දේශීය වෛද්‍ය ඖෂධකෝෂය

ඡායාරූපිකා කිරිඇල්ලේ
ප්‍රියන්ත වීරාල හිටි

දේශීය

වෛද්‍ය ශබ්ද කෝෂ ය

පණ්ඩිත

කිරිඇල්ලේ සුගුණවිමල හිමි

පණ්ඩිත
කිරිඇල්ලේ ඤාණවිමල ස්ථවිරයන් වහන්සේ
ශාසනෝදය පිරිවෙණ
මාරපණ--රත්නපුර

පිට කවරයේ චිත්‍රය

මෙහි යටින් සාගරය ත්, උඩින් හිමාලය ත්, මැදින් ගස් තුනක අතු කැබලි තුනකු ත්, පසෙක ගසක් යට ඍෂිවරයෙකු ත් දිස් වෙයි. මෙයින් අදහස් කරන්නේ සාගර පත්ලෙහි පටන් හිමාලය කන්ද මුදුන දක්වා ඇති හැම දෙයක් ම දේශීය ඖෂධ සඳහා අවශ්‍ය බව යි. රිකිළි තුන පිළිවෙළින් රත් හඳුන්, රුකහුණ හා මදුරා යන දුර්ලභ ගස් වර්ග තුනේ අතු කැබලි ය. පසෙක සිටින්නේ රුකහුණ් රුකක් යට වාඩි වී පොතක් බලමින් සිටින **පුලස්ති** ඍෂිවරයා ය.

ප්‍රථම මුද්‍රණය—1959

දේශීය
වෛද්‍ය ශබ්ද කෝෂ ය
සිත්තරුවේ සහිත සි

රත්නපුර—මාරපණ
ශාසෙන්‍ද්‍රාදය පරිවෙණාධිපති රාජකීය පණ්ඩිත
කිරිඇල්ලේ ඤාණවිමල සඞ්ඝාමිපාදයන් වහන්සේ
විසින් ලියන ලදී.

රත්නපුරේ
ශාසෙන්‍ද්‍රාදය මුද්‍රණාලයෙහි
මුද්‍රිත සි

1959

ප්‍රස්තාවනා

දේශීය වෙදකම

මින් සූ විසි ශත වර්ෂයකින් ඔබ්බෙහි දැමරික ක්‍රියා නිසා රටින් පිටුවහල් කළ විජයාදි දැමරික පිරිස මෙහි පැමිණ මෙම දිවයින වඩාත් භාෂ ය කරන්ට මත්තෙන් මෙහි විසූ දක්ෂ යක්ෂයෝ, ලෝකයා මවිත කරවන යක්ෂ වැඩ කළෝ ය.



වාල්මීකි සවකීය වානේ තුඩින් ලබ්ධියෙන් අඹ්ඩ වූ දුෂ්ට රවනාවක් කොට "ලඞ්කා වාසීහු මිනිසුන් කෑ යක්ෂයෝ" ය යි ලෝකයා හමුවේ අසත්‍ය වාර්තා වක් පිහිට වූ නමුත්, විමසුම් සහිත ව ඒ රවනය ඉකියවන විට එ කල ලොව විසූ අතිශිෂ්ට මනුෂ්‍ය යෝ නම් "ලඞ්දිව විසූ යක්ෂ යෝ ම ය" යි සිතිය හැක.

ඔව්හු නුබ ගැබ වලාවන්හි ගැටී යන සේ උස් ව ගිය මහා මන්දිර සහිත සකලාඞ්ග සම්පූර්ණ මහා නගර නිර්මාණ ය කළෝ ය. ඖෂධීය රස පෙරන යන්ත්‍රයේ පටින් ආකාශ යාත්‍රාව අවසන් කොට ඇති යන්ත්‍ර-සූත්‍ර සෑදූ වෝ ය. ඒ ආකාශ යාත්‍රා වලින් ලෝක වාර්තා පිහිටෙව්වෝ ය. නාඞී ශාස්ත්‍ර ය රසායන විද්‍යාව ඇතුළු වෙදකමෙහි ත් දක්ෂ ව විසූ හ. යන්ත්‍ර-මන්ත්‍ර සහිත ඉන්ද්‍රජාල ශාස්ත්‍රයෙහි මෙන් ම සංගීතයෙහි ද කෙළ පැමිණියෝ ය. නොයෙක් විෂය යන් පිළිබඳ අගනා ග්‍රන්ථ සම්පා දනය කළ හ. ඉන්දියාවේ දෙවියන් සමඟ සටන් කොට ඔවුන් තමා ඉදිරියේ දත ගැස්ස වූ හ.

ලාඬයිකයන්ගේ මේ අප්‍රතිහත දියුණුව දඹදිව විසූ දෙවියන්ට භයට කරුණු වුනා පමණක් නොව ඔවුන්ගේ ඊර්ෂ්‍යාව ද දියුණු කළේ ය. ලඬකාවේ ජාතික හා ආගමික ශිෂ්ටාචාරය උඩ ගොඩනැඟුණු ශ්‍රී විභූතිය මිකා දැමුවෝ මින් අවුරුදු ගය දහසකට පෙර අසුර යුගයෙහි මෙහි පැමිණි චන්ද්‍රවංශික **සාඤ්ඤාමි** ප්‍රමුඛ කොට ඇති ඉන්දියානුවෝ ම ය.

ඉත වසී විසි පහකට පමණ පෙර දේව-යක්ෂ(රාක්ෂස)-නාග යන ගොත්‍රත්‍රිකයන් අතර බෙදී ගිය රාජ්‍ය පාලනය පිළිබඳ ඇති වූ ආඛ්‍යානාන්තර පඤ්ඤ හෙද නමැති අර්බුදයෙන් පෙළී පෙළී ක්‍රමයෙන් පරිහානි පඤ්ඤයක ගමන් කරමින් සිටි සමයක මෙහි පැමිණි විජයාදි දෘමරික පිරිසට මෙම දිවයින තමන් සතු කර ගැණීම වඩා අපහසු කරුණක් නොවී ය. විදේශිකයන් යටතට පත් වන රටවල සවදේශිකයන් හා ඔවුන්ට අයත් ශිල්පශාස්ත්‍රත් පිරිහීම නොවැළැක්විය හැක්කකි. එ කල විජයාදීන් අතින් සිදු වූයේ ද ඒ පාරම්පරික ජාතික විනාශය ම ය.

දේශීය වෙදකමේ සුවර්ණමය යුගය

රාවණ සමය ලඬකා දේශීය වෙදකමේ සුවර්ණමය යුගය ලෙස සැලකිය හැකි යි. ජගත් පූජ්‍ය වෛද්‍ය පරම්පරාවක ආදි කර්තෘවරයෙකු වූ ද, **පුලස්තිපුර** අග්‍ර රාජධානිය කොට රාජ්‍යානුශාසනය කළා වූ ද, මහර්ෂි පුලස්තිනුගේ මුණුබුරු වූ **වෛද්‍ය ශිරෝමණි ශ්‍රී ලඬකාධිපති රාවණ** අධිරාජයා ලොව විසූ ශ්‍රේෂ්ඨ වෛද්‍යවරයන් අතුරෙන් ප්‍රමුඛස්ථානයෙහි ලා ගැණේ. මේ තුමා ජීවත් වූයේ වික්‍රම සංවත්සරයෙන් 1207 වසකට පෙර ය යි ඇතැම් භාරතීය පඬිවරයන්ගේ මත ය යි. බුද්ධ වර්ෂයෙන් යට 1844 වසකට පෙර ය යි **රාජාවලියේ** කියා තිබේ. මේ කරුණු අනුව ඔලන කල නිගමනයකට බැස්ස හැක්කේ දඹදිව දස දේශයක් යටත් කළ නිසා ඒ දස දෙස කිරුළු අනුව **"දශිස්"** ය යි විරුද නාමයකින් හැඳින්වෙන මෙ තුමා මින් අවුරුදු හාර දහස කට පෙර ජීවත් වූ බව යි. එ කල ලක් දිව යන්ත්‍ර-සූත්‍ර අතින් මෙ කල යුරෝපය මෙන් ම කර්මාන්ත යුගයක පැවති බව **රාවණ—රාම** යුද්ධයෙහි දී පාවිච්චි කරණ ලද **නාගශර—අග්නිශර** ආදිය ගැණ කියවීමෙන් පමණක් නොව කාර්මික රටකට අයත් රාවණ රජුගේ ඇඳුමෙන් ම හැඟේ. සිය සොහොයුරාට ත්, මොහුට ත්, අහස් යාන තිබුණු බව ද සඳහන් වේ.

රාවණ තෙමේ දක්ෂ රසායන වෛද්‍යවරයෙකි. ඉගෙණ ගත් ගුරුවරයෙකු ගැණ කියා නැත. නමුත් අනුන් අතින් නොමැරෙන වරයක් ලබා ගැණීම සඳහා බ්‍රහ්මයා සතුටු කරණු වස් **ගොක්කණ්ණ**

ශ්‍රමයට (1) වී තපස් රැකි බව කියැ වේ. බ්‍රහ්ම තෙමේ ආයුර්වේදයේ ප්‍රනෙතෘවරයා යි. රාවණ රජු ඔහුගෙන් බලාපොරොත්තු වූ වරය ගැණ සිතන විට ඔහු බ්‍රහ්මයාගේ වෙදකම ඉගෙණගත්තා පම ණක් නොව ක්ෂණික තුවාල වලින් දිවි ගලවා ගත හැකි රහස් ඖෂධ යොග ගැණත් ගෝකණ්ණාශ්‍රමයෙහි දී දැනගෙණ තිබෙන බැවි සිතිය හැක.

රාවණ---රාම යුද්ධයෙහි දී බරපතල තුවාල ලැබූ (මියගිය) අයට පණ දුන් බවකුත් කියවෙන නිසා බ්‍රහ්මයා සතුටු කොට ඉගෙණගත් ඒ විශෙෂ වෙදකමෙන් ද අදහස් පරිදි ප්‍රයෝජන ගත් බැවි සිතන්ට ඉඩ තිබේ. එසේ ම මින් පෙර හෝ පසුව නො පැවති ලෙස යන්ත්‍ර—මන්ත්‍ර ආදි ගුප්ත විද්‍යාදිය ත් දියුණු ව පැවති බැවි "අහසේ වලාකුල් තුළ සැඟවී සිට පහර දීම" "අදෘශ්‍යමාන ව සිට පහර දීම" ආදී ඒ පිළිබඳ කථා වලින් හැඟේ.

අකී ප්‍රකාශ ය

මෙය රාවණ රජ තුමා විසින් නිපදවන ලද ග්‍රන්ථ (**1. කුමාර තන්ත්‍ර—2. අකීප්‍රකාශය—3. නාඩිප්‍රකාශය—4. උඩ්ඩතන්ත්‍ර**)අතුරෙන් එකකි. පාණිනී සංස්කෘත ව්‍යාකරණ ශාස්ත්‍රය හකුළුවා **පාණිනී ව්‍යාකරණය** කළාක් මෙන් ද, ගෞතම ඍෂි න්‍යාය ශාස්ත්‍රය හකුළුවා **ගෞතමසූත්‍ර** කළාක් මෙන් ද, චරක තෙමේ අග්නිවෙශ තන්ත්‍රය හකුළුවා **චරක සංහිතාව** කළාක් මෙන් ද, රාවණ මනුපේන්ද්‍ර තෙම සකල ආයුර්වේදීය ග්‍රන්ථසාරය උදුරා මේ **අකීප්‍රකාශය** කළේ ය. නොයෙක් රෝගාබාධ සඳහා නියමිත අකී වගී ඇතුලත් ශතක දශයකින් හෙවත් ශ්ලෝක දහසකින් පරිමිත මේ ග්‍රන්ථය ප්‍රකාශ කර තිබෙන්නේ සිය අග මෙනෙසිය වූ **මන්ද්‍රෙදවී** සමග සංවාද මුඛයෙනි. යන්ත්‍රානුසාර යෙන් වාෂ්පකර ඖෂධ සාරය පෙරා ගන්නා (අකී) ක්‍රමය මේ ග්‍රන්ථ යෙහි සඳහන් ව තිබෙන නිසා මෙසින් හැඟෙන්නේ එ කල යන්ත්‍ර—සූත්‍ර පමණක් නොව වෙදකම ත් මෙ කල අපර දිග ක්‍රමයෙහි එන ලෙස පැවති බව යි.

---

1 ගව (ගෙරි) කණක හැඩහුරුකම ඇති වරායක් අසබඩ පිහිටි අස පුවකි. ත්‍රිකුණාමළයට පෙර **ගොකර්ණ** යන නම ව්‍යවහාර වූ බව ඒ පෙදෙසෙහි තිබී සොයා ගත් ශිලා ලිපියක සඳහන් ව ඇත, ගෝකණ්ණයක හැඩහුරුකම ඇති වරාය තිරිකුණාමළේ වරාය බව ත්, දැනට වැඩි කොටසක් මුහුදට දිය වී ගොස් තිබෙන ගල් පර අතර වූ පැරණි දේවාලය රාවණ රජු ඉගෙණ ගත් පැරණි ගෝකණ්ණාශ්‍රමය බව ත් සිතීමට ඉඩ තිබේ

ශ්වාස රෝගයට ධන්තුරාකීය, කෘමි රෝගයට විඩඞ්ගාකීය ද යි මෙසේ රසායන විද්‍යානුකූල ප්‍රත්‍යක්ෂඵල ලැබෙන ඖෂධයන් ගෙන් සම්පූර්ණ ආදිම ලාඞ්කික වෛද්‍ය ග්‍රන්ථය වූ **අකීප්‍රකාශය** 1945 දී විශෙෂ සංස්කරණයකින් යුක්ත ව මුද්‍රණයට පැමිණවීමි. මෙම කරුණු නිසා අෂ්ටාඞ්ග සම්ප්‍රදාය දෙශීය වෙදකමේ සුවර්ණමය යුගය **රාවණ සමය** ලෙස පිළිගත හැක.

දඹදිව හා අපර දිග වෙදකම

උත්තර-දක්ෂිණ භාරතීය (ආයුර්වේද-සිද්ධ) වෙදකම් ද මෙ පමණ හෝ මීට වඩා පැරණි බැව් නොයෙක් සාධක අනුව සිතිය හැකි. පසු කලක දී මේ දෙ වෙදකම ලාඞ්කික වෙදකම හා හුවමාරු කර ගෙණ තිබෙන බැව් දෙරටෙහි ම තිබෙන පොත් පත් සසඳා බැලීමෙන් පෙණේ පෙර දිග ධර්ම දූතයන්ගේ, දේශ සංචාරකයන්ගේ හා වෙළඳුන්ගේ මාර්ගයෙන් අරාබිය පාර්ශ අපර දිගට ගියේ ද මේ වෙදකම ම යි.

ආයුර්වේදයේ සම්භව ය

ලෞකික කටයුතු වලින් වෙන් ම නිර්මලපරිත්‍රාණතයෙහි විවේක ජීවිත ගත කරමින් විසූ ඍෂීන් විසින් මනුෂ්‍යත්වය ඉක්මවා නිය සුවකිය බුද්ධින්ගෙන් හිමාලය පර්වත මුදුනෙහි පටන් සාගර පතුල දක්වා ඇති හැම ද්‍රව්‍යයක ම විද්‍යමාන රස—ගුණ—ඕජා පරීක්ෂා කර බලා තමන් වෙත පැමිණි කීකරු ශිෂ්‍යයන්ට උගන්වන ලද සත්ව ජීවිත ආරක්ෂා කිරීමේ විද්‍යාව ආයුර්වේද ය යි.

අථර්වන වේදයෙහි උපාඞ්ගයක් වූ මෙම ආයුර්වේදය ආදියෙහි අධ්‍යාය දහසක ඇතුළත් කරණ ලද ශ්ලෝක ලක්ෂයකින් පරිපූර්ණ වි ය. අනාගතයෙහි උපදින මිනිසුන්ගේ අල්පායුෂ හා අල්ප බුද්ධිය ගැණ සැලකූ ඒ රුෂිහු ශල්‍ය, ශාලාක්‍ය, කාය චිකිත්සා, භූත විද්‍යා කෞමාරභෘත්‍ය, අගද තන්ත්‍ර, රසායන තන්ත්‍ර, වාජීකරණ තන්ත්‍ර යන අෂ්ටාඞ්ග යකින් යුක්ත වන සේ සුදුසු ප්‍රමාණයකට ඒ වෙදකම සකස්කළ හ. ඔවුන්ගේ බුද්ධි ප්‍රභාවය හා එ කල පැවති ග්‍රන්ථ සම්භාරය ත් දෙස බලන විට මෙය අතිශයොක්තියක් නොව සම්පූර්ණ සත්‍යයක් ම බැව් අවිවාදයෙන් පිළිගැණීමට ඉඩ තිබේ.

ව්‍යාප්තිය

පෙර දඹදිව දියුණුව පැවති **නාලන්දා—තක්ෂිලා—වික්‍රමශිලා** විශ්වවිද්‍යාලයන්හි උපාඞ්ගයක් වශයෙන් ආයුර්වේදය ද ඉගැන්වූ හ. වෛද්‍ය ශාස්ත්‍රය විෂයෙහි භාරතීය විශ්ව විද්‍යාලයවල පැවති දියුණු

තක්ෂිය දූනගත් යොනක (යවන-ග්‍රීක) යෝ ද එකී විද්‍යාල වලට බැඳී ආයුර්වේදය හදාළ හ. "යවනයෝ ජාතියෙන් ම්ලෙච්ඡ වුව ද ඉගෙණීමෙහි අති දක්ෂයෝ" ය යි කුලවාදයෙන් මත් වූ ඇතැම් බම්මණු ඇදුරෝ ග්‍රීක (යවන)යන්ට පරිභව කළ ද, ඒ සටහන් වලින් ඔවුන් දඹදිවට පැමිණ ඉගෙණ ගත් බව ත්, ඉගෙණීමෙහි අතිදක්ෂයන් බව ත්, ඉගෙණ සියරට බලා පැමිණීමෙන් පසු ඉගෙණගත් ශාස්ත්‍රය වඩා ත් ක්‍රමානුකූල ලෙස සකස්කර අනික් අපර දිග රටවල ද බෙදා හැරීමෙන් දැන් පවත් නා අපරදිග වෛදකම ඇති වූ බව ත් පිළිගත හැකි ව තිබේ.

වෙනත් ආයතන හා පුදුම උපාධි

මෙ ම විද්‍යාල හැර ශිෂ්‍යයන් ප්‍රහුණු කරණ දිශාපාමොක් ආචාරි වරුන්ගේ පාලනයෙහි පැවති වෙනත් විද්‍යායතන ද පැරණි දඹදිව තිබුන බව පෙණේ. **ජීවක කොමාර භච්ච** ද එ වැනි තැනක උගත් තේකි. හෙතෙමේ යමක් වරක් ඇසූ පමණින් අමතක නොවන තරමේ බුදුසි යක් ඇති ඉගෙණීමෙහි අති දක්ෂයෙකි මෙ සේ සත් හවුරුද්දක් ඉගෙණීම ලැබූ ඔහු දිනක් සිය ගුරුවරයා වෙත පැමිණ 'දැන් සත් වසක් ඉගැන් වූ හැම දෙයක් ම ප්‍රගුණ කළ නමුදු මෙ ම ශිල්පයෙහි නිමාවක් දක්නට නැත. එම නිසා මෙය කෙළවර වන්නේ කවදා ද" යි ඇසී ය. ඇදුරු තෙමේ ද "එ සේ නම් සිසු දරුව! උදැල්ලක් අතට ගෙණ යොදුනක් දිග—පළල ඇති තක්ෂිලා වනය හාත්පස ඇවිද බෙහෙතට නො ගත්නා යමක් සොයා ගෙණ එව" යි නියෝග කළේ ය

අයම්-විතරින් යොදුනක් තැන් වනය පරීක්ෂා කළ ඔහුට බෙහෙ තකට නො ගන්නා කිසිවක් සොයා ගත හැකි නො වී ය. ඒ බව ගුරුවරයා වෙත පැමිණ සැළ කළ විට ඔහු කියේ "දරුව! තොපගේ දිවි පෙවෙත රැක ගැණීමට කටයුතු කර ගත හැකි තරමේ වෛදකම ගැණ සුළු දැනීමක් තිබෙන නිසා ඉගෙණීම නවත්වා ගම-රට බලා ගොස් වෛද්‍යවෘත්තියෙහි යෙදීමට සුදුසුකම් ඇත" යනු යි.

එ කල පැවති වෛද්‍ය විද්‍යාවේ දියුණුව මැන ගැණීමට මෙය කදිම නිදසුනකි. ජීවක පෙණී සිටි පරීක්ෂණය ත් එයින් ලැබූ උපාධිය ත් සුළු එකක් බැව් දිසාපාමොක් ආචාරීන්ගේ වචන වලින් පෙණේ. "වැඩිය නොවෙ යි, අද මේ පරීක්ෂණය සඳහා පෙර-අපර දෙ දිග වෛද්‍ය විශෙෂඥයන් හෝ උද්ගිද විද්‍යඥයන් ඉදිරිපත් කළොත් එයින් කිදෙනෙකුට සමන් විය හැකි ද" යි සිතා බැලීම ඒ විශෙෂඥ යන්ට ම භාර දීම වඩා සුදුසු ය යි සිතමි. දිග—පළල යොදුනක් ඇති කාලයක තිබෙන වෘක්ෂ—ලතාදියෙහි ගුණ'ගුණ තබා නම් ටික ව ත් කිව හැකි වුවහොත් පුදුමයකි. මෙය විනය පිටක—මහාවග්ග පාලි යෙහි (ශ්‍රී මුඛ දෙශනාවෙහි) ඇතුළත් කථා පුවතකි.

මෙ සේ ඉගෙණීම ලබා සමාජයට පැමිණි ජීවකයන් විසින් කරණ ලද වෙද හෙදකම් කිපයක් ගැණ ද එනි ම සඳහන් කර තිබේ.

1. සාකෙත නගර වැසි සිටුවරියකගේ සත් හවුරුදු හිස රුදුවක් එක නශ්‍යයකින් සුව කිරීම.
2. බිම්සර රජුගේ භගන්දලාබාධය එක ම ලේප(පැලැස්තර)යකින් සුව කිරීම.
3. රජගහ නුවර සිටුහුගේ මොළය කමින් සිටි පණුවන් දෙදෙනෙක් හිසෙහි ශල්‍යකර්මයකින් අස් කොට සුවපත් කිරීම.
4. බරණැස් සිටුහුගේ බඛෙහි වූ ගෙඩියක් බඛ පලා (ශල්‍යකර්මයකින්) අස් කොට සුවපත් කිරීම.
5. චණ්ඩප්‍රද්‍යොත රජුගේ පාණ්ඩුව ගිතෙල් මිශ්‍ර එක ම රසායනයකින් සුවපත් කිරීම හා—
6. එක් වරක් චුම්බනය (ඉඹීම) කිරීමෙන් දස වරක් විරේක වන ඖෂධ බහා ලූ තෙළුම් මල් තුනක් බුදු රදුන්ට පිදීමත් ය.

මෙයින් හිසෙහි කළ ශල්‍යකර්මය ඉතා බරපතල එකකි. තෙල් අප්‍රිය කරණ චණ්ඩප්‍රද්‍යොත රජුට ගිතෙල් පෙවීම ද **ශවද ගැට** හෙළි වන රස මූසු කථා පුවතකි. එ කල මේ ශල්‍යකර්ම සඳහා සිහි නැති කිරීම් පිණිස **මොහිනී** නමැති චූර්ණයක් පාවිච්චිකරණ ලද බව පෙණේ.

ඇත අතීතයෙහි ශල්‍යකර්ම අතින් ද පෙර දිග් වාසීන් අපර දිග ඉක්මවා තිබෙන බැව් මේ විනය පිටකාගත සත්‍ය කථා ප්‍රවෘත්ති වලින් සිතා ගත හැක අපර දිග් වැසියන්ට මේ ක්‍රම සොයා ගත හැකි වූයේ ඉතා මැනකදී නොසිනි.

ව්‍යාඝ්‍ර වෛද්‍යවරයෝ

ජීවකයන් වැනි ශ්‍රේෂ්ඨ වෛද්‍යවරයන් විසූ සමයෙහි ද රට මුලා කරණ, අවිනීත බොරු ටෙටල්කාර වෙදුන් දඹදිව විසූ බව විනය පිටකයේ එන එක් කථා පුවතකින් පෙණේ. ජීවක වෛද්‍යවරයා එක ම පැලැස්තරයෙන් සුව කළ රෝගයක් වූ භගන්දර රෝගය වැළඳුන භික්ෂූ නමක් වේළුවන විහාරයෙහි විසි ය.

භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ගේ නේවාසිකාගාර (සෙනසුන්) පරීක්ෂා කරමින් වඩින වේලෙහි, ඒ භික්ෂූ නමට ශල්‍යකර්මයක් කරමින් සිටි **ආකාසගොත්ත** නමැති වෙදෙක් උන් වහන්සේ වඩිනු දුරදීම දැක "ආගච්ඡතු භවං ගොතමෝ, ඉමස්ස භික්ඛුනෝ වච්චමග්ගං පස්සතු සෙය්‍යථාපි ගොධාමුඛං" (පින්වත් ගෞතමයන් වහන්ස ! මේහි වඩිනු

සේක්වා, මේ භික්ෂුවගේ තලගොයි කටක් වැනි කහල මාංශය බලන සේක්වා)යි කවටකම් කළේ ය. මේ ගැණ සංවේගයට පත් උන් වහන්සේ ට සම්බාධස්ථානයෙහි ශල්‍යකර්ම පිළිබඳ ශික්ෂාපද පවා පණවන්ට සිදු වි ය.

අතීත ලඞ්කාවේ පැවති වෛද්‍ය සේවය

වෛද්‍ය සේවය පිළිබඳ සවණ්ණිමය යුගය වූ රාවණ සමය ගැණ කලින් ලියා ඇත. එය ඉතිහාසයට පෙර ලියූ භාරතීය ලේඛන වල සඳහන් ප්‍රවෘත්ති වලින් ලබා ගත් සම්පිණ්ඩනයකි. මින් පසු මේ ගැණ තොරතුරු දැක්විය හැක්කේ විජයාදී ඉන්දියානුන්ගේ ලඞ්කා ආක්‍රමණයෙන් පසු මෙ ම දිවයිනෙහි ලියවී තිබෙන වංශකථා—අට්ඨකථා—ශිලා ලිපි හා වෙද පොත් අනුව ය.

එසිනු ත් මහාවංශයෙහි සඳහන් වන පළමුවැනි ප්‍රකාශය ලක් දිව ශෂ ව විසූ රාක්ෂසයන්ගේ සභාය ද ඇති ව නැදැයින් සහිත ඉන් දියානු රජ වරුන් නසා, අනුරාධපුරය සකලාඞ්ග සම්පූර්ණ මහා නගර යක් ලෙස ගොඩනංවා, එහි ම වෙසෙමින් සම සැත්තෑ වසක් ලඞ්කා රාජ්‍යානුශාසනය කළ පණ්ඩුකාභය රජු සමයෙහි ය.

අනුරාධපුර සමය

1. පණ්ඩුකාභය(ක්‍රිසතු වර්ෂයෙන් ය.ව.377-307)රජ තෙමේ අනුරාධ පුර නගරයෙහි සූතිකාගාරය (නිබිරිගෙය) ක් හා ආරොග්‍ය ශාලාව (ගිලන්හල) ක් පිහිට වූයේ ය. (මහාවංශ - 10 පරි: 102 ගාථා)

2. දුටුගැමුණු (ක්‍රි: පූ: 101—77) සමයෙහි ලක්දිව පුරා පැවති ආරොග්‍ය ශාලා රජයෙන් පාලනය වූ අතර, ගර්භිනී මව් වරුන් ට අවශ්‍ය ආහාර—පාන—ඖෂධ ආදිය ත් චින්තඞ්ගුවන්ට පාරිතොෂික දීම නා ත් රජුගේ පෞද්ගලික භාණ්ඩාගාරයෙන් සැපයූන.(මහාවංශ-පරි: 32 ගාථා - 38)

3. බුද්ධදාස (ක්‍රි: ව: 398—426) රජ දක්ෂ ශල්‍ය වෛද්‍ය වරයෙකි. එකල රෝගීන්ගේ ප්‍රයෝජනය සඳහා ගමක් පාසා රෝහලක් හා සන්නාගාර ශාලාවක් ද, අඞ්ග විකල වූවන් හා අඞ්ගයන් වෙනුවෙන් වෙන් වෙන් වූ රෝහල් ද කරවූහ. මෙකල යුද්ධ භට යන් වෙනුවෙන් යුද්ධාරොග්‍ය ශාලා ද, තිරිසන් සතුන් වෙනුවෙන් පශු වෛද්‍ය ශාලා හා පශු වෛද්‍ය වරයන් ද ඇතිවීම වැදගත් සිද්ධියකි.

මේ ආරොග්‍ය ශාලාවල නඩත්තුව රජයෙන් සිදු වන අතර වෛද්‍ය වරයන්ගේ නඩත්තුව සඳහා ඒ ඒ ගම් වල කුඹුරු වලින් ලැබෙන අස්වැන්නෙන් දහයෙන් කොටසක් ගන්නා ලද බව ද පෙනේ.

4. දෙවෙනි උපතිස්ස (ක්‍රි: ව: 426—468) රජු කල මහ ජනයාගේ පොදු ප්‍රයෝජනය සඳහා මහාරොග්‍ය ශාලා ත්, අඹයන්, කොරුන්, හා ගර්භිනී මව් වරුන් සඳහා වෙන් වෙන් වූ ආරොග්‍ය ශාලා ත්, කරවන ලදහ. (මහාවංශ – පරි: 37 – ගාථා 182)

5. දෙවෙනි දප්පුල (ක්‍රි: ව: 792—797) රජු පොළොන්නරුවේ හා පදවිය ප්‍රදේශයේ ආරොග්‍ය ශාලා නංවා ඒවායේ පැවැත්ම සඳහා ගම්වර පරිත්‍යාග කළේ ය. මෙතෙමේ අඹයන්ට හා අඹගිකල වූවන්ට ද නොයෙක් තන්හි ආරොග්‍ය ශාලා පිහිටවූයේ ය. (මහා—පරි. 49 ගාථා: 18—19)

6. සිව් වැනි කාශ්‍යප (ක්‍රි: 896—913) රජු වසංගත රෝගීන් සඳහා අනුරාධ පුරයේ හා පොළොන්නරුවේ ගිලන් හල් ඉදිකර දිව සිනේ නොයෙක් තන්හි පුණ්‍යාරොග්‍ය ශාලා ද පිහිටවූයේ ය. (මහා—පරි: 52)

7. පස් වැනි කාශ්‍යප (ක්‍රි: ව: 913—923) රජු අනුරපුර රෝහලක් ගොඩනැංවී ය (මහා—පරි: 52. ගාථා 57)

8. සිව්වැනි මිහිඳු (ක්‍රි: ව: 956—972) රජු ලක්දිව රජය මගින් පාලනය වන ගිලන් හලක් පාසා බෙහෙත් හා යහන් ද සිය වියදමින් බෙදා හැරියේය. ඔහුගේ පුත්‍ර තෙමේ අනුරාධපුර නගර යෙහි උපාසක – උපාසිකා දෙපිරිසගේ ප්‍රයෝජනය සඳහා ආරොග්‍ය ශාලාවක් ඉදි කළේ ය.

පොළොන්නරු යුග ය

ත්‍රිසිංහලය එක් සේසත් කොට පොළොන්නරුව අග්‍ර රාජධානිය වශයෙන් ගෙන විසූ මහා පරාක්‍රමබාහු (ක්‍රි: ව: 1153—1186) රජු කල ලඬකා වෛද්‍ය සේවය ක්‍රමානුකූල ලෙස ඉතා උසස් තත්වයක දියුණුව පැවති බැව් මහා වංශයෙහි සඳහන් වෙයි.

ඔහුගේ ඇමති මඩුල්ලෙහි **මහ වෙදනා**—**සුළු වෙදනා** නම් වලින් **වෛද්‍ය ඇමති**—**වෛද්‍ය උප ඇමති** පදවි දෙකක් ද තිබුන බැව් මහා වංශයෙහි හා ශිලා ලිපියක ත් ලියවී තිබේ.

එකල රෝහල් වල සිටි එක් රෝගියෙකුට සාත්තුකාර සේවක යෙක් සහ සේවිකාවක් බැගින් පත් කර තිබුන බව ත්,[1] රෝහල් මනා පාලනයකින් යුක්ත ව පැවති බව ත්, යුද්ධය වැනි හදිසි අනතුරු

---

1 එහෙත් "වෛද්‍ය සේවය හොඳට ම දියුණු කරලා" යයි කැමොර ගසන මෙකල ඇඳන් වීසි හතරක වාට්ටුවකට ම සාත්තු කාර යන් කී දෙනෙක් සිටින්දැ යි සොයා බලන්න.

වලින් තුවාල ලබන අය සඳහා සේවය කිරීමට පුහුණුව ලැබූ සත්‍රී—පුරුෂ දෙ පක්ෂයේ ම ප්‍රථමාධාර කණ්ඩායම් සිටි බව ත් මහාවංශයෙහි විස්තර කර ඇත. මේ රජ තෙමේ ඒ ඒ විකිත්සාවන් පිළිබඳ දක්ෂ වෛද්‍ය වරයන් ගෙන්වා තනතුරු වලින් හා ඔවුන්ට සුදුසු වැටුප් වලින් ද සංග්‍රහ කළේ ය. වංශ කථා වල දැක්වෙන ඉහත සඳහන් කරුණු තත් කාලීන සෙල් ලිපි වලින් ද අනාවරණය වෙයි. වංශ කථා වල සාමාන්‍ය වශයෙන් ලියවී තිබෙන කරුණු පිළිබඳ සම්පූර්ණ පැහැදිලි විස්තර දත හැක්කේ සෙල් ලිපි වලින් බැව් මේ තාක් සොයා ගෙන තිබෙන සෙල් ලිපි කිපය පරීක්ෂා කිරීමෙන් ප්‍රකට වන වැදගත් කරුණකි. ලක්දිව පුරා විසිර පැවති වෛද්‍ය ශාලාවන්හි පාලන ක්‍රම ය පිළිබඳ කරුණු ඇතුළත් වී ඇති, මේ තාක් සොයාගෙන නැති ඒ ඉතිරි සෙල් ලිපි රාශිය ද සොයා ගැණීමෙන් පසු අපේ පැරණි වෛද්‍ය සේව ය පිළිබඳ පැහැදිලි වාර්තාවක් ලඬකාවාසීන් ඉදිරියට පැමිණෙනු ඇත.

1. සිව් වැනි කාශ්‍යප රජුගේ කිරිඔත් වෙහෙර ශිලා ලිපිය.

2–3. එ ම ශතවර්ෂියට ම අයත් **සෙතල් නඟන්** නමැත්තාගේ හා **දෝනිවලංඟ** නමැත්තාගේ සෙල් ලිපි දෙක.

4. පස් වැනි කාශ්‍යප රජුගේ මැදිරිගිරි ගල් කණු ලිපිය

5. ඔහුගේ ම අභයගිරි විහාර සෙල් ලිපිය

6. මිහින්තලා කන්ද පාමුල පිහිටි දෙරටුපාල රූපයේ කොටා තිබෙන ශිලා ලෙඛනය

7. සිව් වැනි මිහිඳු රජුගේ අභයගිරි විහාර සෙල් ලිපිය

8. ඔහුගේ ම මිහින්තලා ශිලා ලිපිය

9. මහ පැරකුම්බා රජු කල **සුඛබඳනා** නම් නිලධාරියෙකු විසින් අනුරපුර මල්වතු ඔය අසල පිහිටුවන ලද සෙල් ලිපිය

දැනට සොයාගෙන තිබෙන මේ සෙල් ලිපි වලින් ලඬකාවේ පෙර පැවති ආරෝගය ශාලා වල පාලනය — සේවක පිරිස හා නඩත්තු කිරීම පිළිබඳ හැම දෙයක් ම පැහැදිලි වෙයි.



සාරාර්ථ සංග්‍රහවේ ශල්‍යසථාන දක්වා ඇඳ නිබෙන ප්‍රස්ථකාල සිතියමක්

එ කල බොහෝ භික්ෂූන් වහන්සේලා දිසූ සඞ්ඝාරාම වලට යා බ ද ව උන්වහන්සේලාගේ ප්‍රයෝජනය පිණිස ආරොග්‍ය ශාලා තිබුන බැව් මේ ශිලා ලිපි වලින් පෙනේ. ඒවායේ වසන රෝගී භික්ෂූන් ට ගිහි උපසථාය කයන් මෙන් ම පැවිදි උපසථාය කයන් වහන්සේලා ද උවටැන් කරන්නට ඇතුවාට සැකයක් නැත. බුදු රජානන් වහන්සේ ගිලානොපසථානයෙහි අ නු ස ස් වදාරා ඇති හෙයිනි.

එසේ ම ප්‍රධාන නගර වල භික්ෂූන් වහන්සේලාගේ හා (අන ගාරික) උපාසක—උපාසිකාවන් ගේ ප්‍රයෝජනය පිණිස වෙන් වෙන් වූ රෝහල් තිබුන බව ත් ඒවායේ පාලනය රජය මගින් හා සැදැහැවතුන් ගෙන් ලැබුන පරිත්‍යාගවලිනුත් සිදු වූ බව ත් මේ ලිපි වල සඳහන් ව ඇත. (එ හෙ ත් මෙ ක ල භි ක්ෂූ න් වහන්සේලා වෙනුවෙන් වෙන ම ඔසු හල් තබා, රජයේ රෝහල් වල උන්වහන්සේලා වෙනුවෙන් වෙන් වූ උපසථාන ශාලා (වාට්ටු) හෝ නැත්තේ මිසදිටු පාලනයේ ආභාසයෙන් තාම ත් මේ ම දිවයින වැසී තිබෙන නිසා ය.)

පස් වැනි කාශ්‍යප රජුගේ මැදිරිගිරි ශිලා ලිපියෙහි "එහි වූ සඞ්ඝාරාමයට යා බද ව පිහිටි ආරොග්‍ය ශාලාවට, එ ම සඞ්ඝාරාමයට අයත් ඉඩම් බදු කරන්නන් විසින් එ ම ඉඩම් වල හදිසි අනතුරු වලින් මැරෙන එළුවන් හා කුකුලන් සැපයිය යුතු බව" සඳහන් ව තිබේ. ප්‍රාණඝාත අකුශලයට ත් අසු නොවන පරිදි ආරොග්‍ය ශාලා වේ නේවාසික ඇතැම් රෝගීන්ගේ දෛනික ආහාර සඳහා අවශ්‍ය මාංශ වශයෙන් මෙ ම **ත්‍රිකෝටි පරිශුද්ධ මාංශය** ම ලබාගත් බව ත් මෙයින් පෙනේ. එ කල ආගම ත් රකිමින් වෙද කම ත් නො අඩු ලෙස **කළ** බවට මෙය කදිම නිදසුනකි. (රට ඔසුහල් වලින් බෝවුන මස් මාළු පිස්සුව අපේ පැරණි රෝහල්වල තිබුනේ නැත. අනිංසක ආහාර-පාන වලින් රෝග සුවකළ ඒ පැරණි වෛද්‍ය වරයෝ අවශ්‍ය ම අයට පමණක් මෙසේ ලබාගත් මස්-මාලු දුන්හ.)

පක්ෂාඝාත වැනි අසාධ්‍ය රෝග වලින් පෙලෙන රෝගීන් **මහා සෙඳදයෙන්** සෙවද කිරීම හා **බෙහෙත් ඔරුවෙහි** බහා ලීම **ත්** එකල පැවැති ප්‍රත්‍යක්ෂ වෛද්‍ය ක්‍රම දෙකකි. මෙයින් **මහා සෙඳදය** බුදුරජාණන් වහන්සේ විසින් නියම කර වදාරණ ලද්දකි.



(පැරණි ශල්‍යායුධ)

බුද්ධදාස රජ තුමාගේ සාරාර්ථ සඞ්ග්‍රහයෙහි පුස්කොළයක ඇඳ තිබෙන සටහනක්

වාත රෝගීන් සඳහා හැම රෝහලක ම මිනිස් සිරුරක හැඩ හුරු කම අනුව සකස් කළ බෙහෙත් ඔරුවක් ද විය. ලී – මැටි – ලෝහ හා ගල් වලින් තැනූ ඒ ඔරු වලින් දැනට ඉතිරිව ඇත්තේ ගල් වලින් තැනූ ඒවා පමණකි. ඒ ඔරු පැරණි රෝහල් තිබූනු තැන් අපට පෙන්වා දෙන සළ කුණු වශයෙන් සැලකුව ද ප්‍රයෝජනවත් ය.

පැරණි ආරෝග්‍ය ශාලාවල නටබුන්

සිව් වැනි මිහිඳු රජුගේ මිහින්තලා ශිලා ලිපියෙහි සඳහන් වන මිහින්තලා සඞ්ඝාරාමස්ථ ආරෝග්‍ය ශාලාවේ නටබුන් මිහින්තලා කන්ද නගින විට පිය ගැට පෙළ පසෙක දී දැක්ක හැක. ගරා වැටී තිබෙන ඒ ගොඩනැගිල්ලේ නෂ්ටාවශෙෂ පරීක්ෂාවෙන් බලන විට එය ද නවීන ක්‍රමානුකූල ලෙස ගොඩනගා ඇති රෝහලකට නො දෙවෙනි වන සේ ගොඩනගන ලද මහල් කීපයකින් යුත් වඩා ශක්තිමත් සෙල් මුවා පහසක් බැවි නිගමනය කිරීම අපහසු කරුණක් නොවේ.

මේ කරුණු අනුව සලකන විට **සූතිකාගාර—සන්‍නාගාර—පශු වෛද්‍යාගාර** ඇතුළු මහාරෝග්‍ය ශාලාවන් ගෙන් යුත් ජාතික සංස්කෘතිය ත්, දේශීය සභ්‍යත්වය ත්, ආගමික පරිසරය ත් රැකෙන පරිදි ගොඩ නැගුනු සකලාඞ්ග සම්පූර්ණ වෛද්‍ය සේවයක් පෙර අප සතුව පැවති බවට කිසිම සැකයක් නැත.

(අතීත සිදුවී මේසේ වුව ද දැනට මෙ ම දිවයිනෙහි තිබෙන්නේ විජාතික සංස්කෘතිය, විදෙශීය සභ්‍යත්වය, හා මිථ්‍යා දෘෂ්ටිය රැකෙන පරිදි සවදේශීය ධනයෙන් ගොඩ නැගුනු විදේශීය ලක්ෂණයන් ගෙන් අනූන මහා වෛද්‍ය සේවයකි. මේ ඇද කුද මගහරවා ගැණීමේ ශක්තිය ඇත්තේ ජාතික හැඟීම් ඇති මහජනයාට පමණකි.)

ලඬකාවේ (ලියන ලද) පැරණි වෙද පොත්

1 කුමාරතන්ත්‍ර ය
2 අකී ප්‍රකාශ ය
3 නාඩි ප්‍රකාශ ය
4 ඵණිස් තන්ත්‍ර ය
5 සාරාර්ථී සංග්‍රහව
6 රස ප්‍රදීප ය
7 ප්‍රයෝගාර්ණව ය
8 ප්‍රයෝග රත්නාකර ය
9 ද්‍රව්‍යාවලි ය
10 පජී සන්න ය
11 ප්‍රයෝග කෝෂ ය
12 හෙසජ්ජ මඤ්ජූසාව
13 යොගාර්ණවය
14 ප්‍රයෝගරතනාවලි ය
15 පාණ්ඩ ශුද්ධි ය
16 ප්‍රයෝග කෝෂ ය
17 බින්දුසාර ය
18 ප්‍රයෝග සංග්‍රහව
19 බුද්ධවෙදෙහ ය
20 නිෂක් මූෂ්ටි ය
21 මහායාන ය
22 නිෂක් මත ය
23 මූලාගම් ය
24 යොගමාලාව
25 යොග සතක ය
26 යොග සමුච්ච ය
27 සාරසංක්ෂේප ය
28 ප්‍රයෝග සමුච්ච ය
29 යොගාශීති ය
30 වරසාරාර්ථී සංග්‍රහව (සාරාර්ථී සංග්‍රහ සන්න ය)
31 සාරසංග්‍රහව
32 නාගඛිදි ය
33 සිද්ධිසාර ය
34 වරයොගසාර ය
35 යොගරත්නාකර ය
36 කරඹගලේ අත් වෙද පොත
37 යොගපිටක ය
38 ඉත්තෑගලේ අත්වෙද පොත
39 චින්තාමණී ය
40 ශ්‍රී රත්නසේකරගේ විකිත්සා පොත
41 රජගෙයි ඇස් වෙද පොත
42 අභිනව මාධව නිදාන ය
43 ශ්‍රී වීරපරාක්‍රම නරෙන්ද්‍රසිංහ රාජ වෛද්‍යවරයාගේ අත් වෙද පොත
44 කැඩුම්-බිඳුම් වෙද පොත
45 වරයොග සිතුම්ණ
46 හෙසජ්ජ මඤ්ජූසා සන්න ය (ශ්‍රී ශරණංකර සඞ්ඝරාජ)
47 වෛද්‍ය චින්තාමණී ය
48 ගෙඩි වෙද පොත
49 යොගධාරණ ය
50 යොගසාර ය
51 ගව වෙද පොත
52 ඇහැළපොළ අධිකාරම්තුමාගේ අත් වෙද පොත
53 මඩුවන්වෙල අලි වෙද පොත
54 මාකඳුරේ අලි වෙද පොත
55 හිගුරේ පිස්සුබළු-පිස්සු ම් විෂ වෙද පොත
56 පඬුවස් නුවර කැඩුම් -බිඳුම් වෙද පොත
57 වාහිරිගල සර්ප වෙද පොත
58 සුළුගුළු පීනස් වෙද පොත
59 දෙරටියාවේ ඇස් වෙද පොත
60 මාරපණ පිස්සු වෙද පොත
61 මාරපණ මීමස්මොර (අපස්මාර) වෙද පොත

සංස්කෘත-පාලි-සිංහල භාෂා වලින් ලියන ලද මේ පොත් වලින් මුද්‍රණය වී ඇත්තේ ඉතා සුවලපයක්. එයිනුත් පොත් 7 ක් පළ කර වන ලද්දේ මා විසින් ය.

වෛද්‍ය ශාස්ත්‍රයේ දියුණුව

වෛද්‍ය සේවය මෙන් ම වෛද්‍ය ශාස්ත්‍රය ද ලක් දිව ඉතා දියුණු තත්වයක පැවති බැව් පොළොන්නරුවෙන් අවසන්වූනු ශාස්ත්‍රාලෝකය නැවත නැවත දැල්වෙන සමයක (දඹදෙණි සමයේ දී) පස්මුල පිරිවෙන් භික්ෂූන් විසින් ලියන ලද "හෙසජ්ජ මඤ්ජූසා" නමැති පාලි ග්‍රන්ථයෙන් පෙණේ. පඳහති සම සැටකින් අවසන් වන ඒ පොත සකස් කිරීමේදී—

1 අග්නිවෙශ ය
2 අමිත ප්‍රභෙද ය
3 අමෘත මාලාව
4 අෂ්ටාඞ්ග සංග්‍රහව
5 අසිත සංහිතාව
6 ආලම්බායන ය
7 ඔෂධබභ්‍ය ය
8 කාකනීය ය
9 කාත්‍යායනීය ය
10 කාශ්‍ය පෙය ය
11 කුමාර සංහිතාව
12 කෘෂ්ණ පුරාණ ය
13 ඛරනාද ය
14 ඛරපාණීය ය
15 ගෞතමෙය ය
16 චකඛුසෙන ය
17 චණ්ඩ කාශ්‍යපෙය ය
18 චන්දට ය
19 චරක ය
20 චිකිත්සා කලිකාව ය
21 ජතුකර්ණ්‍ය ය
22 ද්‍රව්‍යාවලි ය
23 නාගාර්ජුන ය
24 නාරායනීය ය
25 පජ්ජ සන්න ය
26 පාණ්ඩු ශුද්ධි ය
27 ප්‍රයොග කොෂ ය
28 ප්‍රයොග රත්නාකර ය
29 ප්‍රයොගරත්නාවලි ය
30 ප්‍රයොග සංග්‍රහව
31 ප්‍රයොගාර්ණව ය
32 බාහට ය
33 බින්දුසාර ය
34 බුද්ධ වෙදෙහ ය
35 භද්‍ර සෞණකීය ය
36 විකිත්සාමෘත ය
37 භාරද්වාජ ය
38 භාලුක ය
39 භිෂක් මත ය
40 භිෂක් මුෂ්ටි ය
41 හෙල ය
42 හොජ්රාජී ය
43 මහා කාශ්‍යපෙය ය
44 මහායාන ය
45 මාණිභද්‍ර මත ය
46 මූලාගම ය
47 යොග මාලාව
48 යොග ශතක ය
49 යොග සමුච්ච ය
50 යොගාශීනි ය
51 වටටකඝග ය
52 වඳ්ධකඝනී ය
53 වරරුචි ය
54 වෛදඃී ය
55 වෛදෙහ ය
56 සාරසංග්‍රහව
57 සාරාඃී සංග්‍රහව
58 සිද්ධියොග ය
59 සිද්ධියොග සමුච්ච ය
60 සුශ්‍රුත බාහට ය
61 සුශ්‍රුත ය
62 හරිශ්චන්ද්‍ර ය
63 හාරිත ය
64 හිරණ්‍යකක්ෂ ය

යන මේ පොත් හැට හතරෙ (64)ත් ඖෂධ යෝග (වට්ටෝරු) දෙසිය හත (207) ක් රැගෙණ තිබෙන බැව් එහි ම දක්වා තිබේ. දඹදෙණි සමයේ වෛද්‍ය ශාස්ත්‍රය හදුරනුවස් භාවිත කරණු ලද මේ පොත් වලින් වැඩි හරියක් ගැණ කිසිම තොරතුරක් දැනගන්නට නැත. ඒ පොත්වල සඳහන් ඖෂධයොග පාලි භාෂාවට පෙරලා ගාථා වශයෙන් නිබන්ධන ය කර තිබෙන හෙයින් අභාවයට ගොස් ඇති ඒ පොත් වල තත්ත්වය හෝ කවර භාෂාවකින් ලියන ලද ඒවාදැ යි දැන ගැණීමට පවා ක්‍රමයක් නැත.

එහෙත් ඒ පොත් වලට තබා තිබෙන නාමයන්ගේ සවරූප ගැණ සළකා බලන විට වැඩි හරියක් ම ලඞ්කාවේ දී ත්, ඉතිරි හරිය ඉන්දියාවේ දී ත්, ලියන ලද ඒවා බැව් සිතීමට ඉඩ තිබේ.

ලක් දිව හෝ දඹදිව නැති මේ පොත් වල පිටපත් වලින් සම හරක් සතුරු ආක්‍රමණ වල දී විනාශ වන්ට ත්, ඉතිරි හරිය පොත් එකතු කරන්නන්ගේ මාගී යෙන් විදෙශ වල පුද්ගලයන් හා පුස්ත කාල සතුව ඇතුවාට ත් කිසි ම සැකයක් නැත.

ආයුර්වේද වෛද්‍ය ශබ්ද කෝෂ ය

සංස්කෘත – හින්දි – වංග – හා ඉංග්‍රීසි යන භාෂාවලින් ඉන්දි යානු ඖෂධ වගී පිළිබඳ ව ලියන ලද ශබ්දකෝෂ මහත් රාශියක් ඇති මෙකල ආයුර්වේද වෛද්‍ය ශබ්ද කෝෂයක් සිංහලයෙන් පිළියෙළ කිරීම භාරදූර කාර්‍යයක් නොවේ.

මතභෙද සහිතවූ ත් දුර්ලභවූ ත්, වඩා ප්‍රයෝජනවත්වූ ත් ඖෂධ වගී වල ඡායාරූප සහිත විශෙෂ හැඳින්වීම් ද ඒ පොත් වල ඇත. එසේ ම ඒ ඒ වෘක්ෂ ලතා ආදිය කවර පවුලකට අයත් දැයි බේරුම් කර ගැනීමට පහසුවන පරිදි ලැටින් භාෂාවෙන් ව්‍යවහාර කරණ වචන ද එයින් පොත් කීපයක ම තිබේ.

ඉහත සඳහන් භාෂාවලින් ලියා තිබෙන ඉන්දියානු අකාරාදි හා ද්‍රව්‍ය ගුණ නිඝණ්ඩු කීපය මෙසයක් මත තබා ගෙණ නිවිහැන හිල්ලේ පුටුවක් මත වාඩිවී සිංහලයෙන් ආයුර්වේද (සංස්කෘත) ශබ්ද කෝෂයක් පිළියෙළ කළ හැකි යි. එය එ පමණ භාරදූර වැඩක් නොවන බැව් මා කියන්නේ ඒ නිසා ය.

දේශීය වෛද්‍ය ශබ්ද කෝෂ ය.

ලඞ්කාවේ දේශීය වෙදකම පිළිබඳ ව ශබ්ද කෝෂයක් පිළියෙළ කිරීම පොත් පත් පෙරළීමෙන් පමණක් නිවිහැනහිල්ලේ කළ හැකි පහසු වැඩක් නොවේ. දේශීය (සිංහල) භාෂාව මෙන් ම

දේශීය වෙදකම ද අවුරුදු දහස් ගණනක් පැරණි ය. ඇත අතීත යෙහි යම් යම් ඖෂධ වගී වලට ව්‍යවහාර කළ නම් මධ්‍යකාලීන යුගයේ දී විදේශිකයන් ගේ බලපෑම් ආදි නොයෙක් කාරණ නිසා වෙනස් ව තිබේ. එ ම ඖෂධ වගී ම මෙකල ඊටත් වඩා වෙනස් නම් වලින් හැඳින් වෙ යි.

පැරණි දේශීය වෙදකමේ පරම්පරා වශයෙන් එන ඇතැම් හස්තසාර ඖෂධ වලට ලැටින් වචන තබා සංස්කෘත වචන වත් සොයාගන්නට නැත. ඒ ඖෂධ වගී ගැණ ඉන්දියානුවන් තුළ හෝ යවනයන් තුළ දැනීමක් නොනිබුන හෙයිනි. එසේ ම ඇතැම් ඖෂධ වගී 1. උතුරැමැද, 2. වයඹ, මධ්‍යම, උඟව උතුර, 3. උඟව දකුණ, ගිරුවා, දකුණු, 4. සපරගමු, බස්නාහිර, වශයෙන් එක ම ලඬකාවේ ප්‍රදේශ හතරක හතරාකාරයකින් හැඳින් වෙ යි.

මේ හැර **කඹුළු කඩුප්පුවා, ඩෙදරාලගෙ මෝ, සම්සක් පිපෙනා මල්, භූමි අවතාර, පඹබැඳි ආරච්චිල** ආදි රහස් බෙහෙත් වට්ටෝරුවල එන ගුඪාඛ්‍යා (අඛ්‍යා සැඟවූ = ප්‍රහේලිකා) නම් ද තිබේ. මේ වචන වැඩි වශයෙන් යෙදී ඇත්තේ පැරණි දේශීය වෙදකමට අයත් සර්ප විෂ – කැඩුම් බිදුම් – මාලේ (ප්‍රදර), අතීසාර, සෙංගමාල (කාම්ලා) හා ජලභීතිකා (පිස්සුබළු) උවදුරු පිළිබඳ ව ප්‍රතිකාර ලියා තිබෙන රහස් බෙහෙත් වට්ටෝරු වල ය.

මේ ශබ්දකෝෂය සකස් කළ හැටි

පළමුවෙන් ම ඉන්දියාවේ හා ලඬකාවේ මුද්‍රිත පොත් කියවා බලා මේ රටේ වෙදකමට අවශ්‍ය වචන එකතු කළෙමි. දෙවෙනි ව මේ තාක් මුද්‍රණය වී නැති වෙදපොත් – වට්ටෝරු වෙද පොත්– බෙහෙත් වට්ටෝරු හා බෙහෙත් වදුල් පොත් ද එකතු කර කියවා බලා දුරවබෝධ වචන එකතු කළෙ මි.

ඉන්පසු චිත්‍ර ශිල්පියෙක් හා ආධාරකාරී කීප දෙනෙක් ද කැටුව ලඬකාවේ නොයෙක් පළාත්වල ඇවිද බෙහෙත් වගී ගැණ සාකච්ඡා කිරීමි ත් මතභෙද සහිතවූ ද දුර්ලභවූ ද රහස් බෙහෙත් වශයෙන් පවතින්නාවූ ද ඖෂධ වගී වල ලක්ෂණාදිය සහිත චිත්‍ර පිටපත් කර ගැණීමි ත් කළෙමි. මෙහි ඇතුළත් වන චිත්‍ර අතුරෙන් අබින්, සුං, වව්වනාවි, ඉන්දියානු ගොඩකදුරු යන හතර වගීය හැර ඉතිරි සියල්ල ම ඒ ඒ වෘක්ෂ ලතාදිය ඉදිරියෙහි තබා අඳින ලද නියම සටහන් ය.

මේ සියල්ල සූදානම් කර අතට ගෙන පොතේ වැඩ ආරම්භ කොට පොත ලිවීම ත්, මුද්‍රණය ත් එක වරම නිම කළෙමි. දේශීය වෛද්‍ය ශබ්ද කෝෂයක් ලිවීම එපමණ පහසු නැත කිවේ ඉහත සඳහන් දුෂ්කර කම් නිසා ය.

අශාසත්‍රීය වචන හා මගේ පරමාර්ථය.

වෙනත් භාෂාවල වචන තත්සම - තත්භව වශයෙන් තවත් භාෂාවක ව්‍යවහාරයට ඊමේදී "කලකට පෙර දෙළපාරක තිබුන ගල් පතුරු කැලි රළුවේගය නිසා කල්යාමේදී රවුන්ගල් කැට වන්නාක් මෙන් ව්‍යවහාර කරන්නන්ගේ භාෂා නමැති රළුවේගයට අසුවී නිෂ්පත්තිය පවා සොයාගන්නට බැරි තරමට කැඩී බිඳී රවුන්වී පොත්පත් වල හා ව්‍යවහාරයෙහි පවතී"යි. මට අසුවූ එබඳු හැම වචනයක් ම ඒ ඒ තැන්වල සටහන් කර තිබුන පිළිවෙළට ම මේ පොතට ඇතුළත් කර අදහස දුන්නෙමි. එසේ කළේ දේශීය ශබ්ද කෝෂයකින් අප කවුරුත් බලාරොත්තු වියයුතු ප්‍රධාන කාරණය දේශීය වෙදකමේ තිබෙන වචන තේරුම් ගැණීමට මගක් පාදා ගැණීම නිසා ය.

"මේ පොතේ සිංහල - පාලි - සංස්කෘත - ද්‍රවිඩ - හින්දි ආදි භාෂාවල අශාසත්‍රීය වචන ත් තිබෙනවා ය" කියා පාඨකයන් තුළ වැරදි අදහසක් ඇතිවීමට ඉඩ තිබේ. එ සේ ම මේ ගැණ උරණ වන ඇතැම් භාෂාධරයන් මගේ ඇඟට කඩා පනින්නට ත් මෙය ඉඩ ඇති කරාණක් විය හැකි හෙයින් මගේ ආරක්ෂාව පිණිස පොතේ තත්වය විදහා පෑම මා සතු යුතුකම ය.

යාපුර, දඹින්නරු, සුළුබුරුද, යහවපු, කිරබේරිය, නවැඟිලි, තිදළ ආදි පැරණි ශාසත්‍රීය වචන මෙන් ම වැග්ර, වාහුවාර, බකුල, කට්ඨායම්, කළුපතික්කිල, කැලෙන් කැපූ පොත්ත, අල්සෙරෙප්පාඩි, ආදී අශාසත්‍රීය වචනද මෙහි ඇතුළත් කර ඒවායේ අදහස් ද ප්‍රකාශ කර ඇත.

එසේ ම මුද්‍රිත පොත් වලට වඩා මුද්‍රණය නොවූ පුස්කොළ ලියවිලි (පොත්) වල ත්, වහරෙහි ත් ඇති වචන වැඩි වශයෙන් තිබෙන මෙහි ශබ්දකෝෂයෙන් පොත් බලන පිළිවෙළ අනුව වචන අගට පොත් හැඳින් වීමේ ක්‍රමය නොයෙදුවෙමි. සොයා ගැණීමට පහසු නොවූ ඒ පොත් වලට ලකුණු දැමීමෙන් ලාබිය හැකි ප්‍රයෝජනයක් නැති හෙයිනි.

මේ රණේ පැරණි පුස්කොළ පොත පතක — බෙහෙත් වදුලක හෝ බෙහෙත් වට්ටෝරුවක තමන්ට නොතේරෙණ වචන තිබේ නම් **මේ ශබ්ද කෝෂය** පෙරලා බලන්න. ලක් දිව දැනට හැම තැන ම ඉතිරි ව තිබෙන එ වැනි ලේඛණ වල ඇති නොතේරෙන වචන හැකිතාක් දුරට සොයා මේ පොතට ඇතුළත් කර ඇති හෙයින් බොහෝ විට එහි තේරුම් හා සම්කිසි විස්තරයක් ද මේ පොතේ තිබෙන්ට පුළුවන.

මගේ නිගමනය

වෙදකමක-භාෂාවක-ශාසත්‍රයක හෝ සම්කිසි කර්මාන්තයක කටයුතු සඳහා ව්‍යාප්ත ව පවත්නා වචන සඞ්ඛ්‍යාව ද ඒවායේ දියුණුව හෝ පරිහානිය මැන ගැණීමේ එක් ක්‍රමයකි. දේශීය වෙදකමට

අයත් වචන මහත් රාශියක් තිබේ. මේ ගැණ ලියවී තිබෙන **ද්‍රව්‍ය වලිය** නමැති පොතට දැඩදෙණි කාලයෙන් පසු කුමක් වී දැ යි දැන ගන්නට නැත. පැරණි පොත පතෙහි හා වහරෙහි තිබෙන වචන ප්‍රමාණවත් පරිදි එකතු කර අදහස් දැක් වූ වෙන පොතක් ද නැත.

කලක සිට පැවති මේ අඩුපාඩුව පිරිමසාලීමේ අදහස මා තුළ ඇති වූයේ මීට සිව් වසකට පෙර ය. මෙ සේ ම මෙම දිවයිනට අඩු -පාඩුවක් ව පැවති පාලි ත්‍රිපිටකයේ කටයුතු ප්‍රමාණවත් පරිදි අවසන් කර තබා මේ සඳහා ඉදිරිපත් වීමට කල්පනා කළෙමි.

මෙ වැනි පොතක් ලිවීමට මට වඩා සුදුසුකම් ඇති ගිහි-පැවිදි පින් වතුන් කොපමණවත් සිටින බව මම දනිමි. එහෙ ත් ඒ කිසිවෙකුගෙන් කලක සිට මේ රටට අවශ්‍ය ව තිබෙන **දේශීය වෛද්‍ය ශබ්ද කෝෂයක්** පිළියෙළ කිරීමේ කායර්‍ය ය ඉටු නො වූ නිසා හැකි පමණ උත්සාහ ගෙණ මෙහි වැඩ නිම කළෙමි. ඒ මගේ ප්‍රයත්නය කොපමණ දුරට සාර්ථක වී තිබේ දැ යි නිරණය කිරීම පාඨකයන් සතු කාර්‍යයකි.

ශාස්ත්‍රීය අනුස්මරණ

පොත සකස් කිරීමේ දී රත්නපුර - ගම්පහ ශාඛා ඖෂධාලයා ධිපති **කවිරාජ් පී. බී. ජී. ජයවීර** වෛද මහත්මයා ඇතුළු **ශාසෙන්ද්‍රා දය** පාරිවෙණික ආදි ශිෂ්‍ය පිරිස ගෙන් හා පොතේ ඇතුළත් ඇ තැම් ඖෂධ වගී නිරාකරණය කර ගැණීමේ දී ක්‍රියා කෞශල්‍යයෙන් මෙන් ම, පෙනුමෙන් ද ලඬකාවේ ජීවමාන වෛද්‍ය ඍෂි වරයා ලෙස අප රට වාසීන්ගේ ගෞරවාදරයට භාජන වී සිටින **ගම්පහ සිද්ධා යුර්වේද විද්‍යාලයාධිපති පණ්ඩිත ජී. පී. චික්‍රමාරච්චි උත්තර මන්ත්‍රී තුමා** ගෙන් ද ලැබුන උපකාර ඉතා අගය කොට සලකමි.

පොතේ පිට කවරය ඇතුළු වෘක්ෂ - ලතා වල චිත්‍ර සියල්ලක් ම පිළියෙළ කළ රත්නපුරේ ඩී. පී. **සේනාරත්න මහතා** අතින් සිදු වූයේ ද වටිනා සේවයකි.

විශෙෂ ආධාර.

මේ පොතෙන් ලඬකාවාසීන්ගේ පොදු ප්‍රයෝජනය හා දේශීය වෙදකමේ දියුණුව ගැණ ත් සිදුවන ඉමහත් සේවය වටහාගත් **සංස්කෘතික අමාත්‍යාංශය** මගින් රුපියල් පන් දහස(Rs, 5000/=) ක් ද කැටවල හා නුගේගොඩ ශ්‍රී ධන්වන්තරී ඖෂධශාලාධ්‍යක්ෂධිපති **ඩබ්ලිව්. ඒ. සිංහිරි මහත්මයා** වෙද මහත්මයාගෙන් රුපියල් පන් සියය (Rs, 500/=) ක් ද කලවානේ ඖෂධාලයාධිපති **ඇන්. ආර්. සඞිමන් වෙද මහත්මයා** ගෙන් රුපියල් සියය (Rs, 100/=) ක් ද පරිත්‍යාග වශයෙන් ලැබුන බව ත් මේ ආධාර පොතේ මුද්‍රණ කටයුතු සඳහා බොහෝ ප්‍රයෝජනවත් වූ බව ත් නව ත් මේ සඳහා අවශ්‍ය හැම ආධාරයක් ම **කොළඹ සිමා සහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගමෙන්** ලැබුන බවත් කෘතඥතා පූර්වක ව සඳහන් කරමි.

මෙයට,

1959-1-24. **පණ්ඩිත කිරිඇල්ලේ ඤාණවිමල ස්ථවිර.**

ශාසෙන්ද්‍රාදය පිරිවෙණ,
මාරපණ-රත්නපුර.

දේශීය වෛද්‍ය ශබ්ද කෝෂයේ

චූ ත්‍ර

නම	පිට	නම	පිට
අංකෙත්ද	1	කිරිගොප්ප	112
අක්මැල්ල	2	කිරිතුඟ-(කලඟ ගස්)	112
අනින්ත	14	කිරිවල්ලා	113
අඹින්	17	කුකුරුමාන්	116
අරුඳ	28	කුඩුවෙළඟ	119
ආපසු මදු	37	කෘෂ්ණවෘන්තිකා(ඇද්දෙම්ට)	130
ඇට්ටම්බරා	41	කෙළිඳ	133
ඉකිරිය	43	කොකුම්	135
ඉරරාජ	47	කොතලාහිඹුටු	137
ඉහිපැත්ත	49	කොඹ්බෑ (කොඹ්‍යා)	138
ඊතණ	49	කෝවක්කා	142
උල්වැරණියා	55	ගණිතිශා (සුවඳ හිඟුරුපියලි)	156
එක් පෙති පියුම්	58	ගම්මේ (ගම්මාළු)	159
ඒකාවේරිය	59	ගරුඬරාජ	161
කකුළු සුං	63	ගලිස්	162
කට්ටකුම්න්ජල්	66	ගස්පෙනෙල	163
කටුපිල	68	ගැටනෙටුල්	165
කදුලැස්ස	72	ගුරුළුරාජ	169
කන්සා	75	ගුරුන්ද-(අරිමේද)	171
කප්පරවල්ලිය	78	ගොදිවි-(ඇන්අඹ්)	173
කපුකිනිස්ස	80	ගොඩකදුරු-(ලඹකා)	175
කපුරු	81	ගොඩකදුරු-(ඉන්දියා)	175
කලුකැම්මේරිය	92	වාල්මුග්‍රා-(වවුල්මුඟ්‍රා=තුවරක)	189
කලුකොහිල	93	චීන අල-(අලබේත්)	192
කලුවාල (කලුවා අල)	93	ජයපාල	199
කාකබෝඩි (කවුඩුබෝ)	97	තරණ	211
කාලමේඝ-(වල්බිත්තොහොඹ)	104	නිත්තවැල්	217
කැපුන්කිරිය	108	නිප්පිලි	218
කිඹුල්වැන්න	111	තුම්පත්කුරුඳු-(තුම්පත්කුරු දෙනි)	223

නම	පිට
තුඹකරිවිල	224
තේජපත්‍ර	229
තොලබෝ	231
දන්කැටියා	236
දූත්ත	243
දිවිපහුරු	245
දුනුම්ඩලා	249
දුහුදු (දූදු)	252
දෙඩම්පනා	257
නගා මැරූ අල	266
නවහන්දි	270
නැටවි	273
නියඟලා-(ලියනගලා)	275
නිල් නිවුල්	277
නිල්අවරිය	278
නොනන්කෙන්ද	283
පටිඛාතු	286
පත්කැල	288
පතරාජ	290
පඹුරු	293
පැණිබැව්ල	301
පැණිවරා	302
පිටසුදු පලා	303
පිවරී	308
පුපුල	311
පුවහු-(ප්‍රියඞ්ගු)	312
පෙරැංකායම්	317
පොඩි අරිසි	319
බක්මී	325
බකිනි	325
බඩකිරිල්ල	326
බින්නුග	332
බුරුල්ල ගස	335
බෙහෙත් අනෝදා	336
බෝමී-(උළුල්)	338
මකුණුවැන්න	345
මදනකාමපූ-(වැල්)	349
මදනකාමපූ-(ගස්)	349
මදුර-(මදුරා=මහුර)	351
මරිතොණ්ඩි (හෙන)	356
මලිත (මලඉත්ත)	358
මස්බැද්ද	360
මහ හැඩයා	361
මාදම්	366
මාසක්කා	368
මිදි	370
මුඛමහණ	373
මුරුවා වැල්	375
මූවකිරිය	376
මූස්සැන්ද (බූස්සැන්ද)	377
මූනමල්	379
මොණරපහුරු	383
යකිනාරන්	385
රට අරළු	392
රත්කිහිරිය	393
රත්හඳුන්	395
රත්කිරිගොකටු	396
රත්මානිස්ස	397
රුත්ත	402
රුක්ගොකටු (කණකක්ෂීර)	404
රුකතුණ (අතුණ කරගස)	406
රෝහිතක	409
ලුණුකැටියා වැල්	413
ලුණුවරණ	414
ලේවැරැල්ල (අයාපාන)	415
ලොත්සුඹුලු	416
වච්චනාවි	419
වඳුරුමැ වැල්	421
වනරාජ (ලංකා)	423
වනරාජ (ඉන්දියා)	423
වවුලැටිය	428
වැල්කැප්පෙට්ටියා	435

නම	පිට	නම	පිට
වැල්පෙනෙල	435	සාම්බ්‍රාණි (කුන්දුරුක්කන්)	483
විෂකුම්බ	441	සිරතේක්කු	488
වෘද්ධදාරු වැල්	445	සිරිවැඩි බැච්ල	489
වෙල්ලන්ගිරිය	448	සිවිය වැල්	490
වෙල්ලන්ගිරිය (කළු=වල්)	448	සීඅක්කා	491
ශතපුෂ්ප (සතකුප්ප)	453	සුදුහදුන්	495
ශ්‍රී හස්තිනී (ඇත්සොඩ)	465	සුලුහයි	500
සක්මල්	468	සුවඳ අගිල්	501
සන්නිනායන් (ශවිත්‍රාරි)	471	සෙන්කොට්ටම්	504
සප්සඳ (සස්සඳ වැල්)	472	සේරු	505
සමඳරා (තික්ත සමඳරා)	474	හිඟුල්	517
සල්	477	හින්තඹල	519
සල්වැන්න (ශාලපර්ණී)	480	හුලන්හිත්	520
සවිකෙන්දෑ (යවකෙන්ද)	481	හොඹල	522

උපග්‍රන්ථය 525 – 528
ශුද්ධි පත්‍රය 529 – 530



Pandita
Kirielle Nanawimala Thero

දේශීය
වෛද්‍ය ශබ්ද කෝෂ ය

යෝ'පූර්ව වෛද්‍යය නාමොසතු තසෙම

අංකෙණ්ද — අංශුධර

අ

අංකෙණ්ද

Acronychea Laurifolia

වර්ණයෙන් බෝඹු කොළ වලට සමාන පේර කොළ වැනි බොකුටු ගැසී තිබෙන කොළ වලින් සහ සුදු පාට කඳකින් යුත් අඩි 25 ක් 30 ක් පමණ උසට වැවෙන මේ ගස් වර්ගය දේශීය වෙද කමේ ඉතා උසස් තැනක් ගණියි.

පොඩි කළ විට මොලයට කා වදින "ටර්පන්ටයින්" වැනි තද සුවඳකින් යුත් මේ ගසේ කොළ සහ පොතු හිස සිසිල් කරණ තෙල් වර්ගයක් හා තුවාල තෙල් සෑදීමට ත් පාවිච්චි කරති.

මේ ගසේ කොළ – පොතු වෙනත් ඖෂධ වර්ග සමග කොටා මලවා ඉදිමුම් බැස්සවීමට ත් කැඩුම් – බිඳුම් වෙද කමට ත් බඳින ප්‍රත්‍යක්ෂ ඖෂධයකි. මේ ගස් වල අමු කඩල ඇට ප්‍රමාණ ගෙඩි සැදෙයි. ඒ අමු ගෙඩි නිල් පැහැයෙන් සහ ඉදුන විට කළු පැහැයෙන් ද යුක්ත වෙයි.

ගෙඩි කළු සහ සුදු පාට ඇති අංකෙන්ද වර්ග දෙකක් තිබේ. එහෙත් දෙ වර්ගයේ ම ගුණ එක සමාන යි.

අංශුක – කොල්ලම් කොළ, කොකුම්

අංශුක කණ්ටක-(තීක්ෂණ කණ්ටක)ධන්වයවාස,මේ ද්‍රව්‍යය වෙනුවට අපේ රටේ ගන්නේ හාල් කසබිලියා (දිවැල් කහබිලියා) ය.

අංශුධර-වරා ගස

අංශුපති

අංශුපති-වරා ගස

අංශුපර්ණී- (අංශුපර්ණිකා) අස් වැන්න

අංශුමත්-සෝ ම ල තා ව. සොම් වැල, හෙම්ලිය

අංශුමත් ඵලා-කොසෙල් ගස

අංශුමතී-ශාලපර්ණී,(සල්වැන්න)

අංශුවත් ඵලා-කොසෙල් ගස

අංසුමියතී-අස්වැන්න, පුස්වැන්න

අංශ්‍රිප-ගස, රුක, වෘක්ෂය

අංශ්‍රිසකන්ධ-පඳුර, = (ගු ම් බ ය = ගොමුව)

අක්-බුළු, ඇස්, ගස් මුදුන, පියා ගස, එඩරු ගස

අකක-වරා ගස (අකී)

අකකනාල-වරා දඬු

අකකාපාත-බොහෝ විට ගල් උඩ වැවෙන තද දිය ගතියකින් යුත් කොළ පැලවෙන,පිලිස්සුන තුවාල වලට සහ අශ්මරි රෝග යට ප්‍රත්‍යක්ෂ ඖෂධයකි. පතොක් වර්ගයට අයත් මේ පැලැටි යේ කොළ අඟලකින් $\frac{1}{8}$ ක් පමණ ඝණ ය.

අකෙකා-වරා ගස

අක්ක්‍රකකරා-අක්කර පව්ටා

අක්ක්‍රා-අක්කරපව්ටා

අක්ක්‍රාන්තා-හෙළ බටු ගස, බටු ගස

අක්ක්‍රා පටු-අක්කර පව්ටා

අකඛ-බුළු ගස

අක්තුරු-බුළු ගස

අක් පතුරු-බුළු ගස

අක්පුෂ්ප-බුළු මල්, යොන් තුඹ

අක්බෝ-බුළු ගස

අක්මැලි-අක්මැල්ල

අක්මැල්ල

අක්මැල්ල

අක්මැල්ල-කෘෂණාර්ජක

Spilanthes Acmella

මෙය දකුණු ඇමෙරිකාව ජන්ම භූමිය කොට ඇති තද දිය ගතිය සහිත දඬු හා කොළ වලින් යුත් පැලැටියකි. මෙහි දඬු හා කොළ වල යට පැත්තේ රේඛා කිළිටි රත් පාඟයෙන් පැහැපත් ය. තුර්කි තොප්පි වැනි ක්‍රමයෙන් සිඟින් ව හා උස් ව යන මේ පැලැටියේ සෑදෙන කඟ පාට මල් කපුරු වැනි කා වදින කර රසයකින් යුක්ත ය. දත් කැක්කුම සැදුන විට මේ මල් දත් අතර තබා රිදෙන තැන් වලට තද වන සේ විකාගෙන සිටීමෙන් එකෙණෙහිම වේදනාව අඩු වෙයි. මේ පැලැටිය සෙම් රෝග - ඉදිමුම - දත් කැක්කුම් යන ආබාධ වලට ඖෂධයක් වශයෙන් යොදති.

අක් මුල් නැති වැල්

අක්ෂුණ

අක් මුල් නැති වැල්- මේය පොළවේ පැලෑ ගසක් හෝ වැලක් සිදුරු කරගෙන එහි රසය උරා බොමින් පොළවේ සම්බන්ධය හැර වතුපාළු වැල් උඩ වැවෙන මල් හා ගෙඩි ඇති පෝල් ඉරටු පමණ මහත කදකින් යුත් වැල් වර්ගයකි. ඉදිආප්ප මෙන් සණ්ණ වතුපාළු වැල් උඩ ම වැවෙන මේ වර්ගයෙහි වැල් වල කෙදි මිස කොළ පාහැදිලිව පෙනෙන්නට නැත. වතුපාළු වැල් වැනසීමට සුදුහාව ධර්මයෙන් ලැබී තිබෙන දායාදයක් වූ මේ වැල් සහ සහ කොළ පාට්ටින් යුත් දෙ වර්ගයක් තිබේ.

අක්ලිකා-අවරිය රැකඅක්සත-වී පොරිඅක්සය-පුළු ගස, කලා තුනඅක්සිරෝ-උළුවා හාල්අක්සීර-මුරාංගා ගසඅක්සීව-මූදු ලුණුඅක්සු-බුලු ගසඅක්සොත්තා-තෙල්ලිඅක්සෝට-බුළු, (අඹෝට)අක්සෝල ඇට-ඉහිනි ඇටඅක්ෂ-සුවස ලුණු, බුලු ගස, තුන් කලද, රුද්‍රාක්ෂ වෘක්ෂය, දෙවි මහරි ගස, පියල් ගසඅක්ෂක-බුලු ගස, කොබ්බි ගසඅක්ෂකබීජ-සුදු අලරිය =(හෙළ (සුදු) කණේරු)අක්ෂකාරිකා-කෝමාරිකාඅක්ෂගන්ධිනී-මහ බැවිළඅක්ෂත-සාල්, වීලඳ, බැදි හාල්, බුලු ගසඅක්ෂතණ්ඩුලා-නිදිකුම්බඅක්ෂතා-කහුළු සුහු =(කකීටක ශ්‍රිඛණි)අක්ෂතෛල-බුලු ඇට තෙල්අක්ෂධර-ගැට නිවුල්අක්ෂධූතී-ගැට නිවුල්අක්ෂපිණ්ඩ-සංඛපුෂ්පී (සඛ්මල්)අක්ෂපීඩ-කසඹිලියා වැල්අක්ෂභ්‍ය-සුවස ලුණුඅක්ෂර-සැබෝ ගස, ජලයඅක්ෂව ප්‍රමෝදනී-දිවුල් ගස, හෙළ බටු ගසඅක්ෂවීර්‍යවත්-එළ කණේරුඅක්ෂය්‍ය-දිවුල්, ගිවුලු (ජිවුල්)අක්ෂශාඛ්‍ය-දිවුල්, ගිවුලු, සුවසලුණුඅක්ෂාර-සවිඳ ලුණු, කොතඹුරු (කොත්තමල්ලි) යව, මුංඅක්ෂාර ලවණ-සවිදලුණු, මූදුලුණු, හෙළ කිහිරි, යව, මුං, තල, කොත්තමල්ලි, කිරි, ගිතෙල්අක්ෂික-මිරිකුළු, (මුරාංගා) සැවැන්න, මූදු ලුණු, රත් කිහිරිය වෙසෙසක්, (පතහි)අක්ෂිතුත්ථ-රිදී තුත්තම්අක්ෂිපිඩක-යක්ඛේරියඅක්ෂිපිලක-යක්ඛේරියඅක්ෂිපිලු- මහා නිම්බ, වල් බිම් කොහොඹ (ලුනුම්දෙල්ල)අක්ෂිප්‍රසාධන-ලොත්, හෙළ ලොත්අක්ෂිප්‍රසාධනී-අවරිය, බේරුඅක්ෂිබ-මිරිකුළු, (මුරාංගා)අසු ගස්අක්ෂිහෙෂජ-ලොත් වෙසෙසක්අක්ෂිහෙෂජ- කසිස්, මස්බැද්ද, (මැඩහතු)අක්ෂික- පතහි ගස (393 පිට බලන්න)අක්ෂීර-මූදු ලුණු, ලුණු, උලුවාහාල්අක්ෂීව-මුරාංගා, මූදුලුණු, අහුගස, අහුනු ගසඅක්ෂු-බුලු ගසඅක්ෂුක-කොල්ලම් කොළ, (තමලු පත්) තමාල පත්

අක්ෂුර අග්නි පුෂ්ප

අක්ෂුර-නීරමුල්ලිය, (ඉකිරිය=කටු ඉකිරිය = කොකිලාක්ෂ)
අක්ෂෙත්‍රා-නෙල්ලි (ආමලකී)
අක්ෂෙය-වරා ගස
අක්ෂෙව්‍ය- ගල්පියල් ගස, (ගල් මොර ගස) වත මොර ගස
අක්ෂො-මොර ගස, (පියා ගස)
අක්ෂොහාර-රට ඉඳි ගස
අක්ෂෙෝට-ගල් පියල් (මොර) ගස
අක්ෂොඩ-ඉඟිනිඇට, ගල්මොරගස
අක්ෂෙෝල-මොර, මස්මොර, ඉඟිනි ඇට
අක්ෂෙෝලික- සාතාවාරිය, අමුක් කරා, කවෙළු, කිරි කවෙලු (කා කොලී=ක්ෂීර කාකොලී) මොර ගස
අක-වරා, මදටිය දෙක හමාරක හෝ වීඇට විස්සක බර, බාගය, තුන් කලද, බුළු ගෙඩිය, සුවස ලුණු
අකටපි-වානේ (ලොහ වගීයක්)
අකර (අකරා) -නෙල්ලි
අකකීර-අක්‍රූට්ටා
අකිත්-ගැටපිච්ච (යොහොඹු)
අකිතත්-කලුකැම්මේරිය
අකිල්-අගරු, අගිල්
අකිල්කට්ටෙයි-අගිල්, අගරු
අකුව-අසමෝදගම්
අකුප්‍ය-රන්, රිදී
අකුර-දලුව, ෑලය
අකුරු පස-නුග, බෝ, දිඹුල්, ඇස තු, පුලිල යන පස් වගීයේ දළු,
අකුලී-රණවරා
අකොට-පුවක් ගස
අඛව්ව-ගල් පියල් (මොර) ගස
අඛිලිකා-නින් කරිමිල වැල
අගනිජාලා-මල ඉත්ත. (මලිත්ත= මලිත)

අගනිමන්ථ-සිහින් මිදි
අගනිමාලි-අක්මැල්ල
අගනිසඤ්ඤිත-රත්නිවුල්
අග්නි-ගිනි, රත්නිවුල්, දැත්ත
අග්නික-නිවුල් (රත් නිවුල්), බැවිල, කේසර බැවිල, වැල්බැවිල, බදුල්ල, අසමෝදගම්
අග්නිකදම්බිකා- දේවදාලිය වැල්
අග්නිකා- බදුල්ල, ලියනහලා, අසමෝදගම්
අග්නිකාෂ්ඨ-සාමගස, අගිල් දර
අග්නිකෘත්-කජු ගස
අග්නි කෙත-රන් මහනෙත් (රතු පුල්)
අග්නි ගර්භ- අග්නිජාර වෘක්ෂය, සාම ගස
අග්නි චක්‍රක- සෙන් කොට්ටම්, බදුල්ල
අග්නිජ්වාලා-සිවිය, ඇත්වගපුල්, මලිතා මල්
අග්නිජ- අග්නිජාර වෘක්ෂය, බදුල්ල ගස
අග්නිජිහ්වා-ලියනහලා(නියහලා)
අග්නිදමන-නිණ්ණිහිරිය
අග්නිදමනී-මිදි, සිහින් මිදි
අග්නිදීප්තා-දුදු වැල්
අග්නිදීපන-බක් මී, මහ බක් මී, ලුණුවරණ ගස්
අග්නිදීප්‍ය-රත්නිවුල්
අග්නිධමන-වල් කොහොඹ, මහා නිම්බ වෘක්ෂය (ලුණු මිදෙල්ල ගස)
අග්නිනියාස-අග්නිජාර වෘක්ෂය, =(පශ්චිම සමුද්‍ර ප්‍රදෙශයෙහි හට ගන්නා ඔසු වෙසෙසක්)
අග්නිපාලින්-නිවුල් ගස
අග්නි පුණ්‍ය-මුවකිරිය
අග්නිපුෂ්ප-මුවකිරිය(සෝමලතා)

අග්නිඵලා-දූදුවැල්
අග්නිබීජ-මහමිදි
අග්නිභ-රත්‌රත්
අග්නිභා-දූදුවැල
අග්නිභාස-කොකුම්, දූදු
අග්නිමණ්ඩි-සූයඝීකාන්ත ගස
අග්නිමථන-මහමිදි
අග්නිමපිනී-සිහින් මිදි
අග්නිමන්ථ-මිදි, සිහින් මිදි
අග්නිමූසූරක-අසමෝදගම්
අග්නිමාල-රත්නිවුල්
අග්නිමාලි-රත්නිවුල්
අග්නිමූඛ- බැමිනිරිය, බදුල්ල, සෙන්කොට්ටම්, කොකුම්, කලු වැල්, ලියනහලා
අග්නිමූඛ ලවණ- නිවුල්මුල්, තිපල්, දුන්ත මුල්, තිරිස්සවාලුමුල්, කොට්ටම්
අග්නිමූඛී-සෙන්කොට්ටම්, බදුල්ල, ලියනහලා, රසකිඳ, තිප්පිලි
අග්නියව- ගල්කුරපලා, යාපුර
අග්නිරන්ධ්‍ර-කොබුගස, කෝන්ගස
අග්නිරෝහිණී- මාංශ රෝහිණී වැල,(ලේවැරුල්ල) තුන්දෙසින් උපදනා රෝග විශෙෂයක්
අග්නිවත්‍ර-බදුල්ල, නිටොල්
අග්නිවල්ලභ-දුම්මල, සල්ගස,හල් දුම්මල
අග්නිවිවර්ධන-කොරාසානි
අග්නිවීජ-සිහින්මිදි
අග්නිසාර-රසඳුන් (රසාඤ්ජන)
අග්නිශිඛ- කොකුම්, ලියනහලා, සිරිලගස, නිවුල් ගස, කිඩාරම්, ලාඛලී වෘක්ෂය
අග්නිශිඛා-ලියනහලා, කොකුම්
අග්නිශෙඛර-කොකුම්, වනුක්, ලියනහලා, නිටොල්ගස
අග්නිෂ්ටෝම- සෝමලතාව= (මුව කිරිය)

අග්නිසමභව- වනුක්, අග්නිජාර වෘක්ෂය
අග්නිහානි-මන්දාග්නිය
අග්නිහොත්‍ර-ගිතෙල්
අග්නෙය-- පළිඟු (සූයඝීකාන්ත පාසාන)
අග්‍රගන්ධ-අක්මැල්ල
අග්‍රගන්ධක-බෙලි (බෙලිගස)
අග්‍රජා-වල්ගාමිරිස්,(රාහැණිය) එල්වලු (එලවාළුක)
අග්‍රපර්ණි-වඳුරු මෑ
අග්‍රපුෂ්ප-හෝපලුමල්, (නොමුවහු)
අග්‍රඵල-කුඹුක්ගස
අග්‍රබීජ-රත්වන් කටුකරෝෂණ
අග්‍රලොහිත-සුලුකුර
අග්‍රව්‍රීහි-ඌරාහැල් (වී වගීයක්)
අග්‍රපා-තිපල්(අරලු, බුළු, තෙල්ලි)
අඟන-හෝපලුගස, දියපරඬලා
අඟුනු-අඟුන (අඟුන වගී තුණකි. රැකඟුන (ගස්) තින්ත අඟුන (වැල්) සහ කිරි අඟුණ (වැල්) කියා ය. මෙයින් රැකඟුන ගස මහත් ගුප්ත බලයක් ඇති තේ ජාන්විත දුර්ලභ වෘක්ෂයකි. ඒ ගැණ ඡායාරූප සහිත විස්තරයක් 406 වැනි පිටෙහි ඇත.අනික් වැල් දෙවර්ගය කෘමි රෝග හා විෂනාශක ඖෂධ වගී වෙති. තිත්ත අඟුන වැල් බරවා රෝග යට ත්, කිරිඅඟුන වැල් වියරු බලු විෂට ත්, ප්‍රත්‍යක්ෂ ඖෂධ වගීදෙකකි.මේදෙවගීයේ කොළ මැල්ලුම් වශයෙත් සතියකට දෙවරක් වත් ගන්නේ නම් ශරීරයට හිත කර ය. නීරෝගී භාවය ද ගෙණ දෙයි.
අඟුරැලි වී-වී වගීයක්
අඟුරු-සුවඳ අගිල්, මුරුංගු

අහුරැසිංසපා

අහුරැසිංසපා- ඉන්සලු ගස, ඇට වේරිය ගස
අහුලු-තැල්වැල් (තැල්වැල් ගැණ විසතරයක් 215 පිටේ ඇත)
අහුළු-මත්ස්‍ය විශෙෂයක්
අහුළුවැල්- එගහවලී නම් ලතා විශෙෂය, කිඳිවැල්, අහුණවැල්
අග-ගස, පර්වතය
අගජ-ගල්සෙවෙල්
අගඩබීජ-අඹ ඇටය
අගඩා-කුඩුලු දෙහි(ගඩාදෙහි)
අගඩී-බුලු හෝ තොවිල ගස්
අගත්ති- කතුරැමුරුංගා, වේලා, පිලගස
අගද- ඇත්තෝරගස, කොට්ටම්, අඹ, විෂ, ඖෂධය
අගදවාප්‍ය-කොට්ටම්
අගදබීජ-අඹ ඇට
අගන්ත-කසඹිලියා වැල්
අගන්ත පබුලුව-ගස් කහඹිලියා
අගස්ඛික-සුවසලුණු
අගම්‍ය-දේවදැලියවැල්
අගරි- මාන්දම්-බාලයන්ට සැදෙන රෝගයක්
අගරි-දේවදැලිය වැල්, විෂ
අගරු-කලුඅගිල්,සුවඳ අගිල්, කලු වැල්, මී විෂ නසන ඖෂධයක්. අගිල්, සඳුන්,
අගරුක-කලුවැල්, කලු අගිල්
අගරුචූණී-අගිල්සුණු
අගරුසාර-කලුඅගිල්, යකඩ,
අගරොන්-නිණිපුපුරු (ගිණිපුළිඟු)
අගල්ආදුර-ආඩතෝඩා (වැටහිර= වංඇපල)
අගල්පසඟ- ආඩතෝඩා පඤ්චාඩගය
අගළු-අගිල්=(අගරු)

අඩෙකාල

අගස්ති-කතුරැමුරුංගා, වේලාගස
අගස්තිකා- හෙළ කතුරැමුරුංගා ගස
අගස්තිද-හෙළ්කණේරු, කුකුරුමාන්, (කුකුරැමුවන්)
අගස්ත්‍ය-මුරුංගා ගස
අගස්ත්‍යාහව-හෙළ කණේරු, රත් කතුරැමුරුංගා ගස
අගාඩමොහිණී-දේවදැලියවැල්
අගිර-රත්නිවුල් ගස
අගිල්-කළුවැල්, (කාලාගරු)
අගුකර්ණී-මීනුගවැල, මීකන්පලා, ගොටුකොළ
අගුරු- ඇට්වේරිය, අගිල්, සුවඳ අගිල්, එන්සාල් ගස
අගුරුගන්ධ-පෙරැම්කායම්
අගුරුශිංශපා-ඇට්වේරිය ගස
අගුරුසාර-කලු අගිල්, යකඩ
අගුරුසාරා-ඇට්වේරිය ගස
අගුඩ-සුදු එරඹු ගස
අගුඩගන්ධ- පෙරැම්කායම්, කස්තුරි, සුදු ලුහුනු
අඝන-දීකිරි, (මිදිච්ච කිරි)
අඝාට-සැබෝ
අඞ්කන-රාකහුණ ගස
අඞ්කු-කීකිරිදිය
අඞ්කුට-පයේ මාපට ඇඟිල්ල
අඞ්කුර-මූලබීජය= (මොටෙයියා, කොන්ඩිය, පැළැටිය)
අඞ්කුරපත්‍ර-ඉළුක්, පැළැටිය
අඞ්කුරබන්ධුක-කාවලුණු
අඞ්කුශාවාස-කොල්ලම් කොළ
අඩෙකාන්ද-අංකෙන්ද ගස
අඩෙකාල්-වැල්අහුණ දෙවර්ගය
අඩෙකාට-රාක්අහුණ, පුවහු
අඩෙකාලල-දේදැරු (සුරදැරු)
අඩෙකාල රාකහුණ, පළොල්, පුවහු

අඬගඟුන

අඬගඟුන-ශරීර වේදනාව
අඬගජ්-ලේ, කෙස් (හිසකේ)
අඬගජ්වර-රාජයක්ෂ්‍මා රෝගය
අඬගජා-තුන්ලෝවිජය, (කංසා)
අඬගදඟුන-ශරීරයෙහි දූවිල්ල
අඬගනා-පුවහු ගස, වම්බොටු
අඬගනාදිය-හෝපලු(අශොක)
අඬගනාප්‍රිය- හෝපලු මල්, පුවහු, රැකහුණ, කිණිහිරි, අරුඳ
අඬගපානක-පිතෙන් උපදනා රෝගයක්
අඬගප්‍රිය-කැකිරි, කෝවක්කා
අඬගභඬගිනී-මිදිගස, මුද්‍රප්පලම් වැල
අඬග භෙදන-පුස්වැන්න
අඬගරක්ත-කුඩුවෙලඟ ගස
අඬගරිය-ලියනඟලා වැල
අඬගසාර-සිංසපා, (ඇට්ටේරිය)
අඬගසුන්දර-ඇත්තෝර ගස
අඬගලෝහිත-අඹුඉහුරු
අඬගවසෙන්‍රාන්ථා-සුදු අසමෝදගම්
අඬගවිකුර්ති-අපස්මාර (මීම ස් මොර) රෝගය (අවයව වෙනස් වීම)
අඬගශොඵ-ඇඟ ඉදිමීම
අඬගසෙන-කතුරු මුරුංගා ගස
අඬගාරක-කිකිරිඳිය, රන්වන් කටුකරඹු, අහුරු
අඬගාරකා-අහුරු (අඬගාර)
අඬගාර පුෂ්ප-අහුන ගය (අහුන කරගස)
අඬගාර මඤ්ජරී- සිරිතේක්කු, කරඳ ගස, ඔලිඳවැල්
අඬගාරමඤ්ජී-මඟ කරඳ ගස
අඬගාර වර්ණී-සිරිතේක්කු
අඬගාර වල්ලරී-මහුල්කරඳ, හුනිඳ

අවඥානපත්‍ර

අඬගාරවල්ලි-හඟුලු, ඔල්ඳ, සිරිතේක්කු, රත්කරඳ
අඬගාරවල්ලිනී-තැල්වැල්
අඬගාරවෘක්ෂ-අහුන ගස (අහුන කරගස)
අඬගාරවෙණු-රතුඋණගස් වෙසෙසක්
අඬගාරා-අහුණ ගස (අහුන කර ගස)
අඬගාරී-ලියනඟලා වැල
අඬගාරිකා-අහුරා, වැලුක්, මල් කැකුල
අඬගාරිත-කැල, මල් කැකුල
අඬහුන-වම්බොටු
අඬහුල-එරඬු ගස (නවඟිලිගස)
අඬහුලි-(තුන්පත්) පුළිල
අඬඹ්‍රී-ගස්වල මුල්,(පතුල=පාදප=පේ)
අඬඹ්‍රිග්‍රන්ථික-නිප්පිලිමුල්
අඬඹ්‍රිනාමක-රුක්මුල, දමනක වෘක්ෂය
අඬඹ්‍රිපර්ණී-පුස්වැන්න, (පෘෂ්ණිපර්ණී)
අඬඹ්‍රිබලා-පුස්වැන්න
අඬඹ්‍රිවල්ලිකා-පුස්වැන්න
අඬඹ්‍රිසඤ්ඣ-ගොප්ඇටය
අඬඹ්‍රිසන්ධි-ගොප්ඇටය
අඬඹ්‍රිෂ-තල්ලේ උපදින රෝගයක්
අව්වාරු-ලූනු, මිරිස්, අඹ ආදිය එකට දමා කාඩි (විනාකිරි) යෙන් පැසවා ගත්තා, අමු ආහාර (පැහි) වෙසෙසක්
අවඡ-පබලු (ප්‍රවාල)
අවඡල-තලින් කළ කල්කය
අවඡාන පණිකා-සිරුස්ස
අවඡින්න පත්‍ර-ගැට නිවුල් ගස, කොළ ඇති ගස

අවජුක-කොබ්බ ගස, රංජන පුෂ්ප වෘක්ෂය
අවිජ්‍යුතාවාස-ඇසතු රැක, (බෝ) දිඹුල් ගස
අව්‍යතා-අරලු, (හරිතකී)
අවලජගු-අවල්ගුජ, (බෝදි ඇට)
අවරණා-යෝනිරෝග විශෙෂයක්
අවලපාසාන-ගල්කාන්දම්
අවාරියා පලු-ව දු රා මෑ වෙ සෙ සක් (අවර)
අවිර පල්ලව-රුක්අත්තන ගස
අජජුක-නෙළ අදු (තලා වගීයක්)
අජජුන-කුඹුක් ගස
අජ්ඣිටා-පිටවක්කා=(බිම්තෙල්ලි =නවනැඹිලිය)
අජ-මැඩහඳු, සන්නිය
අජඅං-මැඩහඳු(මෙෂශෘඞ්ගි)
අජකර්-එළුකිරි
අජක-සිහින්තලා, වේලා ගස,සුළු කුඹුක්
අජකණී-සුලුකුඹුක්
අජකණීක-පියාගස, හල්ගස
අජකව-වේලාගස, රත්මානිස්ස
අජකා-නේත්‍ර රෝග විශෙෂයක්
අජකාජාත-නේත්‍ර තාරකාවෙහි ඇතිවන රෝගයක්
අජකෙශී-අවරිය ගස (නීලිකා)
අජග-වේලා, වේලිප්පරිත්ති
අජගද-රම්මානිස්ස
අජගන්ධ-අමුක්කරා, වේලා, රම්මා නිස්ස
අජගන්ධා-අසමෝදගම්, වේලා ගස
අජගන්ධී-වේලා ගස, මස්බෑද්ද
අජගන්ධිනී-මැඩහඳු වැල
අජගල්ලිකා-වේලාගස,බාලරෝග විශෙෂයක්
අජඝොෂ-සන්නිපාත ජ්වර විශෙෂයක්, වේලිප්පරිත්ති
අජටා-බිම්තෙල්ලි (පිටවක්කා)
අජඩා-වඳුරුමෑ, බිම්තෙල්ලි
අජතෙක්ක-වැටකොලු
අජථ්‍යා-බෝලිද්ද
අජදණ්ඩී-බ්‍රහ්මදණ්ඩී වෘක්ෂය
අජනික-වංඇපල (වැටහිර)
අජනිකා- අඩනහිරිය, (භූම්නාදැ)
අජතිකෙශිකා-බේරා,තෙල්බේරා, වැල්තිබ්බටු
අජපල්-කොට්ටම්
අජපාද-ගල්කප්පරවල්ලිය
අජපාලක-උපුල් කොළ
අජපොටා-වල්ඉද්ද
අජප්‍රියා-සෑමගස්, හැලඹ, ඩෙබර, (මසන්)
අජබලා-කලු තලාගස
අජභක්ෂ-සීනියාගස
අජමොද-(අජමොදැ) අසමෝදගම් =(අජමෝදගම්, = ආදිමෝදගම්, =ආදිමෝජගම්)
අජයා-කන්සා
අජර-රත්රත් (සවණී)
අජරා-කෝමාරිකා, ව දු රා මෑ, කෘෂ්ණවෘඩ්ධදාරුලතා(වෘඩ්ධදාරු =ගිරිතිල්ල= මාඛණ්ඩා වැල්)
අජරී-විෂ සහිත අලුවගීයක්
අජලිකාරිකා-නි දි කු ම් බා වැල්, (ලජ්ජාලතා)
අජලිනාමක-පුවඟු, රා ක ඟු ණ (ගස් අඟුණ)
අජලොමා-එලු ලොම්, රත්වන් කිකිරිඳිය, වඳුරා මෑ
අජවල්ලි-මැඩහඳු (වේ ලි ප් ප රින්නි
අජශෘඞ්ගිකා- (අජශෘඞ්ගී) මැඩ හඳු, කකුටකශ්‍රිංගී

අජශී අටරෙ

අජශී-සීනක්කාරම්
අජසිඟු-මැඩගහු, (අජශෘඞ්ගී)
අජහරණ-ආඩතෝඩා, (වංඇපල)
අජහා-වඳුරා මෑ (වාජීකරණ බෙහෙතක්)
අජාඝී- කොට දිඹුලා ගස (විෂ කුම්භ)
අජාගර-කීකිරිඳිය
අජාජී-දුරා, සිඟින් දුරා, කොට දිඹුලා ගස
අජාජීකා-දුරා, (සුදුදුරා, කළුදුරා)
අජාදනි-කහඹිලියා, වැල් කහඹිලියා
අජාප්‍රසි-නියඳ (සර්ප විෂ නාසක ඖෂධයක්)
අජාප්‍රියා-ඩෙබර (මිසත්)
අජාලොම්-රත්වන් කීකිරිඳිය
අජාග්වා-වඳුරු මෑ
අජීර්ණ ග්‍රහණී-අ ජී ර් ණ ය හා ග්‍රහණීය
අජීර්ණ හරණ-නිහුරු පියලි
අජීර්ණ මාන්දම්-අජීර්ණය සහිත මාන්දම
අජීර්ණ රෝජා-අජීර්ණයෙන් ඇති වන රෝජාව
අජෙය-කුඹුක් ගස (අර්ජුන)
අඤ්ජන-අඳුන්, වි ෂ් ණු ක්‍රා නති, මයුර තුතු
අඤ්ජනකල්ලූ- ර සා ඤ්ජ න (රස දුන්)
අඤ්ජන නාමිකා-ඇසිපියෙහි හට ගන්නා පිළිකාවක් (නගතය)
අඤ්ජනමසි-අඳුන් (අඤ්ජන)
අඤ්ජනවිත්-අඳුන් දමන ගුලාව (කොපුව), කුඩා භාජනයක්
අඤ්ජනාදි ගණය-රසඳුන්, හොය දුන්, පුවහු, නා කෙසරා, පියුම් කෙසරා, වැල්මී යන මේ ගණය

පිත්, ලේ, විෂ, දූවිලි නසන් නේසි.
අඤ්ජනාදිකා-නිල් කපු ගස
අඤ්ජනාවතී-කලු කපු ගස
අඤ්ජනාග්වයා-විෂ්ණුක්‍රාන්ති
අඤ්ජනික-අරත්ත
අඤ්ජනිකා-නිල් කපු ගස
අඤ්ජනී-කටුකරෝහිණී, කලුකපු ගස, සේරා ගස
අඤ්ජලී-පලම් හතර, පත, රාත් තල් බාගය
අඤ්ජලිකාරිකා-දඬින්නරා, (වැල් මදට හෝ නිදිකුම්බ)
අඤ්ජලිකා-නිදිකුම්බා ගස
අඤ්ජලිනාමක-පුවහු ගස
අඤ්ජීරා-අත්තික්කා
අඤ්ජීර-කොටදිඹුලා ගස
අටාකොඞ්-මුවකිරිය
අටික්කා-දිඹුල් (උදුම්බර)
අටිල-අෂ්ඨිල =(වාත රෝගයක්)
අටිලය-ඇට (ඇට කටු)
අටුප්පු- අවලුණු (සවිද, සුවස, කලු, මුහුදු, පාංශු, බළල්, ඊද් නිද, රෝම) යන ලුණු අට වගී ය.
අට අක-කලද (මදටිය විස්සක බර)
අටගුණ-ඉඟුරා, (මහෞෂධ)
අටබෙර-අරක්කු (අකී)
අටමහාරෝග-වාත,ප්‍රමේහ,කුෂ්ඨ, අර්ශස්, භගන්දර, අසම්මරි,මූඪගර්භී, උදර යන රෝග අට
අටර-පලම් දහ අට
අටරූඛ- (අටරූෂ=අටරූෂක=වං ඇපල=අගල් ආඛාර = වැටකිර)
අටරෙ-කොඛ්බෑගස(කොඛ්‍යාගස)

අ මලුණු

අටලුණු-(අට්ටුපපු) ලුණු අට වර්ගය (9 පිටේ විස්තර කර ඇත)
අට්යල්-එරඬු ආදී ඇට වල මිදි
අඩ-බාගය (පංගුව=කොටස)
අඩක-පලම් හැට හතර
අඩ කලස-පලම් හැට හතර
අඩගජ-පෙති තෝර
අඩඟ-තිරිඟු (ධාන්‍ය වර්ගයක්)
අඩප්පර-කම්මුල් ගාය, ඇකත් සාව හෝ ගව බළු ආදි තිරිසන් සතුන්ට සැදෙන කටින් සෙම දමා ඇස් වපර (උඩ ඉන්දී) වී ඇලයට වැටී වෙවුලන මාරාන්තික රොගය
අඩපලම-කලං ඔස
අඩමතා-නැලිය, පලම් දහසය
අඩස්සි මාන්දම්-අඩස්සිය සහිත මාන්දම් රෝගය
අඩස්සිය-හිරවීම, තුන් දෙස නිසා මල මූත්‍ර හිර වීමෙන් වන රෝගයක්
අඩසද-පෙනෙල වැල් (අඩිවඳුරා)
අඩහු-දෙල් (ලබුජ)
අඩණහිරිය-යක්ඛේරිය
අඩහැර-අඩන හිරිය, ලුණුවිල
අඩුකකුසෙම් පරතිපු-වද මල්, බදු වද මල්
අණඩ-බිජු, (බිත්තර)
අණඩග-තිරිඟු (ධාන්‍ය වර්ගයක්)
අණඩගජ-පෙති තෝර ගස
අණඩජ-කස්තුරි (මෘග මද)
අණඩපණී-ලූනු පැල
අණඩහසතීන්-තෝර ගස
අණඩිකා-මුං, (මුං ඇට)
අණුමුණ්ටි- වල් කොහොඹ, ලුණු මිදෙල්ල ගස
අණුමේවතී-දැන්ත ගස
අත්-එරඬු (එඩරු ගස)

අනිකණට

අත්කසා-කැමට ගන්නා කහ
අත්තන-සළු අත්තන, හෙළ අත්තන, තුන්බෝ අත්තන, රට අත්තන යනි වර්ග කීපයකි. ඇතැම් සිංහල වෙද පොත් වල **උමතු, මතු මත්තා** යන නම් ද අත්තන වලට ව්‍යවහාර වී ඇත.
අත්ති-අත් නි ක් කා, (දිඹුල්=එදුම්බර)
අත්තෙල්-අත් යනත්‍ර වලින් හෝ කැකැරවීමෙන් සිඳ ගන්නා තෙල්
අත් පත්‍ර-අත්තන
අත් පෝටය-වැල් ඉද්ද
අත්වන-රුක් අත්තන (හත්වන)
අත්සුණු-අග්ගලා වර්ග
අත්‍යගන්ධා-වච්චනාවි (කාල කූට)
අත්‍යච්ඡදන-මඟ කපු
අත්‍යන්නසුකුමාර-පද්ම බීජ, වරා සාල් (වරක නම් ධාන්‍ය විශේෂය)
අත්‍යම්ලපණී-වල් දෙලුම්
අත්‍යම්ලා-සි ය ඹ ලා, ලප්නාරං (සිදරත්)
අත්‍යාකී-එළ වරා ගස
අත්‍යාල-රත්නිවුල්
අත්‍යුහ-කලු මල් සේපාලිකා
අතන්විලිඳි-හරක් ලෙඩක්
අතපත්තා-අත්තන
අතවි ජම්භීර-ව ල් දෙ හි, (ව න දෙහි)
අතස-එළ ඊතණ, කුසතණ
අති උග්‍ර ගන්ධා-අසමෝදගන්
අතිඋඩයන්-අතිවිඩයන්(අතිවිෂා)
අතික්-යොහොඹු (ගැට පිච්ච)
අති කටුක තික්තක-සත ගස
අතිකණට-හින් ගොකටු, කහඹිලියා, (සවාස-තී ක්ෂ ණ ක ණ්ටක)

අනිකඝින

අනිකඝින-දුහුදු ඇට, (දූදු ඇට)
අනිකණ්ටක-ඛන්වයවාස.දුරාලභා (250 පිටේ දුරාලභා බලන්න.)
අනිකන්ද-හබරල ගස (හැනිකණ්ණි)
අනිගන්ධා-සපු ගස් (සපු මල්)
අනිගුහා- පෘෂ්ණිපර්ණී, පුස් වැන්න
අනිච්ඡත්‍ර-ඉකිරිය ගස, ගැට තුඹ, බිම්තල්
අනිවණ්ඩා-වඳුරු මෑ (කපිකච්ඡු)
අනිවරා-මැණික්වැන්න
අනිඡත්‍රක-ගැටතුඹ, රැක්අත්තන
අනිඡත්‍රා-ශතපුෂ්ප, සානාවාරිය
අනිද්‍රා-අමුක්කරා, සානාවාරිය
අනිද්‍රාවිභ-වාතරෝගයක්
අනිනිඝණ-මුරුංගා ගස, මිරිස් ආදී කුළුරස වර්ග, අසමෝදගම්
අනිතීව්‍රා-ගෙළ ගිතණ
අනිතෙජ්‍ර-(අනිතෙජනී) මුරුවා (මුරුවා දූල්)
අනිදීප්ති-සුදු මල් ඇති තලා ගස
අනිදීප්‍ය-රත්කිටුල්
අනිදුරාලභා-වඳුරු මෑ
අනිදුෂ්ට-ගොකටු ගස
අනිධවල - අනිධවලා = කුඩා හෝ මහ වතුසුද්ද)
අනින්කු-ඉන්සලු ගස
අනිපත්‍ර- (අනිපත්‍රා) තේක්ක ගස, බැවිල ගස්, මුරුවා වැල්
අනිපත්‍රක-හබරල, තේක්ක ගස හෝ වැඩිපුර කොළසැදෙන ලුහුනු වර්ගයක්
අනිපණී-අස්වැන්න
අනිපර්ණී-අස්වැන්න
අනිපරිත්ති-පෙතත් ගස
අනිපිච්ඡ-සුදු ඔතල
අනිපිච්ඡිලා-කෝමාරිකා
අනිප්‍රසර-ගොකටු (නෙරෙන්වි)

අනිශාකා

අනිප්‍රසි-නියඳ (විෂනාශනී)
අනිබලා-කොටිකන් බැවිල (අස් බැවිල)
අනිමඔගල්‍ය-බෙලි (බිල්ව)
අනිමඤ්ජුලා-පෙනි රෝස
අනිමතුරන් - වැල්මී = (අනිමදුර හෝ අදිමදරන් කියා ද යෙදේ).
අනිමදරා-වැල්මී (මධු යෂ්ටිකා)
අනිමන්ථ-සිනින් මිදි
අනිමන්දා-රබන්නිටුල්
අනිමුක්ත-යොහොඹු, (ගැටපිච්ච)
අනිමුක්ත- ගැටපිච්ච (යොහොඹු වැල්) කොබ
අනිමොදනී-සිනිද්ද ගස
අනිමෝදා-සිනින් මිදි, සිනිද්ද
අනියුක්ත--යොහොඹු (ගැටපිච්ච)
අනිරක්ත-නිහුල් (සාදිලිඛම්)
අනිරක්තා-වද ගස
අනිරස-මස්බැද්ද, දූප වගීයක්
අනිරසාඤ්ජනී-මුරුවා වැල්
අනිරුහා-මස්වැන්න
අනිරෙවක- කවෙලු (කාකොලී) අෂ්ටක වර්ගයට අයත් ඔසුවක්
අනිරෝග-රාජයක්ෂම රෝගය
අනිලම්බී-භානාවාරිය
අනිලිප්තා-රසකිද (කිදිවැල්)
අනිලුහා-පුස්වැන්න
අනිලෝහිත ගන්ධ-දමනක වෘක්ෂය
අනිවරා- පුස්වැන්න, මැණික් වැන්න. ගොඩපියුම් (එක් පෙති පියුම් = මීතඔර)
අනිවිඛයත්-ඉවද, (අනිවිසා)
අනිවිසා-අනිවිඛයත්
අනිවිසානිකා-මස්බැද්ද,(මැඩහඳු)
අනිවෘත්තපුෂ්ප-කෙසෙල් ගස
අනිවෘෂ- කකීටකශ්‍රිංගි (කුකුළු සුඟු = කකුළු සුං)
අනිවෘහත් ඵල-කොස් ගෙඩි
අනුශාකා-හීන්සාරණ(සුලු බ්‍රාහ්මී)

අනිසාරිවා-ඉරමුසු (අනන්නමූල)
අනිශුභා-අස්වැන්න
අනිශුක-යව (බාර්ලි)
අනිශුකජ-ගොධුම (ධාන්‍ය)
අනිස්කන්ඩා-(රතු) කොල්ලු
අනිසය්‍යා-වැල්මී (මී වැල්)
අනිසාම්‍යා-හුනිද වැල, වැල්මී
අනිසාර-පැපිලිය, (පත්පාඩගම්)
අනිසාරස්න-පැපිලිය
අනිසාරඝන-ඉවද, (අනිවිඩයන්=අනිවිසා)
අනිසාරහෙෂජ-ලොත්, (ලොධ්‍ර) ලුණුවරණ ගස
අනිසාරස්‍යා-රත්ත, (රාස්නා)
අනිසෙෂම්‍යා-වැල්මී (දුව මී)
අනිසෙෂරහ-අඹ හෝ මී අඹ ගස
අතුපිඩයම්-ඉවද, (අනිවිඩයන්)
අතුරුමා-අක්මාව
අතුල්වාදම්-හරකුන්ට වැළඳෙන රෝගයක්
අතුලාම්ල-අඹගස
අද්ද-අමු ඉඟුරු
අද්දක-අමු ඉඟුරු
අද්දිහුරු-අමු ඉඟුරු
අද්‍රක - අද්‍රික = ව ල් කොහොඹ හෙවත් ලුණු මිදෙල්ල
අද්‍රම්සා-මස්වැන්න
අද්‍රවා-අස්වැන්න
අද්‍රික-තොවිල, ලු ණු මි දෙ ල් ල, ගල් මද
අද්‍රිකණී-කටරොලු වැල
අද්‍රිකා-කොතඹුරු, (කො ත් ත මල්ලි) වල් කොහොඹ
අද්‍රිජ-ගල්මිද, ගල් සෙවෙල්, සිවං ගුරු
අද්‍රිජතු-ගල් සෙවෙල්
අද්‍රිජා-කුරුඳු ගස, සිංහල තිප්පිලි
අද්‍රිභූ-මීකන් පලා, කටරොළු
අදරෂ්ට්‍රා-ඇත්සැටිය (ශ්‍රී හස්තිනී)
අදරිය-ආචාරියාපලු (අවරකරල්)
අදල-මිදෙල්ල ගස, ර ණ ව රා, කෝමාරිකා
අදස්න-අඹ (සමීප=සිඳ්ධාර්ථ)
අදූ-සතකුප්ප (ශතපුෂ්ප)
අදූරිකා-කිණිහිරි ගස
අදූරිපළු-ආචාරියා පලු (අ ව ර කරල්)
අදික-ගල්මද, මිහ කොහොඹ
අදිකර්ණ-කටරොලු
අදිමංස-ඇස්, විදුරුමස් යනාදි යෙහි හැදෙන මස් දළු
අදිමදිර-අදිමදිරන් =(වැල්මී)
අදිමරං-වැල් නිබ්බොටු
අදිමෝද-අසමෝදගම්
අදිරන්-රසදිය
අදිරපටන්-විලඳ (ලාජා)
අදිරෂට-විලඳ
අදිෂී-වැල් නිබ්බොටු
අදිලවිට - (අදිලව්‍යා) - දුම්මල
අදිසම්භව-මුහුදු ලුණු
අදිසාර-ලෝකඩ
අදු-අදු තලා-තද සුවඳකින් යුත් සජීයින් අප්‍රිය කරණ තලා වගීයේ පැලැටියකි.
අදුතලා-තලා වගීයක් (අදු)
අදුන්-කුඹුක්, වැලිකහ, අඤ්ජන
අදුන්-[අඤ්ජන] කසට ගස, කරඳ, අර්ජුන [කුඹුක් ගස]
අදුන්මැලි-අදුන්මැල්ල ගස
අධ්‍යක්ෂ-කිරිපලු ගස, එළවරා ගස
අධ්‍යණ්ඩා-පිටවක්කා, වඳුරු මෑ

අධවගවෘක්ෂ අඬුම්මූසිකා

අධවගවෘක්ෂ-ඇම්බරැල්ලා ගස
අධවජා- බෝලිද්ද, කසාවන් බෝලිද්ද
අධවශල්‍ය-කරල් සැබෝ ගස
අධවසිද්ධක-නික ගස (සිඹුවාර)
අධවානන්තශාන්‍ව-කොටිල ගස
අධඃපුට-පියල් ගස (මොර ගස)
අධඃපුෂ්පී-කරල් සැබෝ, යොන් තුඹ, ශතපුෂ්ප
අධඃශෙඛර-එළ සැබෝ ගස
අධඃසල්‍ය-කරල් සැබෝ
අධක්ෂා-කිරිපලු ගස
අධම-ඇඟිල්වේ (ඇඟිල් ඇඹිලිය) හෝ ගොරක
අධරා-අමුක්කරා, මේවන්, හානාවාරිය
අධරාරූහ-බෙලි ගස (බිල්ව)
අධිකණ්ටක- ධන්වයවාස, දුරාලභා, යවාස
අධිකාර-දූදු වැල්
අධිච්ඡත්‍රා-ශතපුෂ්ප
අධිඵලා-අධිත ඵලා-නෙල්ලි
අධිවිශාපහා-අනිවිඩයන්
අධොඝණ්ටා-සැබෝ ගස
අධොමුඛ-ගොදිවි ගස
අධොරෙවන-ඇසළ ගස
අන්කෙල්-වැලහුන
අන්කෝල-රුකහුන
අනන්තවල්ලා-බදුල්ල ගස
අනන්තපුෂ්ප-ඇස්බැවිල
අනන්තර්මුඛී-විශ්‍රාවනයෙහි යොදන යන්ත්‍ර විශෙෂයක්
අනන්තර්වෘද්ධි-අන්ත්‍රවෘද්ධි රෝගය
අනන්තරස-නෙල්ලි
අනන්තසෙනාඵලා-එළකටු වැල් බටු
අනන්තසාර- අඳුන්, රසඳුන් (රසාඤ්ජන)
අනන්තසුසිර-වැලුක්, රඹුක්
අනන්තික-කොල්ලම් කොළ
අනන්තිකා-සනලා හෙවත් හිඟුරු වැල්
අනන්‍යක-කොල්ලම් කොළ
අනන්‍යපුෂ්ප-මලිත්ත ගස
අනන්‍යවෙශී-ගෝනල අල වගීය හෝ ගෝනකොළ.(ගෝනකොළ ගෙවල් සෙවිලි කිරීමට ගන්නා ශක්තිමත් කොළ වගීයකි. දිග අඟල් 12 ක් පමණ හා පළල අඟල් 2 වත් 3 වත් අතර ඇති මේ කොළ සෙවිලි කළ ගෙයක් දශ වර්ෂයකට වැඩි කාලයක් දිරාපත් නොවී (නොතෙමී) පවතී යි. දිය සීරාව ඇති කඳු රැලි වල හා ඇල-දෙල ආදී ජලාස අසල පඳුරු වශයෙන් මේ වගීය වැවෙයි.)
අනන්‍යාදුරි-ඇඟිල් වේ
අනන්‍රවල්ලී- සෝමවල්ලී ලතාව (සොම් වැල් = හෙම්ලිය)
අනන්‍රවෘද්ධි-එනම් රෝගය
අන්දර-අන්දර ගස්
අන්දරතාමරෙසි-දිය පරඬැල්
අන්ද්‍ර-රන්වන් වේලා
අන්ද්‍රභාසා-රන්වන් වේලා, (රම්මා නිස්ස)
අන්ද්‍රිමතූරෙසි- වනුක්, සෙන්දිරික්කා
අඬ්ක-ගස්කැලිය, කලුවර
අඬ්කනිකා-ගස්කැලිය
අඬ්කපූතන ග්‍රහ-අඬ්කපූතනා නම් යකින්න විසින් උපදවනු ලැබෙන යි සැලකූ බාල රෝගයක්
අඬ්කමූල-ඉදවිය, මාරා
අඬ්කමූසිකා-දේවදාලිය

අඞ්ඝ්-ගස්කැලිය
අඞ්ගුමූල-මහරි ගස
අන්නක්කා-අන්නාසි
අන්නග්‍රහි-අතිසාරය
අන්නජා-ඖක්කා රෝගයක්
අන්නතාලෙයි-අන්නාසි
අන්නමය-ශුක්‍ල ධාතුව
අන්නව ද්‍රවශූල-උදර රුජාවක්
අන්නාවේරිය-සු ව ද ඇ නි ගස් වර්ගයක්
අන්නාසි-එනම් ඵල වර්ගය
අන්නාසිප්පු-අනිත්ත
අන්‍යතෝවාස-නෙත්‍ර රෝගයක්
අන්‍යදූරි-ඇඟුල් වේ (ගොරක හෝ ඇඟුල් ඇඹිලිය)
අන්‍යපණ්ණි-අස්වැන්න
අන්‍යලෝහ-ලෝකඩ
අන්‍යසව-කිරිපලු
අන්‍යසංයුත-තලප, (ලේහ)
අන්‍යෙද්‍යුෂ්ක-විෂමජ්වර රෝ ග යක්
අනංශුමත්ඵලා-කෙසෙල් ගස
අනක්ක-පෙනෙල, වැල් පෙනෙල
අනග්ඝා-කපු ගස
අනග-සුදු පාෂානම්, (වෙ ල් ල ප් පාසානම්)
අනඝ්‍රිය-හෝපලු (අශෝක)
අනඩුජ්ජීව්වා-ගොදිවි ගස
අනද-දෙමට ගස
අනද්‍ය-හෙළ අඹ
අනන්ත-කහඹිලියා, නික, ඊතණ
අනන්තක-දෙඹ, බටදෙඹ, බට ගස
අනන්තමූල-ඉරමුසු-අක්මැල්ල
අනන්තමූලි-කහඹිලියා වැල
අනන්තා- හෙළ ඊතණ, යවාස, නෙල්ලි, රසකිද,ඉරමුසු, සිහින් මිදි ගස, රැක් ගොකටු, නිය ඟලා

අනන්තාස-අන්නාසි
අනමන-ඇඟුල් දෙඩම් හෝ පැණි දෙඩම්
අනල-රත් නිටුල්, බදුල්ල ගස
අනලග්‍රහ-ලියනඟලා වැල
අනලද-ජටාමාංශ
අනලනාමා-නිටුල්, රත් නිටුල්
අනලප්‍රභා-දුදු වැල
අනලවපු-ලියනඟලා වැල
අනලි-කතුරු මුරුංගා ගස, මූණ මල් ගස
අනාක්‍රාන්තා-කටුවැල්බටු
අනාගික-කලු අගිල්
අනාදරී-ඇඟුල්වේ
අනාමය-වම්මුතු, (කලාදුරු)
අනායාජක-අගිල්
අනායතිකතා-බිම් කොහොඹ

අනිත්ත — ශූවිකපර්ණී
Rhinacanthus Communis
චීනය ජන්ම භූමි කොට ඇති මෙය මහ නයි කොළ වලට මිදක්

අනින්ජිල් අප

සමාන අඩි 2½ ක් පමණ උස ට කටුකරඹු පඳුරු වැනි පඳුරු වැවෙන පැලෑටියකි. මේහි මූල්ව ලහා කොළ වල යුෂ සර්ප විෂ ට ත් කල් ගිය හොරි-දද-පණු කැවිලි-කඩුවේගත් ආදි ලේ විෂ වීමෙන් සමේ සැදෙන සියළු ම රෝග වලට ත් ප්‍රත්‍යක්ෂ ය. විශෙෂයෙන් සුවනොවන (දෙමළ)හොරි වලට මේ යුෂ ඉතා ප්‍රත්‍යක්ෂ ඖෂධයකි. අනින්ත ලංකා වෙහි ද වැවී නිබෙන පැලෑටියකි.

අනින්ජිල්-අඟුනවැල්
අනිනූනා-ඇත්බැවිල්ල, අනෝජා
අනිමුක්තක-කොබු
අනිල-තේක්ක ගස
අනිල කපිත්ථක-මහා ඇම්බරැල්ලා ගස
අනිලඝ්න-බුලු
අනිලඝ්නක-බුළු
අනිල නියර්‍යාස-පියල් ගස
අනිලරාජු-එරඬු
අනිලහර-කලු අගිල්
අනිලාටිකා-රතු සාරණ, (රතුසුළු බුරුද)
අනිලාහතක-අඟුන (කර) ගස
අනිලාපහත්- රත්පාට කොල්ලු
අනිලෝචිත-උඳු (ධාන්‍ය)
අනිවරා-පුස්වැන්න හෝ මැණික් වැන්න
අනිෂධා- කුළුරැණ (කටුකරෝෂණ)සිරිවැඩිබැවිල්ල, ගස්කැලිය
අනිස්-කපුස්නිස්ස-(ලතා ක ස් තුරි)
අනීකාම්-කලහගස (කිරිනුග)
අනීලි-වැළක් (උක්වගීයක්)
අනුකුම්සී-දැන්ත (දන්තී)
අනුකූලා-දැන්ත ගස
අනුකූලිනී-හීන්දැන්ත
අනුදක්ෂ-තුවරලා (තගර=කළු වැල්)

අනුපජ-අමුඉඟුරු
අනුපාක-බෙහෙත් සමඟ මිශ්‍ර කරණ මීපැණි ගිතෙල් ආදී අනුපානය
අනුපායන-බඩට කෂාය විදීම
අනුපුෂ්ප-හොමුගස, බටගස
අනුබන්ධී-හික්කා රෝගය
අනුභූති-තිරස්සවාලු
අනුමාර්ජ-මුවැන්න
අනුරාගා-හීන්වම්මුතු (හීන් කලාදුරු)
අනුරේවතී-හීන් දැන්ත
අනුෂ්ණවල්ලිකා-ඊතණ
අනුෂ්ණවල්ලී-නිල් ඊතණ
අනුස්න-මහතෙල්, එපුල්
අනෝජාමල්-අනෝදා ගසේ සැදෙන රන්වන් පාට මල්
අනෝදා-අනෝජා, මේවාගේ කොළ තුවාල වලට අඹරා ගෑම සඳහා පාවිච්චි කරති. මහ බැවිලි වලට ද අනෝජා නම් ව්‍යවහාර කරණ බව පෙනේ.
අනෝනා-(අනෝදා)=ආන්නා (වැලිආන්නා, කටු ආන්නා, රට ආන්නා යයි තුන් වගීයකි.)
අනෘජු-තුවරලා ගස
අප්-වතුර (ආපෝ)
අප්ජ-සඬ්, නෙළුම්
අප්ද-වම්මුතු, (කලාදුරු)
අප්දි කළු-මුනුදුපෙණ
අප්දිමණ්ඩූකී-මුතුබෙල්ලන්ගෙන් උපදින මුතු
අප්බීජ-මුදු පෙණ
අප්පමාරිස-සුළුකුර
අප්පිත්ත-රත්නිවුල්
අප්පුරාවම්-මිණිරත්
අප්පොට-වල් ඉද්ද
අප-ඉරිවේරිය

අපත්‍ර අබලු

අපත්‍ර-පතොක්, දළුක්, කොළ නැති අංකුර
අපත්‍යජීව-බුත්සරණ ගස
අපත්‍යසිඳුකෘත්-බුත්සරණ ගස
අපරණණා-මුං (මුංඇට=මාසක)
අපරරක්ෂ-කාලවර්ණ ගෙඩි
අපරාජිත-මදටිය, මාරා, ඊතණ, මිදි, සේපාලිකා, කටරොළුවැල
අපරාජිතා-කටරොලු, විෂ්ණුක්‍රාන්ති
අපරිම්ලාන-(රතු) කටුකරඹු ගස
අපශොක-අශොක (හෝපලු)
අපස්මාර-වස්මර (මී මැස් මොර) රෝගය
අපාංපිත්ත-නිවුල් ගස
අපාකශාක-අමුඉඟුරු
අපාකෘෂ්ණක-අමුඉඟුරු
අපාඞගක-(අපාමාගී) සැබෝ ගස
අපාන්ඩර-මඟමෙවන්
අපාන-එනම් වාතය, ගුදය
අපාමිග-සැබෝ ගස
අපාමාගී-කරල් සැබෝ, හෙළ හෝ රත් කරල් සැබෝ
අපුච්ඡ-ඇට්ටේරිය ගස
අපුල්වා-දඹ ගස
අපුෂ්ප ඵලද--කොස් ගස
අපුෂ්ප-නුග. අත්තික්කා, දිඹුල්, ගස්කැලිය
අපූරණී-ඉඹුල් ගස, කපු ගස
අපෘථක් තුවී-පේර ගස
අපෙතරාක්ෂසී-තලා ගස
අපොතා-කලුතලා, අදුතලා
අපොදක-නීතිය වැල්(නිවිතිවැල්)
අඵල-පිවුල,(හිඹුල්) වෘක්ෂය

අඵලා-බිම්නෙල්ලි,(පිටවක්කා) කෝමාරිකා, හින් ක රි වි. ල, නෙල්ලි ගස, පල නොගන්නා වෘක්ෂය
අඵෙන-මූදුපෙණ, අබින්
අඵෙන ඵල-අබින් ගසේ ගෙඩි
අඵෙල-අබිං (අභිඵෙන)
අබ්ජ-මිදෙල්ල ගස
අබ්ජකෙශර-පියුම් කෙසුරු
අබ්ජවීජභෘත්-එ ල ක ණේ රු ගස
අබ්ජාග්වය-ඉරිවේරිය
අබ්ද-වම්මුතු,(කලාඳුරු)
අබ්දනාද-මඟකුර, සුළුකුර, ගොටු කොළ
අබ්දමණ්ඩකී-මුතු ඇටය
අබ්ධි කඵ-මූදුපෙණ
අබ්ධිජ-මූදුපෙණ
අබ්ධිඵල-සමුද්‍රඵල නම් ඖෂධ විශෙෂය
අබ්භර-මිණිරන්
අබ්භස්ස-ඖෂධ වර්ගයක්
අබ්බිකඵ-මූදුපෙණ
අබ්බිකා-කොතඹුරු, කොත්ත මල්ලි
අබ්බිජ-මූදුපෙණ
අබ්භ්‍රිකා-කොතඹුරු, (කොත්ත මල්ලි
අභ්‍රක-මිනිරන් (අබ්‍රක)
අබ්භ්‍රවාටිකා-ඇම්බරැල්ලා
අබපන්නේ-අබපැනෙහි
අබයා-අරලු, (අමෘත ඵල)
අබරක්කු-මිනිරන්, අභ්‍රක
අබල-ලුණුවරණ
අබලසාර-සල්ගස
අබලා-සිරිවැඩබැවිල
අබලු-අබපියල්ල

අබින් අබින්

ලෝකයා අතර සැලකිළිමත්වන පමණට ම එය පළමුවෙන් සොයාගැනීම පිළිබඳව ද නොයෙක් මතභෙදවලින් ගහන ව පවත්නා ඖෂධයකි අබින්. ක්‍රි: පූර්‍ව තුන්වැනි ශතවර්ෂයේ විසූ ග්‍රීක්වරුනුත්, ක්‍රි: ව: 9 වැනි ශත වර්ෂයට පෙර විසූ චීන්නුත් අබින් ගැන දැන සිටි බැව් වාර්‍තා ගත වී තිබේන් නිසා මේ වර්ගය පළමුවෙන් සොයාගත්තේ පෙරදිග ද අපරදිග දැයි නිශ්චය කිරීම දුෂ්කර ය.

අබින් – අහිඵෙන
Papaver Somniferum
ගෙනි – මල් – කොළ සහිත
අබින් ගසක කොටසක්

භගවන්සිං (H. H. Bhagvat Sinh Jee M. D. Etc.) ගේ අදහස – බටහිර ආසියාව පළමුවෙන් සොයාගත් අබින් ඉන්දියාවට ප්‍රථම වරට ලැබුනේ අරාබි යෙන් බවයි.

"ග්‍රීකයන්ගෙන් අරාබි ජානිකයෝත් ඔවුන්ගෙන් ඉන්දියන්වරුත් ඔවුන්ගෙන් ලංකිකයෝත් මේ ද්‍රව්‍යය ගැන දැනගත්ත" යනු ද තවත් මතයකි.

එහෙත් ධර්මාශොක සමයේ සිට ඉන්දියාවත්, දේවානම්පියතිස්ස සමයේ සිට ලංකාවත් අතර ගණුදෙනු කරණ වුනුන්ගෙන් මේ ද්‍රව්‍යය ගැන අපට දැනගන්ට නොලැබුනාය යි සිතීම සාධාරණ නොවේ. චීනය ලංකාවත්, ඉන්දියාවත් අතර හුවමාරුකරගත් ද්‍රව්‍යවල නම් සඳහන්වන පැරණි ලෙඛණයන්හි අබින් ගැන ද ඇතුළත් ව ඇතුවාට කිසිම සැකයක් නැත.

අහිඵෙන (Opion = Opium)

අහිඵෙන යනු මීට ව්‍යවහාර වන සංස්කෘත නාමයකි. "එය අරාබි – පාර්ශි ජාතිකයන් විසින් අබින් හැඳින්වීමට පාවිච්චි කරණු ලබන ඇෆ්යන් (Afyun) යන වචනය අනුව සාදුගත් සංස්කෘත වචන යකි" යන ඇතමුන්ගේ මතයෙහි ඇති සත්‍යයක් නැත.

ග්‍රීකයෝ අබින් ගෙඩියේ ඉස්ම (කිරි) වලින් මෙය සාදුගත්නා නිසා මේ වර්ගයට "ඕපස්" (Opos= Juice) ය යි ව්‍යවහාර කළහ. ඒ

අබින් අබින්

අනුව ඔවුන් අතර භාවිතයට ආ "ඕපියන්" (Opion) යන වචනය අරාබි-පාර්සි ජාතිකයෝ ඔවුන්ට උච්චාරණය කළහැකි වන පරිදි "ෆ්ලියන්" (Afyun) කියා සකස් කර ගත් බැව් පෙනේ. එම නිසා අප අතර දැනට ව්‍යවහාර වන පැරණි ම වචනය ග්‍රීකයන් අතින් සකස් වූවක් බැව් සිතීම නිවැරදි ය.

මේ ද්‍රව්‍යයේ ක්‍රියාකාරී බලය පරීක්ෂා කළ පෙරදිග වෛද්‍ය චරියෝ නාගවිෂ (අහිඵේන) මෙන් ම අබින් ද වැරදි ලෙස පාවිච්චි කිරීම මනුෂ්‍ය ශරීරයට අනතුරුය කර නිසා අහිඵේන (නයිවිෂ) යන අර්ථානුගත නම මේ ද්‍රව්‍යයට තිබුවාට කිසිම සැකයක් නැත. වාක්විද්‍යාව අනුව සලකන විට "අබින්" යන සිංහල වචනය "අප්ෆ්‍යන්" "අහිඵේන" ශබ්ද දෙකෙන් කොයි එකකින් හෝ බිඳ ඒමට ඉඩ ඇති බව පෙනේ.

අබින් ගැන ආයුර්වේද ලේඛන

අබින් ගැන දැනගැනීම කොතෙක් පැරණි දැයි හරිහැටි නිගමනය කළ හැකි නොවුව ත් ඉන්දියාව ත්, ලංකාව ත් එය ඖෂධයක් වශයෙන් පිළිගෙන අවුරුදු අටසියයකට වඩා පැරණි නැති බැව් ලියා තිබෙන පොත පත අනුව නිගමනය කළ හැකිසි. භාවප්‍රකාශ, සාරඞ්ගධර හා රාජ නිඝණ්ටුව යන ඉන්දියානු සංස්කෘත පොත්වල අබින් ගැන සඳහන් ව තිබේ. මේවා අවුරුදු අටසියයකට වඩා පැරණි නැත. ඊට පෙර ලියන ලද රාජවල්ලභ, චක්‍රදත්ත, වඞ්ගසේන ආදී විශාරදයන්ගේ කෘතිවල අබින් ගැන සඳහන්ව නැත.

ඖෂධ යෝගයන්හි ලා අබින් ඇතුලත් කර තිබෙන පැරණිම ලාංකික වෙද පොත යෝගරත්නාකරය යි. එය කුරුණෑගල් සමයේ අවසාන භාගයෙහි ලියන ලද අවුරුදු පන්සියයකට වඩා පැරණි නොවූවකි. ඊට පෙර විසූ මයුරපාද, පඤ්චමූල පරිවෙණාධිපති, බුද්ධදාස, රාවණ ආදී විද්‍යාඥයන්ගේ කෘතිවල අබින් ගැන සඳහන් ව නැත.

අබින්කෑම පැතිරී ගියේ කෙසේද?

දෙළොස්වැනි ශතවර්ෂයේ ඉන්දියාව ආක්‍රමණය කළ අරාබි (මුසල්මානු) ජාතිකයන්ගෙන් අබින් භාවිතය හින්දූන් අතර ද විශාල ලෙස පැතිරී ගිය බව පෙනේ. අබින් ස්නායු (නහර) දුර්වල කරණ, ධාතු සම්මන්ථන (වියලීම) ය කරණ, කාමෝත්සාහ වර්ධනය කරණ, නිද්‍රාජනක ද්‍රව්‍යයකි. තියුණු මද්‍යසාර වර්ගයක් පාවිච්චි කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල මේ වර්ගයෙන් සුළුපටු යක් අනුභව කිරීමෙන් ම ලැබේ. එම නිසා මත් පැන් පානය තහනම් කර ඇති ආගම් දෙකක් අදහන ස්ලාම්, හින්දූ ලබ්ධිකයෝ ඔවුන්ගේ ආගමික ප්‍රතිපත්තියක් රකිමින් කාරියත් කර

අබින් අබින්

ගැනීම සඳහා "මත්පැන් පානය වර්ජනය කිරීමෙන් පසු මත්පැනෙහි එබූ පාන් අනුභව කරණ අපේ ඇතැම් අභිදූප වීරයන් මෙන්" මෙය දිගට ම කරගෙණ ගියහ.

ඉන්දියාවේ හා ලඞ්කාවේ ඇතැම් කොටස් ආක්‍රමණය කළ යුරෝපීය ජාතියක් නිසා නදින් පැහිරී ගිය උපදංශ (පරංගි) වැනි රාත්‍රි කාලයෙහි අතපය රුදුවෙන් නින්ද නොයන හමහර පාප රෝග වලින් පෙළෙන අයට ස්තායු අප්‍රාණික (නහර හිරිවැටීම) වීමෙන් වේදනා සහනයත්, වහා නිදිගැන්වීම ත්, අබින් පාවිච්චි කිරී මෙන් ක්ෂණික ව ලැබෙන හෙයින් අබින් කෑම වඩ වඩා ත් පැහිර ගියේ යැ වින්නු අබින් දුම් බීම සඳහා පාවිච්චි කරති. එය අබින් කෑමට ත් වඩා අන්තරා ය දායක ය.

ඖෂධයක් වශයෙන් අබින් යෙදීම

මේ ආදී කරුණු උඩ මද්‍යකාරක නිද්‍රාජනක ද්‍රව්‍යයක් වශයෙන් භාවිත වී ඇ අබින්වලින් ගුල්මි රෝග (පණ්ඩුගාය), අතීසාර, ලේ වම නය, ජලසන්නිය, ඝකාලරාව, බඩවැලේ ආඛාධ, විෂමජ්වර, හා මූත්‍ර දෝෂ ආදි රෝග නිවාරණයට ලැබිය හැකි ක්ෂණික ගුණ පරීක්ෂාකර දූනගත් පෙරදිග වෛද්‍යවරයෝ අබින් ඇතුලත් ගුලි, කල්ක, ලෙහ, මොදක, අර්ක, අරිෂ්ට, ආශව, පිළිබඳ බෙහෙත් වට්ටෝරු සකස් කිරී මෙන් ඖෂධයක් වශයෙන් අබින් ද ආයුර්වේද වෙදකමට ඇතුලත් කර ගත්හ.

අපරදිග වෛද්‍යවරියෝ මෙහි ඇති ලෙඩ සුව කිරීමේ බලය ආයුර්වේද වෛද්‍ය වරයන්ගෙන් උගත් බැවි දූන ගත්තට නිබේ. ඔව්හු අබින් වලින් සාදා ගත්තා Morphia සහ Codlia වැනි වශයෙන් පාවිච්චි කරති.

අබින් පිළියෙල කරගන්නා ක්‍රමය

පැපවාර් සම්නිපිරම් (Papaver Somniferum) නම් ගසේ නෙපැ සුනු (මල් පෙති වැටෙන්ට කලින්) ගෙඩි වලින් සූරාගන්නා කිරී වැනි සුදුපාට ද්‍රවය (ඉස්ම) එකතු කර පවනේ වේලෙන්ට දමති. විය ලුනාගින් පසු එසට කැට්කර හන්නා කාලවණ්ණයෙන් යුත් ඒ ද්‍රව්‍යය අබින් නමින් හැඳින් වේ. අබින්ගෙඩි සෑහෙල්ලුයි, තින්කයි. මේ ගෙඩි සහ ඇට ඔනුෂ්‍යයෝ ආහාර වශයෙන් ගනිති. ඉගෙ වෘක්ෂාදන පිණි සත්, ඇට මිස් වයී රස කිරීමට හා කැස්ස, ඇදුම, බඩේගාය යන මේ රෝග සුව කිරීමට ත් පාවිච්චි කරති.

අඹුජ අබින්වල ප්‍රභෙද අම්බෂ්ඨාදි ගණය

උත්පත්තිස්ථාන වශයෙන් අබින් වර්ග තුනකට බෙදන ලැබේ. තුර්කි අබින්, (ටාර්කි ඕපියම්) –මිසර අබින් (ස්මාර්නා ඕපියම්) ඊජිප්තු අබින් (ඊජිප්සියාන් ඕපියම්) කියා ය– මේවායින් තුර්කි අබින් ශ්‍රෙෂ්ඨයි. අනික් දෙවර්ගයට වඩා අධික වීර්‍යයක් ඇති හෙයිනි. ඉන්දියාව, චීනය, මිසරය,තුර්කිය, යන රටවල සහ ඇතැම් යුරෝපීය රටවලත් අබින් වැවීම කරති. ඒ හැම රටක ම, අබින් නිෂ්පාදනය හා වෙළඳාම ආණ්ඩුව සතු ය.

අඹුජ–අසමෝදා, කරගස, බුජරුක
අඹුජ මෝජ– අසමෝදගම්
අඹකඟ– කඟ වර්ගයට අයත් එ ප මණ කහපාට නැති අල හා, කඟ කොළ වලට වඩා තද නිල් පැහැ යෙන් යුත් කොළ ඇති පැලෑ වියක්
අඹකෙදි– අත්කෙන්ද
අඹ– මිණිරන්, කපුරු,
අඹක– මිණිරන්
අඹනාමක– වම්මුතු (කලාදුරු)
අඹමාංසි– ජටාමාංශ වර්ගයක්
අඹවාටික– ඇම්බරැල්ලා ගස
අඹාවහ– කොකුම්
අඹොට්ට– දියමන්ති
අභ්‍යඔග– තෙල් ආදිය ඇඟ ගෑම
අභ්‍යුෂ–විලඳ, හබලපෙති
අභ්‍යෝනියොමක– පුවතු, රැක් අතුණ,
අභය– සැවැන්දරා, (සුවඳ ගොට) අරත්ත,
අභයදා– බිම්නෙල්ලි
අභයා– අරළු, සැවැන්දරා, හෙළ නික ගස, නිවිඟ ගස
අභයාදි ගණය– අරළු, නෙල්ලි, නිප්පිලි, රත්නිවුල් යන මේ ගණය සියළු ම උණ, හා සෙම් රෝග නැසීම ත් මල බිඳීම ත්, බල වැඩිම ත්, බඩගිනි වැඩීම ත් කෙරේ,
අභිනවොද්භිද– අංකුර ය
අභිමදී– සුරා වර්ග
අභිරූ– සාතාවාරිය, මහ සාතාවාරිය, කටු සෙවෙල්,
අභිරූකා– සාතාවාරිය,
අභිරූපත්‍රී– සාතාවාරිය,
අභිවණ්‍ඩී– තලිස් පතුරු
අභිසුත– කාඩිදිය,
අභිහිතා– දියනිප්පිලි
අභීෂට– තල්ගස
අම්කෙන්ද– අංකෙන්ද ගස
අම්බ– ඉරිවේරිය, අඹ, ජලය
අම්බකා– බෝලිද්ද, ඇඹුලැඹිලිය, දියමිත්ත,
අම්බද– කලාදුරු, (අඹ)
අම්බපාන– අඹපැන්
අම්බර– මීනාම්බර
අම්බරද– කපු ගස
අම්බෂ්ඨ– මහ දැත්ත
අම්බරාතක– ඇම්බරැල්ලා ගස
අම්බරී– අඹ ගස
අම්බරීභව– රෝමලුණු
අම්බරීෂ– ඇම්බරැල්ලා ගස
අම්බලමද්– මහ කරඹ
අම්බෂ්ඨ– මහ දැත්ත
අම්බෂඨක, අම්බෂඨා } ඇඹුලැඹිලිය, දිය–මිත්ත, බෝලිද්ද
අම්බෂ්ඨාදිගණය– ඇඹිටිය හෝ, දියමිත්ත, මලිත මල්, ලෝධ්‍ර, දඹඉදින්කරු, (වැල්මදට) පියුම්

කෙසුරු, වැල්මී, තොටිල, (සුලන්සිප්) බෙලි, යන මේ ගණය පැසුණු අතීසාර ජයගනී.

අම්බස්ටි-ඇඹුල්ඇඹිලිය, දියමිත්ත
අම්බා- දියමිත්ත
අම්බාටක- ඇම්බරුල්ලා ගස
අම්බිකා- ලුණුවිල
අම්බිල- ඇඹුල්
අම්බු- ජලය, රාස්නා වැල්, ඉරිවේරිය
අම්බුජ- දෙහි
අම්බුක- හෙලවරා ගස, රතු එරඹු ගස, දෙල්ගස
අම්බකන්ද- කටුසෙවෙල්
අම්බුක සේරුකා-වම්මුතු, කලාදුරු,
අම්බුකේශර-ලප්කාරං ගස
අම්බුකොතපල-නෙළුම්
අම්බුවාමර-පෙඳ (දීය සෙවෙල්)
අම්බුජ-ඉරිවේරිය, නිල්-රතු පාට ඇති නෙළුම්, මහනෙල්, මිදෙල්ල ගස
අම්බුජ ඉජ්ජාලා-දියමිදෙල්ල
අම්බුට-අස්මන්තක වෘක්ෂය
අම්බුනාල-සෙවෙල්
අම්බුද-වම්මුතු (කලාදුරු) ජලය
අම්බුදය-ඉරිවේරිය
අම්බුධර-වම්මුතු, (කලාදුරු)
අම්බුධි-මුදු ලුණු
අම්බුධිප්‍රසවා-කෝමාරිකා
අම්බුනාමක-ශ්‍රීබේර
අම්බුනාමන්-ඉරිවේරිය
අම්බුපත්‍රා-පිටවක්කා
අම්බුපුලලු-ඊතණ
අම්බුපුෂ්ප-හොමුවහු
අම්බුප්‍රසාද-ඉඟිනි ඇට
අම්බුප්‍රසාදනී- ඉඟිනි
අම්බුභෘත්-වම්මුතු

අම්බු මයූරක-දියසෑබෝ
අම්බුමුචි-වම්මුතු
අම්බුයෂ්ටිකා-ද ම් දෙවියුදු (සිරිතේක්කු)
අම්බුරා පත්‍රක-මදටිය හෝ මාරා ගස
අම්බුරුහා-ස්ථල පද්මිණී (ගොඩ මානෙල්)
අම්බුරුහිනී-පද්ම ලතාව
අම්බුල්-නෙල්ලි
අම්බුවලලිකා-කරිවිල
අම්බුවලලී-හිත්කරිවිල
අම්බිවාස්විනී-රත්පළොල්
අම්බුවාසී-රත්පළොල් (රත්පුලිල)
අම්බුවාහ-වම්මුතු (කලාදුරු)
අම්බුවාහිනී-හෙල පළොල්, රත් පළොල්
අම්බුවිස්‍රවා-කෝමාරිකා
අම්බුවෙතස- ඇඹුල්වේ-(ඇඹුලැඹිලිය හෝ ගොරක)
අම්බුශිරිෂි
අම්බුශිරිෂිකා } දිය මහරි
අම්බුෂ-දියකොලොම්, දියම්දෙල්ල
අම්බුසයන-රත් පළොල්, (රත් පුලිල)
අම්බුෂජිනී-පූඩාවෝ (කුඩැල්ලෝ)
අම්බුසර-බක්මී, බකිනි, සුලුබක්මී
අම්බුසාදන-ඉඟිනි ඇට
අම්බුසාරා-කෙසෙල් ගස
අම්බුසාර්ව-කොඳ ගස
අම්බුද-කලාදුරු
අම්බුලු-ඕළු, සුදු ඕළු
අම්භාරිභව-රෝම ලුණු
අම්භස්-වතුර, ශ්‍රීවේර
අම්භසානී-දියමිත්ත
අම්භොජ- රත් නෙළුම්, ජලය, හොමුවහු
අමෙහාජනාල-නෙලුම් අල

අමෙහාජා

අමෙහාජා-වැල්මී
අමෙහාධ
අමෙහාධර } කලාදුරු, (වම්මුතු)
අමෙහාරුහ- හෙ ල පි යු මී, සුදු තෙලුමී
අමමල්-අඹමල්
අම්මු-අඹ, කාඬිදිය, ඇඹුල්, ඇම්බරුල්ලා ගස
අම්මුත-උග්ගස
අම්මුතක-ඇම්බරුල්ලා ගස
අමල-ඇඹුල් කාඬිදිය, කිරල, දෙහි, විනාකිරි
අමලක-දෙසි, කොස් ගොස්ත
අමලකරඤ්ජ-ඇඹුල් කරඳ
අමලකා-සියඹලා, ඇඹුලැඹිලිය
අමලකාඤ්ජකා- කාඬිදිය, ඇඹුල්, විනාකිරි
අමලකාණ්ඩි-සුදුලූණු
අමලකොශර } ලප්තාරං,(නස්තාරං)
අමලකොශරී }
අමලකොශ-සියඹලා
අමලවාඩේහරි-ඇඹුලැඹිලිය
අමලවුක්‍රිකා-සියඹලා
අමලවූඩ-ඇඹුලැඹිලිය, ඇඹුල් පලා
අමලජ-කාඬි, දෙහි
අමලජම්බීර-ඇඹුල් දෙඩම්, දෙනි
අමලටක-අස්මන්තක වෘක්ෂය
අමලඩවී-පියල්ගස
අමලදෙලක-ඇඹුලැඹිලිය
අමලද්‍රව්‍ය-ඇඹුල්වේ (ඇඹුලැඹිලිය හෝ ගොරක)
අමලනායක-ඇඹුල්වේ
අමලනිම්බුක-ඇඹුල් දෙඩම්, දෙහි
අමලනිශා-ගිහුරුපියලි
අමල පත්‍ර-සිය ඹ ලා කොල, ඇඹුලැඹිලිය
අමලපත්‍රක-ගස් රුක්අත්තන
අමලපත්‍රා-හිත් කලාදුරු

අම්ලාන

අමලපත්‍රිකා- සියඹලා, (සිනිඹලා) දියමිත්ත
අමලපත්‍රී-පලාශි ලතා
අමලපත-දෙහි ගස
අමලපනස-කොස්ගොන්ත
අමලපර්ණී-මකුලුවැන්න, කොතු රුබැද්ද (මිකන්පලා)
අමලපර්ණිකා-පලාශි ලතා
අමලපාදප-සියඹලා
අමලපුර-සිනිඹලා, (සියඹලා)
අමලපුෂ්ටිකා-වල්හණ ගස
අමලපුෂ්පක-කොබෝල්ල
අමලඵල-(අඹ ඵල) නත්තාරි ඵල (නස්තාරම් ගෙඩි)
අමලබදර-ඇඹුල් බෙබර
අමලභෙදන-ඇඹුල්වේ
අමලමදී-ඕඝ කරඹ
අමලලෝනිකා-ඇඹුලැඹිලිය
අමලවාටිකා-බුලත් වැල
අමලවිපුල-ඇඹුල්වේ, (ගොරකහෝ ඇඹුලැඹිලිය)
අම්ලවෙතස-ඇඹුල්වේ (ඇඹුලැඹිලිය) ගොරක
අම්ලවෘක්ෂ-සියඹලා ගස
අම්ලශාක-සියඹලා, ඇඹුලැඹිලිය
අම්ලශාකාඛ්‍ය-ඇඹුලැඹිලිය
අම්ලෂ්ඨා-ඇඹුලැඹිලිය
අම්ලසප්තිභානිකා-සිඟඹලා
අම්ලසාර-කාඬි
අම්ලහරිද්‍රා-හිහුරුපියලි
අම්ලා-දෙසි, සියඹලා, තෙල්ලි,
අම්ලාටන-කවුකරඹු ගස
අම්ලාඤ්ඣ-මහ රට දෙහි
අම්ලාතක-කවුකරඹු, ඇඹුල්මේ
අම්ලාතකී-පලාශි ලතා
අම්ලාදන-කවුකරඹු
අම්ලාන්-උලුපියලි, කවුකරඹු, ඔදුවද

අම්ලායනී-ඉද්ද වෙසෙසක්
අම්ලාවරඵල-දෙහි ගෙඩි
අම්ලිකා-ආඹුලැඹිලිය, සියඹලා
අම්ලි-දියහොඹු, සියඹලා, ආඹුලැඹිලිය
අම්ලෝත්තම-දෙලුම්
අම-කොළටන්, ඉරිවේරිය
අමක-එරඹු ඇට
අමකයි-එරඹු ඇට
අමඛල-එරඹු
අමණඩ-එරඹු ගස
අමත් දිහි-හුත් කිරි බැවින් වෙන් වූ, දෘඪභාවයට නො පත් කිරි
අමත-රසකිඳ, අරලු
අමතා-නෙල්ලි, රසකිඳ
අමදුම-දේවදරු ගස
අමනැල්-කොවිටම්බා ගස
අමභව-ගුගුල්,
අමර- රසදිය, දේවදරු, සඳුන්, දලුක් ගස, නවඟන්දි ගස,
අමරකණ්ටිකා-හාතාවාරිය,
අමරකණ්ඨ-ගජකිප්පිලි
අමර්කාලික-ගුගුල්
අමරකාෂ්ඨ-දේවදරු
අමරකුසුම-කරාබුනැට්
අමරජ-ඉඹුරා, ගුරුන්ද, දේවදරු, නුග,
අමරදරු-දේවදරු
අමද්විජ- ගොඤ්ඤු, කුසතණ, නෙරෙන්වි
අමරපුෂ්ප-වැලුක්, අඹ, වැටකේ ගස්
අමර පුෂ්පිකා-ඝනපුෂ්ප
අමරභව-ගුගුල්, හෝරෝෂිත
අමරයන-සුදුදම්
අමරවෙල්ලි-අක්මුල් නැති වැල්
අමරස-අරලු හෝ රසකිඳ
අමරසඕප-දෙව්අබ
අමරා- කිඳි, ඊතණ, දේවදැලිය වැල්, හෙළදඹ, කෝමාරිකා, නුග
අමරාහ්ව-දේවදරු
අමරිකා-කලුනික, තිත්ත කැකිරි
අමරී-නිල්ඊතණ, කලුනික, මුරා වා වැල්
අමරෙන්ද්‍රතරු-දේවදරු වෘක්ෂය
අමල-පලිඟු, ඉඟිනි ගස, නෙල්ලි, කලුනික
අමලං-මිනිරන්
අමලක- වංඇපල, (අඟල්ඇදුර= වැටහිර=ආඩතෝඩා)
අමලදීප්නි-කපුරු
අමල පර්ණී-මකුලුවැන්න
අමලපත්‍රිකා-දිගමිත්ත
අමලපුෂ්පක-කොබෝලිල
අමිලා- පිටවක්කා, අවරිය ගස, දලුක් ගස, නෙල්ලි ගස
අමලාජඩටා- පිටවක්කා, (බිම් නෙල්ලි)
අමලි-රසකිඳ
අමලු-පලිඟු
අමා-කිඳි, වතුර
අමාපල-අරලු
අමාලිය-රසකිඳ
අමිෂ්-ආහාර
අමිසි-සතපුෂ්ප
අමීලාත-කෝමාරිකා
අමු-කොල්ලු
අමු ඇට-අමු නම් ඕනෑ එගීය
අමුක්කිරම්-අමුක්කරා
අමුක්කරා-අශ්වගන්ධ, (අශ්වගන්ධ)
අමුක්කුසන්නි- සන්නිරෝගයක්

අමු කපුරු

අමුකපුරු-බඩහමු පිදෙනවිට බණ්ඩියට පානින් එකතුවන රාත්‍රියට කණාමැදිරියන් මෙන් දිලිසෙන මැලියම් හෝ කපුරු ගසෙන් ලබාගන්නා සුද්ධ නොකළ කපුරු
අමුකුලාසි-ඉද්ද ගස
අමුජමොද-අසමෝදගන්, ඉද්ද ගස
අමුත-හින්අරත්ත, කුඩාකලුවා
අමුල-ඉද්ද
අමුලා-කොකුම්, වතුක්, නියඟල්ලා
අමුව-නල ඇට තුනක බර
අමුසාල්-එනම් ධාන්‍ය වර්ගයේ සහල්
අමුහැර-නොපිසූ ආහාර ද්‍රව්‍ය
අමෙධ්‍ය-වර්චස්, (අසුචි)
අමොඝා-වලහසාල්, අරලු, එන්සාල්, පළොල්, රත් පළොල්
අමොඩා-වලහසාල්, දුම්මැල්ල, අරලු
අම්බණාල-සැවැන්න (සැවැන්දරා)
අම්බත-කිරි, අම්බ, උග්ගස, අත්තන, අරලු, නෙල්ලි, ගිතෙල්
අම්බතකඤ්ඣ-රසකිඳ වර්ගයක්
අම්බතකුණ්ඩලී-රසකිඳ
අම්බතජටා-ජටාමකුට (ජටාමාංසී)
අම්බතඵල-නෙල්ලි, පේර, මිදි
අම්බතඵලා-නෙල්ලි, (ඇඹුලු ඵල) මිදි
අම්බතභවා-අරලු
අම්බතලතා-රසකිඳ වැල්
අම්බතවල්ලරී-රසකිඳ, නිවිති
අම්බතවල්ලී-රසකිඳ හෝ නිදිවගී
අම්බතවල්ලිකා-රසකිඳ
අම්බතසඬ්ඛ-තුත්තම් හෝ රිදී තුත්තම්

අයසි

අම්බතසඤ්ජීවනී- ගොරකෂ දුඟා, (දියලබු)
අම්බතසම්භවා - නෙල්ලි, (ඇඹුල ඵලා) රසකිඳ
අම්බතසාර-ගිතෙල්
අම්බතසාරජ-උක්සකුරු
අම්බතසුව-අඩනහිරිය, (අඩහැර)
අම්බතා- රසකිඳ, බුලත්, අරලු, නෙල්ලි, නරිඅල, උග්ගස්,ඉකිරි, පිටවක්කා, බෝදි ඇට, සුදු පාසානම්
අම්බතඵල- දුම්මැල්ල, (නිත්ත පතෝල)
අම්බතාභි-අරළු
අම්බතාවහ-ගිතෙල්, කිරි
අම්බතොක්ථා-සාලාම්ශ්‍රී
අම්බතොද්භව- කානහිල් අල, (සාලාම්ශ්‍රී) බෙලි ගස
අම්බතොද්භවා- ලසුණු, (හෙලුහුණු) බුලත්, දුහුදු, කැකිරි
අම්බතොපහිතා-සීතමුල්
අම්බතොෂ්ණ- ගොන්කැකිරි, මහ ගොන් සුතු කැකිරි
අය-නෙරෙන්චි. (ගොකටු,)යකඩ, කලු අගිල්, කළුවැල්
අයඃ-යකඩ
අයඃකාන්ත-කාන්දම්
අයඃශද-ගස්රාක් අත්තන, හෝරාක්අත්තන
අයන-පියාගස (පියල්ගස)
අයල්-අගිල්
අයවරි-වදකහ
අයස්-යකඩ
අයසකාන්ත-කාන්දම්
අයසඃසාර-වානේ
අයසි- යක්බෙරිය. (භූමිනාද) යකඩ

අයා අර්ජුනී

අයා–එන්සාල්
අයාඛ්‍යා–වඳුරු මෑ, එන්සාල්, මහ එන්සාල්
අයිඤ්ජප්පු–පස්ලුණු (පැණි ලවණ)
අයිරාවත–කෑරන්,සිත් කෑ රන්, වේලිප්පරිත්ති
අයිරිකකය–වරාගස
අයිවිරලි–තුඹකරිවිල
අයුක්ඡද–පුවහු, රැකගුන, (ගස් අගුන)
අයුග්මක–රැක්අත්තන ගස
අයුග්මවඡද–රැක්අත්තන ගස
අයුග්මපත්‍ර– රැක්අත්තන කොළ
අයුග්මපර්ණී–රැක්අත්තනගස
අයෙලු–අඟිල්
අයෝ–යකඩ
අයෝමල–යඩොර
අයෝනි– පුවහු, රැකගුන, (ගස් අගුන)
අයෝමූඝල–රඹුක්, වැලුක්
අයෝරජ–යසුනු (යහුනු– යකඩ කුඩු)
අයෝසාර–යකඩ
අර්කාල්–අටෙත් පංගුව
අකී–වරා, හෙල වරා, පලිඟු, මද්‍ය සාර, තඹ, පබළු, කපෝ තාඤ්ජන. (හොයදුන්)
අකීකාන්තකා–කවුඩිකැකිරි, කෝවක්කා
අකීගඩිකා–කිරිබදු අල
අකීවිඡ්‍යා–වරාමූල
අකීවඤ්ඡන–රත් හඳුන්
අකීජ– වරාමල, වරා කරල
අකීදල–කොබෝවක්කා, වරාගස
අකීදුඛ්‍යා–වරාකිරි
අකීනාමන්–රතුවරා
අකීපත්‍ර–කොබෝවක්කා, රතුවරා

අකීපණී–වරාගස
අකීපුෂ්ප–කිරිකවෙළු
අකීපුෂ්පි–වරාමල්–හෙලවරාමල්
අකීපුෂ්පිකා–කිරිකවෙලු
අකීප්‍රියා–වද, ඛදුවද, කොබෝවක්කා
අකීඟකතා–කොබෝවක්කා
අකීමූලා–සස්සඳ
අකීර–එලවරාගස
අකීරා–වරා
අකීලතා–රම්මානිස්ස, රන්වන් වේලා
අකීව පුෂ්පිකා–නිත්ත කැල්ල
අකීවල්ලඟ–බදුවද ගස
අකීවල්ලී–කොබෝවක්කා
අකීවාසතුක–තම්පලා, නිල් තම්පලා
අකීවෙඩ–තලිස්පතුරු
අකීසුතා–නිල්කවරොලු
අකීහිතා–කොබෝවක්කා
අකී–වරා
අකීඟව–වරා, හෙලවරා
අකීඟ්ව–වරාගඤ, තලිස්පතුරු
අකේතතමා–වේලාගස
අගීට–නිල්ගිරිතිල්ල
අගීවඩ–ඇසළ රැක
අඤ්ඡට– } නිත්වම්මුතු(කුඩා කලා
අඤ්ඡන } දුරු
අර්ජක–අක්මැල්ල, සුවඳතලා
අර්ජක පණීස–තලා, අඳුතලා
අර්ජකර්ජ–පියාගස
අර්ජකාස–කුඹුරුවැල
අර්ජනී–එන්සාල්
අර්ජා–නීයඳ
අර්ජාක්–ගිනෙල්
අර්ජිකා–අඳු
අර්ජුනී–එන්සාල්, ගිත් එන්සාල්

අර්ජුන

අර්ජුන-කුඹුක්ගස,
අර්ජුනොපම-තේක්කගස
අර්ණවජ-මුහුදු පෙණ
අර්ණවජ මල-මුහුදුපෙණ
අර්ණවොද්භව-අග්නිජාරවාෂය
අර්තගල-කටුවෙලඟ, උගුරැස්ස, නිල් කටුකරඹු, ගිරිතිල්ල
අර්ථ-ගල්සෙවෙල්
අර්ථනී-එන්සාල්, මහ එන්සාල්
අර්ථ ප්‍රසාදනී- ගොඩ මහ තෙල්, දුටුසතුටු
අර්ථසාධක-බුත්සරණ ගස
අර්ථසාධන-බුත්සරණ, කොසඹ
අර්ථසිද්ධි (ක)- නිකගස, බුත් සරණ ගස
අර්දනාදිරස-හිඟුල්, රසදිය ආදිය ගෙන සාදන බෙහෙතක්
අඬවැන්ද්‍ර-වැල්පෙනෙල
අඬවැන්ද්‍රකා-කලුතිරස්සවාලු, වැල් පෙනෙල
අඬිනිකත-නේපාල රටෙහි උපදනා කොසඹ
අඬිපාදු-පිටවක්කා
අඬිපුෂ්පා-මහබෑවිල
අඬිප්‍රසාදන- දුටුසතුටු, මොනර කුඹුම්බිය
අඬිමානිකා-කලන් දහසය
අඬිවනිකනා-කිරෑත(බිම්කොසඹ)
අඬිවාරික-කිරෙන් ගත් මෝරා, (කිරි මෝරා)
අඬිවිරවිජා-කලුර්තණ
අඬිසාක-සිරිතේක්කු
අඬිවහෙදක-ඉරාවා රදය
අමින්-නේත්‍රරෝගයක්
අයඹිමන්-වරාගස
අලිඳ-අරෑද
අර්විදුකාර-ලෝලුගස
අර්විදුදුම-මිඩහඟු
අශී-අර්සස් ලෙඩ

අරණ්‍යපිපළලී

අශීඝන-බදුල්ල ගස
අශීඝගුදන-කිඹාරම්
අශෝඝනී } බදුල්ල, කිරිඇස්ස, කිඹා
අශෝඝක } රම්
අශෝජ-භගන්දර රෝගය
අශෝනා-කිඹාරම්, බදුල්ල
අශෝනී-සිරිඇස්ස
අශෝවනීමන්- නේත්‍රයෙහි උපදිනා රෝගයක්
අර-රසදිය, (රස) පත්පාඩගම්, සෙවෙල්
අරක-පත්පාඩගම්, සෙවෙල්
අරග්වධ-ඇසල රුක
අරඹග (ඔහා-ඔහි)වැල්මුරාංගා
අරටු-තොවිල ගස
අරණ-රත්තිටොල්
අරණක-මිදි, සිහින් මිදි
අරණී-සිහින් මිදි, රත්නිවුල් ගස
අරණීක-සිහින් මිදි
අරණ්‍ය (ක)- කවිඵල වෘක්ෂය, කිඹාරම්, වල් කිඹාරම්
අරණ්‍යකණා-වල් නිප්පිලි
අරණ්‍ය කදලී-ඇටකෙසෙල්, වල් කෙසෙල්
අරණ්‍යකර්කටී-වල්කපු
අරණ්‍ය කුලත්ථිකා-වල්කොල්ලු
අරණ්‍ය කුසුම්භ- වල් සෙන් දිරික්කා, වනුක්
අරණ්‍යකොලි-වල්ඛෙබර
අරණ්‍යචමසක-වල්සපු
අරණ්‍යජාද්‍රික-වල්ඉහුරු
අරණ්‍යජීර=වල්දුරු
අරණ්‍යතිල-වල්තල
අරණ්‍යතුලසි-වල්තලා
අරණ්‍යදමන-වනෙහි හිටුන දමනක නම් ගස
අරණ්‍ය පලාණ්ඩු-වල්ලුහුණු
අරණ්‍යපිපළලී-වල්නිප්පිලි

අරණ්‍යමුද්ග අරුණා

අරණ්‍යමුද්ග-වල්මුංපැල
අරණ්‍යමුද්ගා-මුංවැන්න
අරණ්‍යමෙථි-වල් උලුහාල්
අරණ්‍යරාජිනී-වල්කහ
අරණ්‍යවාසතුක-වල්තම්පලා
අරණ්‍යශාලි-ඌරුහැල්
අරණ්‍යශූරණ-වල්කිඹාරම්
අරණ්‍ය හරිද්‍රා-වල්කහ
අරත්ත-රැත්ත (රාෂ්ණා)
අරත්තෙයි-අරත්ත
අරඛකණී-සාතාවාරිය, මහ සාතාවාරිය
අරන්කසා- වල්කහ (හරන්කහ)
අරනකහ-හරන්කහ(අරණකසා)
අරනිකෝතු-මහම්දි
අරපර-රසදිය
අරපොඩි-යහුණු (යසුණු- යකඩ කුඩු)
අර්ම-මන්ත්‍රරෝගයක්
අරමණ-ගස් වෙසෙසක්
අරමඳ-වේලා, තෙලුම්මල්
අරරත්තා-අරත්ත
අරල-තොටිල
අරලී-(අරලිය) හෙල කණේරු
අරලු-ඇටුවන්, (නුග ආදි ඇසතු ගස්වල උඩ අතුවල්වත් හෝ කඳෙන් පහතට ඇඳෙන මුල්) අරලු ගස්, තොටිල ගස්
අරලුක-තොටිල
අරවින්ද-තෙලුම්
අරසව-කුඹුක්
අරසම්-බෝ
අරසම්මිත්තු-බෝදි ඇට
අරසු-ඇසටු, බෝ
අරසු මරම්-බෝගස
අරාථ-අරලුගෙඩි
අරාම්-දුම්මැල්ල
අරාල-හල්දුම්මල, (සෙලම ල)

අරාලුපල-අරලුගෙඩි
අරිට්ඨා- පෙනෙල, සුදුලූනු, රා හෝ අරක්කු
අරිට
අරිටු } කොසඹ, මදටිය ගස්
අරිතනමඤ්ජරී-කුප්පමේනිය
අරිතාරම්-හිරියල්
අරිමද-සීනි, සකීරා
අරිමර්ද-තෝර, තෝරගස්
අරිමේද-හිඟුරුවැල්, සීනියා නම් චගීය, ගුරුන්ද
අරිෂට-කොසඹ
අරිෂටමෝරු-කුලුරැණ, පෙනෙල
අරිෂ්ඨ-කොසඹ, සුදුලූනු, මේරා, පෙනෙල, මිරිස්, ගස්කැලිය, කටුකරෝසණ
අරිෂ්ඨක-කොසඹ, රුක්පෙනෙල
අරිෂ්ඨඵල-මහානිම්බ වෘක්ෂය
අරිෂ්ඨා-කුලුරැණ, කොසඹ
අරිසම්-අරිසස් රෝගය
අරිසපතති-පෙතංගස
අරිසි-අරිස, (පොඩි අරිසි හෝ මිශ්‍ර අරිසි) වැලි සහිත පොලවේ හට ගන්නා සුලු නසි පැලැටියට වඩා මදක් කුඩා පැලැටියක් (වරසාරාජී සංග්‍රහව බලන්න)
අරුකකම් පිලලු-ඊතණ
අරුගම් පිලලු- ඇටවරා. තෘණ, මිරිස්, ගම්මිරිස්
අරුඹකර-බදුල්ල ගස
අරුජ-ඇසළ ගස
අරුණ- අනිවිඳයන්, ත්‍රාස්තවාලු, රත්නිවුල්. කොකුම්, වැල්මදට, ඔලිඳ, මුඩමහණ
අරුණා-වැල්දෙකි, පිටසුදු සාරණ, මහගොන්කැකිරි

අරුණාක්ෂී

අරුණාක්ෂී–ඍතු වරාගස
අරුණීකෘ–උලුවාහාල්
අරුවලලක්කරි–දියමෙනේරිය
අරුෂ්කර–බදුල්ල, කජුගස
අරුෂා– බිම්තෙල්ලි, (නවනැඹිය)
අරුස්–වරාගස, රත්කිඟිරිගස
අරුහා–බිම්තෙල්ලි

අරුද



අරුද–අඩහනාප්‍රිය
Ruta Graveolens

යුරෝපය ජන්ම භූමි කොට ඇති මේ පැලය ඉතා ලක්ෂණ ය. කොළ සහ කද හිම් වැනි පැහැයෙන් යුක්ත ය. කුඩා කදෙහි සිය ඔලා කොල වැනි දෙපසට බෙදී ගිය කුඩා කිණිති (අතු) ඇත.

මේ වර්ගය ලඞ්කාව ඇතුළු පෙර දිග රටවලට අයත් ශීතාඩික ප්‍රදේශවල හොඳින් වැඩෙයි. මේ වාසේ කොළ ඉතා තද සුවඳකින් යුක්ත ය.

අල්ප පද්ම

විෂබීජ වලින් ආරක්ෂා වීමට– අපසමාර රෝගයට හා හිසෙහි ඇතිවන කලාතුරකින (කරකැවිල්ල) ට ත් ප්‍රත්‍යක්ෂ ය.

මේ කොළ වලින් සිදගන්නා තෙල් පිනසට හා ලදරුවන් ගේ ඉසේ– පපුවේ සෑදෙන සෙම් රෝග වලට ත් පාවිච්චි කරති.

හදිසි ගුණ දෙන ඖෂධයක් වූ මෙය අපර දිග වෛද්‍ය වරු හදිසියෙන් ඇතිවන හිරිවැටීම් වලට යොදති.

සත්‍රීන්ගේ කාමෝද්දීපනය ඇති කරණ සුවඳකින් යුත් මේ වර්ගය ඇතම් අය හදි–හූනිම් වලින් ආරක්ෂා වීමට ගුප්ත ඖෂධයක් ලෙස ද පාවිච්චි කරති.

අරිෂ්ටාම්– අරිෂ්ට, සුරා,
අරෙණුගම්– රූහැණිය (වාල් මෝ ලගු= වල්ගා මිරිස්)
අරෝග්‍යසිම්බි– ඇසල
අරෝචක– අරුචිරෝගය
අරෝබාහූද ලේකම්– කණේරු
අරෝවක– ඇසල
අල්ක– ඇඹුලැඹිලිය
අල්ප– කුරතම්පලා
අල්පක්ෂුපා– නිදිකුම්බ
අල්පක– යවාස
අල්පකෙශි– නිකගස
අල්පගන්ධ– රත්කුමුදු, රත්පියුම්
අල්පනිද්‍රතා– පිහින් උපදනා රෝගයක්
අල්පපත්‍ර– කුඩා කොළ ඇති කලා ගස
අල්පපත්‍රිකා– රතුසෑබෝ ගස
අල්පපත්‍රී– බිම්තල්
අල්පපද්මී– රත් පියුම්, රතුපුල්

අල්ප පර්ණී– මුංවැන්න
අල්පපුෂ්පිකා– කහවන් කනේරු ගස
අල්පප්‍රමාණක– කෝ ම ඩු, ප ත් තක්කා
අල්පමස්තක– නිටුල් ගස
අල්පමාතක– බෙ ලි ග දි න් යුත් තලා ගස්
අල්පමාරිසා– සුලු කුර
අල්පශමී– ස්මරුක වැ නි කු ඩා ගසක්
අල්පශාත– නේත්‍ර රෝගයක්
අල්පිකා– මුංවැන්න
අල්ලක, අල්ලකා, අල්ලා } කොතඹුරු (කොත්ත මල්ලි
අල්ලි– ඉර්ණු
අල්ලෙක් කොඩි– කටුවල වැල
අල– හිරියල්
අලක්තක, අලක්තා } ලාකඩ– (ලාක්ෂා රස– ලතුදිය)
අලක– කොත්තමල්ලි
අලකන්නි– කදුලැස්ස
අලකනඳු– රුකඟුත, අහු ගස
අලකප්‍රිය– පියල්ගස, කලු බදුල්ල ගස
අලකා– හිරියල්
අලකිරිය– කුරතම්පලා
අලකු– ලාකඩ
අලගඬ– දලුක්, මහළුක්
අලගත– නෙත්‍ර රෝගයක්
අලඔකා– හෙලවරා, අලතාව, හිරියල්
අලඔකාර– කුලුරුණ, (කටු කරෝ ඡණ)
අලපලා–කිඩාරම්
අලඹ– විෂවෛද්‍යවරයා
අලම්බමුෂ්කක– තෙලෙඹු ගස
අලම්බා– නිත්ත ලබු
අලම්බුද– ඉරිවේරිය
අලම්බුසර– වෙල්මුඩ, (මුඛමහණ)
අලම්බුසා– වෙල්මුඩ, (මුඛමහණ) සුලුඔක්මී, නිත්ත වැටකොළු, වලා වැන්න,
අලමුල්– පද්මඅල, චීන අල
අලකී– හෙලවරා, ඔදුල්ල, වැල් නිබ්බොටු
අලකෝම්– වැල්නිබ්බොටු
අලරිය– කනේරු, අරලිය, අවරිය
අලව– සුදුදුරු
අලවණා– දුදුවැල්, අදුලු
අලස– පාදරෝගයක්, වලාවැන්න
අලසක– එනම් රෝගය
අලසා–කලුතලා, වලාවැන්න
අලසෙලුකා– රතු නිදිකුම්බා
අලාබු– හෙල ලබු (සුදු ලබු)
අලාබු (නී) කා– නිත්ත ලබු,
අලාබුකණී– ගොටුකොල, මීකන් පලා, (මකුළුවැන්න)
අලාබුසුභාත්–ඇඹුල්වේ, (ගොරක හෝ ඇඹුලැඹිලිය)
අලාබුකට– ලබුසුණු
අලායා– කෙසෙල්
අලාස– වලා වැන්න, උප ජිහ්වා නම්නැති රෝගය
අලි– කීකිරිඳිය
අලික– පළොල් ගස
අලිකා–අලිනී– කවෙලු, කි රි ක වෙලු, සුළු සාරණ
අලිකුලප්‍රියා– සෙව්වන්දි (රෝස)
අලිකුලසංකුල– සුදුරෝස
අලින්වි– අලින්විල්, රුකඟුත
අලිපරිත්ති– පෙතන්
අලිප්‍රියා– රත්පළොල්, (රත්පුලිල) මිදි

අලිම්පක, අලිම්බක } පියුම් කෙසුරු, මිගස
අලිමක- මිගස
අලිමොදු- සිහින් ඕදි
අලිමොහිනි, අලිවාහිනි } කෙවිකා නම් පුෂ්ප වෘක්ෂය
අලිවල්ලභා- රත් පළොල්, රත් පුලිල
අලිවි- රුකහුන
අලිෂට- ඔදටගස
අලිසමංකුල- සුදුඅෝස ගස
අලිනක- ඊයම්
අලු- තල ගස
අලුක- එලවාලුක නම් ඖෂධය
අලුකන්නි- කඳුලැස්ස
අලුවතුගෙඩි- අළුකෙසෙල් ගෙඩි
අලුවරා- අලුපාට කොළ ඇති වරා විශෙෂය. (මේ වර්ගය වැනි වශයෙන් ගන්නේ ගව ලෙඩට ය)
අලෝහිත- රතු පියුම්
අව්බු- අසුගස
අව්‍යක්තාගන්ධා- නිල්කටරොළු
අව්‍යක්තා- කළු මුරුවා වැල
අව්‍යඝ්ඝ- කොකුම්
අව්‍යණ්ඩා- වඳුරු මෑ, පිටවක්කා
අව්‍යතා- අරලු
අව්‍යථා- පුස්වැන්න, අරලු, මැණික් වැන්න, සිඳුහුරු, නෙල්ලි,
අවක්ෂාල- පිටවක්කා
අවක්ෂේපණී- ඛාවිල ගස
අවකා- සෙවෙල්
අවක්‍ර- හොර ගස
අවගන්ධිකා- සිහින් එන්සාල්
අවතීසාර- කෙසෙල් ගස
අවතුවර්ෂ්‍ය- මේවන්. මහ මේවන්, (අෂ්ටකවර්ගයට අයත් ඖෂධ වර්ග දෙකක්) හෝ භාතාවාරිය
අවදංශ- මුරුංගා ගස

අවදූ, අවදූත, අවදූහ } සැවැන්න, (සැවැන්දරා-සුවඳහොට)
අවදුඬ- හුංකිරි
අවදූන්‍යා- මුරුංගා ගස
අවදූනෙෂ්ටතා පත්‍ර- සැවැන්න (සුවඳහොට)
අවන්‍යතොම- කාඬ දිය, ඇඹුල් ජලය
අවන්ධ්‍යා- කැකිරි
අවපාටිකා- රෝග විශෙෂයක්
අවඹේඵල- පිටවක්කා
අවර- අවර පළු (කරල්) (මහ බෝංචි වර්ගයක්)
අවරද- කොබෝවක්කා
අවරඵලා- හෙලදඹ, (සුදු ජම්බු)
අවරාපිකා- කඳුලැස්ස
අවරාම්බ- හෙල දඹ, (සුදු ජම්බු)
අවරි- ඛේරු
අවරිකා- කොතඹුරු, (කොත්ත මල්ලි)
අවරිය- නිල් අවරිය (භීලිකා) බෙහෙත්
අවරොහ- අමුක්කරු, (අස් ගොඳු)
අවරොහක- අමුක්කරු
අවරොහශාඛින්- පුලිලගස
අවරොහිකා- අමුක්කරු
අවරොහින්- නුග ගස
අවල්අරක්කු- කැප්පිටියා, ලාකඩ, ගස් ලාකඩ
අවල්ගුජ, අවල්ගුජක, අවල්ගුජා } බෝදි ඇට
අවලක- මැඩහඳු
අවිලපලු- අවර කරල්
අවස්මර- අපස්මාර රෝගය

අවසාදිනී

අවසාදිනී-ඇට්වේරිය, ඇට්ට ර, මහ කරඳ
අවසෙක-කෂාය දියෙන් තෙම්ම
අවාකපුෂ්පි-සතපුෂ්ප, යොන්තුඹ, වැල් දෙහි
අවාඵල-පිටවක්කා, (නවනැඹිලිස)
අවාරිකා-කොතඹුරු (කොත්ත මල්ලි)
අඹික-වල් කොල්ලු
අවිගන්ධිනී, අවිගන්ධා, අවිගන්ධිකා, අවිගන්ධී } අසමෝදගම්, වේලා ගස
අවිඝන-කර්ඹ හෝ කිරලගස්
අවිතක්‍ර-එලකිරි-මෝරු
අවිද්ධකණී-දියමිත්ත
අවිද්ධකර්ණිකා-දියමිත්ත
අවිදුඹ, අවිදුස } එල කිරි
අවිදුය- ලේවැරැල්ල, (අයාපාන) කැරුකොකු
අවිමරිස-එලුකිරි
අවිමෝච-එලුකිරි
අවිරි-අවරිය
අවිවාඝ-මැඩහඟ
අවිශිර-වේලා ගසෙහි එල
අවිෂා-ඉවද
අවිෂොස-එලුකිරි
අවිහ-තල
අවී-වල් කොල්ලු
අවීජා-මිදි වැල
අවුතල්-තලා වර්ගයක්, අවුතලා
අවුලු-අවුලුපත්, (කැවිලි වර්ග)
අවුල්දැනි-කිඹුලා
අශ්මඝාජ-ගල්මද
අශ්මකදලි-ඇට කෙසෙල්
අශ්මකෘච්ඡ්‍රහන්-අන්දරගස

අශ්මසාරක

අශ්මගර්භීක-කොබු ගස
අශ්මඝන- පහණබෙය, මැණික් වැන්න
අශ්මජ-ගල් සෙවෙල්, ගල්ම ද, යකඩ
අශ්මජතුක-ගල් සෙවෙල්
අශ්මජිත්-පහණබෙය, පොල්පලා
අශ්මන්ත-ගස් රුක්අත්තන
අශ්මන්තක-කෝබෝලිල, පුස්වැන්න
අශ්මතක-දුදුවැල්, දුහුදු
අශ්මපුෂ්ප-ගල් මද, ගල් නහර, කප්පරවල්ලිය, ගල්මල්
අශ්මභින්-පහනබෙය, (පහන බෙය වෙනුවට සම්හරු පොල්පලා ද සම්හරු අක්කපාන පාලැවිය ද ගණිති)
අශ්මභේද-පොල්පලා, පහණබෙය
අශ්මර-කැල, රත් කැල
අශ්මරී- මූත්‍රාශයෙහි හැදෙන ගල්
අශ්මරිභෙද-පොල්පලා
අශ්මරිකෘච්ඡ්‍ර-මූත්‍ර කෘච්ඡ්‍රරෝගය
අශ්මරීඝන-ලුණුවරණ ගස
අශ්මරීප්‍රිය-ධාන්‍ය විශෙෂයක් (මහ හැල්)
අශ්මරීභෙද, අශ්මරීභෙදන } පහනබෙය
අශ්මරිරිපු-මහ හණ ගස්
අශ්මරිශකීරා-අශ්මරීගල්
අශ්මරිහර-ලුණුවරණ ගස
අශ්මලාක්ෂ-ගල් සෙවෙල්
අශ්ම සම්භව-ගල් සෙවෙල්
අශ්මසාර-වැලුක්, රඹුක්, යබොර, රසාඤ්ජන, ඇට කෙහෙල්
අශ්මසාරක-කොබු, කෝන් ගස

අශ්මසුතා-දියමිත්ත
අශ්ව-අමුක්කරා
අශ්වගන්ධික, අශ්වගන්ධා, අශ්වගන්ධිකා } අස්ගොඳු, (අමුක්කරා)
අශ්වකර්ණ-බුරැත, සල් ගස
අශ්වකර්ණමෘත-අසුගස්, සල්ගස්, ඇසල ගස්
අශ්වබුර-හෙලකටරොලු
අශ්වඝන, අශ්වඝා } හෙල කණේරු, (අලරිය)
අශ්වත්ථ පත්‍රිකා-පුලිල ගස
අශ්වත-බෝ ගස
අශ්වත්ථ-බෝ ගස
අශ්වත්ථනිද්, අශ්වත්ථහෙද } තන්ති වාද්‍ය
අශ්වදංෂ්ට්‍රක-ගොකටු
අශ්වදන්තක- අගල් ආදුර (වං ඇපල=ආඩාතෝඩා)
අශ්වනාශක, අශ්වනාශ } එල කණේරු
අශ්වනික-දූදු (දුහුදු)
අශ්වපුත්‍රී-ඉදුසල් ගස
අශ්වපුච්ඡ, අශ්වපුච්ඡිකා } මස්වැන්න, ඵ දු පියලි
අශ්වබාල-වැලුක්
අශ්වමාර, අශ්වමාරක } කණේරු, (අලරිය)
අශ්වමාරාඛ්‍ය-නිවිති
අශ්වමූත්‍රිකා-ඉදුසල් ගස
අශ්වමොහක-එල කණේරු ගස
අශ්වජීව-ඇසතු ගස
අශ්වජීව පත්‍රක-පලොල්,පුලිල
අශ්වරිපු-කණේරු ගස
අශ්වරොධ-කණේරු ගස
අශ්වරෝහා-අමුක්කරා
අශ්ව වරාහ-ඌරල
අශ්වසනා-කණේරු (අලරිය)
අශ්වහන්තා-අශ්වහ=කණේරු ගස
අශ්වහා-සුදු අලරිය
අශ්වාක්ෂ-දේව අබ
අශ්වාන්තක-එල කණේරු ගස
අශ්වාරි-කණේරු ගස
අශ්වාරොහා, අශ්වාවරොහක, අශ්වාවරොහිකා } අමුක්කරා ගොන් කැකිරි
අශ්වාල-සුවඳහොට, කුඩා වැලුක්
අශ්වාහවාදිබුරා-එල කටරොලු
අශ්විභෙෂජ-කුඩා මැඩහඟු
අශ්විනී-ජටාමාංශ
අශ්වෙතා-ඇද්දෙමට, නිල් කටරොලු, නිල් ඉවද
අශ්වෝතා-ඉරමුසු
අශකුම්භී-දියපරඬලා
අශන-රැකහුන, අහු ගස, පියා ගස, රත් තෙවුල්, බදුල්ල
අශනප්‍රුෂ්පික-රත්සඳුන්
අශනමල්ලිකා-කටරොලු
අශිඛනී-සීරුස්ස
අශින ලතා-නිල් ඊතණ
අශිලුගන්ධික-කුඹුරා වැල්
අශිත-කලු අගිල්, කිරිපලු, කිරිහැන්ද, ක්‍රිබදු අල
අශිතක-පියා ගස, ගල් පියල්
අශිතපුෂ්පක-හෙලපිල
අශුකලා-කිරිබදු
අශුකජ-මුඩු හැල්
අශොක-හෝපලු, දියරත්මල්, මූනමල්,
අශොක් රොහිණී- කටුකරෝහණ (කුලුරැණ)
අශෝකා- කටු කරෝහණ (කටු කරෝහිණී)
අශෝකාරි-කොලොම් රැක
අශ්‍රපාද-කිරිපලු
අශ්‍රව- මස්බෑද්ද, (මේලිප්පරිත්තිය) මුගුණ්වැන්න, කොතුරුබෑද්ද

අශ්‍රවා

අශ්‍රවා-මකුළුවැන්න
අශ්‍රෑ-කොකුම්
අෂ්ටකර-කරඹ
අෂ්ටකීර-එලු, බැටලු, ගව. මහිෂ, ඔටු, ඇත්, කොටලු, මනුෂ්‍ය යන මොවුන්ගේ කිරි අට වගීය
අෂ්ටවූණීය-ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි, සුදු දුරු, කලුදුරු, අස මෝදගම්, පෙරුම්කායම්, සවිඳ ලුණු යන මේ අට
අෂ්ටජ්වර- වාත, පිත්ත, කඵ, වාත, පිත්ත, වාත ශ්ලේසමා, පිත්තශ්ලේසමා, සන්නිපාත, ආගන්තුක යන මේ අට
අෂ්ට ජල= ලිං, විල්, ගංගා, පොකුණු දිය සහ කෙම් (ගල්) පැන්, වැසිදිය, කඳුලැලි, (කුඩා ජලපාරවල්) ඔය යන මේවායේ ජලය
අෂ්ට ධාතු-රන්, රිදී, තඹ, ඊයම්, සුදු ඊයම්, කාන්දම්, යකඩ, වානේ යන ධාතු අට
අෂ්ට මහා ඖෂධ- (අෂ්ටක වගී) ජීවක, වෘෂභක, මේදා, මහමේදා, කාකොලි, ක්ෂීරකාකොලි, සෘද්ධි, වෘද්ධි
අෂ්ට මහා රොග- වාත, ප්‍රමේහ, කුෂ්ට, අර්ශස්, භගන්දර, අශ්මරි, මූඪගර්භ, උදර යන රෝග අට
අෂ්ටමූත්‍ර- මීහරක්, එලු, පලෙලු, ගව, අශ්ව, කොටලු, ඔටු, ඇත්, යන මේ සතුන්ගේ මූත්‍ර
අෂ්ට ලවණ-සිදු ලුණු, සුවස ලුණු, කලු ලුණු, මුදු ලුණු, පාංශුලුණු, බලල් ලුණු, උද්භිද ලුණු, රෝම ලුණු, යන අට ලුණු

අසම්ග්‍රන්ථ

අෂ්ටවිධ ගන්ධ- මූල, සාර, සුඹුලු, (සිවි) තව, පත්‍ර, පුෂ්ප, ඵල, සමීසංහාර යන සුවඳ වගීය අට
අෂ්ටවිධ පාන- අඹ, දඹ, ඇට කෙසෙල්, මස්කෙසෙල්, මධු, මුද්දික, ඕලු, බොරලුදමුණු (උගුරැස්ස) යන රත් කොකර ඇල්දිය සමග මිරිකා ගන්නා අට වගීයේ යුෂ
අෂ්ටවිධ මූත්‍ර-ගජ මූත්‍ර, හය මූත්‍ර, රථ මූත්‍ර, ආමලකී මූත්‍ර, වළලු මූත්‍ර, අඞ්ගුලිවෙඨකමූත්‍ර, කකුධ ඵලමූත්‍ර, ප්‍රකෘතිමූත්‍ර
අෂ්ටාඞ්ගය- (වෛද්‍යශාස්ත්‍රයෙහි) ශල්‍ය, ශාලාක්‍ය, කායචිකිත්සා, භූතවිද්‍යා, කෞමාරභෘත්‍ය, අගදතන්ත්‍ර, රසායන තන්ත්‍ර, වාජීකරණ තන්ත්‍ර
අෂ්ටාපද-අත්තන ගස. ඉද්දගස
අසකාත්-මුරුතගස
අස්කුර-එල කටරොලු
අස්ථිමක-කලන් හය
අස්පුදුන-වල්කපු
අසනමතී-මස්වැන්න
අසනිසංහාර-සීරැස්ස
අස්තිංගල } සීරැස්ස
අස්තිශෘඞ්ගල }
අස්ගොදු-අමුක්කරා
අස්ථමය-පලම් දෙක
අසනමතී-ශාලපර්ණී (සල්වැන්න)
අසතු-කිකිරිඳිය
අසෙනා-වරාගස
අසෙනාන-ගිරිතිල්ල
අසන්‍ර-පිල, හෙල පිලගස
අසම්ග්‍රන්ථි-රෝග විශෙෂයක්

අසපිඵල–කොස්ගස
අසපිහඩග–ඇට බිඳුම් රෝගය
අසපියුජ්–නවහන්දිගස
අසපිරාඩ්ක්‍රික–කිතුල්ගස
අසපිශ්‍රැඛලා–නවහන්දිගස
අසපිසංහති, අසපිසංහාර, අසපිසංහාරී, අසපිසංහෘත් – නවහන්දි ගස
අසපිසඞ්ඛානකර–ලුහුනු
අසපිසඞ්ඛානජනනී–නවහන්දි ගස
අසපිසඞ්ඛික–නවහන්දි ගස
අසපිසම්බඞ්ඛන–දුම්මල
අස්තඝ්නි–ගම්සූරිය ගස
අස්තඝ්නී–ගම්සූරිය ගස
අස්තඝ්නී–ගම්සූරිය ගස
අස්පොතා–කටරොලුවැල
අස්ඵොතා–ඉරමුසු
අස්බැද්ද–අස්වැන්න
අසමකජ–ගල්මද
අසමගඹී–කෝන්ගස
අසමතාඤ්ඣන්–අසමෝදා
අසමදම්–ගල්මද, ගල්සෙවෙල්
අසමන්තක–කොබෝලිල, පොල්පලා
අසමන්තර–ඔලිඳවැල
අස්මපුෂ්ම–ගල්මද
අස්මභෙදී–පොල්පලා
අස්මයෝනි–කොබෝලිල
අස්මරී–ඇද්දෙමට ගස
අස්මසර–රසාඤ්ජන
අස්මාර–කණේරු
අසවකර–සාරඹ
අසවකල–හල්ගස
අසවගන්ධි–අමුක්කරා
අසවත්ථ–පසකුරු
අසවපුච්ඡි–මිස්වැන්න
අසවභෙදී–පහණබෙය
අසවල්ලී–ඇසතු, බෝ
අසවල්ලීකර–ඇසතු, බෝ, කිරිබෝ ගස
අස්වැන්න– තුරඟ පයක් වැනි කොළ ඇති කටසාරවත කුඩා වැල් වර්ගයක්
අස්විස–වසතැල්ල
අසසකණ්ණා–සල්
අසසමාරකෝ–කණේරු
අස්‍රඛදිර–රත්කිහිරි
අස්‍රපත්‍රක–බණඩක්කා
අස්‍රඵලා (ලී)–ඉදුසල්ගස
අස්‍රරෙණු–සිඳුරම්
අස්‍රරෝධිකා–නිදිකුම්බ
අස්‍රවිඤ්ඤුවජ්ඩු–රසතැල්ල
අස්‍රාර්ජක–සුදුවත් තලා ගස්
අස්‍රාහ්ව–කොකුම්
අස–ආසව, මත්පැන්
අසන–බක්මී, පියාගස්, මුරුතගස
අසනියමල්–විලඳ
අසනෙ–පියාගස්
අසබදනය–අස්ගොඳු, දුටුසතුටු
අසමන්තර–මයිල, ඔලිඳ
අසමෝද–අජමෝජ– (ආදි මෝජ ගම්–අසමෝදගම්)
අසවි–කරිවිල
අසාර– වැල්මදට, එරඹු, අහිල්, ජයපාල
අසාරෘ–කෙසෙල්
අසිත–බෙරු, අහිල්
අසිතක–කලුඅහිල්
අසිතපත්‍රක–උග් ගස
අසිතඵල–පොල්ගස
අසිතද්‍රුම–කළුතල්ගස
අසිතපලලවා–බලු දම්, දඹගස
අසිතඵල–මුරිසි පොල්
අසිතවල්ලී–නිල්ඊතණ
අසිතසාර–තිඹිරිගස

අසිතා-අවරිය ගස
අසිතාඤ්ජනී-කළුකපු
අසිතාඛලමොට්ටා-කලුතිත්ථිභවැල
අසිතාම්‍රශෙඛර-අවරිය ගස
අසිතාලතා- නිල්ර්තණ, සැම්ලිය
අසින්මොට්ටු-සපුකැකුල
අසිනි-සිහින් එන්සාල්
අසිපංගංපාලෙයි-තොටිල
අසිපත්‍ර-අසිපත්‍රක=උක්ගස
අසිලු-පුසුල්
අසිවස්-විෂසර්පියා
අසු-අහුගස්
අසුගස්-අහුගස්
අසුවි-ශුක්ලය
අසුහ ණ්ඩි-ත්‍රාසනවාලු
අසුර-ලූසුණු, (සුදු ලූහුණු,) මූහුදු ලූණු,දේවදාර, කරාබුනැට්
අසුරඵලා-කුකුරුඇමුවන්
අසුරසා-අදුතලා, වේලාගස
අසුරා-කහ
අසුරී-හෙල අබ, (සුදු අබ)
අසෙනියමල්-විලඳ (ලාජා=පොරි)
අසෝක-හෝපලු
අසෝකය-කුළුරුණ
අසෝකරෝහිණී- කුලුරුණ (කටුකරෝහණ)
අසෝකා- කුලුරුණ (කටුකරෝහණ)
අසෝකු-දියරතඹලා
අසෝකෙ-හෝපලු
අසෘක්-හුරිර (ලේ)
අසෘගහද-කොට්ටම්
අසෘග්දර- රක්ත ප්‍රදර රෝගය
අසෘජ-ලේ, කොකුම්
අසෘණ-සිවන්ගුරු
අත්ත-දවස
අත්වලා-බදුල්ලගස
අහතීක-වරාගස
අහස්- මිණිරන්
අහස්කර- වරාගස
අහස්පැන්-වැහිවතුර
අහස්හෙදි- මිණිරන් අළු
අහසකණමැදිරියා- උඩවැඩියාගස
අහි- උදරාවර්තරෝගය, දළුක් ගස
අහිංස්‍රා-කන්ථාරි වෘක්ෂය,
අහිකා-ඉඹුල්ගස
අහිගන්ධ-සස්සඳ
අහිගන්ධඵලා-ඉදුසල්ගස
අහිචත්‍ර-මැඩහඳු
අහිචත්‍රක-බැලතණ
අහිචත්‍රා-හාතාවාරිය-හකුරු
අහිජිහ්වා-හාතාවාරිය
අහිත්ථ-වල් උලුවාහාල්
අහිනිලා-සුස්වැන්ත
අහිදංස්ට්‍රා-ඇන්සැටිය
අහිනිර්ලයනී-නහිසැව
අහිඵල-පතෝලවැල
අහිඵෙණ-අබින්
අහිභයදෘ-බිම්තෙල්ලි
අහිභුජ්- මොණරා, ගුරුලා,
අහිමද්‍යනී-වරාගස
අහිර්දමනී-අරත්ත
අහිමාර-නිඹුරු-බුලත්(නාගවල්ලි)
අහිමේදක- විවිඛදිර(ගුරුන්ද)ගස
අහියෝනි යොමක- රූකගුණ, (ගස්අහුණ,) පුවහු
අහිශෝවන-නහිසැව
අනිලතා-බුලත්වැල
අහිල්‍යා-වල්ළුලුවාහාල්
අහිලෞකිකා-බිම්තෙල්ලි
අහිවල්ලි-බුලත්වැල
අහිසුගන්ධිකා-සස්සඳ
අහින්ද-ඉරමුසු
අහිරූහ-තේක්කගස
අහු-අහුගස
අහේරු-සාතාවාරිය, සතමූලි
අහෝ-වෘක්ෂ

ආ

ආකඛත –විලඳ
ආක්මත –විලඳ
ආක්ෂභ්‍ය–සුවසලුණු
ආක්ෂික–කටුවෙලඟ, රත්හඳුන්
ආක්ෂිව–ඇද්දෙමට, මුරුංගා ගස
ආක්ෂෝඨ–ගල්පියල් (ගල්පියාගස)
ආකල්ල–ආකල්ලක– අක්කර පව්ටා
ආකාරකරහ–අක්කරපව්ටා
ආකාශ–මිණිරන්
ආකාස–බත්ඩක්කා
ආකාසතාම්රෙරෙයි– දියපරඬැල්
ආකුලින්– රණවරා, බටු
ආකුලී– අරන්ත, එලබටු, රණවරා
ආඛු– දෙවතාඩ (දේවදාලිය) වෘක්ෂය
ආඛුකර්ණී– රැප්පාකොල (කොතුරු බැද්ද= මූෂික කර්ණී=මීකන්පලා)
ආඛුජීත්– බිම්නෙල්ලි
ආඛුපර්ණී– දැත්ත, කොතුරු බැද්ද, මීකන් පලා
ආඛුපාෂාණ– මූෂික පාසානම්= (මීපාෂානම්)
ආඛුඵලා–කුඩාදැත්ත
ආඛුවිෂජීත්– රැක්අත්තන
ආඛුවිෂපහා– දෙවතාඩ වෘක්ෂය
ආඛෝට– ඕර, ඇටමෝර, ගල්පිසා ගස
ආග්නේය– නහර ප්‍රාණවත් කරණ ද්‍රව්‍ය, රත්රන්, ගිතෙල්
ආගච්ඡාදනඵල– කපු, මහ කපු
ආගක– මී පැණි
ආගන්ධපත්‍රිකා– අඳුතලා
ආගන්ධහ– කිඳි, රසකිඳ
ආගමාස, රත්නිවුල්
ආගස්ත්‍ය– කතුරු මුරුංගා
ආගුජී– බෝධිඇට
ආඝටක– රතුකරල් සැබෝ
ආඝාට– කරල් සැබෝ
ආඩකය– පලම් හැටහතර
ආඩගික– ඇසටු
ආඩජික– ආක්ෂික (කුඩුවෙලඟ)—වෘක්ෂය, රත්හඳුන්
ආඩඡාදනඵල– මහකජු, රතුකපු
අඩඡාදනී– කපුගස
ආඩජුක–අහුගස්, කුඩු වෙලඟ ගස
ආඩන්ද්‍රහාෂා– රසකිඳ
ආඩම
ආඩම්න } ඉරිවේරිය
ආඩාම– ඔනින් පෙරු කැඳ
ආඩාරියාපලු– අවරකරල්, (වදුරුමැ වෙසෙසක්)
ආඩු– කුඩුවෙලඟ
ආඩ්‍ය– ගිතෙල්
ආඪවලල– රම්මානිස්ස, වල්තලා
ආඪරාඛ } වංඇපල, (අගල් ආදර, වැටහිර, ආඩා—තෝඩා
ආඪරූස }
ආඪ්‍යාර– පිත්තල
ආඬකී– රට තෝර, තෝරපරිප්පු
ආඬතෝඩා– වංඇපල
ආඬුකෝඩෙයි– වංඇපල
ආඬුනිත්‍යත්තාලෙයි–ආඬතෝඩා
ආඬෙයිඹ්වට්ටි–තුත්තිරි, ඇත් තුත්තිරි
ආඬක– නැලිහතර
ආඬකී– වෙල්ලප්පාසානම්, නාපිරිත්ත, තල
ආත්තිගණ්ඩ– වව්වනාවි
ආත්තිපු– මයිලමල්
ආත්තී– මයිල
ආත්ම– කොට්ටම්, පෙනෙලගස

ආත්මගුප්තා- වඳුරුමැ
ආත්මජා- සූරා
ආත්මජීවණී- කිරි
ආත්මමූලි- ඇල්කසඹිලියා
ආත්මරක්ෂා- ගොන් කැකිරි, මහ ගොන්කැකිරි
ආත්ම විශාලා-මීවනපලා
ආත්මශල්‍ය-හා තා වා රි ය, හින් හාතාවාරිය
ආතඛ්ක-ලෙඩ
ආතපර්ණිකා-කිරිපලු
ආතපර්ණී-කිරිපලු
ආවිඛග-ආපිත-අබින්
ආද්‍ර-යුෂ, ජලය
ආද්‍රනාගර-අමුඉඟුරු
ආද්‍රිම-ගල් සෙවෙල්
ආදුන-ආදුනී-මහ වැටකොලු
ආදුනපාකී-කටුපිල
ආදූරී-කපු, ඇඹුල්වේ (ගොරක)
ආදුලවේර්-දැත්තමුල්, දැත්ත ගස
ආදුලි-සුදුදුරු
ආදි- වසතාල්ල
ආදිත්‍ය-බැවිල, සිරිවැඩි බැවිල, වරාගස
ආදිත්‍යකාන්තා - කොබෝවක්කා
ආදිත්‍යතෙජා-කොබෝවක්කා, බැමිනිරිය
ආදිත්‍යපර්ණිකා-කොබෝවක්කා
ආදිත්‍යපුෂ්ප-ලප්තාල්ල, මයිල ගස, කිරිකවෙලු
ආදිත්‍ය පුෂ්පිකා-රතුවරා ගස
ආදිත්‍යබන්ධු-කොබෝවක්කා
ආදිත්‍යභක්තා-වල් අබ
ආදිත්‍යවල්ලභා- ආදිත්‍යවල්ලී= කැකිරි, කවුඩුකැකිරි, කොබෝවක්කා(කෝවක්කා)
ආද්‍යමාෂක- ඔලිඳ ඇට පසක බර
ආද්‍යමාෂා-මස්වැන්න
ආධාරි-කපු, ඉය කොළ, මහ කපු,
ආධික්‍ය-ගොටුකොල, මීකන්පලා, (මකුලුවැත්ත)
ආනඳ-මහ දඹරුක (ගුඩාඣී-ප්‍රහේලිකා=රහස් බෙත් වට්ටෝරුවක වචනයක්)
ආනඤ-ඉරමුසු, මහ ඉරමුසු, කංසා, මුංවැන්න
ආනවාලු-ඇත් කෙයෙල්
ආනාබු-රඹුක්, වැළක්
ආනාහ-බඩ පිපුම
ආනූප- අත්නාසි ගස, දිය මිදෙල්ල
ආනෙයිනෙරෙන්වි-මහනෙරෙන්වි (මහ ගොකටු)
ආප-ඉරිවේරිය, වතුර
ආපත්‍යා-කැලිය, ගස් කැලිය
ආපන-ගම්මිරිස්
ආපස්-ඉරිවේරිය, ජලය
ආපසුම්දු-ප්‍රසාරිනී

ආපසුම්දු



ආපසුම්දු-ප්‍රසාරිනී- (ගඩිහඳා)
Paederia Foetida

ආපසු මදු

දූනට ලඞ්කාවේ බහුල වශ යෙන් වැවී තිබෙන මේ වැල් වර්ගය මධ්‍යම හා නැගෙණහිර හිමාල අඩ විය ජන්ම භූමිය කොට ඇති වටිනා ඖෂධයකි. ලඞ්කා වේ මෙන්ම බෙන්ගාලයෙහි ත් බට හිර අඩිදඹපවල ත් මෙය පැතිර ගොස් තිබේ. විශෙෂයෙන් වාත රක්තයට හා සාමාන්‍යයෙන් සිය ළු ම වාතාබාධ වලට ප්‍රත්‍යක්ෂ ගෘහෞෂධයක් වූ මේ වැල් වර්ගය කෂායය, අරිෂ්ට, ආසව වර්ග හා වෙන ත් පාන වර්ග සකස් කර ගැනීමට ත් ප්‍රයෝජන වත් ය. මෙ හි කොළ ව්‍යඤ්ජන පිණිස ගණිති. තද ගඤ්ඡයකින් යුත් මේ වර්ගයට **ගණිකාභද්‍රා** යන සංස්කෘත නාමය ද ව්‍යවහාර වේ. මදු කොළ වලට සමාන මේ වර්ගයේ දෙක බැ ගින් හැම සන්ධිස්ථානයක ම සෑදෙන කොළ ආපස්සට හැරිඇත. එමනිසා මේවර්ගයට **ආපසු මදු** යන සිංහල නාමය ද අන්වර්ථවූවක් ලෙස සැලකිය හැක. නිතර ම දළු ව ආපස්සට නැමෙන මදුවැල් වර්ගය ද ඇතැම් වෙද මහතුන් ප්‍රසාරිනී (ආපසු මදු) වෙනුවට ගණිති.

කිරිනොමේරූ කුඩා වසු පැට වුන්ට කැමට දෙන කිරිසහිත ඒමදු වැල්වර්ගයේ ප්‍රසාරිනී වැල්වලඇති සුවඳ හෝ ගුණ ය නැත.එහෙයින් ආපසු මදු (ප්‍රසාරිනී) වෙනුවට ගතයුත්තේ ඒ මදුවැල් නොව ඉහ තින් විස්තර කළ **ගණිකාභද්‍රා** නමැති වැල් වර්ගය යි.

ආම්ලකී

ආපිංජර-රත්‌රන්
ආපීත-මැසිඳ
ආපීඩග, ආපීණ, ආපූක } අබිත්
ආබ්දිකා-සියඹලා
ආභා-කොකුම්, සීනිය ගස, ලාඞ්ගලී වෘක්ෂය
ආභීජි-රුක්බුරුද
ආභීරු-කුඹුරුවැල්, කොහිල අල
ආභීෂණ-කොහිල, කුඹුරුවැල්
ආම්ම්‍ර-අඹ-දඹ
ආම්ම්‍රඵල-කාමරංගා, අඹ ගෙඩි
ආම්‍රඝාකුනි-උක් වෙසෙසක්
ආම්‍රවනද-අඹ පිළිල
ආම්‍රවාට-ඇම්බරුල්ලා
ආම්‍රවෙතස-ආඹුල්වේ (ගොරක)
ආම්‍ර වෘක්ෂ-ගොරක ගස
ආම්‍රාතක-ඇම්බරුල්ලා ගස
ආම්‍රාවතී-ඇම්බරුල්ලා ගස
ආම්‍රාවෘත-ලෝලුගස
ආම්පල්-ආඹුල
ආම්බල්-කුමුදු, රත් ඕලු, එක් පෙති පියුම්
ආම්බලඵල-කාමරංගා ගෙඩිය
ආම්බලේඵල-කාමරංගා
ආම්බුතකරෙඝි- හිවල් තෝර, (පැණි තෝර)
ආම්ල-ආඹුල් වර්ග, කාඩිය, කිරිලා පලා, දෙහි ගස
ආම්ලක-නෙල්ලි, හොමුවගු
ආම්ලකා-නෙල්ලි ගස, පිටවක්කා, හොමුවගු
ආම්ලකපීශ-ආඹුල් කපු
ආම්ලකාඤ්ජිකා- කාණි, ආඹුල් මෝරා
ආම්ලකී-ආඹුලු ඵල(නෙල්ලි)

ආම්ලකී පත්‍ර ආයසමල

ආම්ලකීපත්‍ර-තලිස්පතුරු (තෙල් ලි කොළ)
ආම්ලකෙශර-ලප්නාරත්
ආම්ලපඤ්චකය-ගොරක, ලප්නා රම්, දෙඩම්, සියඹලා, නාරත්
ආම්ල පත්‍ර-ඇඹුල්ඇඹිලිය
ආම්ලපත්‍රිකා-සිනිඹලා
ආම්ලඵල-කාමරංගා, කිරල ගෙඩි
ආම්ලපිත්ත-රෝගයක්
ආම්ලපුෂ්ප-කරඹ, සුලුකරඹ, මහ කරඹ
ආම්ල පුෂ්පඵලා-කරඹ,සුලුකරඹ, වාගස්
ආම්ලපුෂ්පී-කොබෝලිල
ආම්ලපූර-සිනිඹලා (සියඹලා)
ආම්ලලොහිකා-සිහින් සියඹලා
ආම්ලලෝත-ඇඹුලැඹිලිය
ආම්ලලෝනිකා- ලේ නි ය ප ලා, ලේන පලා, ඇඹුල් පලා
ආම්ලවක්ත්‍රත්‍ව-පි නි න් උපදනා රෝගයක්
ආම්ලවති-ඇඹුලැඹිලිය
ආම්ලවල්ලී-වැල් නිවිති
ආම්ලවාසතුක-ඇඹුලැඹිලිය
ආම්ලවෙතස-ඇඹුල්වේ (ගොරක) හෝ ඇඹුලැඹිලිය
ආම්ලා-සියඹලා, දෙසි, තෙ ල් ලි, ඇඹුල්
ආම්ලාතක-ඇම්බරුල්ලා ගස
ආම්ලාන-උදුපියලි
ආම්ලානික-රත්වන් කටුකරඹු
ආම්ලිකා-ලේනියපලා, ඇඹුල්කපු, සියඹලා, රත්වන් කටු කරඹු
ආමගුප්තා-ගිවුලු, (දිවුල්)
ආමණ්ඩ-එරඹු, හෙල එරඹු
ආමණ්ඩක-එරඹු, තෙල්ලි
ආමණ්ඩකී-තෙල්ලි, ඇඹුලුපල
ආමණකකම්
ආමණකකු } එරඹු

ආමනක්නේතෙසි-එඩරුතෙල්
ආමනිග්‍රාව-කැඳ
ආමපත්‍රිකා-සුදු තම්පලා වෙසෙ සක්
ආමය-දෙසි, කොට්ටම්
ආමරකත-ලේ අතීසාරය
ආමරණ කුමාරයා-ව ස තැ ල් ල-(රහස් බේත් ව ට් ටෝ රු ව ක වචනයක්)
ආමලක- තෙල්ලි,(ඇඹුල් ඵල) වං ඇපල
ආමලකා-පිටවක්කා, තෙල්ලි
ආමලකී-තෙල්ලි
ආමලකී පත්‍ර-තලිස් පතුරු
ආමලචඡද-තලිස්පතුරු
ආමල ඵල-කාමරංගා
ආමර්ලී-පිටවක්කා ගස
ආමවිර්ධූති-පලොල්
ආමශා-ඇසල
ආමහෙතු-ඇඹුලැඹිලිය
ආමාසය- ශ රී ර යේ තොදිරවූ ආහාර රැස්වන කොටස
ආමිසඛාරය-බත් වියලා පුළුස්සා සකස්කරගත් කාරම (මෙය ග්‍රහණියට ප්‍රත්‍යක්ෂ ඖෂධයක් ලෙස බු දු ර ජා ණන් වහන්සේ නියම කරණ ලද්දකි)
ආමික්ෂා-මිදෙන කිරි
ආමික්ෂය-කිරිමුහුන්
ආමිශ්කර-ලේ
ආමිසගඩිනී-අජීර්ණය
ආමිසී-සතපුෂ්ප, ජටාමාංශ
ආමුප-ආමුප් (කටුඋණ)
ආමොදක-අසමෝදගම්
ආමොද ජනනී-බුලත්, බුලත් වැල
ආයතචඡද-කෙසෙල්ගස
ආයස-යකඩ
ආයසමල-යකඩමල

ආයාම

ආයාම-වාතරෝගයක්
ආයුධ ධර්මිණී-තිවිඟ ගස
ආයුර්පීත-දේවදාලිය
ආයුර්ද්‍රව්‍ය-ඖෂධය, ගිතෙල්
ආගීවධ-ඇසල රුක
ආර්තකී-මහදැත්ත
ආර්තගල-නිල්හිරිතිල්ල, නිල්කටු කරඹු
ආර්තව-ඔසප් ලේ
ආර්ථනී-දේවදාලිය
ආර්ද්‍රක-අමු ඉඟුරු
ආර්ද්‍රජ-සිදහිඟුරු
ආර්ද්‍රනාගර-අමු ඉඟුරු
ආර්ද්‍ර මරිච-අමු ගම්මිරිස්
ආර්ද්‍රමාෂ-මස්වැන්න
ආර්ද්‍රාස්‍ය-අමු ඉඟුරු
ආර්ද්‍රිකා-අමු ඉඟුරු
ආයෂී-අහු, අහු ගස්
ආයෂ්මාසව-මදටිය
ආර-උදුපියලි, යකඩමල, හිරියල්
ආරකූට-පිත්තල
ආරග්වධ-ඇසළ
ආරග්වධාදිගණය- එරහැන්ද, රත්නිටුල්, හඟුලු, එරමිණිය, කොසඹ, පලෝල්, සිහින් මැඩ හඟු, රසකිඳ, කැකුණ, කුකුරු මුවන්, දියමිත්ත, බිම්කොසඹ, දුම්මැල්ල, කරඳ, කෙළිදහල්, කටුකරඹු දෙවගඩ, සිරිල, රැක් අත්තන යන මේ ගණය ප්‍රමෙහ, කුෂ්ට, උණ, වමණ, විෂ, සෙම යන මේ රෝග නසන්නේ ය.
ආරණ්‍ය-මූරැත
ආරණාල-පොතුහැරි තිරිඟු ගෙන එමෙන් සිව් ගුණයක් වතුර වත් කර පැසවා හෝ තොපැසවා භාජනයක දමා සතියකින් පසු පෙරා ගත් ජලය සි.

ආවතීකී

ආරණාල-කාඩි දිය, ඇඹුල් දිය
ආරණ්‍ය-මහ මිදි
ආරණ්‍යක-කුඹුක්, සිහින් කුඹුක්
ආරණ්‍යක පති- මූරැත, වනමූරැත
ආරණ්‍ය කදලි-ඇටකෙසෙල් (වන කෙසෙල්)
ආරණ්‍යතුලසි-හෝතලා, වල්තලා
ආරණ්‍ය මුද්ග-වනමුං, මුංවැන්න
ආරමන්දි-මීගස
ආරල්ව-තොවිල
ආරලීය-කණේරු, සුදු හෝ රත් කණේරු
ආරවර-උදු
ආරසව-කුඹුක් ගස
ආරාම-දුම්මැල්ල
ආරිද්‍ර-අමුඉඟුරු
ආරිද්‍රනාගර-අමුඉඟුරු
ආරූක-වෙරළු ගස
ආරෝෂ්කර-බදුල්ල
ආරෙවක-ඇසල, (එරහැන්ද)
ආරෝග්‍යසිම්බී-ඇසල රුක
ආලලාක-කොතඹුරු, (කොත්ත මල්ලි)
ආල- හිරියල්, පොන්තරිතලාම්- (රත්හිරියල්) වී පොරි
ආලංගා-වැල් වගීයක්, කැවිලි වෙසෙසක්
ආලම්බ පත්‍ර-ඇඹුල් ඇඹිලිය
ආලකී-එලවරු
ආලාබු-දිය ලබු
ආලුක-සබරල, වෙරළු
ආලුව-අල
ආලෙ-නුග
ආලෝකී-ගැටතිටුල්
ආවට්ටකී-දියමිත්ත
ආවතීකී-දේවදාලිය, මහ දැත්ත, ලිනිය, ඇල්වී

ආවර්තිනී

ආවර්තිනී-මැඩහඳු
ආවත්තී-කැකිරි, කෝවක්කා
ආවාට-මෝ න ර කු ඩු ම් බි ය, කොබෙයි කොළ
ආවාහන්‍ය-මැසිදෑ, (මාක්ෂික)
ආවිකී-ඉදුසල්ගස
ආවිග්ත-කරඹ
ආවිද්ධකර්ණී-දියමිත්ත
ආවීර-කොටදිඹුලා
ආවිවෘක්ෂ-මැඩහඳු
ආවේග-කපු
ආවේගි-වෘද්ධදාරු වැල් (ලංකාවේ මේ වෙනුවට ගිරිතිල්ල= මාඛණ්ඩා වැල් ගනිති.)
ආවෘතත-ගිවුලු, (දිවුල්,) මැ සි දෑ (මාක්ෂික)
ආශුප-උණගස් වෙසෙසක්
ආසුපත්‍රී-ඉදුසල්ගස
ආශූරී-හෙල අබ
ආශ්‍රව-කෙසෙල්
ආශ්‍යපත්‍ර-නෙළුම් මල්
ආසෙනාත-ගිරිතිල්ල
ආස්ඵෝත- වරා ගස, කොබෝලීල, කටරොලු වැල
ආස්ඵෝට-ගල්මොරගස, වරාගස, සීනිද්ද
ආස්ඵෝටා-සීනිද්ද
ආස්ඵෝතා-රතුවරාගස, කොබෝලීල, කැලගස
ආස්ඵෝතා-ඉරමුසු, ඉද්ද, එලවරා, කටරොළුවැල, කිණිහිරිගස
ආස්වප්ත-ඇසතු
ආස්‍යපත්‍ර-නෙළුම්මල
ආස්‍යපුෂ්ප-සුදුකරල්හැබ
ආස්‍යඵල-සුදු අත්තන
ආසනිඵලා-දෙල්
ආසව-අර්ක, සුරා, උක් පැණි

ඇ

ආසවද්‍ර-තල්ගස, පියල්ගස
ආසුර-බළල්ලුණු, මුහුදුලුණු, කළු අබ
ආසුරී-අබ
ආහාර්‍ය්‍ය-බුළු
ආහුරඵෙන-අබින්

ඇගැස්ස-හන ගස
ඇඟිලි-ඉඟිනි ඇට
ඇඟිලි අඟ අල-නියඟලා අල

ඇට්ටමුරා

ඇට්ටමුරා

දිරාගිය පොතු සහ වවුල් ආදි පියාසර කරණ සතුන්ගේ වසුරා එකතුවීමෙන් පෝර පස් සෑදුන විශාල දෙබල් ඇති ගස්වල හටගන්නා උඩවැඩියා වර්ගයක් වූ ඇට්ටමුරා අහාරයට යන්ට යන ප්‍රයෝජනවත් වැලකි. මේවායේ කොළ බොහෝ දුරට තෙබු කොළ වලට සමාන ය. අක්කපාන කොළ වලට වඩා සවල්පයක් සණ හාවයෙන් අඩු ය. වැලේ කඳ රඹුක්

වැල්වල කඳට සමාන ය. එය ප්‍රමාණයෙන්ඇලවේවැලක් පමණඇත. කඳ සුදුපාට ය. පැරණි දේශීය කැඩුම්-බිඳුම් වෙදකමේ ඇට පැස් සීමට ගන්නා ප්‍රධාන ඖෂධය මෙය යි.

ඇවිටර- (ඇවිටේරිය), සුදු මල් ඇති සුවඳ හමන ගස් වර්ගයක්
ඇටියෙල්-ඇට්කෙසෙල්
ඇත්අඩි-පොළවේ මට්ටමට ඇත් අඩි වැනි කොළවටයක් ඇති පැලැටියකි
(“ගොදිවි” යන වචනයෙහි මේ ගැණ ඡායාරූපයක් සහිත විස්තරයක් ඇත.)
ඇත්ඉලතනි-ඇත්බෙටි
ඇත්කන්-කඳල, හබරල
ඇත්කන්වැන්න-හබරල
ඇත්කැන්-කැල
ඇත්ගඳ-රැක්අත්තන
ඇත්නිප්පිලි, ඇත්පුල් } ගජනිප්පිලි
ඇත්මද-රැක්අත්තන
ඇත්විසවල-රැක්අත්තන
ඇත්සොඩ-ශ්‍රී හර්ෂිණී (ඡායාරූපයක් සහිත විස්තරයක් ශ්‍රී හර්ෂිණී ඡේදයෙහි ඇත)
ඇද්දෙමට-කට්ඵල=(කෘෂ්ණ ඵල-රොහිණී (ඇත්දෙමට ගස ගැණ විස්තර හා ඡායාරූපය රොහිණී යන වචනයෙහි ඇත).
ඇදැරිය- වඳුරා මෑ
ඇදිරදුරා- කලුදුරා
ඇදිලිය-ඇම්බරංගා, ඇම්බරල්ල ගස
ඇඹල-සියඹලා
ඇඹළල-ඇම්බරල්ල
ඇඹල පලා-ඇඹුල් ඇඹිලිය පලා
ඇඹැරල්ල-ඇම්බරල්ලා ගස
ඇඹිවි-ඇඹිලිය-දියඹිත්ත
ඇඹිල්ල-ඇඹුලැඹිලිය
ඇඹුල- සියඹලා, හෙල් මැලි, නෙල්ලි, නිල් ඹිලු
ඇඹුල අල-ඹිලු මුල්- නෙළුම් අල හෝ මානෙල් අල
ඇඹුලබොටු-නොලු වැල්මී
ඇඹුලය-නිල් ඹිලු මල්
ඇඹුලු-නෙල්ලි
ඇඹුල් අඹු-ඇඹුල්කැඳ
ඇඹුල්කාඩි-කාඩිවතුර
ඇඹුල්කෙසරු-ලප්කාරන්
ඇඹුල්පලු -නෙල්ලි
ඇඹුල් පස- ගොරක, ලප්නාරං, දෙඩම්, සියඹලා, කාරන්
ඇඹුල්මෝරු-ඇඹුල්වූ කිරිමෝරු
ඇඹුල්වේ-ගොරක, ඇඹුලැඹිලිය, වෙරලු
ඇඹෙල්ල-“ඉන්‍ද්‍රශාල”නම් වෘක්ෂය
ඇම්පිය- (මිටිය) සියඹලා කොළ වැනි සිහින් කොළ හා සුදුපාට කඳත්, රන්පාට සිහින් මලුත් ඇති කැඩුම් - බිඳුම් වෙදකමට අවශ්‍ය ගසක්
ඇරගු-ඇසළ
ඇල්-ඉරිවේරිය
ඇල්කසඹිලියා-වැල්කඹිලියා
ඇල්මඩ-ර්තණ
ඇල්වැසි-පානවැස්ස
ඇලසම්බිමස්- ඇසලාඹි මුවමස් (ඇසලඹිමස්)
ඇළිරිවැල්-අවරවැල්
ඇසකිණිය- ඇස්ගුලිය, ඇසෙහි හටගන්නා අර්බුදයක්

ඇසටු-ඇසටු ගස
ඇසතු-බෝගස, ඇහැටුගස
ඇසළ-ඇසළ (එරහැඳි)
ඇස්පිල්-මොණරපිල්
ඇස්පිල්ල-ඇසිපිල්ල
ඇසෙල්-ඇහැළගස
ඇහැ-කන්සා
ඇහැකාංසා-කම්මුල් ඉදිමුම් රෝගය
ඇකාන්සා-ඇහැකාංසා රෝගය
ඇත්විසඵල-රුක්අත්තන
ඇපොතු-කබල්ලෑවාගේ පොතු
ඇමස්-කබල්ලෑ මස්
ඇමැඩි මස්-කබල්ලෑ මස්
ඇලියා-අජීණී රෝගයක්

ඉ-අමුකපුරු
ඉක්-උග්ගස්
ඉකට-උණකිළිල

ඉකිරිය-කටුඉකිරි, (නීරමුල්ලි)



ඉකිරිය-ඉක්ෂුර (කොකිලාක්ෂි)
Hygrophila Spinosa

ඊ ඉ

පුරුකක් පාසා කොළදෙකක්, කටු කීපයක් සහ ලා නිල් පැහැයෙන් යුත් මල් කීපයකුත් හට ගන්නා ඕජා සහිත ශීත ගුණයෙන් යුත් මේ පැලෑටිය මනුෂ්‍ය වර්ගයාට බොහෝ ප්‍රයෝජනවත් ඖෂධයකි.

මූත්‍රරෝග, ජලෝදර හා වකුගඩුවල ආබාධ වලට ත් පාවිච්චි කරණ ඖෂධ වර්ග අතර මෙය මුල් තැනක් ගණී. මූත්‍ර සමග සීනි හෝ පිටි යාම, මූත්‍ර අධික ව යාම, මූත්‍ර අපිරිසිදුකම හා මූත්‍ර දැවිල්ල යන ආබාධ වලට මේ ගසේ පඤ්චාඞ්ගය රණවරා මුල් සමග තම්බා නිවා මිපැණි අනුපාන වශයෙන් දමා දින පතා පාවිච්චි කිරීමෙන් බොහෝ ගුණ ලැබේ.

ඉකිලි-ඉකිලිය, (නීරමුල්ලි)
ඉක්ෂවාකු-තිත්තලබු
ඉක්ෂවාරි-ඊතණ,කුසතණ
ඉක්ෂවාලිකා- ඊතණ, කුසතණ, වැලුක්, රඹුක්
ඉක්ෂු-උක්, උණගස්, අමුකපුරු, ඊතණ, ඉකිරිය
ඉක්ෂුක- උක්, කරල්සැබ, හෙල කරල්සැබෝ
ඉක්ෂුකර්ණි-මකුලුවැන්න
ඉක්ෂුකන්ද-කිරිබදු අල
ඉක්ෂුකතීනී- ගොටුකොළ හෝ මිකන්පලා (මකුළුවැන්න)
ඉක්ෂුකාණ්ඩ- උක්දඬු, කිරිබදු, දලුක්, වැලුක්
ඉක්ෂුකාශ-උක්ගස
ඉක්ෂුකුසුම-රඹුක්, වැලුක්
ඉක්ෂුගන්ධ-ගොකටු, වැලුක්

ඉක්ෂුගන්ධා–රඹුක්, වැලුක්, ඉකිරිය (නීරමුල්ලිය)වරා, සින්ගොකටු, (හීන් නෙරෙංචි)
ඉක්ෂුගන්ධික–ගොකටු (නෙරෙංචි) කිරිබදු, කළු කොමඩු
ඉක්ෂුතුල්‍යා–රඹුක්
ඉක්ෂුපා } උක්සකුරු,
ඉක්ෂුපාක } උක් පැණි
ඉක්ෂුපත්‍රි–වදකහ, කිරිබදු අල
ඉක්ෂුපුඛා–පිලගස
ඉක්ෂුප්‍ර–බටගස
ඉක්ෂුප්‍රවාලක–වැලුක්,රඹුක්
ඉක්ෂුබන්ධ–වැලුක්, රඹුක්
ඉක්ෂුබාලිකා–වැලුක්,ඉකිරිගස
ඉක්ෂුබිදුරිකා } කිරිබදු,
ඉක්ෂුබිදුරී } හෙලකිරිබදු
ඉක්ෂුමූල–උක් මුල්, හුනගස, හුන මුල් හෝ හුන ගැට
ඉක්ෂුර– ගොකටු, ඉකිරි, උක්, කුසතණ
ඉක්ෂුරක-ඉකිරි ඇට
ඉක්ෂුරපත්‍ර-ඉලුක්, ආරුගම්පිල්ලු
ඉක්ෂුර පත්‍රක-දලුක්, ඉලුක්
ඉක්ෂුරස–වැලුක්
ඉක්ෂුරසක්ෂාථ–උක්සකුරු
ඉක්ෂුරාලිකා–වැලුක්
ඉක්ෂුවල්ලරී-කිරිබදු අල
ඉක්ෂුවල්ලි-කිරිබදු
ඉක්ෂුවාලිකා–බිම්තල්, වැලුක්
ඉක්ෂුවිකාර-උක්සකුරු, සීනි
ඉක්ෂුවිදුරිකා-කිරිබදු අල
ඉක්ෂුසාර– උක්පැණි, උක්සකුරු (ගුඩ)
ඉක්ෂුගද–ගොකටු (නෙරෙංචි)
ඉඟ–ඉසඟු, යක්බේරිය
ඉඟාල-ගිනිඅඟුරු
ඉඟු-උක්ගස
ඉඟුඩි-ඉඟුරු
ඉඟුල්–සාදිලිඛගම්, (හිඛගුල)
ඉඛකුතම්–වැල්අඟුන
ඉඛග–යක්බේරිය
ඉඛගල–අඟුන(කර)ගස
ඉඛගු–උක් ගස හෝ රෝගය
ඉඛගුද–වැල්අඟුන, ඉහිනි
ඉඛගුදි-වැල්අඟුන
ඉඛගුරා–මුරැත
ඉඛගුල–අඟුන(කර) ගස, හිඟුල්
ඉචඡා රොග–ආශාව නමැති රෝගය
ඉචඡුක–ලප්නාරං
ඉජ්ජල–මිදෙල්ල, දියම්දෙල්ල
ඉඤ්ඡි–ඉඟුරු (ඉඤ්ඡා–ඉඟුරු)
ඉඤ්ඡිකුලම්බු–ඉඟුරු ඉස්ම ආදිය ගෙන සාදනු ලබන බෙහෙතක්
ඉට්–මී, බඹර, දෙබර, කනවේ, දඬුවැල්බෑ යන මෙයින් හෝ කැකුණගස් ආදියෙන් හෝ ලැබෙන උෂ්ණයෙහි තැබූවිට උණුවී දියවන ලාවු වගීය
ඉටිකෙහෙල්–ගස්වල සෑදෙන පිළිල
ඉඩත්තල්–අන්දරගස
ඉඩාජාත–බිම්ගුගුල්
ඉඩිපලා–කලුකැම්මේරිය
ඉත්කට–ඇපල
ඉත්ත–ඉත්තැවැල්
ඉත්ථම්භකරී–වී (ධාන්‍ය)
ඉතණ–ඊතණ
ඉතාගද–වදකහ
ඉද්ද–ඉද්දවැල, මලිනිඝවැල (මාල ති–යොඝනාඛුවැල්)
ඉදකාඝ්‍යා– දුරාලඟා
ඉදරම්– රසදිය

ඉදවලු ඉඳුරු

ඉදවලු
ඉදලෝලු } රසවත් ඟතු වර්ගයක්
ඉදින්නරු- වැල්මදට, නිදිකුම්බා වැල්
ඉදි--යොන්ඉදි
ඉදු-ලූණුවරණ
ඉදුරු-ශුක්‍රධාතුව
ඉදුරුවරණ-ගොන්කැකිරි
ඉදුවර-නිල්මහනෙල් (නිලුපුල්)
ඉදුවරණ--ලූණුවරණ ගස
ඉදුවැල්-වැල්පෙතෙල
ඉනදරං-රසදිය (පාරද)
ඉඳ-නිත්තකපුරු
ඉඳනු- නිත්ත කැකිරි, නිල්මානෙල්
ඉඳපු- රුක්මල්
ඉඳයව-කෙළිදසහල්
ඉඳරා- පුවඟ, රුකඟුන (ගස් අඟුන)
ඉඳවාරුණී-නියඹරා
ඉඳසාල-ඉඳුසල් ගස
ඉඳුනි- නිල් මහනෙල්, නිත්ත කැකිරි
ඉඳුභද්‍ර-රණහුණ
ඉඳුමොල-කුඹුක්ගස
ඉඳිගඹ-රඹුක්
ඉඳිපපු-සව්දලූණු
ඉඳිවර- නිලුපුල්, නිල් මානෙල්, කසාවන් කටුකරඹු
ඉඳිවරා-ඇසල, ඟතාවාරිය, මැඩහඟු, කෙසෙල්
ඉඳිවරී-සතාවාරිය (පසිකැම්මේරිය)
ඉඳීර-කීකිරිදිය
ඉඳීරි-කුඹුක්
ඉඳු-කපුරු, සස්සඳ
ඉඳුකලිකා- වැටකේ, (කේතකී)

ඉඳුඛණ්ඩ- කකුළුසුඟු (කකීටක ශ්‍රිඛණි=කකුළුසුං)
ඉඳුවන්දන-සුදු හඳුන්
ඉඳුපපු-සව්දලූණු
ඉඳුපුෂ්පිකා-මයිල, ලියනහලා
ඉඳුඵල-ඇම්බරැල්ල
ඉඳුරකර්ණිකා-මිකන්පලා
ඉඳුරා (ජී)-බෝදිගස්
ඉඳුරෙඛා- රසකිද, බෝදි ගස්, සෝමලතා
ඉඳුලෙඛා-වැල්පෙතෙල
ඉඳුවල්ලි- වැල්පෙතෙල, කෙළිද සාල්, අසමෝදගම්, රසකිද
ඉඳුශුක්ලා-බෝදිගස
ඉඳු-කෙලිදගස, කලුරියම්, නික, කපුරු, හෙල තෙටුල්, රණහුණ
ඉඳුඋපල-ඉඳුනිල්
ඉඳුක-නික, හෙල නික
ඉඳුකදම්බක- කටුවෙලඟ, උගුරැස්ස
ඉඳුකණී- ගොටුකොළ, මකුලුවැන්න, (මීකන්පලා)
ඉඳුකණීක-රතු එරඹු
ඉඳුකාන්දි-වැලුක්, රඹුක්
ඉන්ද්‍රගුප්ත- සැවැන්දරා, (සුවඳ හොට)
ඉන්ද්‍රවන්දන-සුදු හඳුන්
ඉන්ද්‍රවිහීටිකා- මහ ගොන්කැකිරි
ඉන්ද්‍රජ-කෙළිද ගස
ඉන්ද්‍රජාතු-ගල්සෙවෙල්
ඉන්ද්‍රජිහ්වා-ලියනහලා
ඉන්ද්‍රතරු-කුඹුක් ගස
ඉන්ද්‍ර තෙල- පෙතෙල ආදී ඖෂධ වර්ග ගෙණ සිදින ලද ගුල්ම රෝගයට හිත බෙහෙත් තෙලක්
ඉන්ද්‍රදරු-දේවදර

ඉන්ද්‍රදුම

ඉන්ද්‍රදුම
ඉන්ද්‍රදුම } කුඹුක්

ඉන්ද්‍රදූ-කෙලිද, කුඹුක් ගස
ඉන්ද්‍රදූනි-නදුන්
ඉන්ද්‍රනීල-ඉඳුනිල්මිණි
ඉන්ද්‍රපත්‍ර-භූජපත්‍ර ගස
ඉන්ද්‍රපුච්ඡිකා-කෙළිද,කෙළිදසාල්
ඉන්ද්‍රපුෂ්පි-ලියනහලා
ඉන්ද්‍රපුෂ්පිකා- මසිලමල්, ලිය නහලා
ඉන්ද්‍ර පුෂ්පී-මසිල මල්, කොකුම්
ඉන්ද්‍රපූළීකා-කෙලිදසාල්
ඉන්ද්‍රබීජ-කෙලිද
ඉන්ද්‍රබොද-මකුලුවැන්න
ඉන්ද්‍රභූජ-සිරිතේක්කු
ඉන්ද්‍රභූජක-කලු ඊයම්
ඉන්ද්‍රභෙෂජ-සිඳඹිහුරු
ඉන්ද්‍රභෛෂජ-අමු ඉහුරු
ඉන්ද්‍රමොලි-කුඹුක්
ඉන්ද්‍රයව-කෙලිදසාල්
ඉන්ද්‍රයවඵල-කෙලිදසාල්, කෙලිද ඇට
ඉන්ද්‍රලුප්ත-උදුගොව්වා
ඉන්ද්‍රවතීකා-නිත්ත කැකිරි
ඉන්ද්‍රවවා-කෙලිදසාල්
ඉන්ද්‍ර ඵලලරී-ගොටුකොළ, මකුලු වැන්න (මීකන්පලා),මහගොන් කැකිරි
ඉන්ද්‍රවලලී- වැල්පෙනෙල, යක් කොමඩු, සුදු නොවුල්
ඉන්ද්‍රවාරුණී- තියඹරා, මහ ගොන්කැකිරි,යක්කොමඩු
ඉන්ද්‍රවාරුකිණී- නිත්තකැකිරි, මහගොන්කැකිරි
ඉන්ද්‍රවාරුණිකා- මහගොන් කැකිරි
ඉන්ද්‍රවීජ-කෙලිදසාල්

ඉභාඛ්‍යා

ඉන්ද්‍රවෘක්ෂ- දෙවදරු, කුඹුක්, සුදු කෙලිද
ඉන්ද්‍රසුත-කුඹුක්
ඉන්ද්‍රසූනු-කුඹුක් ගස
ඉන්ද්‍රසූරස-නික ගස
ඉන්ද්‍රා-රණහුණ, තලාගස
ඉන්ද්‍රාක්ෂී-කලුකිරිබදු, උණමකුලු, වෘෂභක(අෂ්ටක වගීයේ ඖෂධ යක්)
ඉන්ද්‍රාණී-නික, තලා, එන්සාල්, නිත්ත කපුරු
ඉන්ද්‍රාණිකා-නික, කලුතලා,තලා
ඉන්ද්‍රාඹිපාදප-පුවක් ගස
ඉන්ද්‍රාසන-කන්සා, හුනිඳ ගස
ඉන්ද්‍රාහ්ව-කැකිරි
ඉන්ද්‍රියබොධනී-මකුලුවැන්න හෝ ගොටුකොළ
ඉන්තල-රටල(හිනි අල-කුඩා අල වගීයක්=ඉනි අල)
ඉන්සලු-හින්සල්
ඉපුල්-නිල් ඕලු, මානෙල්
ඉභ-නා මල් රේණු, (නා කෙසුරු)
ඉභකණා-ගජනිප්පිලි, (ඇත්වග පුල්)
ඉභකුසුම- නාමල් රේණු (නා කෙසුරු)
ඉභකෙසර- නා ගස, කීත දෙඹ ගස
ඉභ ගන්ධා } නාගදනති න ම්
ඉභ දන්තා } විෂ වෘක්ෂය
ඉභපිප්ඵලී-ඇත්වගපුල්
ඉභ පුෂ්ප-නාමල් කෙසුරු
ඉභයා-(ඉභෂා) රැක්ගොකටු
ඉභර්ජුප්‍රා-හොමුවඟු
ඉභවලා-සිරිවැඩ් බැවිල
ඉභාඛ්‍යා-නාමල් රේණු

ඉහොඹණා

ඉහොඹණා–ගජනිප්පිලි
ඉහ්‍යා–ඉදුසල් ගස
ඉඹුල්–සාදිලිංගම් (හිඟුල්) ඹිම්බලි (ඉඹුල් ගස)
ඉඹුරු–හිඹුරු
ඉයවැල්– ඉයපලා, ඉය කොළ= ඉසඟු=යකාබැදි වැල්=රීරි බුස් තා වැල් (මේ හැම තමකින් ම කියන්නේ කුඩා ලමුන් අතර පඩ ගෙඩි තමින් හැඳින්වෙන ගෙඩි සැදෙන උඩහළු වැල් ය
ඉයසුඹුලු-ඉයවැල්වල සුඹුලු
ඉර්දිපලා–කළු කැම්මේරිය
ඉඕරු
ඉඕරුක } කැකිරි, තියඹරා
ඉඕරුකිනි– මහගොන් කැකිරි, තියඹරා
ඉඕරුශුක්තිකා–සීනි කැකිරි ගෙඩි
ඉරවිවිනසුවෙ–මස් තැම්බූ වතුර
ඉරතනම්–ගල්, ලේ, රත්රන්
ඉරමුසු–සුවඳතලා, (අපාමාගී)

ඉරරාජ

ඉරරාජ
Zeuxine Regia

ඉරුවිරකම්

නිතර දිය සිරාව ඇති තැන් වල පමණක් වැවෙන ඉතා ලක් ෂණ පැලෑටියකි. මෙහි කොළ දිග- පළලින් අඟල් 2 × 3 කට වඩා විශාල නැත. කොළයේ යටි පැත්ත බූවක් සහිත ය. උඩ ප්‍රත්ත ලා රත්වන් පාටින් යුක් ත ය. එහි දෙපසට බෙදී ගිය රත් පාට රෙඛා තිබේ. පැලය කෙළවර අඟල් තුනක් පමණ උස් වූ උඩට පිපියන ලඝණ මල් නටු වක් ද ඇත. රාජපහ (ඉරරාජ-සඳ රාජ-වන රාජ-ගරුඬ රාජ-ගුරුළු රාජ)ට අයත් මේ පැලෑ ටිය සිංහල වට්ටෝරු වෙද පොත් වල ඉතා ප්‍රත්‍යක්ෂ රහස් ඖෂධ යක් ලෙස හඳුන්වා දී තිබේ.

ඉරසකර්පූරම්–රසකපුරු
ඉරසරස්පම්– රස භස්ම (පාරද භස්ම)
ඉරසම්–රසදිය (පාරද)
ඉරා–අකී, සුරා, ජලය
ඉරාම්බර–පාන වැස්ස
ඉරාවත–නීන්නාරන් ගස
ඉරාවතී– නුග ගස, පහනබෙය (පොල්පලා)
ඉරික්කොඞි–කිරිබදු
ඉරිකීල–රැකගුත
ඉරිඟු–ධාන්‍ය වර්ගයක්
ඉරිමෙදක–කුඹුරු වැල–හිඹුරු
ඉරිම්පු–යකඩ
ඉරිවේරිය–ඉරිවේරි (කප්පරවල්ලි ගණයට අයත් ආමරෝග වලට ගන්නා පැලෑටියක්)
ඉරු–වරා ගස
ඉරුවිරකම්– දෙ දුරු (කලු දුරු, සුදු දුරු)

ඉරුම්බුකුට්ටම් – ඉහිපැන්ත

ඉරුම්බුකුටටම්-යකඩ
ඉරම්බුලි-පෝටාවැල්
ඉරුල්ම්චවුමරම්-ඇට්වේරිය
ඉල්මස පසුමස බැඟ-උ දු පි ය ලි (මෙය රහස් බෙහෙත් වට් ටෝරුවක එන වචනයකි)
ඉලඉක්කලලි-පතුක් ගස
ඉලකාසි-පියාගස
ඉලන්කාසි-ලා ගෙඩි
ඉලඳ-මසන් ගස (බෙබර)
ඉලඳලාකඩ-මසන්ගස්හි සැදෙන ලාකඩ
ඉලන්දෙ-ඩෙබර (මසන්)
ඉලණී-කසපැන්(කුරුම්බා වතුර)
ඉලපපතා-පිලගස
ඉලයිඉලවං-කොළ හිඹුල්
ඉලයිකකලලි-පතුක්
කර්කශපත්‍රක-දියබෙරලිය
කර්කශා-හීන්මැඩහඳු, වල්ඩෙබර
කර්කශිකා-වල්ඩෙබර
කර්කාරු-කොමඩු
කර්කිණී-වලඟසාල්, කර ගස
කර්කෙටි- වැල්තුඹ, රේරු, පුහුල්, දේවදාලිය
කර්කොටක- කැකිරි, වැල්තුඹ, රේරු, බෙලි ගස, උක් ගස
කර්කොටකා } වැටකොළු,
කර්කොටකී } කැකිරි
කර්කොටකී ඵල-දේවදාලිගෙඩිය, වටපුහුල්, තිත්ත වැටකොළු
කර්කොටජ-පුහුල් වැල
කර්කෝටි- වැල්තුඹ, කැකිරි, සිහින් ඩෙබර, රේරු
කර්කෝටිකා-වැල්තුඹ
කර්කෝරි-රේරු
කර්කෝලස-තකුල්, (කපුකිනිස්ස)
කර්බුර-අරණකසා, (හරංකහ)
කර්චූරක-හිඟුරුපියලි, සුවඳකසා, කහ ගස
කර්ජූර-ඉඳි ඵල
කර්ණ- ඇසළ (එරහැදි)
කර්ණක-සිහින් මිදි
කර්ණකා- ඇසළ, සිහින් මිදි,මහ එන්සාල්,කිණිහිරි
කර්ණකාරි-ඇසළ, කිණිහිරිය
කර්ණකී-කළුකිහිරි
කර්ණකුමී-කන් රෝගයක්
කර්ණගූථ-කාරදු
කර්ණජීරක-හීන්දුරු
කර්ණඩූ-බෙලි ගස
කර්ණපුෂ්ප-මුරුවා, නිල්ගිරිනිල්ල
කර්ණපූර-ඇඹුල්, නිල් මහනෙල්, අශෝකා, නන්දි රුක
කර්ණපූරක- කොළොම් ගස, මහරි, හෝපලු
කර්ණමෝටා- වේලා ගස
කර්ණරාව-දුහුදු
කර්ණශෙඛර-සල් ගස
කර්ණසංස්‍රාව-කර්ණ රෝගයක් (කන් පැසවීම)
කර්ණාඛ්‍ය-සුදුගිරිනිල්ල
කර්ණාටි-වලාවැන්න
කර්ණාහරණක-ඇසළ (එරහැදි)
කර්ණාරි-කුඹුක්
කර්ණිකා-සිහින් මිදි,-ඇසළ (එරහැදි)
කර්ණිකාර-කිණිහිරි, ඇසළ
කර්ණිදාඝක-කලුවැල්
කර්ණී-කාටුවැල්බටු

කර්ණීමත්-ඇසළ ගස
කර්ණෝර-දුහුදු
කර්තිම-පාංශු ලුණු, බළල් ලුණු, රෝම ලුණු, තුරුක්තෙල්, ලෝකඩ
කර්තිමුඛ-බළල් ලුණු
කර්ද, කර්දමක } මඩ
කර්දමගන්ධිකා-සිරිතේක්කු
කර්දමර්ද-සිරිතේක්කු
කර්දමුංගු-එන්සාල්
කර්දදූපට-මෝර
කර්දු-කිඹාරම් අල
කෂී-ගල්පියල්
කෂීටි-සකුරා
කෂීටිකා-කවඩි, වල්කපු
කෂීර-තුත්තම්, රිදීතුත්තම්, වතු වැල් (බාන්වැල්) දිඹුල් ගස, උක් පැණි
කෂීරාල-ගල්පියල් ගස
කෂීරිකා- මයුරතුතු (පල්මාණික්කම්)
කෂීරිකාතුත්ථ-තුත්තම්
කෂීරී-හොයඳුන්, රසඳුන්, ඉහිනි ගස
කෂීරිසා-රසඳුන්
කෂීරිතුත්ථ-තුත්තම්
කෂීරි-ඉහිනි
කෂීසක-කපු, කපු ඇට
කෂීසි-කපු, කපු ගස
කර්පිට-රිදී
කර්පූර-කපුරු, චීනකපුරු
කර්පූරක-සුවඳකසා, හිඟුරුපියලි, කපුරු
කර්පූරගන්ධ-විල කොල
කර්පූරතුලසි-කපුරු සුවඳැති තලා වෙසෙසක්
කර්පූර තෛල-කපුරුතෙල්, ඉරි වේරිය
කර්පූරරස-විලකොල
කර්පූරවල්ලි-කප්ප්‍රවල්ලිය
කර්පූරහරිද්‍රා-හරත්කහ
කර්පූරා- ආම්ගන්ධිහරිද්‍රා (කපුරු කහ)
කර්පූරිකා-තුත්තම්
කර්බර-අත්තන, උක් වෙසෙසක්
කර්බිනී-සඛණීකෂීරි, (රන්කිරි ගොකවු)
කර්බුදර- (ක) - නිල් ගිරිනිල්ල, හෙලපෙතන්, ලෝලු
කර්බුර-හිඟුරුපියලි, රන් හිරියල්, කහ ගස
කර්බුර ඵල-සාකුරාණ්ඩ වෘක්ෂය
කර්බූරා-රත් පළොල්, වේලා
කර්බූරු-රත්රන්, රත් පළොල්
කර්ම-කර ගස, බුජපත්‍ර
කර්මකර-හුණගස
කර්මකරි-මුරුත
කර්මකාරි-මුරුවා වැල
කර්මජ-නුග ගස
කර්ම ඵල-කාමරංගා ගෙඩි
කර්මමූල-කුසතණ, ඊතණ, බට
කර්මරඞ්ග-කාමරඞ්ගා
කර්මරී-උණකපුරු
කර්මාරක-ගැටනිවුල්
කර්මාශක්ෂි-වරාගස
කර්මාශුල-අරණකසා (හරංකහ)
කර්මාර-උණගස, කාමරංගා
කර්මාරක-කාමරංගා ගස
කර්වර-ලෝලු, ලාවලු, හිඟුපත්

කර්වරිකා

කර්වරිකා-හිඟුපත් තණ
කර්වදූර-කොබෝලීල
කර්වුදූරක-ලෝලු
කශීය-හිඟුරුසියලි
කෂි-තුන් කළඳ
කෂීකා-තෝර, රටතෝර
කෂීණි-අතසි වෘක්ෂය, හනගස
කෂීණී-කෂීරි වෘක්ෂය, හෙලවද කසා
කෂීණීයා-වැලුක්, තණ ඇට
කෂීඵල-බුලු, කරඹ, වාගස, නෙල්ලි ගස
කෂ්වකා-මිදි, සිහින් මිදි
කර්ෂිකා-වැලුක්, තණ ඇට
කර- **කර** ගස (මැල්ලුමට හා තම්බා කෑමට සුදුසු ඇට සහිත මූත්‍රකාරක ගසක්)
මෙහි කොළ මැල්ලුම් කෑමට ගනු ලැබේ. පොෂණ ගුණය. මේවායේ බෙහෙවින් ඇත. ආහාර දුලබ කාල වලදී මේවා කෑමෙන් ජීවත් වූ මිනිසුන් ගැන පොත පතෙහි සඳහන් ව තිබේ.
කර-කර ගස, වලහඤ්ඤාල්, දුම්බලා ගස
කරක- දෙළුම්, කොබෝලීල වකුල (මුහුණමල්) කිරිදිවැල් පොල්මල් ඇට
කරකද-හිඳි
කරකතාවල්ලි-සිව්ය, ඇත්වගපුල්
කරකශාලි-උක් ගස
කරකා-කරිවිල, පාණවැස්ස
කරකාමහ-පොල්ගස්
කරඞ්ක-පොල් කැටය, උක් වෙසෙසක්
කරවීරකම්-කලුදුරු

කරතුඩගස

කරවඡද-ගැටනිවුල්, නිකා
කරවමසින්-නාරන්
කරවඡදූ-තේක්ක ගස
කරජ- සක්නැඹ, දිවිපසුරු, මල් කරඳ-කරඳ
කරජා-කරඳ ගස
කරජෝඞි-මඤ්ඤුක්කා
කරජෝඞි-මඤ්ඤුක්කා
කරඤ්ජ- කරඳ, සක්නැඹ, කුණු කරඳ
කරඤ්ජක-කරඳ, මහුල්කරඳ
කරඤ්ජ තෛල-කරඳ ඇට තෙල්
කරඤ්ජන්‍ය-කුණුකරඳ, සිරිල
කරඤ්ජ ඵල-දිවුල් ගෙඩි
කරඤ්ජල-ගිවුලු, (දිවුල්)
කරඤ්ජිකා-කටුකරඳ, මහුල්කරඳ
කරඤ්ජී-මහ කරඳ ගස, කුඹුරු වැල
කරට-කුකුරුමුවන්, වනුක්, සෙන් දිරික්කා, කරඹ
කරටක-වනුක්
කරඩ-කරඳ
කරඩතෛසි-වලස්තෙල්
කරඩවානෛසි-සතුරුමැට්ට
කරණ්ඩ- කටුකරඹු, කුකුරුමාන් කරඹ ගස
කරණ්ඩඵල-ගිවුලු ගස
කරණ-තලාගස, ශරීරය
කරණයි-මානෙල්, නිඩාරම්
කරණල-තෙළුම් අල
කරත්ත- වැල්මී
කරත්තඋපපු- කළුලුණු
කරත්තකොල්ලු- කළුකොල්ලු
කරතඹ- කන්සාඇට
කරනිකත-පැපිලිය, (පත්පාඩගම්)
කරතුඩගක- සක්නැඹ

කරතෘණ

කරතෘණ- සුදුවැටකේ
කරඳ- හිඳි, **කරඳ**
කරඳණඩතිකා- ගස්කැලිය
කරඳු- කිඩාරම්
කරඳුම- **කඳුරුගස**
කරනෙයි- කිඩාරම්
කරනෙ- මානෙල්, කිඩාරම්
කරප්පත්-සෙම් කිපීම නිසා ශරීර යේ සෑමතැන ම හෝ තැන් තැන්වල හටගන්නා රත්පාට පළු
කරපට- අක්ක්‍රපට්ටා
කරපත්‍ර- **කළුහලා**
කරපත්‍රවක්- තල්
කරපත්‍රිකා- පතඟි, අන්නාසි
කරපර්ණී- රත්ඵරඬු, කුකුරුමුවන්, ඛණඩක්කා
කරපාකය- **කල්කය** වැලි සේ කැකුළුව වැටෙන පදම
කරපිංච- කරඹෙඹිය
කරපි- මොණර පිහාටු
කරපිල්ලක- කරිවිල
කරපුට- දෙනොත
කරබි- කළුදුරු
කරබ්‍රූසා- **කොමඩු**, (පත්තක්කා)
කරඹු- ලුණුදිය
කරඹෙඹිය- කරපිංචාගස, (කරඹෙඹියා ගස)
කරඹෙල- කරඹ, එල කටරොලු
කරහ- ගජනිප්පිලි, සූයත්‍රිකානනි
කරහණඩිකා- මහකරඳ, කුඹුරු වැල
කරහප්‍රියා- වැල්කසඹිලියා, නීන් මොරගස
කරහවල්ලභ- දිවුල්, පියාගස, මොරගස
කරහාදනී- හැල්කසඹිලියා

කරවැල්

කරහාය- කුකුරුමුවන්
කරණි- තුඹ, වැල්තුඹ, නීන්මැඩ හඳු, එලකටරොළු
කරහාටි- **කටුකරඹු**, කුකුරුමුවන්
කරමහ- පුවඟු ගස
කරමහක- එලසැබෝ
කරමහරා- කොටිකන් බැව්ල
කරමඤ්ජරී- හෙලකරල්සැඹ, (සුදු කරල්සැඹ)
කරමට්ට- පුවක්ගස
කරමදඳ- කරඹ
කරමදින- පුවඟුපල
කරමතුමත්තු- කලුඅත්තන
කරමර්දී- කරඹ, මහකරඹ, හෙල සැබෝ
කරමර්දික- **කරඹ**, මහකරඹ, දුම් මැල්ල
කරමර්දින්-කරඹ
කරමලි- ලෝලු, නීරැස්ස වැල
කරමකකල්ලු- සිවංගුරු
කරමිල්- සීරැස්ස
කරමුව- පුවක්ගස
කරයාන්පු-රත්මල්, (රතඹලාමල්)
කරරී- අසමෝදගම්
කරරුහ- සක්නැඹ, රුකඟුත, පුවඟු, මහමෙවන්, (අෂ්ටකවගී යේ ඔසුවක්)
කරල්සැඹ- **කරල්සැබෝ** ගස
කරල- **කණ**, ගිවුලුගස
කරවිතලා- තලාවගීයක්
කරවාල- කරිවිල
කරවැල්- නෙලුම් අල

කරවී-හෙල අඹ, අසමෝදගම්
කරවීර-කණේරු, අලරිය, රත්හිරියල්, මනෝසිල
කරවීරක-කුඹුක්, රත් කණේරු, රතු අලරිය
කරවීරභූජා-රටතෝර
කරවීරහා-රත් හිරියල්
කරවීරානුජා-රටතෝර
කරවීරිකා-මනෝසිල
කරවිල්ලක-කරිවිල
කරවිලහ-සීනක්කාරම්
කරව්‍ය-ජටාමාංශ
කරසඵල-බුලු
කරසම්භව-රෝමලුණු
කරහාට-අල, තෙලුම් අල, කුකුරු මුවන්
කරහාටක-කුකුරුමුවන්, නෙළුම් මල්
කරාමපු-කරාබුනැටි
කරාම්බුක-දියඇබර ගස
කරාවේලා-කරඹ ගස
කරාමරම්-ඇට්ටවරා
කරායත-ඹහ දියඇබෙරලිය
කරාල-කලුතලා, අක්මැල්ල
කරාලකලිකා-කොඳ ගස,
කරාලා-ඉරමුසු, වලහසාල්
කරාලාඛ-වලහසාල්
කරාලී-ලියනහලා
කරාලෝහා-පිත්තල
කරි-අඟුණ්, තෙලකිරිය
කරිංගල-කරිඛඟල-(තදින් කසන විෂ සහිත හබරල වර්ගයක්) ගරඬිල්ලා වැල්, (යක් පුහුල්-ඔඩිඩි පුහුල්)
කරි උප්පු- කලුලුණු (ව්‍ය ඤ්ජ න සඳහා ගන්නා ලුණු)
කරික-ඇපල ගස, ඉඹුරා, ගුරුඳ
කරිකනා-ඇත් වගපුල්
කරිකනාවල්ලි-සිව්ය වැල
කරිකුසුම්භ-නා (මල්) ගස
කරිකෘෂ්ණා-ඇත් වගපුල්, (ගජතිප්පිලි)
කරිකෙශර-නාකෙසරු
කරිවෙවාරු-දමු බත් (දංකුඩ=බත් දම්කුඩ)
කරිවර්ධ-තලිස්පතුරු
කරිඩක-තොටිල
කරිදමන-වල්කොල්ලු
කරින්-නාකෙසරු
කරිපත්‍ර-තලිස්පතුරු
කරිපිප්පලී-ඇත් වගපුල් (ගජතිප්පිලි) සිව්ය, රත් ගොකටු
කරිහ-බෝ ගස
කරිමාලක-කුණු කරද, සිරිල
කරිල්ල-නින් කරිවිල, තුඹකරිවිල
කරිල්ලක-බටුකරිවිල, තුඹකරිවිල
කරිවල්ලි-ගජතිප්පිලි
කරිවිල-කරවිල වැල
කරිවෙක්කු-ගහල, දෙමස් ගහල, (හබරල විශෙෂයක්)
කරී-තෙලකිරිය
කරීර-දළුක්, හුණහිඹිල්, හෙල කණේරු, (සුදු අලරි) කටුකිරිය මහ උක්
කරීරය-කළිල
කරීෂ-ගොම්වැරටි, අසූචි
කරීසකය-කලංතුන
කරීසලාංකන්නි-කිකිරිඳිය
කරුඋත්මත්තෙසි-කලුඅත්තන
කරුක්කු වාච්චි-වල් බෝඹු
කරුකල්-පේයාව
කරුකුරුණ්ච්-නිල් කටුකරඹු
කරුකොල්ලු-කලු කොල්ලු
කරුණ-ඉද්ද ගස
කරුංකා-වියලි පුවක් (කරුංකා)

කරුණ්කාලි-කිහිරි
කරුණ්තුලායි-කලුතලා
කරුණමල්ලි-දූසමන්
කරුණා-වදකහ
කරුණාවි-කලු වව්වනාවි
කරුත්ත උප්පු-කලු ලුණු
කරුන්විරකම්-කලුදුරු
කරුන්පේරරත්තෙයි-කලුවා අල, අරත්ත (රාෂණා-රැත්ත)
කරුනොච්චි-කලුනික
කරුපපුකසකසා-කලු කසකසා
කරුම්පුපානි } උක් පැණි
කරුම්බුපානි }
කරුම්තලෙයි-කලු තලා
කරුමුකයි-දූසමන්
කරුඹු-උක්
කරුවල-කළුහර (කළුපාට තද අරටුවක් ඇති ගස් වර්ගය)
කරුවා-කුරුඳු
කරුවා අරිසි-කලු කඩල, බැදිහාල්
කරුවාපට්ටෙයි-කුරුඳු පොතු
කරුවෙන්කෙ-නිල් පියා ගස්
කරුවෙම්පු-කරබෙඹිය (කරපිංචා ගස)
කරුවේල්-බබ්බුල
කරෙවී-හිස, ඇට
කරෙණ්ණු-කිණිහිරිගස
කරෙන්නුක-බැලතණ
කරෙඳුජත-කළු අඹ
කරෙරි-ලුණුවරණ
කරොටිකා-හිස්කබල
කරෝ-වංඅපල
කරෝමක-රෝමලුණු
කරෝෂහා- ම හ ගොන් සුතු කැකිරි, තියඹරා
කල්ඔදිය-හුලංහිත්, හික් ගස
කල්ක-තුරුක්තෙල්, බුලු
කල්කවාප්‍රිය-ව නු වැ ල්, (බා න් වැල්=වෙනිවැල්)
කල්කණ්ඩු- ගල්කණ්ඩු, (සූකිරි)
කල්කඵල-දෙළුම් ගස
කල්කරොඩ-ලොත් ගස
කල්කි-තුරුක්තෙල්
කල්කි වෘක්ෂය-බුලුගස
කල්ඛණ්ඩිකා-කළු ඉරමුසු
කල්තොං-බුලු ගස
කල්නාර්-ගල් නහර
කලපක-හිඟුරුපියලි
කලපදුම-හීන් ඇසල ගස
කලපපාදප-දේවදුර, බුලු රුක
කලපවාප්‍රිය-බාන්වැල්
කලපාඛග-පැපිලිය, (පත්පාඩගම්)
කලපාසි-ගල් පෙඳ, (ගල්සෙවෙල්)
කල්මදම්-ගල්මද
කල්මූරසි-ගල්මෝර
කල්ය-මී පැණි
කල්යනමූරුක්කු-එරබදු
කල්යා-කොත්තමල්ලි, මිනෙල්, ඉඟුරු, හරංකහ
කලලහර-හෙල්මැලි (කල්හාර)
කලලිපාක්‍යා-පෙනිපුවක්
කලල්පපාල්-දළුක් කිරි
කලලී-දළුක්, මිහ උක්
කලලුපපු-ගල්ලුණු
කලෙවාකී-කොල්ලු
කල්ශම්-ගල්මද
කල්හර-කල්හාරය
කල්හාර-හෙල්මැලි
කල්‍යක-සුවඳ කාසා, හිඟුරුපියලි
කල්‍යදුම-බුලු ගස
කල්‍යපත්‍රිකා } රතු සැබෝ ගස
කල්‍යපත්‍රී }
කල්‍යවතී-නිරෝගි
කල්‍යා-අරන්කසා, (හ ර ං ක හ) කොත්තමල්ලි, නිලුපුල්
කල්‍යාණ-රත්රන්

කල්‍යාණක–පැපිලිය
කල්‍යාණවීජ–වටමුං හෝ කඩල
කල්‍යාණි– මුරුත, දියකොළොම්, සල්, සුළුබැවිල
කල්‍යාණිකා–මනෝසිල
කල්‍යාණිනී–බැවිල ගස
කල්‍යාණී–මස්වැන්න, හල්ගස
කල්‍යානාඞග–මුරුත
කල්‍යාසිචීන–මීපැණි
කල–ගල්බෙරිය, කළුකැම්මේරිය, සල් ගස, ඉලිඳ
කලංජ–කලඳ (මදටිය විස්සක බර)
කලංබොකකු–(කලංබොකු) අඟිල්
කලක–තකුල්, (කපුකිනිස්ස) ගුගුල්, කළුදුරු
කලකල–සල් මැලියම්
කලඤ්ඡිකා–කලු ඉරමුසු
කලචචකොටෙසි–කුඹුරු ඇට
කලවිවි–කුඹුරුවැල්
කලජ–කලඳ
කලවි–නිසි තරමට නොමේරූ පොල්
කලත්–කොල්ලු
කලත්‍ර–කොල්ලු
කලද–සමූහය (මදටිය විස්සක බර)
කලදුරු–කලාදුරු
කලධෞ–රිදී
කලධෞත–රිදී, රත්‍රං
කලන්ගල්කාවරි–බොරවූ පැන්
කලන්ද–කඳුලුගෙඩිය වැල් (කඳුරුකොටියා වැල්)
කලන්පොකකු–අඟිල්
කලන–එක් මසක් වූ ගැබ, හොමු ගස
කලනමූල–බෙලි

කලනිඤන්නීර්–සාල් දෙවුන් දිය
කලනීරි–දෙවුන් දිය
කලපි–මොණරා
කලබ } සමූහය, මොණරපිල
කලඹ } වැටිය
කලබී–විලපලා
කලභ–අත්තන, පියාගස්
කලභ පොතු–අත්තන පොතු
කලභවල්ලභ–පියාගස්
කලම්බ–කපුකිනිස්ස, (තකුල්) කොළොම් ගස
කලම්බක–බක්මී, දුරුහරිද්‍රා
කලම්බා–නීතියවැල් (නිවිති වැල්)
කලම්බිකා–නිවිති
කලම්බි
කලම්බු
කලම්බුකා } නිවිති
කලම්බූ
කලම්බුට–වෙඩරු
කලමෙපොකකු–අඟිල්
කලඹ–පිල්කලඹ
කලඹි–නිවිති
කලම–අත්තන
කලමඩු–කලම නම් ඇල් වී වගීය
කලයඤ්ජ–සල් මැලියම්
කලරවි–පරවියන් (පාරාපත)
කළලජෝද්භව–සල් රුක
කලඹක–කෙළිඳ ගස
කලවිඹග–කෙලිඳ ගස
කලශාඹග–පැපිලිය (පත්පාඹගම්)
කලශි(ශී)–පුස්වැන්න
කලසව–හෙලලොත්
කලසතිකා–වැල්පෙනෙල
කලස–නෙලුම් අල, තකුල්, (කඳු කනිස්ස)
කලසාරුහා–පොල්පලා, (පුස් වැන්න)
කලසී–වැල්පෙනෙල, අස්වැන්න කිරිදිවැල, පළොල්

කලසිකා–පුස්වැන්න

කලභ ගස්–තුවාල සේදීමට කසට වතුර සාදා ගන්නා තද රතු පාට කින් යුත් පොතු තිබෙන ගසක්. මේ කසට සායම් වශයෙන් ද පාවිච්චි කරති.

උග්‍ර ගන්ධයෙන් යුත් තදින් කසට ගතිය ඇති මේවායේ පොතු අතීසාර රෝගයට දෙන කසාය වලට ද ගණිති මේ පොතු වල ජීවානු නිවාරක ශක්තිය ද ඇත.

කලභනාසන– කුණුකරඳ, කෙළිද ගස

කලහෙලන–සියඹලා

කලා–මනෝසිල, කරඹ, කැම්මේරිය, ඉඟුරු, මිපැණි

කලාකොඤ්කාරෙඤ්–කරඹ, සිහින් කරඹ

කලාජාජී–කලුදුරු, මහදුරු

කලාටක–ගුරුළුහාල් වී

කලාදුරු–වන්‍ය (වම්මුතු)

කලාප–මොණර පිල

කලාපි–නුග

කලාපිනි–ගොකටු (නෙරෙංචි)කලු කැම්මේරිය, හින් කලාදුරු

කලාය–කලුමූං, කඩල

කලායක–කලම නම් හාල් වීවගීය

කලායකා– මකුණුවැන්න (මූඟුනු වැන්න) ගන්ධදුම්=දිය මතුයෙහි උපදනා ඊතණ වෙසෙසක්)

කලාරුහා–රන්වන් වැටකේ

කලාව–කෘෂ්ට නිහක්

කලි–මසන්, ඩෙබර, බුලු, තලප, බදුල්ල

කලිකාර–සිරිල, දියනිප්පිලි

කලිකාරි–ලියනහලා

කලිකාරිකා– සිරිල, කුණුකරඳ, ලියනහලා

කලිකාශිත–හෝපලු

කලිකා– කරාබුනැටි, බේරා, මල් කැකුලු, සුවඳහොට, අලරිය, කටුපිල

කලිකිකා–බේරා

කලිකොහතම–කරාබුනැටි

කලිකුශික–බුලු

කලිහන–කුඹුරුවැල

කලිහා–කලුදුරු

කලිඛග–කෙළිද, මාරා, පුලිල, කුණුකරඳ

කලිඛගක–කෙළිද, පුලිල, මහරි, කුණුකරඳ, බුළු

කලිඛගජ–කෙළිදසාල්

කලිඛගදෘ–කෙළිද ගස

කලිඛගබීජ–කෙළිදහාල්

කලිඛගා–සුදු තිරිස්සවාලු, කකුළු සුතු, (කකීටකශ්‍රිඛි)

කලිඛහි–කෙළිද

කලිතකිකා–වැල්මී, අවරිය ගස

කලිතන–වැල්මී

කලිතරු–බුලු

කලිදුම්
කලිදුම
කලිද්‍රුම } බුලු, හොරගස, බදුල්ල

කලිඳක–කැහිරි, පැණි කොමඩු

කලිඳු–බුලු, හොරගස

කලිනිකා–බේරා

කලිප්‍රිය–බුලු

කලි ඵල–බුලු ගෙඩිය

කලිම්බු–පැලැස්තරය

කලිම–මහරි ගස

කලිමාරක–සිරිල, කුණුකරඳ

කලිමාල(ක)
කලිමාල්‍ය } කුණුකරඳ කටුකරඳ

කලියන

කලියක-ගොන්වැල්, (වනුවැල්)
කලියුගාලය-බුලු
කලියුගාවාස-බුලු ගස
කලිරෝ-කිළිල්
කලිලය-කළිල
කලිවෘක්ෂ-බුලු
කලිසොදරා--නවහන්දි
කලිහාරි-නියඟලා
කලී-බුලු, කුකුරුමුවන්, තල
කලීතක-වැල්මී
කලීදු-බුලුගස
කලීර-ගස්වල බඩය
කලීල-තුවර ගස
කලු-නිප්පිලි,සපී විෂ, ගුරුළුහැල්
කලුකද-නිබිරි
කලු කැම්මේරිය- මනින්තක්කා, (අළුකැම්මේරිය= කාකජඞ්ඝා)

කලු කොහිල

මේය දිමි බිජු ගසට හෝ කළු මිරිස් ගසට සමාන අඩි තුනක් පමණ උසට වැවෙන පැලැටියකි. මේ වගීය තෙල් බෙහෙත් සඳහා ඖෂධයක් වශයෙන් ගණිති. රෝගාබාධ හෝ වෙන යම් කිසි හේතූන් නිසා නින්ද නො යන අයට නිද්‍රාජනක ඖෂධයක් වශයෙන් මෙය බොහෝ ප්‍රයෝජන වත් ය. නින්ද නො යන අයගේ කොට්ටයට යටින් මේ ගසේ අමු අතු කැල්ලක් දමා තැබුවිට හොඳින් නින්ද යයි.

කලු කිහිරි-කළුවර ගස
කලු කුමාර මුදියන්සේ- කලු හබරල (රහස් බෙත් වට්ටෝරුවක එන වචනයක්)

කලු කැම්මේරිය



කලු කැම්මේරිය—කාකමාචි
Solanum Nigrum

කලු කොහිල

කලු කොහිල
Black Lasia Spinosa

කලු කොහිල

කිරි කොහිල, ගුරු කොහිල, වැල් කොහිල, කළු කොහිල ය යි කොහිල වර්ග කිපයකි. තැම්බූවිට හොඳින් පිටිවන රසවත් වර්ග ය ප්‍රමාණයෙන් සිහින් වූ කිරි කොහිල යි. එයට වඩා ඉතා විශාල වූ ගුරු කොහිල රසයෙන් අඩු ය. අල තැම්බූවිට හොඳින් පිටිවීමක් ද නැත. දිරකඩ වල හා ඝණ පෝතු සහිත ගස් වල ත් ගල් වල ත් පසුරු අල්ලා දුවන වැල් කොහිල රසයෙන් හා ගුණයෙන් ද, උසස් නැත. කලු කොහිල වල අල හා කොළ ඉතා විශාල ය. දඬු අල හා කොළ වල උඩ පැත්ත තද කළු පාට් යුක්ත ය. කොළ වල යට් පැත්ත පමණක් ගුරු පාට ය. රස-ගුණ අතින් ඉතා උසස් වූ කලු කොහිල රටේ සුලභ නැත. වස විෂ ශරීර ගත වීමෙහි ත්, මූත්‍ර රෝගයෙහි ත් ප්‍රත්‍යක්ෂ ඖෂධයක් වූ කොහිල අල, දළු හා කරට් ලාංකිකයෝ උසස් ආහාරයක් ලෙස සලකති.

කලුතුඹ–කලුර්යම්

කලුදණ්ඩා රෝග– බුලත් වැලෙහි හටගැනෙන රෝගයක්

කලුදු–කලඳ

කලුනිඟ–කලු මල් ඇති නිකා

කලුනිල්–කරපිංවා

කලුනිත්තිල–පාවට්ටා (රතස් වට්ටෝරුවක එන වචන යක්)

කලුපලා–කරපිංවා කොළ

කලුමල්–කලුපාට මල්

කලුමස්–ලුල්මස්

කලුවා අල

කලුමැදිරිය– (සම්පූර්ණ කළුවර ගසක ලක්ෂණ ඇති එම වර්ගයට ම අයත් අරටුව කළු–සුදු වයිරමෙන් යුත් ශක්තිමත් කළු වර ගසට ත්, වඩා වටිනා ගස් වර්ගයක්)

කලු ලුණු–උද්භිද ලුණු (කාල ලොණ)

කලුවා අල–කුලඤ්ජක, වල්ඉඟුරු, වනද්‍රක (එනම් ගස් වර්ගයේ අල)

කලුවාල–කලුවාඅල(වල්ඉඟුරු)

කලුවාල—කුලඤ්ජන

Alpinia Galanga

මෙය ඉඟුරු සුවඳට ත් වඩා තද සුවඳක් ඇති ඉඟුරු වර්ගයට ම අයත් මද දිය සීරාව සහිත ඉඩම් වල වැවෙන පැලෑටියකි. මේ ගසේ ඇත්තේ රට ඉඟුරු අලා

කට ත් වඬා ම ද ක් ලොකු වූ එක ම අලයකි. හරහට වැඩි යන මේ අලයේ කෙළවර ගස වැවී ඇත. ගසේ කොළ ඉහුරු කොළ වලට මදක් සමාන ය. එය අඩි තුනක් පමණ උසට වැවෙ යි. අළු හන්, පණු හොරි, දද, කුෂ්ට ආදී හමේ හටගන්නා රෝග සඳහා මෙය ප්‍රත්‍යක්ෂ ඖෂධයකි.

කලුවාගස්- කළුපාට කොළ හා කඳ ඇති පිටින් පෙනෙන පෙනු මෙන් කළුවර ගසට බොහෝ දුරට සමාන සීතාධික ප්‍රදෙශ වල වැවෙන ගස් වර්ගයකි. මේ වායේ ලී සම්පූර්ණ සුදු පාටින් යුක්ත ය.

කලුවැල්තලා-තලා වර්ගයක්, කලු වැල්

කලුවැල්-කාලාඟරු, අගිල්

කලුෂමක්ෂිරී-වැල්මදට

කලුසු-කවිඡක නම් ගස් වර්ගය (තන්දිරුක)

කලුහර-කලුවර අරටු

කලෝහිත-එරමිණියා වැල

කවඩ-බිම්මල් (හතු)

කවව } පැපිලිය, නැසි
කවවතාමක } රුක, තෙලැසටු ගස

කවවපත්‍ර-බුරුද ගස

කවඩි-බෙල්ලන්

කවද-හිස නැති මූලකඳ

කවරා-වේලා ගස

කවරි-වේලා, රත්කණේරු, මනෝසිල

කවරිකලා-මනෝසිල

කවරිකූටක-වේලාගස

කවලග්‍රහ-තුන් කලද

කවාකා-කැකිරි

කවි-තුරුක්තෙල්, ගජනිප්පිලි

කවිටෙඨා-ගිවුලු

කවිඩාත්ත්‍ර-තුඹ

කවිත්ථ-ගිවුලු ගස

කවිතුපේය-යොන්තුඹ

කවිතුමෙබයි-කවිතුඹ(යොන්තුඹ=මරිතොන්ඩි)

කවිලා-දියමිත්ත

කවුඩිරි-කරපිංව

කවුඩුඋඩැන්ත-කවුඩුකැකිරි

කවුඩුනියඹරා-කවුඩුකැකිරි

කවුඩුතුමෙබයි-යොන්තුඹ, ඇන් තුඹ, (මහතුඹ)

කවුන්තිහ-රුහැණිය (වාල් මොලගු=එල්ගාම්රිස්)

කවෙරු-ගස් වෙසෙසක්

කවෙලු-කාකෝලී(අෂ්ටක වර්ගයේ ඖෂධයක්)

කවොෂණ-මදක් උණු පැන්

කශවරිකා-ඇද්දෙමට

කශ්මල-මූර්ඡාව

කශ්මීරජ-කුංකුමප්පු (සඳුන් මල්) කොකුම්

කශා-මස්වැන්න

කෂාය-පුවක් ගස, උදු, තොටිල, රත්ලොත්, ලේ, ඇල්කහඹිලියා

කෂෙරු-ඌරල, බිම්තල්, කෙක ටිය, තුන්හිරියා පත්

කෂෙරුකා-කෙකටිය, කලාදුරු

කෂ්ටිල-සුලුසාරණ

කෂාය-තොටිල, දූරා, දුව ගස, කසට පුවක් ගස, කසටරස

කෂායකා-දුරාලභා (යවාස)

කෂායකාත්-රතුලොත් ගස

කෂායජල-පුලිල, ඇසවු, දිඹුල්, මහරි, නුග, යන මෙයින් පෙරණ ලද ජලය

කෂාය වර්ග **කළීර**

කෂාය වර්ග-තිපල්, ඉන්සලු, අඹ, දඹ, මූනමල්, තිඹිරි, යන මෙවා යේ කසට ජලය.

කෂායා- දුරාලභා, ඇම්බරුල්ල, ඉදිගස

කෂායින්-ඉදිගස, සල්ගස, අරත්ත

කෂෙරුකා-කෙකටිය

කස්කිලික-**කක්කිලාස**

කස්තූරි- මෘගමද, උරුලැසැපිටි, සාමා

කස්තූරික-**කණේරු**

කස්තූරිකා-**කස්තූරි**

කස්තූරිමඤ්ජල්-අරණකසා (හරංකහ)

කස්තූරිමල්ලිකා } **කස්තූරි,**
කස්තූරිවල්ලිකා } **ඉද්දගස**

කස්තූරිමෘගාණ්ඩජ-**කස්තූරි**

කස්තූල-හරංකහ අල

කසතාණ-යක්ඛේරිය,කිරාත,(බිම් කොහොඹ,) හණ

කසත්‍රී-මිනී ඇට

කස්මීරජ-කොකුම්

කස-පොල් ගස, කහ අල, කන්සා

කසකා-තෝර ගස

කසකැල-**කසටිය** ගස

කසට්-**කසට**, කසාය

කසට-**කසට** ගස

කසටගහ-**කසට** ගස

ඌසතුරු-**කසමල්** ගස

කසදුන්-රත්හදුන්

කසනමර්දන-තෝර ග ෘ

කසනොත්පාට-වංඇපල

කසනොත්පාටන-වංඇපල, (ආඹතෝඩා)

කසපල-පොල් ගෙඩිය

කසමල්-වැලිකහමල්

කසා- මස්වැන්න, වතුවැල්, අමු හෝ මියලි කසා

කසාකම්ම-මිරිස්

කසාකා-තෝර ගස

කසාඹිලිය-කසඹිලියා වැල

කසාය-සරස, කල්ක, කාථ (සිඳි කසාය)සීත, පාණ්ඩ යයි කෂාය වර්ග පසකි.

කසායකාත්-සබර(ලොත්) ගස

කෂායඵලිකා-නෙල්ලි

කසායමද්දුරවර්ජ-දූවගස

කසාම්ද්‍රුමිණා-පුවක් ගස

කසායවාත්-සුලුකුඹුක්

කසායා-කසඹිලියා

කසායාස-ඇඹුලැඹිලිය

කසාසින්-සල්, දෙහි ගස

කසිනි-අරණකසා (හරංකහ)

කසිස්-ජීරක්කාසි (කාසීස නම් ද්‍රව්‍යය)

කසු-රත්රන්

කසුන්-රන්

කහ්ලාර-නෙලමානෙල්(සුදු නෙලුම්)

කහඩි-කාඩි

කහමුන්-රණවරා ඇට

කහර-කුකුරාමුවන්

කහරමනා-වී වර්ගයක්

කහලි-ගජඹලිද, වැල්මී

කළන් } මදටිය විස්සක බර
කළද් } (කළද)
කළන්ද් }

කළල්-කළලරූපය

කලානුසාරි-කලුවැල්

කලාය-කඹිල

කළීර-උණ කිළිල්, වේඛඩ ආදිය

කා

කා– කුරටිය, හිස, ඉරිවේරිය
කාංචන– සිවංගුරා, නාගස්, රත් රන්, තාම්ල්රේණු
කාංචිකොඩිවැල්– වැල්කසඹිලියා
කාංසපත්‍ර– කුරුණ්ණිය, නැලිහතර (සේරු 4= රාත්තල් 8)
කාංසිකා– මුංවැන්න
කාංස්‍ය– යකඩ, ලෝකඩ
කාංස්‍යනීල– තුත්තම්, ලෝකඩ
කාකඤනම්– කටරොලු
කාකක්ෂිර– ඇද්දෙමට
කාකඝි– තුබරි, (තුවරලා)
කාකඝිරු– කවෙලු
කාකඝිව– මිරිකුලු, (මුරුංගා)
කාකඃ– කැකිරි, කලුකැම්මේරිය, කිණිහිරි, දැත්ත, කොටදිඹුලා, කලුඅගිල්
කාකකඬගු– මෙනේරි, හල්දුම්මල
කාකකකීරී– ඉදි, (ඉදිගස)
කාකකලා– කොටදිඹුලා, කැම්මේරිය
කාකකවාකා– කවුඩුකැකිරි
කාකකුඩ්මල– ඇඹුල, නිලුපුල්
කාකකුම්භිකා– ඇද්දෙමට
කාකගුඤ්ජා– හුනිඳ, (ඔලිඳ)
කාකඝනි– මහකරඳ, මඟුල්කරඳ, ගොඩකදුරු
කාකඣහි–උගුරැස්ස, කටුවෙලඟ, ලියනඟලා
කාකවඡ්ඨලා–සිහින් තිඹිරි, (සුළු තිඹිරි)
කාකවඡර්දි– හෙලකිහිරි
කාකවිඤ්ඡු– හුනිඳ, ඔලිඳ
කාකජඝා– කොටදිඹුලා, කලු කැම්මේරිය, අඳිරිය, අක්මැල්ල
කාකජම්බු– බලුදම්, දියදඹ
කාකජාතු (ක) – ගුරාල්ල ගස
කාකඤ්ඡු– හුනිඳ, (ඔලිඳ)
කාකඩුම්බරා– කොටදිඹුලා
කාකණ්ඩි– කවුඩුකැකිරි, කෝවක්කා, තොටිල, ගුරාල්ල
කාකණ්ඩා– ගුරාල්ලගස
කාකණ්ඩි– කටුවෙලඟ, උගුරැස්ස, මඟදූදු, තොටිල
කාකණාන්තක– සිඳුරම්
කාකතික්තා } තැල්වැල්, අක්
කාකත්ක්තකා } මැල්ල,මඟුල්කරඳ, කලුකැම්මේරිය, ගඟුලු, හුනිඳ
කාකතිත්ත– තැල්වැල්
කාකතිඳුක– සිහින්තිඹිරි, සුළු තිඹිරි
කාකතුණඩඵලා– මහසුදුකැම්මේරිය
කාකතුණ්ඩා– අගිල්, කලුඅගිල්
කාකතුණ්ඩිකා– කිරිහඟුලු
කාකතුණ්ඩී– හුනිඳ, තැල්වැල්
කාකතෙරා– කටුකිරිය
කාකදනනිකා– හුනිඳ, දැත්තගස, රතුකැම්මේරිය
කාකධනී– ඔලිඳ
කාකනන්දිකා– ඔලිඳ, (හුනිඳ)
කාකනම්කොවෙවයි– කවුඩුකැකිරි, කෝවක්කා, කවුඩුකෝවක්කා
කාකනාම– වලාවැන්න
කාකනාමන්– කතුරුමුරුංගා
කාකනාසා– උගුරැස්ස
කාකනාසනි– උගුරැස්ස, කටුවෙලඟ
කාකනාසා– කොටදිඹුලා, ගොඩකදුරු, මහසුදුකැම්මේරිය
කාකනාසිකා– කලුකැම්මේරිය, ගුරාල්ල, ලියනඟලා

කාකනාසනී

කාකනාසිනී– උගුරැස්ස, කටු වෙලඟ
කාකනී– ඇඹුල්වේ
කාකන්දී– සිනිඔලා
කාකනීලා– බලුදම්ගස
කාකතෙරු– කටුකීරිය, කටුකිහිරි
කාකපර්ණී– මුංවැන්න
කාකපීළු–සිහින්තිඹිරි, (සුළුතිඹිරි)
කාකපීලුකා– හුනිද, (ඔලිද)
කාකපුෂ්ප– විෂ්ණුක්‍රාන්ති
කාකප්‍රාණා– මහසුදුකැම්මේරිය
කාකඵල– කොසඹ, මහකොසඹ, බළුදම්ගස
කාකඵලා– බලුදම්ගස
කාකබෝධි– කවුඩුබෝ ගස, (කපුටුබෝ ගස)

කාකබෝධි– කවුඩුබෝ ගස
Ficus Arnottiana

කාකහාණ්ඩි

මේ වගීයේ කොළ බෝපත්‍ර වලට බොහෝ සෙයින් සමානය. එහෙත් ඒ කොළ බෝපත්‍ර වලට වඩා තද නිල්පැහැයෙන් යුක්තය. කොළවල නැට සහ කඳ ද බෝධි වෘක්ෂවල නැට හා කඳ මෙන් සුදුපාට නැත. ශූරාපාවින් (කිලිටි රත්පැහැයෙන්) යුක්ත ය. අතු ද වැල්මෙන් පහතට එල්ලා වැටී තිබේ.

මේ ගසේ පොතු තැල්ම, ඉදි මුම හා ඇට පැස්සීම යන මේ ආබාධ සඳහා අවශ්‍ය තෙල්, බෙහෙත්, මැල්ලුම්, ලේහ (පත්තු) සැදීමට අතිශයින් ප්‍රයෝජනවත් ය.

වසංගත රෝගවලින් ආරක්ෂා වීම සඳහා ප්‍රත්‍යක්ෂ කෙමක්

පාන්දර (ඉතා අළුයම්) කපුටන් හඬන්ට මත්තෙන් මේ ගසක් ලඟට මොට්ට ආයුධය (මුව හත් ඇති කළුගල් පතුර) ක් ද රැගෙණ පැමිණ ගසට පිටිපැවෙන සේ නැගෙනහිර දෙසට හැරී ගසේ නැගෙනහිර දෙසට ගිය මුල කින් පොත්තක් කපුටන් හඬන හඬ ද අසුවන සේ පිටිඅතින්(තමා පිටිපස වූ ගසපැත්තෙන්) ගලවා ගතයුතු ය. මේ පොතු කැලි ඉන බැඳ ගැණීමෙන් කිසිම වසංගත රෝගයක් බෝ නොවෙන බැව් පැරණි රහස් වට්ටෝරු වෙද පොත් වල කියා තිබේ. මෙය අද්දුටු සත්‍ය ක්‍රියාව (කෙම)කි.

කාකහණ්ඩි– එලහුනිද
කාකහාණ්ඩි– මහකරද, හින්රතු කැම්මේරිය

කාකමර්දි

කාකමර්දි- තෝර, තුවරලා
කාකමාචි- කලුකැම්මේරිය
කාකමාතා- කලුකැම්මේරිය
කාකමූගහ
කාකමුද්ගා } මුංවැන්න
කාකරුක- කොසඹගස
කාකරුපා- අගිල්, කලුඅගිල්
කාකරුහා- පිළිල
කාකලම්බී-තලා, කලුකැම්ඉම්මේරිය, නිවිතිවැල්
කාකලිද්‍රාක්ෂා- මිදිවෙසෙසක්(කළු මිදි)
කාකලෝඛ්‍ය- ඇඹුල, අගිල්, ඕලු
කාකවල්ලභා- බලුදම්
කාකවල්ලරී- කවෙලු, තැල්වැල්, පෙතන් ගස
කාකවල්ලී- හඟුලු, තැල්වැල්, කිරි හඟුලු
කාකවලී- තැල්ල
කාකවීජක- කවුඩුනිඹිරිගස
කාකවෘන්තා- රතුකොල්ලු
කාකශාන්තිකා- හුනිඳ
කාකශාලි- කලුහාල්
කාකශිංඛී- වලාවැන්න, කතුරුමුරාංගා
කාකශිම්බී- රතුහුනිඳ, තැල්වැල්
කාකසත්‍රී- කතුරුමුරාංගා
කාකසප්තිකී- කවුඩුනිඹිරි
කාකසසී- ගජඔලිඳ, වැල්මී
කාකසමමතා- ඔලිඳ
කාකසාහ්වා- කැම්මේරිය
කාකසෙක- උනිඳවැල
කාකසිවුභා- කලුකැම්මේරිය
කාකා- අක්මැල්ල, කවෙලු, ගොඩ කදුරු, කොටදිඹුලා
කාකාඬගි- ලියනහලා, කටුවෙලඟ
කාකාණ්ඩ- තොටිල, කවුඩුනිඹිරි
කාකාණ්ඩී- කටුවෙලඟ, තොටිල, මීහදූදු

කාකොල්‍යාදිගණය

කාකාදනී- ඔලිඳ, කටුවෙලඟ, දූදු වැල්
කාකායු- තැල්වැල්
කාකාල- වව්වනාවි
කාකාලි- ඇත්සැවිය,
කාකාහ්වා
කාකාව්හා } කළුකැම්මේරිය
කාකාස්‍යා- මහසුදු කැම්මේරිය
කාකි- නාපිරිත්ත, තෝර, කොට දිඹුලා, කිරිඅඟුන
කාකිනී- ඔලිඳ
කාකිමුඛ- කොටදිඹුලා
කාකෙක්ෂුක- වැලුක්
කාකෙඳු- කටුනිඹිරි
කාකෙෂ්ට- කොසඹගස
කාකෝ- කොටදිඹුලා
කාකෝඩුම්බරික- කොටදිඹුලා
කාකෝත්තුව- සුදුඹිලු
කාකෝත්ථල- ඇඹුල, රතැඹුල, (රත්ඹිලු)
කාකෝදර- නාගස, නා
කාකෝදුම්බරිකා- කොටදිඹුලා
කාකෝල- අමුක්කරා
කාකෝලි- කටුවෙලඟ, කවෙලු, වැල්නිඹ්බටු, ඇත්සැවිය, රත් තම්පලා
කාකෝල්‍යාදිගණය- කිරිකවෙලු, මහකවෙලු දෙක, වැල්මී, කකුලු සුඟු, සුලුමෙවන්, මහමෙවන් දෙක, දිවි,ඔසඹිය දෙක, පොන් ඹරා,මිදි, සුලුකලත් (මුංවැන්න) දඹකලත්, (මස්වැන්න) තුක්පිටිය, (හුණමකුලු) සුලුගෙලඹිය නොහොත් මහගෙලඹිය ක්‍රිරිහඟුලු, පියුම්, රසකිඳ, යන මේ ගණය ශරීර පිනවයි. තත කිරි ඇති කරයි. ජීවනධාතු හා රේතස් වඩයි. පිත් ලේ හා වාතය නසයි.

කාඛසසි- ගජඔලිඳ
කාඩහා- වදකසා
කාචවි- කලුකැමේරිය
කාචසථාලි
කාචස්ථාලි } සලොල්
කාචසමභව- කාචලුණු
කාච- සලොල්, කාචලුණු, මී ඉටි
කාඡපත්‍ර- මුගුණුවැන්න
කාචර- සපු, (සපුගස)
කාචළවණ- කාචලුණු, කළුලුණු
කාචසෙඟවළිල- කාච මැටියෙන් ගන්ලුණු
කාචවොලි- වැල්කසඹිලියා
කාජනත්- ඇඹුල
කාජුනක- කජු
කාඤචන- රත්රන්, සපු, නාගස, දිඹුල්, (අවිවික්කා) කහ, හෙළ කොබෝලීල, රත්හිරියල්, නා මල්රේණු, සිවංගුරා, අත්තන
කාඤචනක- කොබෝලීල, හිරියල්
කාඤචනකාරිනි- සාතාවාරිය
කාඤචනක්ෂෙම- මී අඹ
කාඤචනගෙරික- සිවංගුරා
කාඤචනපුෂ්පි-කිනිහිරි,සිහින් මිදි
කාඤචනපුෂ්පිකා- රන්වන් සමන් පිච්ච
කාඤචනභූෂණ-සිවංගුරා
කාඤචනා- කහ
කාඤචනාර- රත් කොබෝලීල
කාඤචනාල- කොබෝලීල, ඇසළ
කාඤචනාහ්වය-නාමල් රේණු, නාගස, සපුකැකුළු
කාඤචනී- තැල්වැල්, කහ, රන් කිරිගොකටු, (සවණීකෂිරි)
කාඤචි- ඔලිඳ (හුනිඳ)
කාඤචික-තල ගස, කාඩිදිය
කාඤචිකාම්බු-කාඩිදිය
කාඤචිතන්ති-කාඩිදිය
කාඤජික-කාඩිදිය, විනාකිරි ආදී අම්ල වර්ග
කාඤජිකවාස-යක්බෙරිය
කාඤජි කා-කාඩි
කාඤජිකාඤජ-කාඩිදිය
කාඤජිපත්‍රිකා-කළුවන් දැත්ත
කාඤජී-සිරිතේක්කු, ගැටතුඹ
කාටවාතනිපු- ඵලඉත්ත මල් (මලිතමල්)
කාටවාමනක්කු-වල් එඩරු
කාටවුකරණෙයි-වල්කිඩාරම්
කාටවුපයරු-වල් මැ
කාටලු -කොච්චම්බා
කාටු ඉංචි-වල්ඉහුරු
කාටුඵල මිචෙචයි-යකිනාරං
කාටුජීරක-දේවදරු
කාටුතෙගොයි-තෙලඹු
කාටුතුලයි-මදුරුතලා
කාටුපයරු-වල් මුං, වල් මැ
කාටුමී-ඇටඹ
කාඩින-ඉඳි ගස
කාඩිනය ඵල-හිවුලු ගස
කාණ්ඩුම්බර-කොටදිඹුලා ගස
කාඩරි-කාඩි
කාඩි-ඇඹුල් දිය, කාඩි දිය (රාබු අල සහ වී සමඟ ගෙන කොටා සුදුසු භාජනයක දමා දිය වත් කර සතියක් පමණ පැසෙන්ට හැර පෙරා ගත් ජලය කාඩි වේ. නැතහොත් විලඳ, නෙල්ලි, හිප්පිලි, ලසුනු, කුරුඳු පොතු, අසමෝදගම්, මෙකී දේ සම ව ගෙන කොටා බඳුනක ලා දිය වත් කර තෙදිනක් පමණ තබා පෙරා ගත් ජලය ද කාඩි නම්. ආරනාල ද කාඩි විශෙෂයකි. එය කෘදු ගන්නා ක්‍රමය මේ පොතේ 40 පිටුවේ ඇත.

කාඩිනීර්-කාණි දිය
කාණ්ඩ-කුඩුම්මිරිස්, ගල්පියල්
කාණ්ඩකටුක-කරිවිල
කාණ්ඩකණ්ටක-සැබෝ
කාණ්ඩඛිර-පුවක් ගස
කාණ්ඩකීලක-ලොත් ගස
කාණ්ඩගුණ්ඩ-කෙකටිය
කාණ්ඩතික්ත-බිම්කොසඹ (කිරාත) හණ, යක්බේරිය
කාණ්ඩත් මූරුග කොම්පු- කඟ වේන අඟ
කාණ්ඩනී-බුලත්වැල, (කාණ්ඩනී තලා)
කාණ්ඩනීල-ලොත් ගස
කාණ්ඩපුඩා-කටුපිල
කාණ්ඩපුෂ්පා-ගැටතුඹ ගස
කාණ්ඩරුහ-කුලුරුණ
කාණ්ඩශාඛා-මුවකීරිය වැල, සෝමලතා
කාණ්ඩහිතා-ලොත් ගස
කාණ්ඩනීත-ලොත්, වම්මූතු
කාණ්ඩනිකෘතා-බිම්කොසඹ, යක්බේරිය
කාණ්ඩාම්රාගකොම්බු-ගවර අං
කාණ්ඩාරුහා-කටුකරෝඡණ
කාණ්ඩිකොඩි-වැල්කසඹිලියා
කාණ්ඩිතික්තක--බිම්කොසඹ (කිරාත)
කාණ්ඩිල්වෙන්නෙයි--වෙඩරු
කාණ්ඩීර- වැල්මදට, කරල්සැඹ, කරිවිල, මාරා
කාණ්ඩීරා-වැල්මදට, කරිවිල
කාණ්ඩෙක්ෂු-උග්ගස්, වැලුක්, ඉකිරි
කාණ්ඩෙක්ෂු-උක්, වැලුක්, ගොකටු
කාණ්ඩෙන්-රඹුක්, වැලුක්, ඉකිරි, (නීරමුල්ලිය,) උක්
කාණ්ඩෙයි-කුඩුම්මිරිස්
කාණ්ඩෙර-සුලුකුර
කාණ්ඩෙරුහා-කටුකරෝඡණ
කාතොට්ටි-වෙල්ලන්ගිරිය
කාද-කොල්ලම් කොළ
කාදම්බ-කොලොම් ගස (උක්ගස)
කාදම්බකර-කොලොම් ගස
කාදම්බයී-කොලොම්, බක්මී
කාදම්බරී-සුරා
කාදම්බරීවීර-රාමණ්ඩි (රාබිජු)
කාදම්බා-මුඩමහණ
කාදම්බී-වැල්නීතිය (වැල්නිවිති)
කාදු-කටුකරඹු
කාන්වි-හුනිඳ (ඔලිඳ)
කාන්චුරෙයි-ගොඩකදුරු
කාන්වොරි-කසඹිලියා
කානන- කාන්දම්, රැකගුණ, පුවඟ, කොකුම්, සඳුන්, දිය මිදෙල්ල
කානනක්‍රාමක-මහවම්මුතු (මහ කලාදුරු)
කානනගල් කාන්දම් ගල්
කානනධාතු-සිවංගුරු
කානනපාෂාණ-කාන්දම්
කානනපුෂ්ප-කොබෝලීල
කානනම්-කාන්දම්
කානනලක- නන්දිරුක (වතු සුද්ද)
කානනලෝහ- හෝපලු, කාන්දම්
කානනස්කන්ධ-කනේරු (අලරිය)
කානනා- ගෙලබටු, පුවඟ, රැකඟුන, නිබ්බටු, ඉවද, අතිවුඩයන්, සඳුන්, විෂ්ණුක්‍රාන්ති, කොකුම්, බිම්තල්, උක්ගස, මහ එන්සාල්
කානනාඛ්‍රිද්‍රෙහද- } හෝපලු
කානනාවරණද්‍රෙහද } ගස
කානනාර-කොබෝලීල, ඇසළ ගස

කානනාලක කාමල

කානනාලක-වතුසුද්ද
කානනාග්නි-රැකහුන, පුවහු,
කානනිදු-බෝදිගස
කානනීවෘක්ෂ-මුරැත, පියාගස
කානනී-පියාගස
කානනීස්වර-සවණී (රත්‍රන්)
කානෙනාට්ටි-වෙල්ලන්ගිරිය
කාන්ඡුක-වැලුක්, රඹුක්
කානක-ජයපාල ඇට, අරත්ත ඇට
කානනාග්නි-සැමගස
කානනාධිප-අඹගස
කානනාරි-සැමරැක
කානන්-කොල්ලු
කානම්-කඩල
කානලාපුෂ්ප-අත්තන
කානල්වාලෙයි-කෙටල
කානින-ලොත්
කානෙයීාස-ගුගුල්
කානෙයි-මහනෙල් අල, මෙහෙනල (තෙමෙනල)
කාපාලි-කන්ථාරි වෘක්ෂය (එරමිනියා)
කාපාලිකා-වලහසාල්
කාපික-කාඩිකැඳ
කාපිලෙක්ෂණ-ඉකිරි
කාපිශායණී- මිදිවැල, (මුද්දරප්පලම් වැල)
කාපුසි-කොමඩු
කාපොත- හොයඳුන්, සෞවීර අඳුන්, සුවස ලුණු, මුහුදුලුණු
කාපොතවක්‍රක- කොබෝවක්කා
කාපොතාඤ්ජන-හොයඳුන්
කාඵල-කරපිංව, ඇද්දෙමට
කාඵලා-ඇද්දෙමට
කාඹු-ඇඹුල්වේ

කාඹු } තලගස
කම්බු }
කාම්බුකා-අමුක්කර
කාමෙහාජි-මස්වැන්න, දෙඹ, එදු පියලි, හෙළකිහිරි, මුත්වැන්න
කාමෙහාජිකා-එල හුනිඳ
කාම්පිල්ලක- කටුවෙලඟ, එගු රැස්ස
කාම්‍ය-පියා ගස
කාම්-සීනි, තෝර, තුවරලා
කාමඛඩ්ගදලා- රත් වත් වැටකේ
කාමඝනි-කටුවැල්බටු
කාමවාරිනි-අරත්ත
කාමවාරිය-අරත්ත, කලුවා
කාමවි-කලුකැම්මේරිය
කාමජනනී-බුලත්
කාමතර-සිහින්දුම්බලා
කාමදූ- තලිස්පතුරා, කිරිබදු, බුලත්, අරලු
කාමදූතා-මනෝශිල
කාමදූනී-හෙල පලොල්, රත් පලොල්
කාමධිර ජන්මා-කොකුම්
කාමනීඛා-කස්තුරි
කාම ප්‍රියකරී-අස්ගොඳු
කාම ඵල-මී අඹ ගස
කාමඵලා-කෙසෙල් ගස
කාමමෝද්-කස්තුරි
කාමරඛකාසි-කාමරඛගා
කාමරඛගා-කාමරඛගා ගස, (පැණි කාමරංගා, ඇඹුල් කාමරඛගා ය යි දෙවගයකි. පැණි කාමරඛගා කෑමට ත්, ඇඹුල් කාමරඛගා ලෝහ වගී ශුද්ධි කිරීමට ත් ගණිති)
කාමරූපොද්භවා-කස්තුරි
කාමල-සෙන්ගමාල රෝගය

කාමලකී කාමීක

කාමලකී–පිටවක්කා
කාමලොව–කළු අඟිල්, කළුවැල්
කාමවතී–දුරුහරිද්‍රා(ලඬකාවේ මේ වෙනුවට වෙනිවැල් ගණිති)
කාමවල්ලභ–අඹ. කුරුඳුපොතු, බලුදම්
කාමවෘන්තා–පළොල්
කාමශර–අඹ
කාමා–වැල්මදට, කැප්පිටියා
කාමාග්නී–කාංසා
කාමාචි–හීන්කැම්මේරිය
කාමාතා–කලුකැම්මේරිය
කාමාඞ්ගා–කස්තුරි
කාමායුධ–අඹගස
කාමාලු–රතු මල් ඇති පෙතන්ගස
කාමිනී–දුරුහරිද්‍රා
කාමිනීශ–මුරංගා ගස
කාමීල–දෙඹ ගස
කාමුක්– සාදික්කා, වනසාදික්කා
කාමුක– විෂ්ණුක්‍රාන්ති, නෝපලු, සමන්පිච්ච, කෝන්ගස, අක්මැල්ල, කලමැල්ල, පුවක්
කාමුකා–තැල්වැල්, අක්මැල්ල
කාමුද්ගා–මුන්වැන්න
කාමුරණ්ඩ–යක්බෙරිය
කාමුරු–කරාබු
කාමෙෂ්ට–මී අඹ ගස
කාමෙ–සිරිල
කායඵල–කරබෙඹිය (කරපිංව)
කායම්– පෙරුම්කායම්, බෙහෙත් හොද්ද
කායවල්ලි–උඩල
කායසථා–අරත්ත, කාවෙලු, අරළු, එන්සාල්
කායසථාලි–රත්පළොල්
කායසතා–කලුතලා කොළ
කායිනදුඉලෙසි–වියලි කොළ

කායිනදුකායි–වියලි ගෙඩි, (වියැලූ ගෙඩි)
කායිනදුපටෙසි–වියලි පොතු
කායිනෙයිෂිට්ටි–ගස්පෙතෙලගෙඩි, පෙතෙල ඇට
කායිපොන්නම්කොට්ට–ගස්පෙතෙල ගෙඩි, පෙතෙල ඇට
කාර්අගිල්–අගිල්, කලුවැල්
කාර්ර්යම්–කලුර්යම්
කාර්කලුක–සිහින් නිඹිරි
කාර්කවල්ලි–ඔලිද
කාර්තසවර–රත්රන්, අත්තන, කපු
කාර්යොටක–වැල්තුඹ
කාර්කොරි–රේරු
කාර්තසවර–රත්රන්, අත්තන, කපු
කාර්තාක්ෂිරි–රුක්ගොකටු
කාර්ගෝල් අරිසි–බෝදි ඇට, කලු බෝ ඇට
කාර්නික–කිරිහඳුලු
කාෂිට–ලාකඩ
කාෂිාවිකා–කවඩි
කෂිාවිකාපාවි–වැල් කපු
කාෂිාස–මහකපු, හිඟුරුපියලි
කාෂිාසකිකස–කපු ඇට
කෂිාසස්තූලක–කපු පුළුන්
කාර්පූරිකාවරසි–බෝදි ඇට
කාර්මක–තොවිල, දියම්දෙල්ල, හෙල කිඹිරි
කාර්මරී–උණමකුළු
කාර්මුක–නිඹිරි, තොවිල, දිය ම්දෙල්ල, හෙල කිඹිරි
කාඝ්‍ය–කටුවල්බටු
කාර්ශ්මරී
කාර්ශ්මඝ්‍ය } ඇද්දෙමට
කාශ්‍ය–සල් රුක, ඇද්දෙමට, දෙල්
කාෂික–කිරිපලා

කාෂ්ණි-භාතාවාරිය
කාර-යවකාර ලූණු
කාරම්පස-යවකර, පුස්කර, සව්කර, ඕංකර, සර්ජ හෝ අඤ්ජන යන ක්ෂාර පස
කාරක-ඉදුසල් ගස
කාරකුටිකා-අරලු
කාරගිල්-කලුවැල්, කලු අගිල්
කාරදු-කන්කලාදුරා(කණිගුථ)
කාරබූසි-(කරබූසි)ඇට කළු පැණි පුහුල් (පත්තක්කා)
කාරහි-වැල්තුඹ, සතපුෂ්ප, කලුදුරා, හීන් එන්සාල්
කාරම්-පුස්කර, ලූණුරසැති සැර ද්‍රව්‍ය (යවකර, පුෂ්කර, සවුක්කාරම්,ඕංකාරම්, අඤ්ජණක්ෂාර
කාරම්භ- පුවඟු, රැකඟුන. (ගස් අඟුන,)මහ අසමෝදගම්
කාරම්භිකා-කපුරා
කාරලවණ-කාරම්ලූණු
කාරවග-කාරම් (කටුක)වගී
කාරවල්‍ය-කරිවිල
කාරවල්ල-සිඟින් කරිවිල (තුඹ කරිවිල
කාරවල්ලි- අසමෝද, මහ කරිවිල
කාරවල්ලිකා-කරිවිල, මහකරිවිල
කාරවල්ල්‍යක-කරිවිල, මහකරිවිල
කාරවි-සතපුෂ්ප, කරිවිල, කුරුඳු කොළ, රම්මානිස්ස, දුටුසතුටු, මොණරකුඩුම්බිය, කොබෙයි කොළ
කාරව්වල්ලි-අසමෝද
කාරවෙල්ල-කරිවිල
කාරවෙල්ලි-කරිවිල
කාරස්කර-කදුරු ගස
කාරසන්-තෙල්ලි
කාරසවද-ඇසළ
කාරග්ව-මහ අසමොද
කාරිකා-මනෝසිල, කවෙලු
කාරී-කටුවැල්බටු
කාරුක-කාමරංගා ගස
කාරුකා-මනෝශිල
කාරුජ-නාමල්රේණු, සිවන්ගුරු
කාරුපු-උකුස්සන්
කාරෝදක-ලූණුරසැති අළු සහිත දිය
කාරෝසු-කාරම් බෙහෙත
කාල්පක-හිඟුරුපියලි, සුවඳකසා
කාල්ලි-පතොක්
කාල-බැවිල, රත්නිවුල්, කලුදුරා, මනෝසිල, වැල්මදට, කලුත්‍රාසත වාලු, සුලුබැවිල, ලෝකඩ, කොන්තමල්ලි
කාලඅගුරු-කලවැල්
කාලකඛඬ-තිබිරි
කාලක-කරපිංචා(කාරබෙඹිය)පිල, හිඟුරුපියලි, සුවඳකසා, මීඇට, තතුල්, (කපුකිනිස්ස) හිරියල්, කලාදුරා
කාලකණ්ට-පියාගස
කාලකණ්ඨ-නිල්කැට
කාලකණ්ඨක-ඇන්තෝර ගස
කාල කපිත්‍ථ-අක්මැල්ල
කාලක මුෂ්ක-කලු මල් ඇති තෙලෙඹු ගස
කාලකස්තූරි-කස්තූරි වෙසෙසක්
කාලකාපිකා-හෝපලු ගස
කාලකාලි-ලියනඟලා
කාලකූට- වව්වනාවි (වත්සනාභ) විෂ ඉඟුරු
කාලකූටක-වව්වනාවි, කදුරුගස
කාලඝණ්ටා, කාලඝණ්ටිකා } තෙලෙඹු ගස
කාලඩකත, කාලඩකාත } ඇන්තෝර
කාලජීරක-කලුදුරා
කාලඤ්ඣි-මුඩමහණ (වෙල්මුඩ)
කාලතාල-තමලු ගස

කාලනිඳුක

කාලනිඳුක-කදුරු ගස
කාලනිපු-කලු තුඹ
කාලදෙලා-අවරිය
කාලධෙෞත-රිදී
කාලන්-එරමිණියා
කාලනියාස-ගුගුල්
කාලපත්‍රී-තලිස්පතුරු
කාලපර්ණ-තුවරලා .
කාලපර්ණි-කලු තුඹතාවාලු
කාලපාශී-ඉරමුසු
කාලපිලුක-කදුරු ගස
කාලපුෂ්ප-ගල්සෙවෙල්, කඩලගස
කාලපෙය-කිරිමෝරු
කාලපෙශිකා- වැල්මදට, හිරමුසු, කලුදුරු
කාලපෙශී-කලු හිරමුසු

කාලමේෂ - වල්බින්කොහොඹ



කාලමේෂ-වල්බින්කොහොඹ
Antrographis Pariculata

කාලවෘන්තා

මෙය අඩි දෙකක් පමණ උසට වැවෙන හේන් මිරිස් කොළ වැනි කොළ හා නයි (හින්) මිරිස් කරල් පමණ හින් කරල් පොකුරු ඇති පැලෑටියකි.

ඉතා තද තික්ත ගතියකින් යුත් මේ සම්පූර්ණ පැලෑටිය ජ්වරය, රුධිරතාපනය, ආදී රෝග සමූහය කට ම ප්‍රත්‍යක්ෂ ගුණදායක ඖෂධ යකි.

කාලක්‍රියා-අමුක්කරා
කාලඛණ්ඩි-එල හුනිඳ, වැල්මදට
කාලම්බි-වැල්නිවිති
කාලමඤ්ජරි-වැල්මිදට
කාලමාන-කලුහාලා, කලුදුරු, අක්මැල්ල
කාලමාල-ගල්සෙවෙල්, කලුඅගිල්, අක්මැල්ල
කාලමුඤ්ඣක-තෙලඹු
කාලමූල-රත්නිවුල්
කාලමේෂි- කලු තුඹතාවාලු, වැල්මදට, බෝදිගස්, කසා, කලුදුරු
කාලමේෂිකා-වැල්පෙතෙල, බෝදි ඇට, වැල්මදට
කාලය-යකඩ
කාලයා-මෑ, ලීමෑ, උදු
කාල ලවණ-කලු ලුණු, උද්භිද ලුණු
කාලලොණ-කලු ලුණු
කාලලොහක-යකඩ, කලු යකඩ
කාලවත්‍ර-පුවක්
කාලවර්නිකා-පලොල්
කාලවිෂාණිකා-කවෙලු, කිරිකවෙලු
කාලවීජක- තොටිල, කවුඩුනිඹිරි
කාලවෘන්තා-කොල්ලු, රත්පලොල

කාලවෘන්ති-පළොල්
කාලශාක-පිල, කරපිංච, (කරබෙඹිය)
කාලශාකුට-කලු ගහල
කලශාලි-කලුහැල්
කාලෂටජා-තැල්වැල්
කාලස්කන්ධ-දුරා, එලකිඹිරි, අවිවික්කා, කොල්ලන් කොළ, ජීවක වෘක්ෂය
කාලසකර-තිඹිරි ගස, තම්ලුගස
කාලසථාලි-පළොල් ගස
කාලසාර-තිඹිරි, රත් වන් සඳුන්, කලුවැල්, හිරියල්,
කාලසි-පළොල්,(පුලිල) පෘෂ්ණ පර්ණී
කාලසෙස-මෝරු
කාලහීත-ලොත් රුක
කාලා-වැල්මදට, කලුදුරු, අමුක් කරා, කළු තුඹනවාලු, බේරු, අවරිය, යකඩ
කාලාගුරු-කලු අගිල්, කලුවැල්
කාලාජාජි-කලුදුරු,මිහදුරු
කාලාඤ්ජනී-කලුකපු, අවරිය
කාලාත්-නතු
කාලානුශාරිනී-කලු ඉරමුසු,
කාලානුසාර්‍ය්‍ය- ගල්නහර, ගලින් උපන් සුවඳ ද්‍රව්‍ය, ඇට්ටර, තුවරලා, කප්පරවල්ලිය
කාලානුසාර්‍ය්‍යිකා-ගල්මද, ගල් සෙවෙල්
කාලානුසාරි-කලුවැල්, කලුඅගිල්, ඉරමුසු
කාලානුසාරිකා-තුවරලා
කාලානුසාරිකා-තුවරලා, රත්වන් සඳුන්
කාලාය-උලුන්දු (උඳු)
කාලායස-යකඩ
කාලාණ්ව-කවුඩු තිඹිරි
කාලි- ලියනහලා, තිරස්සවාලු, ඇත්සැටි ය,සුලුබැවිල, රත්වන්
කාලි, වැල්පෙනෙල, අගිල්, බේරු, කලුදුරු, කෙළිඳ, නිල් ඕලු
කාලිකා- ඇත්සැවිය, කලු අගිල්, කලුවැල්, කළුසදුන්, මහ කැකිරි
කාලිකාති-අවරිය
කාලිඤ්ඣ- අරළු, කලුදුරු, හාතාවාරිය, ජටාමාංශ
කාලිකි-රතු අබ, කලුදුරු, කවෙලු
කාලිඟ } කෙළිඳ ගස, කිඹි
කාලිඛග } කොමඩු,පැණිකොමඩු, මහ කැකිරි,
කාලිගන-කුඹුරු
කාලිඛා-කොළ අරලු
කාලිඛාත-ඇත්තෝර
කාලිඛගි-සින් එන්සාල්
කාලිඛගිකා-කෙලිද, (කෙළිදසාල්)
කාලිඛගිකා-නිරස්සවාළු, සිනි කැකිරි
කාලිතකි-අවරි
කාලින්-කලුදුරු
කාලිය-ඛාන්වැල්(වනුවැල්= කහවැල්)
කාලියං-කලුවැල්
කාලියක- නිදිකුම්බා, කලුඅගිල්, දුරාහරිද්‍රා
කාලී- වැල්පෙනෙල, කළුදුරු, බේරු
කාලෙය-කහ, නෙලුම් ඇට, කළු සඳුන්, වැල්මදට, වනුවැල්, කොකුම්
කාලෙයක- කොකුම්, වැල්මදට, වනුවැල්, රත්හදුන්

කාලෝදර-උගුරැස්ස, කටුවෙලඟ
කාලෝපල-කාන්දම්
කාලෝහිත-එරමිණියා
කාව්‍යතිකන්තක-හණ ගස
කාවරි-තුඹකොළ, වැල්තුඹ ගෙඩි
කාවලා-පිල, හෙලපිල
කාවලූ-රත්හාල්
කාවාකා-කැකිරි
කාවෙරකණ්ණක-කාවේරි රුක
කාවේරී-කසා
කාවේලු-අරලු, මිහකැකිරි
කාවෘක්ෂ-පිළිල (ගස්වල බැඳෙන පිළිල)
කාශ්මරි, කාශ්මීරි } ඇද්දෙමට, කපුරු
කාශ්මයන්‍ති- ඇද්දෙමට, පොකුරු මුල්
කාශ්මීර-කොකුම්, ඇද්දෙමට
කාශ්මීරජ-කොකුම්, පොකුරු මුල්, කොච්චම්
කාශ්මීරජා-ඉවද
කාශ්මීරජීරක-සුදු දුරු
කාශ්මීරා-ඉවද
කාශ්වරී-ඇද්දෙමට
කාශ්‍ය-මිත්පැන්
කාශ්‍යා- රටතෝර
කාශ-උක්, වැලුක්, ඉහිනි, කාශ රෝගය
කාශක-වැලුක්
කාශනාශන- කකුළුසුඟ (කකීටක ශ්‍රිඞ්ගි)
කාශනාශිනී- නිසාගස
කාශමර්දී- උඟුරැතෝර, ඇන්තෝර
කාශාල්මලී- කටුඉඹුල් ගස
කාශිස- කසිස්
කාශීසම්භූත-රසදිය
කාශුකාර- පුවක්ගස
කාශෙක්ෂු- වීලුක්
කාෂ්ට- දේවදුර, නොරගස
කාෂ්ටකදලී- ඇටකෙසෙල්
කාෂ්ටකුවෙරා- හෙලපළොල්
කාෂ්ටක්‍රි- වැවරණ- දේවදුර
කාෂ්ටදර- වනුවැල්, (බාන්වැල්)
කාෂ්ටය- නිමේස්කල් (නිමේසකා ල= ඇසිපිය හෙලන ප්‍රමාණ කාලය)
කාෂ්ටිලා- කෙසෙල්
කාෂ්ඨ- දුරුහරිද්‍රා
කාෂ්ඨක- කලුවැල්, අගිල්
කාෂ්ඨකදලී- ඇටකෙසෙල්
කාෂ්ඨජම්බු- දියඳඹගස
කාෂ්ඨදුරු- දේවදුරගස
කාෂ්ඨද්‍රු- කැලගස
කාෂ්ඨධාත්‍රීඵල- නෙල්ලි
කාෂ්ඨපාටලා- හෙලපළොල්
කාෂ්ඨපාටලිකා- පළොල්
කාෂ්ඨපාටලී- පළොල්
කාෂ්ඨඵලා- පළොල්
කාෂ්ඨඵලෙරුහා- හෙලපළොල්
කාෂ්ඨපුෂ්ප- වැටකේ
කාෂ්ඨමධුක- වැල්මී
කාෂ්ඨයන්‍ති- ඇද්දෙමට
කාෂ්ඨරජණී- දුරුහරිද්‍රා
කාෂ්ඨවල්ලිකා- කටුකරෝසණ
කාෂ්ඨවාරිණී- අරත්ත (රත්ත) කලුවාගස්
කාෂ්ඨවාසතුක- කම්පලා වෙසෙසක්
කාෂ්ඨශාරිවා- ඉරමුසු
කාෂ්ඨශාලි- රත් හැල්
කාෂ්ඨා- වනුවැල්
කාෂ්ඨාගරු- රන්වන් අගිල්
කාෂ්ඨීරසා- කෙසෙල්ගස
කාෂ්ඨිල- හෙලවරුගස
කාෂ්ඨිලා- ඇටකෙසෙල්, හෙලවරු

කැ

කාෂෙඨක්ෂු- උක්වෙසෙසක්
කාෂෙඨාඩුම්බරිකා- කොටදිඹුලා ගස
කාෂ්මදී- රටතෝර
කාස්ටඤ- දේවදාරුගස
කාස්ටය- කලං එකහමාර
කාස්ටයන- හොරගස
කාස්මීර- නෙළුම්අල, කොකුම්, කොච්චම්
කාස්මීරජන්මන්- කොකුම්
කාස්‍ය- සල්ගස, දෙල්ගස
කාස- ඉහිනි, උක්, වැලුක්, රඹුන්, මුරුංගා ගස
කාසං- වැලුක්
කාසඝ්න- තෝර, බුලු
කාසඝ්නි- කලුවැල්, කලුඅගිල්, බට්ට, කිරිහඳුලු, සිරිතේක්කු, කටුවැල්බට්ට
කාසනාසිනී- කකුළුසුහු
කාසභක්ෂ්‍යන- දුම්මැල්ල
කාසමර්දී } තෝර, රටතෝර
කාසමර්දීක }
කාසමර්දීන- දුම්මැල්ල
කාසරි- තෝර
කාසාරි- රටතෝර
කාසිකා- සෙම, වනමුං
කාසිර- එලබට්ට
කාසීස- කසිස්
කාසුන්‍ද- ඇත්තෝර
කාහලපුෂ්ප-අත්තනමල්, අත්තන
කාහී- කෙළිඳ
කාළ- ලෝකඩ
කාළලවණ- බඟල්ලුණු, කළුලුණු
කාළසාක- කරපිංවා ගස
කාළා- ත්‍රිඵලාවාළු, වැල්මදට, අමුක්කරා, පළොල්, කළුදුරු, අඹරිය.

කැකිරි- කත්තාරි,(හේන් කැකිරි, සීනි කැකිරි, තිත්ත කැකිරි, ගොන් කැකිරි යයි කැකිරි වර්ග 4 කි. මෙයින් ඇඹුල් රසයෙන් යුත් කුඩා ම කැකිරි වර්ගය වූ හේන් කැකිරි අස්මරී රෝගයට ප්‍රත්‍යක්ෂ ඖෂධය කි)
කැකිල්ල- වැඩි ප්‍රයෝජනයක් නැති තදින් බෝවී යන ඉඩම් නිසරු වන පැලැටියකි. මෙයින් ගන්නා ප්‍රයෝජනය නම්: එල වලූකොටු, පතල් ආදිය ආවරණය කිරීමයි. තුවාල වෙද කම ට ද ගනිති.
කැකුණමල- (කැකුණ ලාටු)
කැකුලු- කකීඝ, රළු,
කැවිනිරි - මදුරුගස
කැට්ලුණු- කැමට ගන්නා ලුණු
කැණටු- බුලත්වැල, බුලත් කිනිති
කැඳ- කාඩි
කැඳත්ත- ඔසු වෙසෙසක්
කැඳරවාල- එදුපියලි
කැන්- සමූහය,මෝරු
කැන්ද- කැන්දගස- (රත්කැන්ද, බූකැන්ද, මූදුකැන්ද, යයි කැන්ද වර්ග තුනකි. මෙයින් රත් කැන්ද කොළ හා කිරි (ලාටු) ප්‍රයෝජනවත් ය.)
කැම්මේරිය-කැම්මේරිය, මේපැළැටිය රත්, කළු, කැම්මේරිය වශයෙන් වර්ග දෙකකි. එයින් කළු කැම්මේරිය වඩා ප්‍රයෝජනවත් ය. විසතර 92 පිටේ කළු කැම්මේරිය බලන්න.

කැනහිල්අල

කැනහිල්අල- සුධාමූලි,=ඇ ලා මිශ්‍රී, (නරිඅල,)මෙය බින්තල් ගණයට අයත් වාජීකරණ බෙහෙතකි. අෂ්ටක වගීයෙන් ද එකකි.

කැනහිල්ල- කටුසෙවෙල් (සීනිද්ද)

කැනහිවි- කැනහිල්ල

කැපුන්කිරිය- තුවාල සුවකෙන බෙහෙතක්



කැපුන්කිරිය

දළුක් වගීයට අයත් වූ මේ පැලෑටිය අඩි 8 ක් පමණ උසට වැඩෙයි. මෙහි කඳ ඇලවේ වැලක් පමණ ඇත. කොළ අඟල් $1\frac{1}{2} \times 1$ පමණ දිග – පළල ය. ඕවාල හැඩයෙන් යුක්ත ය. මේ කොළ එක තැන දෙක බැගින් දෙපසට බෙදී තිබේ.

කැම්බි

දළුක් ගසේ මෙන් ම මේ පැලෑටියේ ද සෑම තැන ම සුදුපාට කිරි පිරී ඇත. මෙහි කරට් තලා (පොඩිකර) කැපුම් තුවාල වලට ලේ පිටින් බැඳීමෙන් එකී තුවාල පැසවන්නේ නැතුව ඉතා ඉක්මනින් සුව වෙයි.

කැබිලින්තෙ නටන්නා- වී පොරි (රහස් බෙත් වට්ටෝරුවක එන වචනයක්)

කැබෙල්ල- කැබෙල්ල ගස- (තේ ගසට සමාන මේ ගසේ දළු මාළුවට හා තේ කොළ වෙනුවට පිළියෙළ කරගත හැක)

කැම්මීර- කැම්මේරිය

කැම්මේරිය- කළුකැම්මේය (කෘතජඛඃ) නිදිගන්වන පැලෑටියකි.

කැමජීවා- (කැමජුවා) – කමීජවා කඃ.

කැරට්-ගාර්ජාර-(ඇදුමට ප්‍රත්‍යක්ෂ බෙහෙතකි)

කැල- සමූහය, බැවිල, කණේරු, කිණිහිරි

කැලණිය- වල්ණිය (අරත්ත, ඉහුරු, වල් ඉහුරු, කළුවා අල වගී වලට අයත් ගසකි.) තද සුවඳකින් යුත් මේ වගීයේ මල් සහ බඩ බුලත් විට රසවත් කිරීමට ගනිති.

කැලුම්- මහනෙල් මල්

කැලෙන්කැපූ පොත්ත-කැටකැල (රහස් බෙත් වට්ටෝරුවක ඔසුවක්)

කැවිඩි- කැප්පෙටියා

කැ කි

කැසිපිස්සන්වැල්- රත් පිතට කැමට හා ඉසකුඩිච්චියට ප්‍රත්‍යක්ෂ අධික සීත ගුණ යෙන් යුත් වැල් වර්ගයකි. මේ වායේ කොළ කොටා ඇල්දියෙන් මිරිකා පෙරා සීනි දමා රැයක් මිදෙන්ට තබාගත් කල සන්වවු වැනි අධික සීත ගුණයෙන් යුත් රස වත් කැමක් පිළියෙළ කර ගත හැක.

කැසිමුස- කැස්ස හා ඇදුම

කැහැල- කැල ගස,

කැර- කැරැ ගස (බරු වර්ගයට අයත් අවුරුදු සිය ගණන් ගිය විට ඇතුලේ සැරයටි (බස්තම්) තැනීමට සුදුසු අරටුවක් සැදෙන උඩවැඩියා වැවීමට පොත්ත හත්නා ගසකි.

කැල- කැල ගස- (කැටකැල, පව් (රත්) කැල යයි කැලවර්ගී දෙකකි කැට කැල කැඩුම් බිඳුම්, වෙද කමට ත් පව් (රත්) කැල වාජීකරණ ඖෂධ වලට ත් ප්‍රත්‍යක්ෂයි.

කැලිය- නාග බලා නම් ගස්

කිංකිණ-රිදිතුත්තන්

කිංකිණි- කිහිරි, උගුරැස්ස, කටු කිරිය, මුංවැන්න

කිංගෙදරිදං-ඉද්ද

කිංචුලකයා-බිම්නා, (ගැ ටු වු ලා= ගැඩවිලා)

කිංජය-අගිල්

කිංජල්ක-පද්ම කෙසරු, නාමල් රේණු

කිංජල-කොට්ටන්

කිංව-තෙලුම් මල් රේණු

කිංශුක-කැල, එරබදු, අත්තන, තල් ගස

කිංසුක-අරත්ත, එරබදු, අත්තන

කිංජකෙඛා-පියුම් කෙසරු

කිකකරි-වැටකොලු

කිකි-පොල් ගස

කිකුරු-මළල

කිඛකරා-කොටදිඹුලා

කිඛකිරාට-සීනිය ගස

කිඛකිරාත-හෝපලු ගස

කිඛකිරාතක-කටුකරඹු ගස

කිඛකිරාල-මූතමල්, සීතියා ගස

කිඛකිරින්-කටුකිහිරි

කිඛකිලාස-හෝපලු ගස

කිච්චා-මූත්‍රකෘච්ඡ්‍රා

කිච්චාඬි-මුංඇට හා සහල් ද මිශ්‍ර කර පිළියෙළ කරණ ආහාරයක්

කිචූලක-ගැඩවිලා

කිඤ්ඣ-තෙලුම්මල් රේණු

කිඤ්ජලක - කොට්ටන්- නා ම ල් රේණු, තෙලුම් මල් රේණු

කිඤ්ඣලක- කොට්ටන්, නා ම ල් රේණු, තෙලුම් රේණු

කිට්ට-යබොර

කිටෙටා-බුළු

කිටම්-යබොර

කිටිප-රිදිතුත්තම්, උක්පැණි

කිටිමූලක-උණරල

කිට්ඨ- සමූහය

කිඩාරම්-කිඩාරම් ගස

කිඩිඛ-කිඩිඩි, තුත්ත ම්, රිදිතුත්තම්, කුෂ්ට රෝගයක්

කිණ්වමූලක-මූණමල් ගස

කිණිහි-සැඹෝ ගස

කිණිහු-මලැස්ස, ලාගෙඩි
කිණිරී-කිණිහිරි ගස
කිණිහි-කරල්සැබෝ, එල කට රොලු
කිණිහිතුල්‍ය-කටුවැල්බටු,
කිණිහිරි-කර්ණිකාර. හැඩ හුරු කමෙන් නා මල් වලට සමාන කහපාට මල් හටගන්නා කපු කොළ වැනි කොළ ඇති, හික් ගස් වැනි කද ඇති ගස් වර්ග යකි.
කිණු-ගම්මිරිස් වැල
කිණුමස්-ලූල් මස්
කිතව-අත්තන, නි හු රු පි ය ලි, සුවඳ කසා
කිතවරුක්-අත්තන ගස
කිතල්-එනම් ගස, ඉඳි ගස
කිතල-අළු කොසෙල් හැඩය ඇති අළු නැති මාළු කොසෙල් වර්ග යක්
කිතුල්-නිතුල් ගස, (හිංනාල)
කිදල-කුඩා වැල
කිදි-රසකිද, ගිම්පලා
කිදිලිය-කිඳුලිය
කිදි (වැල්)-කිදි වර්ග අටකි. රස කිද, නිත්ත කිද, බූ කිද, ගැට කිද, පිටි කිද, දික් කිද, අළු කිද, සෙවෙල් කිද
කිදු-මිරිස්
කිදු-අත්ත
කින්කරා-කොටදිඹුලා
කින්කිනි-කටුකිරිය, උගුරැස්ස, මුංවැන්න
කින්කිරාත-හෝපලු, අසෝක
කින්කිරාල-වකුල, (මුහුණමල්)
කින්ජල්ක-නා කෙසරු, නා මල් රේණු; නෙලුම් රේණු, සුවඳ කොට්ටම්
කින්තාල-කිතුල්
කින්නම්-කිර
කින්නරා බිජූ-යෝගාබිජූ
කින්ශුක-කැල, (එරබදු) කිඹිරි
කින්සුක-රත්කැල
කිනඟ-කාලහංසයෝ
කිනව්-කටුකරඹු
කිනිහු, කිනිහුල් } මලැස්ස
කිනිගෙෂරා-බටු ගස
කිනිතුල්-විලිකුත් ඵලය, (විසලි ගෙඩි = පැසුන ගෙඩි)
කිනිමස්-කලුමසුන්
කිනිලිකාලි-නිල්කැට
කිනිහි-මහ කපු, සාබෝ, ලෝලු, නිල්කටරොලු, ඇඹුල්වේ, මහ ඉඟිනි, හෙලසැබෝ, තිබ්බටු
කිනිහිතුල්‍ය-කටුවැල් බටු
කිනිහිරියා-ගින්තේර, (කඳුරැලි වල හටගන්නා නිල්පාට මල් පොකුරු සහිත කුඩා පඳුරු වර්ගයක්)
කිනී-හීන් වම්බටු
කිබි-කහට ගස
කිම්පක්, කිම්පක්කා, කිම්ඵල } විෂ සහිත අඹ ගෙඩි වැනි ගෙඩි ඇති ගස් ක්, (ගොඩ කඳුරු යයි විශ්වාස කළ හැක.)
කිම්පල-කඳුරු ගස
කිම්පාක-කඳුරු ගස
කිමෂීර-නස්තාරං
කිම්ජ-වලහසාල්
කිම්ල-දේවදාර
කිම්හර-වලහසාල්
කිඹික-කසට ගස
කිඹිලි-ඉස්සා, (නලමස්සු)
කිඹුල්-කිඹුල්ලු

කිඹුල්වැන්න–අතීසාර නාසක ඖෂධයක්

කිඹුල්වැන්න—සඤ්ඤානිඤ්ඤ පනම්පෙනි (කාසිපෙනි)

Polygonum Tomentosum

කුමහිලාකාර (කිඹුලෙකුගේ ඇඹුරුකම ඇති) මල් හට ගන්නා මේ වර්ගය දියසීරාව ඇති රාශිය ගස්වල ත්, ගල් වලත් ඇවේ. කිතුල් කෙඳි වැනි කලු ාට කුඩා දඬු වල සැදෙන මස හිත දිය ගතියෙන් යුත් කොළ ැති මේ වර්ගය ලංකාවේ පැරණි නමේ කාසි ය ට සමාන නිසා නම්පෙනි යයි ද, කාසි පෙති යි ද ගැම් වහරෙහි යෙදී ඇත. මය ඇඹුල් – කසට ර ස යෙන් යුක්ත ය. අතීසාර රෝගයට හා අධික පිපාසයට ත් මේවා තම්බා ගත් ජලය උතුම්.

දිය සෙවෙල් සහිත ගස්වල් පැලවෙන මේ වර්ගයේ මුල් පසුව පොළවට ඇදෙයි.

තවත් මතයක්:— ඇඹුල් ඇඹිලියවල හැඩ හුරුකම් ඇති පෙති හතරකින් යුක්ත වූ "පෙති පලා" නම් න් දකුණු පලාතේ ප්‍රසිද්ධ පලා වර්ගය කිඹුල්වැන්න බැව් එක් ප්‍රසිද්ධ වෛද්‍ය පරම්පරා වක පැවත එන මතයකි.

කියමු–කහ
කිර්මිර–නාරං ගස
කිර්මිරුච්–නාරං ගස
කිරටා–වනුප් ඇට
කිරතුං––බිංකොසඹ
කිරඹ–ගිරා අඹ
කිරමාල–ඇසළ ගස
කිරාත–බින්කොසඹ
කිරාතක–බින්කොසඹ
කිරාතජ–කෝන්, තඹවන් සඳුන්, බිංකොසඹ
කිරාත තික්ත – බිම් කොස ඹ, නේපාල බිම්කොසඹ
කිරාතිනී–ජටාමාංශි
කිරාම්බු–කරාබුනැට්
කිරි–ලෑරල
කිරිඅල–කිරි ගබරල, කිරිබදු අල,
කිරි ඇති ගස– රුක්අත්තන ගස
කිරික–කිරිපලු
කිරිකවෙලු–ක්ෂීරකාකොලි (අෂ්ටක වර්ගයේ ඔසුවක්)
කිරිහු–ලූලා
කිරිගොප්ප– උඩවැඩියා වර්ගයට අයත් කිරි සහිත වැලක්

කිරිගොප්ප

කිරිගොප්ප

මෙය දිරා ගිය පොතු සහිත විශාල ගස්වල පැලවී එයින් මුල් බිමට ඇදී වැවෙන උඩවැඩියා වගී යට අයත් වැලකි. මෙහි කඳ කොළ හා මල් වල ත් සුදු පාට කිරි රාශිගත ව තිබේ. කොළ දිග පළලින් අඟල් $1\frac{1}{2} \times 1$ ක් පමණ ඇත. මේවා අක්කාපාන කොළ මෙන් ඝණය. මල්-සත්‍රීන්ගේ කණීා භරණ විශෙෂයක් වූ කරාබු වලට සමාන ය. ලා රත් පැහැයෙන් යුත් පොකුරු සහිත ඒ මල් පිපී මෙන් පසු පරවත්තේ දෙසනිය කට පමණ පසුව ය. අඳුරු සහිත ඝණ වතාතරවල වැවෙන මේ වැල් වගීය උඩවැඩියා වවන් නන් විසින් ප්‍රසිද්ධ නගරයන්හි පිහිටි සවකිය උඩවැඩියා ගෘහ යන්හි අලංකාරය පිණිස වවා ත්බෙනු දක්නට ලැබෙන. මෙය

කිරිනුග

කැඩුම්-බිඳුම් වෙදකමේ අවසන්හි වී තිබෙන තැන් එකතු කිරීමට ත් ඇට පැස්සීමට ත් ගන්නා ප්‍රත්‍යක්ෂ රහස් ඖෂධයකි.

කිරිඳි-ඔලිඳ, ගොයම් අතර වැවෙ න තෘණ වගීයක්, (යව වැනි තෘණ පඳුරු විශෙෂයක්)

කිරිඳි වැල්-වැටවල් බැඳීම, වට්ටි-පෙට්ටි ආදියේ ගැට දැමීම වැනි ගොරෝසු වැඩට ගන්නා ලොකු වැල් වගීයක්

කිරිනුග-කළහගස්

කිරිනුග-කළහගස්

Ficus Infectoria

කිරිපලා

කිරිනුග

කැපූ විට ඉතා රත් පාට පොතු සහ කුඩා අතු වලට ම ඇලී තිබෙන සඛල ඇට පමණ ගෙඩි ඇති නුග වර්ගයට අයත් ඖෂධයක් වූ මේ ගස ගැන ප්‍රමාණවත් විස්තරයක් මේ පොතේ 91 වෙනි පිටුවෙහි ඇත.

කිරිපලා-කිරිහැන්ද ගස
කිරිපිඹු-කිරිබත්
කිරිපුරණඩාන්-දත්කැටියා
කිරිබදු-එතම් අල හෝ වැල
කිරිබිඤ්ජිය-කරපිංචා ගස
කිරිමි-කුඹුක් ගස, ඉදි ගස
කිරිමිජිත්-වලඟසාල්
කිරිල-කිරිල්ල(කිරිල්ලා ගස)
කිරිරුක්-පියා ගස
කිරිවල්ලා- කෙළිද වර්ගයට අයත් (ලමා) කෘමි රෝග වලට හිතැති ගසක්. විස්තර ඉදිරියෙහි ඇත.
කිරිවැල්-ඉරමුසු
කිරිරුක-කිරිපලු ගස, පියා ගස
කිරහඟුලු-(කිරිඅඟුලු) කිරිඅඟුණ
කිරිහැන්ද-කුඩා පලා ගසක්
කිරිහුළු කැඳ-කිරි වත්කර පිසූ හාල් කැඳ
කිරිට-වනුක් ගස
කිරිසි-කුඹුක් ගස
කිරෙ-නිල් තම්පලා, කුරතම්පලා
කිල්කායතෙල්ලි-පිටවක්කා (බිම් තෙල්ලි)
කිලඟි-අල
කිලපාදිකා-හීත් නිදිකුම්බා
කිලම්-මෝරු
කිලඹ-හෙලනික, දේවදාර
කිලා-මඟ කරඹ
කිලාටින්-හුණ ගස, එරබු ගස
කිලාල-ගෝ මූත්‍ර
කිලාස-කුෂ්ඨ, පියුම්පෙත්ත
කිලිකිපප-යක්ඛේරිය
කිලිකිලි-යක්ඛේරිය
කිලිකිලිප්පෙයි-අඩතහිරිය, යක් බේරිය
කිලිඤ්ඣන-දුම්මල
කුලිදිලි-කුලුදුල්
කිලිමන්-දේවදාර
කිලිල්-උණ ගස, දලුක් ගස

කිරිවල්ලා

කිරිවල්ලා
Holarrhena Antidysenterica

කී

කිරිවල්ලා

මෙය කෙළිඳ වෙනුවට ගන්නා අඟල් 1½ ක් පමණ විශාල මල් ඇති අඟල් 4 ක් පමණ දිග හා අඟලක් පමණ පළල කොළ ඇති අඩි 20 ක් පමණ උසට වැවෙන ගසකි. කොළ හැඩහුරු කමින් වැලි අනෝදා කොළ වලට බොහෝ සේ සම වුව ද ප්‍රමාණයෙන් මදක් කුඩා ය. මේ ගසේ ඇට, පොතු, හා කොළ දේශීය වෛද්‍ය ප්‍රතිකාර සඳහා ගනු ලැබේ. විශෙෂයෙන් ම අතීසාර, ප්වර හා ලමා රෝග වලට ත් ප්‍රත්‍යක්ෂ ඖෂධය කි.

කිවි-රිලවා
කිශක-උග් ගස, උණ ගස
කිශරොමන්-වඳුරු මැ
කිෂ්කුපර්ණී-උක් ගස, උණ ගස, ඛට ගස
කිස්මිස්-ඒයලි මුද්දරප්පලම්
කිසල්-දළුව
කිසලං-කීකිරිඳිය
කිසල-කීකිරිඳිය, ලා දළුව, කොළ පත
කිසලය-ලා පත්‍ර (දළු)
කිසි-කසට ගස
කිසිඹිලි-ඉස්සෝ
කිසුම්-මල්
කිසුලු-මිඳෙල්ල
කිහිම-කුසුම
කිහිඹිය-පිහිඹිය ගස,ඝණ වනාන්තරවල විශාල ගල් අසල වැඩි වශයෙන් හටගන්නා මේ ගසේ කොළ ගරාඬාකාර ය. නීල වර්ණ වූ ඒ කොළ පරඬැල්ලී වැටීම ද අඩු ය. ගොමුවක් සේ යාන්ද්‍රා කාර ව (ඝණසැරේට) වැවී තිබෙන නිසා ග්‍රීෂ්ම ප්‍රදෙශවල ශෙවල් අසල වැවීමට සුදුසු යි
කිහිරි-බදිර (රත්කිහිරිය ගස)

කිංගෙදරිදං-ඉද්ද
කීකශ-මිනීඇට
කීකිරිඳිය-ඵලකීකිරිඳිය, අඳුන් කීකිරිඳිය යනි වශී දෙකකි. අඳුන් කීකිරිඳිය අකලටපැසෙන කෙස් කළු කරණ, ඉස සිහිල් කරණ තෙල් වලට සහ ඇතැම් අරිෂ්ට වලට ත් ගණිති. මෙය අලි වෙදකමේ ද ප්‍රධාන ඖෂධය කි
කීවක-රණබට
කීවකා-පවනින් හඬන හුණ
කීට-යබොර
කීටක-කොසඹ ගස
කීටඝ්න-ගෙන්දගම් (ගඬුක)
කීටජා-ලාක්ෂ
කීටනාම-රතු නිදිකුම්බා
කීටපවිජයා, කීටවිජයා } කුඹුක්
කීටපාදිකා-වලාවැන්න, රතු නිදිකුම්බා
කීටමණ්ඩාලි-කසඹිලියා
කීටමාරිකා-වලාවැන්න.
කීටමාරි-වලාවැන්න
කීටමාලිකා-වලාවැන්න
කීටවිනාසනී-සාලිපර්ණී
කීටහනන-ගෙන්දගම් (ගඬුක)
කීටහා-වලහසාල්
කීඩෙර-සුලුකුරු ගස

කු

කු-වෘක්ෂය, ගස, භූමිය, ශබ්දය
කුංකුමපපු- කොකුම්, හඳුන්මල්
කුංචි-කළු දුරා, මාදුරා
කුංඩ්‍රමණී-ඔලිඳ
කුක්-මෝරා
කුක්කිල්-ගුගුල්
කුක්කුට-තොටිල, ඝිහින් සාතා වාරිය, ඉඹුල්
කුක්කුටක-හෙළ කිහිරි
කුක්කුටපාදප-දෙව් අඹ
කුක්කුටඵල-තොටිල
කුක්කුටමස්ජරී-ඝිවිය
කුක්කුඩමස්තක-ඝිවිය
කුක්කුට ශිඛ-කුකුල් කරමල් ගස, වනුක් ගස
කුක්කුටසිව-වනුක්,සෙන්දිරික්කා
කුක්කුටා-කසාවන් හිරිතිල්ල
කුක්කුටාණඩ-කිකිළිබිජු
කුක්කුටාණඩසම-කත්තිරික්කා බටු
කුක්කුටි-ඉඹුල්, වෘෂභක (අෂටක වගීයේ ඔසුවක්) කිඹුල්වැන්න, හීන්වම්මුතු
කුක්කුටිකා-ඉඹුල්, (හිඹුල්)
කුක්කුර-විෂ්ණුක්‍රාන්ති, පොණඩරු
කුක්කුල්-ගුගුල්
කුක්කුලකොඩි- පුපුලවැල
කුක්කුළු- ඉලුක්
කුක්ෂි-නිත්ත ලබු
කුක්ෂිරඤ්ජ-බට ගස
කුක්ෂිසූල-බඩරුජාව
කුකහ-මත්පැන්
කුකුට-ඉඹුල් ගස, කිඹුල්වැන්න
කුකුටමස්ත-සිවිය
කුකුටී-ඉඹුල් ගෑ
කුකුණඨ-මෑ, ලීමෑ

කිණ-කීන ගස, මේවායේ අරටු අරිෂට වලට ගණිති.
කිණ්ඩ-ගම්මිරිස්
කිතනිකා-වැල්මී
කිතාව මුල්-කාංටකාව මුල් (කීන මුල්=සීන නමැති ගසේ මුල්)
කිනාශ-කටුවැල්බටු
කිතීනී-අවරිය ගස
කිර්ති-බුරුත ගස
කීර-මස්
කීරකැඳඹි අල- කුෂ්ට රෝගයට ගන්නා බෙහෙතක්
කීරට-රියම්
කීරතතුඵලා-පුලුන් (ඉඹුල්)ගස
කීරනාශක
කීරහාශක } තොටිල
කීරමාතා-වලාවැන්න
කීරික-කිරිපලු
කීරෙෂව- කොසඹ, මහ කොසඹ, අඹ ගස, ගල්මොර ගස
කීරෝ-තම්පලා වගී
කිල්-ලාටු, දුම්මල හා පොල්තෙල් උණු කිරීමෙන් සාදා ගන්නා බදාම
කිල-කොකුම්, ලියනහලා
කිලඤ-තකුල්
කිලකාසිනෙල්ලි- පිටවක්කා, (බිම් නෙල්ලි)
කිලන්-මෝරා
කිලපාදිකා-වලාවැන්න
කිලම්-දේවදාර
කිලවනෙල්ලි-පිටවක්කා
කිලසංස්පර්ශී-කිඹිරි ගස
කිලාල-ලේ, වතුර, ඉදුසල්, මැලියම්
කිශපර්ණී-කරල්සැඹ
කිශඵල-තකුල්
කිශරෝමා-වඳුරා මෑ
කිළිදු-කෙළිඳ

කුකුණ්ඨක–කිහිරි, උඳු, වැල්කස ඕලියා
කුකුණක- ලදරුවන්ට ඇතිවන ඇස්රෝගයකි.
කුකුඳනී–දුදුවැල්
කුකුරුමාන්–මදන

කුකුරුමාන්–මදන
(කුකුරුමුවන්)



කුකුරුමාන්–මදන
Randia Dumetorum

මෙය මකුළු කොළ වලට සමාන කොළ ඇති, කුඩා නිඕරි ගෙඩි වල හැඩහුරුකම්ට සමාන ගෙඩි ඇති, අඩි 40 ක් හෝ 50 ක් පමණ උසට වැවෙන ගසකි. කට හාරවන සුළු කටුක රසයකින් යුත් මේ ගසේ ගෙඩි ලාදුරු වලට හා ස්ලේස්මාධික ඉදිමුම් රෝග වලට ඖෂධ වශයෙන් යොදති. මේ ගෙඩි ආරක්ෂා සහිත හොඳ ම ලය විරේකයක් ද වේ. තද මත් ගතියකින් යුත් මේවා නොයෙක් සතුන් මත් කරවීම සඳහා යොදා ගනිති. ගර්භිණීන්ට ද අහිත කර ය.

කුකුල්පක්–කුකුරුමාන් ගෙඩි
කුකුල්පහර-කුකුල් වසුරු
කුකුල් ලෑමඩියේ ඇට–කුකුලාගේ ඉලපලුවල ඇට
කුකුල් වසුරු–කුකුල් බෙට්
කුකුල–දහඩියා ගිනි
කුකුලල–ජාවාල වගීයෙහි වූ මදක් තික්ත රස ඇති අල වගීයක්
කුකුලු–රලු, කර්කශ
කුකුලුසුන්–කර්කටකශ්‍රිංගි
කුකුළ්ඨා–උඳු
කුකෙලෙ–පොකුණ
කුකොල–ඩෙඩර ගස
කුඛකු–වරා
කුඛකුම- සඳුන් මල්, කොකුම්, කොට්ටම්, උපුල් කොළ
කුඛකුමපපු–කොකුම් මල්, හඳුන් මල්
කුඛකුමම්–කොකුම්
කුඛකුම රේණු–කොකුම් පරාග (රොන්)
කුඛකුමා–ඉඹුල් ගස
කුඛකුමාගරුක–රන්වන් සඳුන්
කුඛකුමී } මහ දුදු වැල
කුඛගනී }
කුඛගිලි–දුම්මල
කුඛගිලිඑන්නෙයි–දුම්මල තෙල්
කුඤ්චිකාඝොසා–කලුදුරු
කුචජ–හෙල පියුම්, (හෙලුපුල්)
කුචඡදු–එඩරු
කුචඡුට–සීනියා ගස

කුව-තනය
කුවණ්ඩි
කුවණ්ඩිකා } මුරුවා වැල
කුවන්දන-රත් සඳුන්, වැල්මදට, පතඟි
කුවන-ත්‍රස්තවාලු
කුවඵල-දෙලුම්, (දුඹිම) දිවුලු ගස
කුවරන-ත්‍රස්තවාලු
කුවිත්‍රක-ගල්කුරා, යාපුර, කුරපලා
කුවිල-දියමිත්ත
කුවිලා- ගොඩකදුරු
කුෂ-ගස, අඟුර
කුෂල-ඇඹුල, ඇඹල
කුෂෝ-කුඩා ගස
කුසුඛඵලා-අලු පුසුල්
කුසුඛයනද-රත්සඳුන්
කුසුම්-කලු දුරු, මහදුරු
කුසුම්කා-මහදුරා, කලුදුරා, සීන් එන්සාල්
කුසුම්ත-මෝරු, තුවරලා මල්
කුසුම්තා-මහදුරා, කලුදුරා, සීන් එන්සාල්
කුෂ්මකා-උළුවහාල්
කුෂ්මප්‍රිය-වදගස
කුෂ්මර-මසිල, රත්ලොන්, පුළිල, ඇසතු
කුෂ්මරකණා-ගජ නිප්පිලි
කුෂ්මරඝණාරමූල-රාබු
කුෂ්මරපිපඵලි-ඇත්වගපුල්, (ගජ නිප්පිලි) සිව්ය
කුෂ්මරා-මලිත ගස, පළොල් ගස
කුෂ්මරාශන-ඇසතු, බෝ ගස
කුෂ්මරාන්වය-කොටදිඹුලා ගස
කුෂ්මරි-මසිල ගස
කුෂ්මරිකා-ඉදුසල් ගස
කුෂ්මරී-මසිල, මහපොණ්ඩරු
කුෂ්ඨල-ඇඹුල ගස, කාඩිදිය, ඕලු
කුෂ්ඨවාලුක-කුරාඳු
කුෂ්ඨජීකා-කලුදුරු
කුච්ච-කොච්චම්
කුච්ඡසාති-කල්ලුකැම්මේරිය,
කුච්මල-මල් කැකුල
කුට-රුක් ගස, මලබඩ ගස, කට රොලු, නිවුල් ගස, කොච්චම්
කුටක-කෙලිඳ ගස
කුටකබේදි-කටුකරෝෂණ
කුටකා-සිහින් මැඩහගු, මස්බැද්ද, (වේලිප්පරිත්ති)
කුටජ-කෙලිඳ
කුටජඵල-කෙලිඳ ඇට
කුටජබීජ-කෙලිඳසාල්
කුටජරසක්‍රියා-කෙලිඳ පොතු
කුටජසුධා-කෙලිඳසුණු
කුටජී-කෙලිඳ
කුටජීකා-කෙලිඳ ඇට
කුටජීව-බුත්සරණ ගස
කුටජෝ-කෙලිඳ
කුටතුම්බි } නිත්තලබු
කුටතුම්බි }
කුටන්-තොවිල
කුටන්නට-කලාදුරු, (වම්මුතු) තොවිල, දසපුර, කොටච්යාමුරු
කුටන්නටා- තොවිල, දසපුර, පාලාඛ්‍ය නම් පලා වෙසෙස
කුටනී-මහදුදු වැල
කුටප-නෙලුම් මල
කුටර-ගස, (වෘක්ෂය)
කුටරවාහිනී-ත්‍රස්නාවාලු
කුටරුණා-ත්‍රස්නාවාලු
කුටල-කොබෝලිල
කුටශ්ච-පුවඟු
කුටසථාන-පිටවක්කා (නවතැබිලිය=බිම් නෙල්ලි)
කුටසිඹලී-කොලහිඹුල්
කුටාමෝද-උරාලෑ සැපිරි

කුමාරු කුඩුමල

කුටාරු-ගස (රුක)
කුටි-ගෙය, ගස, ශරීරය, වතුර, ඉඟුරු
කුටික-කොට්ටම්
කුටිච-එන්සාල්
කුටිඤ්ජර-වල්නම්පලා
කුටිමන්-වෘෂභක (ඔසබිය) (අෂ්ට ක වර්ගයේ ඔසුවක්)
කුටිර-තුවරලා
කුටිල-සුදු ඊයම්, අරණකසා, තුවරලා මල්, කිණිහිරි, ගැට පිච්ච, ඉඟුරු
කුටිලකණ්ටක-කළු කිහිරි
කුටිලසත්තක-සිව්ය ගස
කුටිලා-අරණ කසා (හරන්කහ)
කුටිලාලය-හරංකසා
කුටි-ඵල කෙලිද ගස, නින්පණිස ගස
කුඨ-නිවුල් ගස
කුඩ්ඩ-උපුල් කොළ
කුඨරිණී-සුදුත්‍රාසතවාලු
කුඨාර-රේරු හෝ නියඳ
කුඨික-කොට්ටම්
කුඨිලලක-රතුසාරණ
කුඪේර-තලා ගස
කුඪේරක-වේලා ගස
කුඪේරජ-සුදුතලා ගස
කුඪේරව-අඳුතලා
කුඩ්මල-ඇඹුල
කුඩත්තා-අඳර
කුඩප-නැලියෙන් සතරෙන් කොටස
කුඩමස්පෙති-පනම්පෙනි (රහස් බේත් වට්ටෝරුවක ඔසුවක්)
කුඩලි-කොබෝලිලු
කුඩහුඤ්ඡි-හින් කරිවිල
කුඩා අදිකාරි-ඉඟුරු (රහස්බේත් වට්ටෝරුවක ඔසුවක්)

කුඩා කලුවා-සීතල පොළවේ හට ගන්නා පුරුක් පුරුක් ඇති කලු පාට වැලක්
කුඩාගල්-උපුල්
කුඩා පණිස් කිල - අරන්කසා (රහස් බේත් වට්ටෝරුවක ඔසුවක්)
කුඩාරත්න මුදියන්සේ- ගම්මිරිස් (රහස් බේත් වට්ටෝරුවක ඔසුවක්)
කුඩා සුදනා- සීතල ගුණයෙන් යුත් කඳු උඩ හටගන්නා පොඩි මල් ඇති පැලැටියක්
කුඩා හැඩයා-සන්‍රින්ගේ පැරණි ශ්‍රීවාහරණය (මාලය) ක හැඩ හුරු කමින් යුත් එකට ගෙතී තිබෙන ඝිනින් කෙඳි වැනි කොළ ඇති, දියසීරාව ඇති පෙදෙස් වල දිසෙවෙල් සහිත ගස්වල පැලවී වැවෙන උඩවැඩියා වර්ගයක්. මේවා අග වැල් මල් (බුලත් කරල්) වැනි කුඩා කරල් සෑදේ. හොඳට වැවෙන පැළයක් පවා අඩි දෙකකට වඩා දිග් නොවේ.
කුඩිත්කාරන- නිලුපුල්, (නිල් මානෙල්)
කුඩු මුහුණ
කුඩු ගම් දෙමිරිස් - කුඩුමිරිස් සහ ශම්මිරිස්
කුඩුබ-නැලියෙන් හතරෙන් පංගුව
කුඩුබය-මනා බාගය හෝ පලම් අට
කුඩුමනී-ඔලිඳ වැල
කුඩුමල- මූකල කැකුල (මේරු මල් පොහොට්ටුව)

කුඩුවෙලඟ--කම්පිල්ල

කුඩුවෙලඟ - මපිකල්ලක (කම්ලාකුඩි)

Mallotus Phillippinensis

මේ ගසේ කඳ ගුරු පාට ය. කොළ හැඩ හුරුකමෙන් අට්ටි ක්කා කොළ වලට සමාන ය. දිග අඟල් 7 ක් හා පළල අඟල් 2 ක් පමණ ඇත. කොළ වල යට පැත්ත ගුරු පාට ය. උඩ පැත්ත නීල් පාට ය. කුඩා මසන් ගෙඩි වැනි මේ ගසේ හටගන්නා ගෙඩි වල පොතු කෘමිනාශක ඖෂධයකි දූරක රෝග වලට ප්‍රත්‍යක්ෂ ය. ගෙඩි ඇඟිලි දෙකට ගෙන පොණි කළ විට තද කහපාටකින් යුක්ත තැති. කුරුවිට රතු පාට යි.

කුණට-අක්මැල්ල

කුණටක-රන්වන් කටුකරඹු ගස

කුණ්ටි-අඳුතලා

කුණ්ඩී-රත්හිරියල්

කුණ්ඩන- සුන්සහල් (පොඩි වූ හාල් ඇට)

කුණ්ඩල-රතු පෙතන් ගස

කුණ්ඩගෝලක-කාඩි

කුණ්ඩඵල
කුණ්ඩලඵල } අහු ගස්

කුණ්ඩලතා-රසකිඳ

කුණ්ඩලඵලී-ඉන්සල් ගස, අහුගස

කුණ්ඩලී-අහු, රසකිඳ, සිහින් එන් සාල්, රත්හිරියල්, කොබෝලීල, ඇසල

කුණ්ඩලීනී-රසරකිඳ

කුණ්ඩවලි-අහු, ඉන්සලු

කුණ්ඩුමති-ඔලිඳ

කුණඛ-නියපිරිත්තා

කුණබී-නොවිල

කුණඤ්ජා-වල්තම්පලා

කුණ්ටි-මනෝසිල

කුණ්ඩී-තුනත නම් වෘක්ෂය

කුණ්ඩුම්ල්ල- මැල්ල වර්ගයක්

කුත්තුඹුරු- කොත්තමල්ලි

කුත්සලා- අවරිය ගස

කුත්සිතාඞ්ග- බක්මී, කොළොම්, බකිනි

කුත්සිතශාල්මලී- ඉඹුල්

කුතඤක- රණදුන්

කුතප- කුසතණ

කුතසිත- කොට්ටම්

කුතුම්බ- ගැටතුඹ

කුතුම්බක- ගැටතුඹ

කුතුම්බර- තෑණ, හණ

කුතුම්බරී- කොතඹුරු, (කොත්ත මල්ලි)

කුතුම්බුරු

කුතුම්බුරු- තිඹිරිගෙඩි
කුතෝරුක
කුතෝරුල } අක්මැල්ල
කුථ- කුසතණ, ඊතණ
කුද්දුල
කුද්දුල } කොබෝලීල ගස
කුදුර- කොබෝලීල, ඇසළ
කුදිරවාලි- අස්වැන්න, කිකිරිඳිය
කුදුදල- අන්දර ගස
කුදුම්බක- ගැටතුඹ
කුදුරුක්- වතුක්
කුදෙහක- කෙසෙල්
කුෂ්ඨි- කුද්දුවිය (රොගයක්)
කුන්කුමපට්ටෙයි- කොකුම්පොතු
කුන්වයනදන- රත්සඳුන්
කුන්ජරී- මයිල
කුන්ටි- රත්හිරියල්, මනෝසිල
කුණ්ඩිකේරිකා- කොම්වැල්
කුන්තලවර්ණ- කිකිරිඳිය
කුන්තලිකා
කුන්තල } ඉරිඟුවිරිය
කුන්තලෝශීර- ග්‍රීබේර
කුන්ති- ගුගුල්ගස, ඉඳුසල් ගස
කුන්ද- වැකොඳ, සමන්මල්, කොල්ලු, කුන්දුරුක්කන්, කකුළුසුඟ
කුන්දක- කුඤ්ඤරුක්කන් ගස
කුන්දරු- තුන්පත්කුරුඳු
කුන්දරුෂ්ක- කුඹුරු
කුන්දරිකා- ඉඳුසල්ගස
කුන්දරු- අලරිය, (කනේරු) කළුලුණු, වතුක්
කුන්දල්- මදුවැල්, ඔළිඳ
කුන්දසාහ්වා- බෝලිද්ද
කුන්දු- යොහොඹු,පිච්ච, බෝලිද්ද
කුන්දුල- මහ ඇසළගස
කුන්දුර- තුන්පත් කුරුඳු

කුබ්ජක

කුන්දුරු- තුන්පත්කුරුඳු,ඉඳුසල්, ගුගුල්
කුන්දුරුකී- ඉඳුසල්ගස
කුන්දුරිත්තම්
කුන්ඩුරිත්තම් } කුන්දුරුක්කන්,
කුන්දුරුක්කන්
කුන්ඩු- දුම්මල, කුඤ්ඤරුක්කන් තුන්පත්කුරුඳු
කුන්ඩුග්‍රාහ්ව- කුන්දුරුක්කන්
කුන්ඩුරු- කට්ටකුමන්ජල්
කුන්ඩුරුක- කෙසෙල්, කුඤ්ඤරුක්කන්
කුන්ඩුරුකී- තොටිල, ඉන්සලු
කුන්ඩුමණි- ඔළිඳ
කුනඛි- තොටිල
කුනට- කොබෝලීල
කුනටී- හිරියල්, මනෝසිල
කුනට්ට- බුලත්
කුනප- කුසතණ, ඊතන
කුනලින්- කතුරුමුරුගා
කුනාශක- ඇල්කසඹිලියා
කුනිම්බ- බිම්කොසොඹ
කුනී- කිරිබෝගස, නන්දිරුක
කුප්ත-උක්ගස
කුපප-සතකුප්ප
කුපපකිරෙයි-කුරතම්පලා
කුපපමේනිය- මාර්ජාරමෝහිනී, මූත්‍ර බද්ධයට ප්‍රත්‍යක්ෂ විෂ නාශක පැලැටියකි.
කුපපලකොඩි- පුසුල්වැල, වැල් පුසුල,
කුපනස-කොස් ගස
කුපාක-කදුරු
කුපිළු- සිහින් තිඹිරි, සුළු තිඹිරි, ගොඩකදුරු
කුබ්ජ-මුරුන, කරල්ඇඹ
කුබ්ජක-රක්තසෙව්වන්දි (සුදු රෝස

කුබ්ජකණ්ටක-හෙළ කිහිරි
කුබ්ජපර්ණිකා-මැඩහඳ, මස්ඛැද්ද (වේලිප්පරිත්ති)
කුබ්ජපුෂ්ප-කසාවන් ගිරිතිල්ල
කුබ්‍රිකු-කුඹුක්
කුබුද } කුඹුක්
කුබුදන }
කුබුබු-කරඳ, කුඹුක් ගස
කුබෙර-බුළු ගස, කුඹුරුවැල
කුබෙරක-කුඹුරුවැල, නන්දි වෘක්ෂය
කුබෙරනෙත්‍ර-පළොල් ගස, කුඹුරු වැල
කුබෙරබිජු-කුඹුරු ඇට
කුබේ- කුඹුරුවැල, බුළු ගස, පළොල්
කුබේරාක්ෂි-කුඹුරු වැල
කුබේරාහ්වය-නන්දි වෘක්ෂය
කුම්කුම්ප්පු-හඳුන් මල්
කුම්න-දැන්න
කුම්බිකා-මුද්දරප්පලම් වැල - ලබු වැල
කුම්බිය-දියපරඬලා
කුම්බිලයා-අවුල්දැති (කිඹුලා)
කුම්භ්‍ය-ලබු
කුම්භ-ගුගුල්, ඇත්දෙමට, ද්‍රෝණ 20 ක ඛර ප්‍රමාණය, ජයපාල, කරබෙඹිය, පළොල්, පුස්වැන්න
කුම්භක-අමුක්කරා, මිණිරන්
කුම්භකණී-හරංකහ
කුම්භකර්ණිකා-කොල්ලු
පිටක–සුළු සාරණ
පිටවක්කා–භූධාත්‍රී, (බිම් නෙල්ලි)

පිට සුදු පලා

පිට සුදු පලා – සාරණ



පිට සුදු පලා – ශ්වේත පත්‍ර (පුනර්ණවා)

Boerhaavia Diffusa

සාරණ වගී දෙකකි. හීන් සාරණ, මහ සාරණ වශයෙනි. එයින් හීන් සාරණ හැඩහුරු කමින් ගෙඳ පලා වලට සමාන ය. මහ සාරණ ද දෙ වගීයකි. කොළයේ යට පැත්ත සුදු සහ රතු වශයෙනි. පිට සුදු පලා කියන්නේ එයින් කොළයේ පිට පැත්ත සුදු වගීයට යි. ඖෂධ වශයෙන් ගන්නේ ද ගුණයෙන් වැඩි මේ වගීය යි.

මෙය මූත්‍ර වර්ධනය, ආමාශ ශක්තිය හා අග්නි දීපනය කරයි. පාණ්ඩු රෝග, ජලෝදර, සෙංගමාල, මූත්‍ර කෘච්ඡ්‍රාව හා ශොථ (ඉදිමීම) යන රෝග වලට ප්‍රත්‍යක්ෂ ඖෂධයකි.

පිට සුදු පලා

මේ සාරණ තුන් වගීය ම ලාඩකිකයෝ බෙහෙතක් වශයෙන් පමණක් නොව දෛනික ආහාරයක් වශයෙන් ද ප්‍රයෝජන ගණිති. රෝග නාශක ශක්තියක් ඇති මෙවැනි ඖෂධ දින පතා ආහාර වශයෙන් ගැණීම මනුෂ්‍ය ශරීරයට හිතකර ය.

පිට සුදු කොළ නමින් තවත් වගීයක් තිබේ. එය පිට සුදු පලා (සාරණ) නොවේ.

පිටුකර-පිටිකර, ගලවලුව
පිටෝස්-කොස් ගෙඩියේ මිදුලු හා ඇන කටු අතර ඇති සුදු පාට මස
පිඩවෙ-පිල
පිඩුකය-කලං තුන
පිඩුපල-අඹ
පිඩක-තුරුක් තෙල්
පිඩු-සමූහය
පිණ්ඩ-ලුණුමඩ, යකඩ, කහ, වවි වනාවි, රසකිඳ, නෙරිවිෂ, ඉන් සළු, හිඹුල්
පිණ්ඩක-තලමූරු, පික්මැලි, තුරුක් තෙල්, රන්කිරි ගොකටු
පිණ්ඩඛර්ජූරිකා-යොන් ඉදි
පිණ්ඩඛර්ජූරි-යොන් ඉදි
පිණ්ඩතගර-තුරුක් තෙල්
පිණ්ඩ පණී-කහ
පිණ්ඩ පුෂ්ප-අශෝකා
පිණ්ඩ පුෂ්පක-කුරතම්පලා
පිණ්ඩ ඵල-යොන් ඉදි
පිණ්ඩඵලා-නිත්ත ලබු
පිණ්ඩමූසකා-කලාඳුරා, ඉඟුරු
පිණ්ඩ වණී-කහ
පිණ්ඩ වීජක-කිණිහිරි
පිණ්ඩා-කහ, දිය බෙරලිය

පින්

පිණ්ඩානතක ඵල-කුකුරුඹුවන්
පිණ්ඩාමෘත-රසකිඳ
පිණ්ඩාහිඟු-පෙරුම්කායම් (පිණ්ඩා හිඬගු)
පිණ්ඩිත-මකුල් ගස
පිණ්ඩි පලා-නිත්ත ලබු
පිණ්ඩි පුෂ්ප-හෝපලු
පිණ්ඩි ඵල-නිත්ත ලබු, අඹගස,
පිණ්ඩී-කුකුරුමාන්
පිණ්ඩීත-හෝපලු, තුරුක් තෙල්, ඉකිරි
පිණ්ඩීතක-තුරුක්තෙල්, තුවරලා, කටුකරඹු, කුකුරුමාන්
පිණ්ඩීතක ඵල-කුකුරුමාන්
පිණ්ඩීතගර-තුවරලා
පිණ්ඩීතා-කුකුරුමාන්
පිණ්ඩීපුෂ්ප-හෝපලු ගස
පිණ්ඩී ඵල-අඹගස, නිත්ත ලබු
පිණ්ඩීවෘක්ෂ-හෝපලු ගස
පිණ්‍යා-දූදු
පිණ්‍යාකු- පෙරුම්කායම්, නිකා, තුරුක් තෙල්
පිත්තං-පිත
පිත්තඤ්ති-රසකිඳ
පිත්තඝාති-පැපිලිය
පිත්තද්‍රාවින්-දෙඩම්
පිත්තද්‍රු-බාන්වැල්
පිත්තනාශ-පැපිලිය
පිත්තප්‍රකාශා-කටුකරෝෂණ
පිත්ත ප්‍රනාශනී-පැපිලිය
පිත්තල-ලියනහලා
පිත්තලා-ඇසළ
පිත්තහා-පැපිලිය
පිත්තාරි-පැපිලිය, රන්මානිස්ස, ලාකඩ
පිත්තාප්‍රිය-කීකිරිදිය
පිතුෂ්ට-කීකිරිදිය
පිත්‍රා-ඕපැණි
පින්-පද්මකේශර, (නෙළුම්රේණු)

පින්න

පින්න-තද තික්ත ගතියෙන් යුත් කෘමි රෝග නාශක පැලෑටියකි. මේ වගීයේ මල් පිපුන විට කිතුල් හකුරු සුවඳක් නික් මෙයි. පින්න කොළයක කර බටු (ඉදුන ඵල බටු) ගෙඩියක්, දළුක් පළු කැල්ලක් හා තින්ත අබින් කැල්ලක් ඔතා උනු අළු පල්ලේ ලා තම්බා අඹරා දත මූල තැබීමෙන් දරුණු දත් පණුවන් කැමක් වුව ද මිනිත්තු කිපයක් තුළ දී සුව වෙයි. අත්දුටුවයි.

පින්නාහු-පෙරුම්කායම්, නික, තලමූරුවට

පින්මලලි-සෙව්වන්දි

පිනක-කුකුරුමුවන්

පිනැඹිලිය-වනෞෂධ වර්ගයක් (කඳුලැස්ස)

පිප්ඵල-පළොල්, ඇසටු, තිප්ලිලි, බෙර්, රත්ගොකටු

පිප්ඵලා-ඵලබටු, රත් ගොකටු

පිප්ඵලාඞ්ගුලි-තුන් පුළිල

පිප්ඵලී-වගපුල්, ඇසටු, පුළිලගස, සිවිය, සාතාවාරිය, කිරිපලු, නියඟලා

පිපඵලි පත්‍රක-තුන් පුළිල

පිප්ඵලී ඵලක-තුන් පුළිල

පිප්ඵලී මූල-තිප්පිලි මුල්

පිප්ඵලී සීත-පුළිල

පිප්ඵල්‍යාදි ගණය- තිප්පිලි, රත් නිවුල්, වදකහ, කෙළිද හාල්, ගජතිප්පිලි; තිප්පිලි මුල්, කලා දුරා, සිඞ්ඛුරු, එන්සාල්, අනිවූ ඔයන්, රුහැණිය, සිවිය, මිරිස්, යඳුල්, අඹ, දම් දෙවි සුදු, මුරුවා දුල්, තොවිල, කුකුරු මාන්, කළුදුරා, පෙරුම්කායම්, කුළුරැණ, වලඟසාල් යන මේ ගණය වා, සෙම් නසන්නේ ය.

පිපිඤ්ඤ-කුඩා තියඹරා (තුප්පෂා)

පිම්-සත්‍රීරෝගයක්

පිය-කොළොම්, තුවරලා වැල, මොර ගස, පියාල ගස

පියක-කොළොම්

පියහු-පුවහු, තණහාල්

පියපළු-කිරිපළු

පියඹ-රතිකෙළිය, ප්‍රියාව

පියයුරු යුෂ
පියයුරු රස } තනකිරි

පියල්-මොරගස

පියලි-වැරහැලි

පියවුරු-කලාදුරු

පියා-බක්මී, මොරගස්

පියාල-පියල් හෙවත් මොර

පියුම්-නෙළුම්

පියුම් ගොටු-නෙළුම් ගොටුව, (පද්ම කර්ණිකාව) මල් කැකුල

පියුමාටර-පියුම් ඵල

පිරන්කු-වැටකොළු

පිරන්ඩෙකොඩි-සීරැස්ස

පිරප්පන් කිලංගු-වේමුල්

පිරප්පන් කොඩොල්-වේබඩ

පිරම්-ලුණුවිල

පිරම්-ලුණුවිල

පිරාසදඩි-කිරි නෙවුල්

පිරාසි-ගැටනෙවුල්

පිරිමි පනා-වරකා ගස

පිරිවට-රෙදි, පිළි

පිලල-කුඩුම්රිස්

පිල්ලු-තණකොල

පි

පිල-පුඩ=(ශරපුඩ) කතුරු පිල, කටුපිල යයි වගී දෙකකි. කතුරු පිල උපදංශ ඇතුළු වෘණ රෝග වලට ත්, දන්න රෝග කණ්ඩ රෝග සහිත සෙම් රෝග වලට ත් ප්‍රත්‍යක්ෂ විෂ නාශක ඖෂධයකි. කටු පිල ගැණ විසතරයක් 68 පිටේ ඇත.

පිලකඩ-පුළිල

පිලකා-පොල

පිලාමරම්-කොස් ගස

පිලි-ගෙඩිය

පිලිම්තණ-තෘණ වගීයක්

පිලිමිනි-පුලිහු

පිලිල-ඉටි කෙහෙල්=(උඛවෘඛියා) දියසෙවෙල් හා ගස්වල ඕජාවත් ආහාර කොට ගනිමින් වැඩෙන පැලැටි

පිලිවිලි-බෝගස්

පිලිහුඩු-මස්-මාළු වගී හෝ තම් පලා වගීයක්

පිලිවරි-උග්ගස්

පිලුපර්ණී-මුරුවා වැල

පිලූක-පියාගස්

පිශාව-කොට දිඹුලා, ශාකොට වෘක්ෂය (ගැට නෙටුල් ගස)

පිශාවක-තෝර ගස

පිශාවදෘ-ගැටනෙටුල්

පිශාචි
පිශාචිකා } මස්වැන්න, ජටාමාංශ

පිශිත-පියා ගස, උණ කපුරු, පික්මැලි

පිශුන-කොකුම්, පික්මැලි (පික් මැලි=හින්දි - පිඩිඩ්)

පිෂණපර්ණී-පෘෂණ පර්ණී (පුස් වැන්න)

පිෂ්ට-ඊයම්, සුණුකිරීම (කුඩුකිරීම) පිටි

පිෂ්ට පාෂාණාන්තක-ඩෙබර ගෙඩි

පිෂ්ටි-හිඹුල්

පිෂ්ටික-හාල් පිටි වලින් උපන් කිරි වැනි ද්‍රව්‍යය

පිෂ-සුණුකිරීම

පිසඟ පද්ම-වැල්මදට

පිසඹුරු-දියසෙවෙල්(දියපරඬැල්=පෙඳ)

පිසිත-මාංශය

පිසිනි-ලාටු වගී

පිසිඹ-කොසඹ

පිසුනා-සෙව්වන්දි, කොකුම්

පිහිඹිය-(කිහිඹිය) තද නිල්පාටින් යුත් අඟල් එක හමාරක් පමණ පළල හා අඟල් හතරක් පමණ දිග ඇති කොළ වලින් යුත් සෙවන සඳහා ප්‍රයෝජනයට ගන්නා වදුලු සහිත ගසක්

පිඵල්ලිය-ඉකිරි

පික්කෙසි-නියත් වැටකොළු

පික්තු-වැටකොළු

පිකන්කාසි-වැටකොළු

පිත-හිරියල්, කොකුම්, වනුවැල්, (බාන් වැල්) මුං, කසා, රන්වන් සඳුන්, මහ වැටකොලු, කීන දෙඹ

පිතක-කටුකරඹු, මැසිඳු, පද්මකාෂ්ඨ, වනු වැල්, තොටිල, බිම් කොසඹ, කොකුම්, රත් හාල්, මුහුණමල්, නෙළ වලා වැන්න, හිරියල්

පිතකදලි-කොසෙල් (රන්වන් කෙහෙල්)

පිතකන්දුල

පිතකන්දුල-වම්බටු
පිතකන්ද-කැරැට්
පිත කරොහිණි-කටුකරඹ, පිත කරෝහණ
පිතකා-පිතකරෝහණ
පිතකාවේර-කොකුම්, පිත්තල
පිතකාෂට-රන්වන් අගිල්, රන්වන් සඳුන්
පිතකේශ-නාමල් රේණු
පිතවන්දන-රන්වන් සඳුන්, වනු වැල්
පිතස්ත්-දුරුහරිද්‍රා
පිත තණ්ඩුල- කිරිපලු, මෙනේරි
පිතතෙලා-දුහුදු, කටුවෙලඟ
පිතදර්පාතින-බාන්වැල්
පිතදුරු-හොර අරටු, දේවදුර, කහ ගස
පිතදෘම- වනුවැල්, හොර අරටු, දේවදුර, පිච්ච, යොහොඹු
පිතන-ඇම්බරැල්ල, කසා, හිරියල්, පළොල්, කොකුම්, වනු වැල්
පිතනක-ඇම්බරැල්ල
පිතනා-කඩල
පිතනි-අස්වැන්න
පිතපුෂ්ප- වල් අබ, අස්බැවිල, රන්කිරි ගොකටු, අඩනහිරියා, මඟුල්කරඳ, කිහිරි, මහ බැවිල, වැටකොලු, කුඹුරුවැල්, කැකිරි, මස්බැද්ද
පිතපුෂ්පක-මුහුණමල්, තුවර, මහ බැවිල, රටතෝර
පිතපුෂ්පා-රම්මානිස්ස, වැල් තුඹ, කැකිරි, රන්කිරි ගොකටු
පිතපුෂ්පි-අස්බැවිල, යක්ඛේරිය, වේලිප්පරිත්ති
පිතපුෂ්පිකා-පුසුල්, මහ බැවිල, කොමඩු

පිතාඹග

පිත ඵල-ගැට නෙවුල්, කාමරඹගා
පිතඵලා-බෙලි, හෙළබටු, ඇද්දෙමට, කාමරංගා
පිතඵේණ-කොසඹ
පිතජාත- දැසමන්, රන්වන් සමන්පිච්ච
පිතදෘ-බාන්වැල්
පිතබන්ධන-දුරුහරිද්‍රා
පිත බර්බරිකා-වේලා
පිතමධ්‍ය-සිහින් දුරු, (සුදු දුරු)
පිත මාකීව- කිකිරිදිය, රන්වන් කිකිරිදිය
පිත මූලා-උරුලු සැපිටි, මැණික් වැන්න, පොල්පලා
පිතයුක්ති-රන්වන් ඉද්ද, බෝලිද්ද
පිත රත්න-ගෝමේද
පිතරාග-මී ඉටි, තෙළුම් රේණු, (නා කෙසර)
පිතකරෝහණ- හොර ගස, ඇද්දෙමට
පිතරොචනෙ-පිතරෝහිණි, රන්වන් කටුකරෝහණ
පිතරෝහිණි-කහ කටුකරඹු
පිතලා-පිත්තල
පිතලෝහ-පිත්තල
පිතවණ්-කසා (කහ)
පිතවීජා-උළුවා
පිතවෘක්ෂ-තොටිල, තෝර
පිතශාර-රත්හඳුන්, අහුගස, වනු වැල්, වැල්මදට, රැකහුන, ගල් පියල්, ගෝමේද
පිතශාල- පියල් ගස, පියා ගස, ගම්මාලු ගස
පිතසාරක-අහුගස, පියා ගස, කොසඹ
පිතා-කසා, දුහුදු, දුරුහරිද්‍රා, පිත කරොහණ
පිතාඹග-තොටිල හෙදයක්

පිතාජාත-දැසමන්, රන්වන් සමන්පිච්ච
පිතාදෑ-බාන්වැල්
පිතාඛණ්ඩන-දුරුහරිද්‍රා
පිතිකා- රන්වන් බෝලිද්ද, කසා, දුරුහරිද්‍රා
පිතිනී-ශාලිපර්ණි
පිතෙරි-මිදිච්ච කිරි
පින්ජල්-සිනින් මිදි
පිනක-තොටිල
පිනනෙල-කලුකැම්මේරිය
පිනපාදප-තොටිල
පිනස-එනම් රෝගය, ඩෙබර
පිනාසෝ-නාසිකා රෝගය
පියූෂ-අමාව, කිරි
පිරණෙඩ-සිරුස්ස
පිලි-කටුපිල
පිලිනී-මැඩහතු (වේලිප්පරිත්ති) මස්බැද්ද
පිලු-කොරාසානි, ඉඟිනි,වැලහුණ, වනෙහි වූ මොර, පියා ගස,
පිලුක-මොර
පිලුකි-මුරුවා, මස්බැද්ද, නියඳ, කෝවක්කා
පිලුණි-මුරුවා වැල්
පිලුපත්‍ර-මුරුවාදුල්, කටුපිල
පිලුපර්ණි-කෝ ව ක් කා, කවුඩු කෝවක්කා,වැඩහතු, මස්බැද්ද, නියඳ, මුරුවා කොළ. කැකිරි, උඩැත්ත
පිලුපුෂ්පි-මුරුවාදුල්
පිලුවණි-කෝවක්කා
පීවර-මේවන්, සානාවාරිය, අමුක් කරා, ශාලිපර්ණි

පිවරී—යක් කපු

පිවරී

Abroma Augusta

මෙය ඉන්දියාව ජන්මභූමි කොට ඇති **රක්කැන්ද** කොළ වලට සමාන කොළ වලින් යුත්, මුල් සහ ඇට පැළවීමෙන් විශාල ලෙස බෝවී යන, අඩි පහළොහක් පමණ උසට වැවෙන පඳුරු වගී යකි

අපේ රටේ බුලත් වැල් වල කද (නොපිදුන) බුලත් වල හා කිනිති (පිදුන) බුලත් වල ඇති වෙහස මෙන් ම මේ වගීයේ ද නො පිදුන අතු වල සහ පිදුන අතු වල කොළ අතරෙහි විශාල වෙනසක් දක්නට නිබේ.

නො පිදුන අතු වල කොළ රක්කැන්ද කොළ මෙන් විශාල ය. හැඩහුරුකමින් ද එ සේම

පු

ය. පිදුන කොළ කුඩා ය. පෙනු මෙන් හා ප්‍රමාණයෙන් පිදුන බුලත් කොළ වලට සමාන ය.

මේ ගසේ මල් කපු මල් වැනි ය කුඩා රිකිලි දිගේ පෙළට සැදෙන මේ මල් වලින් හට ගන්නා ඇට කොපු (ගෙඩි) පැසුනවිට විවෘතවී කපුකිනිස්ස ඇට ප්‍රමාණ කළු පාට ඇට වලින් පිරී තිබෙයි.

මේ ගසේ මුල් වල සාරය අනියම් මාස් ශුද්ධියෙහි දී ඇති වන වේදනාව මගහරවා මසකට වරක් බැගින් සවාභාවික මාස් ශුද්ධිය ඇති කිරීමට ත්, මාස් ශුද්ධියට පෙර අධික ලෙස ලේ රැස්වී මෙන් සහ ලේ නහර ගත වීමෙන් හි සෙහි සහ මධ්‍ය ප්‍රදේශයෙහි ත්, ඇති වන වේදනාවන් දුරු කිරීමට ත් ප්‍රත්‍යක්ෂ ඖෂධයකි.

මේ ගස් එගීය ලක්දිව හැම ප්‍රදේශයක ම හොඳින් වැවිය හැකි බව පෙනේ. එම නිසා බෝ කර ගැණීමට උවමනා අයට අප වවා තිබෙන ගස් වලින් ඇට ලබා ගත හැක.

පිවරු–සාතාවාරිය
පිවරෝසදූසස්ඛඩා–කවෙලු, කිරි කවෙලු

———

පුංකු–කරඳ
පුංග–කරඳ
පුංගල–වට්ටක්කා වැල
පුංසවන–කිරි
පුඟ–දෙඹ ගස
පුඩකුමරම්–කරඳගස
පුඩක–පිල
පුඩකිකා–පිල, හෙළපිල
පුඩග–මහුල්කරඳ
පුඩගව–ඍෂභක, වංඇපල
පුවඡිකා–මස්වැන්න
පුවඡාලි–ඇත්අඹ
පුවඡි–එරඬු
පුවඡිකා–මස්වැන්න
පුවඡින්–එළවරා
පුවිමඳ–කොසඹ
පූට–සාදික්කා
පුටකොඡ–සුදුලුහුනු
පුටජෝඡ–පොල්
පුටදීම–යම්කිසි ඖෂධයක් සුඹ කිරීම පිළිස්සීම හෝ ගිනියම් කිරීම සඳහා වරින්වර නියම කරණලද පිළිවෙළකට පිළිස්සීම
පුටපාක–ලොකු භාජනයක හෝ වළඳක දහයියා පුරවා මැදට ගොම වැරටි දමා ගිණි දල්වා ඒ තුළ තබන ලද කට වසා මැටි බැඳි බෙහෙත් බදුන.
පුටයන්(ක)–(ගොටුවක්)බෙහෙත් ඔතා උණු අළු පල්ලේ දමා තැම්බීම.
පුටස්–කිනිබුරාද
පුටී–එන්සාල්

පුතෝදක-පොල්
පුඩාල්-මී මන්තන් වැල
පුණ්ඩර-හෙළ උක් දඬු
පුණ්ඩරී-මහ සාරණ, සුදු උක්
පුණ්ඩරීක-හෙළ පියුම්, ඇටඹ
පුණ්ඩරීකා- හෙළ නෙළුම් මල්, කුකුරුමුවන්, අඹ, ඇටඹ, පොණ්ඩරු
පුණ්ඩරීය-පොණ්ඩරු
පුණ්ඩරීයී-පොණ්ඩරු
පුණ්ඩාහ්ව-පොණ්ඩරු
පුණ්ඩ්‍රක- යොනොඹු, ගැටපිච්ච, පොණ්ඩරු, බෝලිද්ද, මදටිය, මිරා, කොසඹ, සුදු නෙළුම්
පුණ්‍ය-මසන්
පුණණකකී-ගල්කුර
පුණණා-ඇත්තෝර
පුණණාග-දෙඹ, සාදික්කා, හෙළ එපුල්,
පුණෙණාමරම්-දෙඹ ගස
පුණ්මුරුන්කෙ-වැල් මුරුංගා
පුණකාවිවෝරි-වඳුරු මෑ
පුණ්‍යගන්ධ-සපු
පුණෙන්නව-සාරණ
පුණමරම්-අහු ගස්
පුණරන්-දෙඹ
පුණෙක්කාලි-වඳුරු මෑ
පුත්නම්පලම්-අස්මී අල
පුතන-අරළු
පුතිකා-රත් නිවිති
පුත්‍ර-ලැටිය, බුත්සරණ
පුත්‍රජීජී-හණ
පුත්‍රජාති-වවුලැටිය
පුත්‍රජානනී-රසතැල්ල, ලප්තැල්ල
පුත්‍රජාරි-යක්බේරිය, භූමිනාද
පුත්‍රජීව- බුත්සරණ, රත්කතුරු, ලකවැලිය
පුත්‍රජීව ඇට-ලකවැලිය ඇට
පුත්‍රදරු-රසතැල්ල
පුත්‍රප්‍රජනනී-තුන්දුර වැල්
පුත්‍රී-බිම්නෙල්ලි
පුත්‍රෝසන-පිළ, හෙළ පිළ
පුදතම්පලා කොළ-තම්පලා වර්ගයක්
පුදුහලමල්- පූජා කිරීමෙන් පසු අස්කළ මල්
පුන්නාට-තෝර
පුන්නාග-සාදික්කා, දෙඹ, හෙළ එපුල්
පුන්නාට්‍යනාම-දෙඹ කින
පුණ්‍යගන්ධ-සපු
පුණ්‍යනාණ- ඊතණ, කුසතණ, හෙළ ඊතණ
පුණ්‍යලතා-රටලබු, වට්ටක්කා
පුනග-දෙඹ ගස
පුනට්‍ය-මසන්
පුනදෙඹ-කොට්ටම්
පුනනග-දිඹුල්
පුනබෝ-දෙළුම් ගස
පුනණීහව-රත්ගෙඳ, රත්සාරණ
පුනණීවා-සාරණ, මහ සාරණ,සුළු සාරණ, පිටසුදුපලා
පුනාගකිරෙයි-සුළුනයි
පුනාවු-හකුරු
පුනී-සිහින්අරත්ත, කුඩාකළුවා
පුනුගු-උරුලැසැපිටි
පුනුගුසවිටන්-උරුලැසවිටන්
පුප්-මල
පුප්පි-මගිල
පුප්මී-මිපැණි

පුපුල

පුපුල—පුපුල ගස්

පුපුල

පුපුල ගස් සම දේශගුණය ඇති ප්‍රදේශවල වැවෙන පඳුරු වර්ගයකි. මේ ගස් වල මල් හා කොළ **වැරණිය** මල් සහ කොළ වලට සමාන ය. එනෙත් මේ කොළ වැරණියා කොළ තරම් ණ සණ නැත. ප්‍රාණවත් බව ද අඩු සි.

පුපුල කොළ සහ පොතු හන්දි වෙදකමේ ප්‍රධාන ඖෂධ යකි. දේශීය වෙදකමේ නොයෙක් තෙල් වර්ග වලට මේ පොතු සහ කොළ වල යුෂ අවශ්‍ය වේ.

පුබෙබා–සැරව
පුමත්තම්–අත්තන ගස
පුමත්තේ–අත්තන
පුර්තබිජු–වළඟසාල්, බෝදිඇට

පුලියාරෙ

පුර–හෙළ එරඹු, අරත්ත, (රැත්ත), ගුගුල්, කුන්දුරුක්කන්, ලප්නාරම්
පුරකංජය–සුදු දුරු
පුරකෘකෝ–අඹ
පුරපල්–ලප්නාරම්
පුරා–ඉන්සළු
පුරාලකන්–කුකුරුමුවන්
පුරිසම්–රත්කැල, කැල
පුරු–එළ එරඹු,(නවගිලිය)
පුරුෂ–දෙඹ, ගුගුල්
පුරුෂදනන්තිකා–මහමෙවන්
පුරුෂප්‍රකාණ්ඩ–කසිස්, (කාසිස)
පුරුෂම්–ගස්කැලිය
පුරුෂාග්වධ–දෙඹ, මහ දෙඹ
පුරුහත–කොළිඳ
පුරෙකකණ්ඩ්වෝඩි–වැල්කස ඹිලියා
පුරෙසඃ–එරමණ්ණියා
පුරෝඩාස–මුවකිරිය
පුල්–පුබුදුවීම
පුල්කීරෙසි–දියබෙරලිය
පුල්කොළ–සෙන්කොට්ටම්, උපුල් කොළ
පුල්ලෙකනතලෙසි–කෝමාරිකා
පුලනනි–කලිල්
පුලන්දිය–කටුපිල
පුලයාරි–පොල්කුඩුපලා
පුලෂ්වි–ගෙඳ
පුලි–සියඹලා
පුලිතුඩක්කි–එළ එඩරු
පුලියම්–සිනිඹලා, සියඹලා
පුලියමරම්– සිනිඹලා, (සියඹලා ගස
පුලියාරෙ–ඇඹුල් ඇඹිලිය

පුලිල–පළොල්

පුළු–ඉබලපෙති

පුළුප්රා–පොල්රා

පුළුපු–පොල්

පුවක්–පුවක් ගස, (පූග)

පුවක්ඇටියා–තු වා ල ව ලට සහ බුලත්විට කැමට පුවක් වෙනුවට පොතු ගන්නා කසට ගතියෙන් යුත් අඩි දහයක් පමණ උසට වැවෙන පඳුරු වර්ගයක්

පුවකු–පුවක් ගස

පුවගය–පුවක් ගස

පුවටා–පුවටන්, පෝටාවැල්

පුවතු–පුවක් ගස

පුවාලු–පුවාලෙ–ව්‍යංජනය පිණිස ගන්නා ලොකු කෙසෙල් ගෙඩි වර්ගයක්, ඇතැම් පළාත්වල කෝලිකුට්ටු කෙසෙල් වලට ද පුවාලු යයි කියති.

පුවහු—පුවහු ගස්

පුවහු—ප්‍රියඞ්ගු

Aglaia Roxburghiana

පුවහු-සුවඳ පුවහු යයි වගී දෙකකි. දිග-පළල අඟල් $4 \times 1\frac{1}{2}$ කට වැඩි නොවූ එක ඉත්තේ කොළ හතර-පහ බැගින් ඇති, කහ පාට කුඩා මල් පොකුරු හා ඒවායින් සපදිල්ලා මල් කැකුළු පමණ ගෙඩි පොකුරු සෑදෙන ගස් වර්ගයකි පුවහු.

සුවඳ පුවහු දිග-පළල අඟල් $1\frac{1}{4} \times \frac{3}{4}$ කට වඩා විශාල නොවූ කොළ ඇති මිහිරි සුවඳකින් යුත් කහ පාටින් යුත් පුවහු වලට වඩා කුඩා මල් පොකුරු හටගන්නා වර්ගයකි. පුවහු ඉන්දියාවේ හා ලඞ්කාවේ වනගතව වැවෙන වර්ගයකි. සුවඳ පුවහු ඉන්දියාවෙන් ගෙනැවිත් මෑතකදී බෝ කරණ ලද්දකි.

පුවහු – රෑක්

පුවහු ගෙඩි වෙනුවට ලඞ්කාවේ පාවිච්චි කරන්නේ රෑක් මල් (ගෙඩි) ය. රෑක් ගස වනාහි දිග-පළල අඟල් $10 \times 3\frac{1}{2}$ කට වැඩි නො වූ කොළ ඇති, වැලි අනෝද ගෙඩියක පිටපැත්ත මෙන් ගැට සහිත, ලොකු කඩල ඇට ප්‍රමාණ මල් සෑදෙන ගසකි. අතුවල හා කඳෙහිත් නටුවල සෑදෙන ඉම් මල් පොකුරු අමුවෙන් (පිපෙන්ට පළමු ව)

පුවහු පුවහු

නිල්පාට ය. පැසුන (මේරූ) විට රන්වන් පාට ය. පිපුනාවූ මේ මල් වලින් ද සුවඳ පුවහු මල් වලට සමාන සුවඳක් නික් මෙයි. රුක් ගස් වල ගෙඩි හටගන්නේ මේ මල් පොකුරු වලින් නොවේ. අතු දිගට වෙන වෙන ම ය.

පුවහු-රුක් දෙවර්ගය ම මෙම දිවයිනෙහි තිබියදී පුවහු ගෙඩි වෙනුවට රුක් මල් ගැණීම අනාදිමත් කාලයක සිට අපේ දේශීය වෛද්‍යවරයන් විසින් කරගෙන එන ක්‍රියාවකි. මෙය නො දැනීමක්-නුගත් කමක් නෝ වැරදීමක් නිසා සිදුවූවකැයි ඉවත දැම්මට පෙර මදක් විමසා බැලිය යුතුව තිබේ. රාවණ සමයේ සිට සිංහල රාජ්‍යයේ අවසානය දක්වා උගත්කමින් හා කෘතඥතා භාවයෙන් ද අනූන වූ වෛද්‍ය පරම්පරාවලින් මේ ලක්දිව හිස් නොවූ බව ඓතිහාසික සිදුවීම් අනුව නිගමනයකට බැසීමට ඉඩ ඇති හෙයිනි.

පුවහු-සුවඳ පුවහු දෙවගයෙන් සුවඳ පුවහු ගුණයෙන් අධික බව ප්‍රකට කරුණකි. සුවඳ පුවහු මල් (ගෙඩි) හා රුක්මල් (ගෙඩි වැනි මල්) ද වණී යෙනුත් සුවඳිනුත් එක සමාන ය. එකල සුවඳ පුවහු ඉන්දියාවේ මිස ලඞකාවේ තිබුණේ නැත. එය මැනකදී මෙහි බෝකරණ ලද්දකි. එම නිසා සුවඳ පුවහු සපයා ගන්නට නො හැකිවූ විට ඊට ප්‍රතිනිධි වශ යෙන් පුවහු ගෙඩි වලට වඩා රුක්මල් ගැණීම සුදුසු යයි කරණ ලද පරීක්ෂණ අනුව සම්මත කරගන්ට ඇතැයි සිතුවොත් වැරදිද?

දුරාලභා – දුරැහරිද්‍රා – රක්ත වන්දන ආදි විදෙශික ඖෂධ වෙනු වට ප්‍රතිනිධි වශයෙන් ගැණීමට ඉන්දියානු වෛද්‍යවරයන් විසින් කරණ ලද නියමයන්ට වෙනස් ඖෂධ වර්ග මේ රටේ පාවිච්චි කිරීම ද මෙයට ශාක්ෂියකි.

පුවහු වෙනුවට රුක්මල් ගැණීම හරි හෝ වැරදි යයි සවිරලෙස ම සම්මත කළ හැක්කේ පුවහු – සුවඳ පුවහු හා රුක්මල් පිළිබඳ විද්‍යානු කූල පරීක්ෂණයක් කිරීමෙන් පසුව මිස එක එක්කෙනා ලියා තිබෙන අනන් මනන් වලින් නොවේ.

පුවොදනී–කටුවැල් බටු
පුෂ්කර–පුස්කර, නෙළුම්, කොට්ටම්
පුෂ්කල–මිටට ගන්නා ප්‍රමාණ හැට හතරක්, උරුලැවා
පුෂ්ටිඊශ්වරා–අමුක්කරා
පුෂ්ටිද–අමුක්කරා
පුෂ්පපුණ්ඩරී–සුදු උක් ගස
පුෂ්ප බැවිල–ත්‍රිවේර
පුෂ්පමඤ්ජරී–කොට්ටම්, අබ, මැලියම්
පුෂ්පරාහ්වය–අමුකපුරා
පුෂ්පරෝචන–නාමල් රේණු,
පුෂ්පරෝහ–ලියනහලා
පුෂ්පලතා–කොමඩු වැල, පත්තක්කා වැල, පුසුල් වැල
පුෂ්පලා–දුරියන් (ජුලියන් ගස).
පුෂ්පවාන්–මුරුත ගස
පුෂ්පවෘක්ෂ–පියල්
පුෂ්පශෘඞ්ගරා – ලියනහලා, මේ වායේ අල දුඃ ප්‍රසවයේදී පතුල් වල ගැමට භාවිත කෙරෙයි.
පුෂ්පසන්ධු–මී පැණි
පුෂ්පසාර–මී පැණි
පුෂ්පසූත්‍ය–දිඹුල්
පුෂ්පාඤ්ජන–මල් අඳුන්
පුෂ්පාමල–සියඹලා
පුෂ්පාහ්වා–ශතපුෂ්ප
පුෂ්පිකා–මස්වැන්න, යක්ඛේරිය,
පුෂ්බට්ට–පුස්වැලේ ඇටයට ඇතැමෙක් මෙසේ කියති. මේ ඇට මද ග්‍රන්ථි ශොථවලට ගනු ලැබේ
පුෂ්පෙර්වන–නාමල් රේණු,
පුෂ්‍යලතා–පුසුල්වැල

පුස්විල–ව ස තැ ල් ල, දියමින්ප කොෂ්ඨවලට සමාන කොළ ඇත මේ වැල් වර්ගය කටු ඇතුනාම කහ – දුඹු ලා කොටා මලව බඳිනු. සුව වේ.
පුස්නා–පුස්ඇට, නා ඇට
පුස්පකාමලඃ–කොසඹ
පුස්පන්–මහ සාරණ
පුස්පන්ඩය–වසාවාසි
පුස්පරු–අත්තන
පුස්පසේකර–මී පැණි
පුස්පා–රුක්මල
පුස්පි–එරබදු
පුස්පිකණ්ටකාලි–ඉඹුල් මැලියම්
පුස්වැන්න – පෘෂ්ණිපර්ණී = ත්‍රිපර්ණී = ක්‍රොෂ්ටුවිත්‍යා, නරිවලිගයක් වැනි මලක් සැදෙන, එක නැට්ටේ දිගටි හැඩයෙන් යුත් කොළ තුනක් බැගින් ඇති පැලැටියකි. පෘෂ්ණිපර්ණිවල හැඩහුරුකම මෙසේ සවිස්තාරව දක්වා තිබියදීත් සරසවති නිඝණ්ඩුව ඇතුළු බොහෝ පොත් වල වගී දෙකක් ව ශ යෙන් වෙන් වෙන්ව විස්තරකර තිබියදීත් මේ වර්ගයට සමාන කිසිම ලක්ෂණයක් නැති පොල්පලා, පුස්වැන්න (පෘෂ්ණිපර්ණී) වෙනුවට ගැණීම තේරුම් ගත නො හැකි ප්‍රකට කරුණකි. එසේම පුස්වැන්න පැලැටි මේ රටේ සුලභව තිබේ. පෘෂ්ණිපර්ණී උණ- අතීසාර රෝග නසන ඖෂධයකි.

පූ

පුස්වැල්-අවුරුදු සිය ගණනක් වුව ද නොමැරී පවතින ඉතා විශාල ලෙස වැවෙන මේ වැල් වර්ගය දේශීය වෛද්‍යකමේ ශ්‍රේෂ්ඨ ඖෂධයකි. පුස්වැල් ඉස්ම හැම සපී විෂකට ම නශ්‍ය, පිට ගැම හා පෙවීම පිණිස ත්, ඇට ඇස් බේත් හා වෙනත් දේශීය ඖෂධ වගී පිළියෙළ කිරීම පිණිස ත් ගණිති.

පුස්ඇට මද ගෙන දෙපැයක් හොඳින් තම්බා එක් රැයක් ගලා යන දියපාරක (පිල්ලක නම් වඩා හොඳයි) හල් තිත්ත අරින ක්‍රමය ට දියේ බැඳ තබා උදේට ගෙන මිඤ්ඤක්කා හෝ බතල සහ එකට මිශ්‍ර කර නැවත තම්බා පොල් සහ කට්ට සම්බෝල සමග අනුභව කළ හැකි රසවත් ආහාර යකි.

පුස්සමන්-කොට්ටන්
පුස්සරාජකුමාරයා-කොල්ලම් ගස
පුසිඹ-කොසඹ
පුසුල්-පුහුල්, පුහුල් වගී කිපයකි. මේවායින් අලු පුසුල් වැඩි වශයෙන් ඔසු පිණිස ගණිති.
පුහුඩා-පුඩාවා, කුඩැල්ලා

පූ-මල්
පූඅරඹමරම්-ගම්සූරිය
පූකමාලක-කොසඹ
පූකිරි-අප්පල්ලය=(පූකිරිය)
පූකුඩු-ඒ කුඩු
පූකුරුව-දිය බොන කොතලය, කැම කන විට භාජනය තබා ගන්නා අඩිය (උප පාත්‍රය)
පූගතුංග-දෙඹ ගස
පූගපලම්-පැන්තුරු, (ලපටි පුවක් =ගොලු පුවක් ගෙඩි)
පූගොං-පුවක්
පූජ්‍යක-මස්බැද්ද
පූඩාවැල්-මීමන්තන් වැල
පූතකුසි-හෙළ ඊතණ
පූතගඤ්ඤ-ගෙන්දගම්, තලා
පූතනා-ජටාමාංශ, අරළු
පූතනාද-ඒ
පූතඵල-කොස්, බෙලි, සිරිවැඩි බැව්ල
පූතබර්බරිකා-වේලා
පූති-වේලා, සිරිල, කුණු කරඳ
පූතික-කුණුකරඳ, සිරිල
පූතිකටු-සරල
පූතිකඨං-සරල
පූති කරඤ්ජ-සිරිල
පූතිකව-උරුලු සැපිටි
පූතිකා- සිරිල (කුණු කරඳ), තොට්ල
පූතිකාරස-සිරිල
පූතිකාෂ්ඨ-දේවදූර, හොර
පූතිකීටා-රම්මානිස්ස
පූතිගඤ්ඤ-ගෙන්දගම්, යෙහෙන් තුඹ, කිරි අහුණ
පූතිගන්ධා-ගෙන්දගම්, යොන්තුඹ
පූතිකෝ-කටුකරඳ
පූතිතෙල-දුහුදු (දූදු)
පූතිදණ්-දළුප්, ඉළුප්
පූතිදූරු-දේවදූර
පූතිනාග-තොට්ල
පූතිපත්‍ර-තොට්ල
පූතිපර්ණි-සිරිල, කුණු කරඳ, තොට්ල, වැලහුණ, බෝධි ඇට
පූති පුෂ්පිකා-දෙඩම්

පෘ

පූතිඵල-බෝඩි ඇට
පූතිඵලි-බෝඩි ඇට
පූතිබර්බරිකා-වේලා
පූතිබීජු-බෝඩි ඇට, නෝ වලඟ සාල්
පූති මසූරිකා-අසමෝදා
පූතිමායුර-වේලා
පූතිමාරුත-බෙලි
පූතිමේද-හිඹුරු
පූතිලතා-කිඳි, (රසකිඳ වැල)
පූතිවර්චරී-රම්මානිස්ස
පූතිවල්ලි-බෝඩි ඇට
පූතිවාත-බෙලි
පූතිවෘක්ෂ-තොටිල
පූතිවේද-හිඹුරු
පූතිසම්භව-සිරිල
පූත්‍යාහ්ව-සිරිල
පූතෛවතංගි-කුප්පමේනිය
පූපලික-පූ-(කැවුම්)
පූපලිකා-පූ-(කැවුම්)
පූමත්තෙයි-අත්තන
පූමනඳ-අත්තන
පූයාරි-කොසඹ
පූයෝ-සැරව
පූණීඝොටක-කොට්ටම්
පූණීකොෂ්ඨා-කලාඳුරා, ඉහුරු
පූණීපර්ණී-පුස්වැන්න
පූණීඵලා-කටුවෙළඟ
පූණීබීජ-දෙළුම්
පූණී-අරළු
පූජීපුෂ්පිකා-දැත්ත, මහ දැත්ත
පූජීම්පලම්-ගස්පෙනෙල
පූරක-ලප්නාරම්
පූරණ-හිඹුල්, (ඉඹුල්)
පූරෙයිඃ-එරමිණිය
පූලා-ජමනාරං

පූලි-සියඹලා, වසාවාසි
පූලියං-සියඹලා
පූව-පූප, (කැවිලි වර්ග)
පූෂ-බැමිනිරිය, ඇසතු, බෝගස
පූසනි-පුසුල්, වට්ටක්කා
පූසනික්කායි-පුසුල්
පූසාරි-කොසඹ
පූහල-වට්ටක්කා වැල

පෘථ්වී-මහදුරා, පත්‍රාඟිංගු, එන්සාල්, පැපිලිය, අසමෝදා
පෘථ්වීක-රත්නිවුල්
පෘථ්වීකාලා-කළුදුරා, එන්සාල්
පෘථ්වීකුරවක-හෙළ එරඹු
පෘථක්-මදටිය, මහරි
පෘථක්පර්ණ-මූරුවාවැල
පෘථක්පාර්ථා-මස්බැද්ද,
පෘථක්පර්ණී- පුස්වන්න, ආපසු මිදී, මකුළුවැන්න
පෘථක්වීජ-බදුල්ල ඇට
පෘථිවී-මහ එන්සාල්
පෘථිවීක-එන්සාල්
පෘථිවීජ-එරබදු
පෘථ්‍යජ-කුඹුක් ගස
පෘථු-කලාඳුරා, කුඹුක්, පත්‍රාඟිංගු
පෘථුක-පත්‍රාඟිංගු
පෘථුකෝල-මහ මසන්
පෘථුනාමා-අරළු
පෘථුපත්‍ර-රතු ලුහුනු
පෘථුල-මහ පත්‍රාභිඛු
පෘථුවල්ලි-මූරුවා වැල්
පෘථුවාතීකි-වම්බටු, ඇත්බටු
පෘථුවිකා-එන්සාල්
පෘථුවීජ-රත්කැල
පෘථු වීජක-තොටිල
පෘථුවිපනි-සෘෂභක

පෙ

පෘථුවීභව-උද්භිද ලුණු
පෘථුශෘඞ්ගි-එරබදු, මදටිය, මහරි
පෘදාකු-රත්නිවුල්
පෘෂ්ඨා-ඉද්ද
පෘෂ්ණපර්ණී-පුස්වැන්න

පෙකඩක-පැල, (ලාස් 10)
පෙට්ටිය-මලබටු
පෙටි-ලේල් වර්ගයට අයත් අඟල් 12 කට නොදික්වූ මත්ස්‍යයෙක් (සඵර)
පෙණෙල- ගස් පෙණෙල, වැල් පෙණෙල යයි පෙණෙල වර්ග දෙකකි, විසතර 163 පිට බලන්න.
පෙතත්-ඵාල්ගු=පෙතඟ-කරපිංචා සුවඳින්යුත් කොබෝලීල කොළ වලට සමාන කොළ ඇති ගසකි
පෙතලාලු-ලාලු(කැම)වර්ගයක්.
පෙති-කොළ, පෙත්ත
පෙතිතෝර-කැමට ගන්නා තෝර වර්ගයක්. මේ වා යේ කොළ වා තා බා ධ හා කෘ මි රෝග සඳහා මලවා කැමට ත්, කොළ යුෂ ඉදිමුම් බැස්සවීමට හා සම් මතුපිට ගෑමට ත් ගණිති.
පෙතිපියුම්- එක්පෙති පියුම්, (මී නඹර)
පෙද- පාසි, (ජලශෛවාල= දිය සෙවෙල්)
පෙනැඹිලිය-පිනැඹිලිය
පෙනෙල- පිහිල්ල, පෙනෙල ගස් හෝ වැල්
පෙප්පුට-කැප්පෙට්ටියා
පෙයන්ති-කොටදිඹුලා
පෙසිලන්ත-ඩෙඛර
පෙර-සස්සඳ වැල
පෙරමට්ටි-එළ බැවිල, ජම්බරඃ
පෙරමරුනුකොඩි-සස්සඳ වැල්
පෙරමලි-අස්වැන්න, උදුපියලි
පෙරවහරේදිය-පෙරෝදිය=කොළ රොඩ්ඩු, මැටි, ගල්, මුල් ආදිය සෝදාගෙන එන වතුර නෝ තුවාලයකින් පෙරා වැටෙන ඕජාව.
පෙරවාකෙ-තොටිල
පෙරාමනක්කු-මුඛ්ඩ එඬ්ඩරු
පෙරාරත්ත- මහඅරත්ත, කළුවා අල

පෙරුංකායම්—සුං=
(සුඟ=හිඬගු)

පෙරුංකායම්—හිඬගු
Ferula Foetida

පර්සියාවේ, කොරාසාන් හි හා බටහිර ආසියානික රටවල ත් වැවෙන ගසකින් ලබා ගන්නා සාරය කැටි ගැසීමෙන් සෑදෙන ලහටු වර්ගයකි පෙරුංකායම්.

පේ

කොළ, පොතු, මුල්, කඳ හා කරවිය යන මේ කොටස් වලින් වෙන් වෙන් වශයෙන් පෙරුංකායම් ලබා ගතහැකි බව ත්, ඒවායේ ගුණ ද ඒ කොටස් අනුව වෙනස් වන බව ත් පැහැදිලි වෙයි. මෙය අත්‍යාවශ්‍යක ඖෂධ යක් බැව් බුද්ධ දේශනාව වූ විනය පිටකයේ මහාවගග පාලියේ හෙ සජ්ජකඛන්ධකයේ ද **පත්‍තාභිඛගු-තවාභිඛගු** ආදි වශයෙන් සවිස්තර ව ඇතුළත් ව තිබීමෙන් පෙනේ.

ආමශූල, අග්නි මාන්ද්‍යය, උදුවර්තය ආදි රෝග වලට හා නානරගත ආඛාධ වලට ත් අවශ්‍ය කෂාය-ගුලි-කල්ක-අරිෂ්ට ආදිය පිළියෙළ කිරීමෙහි ලා පෙරුංකා යම් ද ඖෂධයක් වශයෙන් ඇතුළත් කර තිබේ.

භිඛගු යන මාතෘ භාෂාගත වචනය සිංහලට බිදී සෑදුන **සුඟු**= සුං යන වචන ග්‍රන්ථ ව්‍යවහාර යෙහි පවතින ත්, ග්‍රාම්‍ය ව්‍යවහාරයෙහි පවත්නේ **පෙරුන්ගා** යම් යන දෙමළ වචනය ම මිදක් වෙනස් වීමෙන් සෑදී තිබෙන **පෙරුංකායම්** යන දේශීය වචනය යි.

පෙරුංපරිත්ති-මහකපුගස
පෙරුංකුමට්ටි-නියඹරා
පෙරුන්කුමිල්-ඇන්දෙමට
පෙරුන්කුමුල්-ඇන්දෙමට
පෙරුන්කුරන්වකම්-බහුළු
පෙරුන්කුරුන්ද්‍ර-දෙඩම්, පඹුරු,
පෙරුන්කුරුන්පෙ-මූරාවා වැල්
පෙරුන්කෝරෙසි-ජටාමාංශ
පෙරුන්තන්තාරි-මහ ඉරමුසු
පෙරුන්නෙට්ටා-මහ ඉහිනි
පෙරුන්ෂඩයන්-මහ හැඩයා
පෙරුන්සාරණෙ-මහසාරණ
පෙරුන්සිරකම්-මහදුරු
පෙරුනාකරෙ-උගුරැස්ස
පෙරුනාවල්-හෙළ දඹ,මාදම්,(මහ දඹ)
පෙරුම්කාවෙවාරි- මහකසඹිලියා
පෙරුම්පරිත්නි-මහකපු ගස
පෙරුම්පාෂාණ-රසාඤ්ජන
පෙරුම්විටි-මහබැවිල, සුළු බැවිල
පෙරුම්රම්-කොටිල
පෙරුම්රුඤු-සස්සඳ
පෙරුම්ල්ලිය-පුස්වැන්න
පෙරුම්ලි-මස්වැන්න
පෙරුවන්වෙල්ලරි- මහ ගොන් කැකිරි
පෙරුවාකෙස්-තොවිල
පෙවෙත්-ශරීරය
පෙහෙඹිය-පිහිඹිය=කිහිඹිය, (14 පිට පිහිඹිය බලන්න)
පෙහෙරතුඹ-යොන්ඉදි, (රටඉදි)

පේඅත්නි-කොටදිඹුලා
පේක්සුරෙ-තිත්තලබු වැල
පේචක-කලාදුරා අල
පේවිකා-ඇඹුල්කපු, නාපිරිත්ත වැල
පේදම්විටි-කේශර බැවිල
පේන-මුහුදුපෙණ හෝ අබින්
පේනිල-පෙණෙල ගස
පේපික්කු-තික්තවැටකොළු
පෙපුඩල--(පේපුංඩල)- දුම්මැල්ල
පේපෝඩල්-දුම්මැල්ල

පෙ පො

පේමුන්සිවිටා–රසකිඳ
පේයක්කරුම්පු–රඹුක් ගස
පේර්ඒලම්–මහ එන්සාල්
පේර–පේරගස
පේරමට්ට–මහබැවිල
පේරාමල්ල–පුස්වැන්න
පේරිච්චෙයි–යොන්ඉදි
පේරු–මැකරල්
පේලව–කලාදුරු
පේෂටා–මිරිස්, ගම්මිරිස්
පේෂටාම්ල–කොසඹ
පේශතාඝ්‍රී–කොන්තමල්ලි
පේසා–මදුළු, කොස්මදුළු ආදිය
පේසිකරුම්බු–රඹුක්, වැලුක්
පේසිකුමට්ටි–යක්කොමඩු
පේසිමනට්ටි–යකුවනස්ස

පෙතික–දියමිත්ත
පෙතිකා–දියමිත්ත
පෙසාවෙක්ෂු–රඹුක්, වැළුක්

පොං–රත්රන්
පොඉලත්ත–ඩෙබර (මසන්)
පොක්කරං–නෙළුම්
පොකුණ–පුෂ්කරණිය
පොකුරු–නෙළුම්, නෙළඹුදැලි, පියුම්
පොකුරුකුරු–නෙළුම් දළු
පොකුරුමුල්–පුෂ්කරමූල, (නෙළඹු දැලි)
පොඩ්ඩ–දැත්ත
පොට්ටකතුත්ති–අනෝද, (අනෝජා)
පොට–හෙළ පෝටාවැල
පොටගල–රඹුක්, වැළුක්, දියබෙරලිය
පොටතල–දියබෙරලිය
පොඩක–උක්, රඹුක්, වැළුක්
පොඩලෙයි–පතෝල

පොඩිඅරිසි

පොඩිඅරිසි

උදුපියලි කොළ වලට මදක් ලොකු දැනි සහිත මිසඳුවි කොළ වල හැඩහුරුකම ඇති සහල් ඇට වැනි මල් හටගන්නා අහල් හයක් පමණ උසට වැවෙන පැලැටියකි. මෙහි නිල් සහ සුදු පාට මල් ඇති වගී දෙකක් තිබේ. සාරාඥී සංග්‍රහයේ වාත රෝග චිකිත්සාවෙහි ඖෂධ වශයෙන් ගැණීමට නියම කර ඇති මේ පැලැටිය මදක් වැලි හා දිය සීරාව ඇති සපරගමුවේ ඇතැම් මිදුල් වල දක්නට තිබේ.

පෝ පෞ

තවත් මතයක්

රෑණමැඩිය කොළ වලට මදක් සමාන, එ පමණ ලොකු නො වූ තද කොළ පාට ඇති කැප්පෙට්ටියා කොළ සුවඳින් යුත් Croton Officinalis න මැ ති පඳුරු වර්ගය ද ඇතැම් අය පොඩි අරිසි නමින් හඳුන්වති. සමී විෂට මේ ගසේ පොතු ප්‍රත්‍යක්ෂ බැව් කියති. මේ වර්ගයේ මල් -ගෙඩි හා පඳුරු ක් වැල් කැප් පෙට්ටියා පඳුරු වලට සමාන ය.

පොඩරු-ප්‍රෞණ්ඩරික,පද්මකාෂ්ඨ
පොඩුරු-වච්චනාම්
පොන්කුරුන්ව්-රත්වන් කටු කරඹු
පොණ්නීර්වන්දනම්-රත්වන් සඳුන්
පොණ්මොලඟු-ලාකඩ
පොතාස්මපුෂ්පි-එරබදු
පොතුබටමිරිස්- පොතුහැරි ගම් මිරිස්
පොන්නන්කන්නි-රත්හිරියල්
පොන්නන්කොට්ට- ගස්පෙණෙල ගෙඩි
පොන්නන්තකරෙයි-පැණිතෝර
පොන්නම්කානි-රත්හිරියල්, මුගු ණවැන්න
පොන්නරිතාලම්-රත්හිරියල්
පොන්නාමරෙයි-රණවරා
පොන්නීර්වන්දනම්-රත්වන්සඳුන්
පොන්මොලඟු-ලාකඩ
පොම්-මල්
පොර්රිලෙයී- රත්වන් කීකිරිඳිය
පොරල-ඒ බොල්
පොරි-විලඳ
පොරි අරිසි-විලඳ හෝ බැදිහාල්
පෞරිකාරම්- පුස්කර, (පුස්කර වගී දෙකකි. පුස්කර, ලංසි පුස් කර කියායි)
පොරිනීරෙයි-විලඳ වැන්න
පොල්-තණ රුක්,(උසත්)
පොල්වාකර-පළමු වර පෙරාගත් අරක්කු
පොල-ඇඹිකිනි, (ඇසේ හටගන් නා සෙම් බිබිලි)
පොලයල්-ඇල් වී වර්ගයක්
පොලෝ පැලියා- ගහල වර්ගයට අයත් අල වර්ගයක් (කඳල)
පොවඟු-පුවඟු ගස්, ප්‍රියඞ්ගු
පොසොන්-මල්

පෝ-පැටවි
පෝක්-(පෝපත්)-පුවක්
පෝඟු-ප්‍රියඞ්ගු
පෝටතල-දිය බෙරලිය
පෝටා-පුවටා වැල්-(පෝටා වැල්)
පෝතල-සිවලුන්
පෝතිකි-නීතිය වැල්
පෝදිකා-නිවිති

පෞණ්ඩරීක-පොණ්ඩරු
පෞණ්ඩ්‍රක-වැළුක්, රඹුක්
පෞණ්ඩ්‍රාහ්ව-පොණ්ඩරු
පෞත්‍රිකා-කණවෙයියා පැණි
පෞර-සුවඳ තෘණ, වච්චනාම්
පෞලි-හබලපෙනි
පෞෂ්කර-නෙළුම් අල, බම්මරපැණි
පෞෂ්කරාහ්ව-පොකුරු මුල්

ප්‍රකකපි-පළොල්
ප්‍රකකන-හිරියල්, බුළු
ප්‍රකකා-ඵණකපුරු
ප්‍රක්ෂපල-නුග
ප්‍රකණී-කිරිබදු
ප්‍රකිති-හෙළ පළොල්, හෙළලොත්
ප්‍රකිනි, ප්‍රකියී } සිරිල(කුණුකරඳ)
ප්‍රකුවය, ප්‍රකුඤ්ජි, ප්‍රකුඤ්ජිය } කලං 12 (පලම)
ප්‍රගන්ධ-පැපිලිය
ප්‍රගු-වඳුරු මෑ
ප්‍රග්‍රහ-රත් කණේරු, අලකිරිය, ඇසළ
ප්‍රච්චික-මස්වැන්න
ප්‍රවණ්ඩ-සුදු කරිවිල, රත් කණේරු, අලරිය
ප්‍රච්බල-අක්මැල්ල
ප්‍රවෙත-බුළු
ප්‍රවෝදනී-කටුවැල් බටු
ප්‍රජ්‍රුත්තන-වනුවැල්,(කහ වැල්)
ප්‍රජාපද-හෙළ ඊතණ, කුසතණ
ප්‍රජාලි-කටුකරෝෂණ, බදුල්ල
ප්‍රඤ්ජලිඤ්ඣාරකාරක-බදුල්ල ගස
ප්‍රවිකා-සිඹින් එන්සාල්
ප්‍රත්‍යක්පාර්-කරල් සැබෝ
ප්‍රත්‍යක්ශ්‍රේණී- ගොටු කොළ, මී නුග
ප්‍රත්‍යක්ෂ- තලිස් පතුරු
ප්‍රත්‍යව්ශ්‍රේණී-දැත්ත ගස
ප්‍රත්‍යවාට්‍යලක-සුළු බැවිල
ප්‍රතන්‍ථිසිඞ්ඛ-තොටිල
ප්‍රතානිකා-සාදික්කා, ආපසු මදු, මහ ඉරමුසු
ප්‍රතාපය-හෙළවරා
ප්‍රතාපවාන්-වරාගස
ප්‍රතිගන්ධ-යොන්තුඹ
ප්‍රතිග්‍රහා-මුඩමහණ
ප්‍රතිවි-සිරිල
ප්‍රතිනිධි-යම් ඔසුවක් වෙනුවට රස- ගුණ - ඕජාදී යෙන් ඊට ආසන්න වශයෙන් ගැණීමට නියම කරණ ලද ඖෂධය ප්‍රතිනිධි නම්.
ප්‍රතිහා-පුස්වැන්න
ප්‍රතිවිෂා-අතිවිඩයම්
ප්‍රතිහාස-අලරිය ගස්
ප්‍රථක්පර්ණී- පුස්වැන්න, කරල් සැබෝ
ප්‍රථ්‍රකා-හබලපෙනි
ප්‍රථු-රත්කැල
ප්‍රථුසිම්බි-තොටිල
ප්‍රපථ්‍යා-අරළු
ප්‍රපුත්‍රාඩ-තෝර
ප්‍රපෞණ්ඩරීක- පොණ්ඩරු හෝ පද්මකාෂ්ඨ (ප්‍රශාරිනී. ගණයට අයත් සුගන්ධවත් පැලැටියක්. මේ වෙනුවට ලක්දිව නෙළුම් දඬු ගනිති.)
ප්‍රභඤ්ජන-මුරුංගා
ප්‍රභද්‍රක-කොසඹ
ප්‍රභාකර-වරාගස
ප්‍රමද්‍ය-අත්තන, අත්තන ඵල
ප්‍රමේහ-ඇසළ
ප්‍රවරා- කොත්තමල්ලි, අඟිල්, අරළු, බුළු, නෙල්ලි, හෙළ දම්
ප්‍රවාල-පබළු
ප්‍රවාල ඵලිකා-සීරුස්ස
ප්‍රවාලමධ්‍ය-දෙඹ
ප්‍රවාලාභ ඵලා-කෙම්වැල්
ප්‍රවෘජිත-වෙල්මුඩ, ජටාමාංශ
ප්‍රවෘෂායනී-වඳුරු මෑ
ප්‍රශාරිනී-ප්‍රශාරිනී-ගන්ධ ප්‍රශාරිනී යයි දෙවගීයක්. =ගන්ධ පාදුලියා (ගඳ මදුවැල් = ආපසු මදු) මේ ගැණ 97 පිටේ ආපසු මදු

ප්‍රා ප්‍රි

යනුවෙන් ලියා තිබෙන විසන රය බලන්න.

ප්‍රසථය-පලම් දහසය
ප්‍රසමනී-කිරි අහුණ
ප්‍රසවාඞ්කුර-කැකුළු
ප්‍රසූත-කරාබු නැට
ප්‍රසූන, ප්‍රසූනක } මල්
ප්‍රසූනපත්‍ර-මල් පෙත්ත
ප්‍රහසා-සුළු බැව්ල

ප්‍රාචීන-දියමිත්ත, අරත්ත අල
ප්‍රාචීනාමලකී-රට උගුරැස්ස
ප්‍රාචීඵල-අක්මැල්ල
ප්‍රාඤ්ජලී-කටුකරෝෂණ
ප්‍රාණජීව-නිල් අවරිය කොළ වැනි කොළ ඇති අඹ එක හමාරකට වඩා උස් නොවූ පැලැටියක්. මෙහි කොළ නිතරම වලනය වෙයි.
ප්‍රාණද-අරළු, නරි අල, =(නරි අල=ශාලාමිශ්‍රී)
ප්‍රාණහෘත්-නරි අල (ශාලාමිශ්‍රී)
ප්‍රාතිකා-බදු වද මල්
ප්‍රාලභ්‍යාදනී-දුරාලභා
ප්‍රාවෘශෙන්‍ය- කෙළි ද, සාරණ, කොළොම්, වදුරු මැ, බක්මී
ප්‍රාවෘෂායනී-වදුරු මැ

ප්‍රිතෘෂටය-කීකිරිඳිය
ප්‍රිය-පුවහු, ඉඳි
ප්‍රියඞ්ග-පියාගස්, බක්මී, කොඛුම්, රැකහුණ
ප්‍රියඞ්කර-පියාගස්
ප්‍රියකරි-අමුක්කරා
ප්‍රියගන්ධ-පියාගස්
ප්‍රියඞ්කර-අමුක්කරා, කිරිපලා, හෙළබටු
ප්‍රියඞ්ගු-පුවහු, (පුවහු ගස)
ප්‍රියජීව, ප්‍රියජීවි } කොටිල
ප්‍රියතම-මොණරකුඩුම්බිය
ප්‍රිය දර්ශින-කිරිපළු
ප්‍රියදර්ශ-කෙලින්ද
ප්‍රියනාමා-ජීවක
ප්‍රියප්‍රිය-කොටිල
ප්‍රියභෙදනී-පුවහු ගස
ප්‍රියම්බදෘ-දැසමන්
ප්‍රියම්බු-අඹ
ප්‍රියවර්ණී-පුවහු
ප්‍රියවතී-පුවහු
ප්‍රියවල්ලි-පුවහු
ප්‍රියවෘක්ෂ-කොළ හිඹුල් ගස, පියා ගස

ප්‍රියශාලක-පියාගස
ප්‍රියා-බිම්කල්, පුවහු, කිරිපලා
ප්‍රියාඞ්ග-වැල්මදට
ප්‍රියාල-පියාගස්, වියලිමිදි, කිරිපළු, මොරගස
ප්‍රියාලා-මුදුකඵල
ප්‍රියෙසි-පුවහු
ප්‍රෂට-හෙළ ලූහුණු, වැල්ඉද්ද
ප්‍රෂට-මාදඹ, (මහදඹ)
ප්‍රෂටභෙදිකා-නීදිකුම්බා
ප්‍රෂාර්පි-වසට ඇට
ප්‍රෂ්ටි-ඉඹුල් හණ
ප්‍රසිමාල-එලජම්බු
ප්‍රීවූ-දෙනි

ප්‍රේ පල පලි එ

ප්‍රේක්ෂා-මහ කොත්තමල්ලි
ප්‍රේතමූලී-කිතුල් ගස, කොටදිඹුලා ගස
ප්‍රේතාධිවාස-බුළු ගස
ප්‍රේයසී-පුවඟ
ප්‍රේශඵල-මානුග ගස
ප්‍රෝජ්ඣි-මහ වැටකොළු
ප්‍රෝෂ්ටා-මිරිස්

ප්ලක්ෂ-පුළිල, සියඹලා, තුන්පුළිල
ප්ලව-වරා ගස, කලාඳුරා, කුරුඳු
ප්ලවකා-තුන්පුළිල, රුකහුණ
ප්ලවග-මාරාගස, රුකහුණ
ප්ලවඞ්ග-මාරා ගස

ප්ලීවරී-රඹුක් ගස
ප්ලීහ-බඩදිව (පිලාව)
ප්ලීහනාසන-යක් එරබදු ගස
ප්ලීහශත්‍රු-වල් එරබදු
ප්ලීහාරි-ඇසටු ගස

එගහව-හඟුළු
එඤ්ජි-සිරිතේක්කු, දුම්බෙ
එඤ්ජිකා-දැත්ත, සිරිතේක්කු
එඤ්ජිපත්‍රිකා-මකුණුවැත්ත
එණගන්ධ-කරවුතලා, ජූල්, (දිවුල්)
එණී-නයා, නයිපෙණය, බුලත්
එණීකාලි-ඇල් කහඹිලියා, (වැල් කහඹිලියා)
එණීජඞ්ඝ-තලා, සාමාන්‍ය දෙඩම්
එණීජිව්-සාතාවාරිය
එණීජිහ්වා- හාතාවාරිය, මකුණු වැන්න, සුළු බුබැවිල
එණීජිහ්විකා-ඉරමුසු
එණීඤ්ජක-නියඳ
එණීඵෙන-අඹින්, නයිපෙන
එණීලතා-බුලත් වැල
එණීවල්ලී-බුලත් වැල
එණීහන්ත්‍රි-සුවඳ අරත්ත
එණීහාරි-ඇල්කසඹිලියා
එණීහාත්-හින් ඇල්කසඹිලියා
එතීජිහ්විකා-ඉරමුසු
එතීවාක-මුද්දරප්පලම්
එරොවත-හිඟුරුපියලි
එල්ගු
එල්ගුණී
එල්ගුවාටිකා } කොටදිඹුලා
එල්ගුවෘන්තාක-නොවිල
එල්‍ය-මල
එල-ගෙණිය, බෝ ගස, කුකුරු මාන්, සාදික්කා
එලක්ෂීරි-වරා ගස
එලක-හින් ඉරමුසු, නා කෙසරු
එලංකශා- නෙරෙන්වි = (වර්ග දෙකකි. කුඩා නෙරෙංචි, මහ නෙරෙංචි කියා සි. මූත්‍ර කෘච්ඡ්‍රා වට ප්‍රශස්තයි.)
එලකෙශර-පොල් ගස
එලකෘෂ්ණ-කරඹ ගස
එලජාත-කලගස
එලජානි-සාදික්කා
එලත්‍රය-අරළු, බුළු, නෙල්ලි හෝ ද්‍රාක්ෂා, කාශ්මර්‍ය්‍ය, බර්ජූර
එලත්‍රා-ඉරමුසු
එලත්‍රිකා-අරළු, බුළු, නෙල්ලි
එලධාතු-පිණ්ඩාභිඛු
එලනාසන-ගොකටු
එලනිඛයා-කෙළින්ද ගස

ඵා ඵූ

ඵලනිසසා-කුඹුරුවැල
ඵලපත්‍රිකා-මූරුංගා
ඵලපාක-කරඹ ගස
ඵලපාකින්-තෙලෑසටු
ඵලපාදස්‍ය-ඇපල ගස
ඵලපුෂ්පා-රටඉඳි
ඵලපූර
ඵලපූරක } දෙළුම්, ලප්නාරම්
ඵලප්‍රිය-පුවඟු
ඵලමූඛ්‍යා-අසමෝදගම්
ඵලරස-කුකුරුමාන්, කෙල්ලි
ඵලරූකාසි-කරිවිල,(කරිවිල ගෑණ 224 පිටේ තුඹකරිවිල යනුවෙන් ලියූ විසතරය බලන්න)
ඵලවල්ලි-කොමඩු, පුසුල්වැල
ඵලවිනාසනී-කෙහෙල් ගස, (කෙසෙල් වගී 74 ක් ඇතැයි දැක් වේ. මේවායින් සුවඳෙල් (සුවඳ කෙසෙල්) හුණාඩික සි.)
ඵලවෘක්ෂක-කොස් ගස
ඵලවෘන්තාක-තොවිල
ඵලශාඛ-වංඇපල
ඵලශාඛව-දෙළුම් ගස
ඵලශිෂ්‍යාඟ්වය-ඔලිඳ වැල, (ඔලිඳ, රස ඔලිඳ, (පැණි ඔලිඳ) ඵල ඔලිඳ යයි වර්ග කිපයකි. මෙය වාජීකරණ ඖෂධයකි)
ඵලශෛක්ෂීර-ඩෙඛර
ඵලශ්‍රේෂ්ඨ-රඹුටන් ගස, දෙඛර, මිදි ඵල
ඵලස්නෙහ-රඹුටන් ගස
ඵලා-පුවඟු
ඵලාඪ්‍යා-ගෙඩියුත් වල් කෙසෙල්
ඵලාණ්ඩු-කුකුරුමාන්, රතුළූනු
ඵලාධ්‍යක්ෂ-කිරිපළු ගස
ඵලාමල-ඇඹුල්වේ, (ගොරක)
ඵලාශක-කිරිබදු වැල
ඵලාහ්‍ය-මුංවැන්න
ඵලිකා-පුවඟු
ඵලිකා-සීරුස්ස
ඵලිත-ගැටනිවුල්
ඵලින-පුවඟු
ඵලිනී-නිටොල්, පුවඟු
ඵලී-පුවඟු
ඵලෙන්ද්‍ර-මාදම්
ඵලෙරුහා - රත් පළොල්, හෙළ පළොල්
ඵලෝත්කට-පිටවක්කා
ඵලෝතතමා-මුද්දරප්පලම්, නිපල්
ඵලෝදය-නුග ගස
ඵලෝරුහා-සෙළ පළොල්, රත් පළොල්
ඵහි-උක්පැණි
ඵළික-පළිඟු

ඵාණි-උක්සකුරු විකෘති, දී මිශ්‍ර අත්සුණු
ඵාණිත-උක් පැණි, සීනි, කඩ සකුරු
ඵාරුසක-බොරලු දම්මිණ
ඵාල්ගු-කොට දිඹුලා, තොවිල, පෙතන්
ඵාල්ගුණ-කුඹුක්, රඹුක්, කුරුඳු, සා දික් කා, වසාවාසි, කොට දිඹුලා
ඵාල-දෙඩම් ඇට ආදිය, ඇපලගස
ඵාලිකා-ඇසතු ගස
ඵාලිනී-කළු තුඹනවාලු, මහ කපු, සිරිතේක්කු, වැල් පෙනෙල. මහ ඇඹුල්වේ, රැක් පෙනෙල

ඵුප්පුස-පෙණහලු
ඵුර්ජකා-සින්මැඩහඳු

බ එෙ

එෙග්ගු-කොටදිඹුලා
එෙණ-මූදුපෙණ
එෙණාග්ව-මූදුපෙණ
එෙණ්ල-ඩෙබර, සින්ඩෙබර ගෙඩි, කොසඹ, රුක්පෙනෙල

බංගය-කිකිරිදිය
බංජි-ගිරිතිල්ල වැල(මාබණඩා)

බක්මි—බක්මි ගස



බක්මි—හලිප්‍රිය

Sarcocephalus Cordetus

බක්මී පේරතඹල හෝ කුඩා තේක්ක කොළ වැනි කොළ ඇති විශාල ගසකි. මෙහි කඳ ලා කොස් ගසක අරටුව මෙන් ලා කහ පැහැයෙන් යුක්ත ය. මල් මදක් ඉදුන රඹුටන් ගෙඩි වැනි ය. ගෙඩි සපදිල්ලා ගෙඩි පමණ ඇත ඇඹුල් රසයෙන් හා පැණි රසයෙන් යුක්ත මේ වර්ගයේ ඉදුන ගෙඩි ගම්බද පාසැල් කරා යන එන සිසු දරුවන්ගේ අතිරේක ආහාරයකි.

බක්මී පොතු වියරු බලු විෂට හා සර්ප විෂට ප්‍රත්‍යක්ෂ ඖෂධ යකි. මේ පොතු කලං දෙළහක් ගෙණ පත අට පත එකට සිඳුවා එළ හිතෙල් අනුපාන දමා උදේ-සවස කෂාය හතරක් ද හෝ උදැසන හතරක් මේ පොතු යුෂ දැමූ කෑද ප්‍රතිවාප වශයෙන් හිතෙල් දමා හෝ දුනහොත් හැම වර්ගය ක ම ශරීරගත වූ විෂ පහ වෙයි. කෑ මුඛය ඉවිමී නිබේ නම්: මේ පොතු කහ-ලුණු ලා කොටා මලවා උදේ-සවස බැන්ද යුතු යි.

බකිනි—බකිනි ගස්



බකිනි

මෙය අඟල් දෙළහක් පමණ දිග හා අඟල් හතරක් පමණ පළල ඇති **වවුල්මුඟා** කොළ වැනි කොළ වලින් යුත් **නෑවිච්** ගස් මෙන් සෘජුව යන වහා වැවෙන ගසකි. මෙහි ලීය සුදු පාට යි. මේ වගීය දර පිණිස මිස ඖෂධ පිණිස ගැණීමට නියම කළ තැනක් දකින්ට නැත.

බක්මී-බකිනි දෙක එක ම වර්ගයක් වශයෙන් ඇතැම් පළාත්වල සළකති. එහෙත් වචන දෙකේ මිස ගස් දෙකේ කිසිම සමානකමක් නැති මේ ගස් දෙක වෙන් වශයෙන් අඳුනා ගැණීම ප්‍රයෝජනවත් ය.

බක්මී පොතු වෙනුවට බකිනි පොතු වරදවා ගතහොත් නැති අසනීප ඇතිවිය හැකි නොයිනි.

බක-වකපුෂ්ප, කොකුම්
බකන-ගජතිප්පිලි
බකුල-මුහුණමල්
බඟය-කිකිරිදිය
බඟනර-සුරා
බජ්ජල-යක්ඵරබදු (පාරිභද්‍ර)
ඩෙබර ගස
බටකපුරු- බටගස් තුල සෑදෙන සීනක්කාරම් කැලි වැනි සුදු පාට ද්‍රව්‍යය

බඩකිරිල්ල—කිරිල්ල වර්ගයක්

බඩකිරිල්ල

Erythroxylon Lucidum

බඩකිරිල්ල, බට (කොහු) කිරිල්ල, හුණු කිරිල්ල යයි කිරිල්ල වර්ග තුනකි. කොරකහකොළ මෙන් උල්වී නියා සිහින් කොළ හා නයි (සිහින්) මිරිස් කරල් වැනි ඉදුනවිට රත් පාට ගෙඩි ඇති වර්ගය බඩකිරිල්ල යි. මේ ගසේ කොළ, මූල්, පොතු ආදි හැම දෙයක් ම ලමා (කෘමි) රෝග පිළිබඳ ප්‍රත්‍යක්ෂ ඖෂධයකි.

කොළ වියලා කුඩු කර හාල් පිටි සමග මිශ්‍රකර කිතුල්හකුරු හෝ පැණි දමා සකස් කර ගන්නා අග්ගලා කෘමි රෝග නාශක ආහාරයක් වශයෙන් ලමයින්ට කෑමට දෙති. තද පණු ගායට මේ පොතු කෂාය පොවති. මේ ගසේ කොටස්

වෙනත් ඖෂධ යෝග සමඟ මිශ්‍ර කර සකස් කළ ලමා රෝග පිළි බඳ බෙහෙත් වර්ග ද ඇත.

ඔට(කොහු)කිරිල්ල–බෝඹු කොළ පමණ විශාල කොළ ඇති ලොකු කිරිදිඇට පමණ විශාල ගෙඩි පොකුරු සැදෙන වර්ගයකි. මේ ගෙඩි ගම්බද ලමයින්ගේ පාසැල් ජීවිතයෙහි දී ඔට ලී වලින් සෑදූ (කිරිල්ල තුවක්කු) තුවක්කු වලට දමා වෙඩි තැබීමට පාවිච්චි කරති. ඉදුන විට කළු පාට වූ මේ කිරිල්ල ගෙඩි ඇඹුල් රසින් හා පැණි රසින් යුක්ත ය. ඒවා කෑමට පක්ෂීන් මෙන් ම ලමයින් ද කැමති ය. මේ වර්ගය බෙහෙත් වලට ගැණීමක් නැත.

හුනුකිරිල්ල කොළ ඔටකිරිල්ල කොළ වලට ත් මදක් විශාල ය. ගසත්, කොළ ත් මද සුදු පැහැයකින් යුක්ත ය. ඒ වර්ගයේ ගෙඩි කොහුකිරිල්ල ගෙඩි වලට වඩා මදක් කුඩා ය.

සත්‍රීන්ගේ කණ්ණාහරණ මෙන් මේ වර්ගයේ ගෙඩි වල ඉදිරි පැත්තෙහි වෙන් වෙන් ම මතුවී පෙණෙන බුබුළු තුනක් ඇත. ගෙඩි ද තද සුදු පාටින් යුක්ත ය. දර පිණිස හැර හුනුකිරිල්ල ගසෙන් ගන්නා වෙන ප්‍රයෝජනයක් නැත.

ඔටදැල්–ඔටදැල්ල නම් වූ විශාල ව වැවෙන තෘණ වර්ගය

ඔටු–ඔටු ගස

ඔටුකර– කරඔටු, ඉදුන ඵල ඔටු හෝ ඉදුනු ඵලඔටු ගෙඩියේ මද ය. (වනගත ව වැවෙන ඵල ඔටු ගෙඩි වලට සමාන ගෙඩි ඇති රතු පාට වර්ගයක් ඇත. ඒවාට ද කරඔටු යයි කියති.)

ඔඩල්වනස්ස– විල්වනස්ස, ඇදුම (රෝගය)ට ප්‍රත්‍යක්ෂ ඖෂධ යකි.

ඔඩිල–සියඹලා

ඔණ–ගින්නේරිය ගස

ඔණිග්ඝණ්ඩු–ඛෙරු ගස

ඔද්දිජ–යක්ඵරඔදු ගස

ඔද්දිජ ඇට–ඵරඔදු ඇට

ඔද්දිය–ඵරඔදු

ඔදර–මහකපු, ඩෙඔර, බිම්තල්

ඔදරි– ඩෙඔර, බිම්තල්, මහකපු, යක්ඛේරිය, හණගස, නිදිකුම්බා, හූරල

ඔදරිකා–කපු

ඔදරිච්ඡදා–ඇත්ඛෙඩර

ඔදරිතරු–ඩෙඔර ගස, ඔදුල්ල ගස

ඔදරිපත්‍ර–ඩෙඔරපත්

ඔදරිඵලා–නිල් සේපාලිකා

ඔදිර–කැල

ඔදිරෝ–කිණිහිරි

ඔදු–යුගල

ඔදරෝට–මසන් ඇට

ඔදුන–භාජනය

ඔදුවද– පොකුරු සැදෙන ලොකු වදමල්

ඔදුලු–ඔදුල්ල

ඔද්‍ර–රණහුණ

ඔද්‍රකා–මඤ්ඤාරඳ

ඔද්‍රලතා–ඉරමුසු වැල

ඔද්ධපාදී–හඬනහිරියා

ඔද්ධපුෂ්පී–බිම්තල්

බඳුඵල-කරද
බඩිර-සණ, යකඩ, යක්බෙරිය
බන්‍ධුක-සින් දුමැඩ, පත්‍රරාඡණා
බන්දු-ඍෂභක
බන්දුල-බදුවද ගස
බන්‍ධපාදි-හඬන හිරියා
බන්ධි-සුළු පෝටා වැල
බන්‍ධ්‍යා-ගෝරෝචන
බන්‍ධ්‍යාකකෝපි-මල්තුඹ
බන්‍ධු-බදුවද
බන්‍ධුක-බදුවද, ගම්මාළු ගස
බන්‍ධුක පුෂ්ප-පියා ගස
බන්‍ධුජීව
බන්‍ධුජීවක } බදුවද
බන්‍ධුජීවක පුෂ්ප-රන්වන් අත්තන, බදුවද මල්
බන්‍ධුවර-බදුවද, තලමුරා, වලඟ සාල්, සෘෂභක
බන්‍ධුර-කුන්දුරුක්කත්, සෘෂභක
බත්තට-කැලනිය ගස
බනවය-සුදු ලීනු
බනන්-බත්
බපෙපා-කඳුලු
බබුරා දමුණු-එඳුන රුක (කොළොම් ගස)
බබුස්තණ-බබ්බජ නම් තෘණ වගීය
බහෘ-මඟ එන්සාල්
බහෘධාතු-රන්වන් අත්තන, ගුරා
බහෘෂට-තුවරලා
බම්බු-උණගස
බමර-බම්ර පැණි
බඹමුල්-ලුණුවිල, බැමිනිරිය
බඹර-මී මැස්සන්
බඹරුක්-කැල
බඹුරා-කුකුලන්
බගී-ලෝලු
බර්ගිපත්‍ර-ලෝලු කොළ

බර්බට-ඒ
බර්බර-රිදී, වේලා, සිරිතේක්කු, සල් ගස, රම්මානිස්ස, පිල ගස
බර්බර වඩීක-සිරිතේක්කු
බර්බරා-වේලා, රම්මානිස්ස
බර්බරාඛ්‍ය-රම්මානිස්ස
බර්බරිකා-වේලා, රම්මානිස්ස
බර්බෂට-තුවරලා, ඉරිවේරිය
බර්ව-කන්සා
බර්හ-මොණර පිල
බර්හි-ගෝසාල වැල
බර්හිනී පුෂ්ප-බළුදම්
බර්හිෂට-තුවරලා, ඉරිවේරිය
බහ්‍වී-මොනරපිල්, මහ පොණ්ඩරු, ඉළුක්
බහ්‍වීපුෂ්ප-පොණ්ඩරු
බර-රසකිඳ, තිපල්, මේවන්, බැමිතිරිය, පලම, වළඟසාල්, දියමිත්ත, සානාවාරිය, කහ
බරහුල්-අඟල් 12 =(අඩිය)
බරන-නයා
බරනය-රත්‍රන්
බරමස්-මෝරු
බරවා-(බරපා) ශ්ලිපද=ශිපද රෝග ගය
බරුස්-කෙසෙල් =(මස් කෙසෙල් වගී)
බලලක-ඇඹුල
බලලාක-බදුල්ල
බලලි-බදුල්ල
බල්‍ය- මඟ බැවිල, අමුක්කරා, සාරණ
බල්‍යඵල-ලා ගෙඩි
බල්‍යා-අමුක්කරා, මේවන්, අරළු
බල-ලුණුවරණ
බලකොළ-ලුණුවරණ
බලජ-බබුස් තණ
බලජා-අමුක්කරා

බලද බහුකණ්ටකී

බලද-අමුක්කරා
බලදු-අමුක්කරා
බලභද්‍ර-සරල, (හොර ගස)
බල භද්‍රක, බල භද්‍රිකා } බැමිතිරිය
බල භෛෂජ්‍ය-වෙනිවැල් කෂායයෙහි ලා ශුද්ධි කර ගත් තුතු (පල් මානික්කම්)
බලමුත්තා"පනිකා-හෙළ එරඹු
බළල් වසුරු-බළල් බෙටි
බලවජ-වැළුක්
බෘවන්ත-බැමිතිරිය
බලසාර-සල් ගස
බලසෞගන්ධික-ගෙන්දගම්
බලා-අස්වැන්න, වල් මුං, සුළු බැවිල
බලාකා-මහ බැවිල, සිරිවැඩි බැවිල
බලාග්නි-කලගස
බලාඪ්‍ය-මුං
බලාතික්ත-දුම්මැල්ල
බලාමොටා-සස්සඳ, කංසා
බලාය-ලුණුවරණ, කැලිය ගස්
බලාසග්නි-දූදු වැල්
බලාසාග්නි-දූදු වැල්
බලාහක-කලාඳුරු
බලිකා-මහ බැබිල
බලිකාම-රත්නිවුල්
බලිකුට-රත්නිවුල්
බලින-ගෙන්දගම්
බලිපු-කරබෙඹිය
බලිප්‍රිය-ලොත් ගස
බලී-කළු ලුණු
බළුදිවි-වරාපක්කඩ, පතොක්
බ(ව)ර-රසකිඳ, නිපල්, මේවන්, බැමිතිරිය, වළඟසාල්, කොකුම්, අමු ඉහුරු, දියමිත්ත, කහ, ලුණුවරණ, හානාවාරිය
බස්න-රත්වන් වේලා

බසනකණ්-සුළු කුඹුක්
බසනගන්ධ-වේලා
බසනගන්ධක-පෙරැන්කායම්
බසනගන්ධා-වේලා
බසනනති-ගිරිතිල්ල
බසනමොදු-අසමොදගම්
බසනභූෂණ-වැල් මදට
බසත්‍රශාඛී-මැඩහඳු
බසත්‍රශාඛිකා-මැඩහඳු, පෙරැම් කායම්
බසතුගන්ධා-වේලා
බස්මානං-අමුකපුරු
බස්මාගීය-දේවදුර
බස්ව-ඇට්ටර
බහති-හෙළ බටු
බහ දුරැසිරි-භද්‍රශ්‍රී වෘක්ෂය, සඳුන් ගස
බහන්-ලනුව
බහමධුරී-වැල් මුරුංගා
බහරි-කුසතණ
බහල්-දෙසාලිස (42)
බහල-ශතපුෂ්ප
බහලඃ-මොර ගස
බහලකක්-වැල් මුරුංගා, තොටිල
බහලතව-පියා ගස, බෙලි ගස, හෙළ ලොත්, මොරගස, කිරිපළු
බහල පත්‍ර-කළු කිහිරි
බහල පලලව-වැල් මුරුංගා
බහල වල්කල-හෙළ ලොත්
බහලා-මැඩහඳු
බහස්ම-භස්ම කිරීම
බහා-ගිතෙල්
බහුකෂීරි-මහ උක්
බහුකණ්ටකී-හීන් ගොකටු, කටු වෙළඟ, වැටකේ, සුළු තළ ගස
බහු කණ්ටකී-සැම ගස

බහුකණ්ටු-කටුවැල් බටු
බහුකන්ද-තිබ්බරම්
බහුකන්දක-වැටකේ
බහුකර්ණිකා-මකුණුවැන්න
බහුගන්ධ-කුන්දුරුක්කන්, පොත්ත, ඉද්ද, සපු කැකුලු, සුදු දුරු
බහුචර්ම-පුළිල, භූජපත්‍ර
බහුචර්ම්‍යා-රසකිඳ
බහුචර්ම්‍යා-රසකිඳ
බහුත්වච-බෙලි, කිනිබුරුද
බහුතන්තිකා-කළුකැමිමේරිය
බහුද-ශතපුෂ්ප
බහුධාවන-අන්දර
බහුධාවලය-තින් එන්සාල්
බහුපනි-පුළිල
බහුපත්‍ර-දිය බෙරලිය, මුරුවා
බහුපත්‍රක-රුක් තිබ්බටු
බහුපත්‍රා-මහ හාතාවාරිය, වම්බටු, නව නැඹිලිය, කටුපිල, දියබෙරලිය
බහු පත්‍රිකා-තිබ්බටු, හාතාවාරිය, එළුවාහාල්
බහුපත්‍රී-පිටවක්කා
බහු පර්ණික-බෝ ගස
බහුපර්ණිනී-පතුක්
බහුපර්ණී-බෝ ගස
බහුපර්ණික-උණගස
බහුපර්ව පුෂ්පක -- රන්වන් අත්තන
බහුපල-තිරිහු
බහුපා } නුග ගස, මහ නුග
බහුපාද }
බහුපාදි-අඩනහිරියා
බහුපුට-සුදු ලූනු, භූජපත්‍ර, පුළිල, මිණිරන්
බහුපුත්‍ර } පිටවක්කා
බහුපුත්‍රා }
බහුපුත්‍රිකා-තිබ්බොටු
බහුපුෂ්ප-කටුපිල ගස, මයිල ගස
බහුප්‍රජා-කටුපිල
බහුඵල-වැල් තිබ්බටු
බහුඵලා-මුද්දරප්පලම්, කළුකැමී මේරිය, එළ ඔළිඳ, වැල් තිබ්බටු
බහුඵලාශය-එල කිහිරි
බහුඵලි } නෙල්ලි
බහුවලි }
බහුපෙණිකා-බැමිතිරිය
බහුබීජ-මිරිස්
බහුබීජක-තකුල්, ඇට කෙසෙල් හොඳ මිරිස්
බහුබීජය-කපුකැන
බහු මඤ්ජරී-තලා, කළුතලා
බහුමූර්ති-වල් කපු ගස
බහුමූල-මුරුංගා, සැවැන්න, සාතාවාරිය, කළු කිහිරි
බහුමූලා-සැවැන්න, සාතාවාරිය
බහුමූලිකා-ඇම්බරැල්ල
බහුරස-උක්ගස
බහුරාත්‍රි-නෙලුඹුදෑලි
බහුරූප- එ ඳ න (කොලොම්) වෘක්ෂය
බහුරූප-දුම්මල, මයිල, බදුල්ල
බහුරේණුක-කරබෙඹිය
බහුල-බෙරු, එන්සාල්, ශතපුෂ්ප, මැඩහඳු
බහුලගන්ධා-එන්සාල්
බහුලචර්ම-රත්මුරුංගා
බහුලා-මහ එන්සාල්, තින් එන්සාල්, ශතපුෂ්ප, බුලත් වැල්, කටුවැල්බටු, මැඩහඳු
බහුලාජිනී-එන්සාල්
බහුවල්ලි-මහ කරිවිල
බහුවාතක-ලෝලු ගස
බහුවාර-ලෝලු ගස
බහුවාරක-ලෝලු, අන්දර
බහුවාහක-ලෝලු

බා

බහුවිඥා-රසකිඳ
බහුවිය-අසු ගස්
බහුවීයී-තලා, බුලු, කුරතම්පලා, ඉඹුල්, අහු ගස
බහුශල්‍ය-කළු කිහිරි
බහුශාල-දළුක්
බහුශෘඞ්ගික-මැඩහඳ
බහුසුතා-පිටවක්කා, සාතාවාරිය
බහුස්‍රවා-කිහිරි
බෘහෙදුක-බුළු
බළල්-බළල් ලුණු
බ්‍යග්සි-කටුවැල් බටු

බාංජී-ගිරිනිල්ල
බාකුචි – බෝදි ඇට = බවුචි, කලු කොල්ලු ඇට වලට සමාන ඇට වර්ගය කි. ඇතැම් අය බෝදි ඇට – සන්නි නායම් දෙවර්ගය ම එක වර්ගයක් ලෙස සලකතත් සන්නි නායම් වෙන වර්ගයකි. **කෘෂ්ණ ඵලා** නමින් බෝධි ඇට ත් **ශුක්ලාඞී** නමින් සන්නිනායමුත් හැ දි න් වෙ යි. ඡායාරූප සහිත සන්නිනායම් ගැන ලියූ විවේචනය ඉදිරියෙහි ඇත, බලන්න.
බාදර-කපු ගස, කපු පුලුන්, නූල්,
බාදරා-කෑකුණු ගස
බාධිර්‍යී-බිහිරි බව
බාන-නිල් කටුකරඹු, සැවැන්න, පිළිල, කණවෙයියා පැණි, ගිරිනිල්ල
බානක-නිල් කටුකරඹු
බානදෘඞි-නිල් ගිරිනිල්ල,
බානවීරස-සැවැන්න
බානාග්ව-මුඤ්ජ නම් තණකොළ
බාර්ලි-යව නම් ධාන්‍ය වර්ගය
බාල්හික- කොකුම්, රත් නිටුල්, පෙරැම්කායම්
බාල-ඉරිවේරිය, බෝලිද්ද, හින් එන්සාල්, වැටකේ, පොල් ගස, වැටකේ මල, ඉද්ද මල
බාලක- ඉරිවේරිය, කෙහෙල්, කිහිරි
බාලක ප්‍රිය- කෙසෙල්, ගොන් කැකිරි
බාලතනය-කිහිරි
බාලතෘණ-ලා තණ
බාලපත්‍ර-කලු කිහිරි, ඇල් කසඹිලියා, රත් කිහිරි, සිරිවැඩ බැම්ල
බාලපුෂ්ප-මහ ඇල් කසඹිලියා
බාල පුෂ්පිකා-බෝලිද්ද
බාලප්‍රියා-කැකිරි
බාලඵල-ලා ගෙඩි
බාලවායජ-නිල් වෙරෝඩි
බාල්‍ය ඵල-ලා ගෙඩි
බාලා-පොල් ගස, සීනිද්ද ප්‍රභෙද, ඇඹුලැඹිලිය, නිල් කටුකරඹු, කෝමාරිකා, ඉද්ද
බාලිකා-ඉකිරි
බාලිය-ඔලිද
බාලී-හින් එන්සාල්
බාලුක-වැලි
බාලෙය-සිරිතේක්කු, කලාඳුරු
බාලෙශාඛ-සිරිතේක්කු
බාලෙෂට-ඩෙබර (මසන්)
බා(වා)ණ-මුද්දරප්පලම්, පිල ගස, සැවැන්න මූල්, නිල් කටුකරඹු
බා(වා)ලක-ඉරිවේරිය
බාෂ්ප-කඳුළු
බාෂ්පිකා- පත්‍රාභිංගු, පෙරැම්කායම්
බාහිර-රත් නිටුල්
බාහු-අත
බාහුලතා-කරිවිල

බැ බි

බාහුලා-හීන් එන්සාල්
බාහු වල්ලි-කරිවිල වැල
බාහු වල්ලිකා- කරිවිල, මහ කරිවිල

බැකරපත්‍ර-කටුකරඹු
බැටදී තෙල්-තලතෙල්
බැදි-ලැහැබ්
බැදිවතු කෙහෙල්-අමුවෙන් ඇඹුල් රසත් ඉදුන විට ඇඹුල් රස හා පැණිරසත් ඇති නවරිකෙසෙල් ගෙඩි වැනි ගෙඩි හට ගන්නා ඕයලි කලාපයේ පැළවෙන මූත්‍ර කෘච්ඡ්‍රාවට ප්‍රත්‍යක්ෂ වැල් වගී යක්.
බැබිල-බැවිල ගස
බැමිතිරිය-ලුණුවිල
බැරිනී-ගර්භිනිය
බැලතණ-එනම් තෘණ වගීය. තැල්මට කහ, ලුණු ලා කොටා මලවා බඳින ශක්තිමත් තෘණ පඳුරු වගීයක්
බැලිල-බැවිල ගස
බැවිල වගී නවය-හීන් බැවිල, මහ බැවිල, සුලු බුබැවිල, මහ බුබැවිල, කොටිකාන් බැවිල, සිරිවැඩි බැවිල, කේශර බැවිල, වැල්බැවිල, පැණි බැවිල යන නව වගී යයි. (බැබිල නැති තැන ප්‍රතිනිධි වශයෙන් අනෝදා ගැනීමට නියම කර තිබේ) පැණි බැබිල අශ්මරී රෝගයට ප්‍රත්‍යක්ෂ ඖෂධයකි.
බැහැනි-ශල්‍යකර්ම වල දී කරණ බැඳුම

බිංරක්ෂා-දුම්මල
බික්-බික, දෙඩම් ගෙඩි ආදියෙහි ගලවා වෙන් කළ හැකි කොටස
බිහු-කිකිරිදිය, මීමැස්සන්
බිහුකොළ-කිකිරිදිය
බිහුසන්‍ධා-කිකිරිදිය
බිල්ලුපුර-ලප්නාරම්
බිල්ලුරුපු-ලප්නාරම්
බිට්-කොමඩු
බිඩ-බළල් ලුණු, තුවරලා
බිඩංග-තාල වර්ගයේ ගස් වල අතු (පිති)
බිඩලු-බිඩලි (තාල වර්ගයේ ගස්වල පිති)

බින්නුග

බින්නුග — මූලිනී
Tylophora Asthmatica

නුග කොළ වැනි කොළ හා හාතාවාරිය අල වැනි මුල් ඇති වැල් වර්ගයකි. මේ මුල් මනා සුවඳ කින් යුක්ත ය. මේ වර්ගය ප්‍රධාන පඩ්ඤාතියේ වමන කාරක (ලය විරේක) ඖෂධයකි.

අතීසාර ජීවානු නැසීමෙහි ත්, ශ්ලේෂ්මා, ජ්වර හා හෘදයාබාධ නැසීමෙහි ත් මූත්‍ර වර්ධනය කිරී මෙහි ත් පසස්තා ලදී.

බින්කා-කවුඩු කැකිරි, කෝවක්කා, උඩැත්ත
බිදල-බැම්තිරිය
බිදුරල-රත් කරවි ගස
බිදුරි-ඌරල, සීත් ඩෙබර ගස, කිරිබදු
බිදුරිකා-කිරිබදු
බිදුරි ගඤා-අස්වැන්න
බිදුරි හස්ත-සිහින් ඩෙබර
බින් තල්-බිම්තල් අල
බින්නිබ-බින් කොහොඹ
බින් රුක්ෂ-දුම්මල
බිනිසා-කන්සා
බිම්තඹුරා-බතලවැල් වලට මදක් සමාන වූ මෙහි සුදු, රතු භෙද යෙන් වශී දෙකක් ඇත.
බිම්නිඹ-බිම්කොස්ඹ
බිම් නෙල්ලි- පිටවක්කා, මෙය හෙළ, රත් වශයෙන් දෙවර්ගය කි. සෝම රෝගාදියෙහි ගන්නේ සුදු වර්ගයයි.
බිම් පුහුල්-එල කිරිබදු
බිම්බජාල-රත් කරවි ගස
බිම්බි- කෙම්වැල්, = කෝවක්කා වැල්, (බිඹුවැල්)
බිම්බිඵල-(බිඹුගෙඩි) කෝවක්කා වැල් වල ගෙඩි (කෙම් ගෙඩි)
බිම්බිකා-කෝවක්කා
බිම්බිරි
බිම්බිලිකා } බිලිං ගස
බිම්බෝදක-බදුල්ල
බිම්මද-අඹ
බිම්මදු-බිම් දිගේ වැවෙන මදුවැල්
බිම්මාරා-පොල් කරඹඩයේ හැඩ හුරු කම ඇති පොලවට ඇලී තිබෙන රතු පාට කුඩා පාල වර්ගයක්.

බිම්මුල්-මදවිය ඇටයකට කුඩා වූ ඔතා තිබෙන නූල් බෝලයක් වැනි සුදු පාට දිග පණුවෙකි. මේ සතා හමු වූ විට ඔට කුඹල් වල දමා ප්‍රවේසම් කර තබති. නැවත දෙසි ඇඟුල් හෝ කන කිරි ගැවුන විටක ප්‍රාණවත් වෙයි. පෝර පසෙහි සහ ගොම දිරා ගිය පරණ ගෙබිම් වල ද මොවුහු සිටිති.

බිම්ලිය- එල බිම්තඹුරා, ගැඩවෙල්ලු
බිඹු-කෝවක්කා, කොබෝවක්කා, කපුරා
බිඹුලු-ගස් වර්ගයක්
බියල්-මී ඇට මදය
බියලි-පියල්ල, පලුව
බිල්ලෝ-බෙලි
බිල්ව-බෙලි ගස, පලම, රත්නිවුල්
බිල්වජා-වැළක්
බිල්වය-පලම, (කලං දෙලහ)බෙලි
බිල-බළල්ලුණු
බිලහ-කොස්
බිලහෝ-කාඩි
බිල පත්‍ර-ඇල් කසඹිලියා
බිලමෝහ-කුප්පමේනිය
බිලල්-බළල් ලුණු

බි බු

බිලාය-බැව්ල
බිලාලපය-කලං තුණ
බිලාල ලවණ-බළල් ලුණු
බිලාලිකා-වළඟසාල්
බිලි-ඉස්සන්
බිලිං-බිලිං ගස
බිලිදුන්-කොල්ලු
බිලිපුටු-කපුටන්
බිලියද-නෙල්ලි
බිෂ-නෙළඹල
බිෂපුෂ්ප-රත් නෙළුම්
බිෂප්‍රශුන-රත් නෙළුම්
බිෂිකා-කෝවක්කා
බිහිසර-තණරද, උණ ආදී තෘණ රාජ වෘක්ෂ

බීජ-ඇට, ලප්නාරං, අංකුරය, ඇට කෙසෙල්
බීජක-පියා ගස, ලප්නාරං
බීජකදලි-ඇට කෙසෙල්
බීජකුත්සිත-ලෝලු ගස
බීජකොෂක-බීජකොෂය, නෙළුම් බට්ට
බීජගභී ප්‍රතාන-දුම්මැල්ල
බීජගභී ප්‍රතානිකා-දුම්මැල්ල
බීජධාන්‍ය-කොත්තමල්ලි
බීජපූර-දෙළුම්, ලප්නාරම්
බීජ පූරක-ලප්නාරම්, දෙළුම් ගස
බීජඵල-ඇට කෙසෙල්
බීජඵලා-නිප්පිලි
බීජමොචපල-ඇට කෙසෙල් ගෙඩි
බීජාභ්ව-ලප්නාරං
බීතසනනි-සනනි රෝගයක්
බීනාක්ෂ-බූළු
බීරණ මූලිකා-සාවැන්න
බීරණී-සාවැන්න
බීරුපත්-සාතාවාරිය

බුංක-රත්එඩරු
බුජ-බුරුද
බුජඟ-නයා
බුජඟය-මුරුංගා
බුජපත්-බුජරුක
බුජුරුක-දෙළුම් ගස
බුටක-නිත්ත වැටකොලු
බුත්සරණ-(ලඬකාකැනාස්) පළුත උඩ එකතුවන තුණු පසෙහි හා දෙණි වලත් හටගන්නා මේ වගීයේ ඇට රත් තෙළඹු ඇට පමණ විශාලය. කළු පැහැයෙන් යුක්ත ය. කොළ මල් හා දඬු කැනාස් වලට සමානය.
බුතක-තලා
බුද්දන්සරණ-බුත්සරණ
බුදුරුස්හාමි-මුඩමහණ
බුධපුෂ්පි-බිම්තල්, උඟරල
බුධා-ඇටකෙහෙල්, ජටාමාංශ
බුන්නෙල්-දුන්නෙල්,මීකිරි වලින් ගන්නා තෙල
බුන්ද-ගස් වැල්වල මුල
බුනිඹ-බිම්කොහොඹ
බුබුස්තන-සාවැන්දරා
බුබුළුපැන්-පොළව පළාගෙන මතු වන දිය, බුබුළුවල ජලය
බුම්බලා-බිම්බැව්ල
බුර්ජ-කිනිබුරුද
බුරඡක-තුරුක්තෙල්
බුරුට්ට-වැටකොළු
බුරුත-එනම් ගස, මල් බුරුත,ඉටි බුරුත යයි බුරුත දෙවගය කි. මල්බුරුත ලීයේ අරටුව වසිරන් වැටී නිබෙන අතර ඉටි බුරුත අරටුව තනිකර ඇන්දත් පාවින් යුක්ත ව නිබේ.
බුරුර-කටරොළු

බූ

බුරුල්ල—ගුරුල්ල ගස

බුරුල්ල ගස—නලගු

Leea Sambbucina

ඉර-හඳ නොදුටු දළු නමින් රහස් බෙහෙත් වට්ටෝරු වල තිබෙන මේ ගසේ පෙතත් කජු ගෙඩිවැනි **කෝෂ** තුළ තිබෙන දළු තුවාල සුව කිරීමට ත්, තල තෙල් සමග මිශ්‍ර **කර** ගත් මේ දළු සහ ගසේ බඩය (මද=ලොද) පිළිස්සුම් තුවාල වලට හා තෙල් වගී සැදීමට ත් ප්‍රයෝජන **වත්** ය.

බුරුවා-කිකිරිදිය

බුලත්-(තාම්බූල) නාගවල්ලි, **කහ** බුලත්, දිය බුලත්, මළය (ගල්) බුලත්, ගස් බුලත්, කොටු බුලත්, බුලත්පාලා, (බිම දිවූ-බුලත්) යයි රසයෙන් හා ගුණයෙන් වෙනස් වූ බුලත් වර්ග සමූහයකි. හැම බුලත් වැල **කම කඳ** (**තෙ**ා පිදුන) **කොළ** හා කිනිති(පිදුන)බුලත් **කොළ** හැඩහුරු **කමින්**, රසයෙන් හා ගුණයෙන් අසමාන ය. බුලත් ඇතැම් ආසියාතික ජාතීහු මඟුල සම්මත ද්‍රව්‍යයක් ලෙස සලකති.

බුලත්තිය-දිවුල්

බුලතෙහි ගුණ-කුළු,තික්ත,මධුර, ක්ෂාර, කසට රස, වා, සෙම්, කෘමිරෝග දුරුවීම, මුව දුගඳ පහවීම හා සැරසීම, මළ පිරිසිදු කිරීම, කාමාග්නි දීපනය හා උෂ්ණ ගුණයෙන් යුක්ත වීම; යන තෙලෙ**ෝ**සි. බුලත් සැපිම **කරන්නේ** මේ කී ගුණ ගැන පාරම්පරික දැනීමක් ඇති නිසා ය.

බුවිබෝ-බෝගස

බුවන-අඹ

බුවනක-ඉරිවේරිය

බුත්සැන්ද-මුස්සැන්ද වලට ඇතැම් පළාත් වල මෙසේ **ව්‍යවහාර** කරති.

බුසුන්-ගස්මුල, රුක්මල්

බූකැන්ද-කොළය ය ට බූ ව ක් තිබෙන කැන්ද විශෙෂය, ගන්දි බෙතක් වශයෙන් ප්‍රසිද්ධ සි.

බූකිඳ-බූව සහිත **කොළ** ඇති කිඳි වර්ගයට මේ නම් **ව්‍යවහාර** වේ.

බූතඇස්සී-නික

බූතවේය-තලා

බූනිඹ-බිංකොසඹ

බෙ

බූපදි-බෝලිද්ද
බූමටුල්ල- පොල් අතු මූල එකට බැඳී තිබෙන දැල වැනි කවර ය. මෙය ඉටි ආදිය ඇතුළු බොහෝ දියර දේවල් පෙරීමට පෙර හනක් ලෙස පාවිච්චි කරති.
බූම්අවතාර-එළ බින්තඹුරු
බූම්ලතා-බිම්තඹුරු වැල
බූරුන්ද- ගුරුන්ද = ගරිද (අරිමේද)
බූවල්ල- පොල්ගෙඩි වැටීමෙන් පසු ඉතිරිවන (හිස්) වල්ල
බූසා-කෙසෙල්
බූහනස්ස-පොල්මල වැසී තිබෙන ඝණ කවර ය

බෙන්ඩුවාල-කොන්ත
බෙබි-කරපිංචා
බෙයද-පඹිතය, කඳුරැලිය
බෙයදින්-හිරියල්
බෙරලිය-පලා වර්ගයක්,(දියබෙරලිය, ගොඩ බෙරලිය යයි දෙවග යකි)
බෙරාදි-බේදුරු
බෙරු-තෘණ වර්ගයක්,අවරියගස
බෙරුමුල්-බේරුමුල්
බෙල්බිජු-බෙලි ඇට
බෙල්මදුළු-බෙලි ගෙඩියේ මද
බෙලි- බෙල්ලෝ, මලිගිය වැල, ඉද්දවැල, බෙලි(බිල්ව) ගස
බෙලිමදුල-බෙලි ගෙඩියේ මද
බෙලිමැලසි- බෙලිගැට (නොපැසුන ගෙඩි)
බෙලියනුග- කාවාට් බෙල්ලන් කැම්බූ වතුර උණුකර උකු කොට සාදා ගන්නා ද්‍රව ආහාර යක්. මේ වර්ගය සම්බෝල හා හොදි ව්‍යඤ්ජන රසවත් කිරීමට ප්‍රතිවාප වශයෙන් යොදති. මේ බෙල්ලෝ බෙන්තර ගඟේ සුලභ ව සිටිති.
බෙලිල-කොබෝලිල ගස
බෙලුවා-බෙලි
බෙහෙරපලා-අවරිය කොළ

බෙහෙන් අනෝද



බෙහෙන් අනෝද — අතිබලා

Abutilon Indicum

කහ පාට මල් සහ කොකිස් අව්වු වැනි කුඩා ගෙඩි සෑදෙන මේ ගසේ කොළ සිංහල කැකුළු හාල් සමග තම්බා එම හාල්පාණු වෙන් ම අඹරා කල්හිය ඔඩු-වන-තුවාලවල ගැමෙන්, ඔඩු ද්‍රව තිබේ නම් ඒ ඔඩු ඇදී, කොස්ස තිබේ නම් එය ද කැපී තුවාල

බො බෝ

ශුද්ධවී රතු මස් පැදී ඉක්මණින් සුවය ලැබේ යි.

මේ ගසේ කොළ වලින් හා මුල් වලින් ලබාගන්නා සාරයෙන් උපදංශ (පරංගි) හා සමාජරෝග නිසා ඇතිවන තුවාල ද සුවකර ගත හැකි යි.

මේ සිංහල කැකුළුහාල් කුඩු සහිත අනෝදා මිශ්‍රණයෙන් ඔඩු දිවූ-වණ තුවාල වලට වර්තමාන පෙන්සිලින් වලින් ලැබෙන ගුණ යට සමාන ගුණයක් ලැබෙන බව අත්දැකීම් අනුව කිව හැක.

බෙහෙරු-බටු

බේදුරු-ගස් උඩ වැවෙන පැළැටි වර්ගයක් (උඩවැඩියා)

බේරු-අවරිය

බොකල-බොකල වැල්

බොජුන්-බත්

බොටු-බටු

බොඩහමු-බඩහමු= කරල් එළියට නොඇදී පිදෙන බණ්ඩිය එලෙස ම පැසෙන අමුවර්ගය

බොඩහමුයාල්-බඩ අමු හාල් (අමු ඇට තුළ තිබෙන මද)

බොද-බෝධි ගස

බොඳ-ඉස්ම

බොඩ-අඟිල්

බොඩන-අඟිල්

බොඩනා-දඬකලත්

බොඩනී-වදකසා, තිප්පිලි, වම්බටු

බොඩනීය-වදකසා, තලාගස

බොරළුදමුනු-උගුරැස්ස

බොල්පනාඋඩත්තා-පුහුපනා මල්

බොලටිය-ඇස්වටය

බොලරස-වච්චනාවී

බොලුසුණු-බෙල්ලන් දවා පුලුස්සා ගත් සුණු (අළු)

බොහොඩ-කටුස්සා

බෝදන-ගෙඳ

බෝදනතුඩ්ටි-ගෙඳපලා

බෝදිඇට-කළු කොල්ලු ඇට වැනි ඇට විර්ගයක්, බාකුවී, බවුවී, (ඉදිරියෙහි සන්නිනායම් ගැණ ලියූ ඡායාරූප සහිත විස්තරය බලන්න)

බෝදිලි- බොහෝ පලදුව ඇති කුඩා පොල් වර්ගයක්

බෝදී-ඉරිවේරිය

බෝදුම්-බෝගස, ඇසටු

බෝධි
බෝධිදුම } ඇසටු, බෝගස

බෝධිපාදප- ඇසටු, බෝ, පුළුල ගස

බෝනුග-එනම් ගස

බෝපල-මීගස

බෝඹු- ලොධ්‍ර වර්ගයේ ගසක්. නියම ලෝධ්‍ර නැති වූ විට ගත යුත්තේ ලොත් සුඹුලු නොව මේ ගසේ පොතු ය. (ලොත් සුඹුළු ගැණ ඉදිරියෙහි ලියා ඇති ඡායාරූප සහිත විස්තරය බලන්න)

බෝබිජු-දෙළුම් ගස

බෝබොලු-කුඩා ගෙඩිය (ගැටය)

බෘ බ්‍ර

බෝමි—උළුල් ගස්
(සෙවෙල් බෝමි)

බෝමි
Litsaea Sebifera

මේ ගසේ පොතු දේශීය වෛදකමේ බිදුන ඇට පැස්සීමට ගන්නා ප්‍රධාන ඖෂධයකි. මේ පොතු අමුකහ සමග අඹරා ගැමෙන් සීරීම් සහ තුවාල ද සුව වේ.

අතීසාර රෝගයට හා ස්නායු දුර්ලභයට දෙන ඖෂධ සංයෝග වලට ද උළුල් පොතු ඇතුළත් ව තිබේ.

බෝරැක්-ඇසතු ගස
බෝල-වව්වනාව්, ගෙන්දගම්
බෝලිද්ද-ඉද්ද වර්ගයක්, මලිගිය වැලි

බෘඛ-ඉදි, කිකිරිඳිය, කරාබු
බෘඛරාජ-කිකිරිඳිය
බෘඛලතා-වැල්නිබ්බටු
බෘහත්ඵලා-තිත්තලබු
බෘහති- වම්බටු, ඇන් බටු, තිඹ බටු, එළ බටු
බෘහ්ර-කටරොලු
බ්‍යග්ඝි-කටුවැල්බටු

බ්‍රහ-ඉදි
බ්‍රහරාජ-කිකිරිඳිය
බ්‍රඟි-කිකිරිඳිය
බ්‍රඹලතා-වැල්නිබ්බටු
බ්‍රඤ්ජන-කරාබුනැටි, කොත්තම්ල්ලි
බ්‍රතනී-වැල
බ්‍රඨන-වරාගස
බ්‍රන්ද-ඩෙඛර
බ්‍රන්දක-බෘන්දක නම් මුඛරෝගය
බ්‍රහ්ම-ලුණුවිල, රත්කැලිය
බ්‍රහ්මකණ්ටක-පැපිලිය
බ්‍රහ්මකණ්‍යකා-ලුණුවිල
බ්‍රහ්මකාෂ්ය-පුවක්ගස
බ්‍රහ්මකෙශි-අසමෝදගම්
බ්‍රහ්මකොශ-අසමෝදගම්
බ්‍රහ්මචාරිණී-බැමිතිරිය
බ්‍රහ්මජටා- කුකුරුමුවන්, ජටා මාංශ
බ්‍රහ්මණ්‍ය-බ්‍රහ්මදාරුගස
බ්‍රහ්මතරු-රත්කාල, පුවක්
බ්‍රහ්මතීර්ථ-නෙළුම්අල
බ්‍රහ්මදණ්ඩ-පුවක්
බ්‍රහ්මදණ්ඩි-යොන්තුඹ
බ්‍රහ්මදර්භා-කොරාසානි, අසමෝද
බ්‍රහ්මදාරු-බ්‍රහ්මදාරු ගස
බ්‍රහ්මන-බ්‍රහ්මදාරු, පුවක්ගස
බ්‍රහ්මපර්ණී-පුස්වැන්න

බ්‍රා හ

බ්‍රහ්මපාදප–කැලගස
බ්‍රහ්ම මණ්ඩූකී–මකුළුවැන්න, ගොකටු
බ්‍රහ්මමේලස–මුඤ්ඣ නම් තණකොළ වර්ගීය
බ්‍රහ්මමූලි–බැමිනිරිය, ලුණුවිල
බ්‍රහ්මය–සූරියකාන්ති
බ්‍රහ්මයව–යාපුර
බ්‍රහ්මරොෂ්ට–පුවක්ගස
බ්‍රහ්මලතා–රසකිඳවැල්
බ්‍රහ්මවර්ධන–තඹ
බ්‍රහ්මවීයෂී–අහුගස, එළඹළිදවැල
බ්‍රහ්මවෘක්ෂ–කැලගස, රන්කැල
බ්‍රහ්මසත්‍රි–කෝමාරිකා
බ්‍රහ්මසෘ–බැමිනිරිය
බ්‍රහ්මසුපලා–බැමිනිරිය
බ්‍රහ්මසුවර්චලා–කෝවක්කා
බ්‍රහ්මා–මහළුන්සාල්, මකුණුවැන්න
බ්‍රහ්මාජ්‍ය–ගෝමූත්‍ර
බ්‍රහ්මාදනී–වලාවැන්න
බ්‍රහ්මාද්‍ය–ගෝමූත්‍ර
බ්‍රහ්මී–කෝවක්කා, බැමිනිරිය
බ්‍රහජ්වලා–මහබැවිල, අස්බැවිල
බ්‍රහත්–රැක්අත්තන
බ්‍රහත්පත්‍ර–සබරලොත්
බ්‍රහත්පණී–අඳුතලා
බ්‍රහත්පර්ණී––තෙලගස
බ්‍රහත්පුෂ්පි–සනගස
බ්‍රහත්ඵලා–නික්ත ලබු
බ්‍රහති–කිරිදි, වම්බටු, නිබ්බටු, මහනෙළබටු, කටුවැල්බටු, රැක්නිබ්බටු
බ්‍රහතිඵල–එළබටුගෙඩි
බ්‍රහත්‍යාදිගණය–හෙළබටු, කටුවැල්බටු, දියමිත්ත, වැල්මී, කෙළිදසාල්, යන මේ ගණය දෙස් පැසවීමට හිතයි. මූත්‍ර කෘච්ඡ්‍රාව හා තුන් දෙස් පැසවීම ද කර යි.
බ්‍රහතෙෆ–කටුවැල්බටු, හෙළබටු
බ්‍රහදෙලා–මහළුන්සාල්, සිරිවැඩි බැවිල
බ්‍රහස්පර්ණී–අඳුතලා

බ්‍රාහ්මණ–සිරිතේක්කු
බ්‍රාහ්මණකඞ්ඛා–කිම්නල්අල,ඌරල
බ්‍රාහ්මණයෂ්ටිකා–සිරිතේක්කු,
බ්‍රාහ්මණී–සිරිතේක්කු,පික්මල්
බ්‍රාහ්මී–බැමිනිරිය, (ලුණුවිල)
බ්‍රාහ්මීකඞ්ඛ–කිම්හල්
බ්‍රාහ්මීවල්ලි–සිරිතේක්කු
බ්‍රාහ්මීශාඛ–කොත්තමල්ලි

භංජන–රත්රන්
භණ්ඩාකී–වම්බටු, තිබ්බටු
භක්ෂටක–සිහින්ගොකටු
භක්ෂ්‍යපත්‍ර–බුලත්
භක්ත–බත්
භක්තක–ඇඹුල්ගස
භක්තෘටක–ගොකටු
භගෙළුලා–කොටදිඹුලාගස
භඩග–තුඹ්තවාළු, අරළු, තෙල්ලි, කුරැඳු
භඩගා–කාංසා, දුහුදු
භඩනිකා–අනිවිඩයම්
භඩනි–වැල්මදට
භඩගුර–අනිවිඩයම්
භඩෙගාදකය– ඖෂධ හර හා කොළ වගී තැම්බූ වතුර.(මේ බෙහෙත් වතුර ඇතැම් රෝගාබාධ වලදී නැම පිණිස ගනු ලැබේ.)
භඤ්ජනක–වැල් මුරුංගා
භඤ්ජී කා– සිරිතේක්කු
භඤ්ජී–සීන්දුමැඩ වැල, සිරිතේක්කු

හණ්ටාකී--වම්බටු, බටු, කටුවැල් බටු
හණ්ටාර-එළබටු
හණ්ඩාකී-තිබ්බටු, එළබටු; වම්බටු
හණ්ඩිකොා-බඳුවද
හණ්ඩිලොා-මහරි
හණ්ඩී-වදගස, වැල්මදට, මාරා
හණ්ඩීර-සුළුකුර,මාරා, වැල්මදට
හණ්ඩීරලතිකා-වැල්මදට
හණ්ඩීරිකා-වැල්මදට
හණ්ඩීරී-මිදෙල්ල, වැල්මදට
හණ්ඩීල-මාරා ගස, මහරි
හණ්ඩුක-තොටිල
හද්‍ර-බුලත්, කළුරියම්, කලාඳුරා, ඉරමුසු, දේවදාර, බක්මී, මහ කුර, රත්රන්, දළුක්, කෙළිද, සඳුන්, නිල්මානෙල්, අලකිරිය, ගොකටු
හද්‍රක-කලාඳුරා
හද්‍රකණ්ටක-ගොකටු
හද්‍රකණ්‍යා-ඉරමුසු
හද්‍රකාණ-ඉරමුසු
හද්‍රකාශ්මරී-ඇද්දෙමට
හද්‍රකාශී-කලාඳුරා
හද්‍රකාෂ්ඨ-දේවදාර
හද්‍රකුම්භා-ඇද්දෙමට
හද්‍රගන්ධ-බෙලිගස
හද්‍රගන්ධිකා-කලාඳුරා
හද්‍රජ-කෙළින්ද
හද්‍රදාරු-දේවදාර
හද්‍රනාම්කා-බැමිනිරිය
හද්‍රපර්ණිකා-ඇද්දෙමට
හද්‍රපර්ණී-සාරණ, ආපසුමදු, ඇද්දෙමට
හද්‍රඵල-ඇද්දෙමට, පියාගස
හද්‍රබලා-වැල්බැවිල, ආපසුමදු
හද්‍රබණ්ඩී-ගසුබු
හද්‍රම්ලලිකා-යොන්තුඹ, බෝලිද්ද
හද්‍රමුස්ත-කලාඳුරා, (වම්මුතු)
හද්‍රමුස්තක-කලාඳුරා, (වම්මුතු)
හද්‍රයව-කෙළිඳු ඇට, කෙළින්ද ගස
හද්‍රවති-ඇද්දෙමට
හද්‍රවර්ණී-ඉද්දගස
හද්‍රවල්ලි-ඉරමුසු
හද්‍රවලා-ආපසුමදු, වැල්බැවිල
හද්‍රශාල-යහපත් සල්ගස, සුන්දර වෘක්ෂය
හද්‍රශ්‍රී-සඳුන්
හද්‍රශ්‍රී-එළ සඳුන්, රත්සඳුන්
හද්‍රශ්‍රීය-කලාඳුරා
හද්‍රසක්‍රපද-දේවදාර
හද්‍රසිරි-සඳුන්
හද්‍රා-බුලත්වැල, ඊතණ, සුදු බැවිල, පුස්සමන්, බැමිනිරිය, හීන් ඉරමුසු, ඇත්දෙමට, කුරපලා,
හද්‍රාපත්‍රිකා-කන්සා
හද්‍රාලි-මැසිඳ
හද්‍රාශ්‍රය-සඳුන්
හද්‍රොලා-මහ එන්සාල්
හද්‍රොදනී-සුලු බැවිල
හද්‍රොඛනී-සුළුබැවිල
හනස්-බදුල්ල
හම්භරාලි-මැසිඳ
හයනාශිනී-ලුණුවිල
හර්ජක-ඇඹුල
හර්තාල්‍යපත්‍රක-මහබෙරා
හයාී-වැල්පෙනෙල
හර්ල, හර්ලනක, හර්ලතකි, හර්ලි } බදුල්ල
හරොඛා-දැවගස
හල්ලාතක-සෙන්කොට්ටම්, හල් ලාතක වෙනුවට ප්‍රතිනිධි වශයෙන් බදුල්ල මේ රටේ ගණිති. මේ දෙවගස ම විෂ සහිත ය. විෂ මරා ගත යුතුයි.

හා හි

හල්ලුක-මහමිදි, තොට්ටිල
හව්‍ය- ගජතිප්පිලි, කාමරංගා, හොඬපර, සිවිය
හවෘපතඹග-වරාගස
හෂ්ම-අළු, අමුකපුරු
හෂ්මක-රත්‌රන්, රිදී, වළඟසාල්, වටරුහැණ
හෂ්මගන්ධිනී-රුහැණිය, (වාල්ඹොලඟු)
හෂ්මගර්භ-කෝන්ගස
හෂ්මගර්භා-සැමගස, ඇට්ටරගස
මූත්‍රඵල-නියඹරා, කැකිරි
මූත්‍රලා-කැකිරි
මූත්‍රහරා-රසකිද
මූදුපෙණ-මීවදයක ඇතුළට සමාන කිළිටි සුදු පාවින් යුත් කැටි ගැසී සැදී තිබෙන ලුණුකැට වැනි තද ද්‍රව්‍යයකි. ඇතැම් අය මූදු පෙණ වලට දැලිපොතු ද ගණිති.
මූනවිකිරිකොළ-උදුපියලි

මූනමල්—මුගුණ ගස්

මූනමල්—වකුල

Mimusops Elengi

මුගුණ ගස, මුහුණ මල් ගස, මුන මල් ගස යන නම් වලින් සිංහළයන් අතර ප්‍රසිද්ධ මේ ගස මනුෂ්‍ය ශරීරයට හිතකර ය. මෙහි පොතු හා ඇට, දත් සෙලවීම, විදුරුමස් දියවීම, විදුරුමස් වලින් ලේ සාරේ යාම, තොල් පැලීම ආදි මුඛ රෝග පිළිබඳ ආබාධ වලට හා හෘදයාබාධ වලටත් ප්‍රත්‍යක්ෂ ඖෂධයකි. දන්ත රෝග පිළිබඳ හැම බෙහෙතකට ම පාහේ මුහුණ මල් පොතු ද ඇතුළත් ව ඇත.

කුඩා බුළු ගෙඩි පමණ වූ මේ ගස් වල ගෙඩි කසට-පැණි-පිටි රසයන්ගෙන් යුක්ත ය. දන්ත රෝග වලක්වා ගැණීමට හා ආහාරයක් වශයෙන් ද මුගුණ ගෙඩි කෑමට යොග්‍ය ය.

මූර්ධව-ඉස
මූර්ධවචාරිණී-මොරගස
මූර්ධවපුෂ්ප-මාරාගස
මූල-ඉරිවේරිය, තිප්පිලිමුල්, මුල් වශී
මූලක්කණ-තිප්පිලිමුල්
මූලක- නිතිවැල්, අඳුතලා, ලීමෑ නියඹරා,තිප්පිලිමුල්
මූලකනිකා-නියඹරා වැල,
මූලකපත්‍රිකා-මුරුංගා,
මූලකපර්ණී-මුරුංගා,
මූලජ-අමු ඉඟුරු, මුල් වලින් අල සෑදෙන මානෙල්,කලාඳුරා,
මූලප්-පළොල්,
මූලපුෂ්කර-නෙළුම්අල,
මූලපෙෂ්කර-කොට්ටම්,
මූලඵල-කොස්ගෙඩිය,
මූලරස-මුරුවා
මූලශාඛන-පොණ්ඩරු
මූලා-භාත වාරියඅල
මූලිනී-බැමිතිරිය,බිම්නුග
මූවිට-මූත්‍රමාංසීය
මූෂණ-තිප්පිලිමුල්,මිරිස්
මූෂා-රත්‍රන්මකන කෝව
මූෂිකපර්ණී-මීකන්පලා
මූෂිකපාෂාණ-මීපාසාණම්
මූෂිකවපු-මීනුගගස
මූෂිකවිනාශනී-දේවදාලි
මූෂිකා-දේවදාලි

මෘ

මූෂිකාගනි-දේවදාලි
මූෂිකාඞ්ගී-තිත්තවැටකොළු
මූෂිකාශ්‍රවනා-මකුණුවැන්න
මූෂිකාහ්වා-දැත්ත

මෘගගාමිනී-වලහසාල්
මෘගනාභි-කස්තුරි
මෘගනාභිනී-වලහසාල්
මෘගනාලිකා-කිරිබදු
මෘගපර්ණී-ගොකටු
මෘගපාශි-රසකිඳ
මෘගභක්ෂ්‍යා-ජටාමාංශි
මෘගමද-කස්තුරි
මෘගරසා-මගුල්කුඹුරුවැන්න, මහ බැවිල
මෘගරාට්කා-රසකිඳ, රත්තම්පලා, කිරිපලා
මෘගරූවිකා—කිරිපලා
මෘගසාරා-වලහසාල්
මෘගා-මහබැවිල
මෘගාක්ෂි-මහගොන්සුතු කැකිරි
මෘගාණ්ඩජ-කස්තුරි
මෘගාදනී-මහ ගොන්සුතු කැකිරි, තුඹගෙඩි
මෘගාරි-රත්මුරුංගා
මෘගෙර්‍යාරු-සුදුකැකිරි
මෘචවස-වව්වනාවි
මෘඩ-මහගොන්කැකිරි
මෘඪා-මහගොන්සුතුකැකිරි
මෘණාල-නෙළුම්අල, සාවැන්න
මෘණාලසූත්‍ර-නෙළුඔල
මෘණාලිකා-කිරිබදු
මෘත්ස්නා-තුබරි
මෘත්සකලා-කටුරෝහිණී
මෘතඥීව-මාරාගස

මෘතඵලී-කොට්ටම්
මෘතඝගම-පල්මානික්කම්
මෘතාඩි-අරළු
මෘතාලක-තුබරි
මෘතඵී-දළුක්, මහළුක්
මෘතඵීනාසක-රසදිය
මෘතඵීපුෂ්ප-දළුක්ගස
මෘතඵීඵල-කෙසෙල්ගස
මෘතඵීනාශක-පාරද (රසදිය)
මෘතඵීදීක-බටගස
මෘද්වීකා } මුද්දරප්පලම්
මෘද්වී }
මෘදඝඵලිනී-වැටකොළු
මෘදු-කිතිබුරුද, චිත්‍රානුපත්‍රවෘක්ෂය
මෘදුකණ්ටක-රත්වන් කටුකරඹු, කටුකරඹු
මෘදුකාඩ-බුරුද
මෘදුකාණ්ඩක්-බුජපත්‍ර
මෘදුචර්මීත්-කරගස, ගල්මොර
මෘදුවර්මීත්-කරගස, බුජපත්
මෘදුත්වච-දුම්මල, කරගස
මෘදුපත්‍ර- සුළුකුර, කුරතම්පලා, කිරිහාන්ද
මෘදුපර්ණී-දුරාලභා
මෘදුපර්වක-වේවැල
මෘදුපුෂ්ප-වැළුක්, මාරාගස
මෘදුඵලා-මුද්දරප්පලම්, උගුරුස්ස, තැඹිලිගෙඩි
මෘදුලෝහ-කළු ඊයම්
මෘදුලෝහකම්-කළු තුඹ
මෘදුවිරෙචනී-පතුක්
මෘදුසිව-නිල්ලෝලු
මෘද්ධි-සුළුදඩකලත්
මෘෂට-මිරිස්
මෘෂ්ටි-උඟුරල (බිම්තල්)
මෘෂ-වව්වනාවි
මෘහපානි-රසකිඳ

මෙ මේ

මෙඅත්-බත්
මෙඛලා-පුස්වැන්න
මෙගතාරායන-මාන්සවේරිය, අක්කපාන
මෙගලක්ඛක්-වැල්මුරුංගා
මෙඝ-ඉරිවේරිය, කලාඳුරු
මෙඝකර්ණ-සුළු කුඹුක්
මෙඝකුසුම-තෝරගස
මෙඝදීප-ලියනහලා
මෙඝනාද-සුළුකුරු, කුරතම්පලා
මෙඝනාළන්-කලාඳුරු
මෙඝපුෂ්ප-වතුර
මෙඝභව-කලාඳුරු
මෙඝරාව-සුළුකුර
මෙඝලෝචන-රන්වන් කිකිරිඳිය
මෙඝවණී-බඵදම්, බෙරු
මෙඝවණීා-නීලී වෘක්ෂය (අවරිය)
මෙඝවාසිනී-මයිල ගස
මෙඝවිනාසිනී-දියබෙරලිය
මෙඝසථානෝද්භව-උගුරුස්ස
මෙඝසම්භව-ඉරිවේරිය
මෙඝසාර-චීනකපුරු, දෙඹගස
මෙඝා-ඩෙබර
මෙඝාක්ෂ-තුවර ගස, කිකිරිඳිය
මෙඝාණඩ-ඉකිරි
මෙඝාහා-බලුදම්
මෙවක-කළුලුණු
මෙට(ඩ)-ඔල්මාදය
මෙථී-උළුවා
මෙථුලා-නෙල්ලි
මෙත්තා-සඳුන්
මෙපිකා-වල්උළුවා
මෙෂී-උළුවා, (උළුවාහාල්)
මෙද-ගුරුන්ද ගස, මිනීඇට
මෙදක-රසදිය, කුන්දුරුක්කන්, මේද තෙල
මෙදඃ-ගෝරෝචන, මේවන්
මේදුග්ව-මේවන්
මේදිනී-මහ වැල්පෙනෙල
මේදුර-සිහිදුදෙය
මේදෝ-මේදතෙල
මේදෝත්භවා-මේවන්
මේඛ-හෙළඟිඹුරු
මේධා-බැමිතිරිය, හෙළවදකසා
මේධාකරී-වදකසා
මේධාක්‍ය-කලාඳුරු
මේධාජනනී-බැමිතිරිය
මේධ්‍ය-රන්වන් වදකහ, කිහිරි, යව, සක්මල්, ගොරද
මේධ්‍යමුඛ්‍ය-කස්තුරි
මේධ්‍යා-පිරිසිදුදෙය, ලුණුවිල
මේධ්‍යාහාර-දී ආදිය
මෙන-මැණික්
මෙනා-මුහුණ
මෙනෙල-මෙහෙණල
මෙරට ආවා-අමුකහ
මේරය-ධාන්‍යාදියෙන් කළ සුරා
මෙල්ල-ලප්තාරං
මෙල්සිනි-උක්ගස
ශ්ලේචජගන්ධ-හෙළ ලුහුනු
මෙලචජමුඛ-තඹ
මෙලඩි-හෙළ සාබෝ
මො-බෙරා, අඳුන්
මෙලොවඅළුකරණදළ-වරා කොළ
මෙවන්-මේදා
මෙෂ-තෝරගස, එළුවා
මෙෂක-ඇන්තෝර
මෙෂලොචන-තෝරගස
මෙෂලොම-රන්වන්කිකිරිඳිය
මෙෂවල්ලි-මැඩහඳු
මෙෂවිෂාණී- වෙල්ලිප්පරත්නි, (මැඩහඳු)
මෙෂශෘඞ්ගී-වච්චනාවි, මැඩහඳු

මේ මා

මේෂා-අඳුනලා, හීන් එන්සාල්
මේෂාක්ෂ-තුවර ගස, කිකිරිඳිය, තෝර
මේෂාක්ෂිකුසුම-තෝරගය
මේෂාක්ෂී-තෝරගස
මේෂාඛ්‍යි-මැඩහතු, වව්වනාවි
මේෂාණ්ඩ-කුකුරුමාන්
මේෂාලු-අඳුනලා, වේලා
මේෂී-ජටාමාංශ, කෝන්ගස
මේසෙස්-සජීවිෂ
මේහඛ්නී-කහ
මේහනාශනී-සුදු කටරොළු
මේහරිපු-රණවරා, වැල්මුරුංගා
මේහවිනාශිනී-දියබෙරලිය
මේහෙනල- ලුණුවිල, මානෙල්, කිඩාරම්
මේහොදරී-සීන් සාතාවාරිය

මේ-වම්මුතු
මේඝ-කලාදුරු, කුරතම්පලා
මේඝඅල-කලාදුරු අල
මේඝනාද-සුළුකුර
මේඝමුත්ත-කලාදුරු අල
මේදූ-මේවන් (අෂටක වර්ගයේ ඔසුවක්)
මේනල-මේහෙනල, (මේහෙතල්-ආතැම්) ලුණුවිල
මේනී-කුප්පමේනිය
මේල්-උක්
මේල්සිනි-උක්ගස
මේල-සීනි, උක්ගස
මේශනාසනී-සුදු කටරොළු
මේෂකා-වැල්මදට
මේසක-ඇත්තෝර
මේසිකා-වැල්මදට
මේහ-ප්‍රමේහ රෝගය
මේහරිපු-රණවරා

මෛරෙය-මිලිත මල්, උක්සකුරු, කොත්තමල්ලි,ඇඹුල්කාඩි,සුරා, කරල්සෑබෝ
මෛල-මයිලගස්
මෛලංගං-ලුණුවරණ, ලොත්ගස
මෛලාතතා-මයිල
මෛලෙය-ගොකටු, එන්සාල්

මොක්ෂ-වළඟසාල්, තෙළඹු, පළොල්
මොක්ෂක-ඇපල, දේවදාලිය, හෙළ පළොල්
මොගංචිය-අසමෝදගම්
මොඝා-පළොල්
මෝචි පොල්ගස, කොස්ගස, මුරුංගා ගස, බෙරා, ඉඹුල්,තල්ගෙඩි, කෙහෙල්ගෙඩි,
මෝචක-ගෙන්දගම්, මුරුංගා, ඇළුණු, වළඟසාල්, හොයඳුන්, කෙසෙල්
මෝචකී-මුරුංගා,මහඉඟිනි, ඉඹුල්,
මෝචන-කටුවැල්බටු
මෝචරස-ඉඹුල්ලාටු
මෝචශ්‍රවා-ඉඹුල්ලාටු
මෝචා-ඇටකෙහෙල්, ඉඹුල්, ඉන් සළු ගස,
මෝචාට-කළුදුරා, ඇටකෙහෙල්
මෝචි-මීමුරා
මෝචික්වාෂහ-ගොන්කැකිරි
මෝජ-අසමෝදගම්
මෝජනණ-මුඇඳ් නම් තෘණ වර්ගය
මෝට්ටු-කැකුල
මෝට-දෙහි
මෝටඳඩියා කොළ-පඩ (උඩ හළු) වැල්

මොටපාටි

මොටපාටි-සුළුබුබැවිල්ල
මොටා-බැවිල්ල
මොඩකොත්තාන්-වැල්පෙනෙල
මෝද-අසමෝදගම්
මෝදක-අග්ගලා, කුන්දුරුක්කත්
මෝදගස්ත්‍රා-අසමෝදගම්
මෝදමෝදඛ්‍යා-අසමෝදගම්
මෝදමෝදිනී-ජම්බු
මෝදයන්ති-වල්ඉඳ්ද
මෝදරකන්නිය-හුළුවැල්
මෝදූ-අසමෝදගම්
මෝදිනී- සුරා, ඉඳ්ද, අසමෝදගම්, සමන්කස්තුරි, ඇත්දෙමට
මෝනරකුඩුම්බිය-දුටුසතුටු
මෝනරත්ති-උළුවාහාල්

මොනරපහුරු



මොනරපහුරු

මොහොරු

මෙය **කඩුපහර** පැළයක් මෙන් දෙපසට බෙදී යන කොළ ඇති තිතර දිය සීරාව සහිත ගල් උඩ හටගන්නා පැලැටියකි. මෙහි මල් **ඕකිඩ** (උඩවැඩියා)මල් වැනි ය. ඒ මල් පරවූ විට බුත් සරණ ඇට පමණ ගෙඩි පොකුරු සැදෙයි. මෙහි මල් සහ ඉදුන ගෙඩිත් මොණරපිල් (මයුරපිච්ඡ) පැහැයෙන් යුක්ත ය.

මේ පැලැටිය සහමුලයෙන් ම ගෙඩි-වණ-තුවාල සඳහා ගන්නා බෙහෙත් වට්ටෝරුවල ඇතුළත් කර තිබේ.

මොනරසිළු- හෝපළු, පවුරු තල් ගස
මොරට- බොරළුදමුණු, මුරුවා, නියඳ, උක්මුල්, මැඩහඳු, අඟුණ මල්, සත් රැයක් පිලුනු කළ කිරි
මොරටි-මුරුවා
මොරබ්ජු-පියා (මොර) ඇට
මොරවා-මුරුවා වැල්
මොලඟු-ගම්මිරිස්
මොවුනල-මානෙල් අල
මොසා-අරළු
මොහවන්දන-ගෝරෝචන
මොහන-ගෝරෝචන, අත්තන,
මොහිනී-නීත් ඩෙබර, බුලත්, තුන් බෝ අත්තන
මෝනී-කන්සා
මොහොඵුන-කුප්පමේනිය
මොහොර-කිරිමෝරු
මොහොරු-මෝරු

මෝ මෙෆ මෙල ය

මෝකපාල-කටුවල අල
මෝගංචය-අසමෝදගම්
මෝච-ඇට කෙසෙල්, (ර ඹ) කොස් ගස, තෝර
මෝචක-වලහසාල්, ඉඹුල්
මෝචයුග්මය-ඇටකෙසෙල්, මස් කෙසෙල් දෙවගය
මෝච රස-ඉඹුල් ලාටු
මෝචා-ඉඹුල්, ඇටකෙසෙල්
මෝචි-මී මුරුවට
මෝචික් වෘෂබය-ගොන්කැකිරි
මෝටාපාටි-සුළු බූ බැවිල
මෝදක-අසමෝදගම්
මෝදගම්-අසමෝදගම්
මෝදන-තිබ්බටු
මෝරට පත්-මුරුවා කොළ
මෝරිය-මුඛ රෝගයක්
මෝවික්-ගොන් කැකිරි
මෝහි-කංසා
මෝහිනී මජර-කුප්පමේනිය

මෙෆක්තික-මූතු
මෙෆක්තික ප්‍රභවා-මූතුබෙල්ලා
මෙෆක්තික ශුක්ති - මූතු බෙල්ලා
මෙෆඤ්ජි-ඊතණ
මෙෆඤ්ජි පත්‍රී-පොතු
මෙෆදුම්බර පල-අට්ටික්කා
මෙෆර්වී-නියඳ, මැඩහඳු
මෙෆලී-හෝපළු ගස
මෙෆශලී-බින්තල්

මෙලචඡ-මිරිස්, සාදිලිංගම්
මෙලචඡ කන්‍ද-පීනු
මෙලචඡාඛ්‍ය-තඹ
මෙලචඡගන්ධ-සුදු පීනු
මෙලචඡජ-මිරිස්, සාදිලිංගම්
මෙලචඡප්‍රිය-හොඳ මිරිස්
මෙලචඡඵල-කෝපි
මෙලචඡමුඛ-තඹ
මෙලචඡා-කෝපි

යක් ඇස් පත්-කුඹුරු කොළ
යක් ඇස් බිජු-කුඹුරු ඇට
යක් එරබදු-සෙවන මකුර, පාරිභද්‍ර (එරබදු වගීයක්)
යක් කොම ඩු-ඉඳ වා රැණි, =(ඩොංග පුහුල්=ඔඩ්ඩි පුහුල්)
යක් බේරිය-අඬනහිරියා, වේලුනු කරල් සොලවන විට නාදයක් (හඬක්)නිකමෙන පැණි තෝර කොෂ්ඨ වලට මදක් සමාන අඩි තුනකට වඩා උස් නොවූ පැලෑටිය කි.
යක්ෂ-කුඹුරු ඇට
යක්ෂක-මාරා ගස
යක්ෂකදීම-කොකුම් මල්, අගිල්, කස්තුරි, කපුරු, හඳුන්, මේ හැම සම භාගව මිශ්‍ර කිරීම යක්ෂකදීම නම් වේ.
යක්ෂ තරු-නුග ගස
යක්ෂ දෘක් } කුඹුරු වැල
යක්ෂ දෘග් }
යක්ෂධූප-දුම්මල
යක්ෂ ඵල-ඉඟිනි ඇට
යක්ෂභූෂණ-ඉළුක්
යක්ෂමස්නි-මුද්දරප්පලම් වැල
යක්ෂමොදංස-මුරුංගා
යක්ෂවෘක්ෂ-තුන් පුළිල
යක්ෂශ්‍රෙෂ්ඨ-බෝධි ඇට
යක්ෂාක්ෂී-කුඹුරු වැල, කුඹුරු ඇට
යක්ෂාම්ලක-පිණාඩා ඉදි ගෙඩි
යක්ෂාවාස-නුග ගස

යක්ෂී

යක්ෂී-කටුපිල ගස
යක්ෂ්මඝ්නී-මුද්දරප්පලම්
යක්ෂ්මා-ක්ෂයරෝගය
යකා බැඳි වැල්-ඉසඟු හෝ වැල් දෙනි වැල්. ඉසඟු = ඉය හෝ වැල් දෙනි
යකා වනසු- යකවනස්ස (යකු වනස්ස)
යකැස්-කුඹුරු ඇට, කුඹුරු වැල
යකින්නතලා--තලා වර්ගයක්

යකිනාරන් - නද පැහිරි ගතියෙන් යුත් ගස් වර්ගයක්



යකිනාරන්

Atlantia Zeylanica

යකිනාරන් පමණ නද පැහිරි සුවඳින් යුත් වෙන පැහිරි ගස් වර්ගයක් නැත. මෙහි කොළ මැඩිය කොළ වලට නැතහොත් දෙඛම්පනා කොළ වලට සමාන ය. කදෙහි සහ අතු වල ත් අහල එක හමාර දක්වා දික් වූ නියුණු කටු ඇත. මෙහි මල් කරඹ මල් වලට සමාන ය. තටුවලා රත් පැහැයෙන් සහ මල් පෙති සුදු පැහැයෙන් යුක්ත ය. මේ ගසේ අතු අග ප්‍රමාණයෙන් නිබ්බටු ගෙඩි පමණ හා ගැඩහුරු කමින් මදනකාමපූ ගෙඩි වැනි ගෙඩි පොකුරු සැදෙයි

මේ ගසේ කොළ කොටා මිරිකා ගත් යුෂ සෙම් පැසවීම සඳහා කැඳ පිසීමට ත්, ප්‍රතිශ්‍යාව නරක් වී සෙම වියළන විට එම සෙම බුරුල් වීම සඳහා තම්බා වේදු පැම් (දුම් ඇල්ලීම්) ට ත්, ආතැම් සන්නි රෝග සඳහා කොළ යුෂ නශ්‍ය කිරීමට හා යකුවනස්ස, නික, කුඹුරු කොළ සමග ගිනි කබල් වලට දමා දුම්පා සෙවද ගැන්වීමට ත් පාවිච්චි කරති.

යකිනාරන් මුල් කෂාය-තෙල්-බෙහෙත් වර්ග සඳහා අවශ්‍ය ඖෂධ යොග වලට ගණිති.

යකිවනසු (ස්ස)- යකුවනස්ස ගස
යකු-කුඹුරු ඇට, යකවනස්ස, යක් බේරිය
යකුන් එබුව - යකෘත්වේෂ වූ ව (තනිකම නිසා රෝගී වූ අය)
යකුනෙත්-කුඹුරු ඇට
යකුවනසු-යක්වනස්ස
යකෘත්ච්ඡාල-උදර රෝගයක්

යකෘත් යවනාමකා

යකෘත්-අක්මාව, එය වැසීමෙන් ඇති වන රෝගය.
යඤ්ඤ අඹග-දිඹුල් ගස
යකෘත් වෛරින්-එරබදු ගස
යඤ්ඤක-කෑල ගස
යඤ්ඤපුප-දුම්මල
යඤ්ඤනෙතා-මුවකිරිය, මූනමල් ගස
යඤ්ඤභූෂණ-සුදු කුසතණ, ඉළුක්
යඤ්ඤයෝග්‍ය-අත්තික්කා
යඤ්ඤවල්ලි-බෝදි ඇට
යඤ්ඤවෘක්ෂ-නුග ගස
යඤ්ඤශ්‍රේෂ්ඨා-බෝධි ඇට
යඤ්ඤසංස්ථරණ-ඉළුක්
යඤ්ඤසාර-දිඹුල්
යඤ්ඤඔග-ඉළුක්, කිහිරි,අත්තික්කා
යඤ්ඤඔගික-කළු කිහිරි
යඤ්ඤයොග-අත්තික්කා, තුන්පුඹිල
යඤ්ඩික-කළුකිහිරි
යඤ්ඩිකා-ඉළුප්
යඤ්ඩි පුණ්‍ය-මුවකිරිය
යඤ්ඩෙය-ඉළුක්
යඤ්ඩුම්බර-දිඹුල් ගස
යජ්ජ-දුම්මැල්ල
යඤ්ඤඤ්ඤඟොධ-දිඹුල්
යට්ටි-වැල්මී
යටි-ලතාව, වැල්මී, වැල්මදට
යතිද්‍රු-මුරුංගා
යදූල්-යබොර, යකඩ මළ
යදූල් සුන්නෙන්-යකඩ කුඩු වලින්
යඳුග-පඳොක්
යපත-යකඩ තහඩුව
යම දූතිකා-සියඹලා
යමනිකා-අසමොද
යමප්‍රිය-නුග ගස
යමල-හිඹුල්, යකඩ මල
යමලකණ්ටක-දළුක් ගස
යමලපත්‍ර-පොල්පලා
යමලපත්‍රිකා-කොබෝලීල ගස
යමලපුෂ්පක-කොබෝලීල ගස
යමල ඵල-මහ වැල් පෙතෙල, උන ගස
යමලාඵලා-කිරිඳි
යමානිකා-අසමොදගම්
යමානී-අසමොදගම
යමුනා-හොයඳුන්
යමෝ-අසමෝදගන්
යර්ජ-දුම්මල්ල
යල හැනි-මල්කැන
යළුව-සාලියා අරිසි
යව-හුන වී, අස මොදගම්, යව හාල්, කොල්ලු
යවංගු-සීනි
යවඃ-අරළු ගස
යවක්ෂාර-යවකර ලුණු
යවක-කළුතලා, යවධාන්‍ය, කෙකටිය
යවකණ්ටක-හීන් සාතාවාරිය
යවකර-යවකර ලුණු
යවජ-අසමෝද, යවකර ලුණු
යවතාෂ්ටශ-කොසඹ
යවතික්තා-ඇල් වී, අරත්ත, යක් බෙරිය, චිරතා
යවදනායා-බැදි සාල්
යවදූනි-අසමොදගම්, ශතපුෂ්ප
යවධානිකා-අසමොදගම්
යවධාන්‍ය-බැදිසාල්
යවධාන්‍යක-යව වී, අසමොදගම්
යවන-හිරිඟු
යවනදර්ෂ්ට-ගුගුල්
යවනප්‍රිය-මිරිස්
යවන සමන්-ගැටපිච්ච
යවනාම්නා, යවනාමකා } හීන් අසමෝදගම්

යා

යවකාලජ-යවකර ලුණු
යවතෙෂට-කොසඹ, මහ ලුහුනු, මිරිස්, ඉඳි, ඊයම්, ලූනු, මැඩ හඟු, වව්වනාවි
යවපත්‍ර=(යවන පත්‍රිකා)-උඩැත්ත
යව පත්‍රික
යව පත්‍රිකා } උඩැත්ත
යවපුෂ්පි-සඹර ලොත්
යවප්‍රභ්‍යා-යව ඇට වැනි කුෂ්ටය
යවඵල-උණ ගස, කෙලින්ද, ජටා මාංශ
යවරෝද-අරළු
යවලාස-යවකර ලුණු
යවලූෂ-යවකර ලුණු
යවශූක-යවබූව, යවකර ලුණු
යවශූකජ-යවකර ලුණු
යවශාර-යවකාර ලුණු
යවසෝ-තාණ වගීයක්
යවා-යව නම් වූ ධාන්‍ය වගීය
යවාගු-හුළු කැඳ (ලුණු කැඳ), බත් ඇට මෙන් සය ගුණයක් වතුර යොදා ඇති කැඳ වෙසෙස
යවාග්‍රජ-කාඹි දිය, යවකර ලුණු
යවානීකා-මහ අසමොදගම්
යවානී-කළුදුරු, හින් අසමොද, මහ අසමෝද
යවාපත්‍ය-යවකර ලුණු
යවාම්භ-යව කැම්බු දිය
යවාම්ලජ-කාඹි, ඩෙබර ගස
යවාස- ධන්වයවාස (දුරාලභා) වෙනුවට ප්‍රතිනිධි වශයෙන් ගැණීමට ඉන්දියානු පඬුවන් විසින් නියම කරණ ලද ඉන්දියානු පැලෑටියකි. මෙ දෙවගීය වෙනුවට ම ලඞ්කාවේ ගන්නේ වැල් කහඹිලියා ය. 250 පිටේ දුරාලභා ගැණ ලියූ විස්තරය බලන්න.
යවාහ්ව-යවකර ලුණු
යවාහ්වා-අසමොදගම්
යවොත්ථ-කාඞි, නොයඳුන්
යශෂ්කරී-කිරි පලා
යෂ්ට්‍යාහ්ව-වැල්මී
යෂ්ටි-හින් මිදි, නිප්පිලි, වැල්මී, රත්හඳුන්, වැල්මදට
යෂ්ටික-වැල්මී
යෂ්ටිපුත්‍ර-බුත්සරණ
යෂ්ටි පුෂ්ප-ජීවක ගස
යෂ්ටිමධු-වැල්මී
යෂ්ටිමධුක-රත් හඳුන්, වැල්මී
යසසී-කුඹුරු ඇට
යහපුහුරු-යහ වපු (ශතපුෂ්ප)
යහවපු-ශතපුෂ්ප
යහුණු-යකඩ කුඩු

යාගු-කැඳ
යාගු (කැඳ) ගුණදසය:-ආයු, වණී, සැප, බල, ප්‍රතිභාන ඇතිවීම, සා, පිපාස ය දුරුවීම, වාතය අනුලොම් වීම, වස්ති ශොධනය හා ආමාවශෙෂය පහ වීම යන මේ ගුණ දසය බුදු රජාණන් වහන්සේ විසින් විනය පිටක දේශනාවෙහි දී වදාරණ ලද්දකි.
යාගෙක්ෂක-වැලුක්
යාචන-තුරුක් තෙල්
යාජ්‍යඩික- කැල, එරබදු, කිහිරි, ඇසටු
යාතුඞ්න-ගුගුල්
යානෙසිකම්ල්-ඇද්දෙමට
යානෙසිතකර-ඇත්තෝර
යානෙසිවනන්ගි-ඇත්සැවිය
යාපුර-හිරිල =(බ්‍රහ්ම යව) (තෝ වැල්ල=රට බුලත්)

යු යූ යෙ යෝ

යාපය- සන්සිඳවන්ට පුළුවන් ලෙඩ
යාබ-ලාකඩ
යාමුන-හොයඳුන්
යාමුනෙෂ්ටක-කළු ඊයම්
යාම්‍ය-හිඹුල්
යාම්‍යක- කතුරු මුරුංගා ගස, හඳුන් ගස
යාම්‍යාද්‍රු-ඉඹුල් ගස
යාම්‍යොද්භූත-දකුණු දෙසෙහි හට ගත්නා ශ්‍රීමත් තල් ගස
යාවකෝ-ලාකඩ
යාවන-අසමොදගම්
යාවනාල-ධාන්‍ය ප්‍රභෙද
යාවපු-ශතපුෂ්ප
යාවශූක-යවකර ලුණු
යාස-යවාස (ඒ වෙනුවට මේ රටේ වැල් කසඹිලියා ගණිති)
යාසක-යවාස

යුකතරස-අරත්ත
යුග්මකණ්ටක-ඩෙබර ගස
යුග්ම පත්‍ර-රුක් අත්තන, රතු කොබෝලීල, ඉන්සළු
යුග්මපත්‍රක-කොබෝලීල
යුග්මඵලා-මහ ඩෙබර, ඇත් සැටිය, කිරිදි
යුගය-මහදබ කලන්
යුග-යුග්ම, (දෙක)
යුගදල-කොඩලීල (කොබෝලීල)
යුගපත්- කොබෝලීල ගස, ඉන්සළු ගස
යුගපත්නිරු-අත්තන, තුන්බෝ අත්තන
යුගපත්‍ර-කොබෝලීල ගස, ඉන්සළු ගස
යුගපත්‍රක- කොඩලීල (කොබෝලීල)
යුගලාඛ්‍ය-රම්මානිස්ස
යුජ්‍යමානක-සුදුදුරු
යුති } බෝලිද්ද
යුතිකා }
යුවති-කෝමාරිකා
යුවතීෂ්ටා-පිච්ච
යුවලපත්-කොබෝලීල
යුස-ඉස්ම, මුංඇට ආදිය තම්බා ගත් රසය

යූපිකපණ්-අනිත්ත
යූපිකා-බෝලිද්ද
යූපී-දියමිත්ත, බෝලිද්ද
යූප-තුන් පුළිල
යූපද්‍රු-කිහිරි ගස, යුෂ, මුං ආදි යෙහි යුෂ

යෙල කලද-කලන් බාගය
යෙළුකන්-වැල් මදට

යොගක-පතහි
යොගවහා-මුරුවා
යොගවාහි-පිත්තල, ගල් සෙවෙල්
යොගී-මුරුවා
යොගෙෂ්ට-කළු ඊයම්
යොග-යෘද්ධි නම් ඖෂධය, සුළු දඩ කලන්
යොජන ගන්ධා-කස්තුරි
යොජන පර්ණී-වැල් මදට
යොජන වල්ලී-වැල්මදට
යොජනා-කකීටක ශ්‍රිංගී
යොන් ඉදි-රට ඉදි
යොනී-චතුර
යොමු-පිච්ච මල්

යෝ ර

යොය-නෙරි විස
යොෂික් ප්‍රියා-කඟ
යොහොඹු-ගැට පිච්ච, මාලතී (මල ගිය මල්)
යොහොඹු වැල්-ගැටපිච්ච වැල්

යෝග-යෙදීම
යෝගා බිජූ-කණ්ටක මූල, කින් නරා ඇට
යෝනි-යකුවනස්ස
යෝනිය-යකුවනසු, උතු මග
යෝනි ව්‍යාපත්ති-සත්‍රී රෝගයක්
යෝනී-වතුර
යෝය-නෙරිවිස, වව්වනාවි
යෞවනී-යකුවනසු, කෝමාරිකා

රංච-රත්කෑල
රංජනී-අවරිය
රංස-මනෝසිල, සවින්දවලුණු
රංනොලිච්-පිලඟස
රක්-මනෝසිල, රත්හිරියල්
රක්කළල්-මනඃ ශිලා කල්කය (මනොශිල කල්කය)
රක්සුණු-මනඃ ශිලාචූර්ණීය
රක්ගොයටු-රත්ගොකටුගස්, රත් මල්ගස්
රකත-ඇඹුල්වේ, කිහිරි, ලේ, සිඳුරම්, මුතු, වැලහුන, නුග, කොඅුම්,තඹ, සාදිලිංගම්,සෙන් දිරික්කා, දිය මිදෙල්ල, වැල් මදට, ලාකඩ, ඔලිද, රත්හඳුන්
රකත උපෝදිකා-රත්නිවිති
රකතක-බදුවද, රත්මුරුංගා, රත් එරඛු, ලේ, කටුකරඛු, කොල්ලු
රකතක චිරවීයී-රත්එරඛු
රක්තකන්ද-පබළු
රක්තකමලා-රත්උපුල්
රක්තකරවීර-රතුකණේරු
රක්තකා-කටුවැල්බටු
රක්තකාඤ්චන-රතුසපුගස
රක්තකාණ්ඩ-රතුසාරණ
රක්තකාහ්ව- පතඟි
රක්තකුමුද-රත්මහනෙල්
රක්තකුරවක-රත්කරවිගස
රක්තකුසුම-දෙඑම්ගස, එරබදු
රක්තකෙශර-දෙඹ ගස, එරබදු ගස, නාමල්රේණු
රක්තකෙසරු-නාමල්
රක්තඛදිර-රත්කිහිරි
රක්තඛල්ව-කොල්ලු
රක්තගන්ධක-ගෙඳගම්
රක්තගන්ධා-මනෝසිල
රක්තගොක්ෂුරක-රත්ගොකටු
රක්තගොමේද-ගෝමේදගල
රක්තඝ්න-එරබදු, රී තණ
රක්තවන්දන-රත් හඳුන්, වැල්මදට
රක්තවන්දනා-වැල්මදට
රක්තවිත්‍රක-රත්නිටුල්
රක්තචූර්ණී-සිඳුරම්
රක්තජ-තඹ
රක්තජරස-ලේරස
රක්තතණ්ඩුලා-සුළුබුඹිල
රක්තදලා-ලුණුවිල
රක්තධාතුක-තඹ, සිවංගුරු
රක්තනායක-කෙළිඳගස්
රක්තනාල-රත්තම්පලා
රක්තනාලි-රත්මහනෙල්
රක්තනීල-නුගගස
රක්තපත්‍රිකා-බදුවද ගස, අරත්ත
රක්තපර්ණී-වැල්මදට

රක්තපල්ලව-හෝපළු ගස
රක්තපා-පූඩාවා (කුඩැල්ලා)
රක්තපාකී-කටුවැල්බටු, බටු
රක්තපාද-වලාවැන්න, නිදිකුම්බා
රක්තපාදි-වලාවැන්න
රක්තපායිනි-පූඩාවා
රක්තපාරද-සාදිලිංගම්
රක්තපාෂාණක-සුවංගුරු, (සිවංගුරු)
රක්තපිත්ත-රත්පිත
රක්තපුෂ්ප- එරබදු, කණේරු, රත් කිහිරි, දෙළුම්, මූණ මල්, බඳුවද, දෙඔ, කැල, පැපිලිය, ඉඹුල්, සෙන්දිරික්කා
රක්තපුෂ්පි-දියම්දෙල්ල, නිදිකුම්බා, මලිත
රක්තපුෂ්පිකා-ඉඹුල්, නිදිකුම්බා, රතුසාරණ
රක්තපුෂ්පී-එරබදු, ලුණුවරණ, පළොල්, වදගස, සස්සඳ, දේවදලිය
රත්තපූරක-සියඹලා
රක්තප්‍රභව-රත් කටුකරඬු, කණේරු
රක්තඵල-නුග ගස, කෙම්වැල්
රක්තඵලා-කෝවක්කා, කෙම්වැල්
රක්තඵලිකා-ඔලිඳ
රක්තබිඳුවිෂදූ-රසතැල්ල
රක්තබිඳුපත්‍රා-රසතැල්ල
රක්තබිඳුසමපත්‍රා-රසතැල්ල
රක්තබීජ-මදට ගස
රක්තබීජා-එරබදු ගස
රක්තමඤ්ජර-මිදෙල්ල ගස
රක්තමඤ්ජරී-අක්මැල්ල
රක්තමනී-රකු මාණික්ක
රක්තමාලී-සේපාලිකා
රක්තමූලා-නිදිකුම්බ
රක්තමේහ- ප්‍රමේහ රෝග හෙදයක්
රක්තයෂ්ටී-ඔලිඳවැල, වැල්මදට
රක්තරජ-සින්දූරම්
රක්තරේණු- කැලම්ල්, කැකුල, සින්දූරම්
රක්තලකුතක-ලාකඩ
රක්තලතා-වැල්මදට
රක්තලශුන-රතුලූනු
රක්තලා-අගිල්
රක්තලෝහ-තඹ
රක්තවටී-මැසිරි
රක්තවණිකා-එරබදු
රක්තවර්ණමාලා-කොකුම්
රක්තවර්ධන-බටුගස
රක්තවාහු-රතුසාරණ
රක්තවාස්තුක-රත්තම්පලා
රක්තවිඳුවිෂදූ-රසතැල්ල
රක්තවීජ-දෙළුම්
රක්තවෘන්තා--සුළු සාරණ,සේපාලිකා
රක්තවෛදූර්‍යකී-රතු වයිරෝඩි
රක්තශිමිකා-හොරගස, ගුගුල්
රක්තසංකොච-කොකුම්
රක්තසන්ධිකා-රත්මහනෙල්
රක්තසක්‍යකා- රතු හෙල්මැලි, නෙළුම්
රක්තසෂීප-රතු අබ
රක්තසහා-රතු උඳුපියලි
රක්තසාර- ඇඹුල්වේ, රත්හඳුන්
රක්තසෞගන්ධිකා-රතු හෙල්මැලි
රක්තා-ලාකඩ, ලියනහලා
රක්තාකාර-පබළු
රක්තාඞ්ග- කුඩුවෙලඟ, කොකුම්, පබළු, කිරිපලා, වැල්මදට
රක්තාඞ්ගී-වැල්මදට
රක්තාතිරක්තා-රත්ගොකටු
රක්තාධාර-ශරීරය වසා සිටි සම
රක්තාපර්ණිකා-කුඩුම්රිස්
රක්තාපහා-ගෙන්දගම්

රක්තාපාමාගී-රත්සැබෝ
රක්තාම්ලාන-රතු උදුපියලි
රක්තාලු-බතල
රක්තශාලි-රත්හැල්
රක්තශීර්ෂික-හොර
රක්තිකා-ඔලිඳ, අඹ
රක්තෙක්ෂු-රතු උක්
රක්තෙරණ්ඩ-රතු එරඬු
රක්තොත්පල-රතුපුල්, රත් මහ නෙල්, රත් නෙළුම්
රක්ෂණී-බැමිතිරිය
රක්ෂසි-හරන්කසා
රක්ෂා-ලතු දිය, අළු
රක්ෂාපත්‍ර-කරගස
රක්ෂාඝ්න-කාඹ, පෙරුම්කායම්, බදුල්ල, සුදු අඹ, වදකහ, හරන් කහ
රක්ෂොහන්-ගුගුල්, සුදු අඹ
රක්සය-කොළුවැල
රඛග-පුෂ්කර, සුදු ඊයම්, කිණිරි අරටුව
රඛගක-සුදු ඊයම්
රඛගකාෂ්ට-වැල්මදට
රඛගජ-සින්දූරම්
රඛගද-කිණිරි අරටු, පුෂ්කර, කසිප්පු
රඛගදයක-පික්මල්
රඛගපත්‍රී-බෙරැ
රඛගපුෂ්පී-බෙරැ
රඛගභොග්‍ය-සාදික්කා
රඛගමාතෘ-ලාකඩ
රඛගලාසිනී-සේපාලිකා
රඛගවීජ-රිදී
රඛගා-කෙහෙල් ගස
රඛගාරී-කණේරු

රඬගිණී-දිඹුල්, සාතාවාරිය, කොටියාමුරු
රජ-වෙනිවැල්, ඔසප් ලේ, පැපිලිය, මල්රේණු, තල්ගස
රජඟ-තොටිල ගස
රජත-රිදී, ඇත්දළ, ලේ, ගල, රත් රන්, සුදුපාට තල්ගස
රජති-රිදී, ඇත්දෙමට
රජදන්-ඇත්දන්, (රාජදන්ත)
රජනං-තල්ගස
රජන-රත්හදුන්
රජනද්‍රැම-මදට ගස
රජනි-කහ, පැපිලිය, රාත්‍රිය, කුඩු මිරිස්
රජනිපිල්ල-කුඩුමිරිස්වැල
රජනීජල-පිනි
රජනීද්වය-කහ, වෙනිවැල්, (බාන් වැල්) දෙවර්ගය
රජනීවල්ලි-තෝවැල්ල, සාපුර
රජනීහාසා-සේපාලිකා
රජමුල්-ඇසළ මුල්, ඇසළ ගස
රජරුක්-ඇසළ ගස,
රජරුක්කසුඹුළු-ඇහැළමුලේ පොතු
රජස්-කිල්ල, මල්රේණු
රජස්වලා-කිල්ල, ඔසප් සත්‍රිය
රඤ්ජ-රත්කැල ගස
රඤ්ජක-සාදිලිංගම්, කටුවෙළඟ
රඤ්ජන- රත්හදුන්, වැල්මදට, සේපාලිකා- කටුකරඹු, බෙරු, කහ, පැපිලිය, ඇත්දෙමට
රඤ්ජනක-කටුවෙළඟ
රඤ්ජනා-ලාකඩ, කහ
රඤ්ජනී-බෙරුගස, අවරිය
රඤ්ජිකා-වැල්මදට
රටංකන-ලාකඩ

රට අරළු

විශාල කොළ හා ගෙඩි ඇති අරළු වර්ගයක්.



රට අරළු—ජීවනති
Terminalia Lchebula

විජයා, රොහිණී, පූතනා, අමෘතා, අභයා, ජීවනති, චෙතකී ය යි අරළු වගී සතකි. වාජීකරණයෙහි **විජයා** නම් අරළු ද, ක්ෂය රෝගයෙහි **රොහිණී** නම් අරළු ද, ආලේපයෙහි (ඇඟ ගෑමෙහි) **පූතනා** නම් අරළු ද, විරේචනයෙහි **අමෘතා** නම් අරළු ද, අක්ෂි රොගයෙහි **අභයා** නම් අරළු ද, සියළු රෝග නැසීමෙහි නැතහොත් අරළු අවශ්‍ය හැම ඖෂධ යොගයන්හි **ජීවනති** නම් අරළු ද, චූර්ණ සෑදීමෙහි **චෙතකී** නම් අරළු ද ගත යුතු යි.

රට අරළු

මේ හැම වගීයක ම ලපටි (නොපැසුන) ගෙඩි වියලා ගන්නා ලද **කළු අරළු** නැ ත හෝ ත් **කොළ අරළු** යයි තව වගීයක් ද තිබේ. දෙමළ- කොව්වි – මුස්ලිම් වෙද මහත්වරු **අරළු** වෙනුවට ඖෂධ වශයෙන් ගන්නේ මේ වගීය (වියලා ගත් අරළු ගැට)යි, (කර්ණාටකශ්‍රීඛණ්ඩි වලට ද **කොළ අරළු** යයි ව්‍යවහාර කරති).

රට අරළු

සාමාන්‍යයෙන් අරළු කොළ දිග පළලින් අඟල් 6 × 3 කට වඩා විශාල නැත. මේ සත් වර්ගයට ම අයත් ඉතා විශාල අරළු ගෙඩිය වුව ද ලොකු ලුණුම්දෙල්ල ගෙඩියකට වඩා විශාල නැත.

එහෙ ත්, මේ රටේ ඇතැම් ප්‍රදේශවල සාමාන්‍ය කොළ හා ගෙඩි මෙන් දෙගුණයක් විශාල අරළු වගීයක් තිබේ. මේ වගීයේ කොළ දිග-පළල අඟල් 10 × 6 ක් පමණ ඇත. ගෙඩි ද තරමක රඹඵඵ (ඉදුන) පුවක් ගෙඩි පමණ ඇත.

පිට රට වලින් මෙහි ගෙනැවිත් බෝ කරණ ලද ප්‍රමාණයෙන් විශාල ඇතැම් ගෙඩි වගී **රට පුවක්-රට දෙල්- රට අඹ – රට අන්නාසි** වශයෙන් හැඳින්වෙන්නාක් මෙන් ම මේ රටේ අරළු වලට වඩා ප්‍රමාණයෙන් විශාල මේ වගීය **රට අරළු** නම් න් හැඳින්වීමි. පරීක්ෂාකර බලා මේ වගීය වැවීමෙන් වැඩි ප්‍රයෝජනයක් ලබා ගත හැකි බැව් පාඨකයන් ඉදිරියේ තබමි.

රටතෝර- පරිප්පු, (තෝරවර්ග යක්)

රටල-ඉන්තල,=(හිනිඅල=ඉනිඅල=ඉන්තල) මඤ්ඤුක්කා, රාජ අල, ගහල

රටසිටඑනසුද්දු-සුදුලූනු අල

රටහිවිල්ල කොළ-ඉවිල්ල=(ඉල්ල) කොළ (මෙය බුලත් වෙනුවට බුලත් විටට ත්, කැපුන් තුවාල වලට ත් ගන්නා අඳුරු සුදු පාටින් යුත් වාතහඔග හෝ රදලිය කොළ වැනි කොළ ඇති ගස් වර්ගයකි. මේ වර්ගයේ ගස් අඩි පහළොහක් පමණ උසට වැවෙ යි.

රණඩා-මීනුග, මුකුණුවැන්න

රණ-උණ ගහ

රණඋණ-රණ උණ ගස, රත්වන් පාට ඇති උණ ගස් වර්ගය

රණබට-බටගස් ජාතියක්

රණබිජු-රණවරා ඇට

රණප්‍රිය-සැවැන්දරා

රණහුණ-රත්වන් පාට හුණ ගස්

රණ්ඩල-තිසර පෙරලිය

රත්-සාදිලිංගම්

රත්ඉහුවැල්-රතු පාට හිඟුරු වැල්

රත්එඩරු-රතු පැහැති එඩරු

රත්කණේරු- ඔලියන්දර (රතු අලරිය)

රත්කදුලැස්ස-රතුපාට කඳුලැස්ස

රත්කදුරු-රතුපාට කඳුරු ගස්

රත්කරව්- කණවේරිය ගස, (රක්ත කුරවක ගස= බිම්බජාල ගස)

රන්කිහිරිය



රන්කිහිරිය—රක්තඛදිර

Acocia Sundra

රත් කිහිරිය-එළ කිහිරිය ය යි කිහිරි වර්ග දෙකකි. මෙය ඉන්දියාව-බුරුමය-මලයාව ආදි රටවල වනගතව වැවෙන ගසකි. යකිනාරම් කටු වැනි උල්වගිය තියුණු කටු ඇති මේ ගසේ කොළ සිහින් ය, කිනිහිවල දෙපසට බෙදී ගිය නිදිකුම්බා කොළ වැනි සිහින් කොළ ඇති මේ ගස සාමාන්‍ය පෙනුමෙන් පතහි ගසකට සමාන ය. මෙහි අරටුව ද පතහි ලීයෙහි අරටුව මෙන් තද රත් පැහැයෙන් යුක්ත ය. එළ කිහිරි හර (අරටු) සුදු පැහැයෙන් යුක්ත ය.

ඉස්තරම් වර්ගයේ කසිප්පු මේ වගීයේ අරටු කකාරා ගත් ජලය උකු කිරීමෙන් සෑදේ. රත් කිහිරිය වලින් සාදා ගන්නා කසිප්පු තද රත් (කළු) පැහැයෙනු ත්, එළ කිහිරිය වලින් සාදා ගන්නා කසිප්පු කිළිටි සුදු පැහැයෙනු ත් යුක්ත ය. වෙනත් ගොලෑ (පෙති) පුවක් ආදියෙන් සාදන බාල වගී වල කසිප්පු ද තිබේ.

කිහිරි කසිප්පු හොඳ වගී ය යි. එය උගුරේ බැරැන්ඩිය, විදුරුමස් වලින් ලේ සාරේ යාම, විදුරුමස් දියවීම යන මේ මුඛ රෝග වලට ප්‍රත්‍යක්ෂ ඖෂධයකි. මේ කිහිරි කසිප්පු වර්ග යෙන් කැල්ලක් කටට දමා ගත් විට එය කපුරු වැනි සැර ගතිය කින් යුක්ත ව වහා දියවී ය යි. බාල කසිප්පුවල එවැනි ගති යක් නැත.

කිහිරියර වමීරෝග, කාමිරෝග, ලේ විෂවීම, තැල්ම, හා අතීසාර ආදි රෝග සුව කිරීමෙහි ශක්ති යක් ඇති ඖෂධයකි. අපේ රටේ රත්හදුන් වෙනුවට ගන්නේ මේ රත් කිහිරිය යි. (395 පිටේ රත්හදුන් ගැණ ලියා ඇති විස්තරය බලන්න.)

රත්කොහොඹ-එරබදු
රත්කිනි-කහපළු
රත්න-අත්තන
රත්නං-සාදිලිංගම්, ලේ
රත්නක්කි- බැලතණ
රත්නකම්බිලිය-රත්මල් ගස
රත්නගුල්ම-ගුල්මරෝග භේදයක්
රත්නපල-කෝවක්කා
රත්නඵලා-කෙම්වැල් (කෝවක්කා)
රත්නමණි-පියුම්රාමිනි
රත්නමේඝ-රක්තප්‍රමේහ
රත්නාතීසාර-රක්තඅතීසාරය
රත්නාරිසස්-ලේ වැගිරීම ඇති අශීස් රෝගය
රත්න-රුවන්
රත්නකන්දල-පබළු
රත්නපාලම්-රටදුම්මල
රත්නික-රත්පැහැති නික
රත්නිවුල්-රතුපාට මල් ඇති නිවුල් වගීය (277 පිටේ විස්තරය බලන්න.)
රත්නිවිති-රක්ත උපෝදිකා
රත්නිවුල්-රක්ත චිත්‍රක
රත්පති-රැක්අත්තන
රත්පල-නුගගස
රත්පා-පූඩාවෝ
රත්පොඩි-සාදිලිංගම්
රත්බදිනාවැල්- උගුරේ ලෙඩට ගන්නා බෙහෙතක් (වැල්මදට)
රත්බිත්තු-මදරිය
රත්මල-රත් මල් ගස
රත්මනෙල්- රතු පාට ජලජ පුෂ්ප
රක්මිණී-පද්මරාග
රත්ලොත්-කොකුම්
රත්සෑ ලුහුණු-රතුලූනු
රත්හර-රත් හඳුන් ගස
රත්හැල්- අග්‍ර ධාන්‍ය වූ රක්ත වර්ණ ඇල් වී ජාතිය
රත්හිරියල්-මනෝසිල
රතඹලා-රත්මල් ගස
රතැඹුල-රතු ඕලු, රත් මහනෙල්
රති-මෛථුනය



රත් හඳුන්—රක්ත චන්දන

Pterocarpus Santatinus

රත් හඳුන් නමින් හැඳින් වෙන මේ ගස සුදු හඳුන් ගසට හෝ එල කිහිරිය ගසට හෝ රත් කිහිරිය ගසට කිසිම විධියකින් සමානකමක් නැත. එය බොහෝ දුරට සමාන වන්නේ **මදුරා** ගසට යි. රත් හඳුන් ගසේ පිට පොත්ත ද මදුරා ගසේ පිට පොත්ත මෙන් ම ඝණ ය. සුදු පැහැයෙන් යුක්ත ය. දෙ වර්ග යේ ම සාද මහත් වන්නේ පොත්ත පිපිරී යාමෙනි. දෙවගී යේ ම කොළ ද හැඩහුරුකමින් එකාකාර යි.

එහෙත් රත් හඳුන් කොළය මදුරා කොළයට වඩා ඝණ යි. කර කොළ මෙන් මස සහිත යි. දෙ වගීයේ ම අරටු පද්මරාග වර්ණයෙන් යුක්ත යි. අරටුවල සුවඳ ද එක සමාන යි.

දඹදිව ඇතැම් ශීතාධික ප්‍රදේශයන්හි වැවෙන මේ වගීය පෙර රජුන් විසින් ලඬකාවේ නොයෙක් පළාත්වල වගා කරණ ලද බව පෙණේ. දිගා මඩුලු පෙදෙසට අයත් ගල්ඔය මිටියා වතෙහි තාමත් වනගත ව තිබෙන්නේ ඒ ගස් වලින් බෝවී යන ගස් විය හැක.

රත් හඳුන් අදුනාගෙන මේ වනය පරීක්ෂා කිරීමෙන් නියම රත් හඳුන් සොයා ගත හැක.

රත් හඳුන්—රත් කිහිරිය

රත් හඳුන් මදුරා පවුලට අයත් ගසකි. රත් කිහිරිය පතඟි පවුලට අයත් ගසකි. රත් හඳුන් වෙනුවට **ප්‍රතිනිධි** වශයෙන් ගන්ට ඉන්දියා රැසිවරු නියම කර තිබෙන්නේ අළුත් සැවැන්දරා මුල් ය. එහෙත් ලඬකා රැසිවරු ඒ වෙනුවට රැගෙන තිබෙන්නේත් මේ දක්වා ගන්නේත් රත් කිහිරිය ය. සුවඳහොට (සැවැන්දරා) මුල් නොවේ.

රත් හඳුන්-කිහිරිය දේවර්ග යෙහි සුළු සමානත්වයක් ඇත්තේ අරටුවල වර්ණයෙහි පමණකි. ශීත ගුණයෙන් යුත් බලකාරක දුර්ලභ ඖෂධයක් වූ රත් හඳුන් වෙනුවට සැවැන්දරා මුල් වලට

රත් හඳුන්

වඩා පෙනුමෙන් වත් සමානත්ව යක් ඇති රත් කිහිරිය රැගෙන සැනසෙන්නේ රත් හඳුන් වල මිළ අධිකත්වය හා දුර්ලභත්වය නිසා විය හැක.

නේපාලයේ රාජකීය ඵර්මානය ඇතුළු මේ ගස් වල ඇට පහසුවෙන් සපයා ගත හැකි ස්ථාන වලින් ඇට ලබා ගෙන අපේ රටේ ද විශාල ලෙස රත් හඳුන් වැවීමෙන් ජාතික ආදායමේ හා දේශීය වෙදකමේ දියුණුව ත් සිදු කළ හැකි බැව් මගේ හැඟීම යි. මෙය ආණ්ඩුවෙන් ඉටු විය යුතු යුතුකමකි.

රතිමුක්තක-කොබු ගස
රතුභුග-රතුපාට නුග ගස්
රතුහරක්-රත් හඳුන් හර
රථ-වේගස, වෙරලු, කෝන් ගස, කොබු
රථක්‍රාන්තා-විෂ්ණුක්‍රාන්ති
රථක්‍රානති-විෂ්ණුක්‍රාන්ති
රථද්‍රු-කෝන්ගස, කොබු ගස
රථවර්ණා-මැණික්වැන්න
රථාඩගපුෂ්ප-හොමුවහු
රථාඟීපුෂ්ප-වේවැල
රද-දත්, ලනුව, ලේ
රදවර්ජ-තොල
රදන-දත්
රදලිය- ඉල්ල, (ඉවිල්ල=ඉඟිල්ල) කොළ වැනි කොළ ඇති ගස් වර්ගයක්
රන්-රත්රන්
රන් ඉඳිවැල්- රණින් කළ කුඩා කෙඳි
රන්කෙසරු-දෙඹ ගස

රන්කිරි ගොකතු

රන්කෙසෙල්-රන්වන් කදලි වෘක්ෂය
රන්ව-රත්කැල
රන්තොලිවි-පිලගස
රන්ද්‍රි-බටු ගස, මිදි
රන්ධ්‍ර-සිදුර

රන්කිරි ගොකතු



රන්කිරි ගොකතු — සවර්ණක්ෂිරි

Argemone Mexicana

මැක්සිකෝව ජන්මභූමිකොට ඇති මෙය හිම වැනි පැහැයෙන් යුත් ඉතා ලක්ෂණ පැලැටියකි. එහෙ ත් කදෙහි ත්, කොළ වල ත්, නැටි වල ත්, ගෙඩි වල ත්, හැම තැනකම ත්, අහල් බාගයක් පමණ දික් වූ තියුණු කටුවලින් වැසී නිබෙන නිසා කිව්වුවෙන්ට බැරි ය.

රන්කිරි ගොකටු **රණබිජු**

රන්මානිස්ස — රන්වන්වේලා

මෙය ද අපර දිගින් පෙර දිගට ඇවිත් අපේ ආයුර්වේදයට එකතුවී අවුරුදු පන්සියයකට වඩා පැරණි නැති බැවි භාව ප්‍රකාශයෙන් එහා වෙද පොත් වල සඳහන් ව නොතිබීමෙන් පෙණේ.

ප්‍රමාණයෙන් සිහින් බෝටියා මල් පමණ වූ මේ පැලැටියේ මල් වර්ණයෙන් හා හැඩහුරුකමින් නා මල් වැනි ය. ගෙඩි රට බිලින් ගෙඩි වලට සමාන ය. ඇට පරංගි තෝරඇට පමණ ඇත. එමෙන් ම කළු පාට ය. කිරි තද රන්වන් පැහැයෙන් යුක්ත ය. අඩි එකහ මාරක් පමණ උසට වැවෙන මේ පැලැටිය වැවී ඵල දැරීමෙන් පසු කටුවැල්බටු පැලැටිය මෙන් සම්පූර්ණයෙන් ම වියලී ය යි. මේහි කිරි සහ සම්පූර්ණ පැලැටිය ම ත් ඖෂධ සඳහා ගණිති.

මෙය මූත්‍ර කෘච්ඡ්‍රා, අශ්මරී, ශොථ, දුහජ්වර, කැසීම, කෘමි රෝග හා සෙම්-පිත් ප්‍රධාන ව ඇති වන හැම රෝගයකට ම ගුණ දායක ඖෂධයකි. (ඉදිරි යෙහි රුක් ගොකටු ගැණ ලියා ඇති විස්තරය බලන්න.)

රන්බෙලි-සිප්පිබෙල්ලා
රන්මෝට-රත්මොට, (දදවලට ගාන බෙහෙතක්)
රන්වන්කිකිරිඳිය-මේෂලෝම, (රත්‍රං පාට කිකිරිඳිය)
රන්වන් ඇදුන්-හරිවන්දන
රන්වන්වේලා-රම්මානිස්ස

රන්මානිස්ස

Cleome Viscosa

රන්වන් පාට මල් පොකුරු හා උල්ව ගිය කොළ ඇති අඩි දෙකක් පමණ උසට වැවෙන මෙය ප්‍රධාන පඩිකාතියේ වාතහර ඖෂධයකි. ප්‍රාණජ්වය වැනි ඉදී ශීය වෙදකමේ තෙල් වගී සහ වෙනත් වාතහර ඖෂධ වගී පිළි යෙළ කිරීමේදී මේ පැලැටිය ද අවශ්‍ය වේ. ඇතැම් පළාත්වල **රන්වන් වේලා** නමින් හැඳින් වෙන මෙය ඖෂධ සඳහා සහ මුල යෙන් ගන්නා පැලැටියකි.

රන්ෂ-සවිඳුවලුණු, මනෝසීල
රන්සිරියෙල්-හිරියල් නම් ධාතු විශෙෂය
රණබිජු-රණවරා ඇට

රනිල-නිසර පෙරලිය
රඹ-කෙසෙල්
රඹුක-එරඹු
රඹුක්- රඹුක් වැල් (උක් වගීයට අයත් ඊට වඩා කුඩා දිගට වැල් යන පඳුරු වගීයක්)
රම්භා-කෙහෙල්
රම්මනිස්ස-රන් මානිස්ස, රන් වන් වේලා
රම්‍ය-සපු ගස, දුම්මැල්ල මුල්, නුග ගස
රම්‍යපුෂ්ප-ඉඹුල් ගස
රම්‍යා-ගොඩ පියුම්, (මීතඹර)
රමඨඛවනී-පෙරුම්කාගම්
රමණ-දුම්මැල්ල මුල්, පොල් ගස
රමණීප්‍රිය- සැවැන්න, (සැවැන් දරා)
රමා-රම්මානිස්ස
රමාප්‍රිය-නෙළුම්
රමාභ්වය-රම්මානිස්ස
රර රාජ-රසඳුන්
රළු-තොවිල
රව-හීරුස්ස
රවක-දිවි පහුරු (වක් නිය)
රවකං-දිවි පහුරු
රවි-තඹ, වරා ගස
රවිග්‍රහා-දුරාලභා, (ධන්වයවාස)
රවිනාථ-නෙළුම් මල, බඳුවද
රවිනාමක-තඹ
රවිපත්-වරා කොළ
රවිප්‍රිය- රන් නෙළුම්, කණේරු, වේලා, කොසඹ
රවිප්‍රිතා-කෝවක්කා
රවි මදී-තෝර
රවිරත්න-මැණික, තඹ
රවිලෝහ-තඹ
රවු-රහු ගෙඩිය
රශනා-දිව
රශාණ-ගිනෙල්
රශාල-අඹගස්, උග්ගස්
රස්-රහු ගෙඩිය
රස්ක-බදුල්ල
රස්නා වතුකඃ- රත්මල්, ගොරක
රස-රස දිය, වව්වනාව්, ෂට්රසය, ගෙඳගම්, තෙත් ගතිය, කන ලද ආහාරයාගේ මනාව පැස වීම, ඉරිවේරිය
රසඔලිදැ-පැණිඔලිද
රසකර්පූර-රිදී තුත්තත්
රසකිඳ-අමෘත=(දින් කිඳ, අළුකිඳ, බූ කිඳ, ගැට කිඳ, සෙවෙල් කිඳ, තික්ත කිඳ, පිටි කිඳ, රස කිඳ යයි කිඳි වගී අටකි.)
රසකිඳ අරළු- රසකිඳ වැලෙන් බිමට ඇදෙන මුල් (කෙදි)
රසකෙශර-කපුරු
රසකුම්බ-කිතුල් ගස
රසගහසා-රස නහර
රසගන්ධ-ගෙන්දගම්
රසගන්ධා-තුත්තම්
රසගර්භ-රසඳුන්, සාදිලිංගම්
රසගර්භක-රසඳුන්
රසගර්භා-රසඳුන්
රසඤ්ඤ-පුස්කර
රසජ-සාදිලිංගම්, උක් සකුරු,ලේ
රසජාත-රසඳුන්
රසඥ-දිව
රසතාවතුක-රත්මල්
රසතල්ල-ලක්ෂමණ
රසතෙජස්-ලේ
රසදක-රසදිය

රසඳුන්-අඤ්ජන කැට, රස අඳුන් =(දරුහරිද්‍රා පලම ක් ගෙන වතුර පත 8 කට තලා දමා පත 1 ට සිඳුවා ගත් කෂායට එල කිරි පතක් ලා ඝණ වන තෙක් සිඳුවා ගත් අඳුන ද **රසඳුන්** නම් වේ

රසද්‍රාවී-ගෙන්දගම්

රසධාතු-රසදිය

රසනා-කාඩි, අරත්ත, දිව

රසනාගඹී-රසඳුන්

රසනායක-සාදිලිංගම්

රසනාසක-හිඟුල්, (ඉඟුල්)

රසනෙත්‍රිකා-මනෝසිල

රසපාකජ-උක් සකුරු

රසඵල-පොල් ගස

රසමාණික්‍ය-රසදිය

රසරාජ-රසදිය

රසල-උගුගස

රසලය-උක් ගස

රසලෝහ-රසදිය

රසවර්ජිත-මෝරු

රසශොධන-පුස්කර

රසසථාන-සාදිලිංගම්

රස සය- මධුර, ඇඹුල්, ලුණු, කටුක, තික්ත, කසට යන රස වගී සය.

රස සය (වෘක්ෂයක)-මූලරස, බඩ රස, තවරස, පත්‍රරස, ඵලරස, පුෂ්ප රස යන රස සය.

රස හරත්‍ය-මාංශය

රසා-දියමිත්තා, රසඳුන්, මුදික ඵල

රසාග්‍ර-රසඳුන්

රසාග්‍රජ-රසඳුන්

රසාග්‍ර්‍යා-රසඳුන්

රසාඤ්ජන- අශ්මසාර, අංජන කැට. හා පිත්තල බොර වලින් සාදන අඳුන් වගීයක්

රසාඪ්‍ය-ඇම්බරල්ල

රසාදනී-වං ඇපල

රසාධික- පුස්කර, කොට දිඹුලා

රසාන-ගිතෙල්, ගෝමූත්‍රා

රසාම්ල-සියඹලා, ඇඹුල්වේ

රසායන-රස බෙහෙත් වගී, විෂ ප්‍රභෙද, මෝරු, වලඟසාල්

රසායන ඵලා-අරළු

රසායන ශ්‍රෙෂ්ඨ-රසදිය

රසායනී- රසකිඳ, කෝමාරිකා, කළු කැම්මේරිය, මහකරඳ

රසාල-ඊතණ, කිරිබදු, මුද්දරප්ප ලම්, කොස්, පොණ්ඩරු, අඹ, තිරිඟු, උක් දඬු, උණ ගස

රසාලිකා-ඒ, උක් ප්‍රභේදයක්

රසාලූ-පුස්කර

රසුන-ලූනු

රසූවන්-රත්‍රන්

රසෙන්ද්‍ර-සාදිලිංගම්, රසදිය

රසෝ-ගෙන්දගම්, රසදිය

රසෝත්තම-මුං

රසෝන්භව-මුං, සාදිලිංගම්

රසෝන්භවා-රසඳුන්, පුස්වැන්න

රසෝභූත-රසඳුන්

රසෝන (ක)-සුදු ලූනු

රසෝපල-මුතු

රසෝබල-ගෙන්දගම්

රස්‍ය-ලේ, දියමිත්ත, අරත්ත

රහස් පියස- සත්‍රීන්ගේ යෝනි මාර්ගය (රහස්‍ය ප්‍රදෙශය)

රහස්‍ය-දියමිත්ත, අරත්ත

රා

රා-සුරාව
රාක්ෂස-ගොකටු-හොර ඉටි
රාක්ෂා-ලාකඩ
රාක්ෂි-කුඹුරු ඇට
රාග-ලාකඩ
රාග කාරිණී-කොච්චම්
රාගචූර්ණී-කිහිරි, ලතුදිය, (ලාකඩ =ලාක්ෂාරස)
රාගදලි-සැබෝ ගස
රාගනීල-ගිරිකිල්ල
රාගපුෂ්ප-බඳුවද
රාග පුෂ්පී-බඳු වද මල්
රාග ප්‍රසව-බඳු වද, රතු සියඹලා, රතු වදකහ, රතු ඕලු
රාගමලන්-පිච්ච මල
රාගාඩ්‍යී-වැල් මදට
රාගිණී-බුලත්
රාඟී-කුරක්කන්
රාගොඩි-කොච්චම්
රාෂ්ට-එල සැබෝ
රාජ-ඇසල ගස
රාජක්ෂවක-අක්මැල්ල, අඹ
රාජක-කරඹ ගස, කලාදුරු
රාජකදම්බක-බක්මී
රාජකලින්දි-කොමඩු
රාජකෙශරු-කලාදුරු
රාජකුල මුදලියා-කැකුණ ගස
රාජ කුෂ්මාණ්ඩ-එලබටු, කලාදුරු
රාජ කෙතකී-(දුනුකේ ගස)
රාජ කොශාතකී- වැ ට කො ළු, නියන් වැටකොළු
රාජ ඛර්ජූරී-යොන් ඉඳි
රාජ ජම්බු-මාදම්
රාජතරු-කිනිහිරි, ඇසළ
රාජතාල-පුවක් ගස
රාජ තිකතක-බිම් කොසඹ
රාජදන එල-කිරිපළු
රාජද්‍රැම-ඇසළ ගස
රාජ ධන්තුර-තුන්බෝ අත්තන
රාජධුස්තුරක-මහ අත්තන
රාජ ධූර්ති-තුන්බෝ අත්තන
රාජනියම්බ-ගල් දුම්මල
රාජනී-බෙරු ගස, නීලී (නීලිකා)
රාජ පටොල-මිහිරි දුම්මැල්ල
රාජ පලාණ්ඩ-රතු ලූනු
රාජපත්‍ර-වණ රාජ, ගුරුළු රාජ, සඳ රාජ, ඉර රාජ, ගරුඩ රාජ
රාජපිලු-මහ ඩෙබර
රාජපුත්‍ර-තික්ත ලබු
රාජ පුත්‍රි-රෝහණීය, දෑ ස ම න්, තික්ත ලබු
රාජපුෂ්ප-කොකුම්, නා ගස, ලුනු වරණ
රාජ පූනා-තික්ත ලබු
රාජඵණිඤ්ජක-නාරම් ගස
රාජඵල-දුම්මැල්ල, ජම්බු
රාජ ඵලාණ්ඩු-රතුලූනු
රාජ බදර-රතු නෙල්ලි, මහඩෙබර
රාජ බලා-වැල් බැලිල, ආපසු මදු, ඇසළ, මහ බැවිල
රාජ භද්‍රක-කොසඹ, එරබදු
රාජභොග-සඳුන්
රාජ භොග්‍ය-සාදික්කා, කිරිපලු
රාජ මරල-අගිල්
රාජ මාංශ-ලී මෑ, මෑ කරල්
රාජ මාෂ-උඳු, මැකරල්
රාජ යක්ෂ්ම- ක්ෂය රෝගය
රාජ යොග්‍ය-සුදු හඳුන්
රාජ රඹ-රිදී
රාජ රුකෙඛා-ඇසළ
රාජ රුවන්-අගිල්

රාජ වල්ලහ-මහ ඩෙඛර ගස
රාජ වෘක්ෂ-ඇසළ, ලී මෑ, තෝර
රාජ ශාක-සුළු කුර
රාජසවණී-මහ අරත්ත, තුන්බෝ අත්තන
රාජ සමීප-හෙළ අබ
රාජ හඹිණ-තුවරලා
රාජහඹ් විනාසනී-ගොඩමේරිය
රාජා-කිරිපළු
රාජාදන-පියල් ගස, කිරිපළු, කැල
රාජාදන ඵල-කිරිපළු ගස
රාජාම්ල-ඇඹුල් වේ
රාජායතන-පියල් ගස, කිරිපළු, කැල, ගිරිතිල්ල
රාජාර්කී-එල වරා
රාජාවී-අගරු, අගිල්
රාජාහී-අගිල්, සඳුන්, සළු අගිල්, සුදු ඊයම්, ජම්බු
රාජාරීති-ඔත්තල
රාජාහ්ව-වරා ගස
රාජාහ්ව සෛයීක- නිල් කටු කරඬු
රාජී-අබ
රාජීක-අබ
රාජීකා-අබ
රාජීකා ඵල-හෙළ අබ
රාජී මාතා-දුම්මැල්ල
රාජී-මහ අබ, වන රේඛා
රාජී ඵල-දුම්මැල්ල
රාජීව-රත් නෙළුම්, සුදු නෙළුම්, වතුර
රාඪ්
රාඝ් } කුකුරුමාන්
රාත්‍රිකර-කපුරු
රාත්‍රිපුෂ්ප-මහනෙල්
රාත්‍රිඝෝර-ගුගුල්
රාත්‍රී-කහ
රාත්‍රිහාෂ-සුදු මහනෙල්
රාඛාර-ගිතෙල්
රාබු-මූල පලා
රාම්භ-තොටිල, තිඹිරි
රාම-කොච්චම්, කුරතම්පලා, කොල්ලම් කොළ, පෙරැන්කායම්, ඛින් කොසඹ, නෙළපෝරා
රාමකර්පූරක-මුතු
රාමඡර්දනක-කුකුරුමාන්
රාමට
රාමඨ } පෙරැම්කායම්, මධූර තුතු
රාමතෙල්-බඩේ සිටමූඛයෙන් පිට වන ආහාර ගඳින් යුත් වාතය.
රාම දූති-තලා ප්‍රභෙද
රාමන-තොටිල
රාම රූප-වන්ඇපල
රාම වල්ලහ- කර ගස, කුරුඳු පොතු
රාමසුත-පෙරැම්කායම්
රාමසෙන (ක)-බිම් කොසඹ
රාමා-පෙරැම්කායම්, සාදිලිංගම්, සුදු කටුවැල් බටු, හෝපළු, ගෝරෝචන, ගුරා බැවිල, රම්මා නිස්ස
රාමාඡඡීනක-කුකුරුමුවන්
රාමාහ්වා-රම්මා නිස්ස
රාමෙෂ්ට-කුරුඳු පොතු
රාල-දුම්මල, සල් ගහේ ලාටු
රාලකාර්‍ය්‍ය-සල් ගස
රාලුක-අල, රාබු අල
රාෂ්ට්‍ර-එලබටු
රාෂ්ට්‍රකා-තිබ්බටු
රාෂ්ට්‍රී(කා)-කටුවැල් බටු
රාෂ්ට්‍රී-දළුව මුල්
රාෂ්ට්‍රිකී-එලබටු
රාඹණා-රත්ත (රත්ත ගැණ 402 පිටෙහි ලියා ඇති විස්තරය බලන්න) ගස් වල හට ගන්නා පිළිල වැනි වගීයරි පත්‍ර රාඹණා යයි කියති

ර

රාජණාඵලා–කිරිපළු
රාජනවඳිනී–සීනිද්ද
රාසාල–උක් ගස
රාහුචඡ්‍ඡන–අමු ඉහුරු
රාහුචඡ්ඡට–ලූනු
රාහුත්සෘෂට–ලූනු
රාහු රත්න– ගෝමේද (මැණික් වර්ගයක්)

රත්න—රාජ්ණා



රත්න—රාජ්ණා (පත්‍ර රාජ්ණා)

Vanda Roxburghii

රත්න (රාජ්ණා) වෙනුවට අනාදිමත් කාලයක සිට අපේ රටේ පාවිච්චි කරන්නේ **නිය** පවුලට අයත් අරත්න (Cophiorr hiza Mungos) නමැති ඖෂධයකි. එය **කින් අරත්න, මහ අරත්න** ය යි දෙ වගයකි. ඒ දෙවර්ගීය ම ඖෂධ සඳහා අවශ්‍ය වෙයි. ඒ වායේ අල (මුල්) නිය අල හෝ වල් ඉහුරු අල වැනි තද සුවද කින් හා කට හාරවන (කාවදින) ගතියකින් යුක්ත ය. සුළු තික්ත රසයක් ද ඇත. "මෙයට ව්‍යවහාර වන **නාකුලී—නකුලෙෂ්ටා** යන නම් නිසා මෙහි සර්ප විෂ නාශක බලයක් ඇති රාජ්ණා වල **වාත—ජ්වර** රෝගෝපශමන ශක්තියක් නැත" යනු එක් මතයකි.

පත්‍රරාජ්ණා

එක් ශිය දහය (110) ක් පමණ වූ උඩවැනියා වර්ග අතුරෙන් **පත්‍රරාජ්ණා** ද එකකි. මේ වර්ගීය වවුල් පහර හා දියසෙවෙල් එකතු වන ගස් දෙබල වල ත්, ගස් බිල වල ත් සරු සාරව වැවෙ යි. ඉන් දියානු ද්‍රව්‍ය ගුණ නිසඟඬු වල කියා තිබෙන පරිදි මද සුවදකින් හා තික්ත රසයකින් යුත් මේ වර්ගීය වාත-ජ්වර ආබාධයන්හි පසස්නා ලද නිසා ඉන්දියානු වෛද්‍යවරයන් රාජ්ණා ඖෂධය වශයෙන් මෙය ගන්නා බව ඇසිමු.

අපේ රටේ ඇතැම් අය "රාජ්ණා වෙනුවට මේ වර්ගීය ගත යුතු ය"යි කියන නමුත් ගන්නේ පරණ පුරුදු අරත්න ම ය. අරත්න නුදුටු-නොදන්නා පාඨකයන් ඇතැ යි සිතීම දුෂ්කර නිසා ඉන්දියාවෙන් ආ අලුත් මතයට භාජන වී තිබෙන පත්‍ර රාෂණා පැලයක ඡායාරූපයක් පමණකි මෙහි දැක්වෙන්නේ.

රි රී රු

රිස්කන්සා-හැඩකන්සා
රිහාණිය-වල්ගාමිරිස්, (වාල් මොලඟු)

රි-අමුකහ, කඟ
රිකු-රුක් ගස
රිට හැසිරීම්-භිතුරුපියලි අල
රිණ-කුළුරිණ, (ඝට්ටකරෝහණ)

රික්-හැමගස්
රිහිකොළ-වව්වනාවි (වස) කොළ
රිඛගිනි-තිබ්බොටු
රිඛගිනීතුල්‍යා-කටුවැල්බටු
රිට
රිටි
} කොහොඹ
රිටු-කපුටන්, කොහොඹ ගස
රිටු තෙල්-කොහොඹ තෙල්
රිටු සුඹුළු-කොහොඹ පොතු
රිඩි-ගෙඳ
රිතුක-හුණමකුල්
රිතුකඃ-තුක්පිටි, (උණමකුළු)
රිතුකා-හුණමකුල්=හුණකපුරු
රිදීතුතු-රිදීතුත්තම්
රිපු-භිතුරුපියලි
රිවි-වරා ගස, ඉරමුසු, රිටි නම් ගස් වර්ගය
රිවිඉරමුසු-සස්සඳ
රිශ්‍යගන්ධා-අමුක්කරා
රිහිරි-රැධිරය

රීති-යකඩමල, පිත්තල
රීතික-අඳුන්, පිත්තල, මල්
රීතිප්-මල් අඳුන්, (පුෂ්ප අඳුන්)
රීතිපුෂ්ප-පුෂ්ප අඳුන්
රීතිසමන-සුළුකුඹුක්
රීරි-පිත්තල
රීරිබුස්නා වැල්- (රීරිබුන්කාවැල්) උඩහළුවැල්=(පඹවැල්)

රුක්- කොට්ටම්, හැමගස්, රුක් ගස
රුක්කය-නාමල් රේණු අත්තන, රත්රන්
රුක්අහුණු-රුකහුණ,=(අංකොළ)
රුක්අත්තන-සප්ත පර්ණි වෘක්ෂය
රුකඛක-කෙළින්ද ගස
රුකඛාදනී-පිළිල

රුක්ගස-ඊරිය, මූලඛඩ, රුක් යන ගස් තුන් වගය ම පෙනුමෙන් සමාන ය. ඒවා හඳුනා ගත හැක්කේ මල් හා ඵල හටගැනීමෙන් පසුව ය. රුක් ගස් වල-ලපටි අවධියේ කොළ පැහැයෙන් හා මේරූ (පැසුණු) පසු කහ පාටින් යුත් ගැට සහිත බුබුලු වැනි අති සුගඛ වත් මල් පොකුරු සෑදෙයි.

මෙහි ඵල හටගන්නේ ඒ මල් පොකුරු වලින් නොවේ. කුඩා අතු දිගට වෙන් වෙන් වශයෙන් ය. ඊරිය ගසේ ද රුක් ගසෙහි මෙන් ම කුඩා අතු දිගට ඵල හට ගනී. එහෙත් රුක් මල් වැනි ලඝුඛණ මල් හටගැනීමක් එහි නැත. මූල ඛඩ ගසෙහි කොළ හා ගෙඩි න් ඊරිය, රුක් දෙවගයට වඩා මදක් දිගටි හැඩයෙන් යුක්ත ය. මේ තුන් වගේ ම ගෙඩි වල ළෙල්ලට ත්, ඇටයට ත් අතර රතු පාටින් යුත් (සාදික්කා ගෙඩිවල මෙන්) වසාවාසි තිබේ. ඊරිය, රුක් දෙවගය ම ඖෂධ වශයෙන් ගණිති. මූල

රුක්ගොහාමු

බඩ දේශීය වෙදකමේනි ඖෂධ වශයෙන් යෙදුන තැනක් ගැන දකින්නට නැත. කල්ගිය වන වල සැදෙන කොස්ස - ඊරිය කිරි ඉරදි කැල්ලක ගා එක වරක් පමණක් ඒ වණය පිට එලිමෙන් සම්පූර්ණයෙන් ඒ කොස්ස කැපී වණය සුදුබී රතු මස් පැදේ. රුක් මල් දේශීය වෙදකමේ ප්‍රියඛහු වෙනු වට සොදනි. (312 පිටේ පුවතු ගැන ලියූ විස්තරය බලන්න)

රුක්ගොහාමු - රන්කිරිගොහාමු

රුක්ගොහාමු - හණහක්කිරි

මේ ගස **රන්කිරිගොයමු - රන්කිරිගොහාමු - රුක්ගොහාමු - හණගොරක - මලගොරක - මල්ගොරක** යන නම් වලින් හැඳින් වෙයි. රත් වන්පාට කිරි වගීයක් පිට කරණ නිසා මේ ගසට සංස්කෘතයෙන් **හණහක්ෂිරි** යයි කියති. පැරණි සිංහල දේශීය වෙදකමේ මේ ගස හඳුන් වන්නේ රන්කිරි ගොයටු - රුක් ගොයටු යන නම් වලින් ය.

මේ ගසින් ලබාගන්නා දඹ රන්පැහැය ඇති කිරි රසායන ද්‍රව්‍යයක් වශයෙන් හා ශ්‍රේෂ්ඨ තම ඖෂධයක් වශයෙන් ද ප්‍රයෝජනවත් ය. මේ කිරිවල තිබෙන රසායනික පුදුම ගුණය නම්: අව්-වැසි-සුළං වලට එහි වණීය වෙනස් නොවී ඔරොත්තු දීමේ ශක්ති ය සි.

මේ තාක් නොනැසී පවත් නා **හරඹගල** —**සිගිරිය**—**දිඹුලාගල**—**හිදගල** ආදි ගල් ගුහාවල ඇඳ තිබෙන සිතියම් වල කෂා වර්ණය දක්වා තිබෙන්නේ මේ කිරි වලින් ය. එසින් හරඹගල සිතියම් අවුරුදු 2100 කට වඩා පැරණි බැව් වංශකථා හා රූප ලක්ෂණ අනුව තීරණය කළ හැක.

මල—මූනු විමේක්ෂය

මේ කිරි කලඳකට සියඹලා බොර කලං තුනක් මිශ්‍රකර සිනි දුව අඹරා කෙසෙල් කොළයක ඔතා වණ්ඩුවේ තම්බා උණු දිය පතකට ඒ කලං හතරම දිය කර හත් වරක් පෙරා එක වරම පොවන්න. කවර

තරමේ මල-මූත්‍ර බද්ධයක් වුව ද එසෙනෙහි මිගහැරී යයි. මල--මූත්‍ර අවස්සිය එක වර සුව කළ හැකි වෙන එක ම වස්තියක් හෝ එක ම බෙහෙතක් මේ තාක් සොයා ගෙන නැති නිසා මහත් ක්‍රියාකාරී බලයක් ඇති මනුෂ්‍ය ශරීරයට හිතකර ඖෂධයක් වශයෙන් ද. මේ (රුක්ගොකටු) කිරි විලට ලැබෙනුයේ උසස් තැනක් ය.

රුක් ගොකටු හා රන්කිරි ගොකටු

වැල් ගොකටු (නෙරෙංචි= ගොක්ෂුරක) වර්ගයක් ද මේ රටේ තිබෙන නිසා රුක් ගොකටු නම් නුත්, ඒ ගසෙන් රත් පාට කිරි නික්මෙන නිසා රන් කිරි ගොකටු නම්නුත්, ගොරක ගසට සමාන නමුත් කොළ හා කඳත් තද කෘෂ්ණ වර්ණයෙන් යුක්ත නිසා කණ (කෘෂ්ණ)ගොරක නම් නුත්, ගොරක මල් වලට සමාන මල් පොකුරු සැදෙන නමුත් ගොරක ගෙඩි පමණ විශාල නොවූ රට තිබ්බටු ගෙඩි වැනි ප්‍රකට ව නො පෙණෙන කුඩා ගෙඩි සැදෙන නිසා මල ගොරක-මල්ගොරක යන නම් වලිනුත් හැඳින්වෙන මේ රුක් ගොකටු ගස පමණක් ලඞ්කාවේ තිබුණේ.

උතුරු අමෙරිකාවේ මෑක්සිකෝ ප්‍රදේශය ජන්ම භූමි කොට ඇති (Argemone Mexicana) නාමැති පැලෑටිය මෙහි බෝවී මෙන් පසු තවත් රන්කිරි ගොකටු වර්ගයක් එයට එකතු විය.

කටු සහිත රත්වන් පාට කිරි නික්මෙන ඒ පැළෑය ද ආයුර්වේදයට හා දේශීය වෙදකමට ඇතුල් කර ගැණීමේ දී කණ්කට පත්‍රී, සවර්ණක්ෂීරී, රන් කිරි ගොකටු යන නම් වලින් හැඳින්වීම ය එයට හේතුව. එක ම නමින් පවත්නා මේ දෙවර්ගීය රස--ගුණ - ඕජා වශයෙන් හා හැඩහුරු කමින් ද වෙනස් ය.

රුක් ගොකටු (රන්කිරි ගොකටු) ගස ගොරක ගසක් වැනි විශාල වෘක්ෂයකි. කණ්ටකී පත්‍ර (රන්කිරිගොකටු)ගස කටුවැල්බටු වැනි කුඩා පැළෑයකි. පිට රටින් අළුතෙන් ආ පැළෑයකට රන්කිරි ගොකටු යන නම තබා අපේ පැරණි රන් කිරි ගොකටු ගසේ නම මකා දමන්ට ඇතැම් අය ගන්නා උත්සාහය ගැණ අනුකම්පා කළ යුතු ය.

(රන්කිරි ගොකටු පැලෑය ගැණ 396 පිටේ ලියා ඇති විස්තරය බලන්න)

රුක්පෙනෙල-ගස්පෙනෙල= (163 පිටේ ගස් පෙනෙල ගැණ ලියූ විස්තරය බලන්න)
රුක්බුරාද-භිඹුරා
රුක්බෝ-රුක්අත්තන ගස
රුක්ම--නාකෙසරු
රුක්මිණී- සවර්ණක්ෂීරී(රන්කිරි ගොකටු)
රුක්රුකුන්-රුක්ගස්
රුක්සිදුරු-ගස්බෙන (වෘක්ෂකුහර)

රුකහුණ—ගස්අහුණ

රුකහුණ—ආංකොල
(ගණිපුෂ්ප)

මෙහි කොළ දිග-පළලින් මකුළු කොළවලට සමාන ය. එහෙත් මකුළුකොල මෙන් සම්පූර්ණයෙන් දිග හැරී නැත. මදක් ගොටු ගැසී ඇත. මේරූ කොළ පවා ලපවී පෙනුමෙන් යුක්ත ය. මස සහිත ය. ප්‍රාණවත් ය. මල් දෙඹ මල් වලට මදක් සමාන නමුත් පිපුන විට රේණු ඊට වඩා දික්ව සිටී සි. ඒ මල් තද සුවඳකින් යුක්ත ය. ගසේ කඳ සුදු පාට ය. අඩි 30 ක් පමණ උසට වැවෙ සි.

තේජාන්විත වෘක්ෂයක්

මෙය පුදුම් ඵලවන ඖෂධ ගුණයකින් යුත් තේජාන්විත දුර්ලභ වෘක්ෂයකි. මේ ගස් තිබෙන ඉඩම් වලට සර්පයෝ නො පැමිණෙති. තිබිරි ගෙඩියෙහි මෙන් ඉදිරියට තෙරා තිබෙන තොම්බක් ඇති ඇඹුල් පේර වැනි මේ ගසේ ගෙඩි වල ඇතුළත ඇත්තේ එක ම ඇටයක් පමණකි.

අහසින් යාමට

අදෘශ්‍යමාන ව(නොපෙනී)සිටීමට හා අහසින් යාමට විද්‍යාධරයන් විසින් සකස් කරණ අදුන් වලට් මේ තෙල් අවශ්‍ය බවත්, නියම පිළිවෙළට ඇට ලබා ගත හැක්කේ හිමාල වණ ප්‍රදේශයෙහි වැවෙන මේ වර්ගයේ ගස් වලින් පමණක් බවත් බෙහෙත් වදුළු පොත් වල කියා තිබේ. ලඞ්කා වේ තිබෙන රුකහුණ ගස් කීපය පරීක්ෂා කර බැලීමි. ඒවා යේ සෑදෙන ගෙඩි වල ඇතුළ ලා රත් පැහැයෙන් යුක්ත ව හිස් ව තිබේ. ඇතුළෙහි ඇටයක් හෝ වෙන කිසිවක් නැත. අපේ රටේ තිබෙන යම්කිසි ගසක ඇට සෑදෙනොක් එය හිමාලය අඩවියට සමාන පෘථිවි රසයෙන් යුත් උසස් භූමියක පිහිටීම නිසා සිදු වන ප්‍රාතිහාර්‍යයක් විය හැකි සි,

රැ

රැකුදු-රැක්මල්
රැක්‍ය-රත්‍රන්,අත්තන,ලෝකඩ, කාමල් රේණු
රැව-දුමැඩ
රැවක-සර්ජිකක්ෂාර, (සුවසලුණු) වලඟසාල්, දෙළුම්, ලුණු, ගෝරෝචන, එරඹු, ලප්නාරං, බදුල්ල, බළල්ලුණු, කළුද
රැවරැකඩ-බුරුද ගස
රැවි-ගෝරෝචන
රැවිකන්තක-කොත්තමල්ලි
රැවිර-මිරිස්, තියඹරා, කොකුම්, කුරුඳු, ගෝරෝචන, කරාබු කැටි, රිදී
රැවිරබඤ්ඣ-යෘසභක, උණම්බුළු, කළු කිරිබදු
රැවිරාඤ්ජන-මුරුංගා
රැවිශ්‍යා-දියමිත්ත
රැවු-එරඹු, හෙළ එරඹු
රැව්‍ය-සුවසලුණු, ඉඟිනිගස, ඇල්වී
රැව්‍යක-සුවස ලුණු
රැව්‍යකන්‍ද-කිඹාරම්
රැජා-ලෙඩ, කොට්ටම්
රැජාකර-කාමරංගා ගෙඩි
රැජාසන-වැලඟුණ
රැතිදෙනගොමුය-රැව් දෙනකගේ ගොම හා මූත්‍ර
රැතීකා-උළුවා
රැදිර-රැඹිරය (ලේ)
රැදිරය-ලේ
රැදිරහර-රත්හඳුන්
රැදුරු-කවුවැල්බටු
රැදුරුබීජ-ජයපාල ඇට
රැද්‍ර-බෙලිගස
රැද්‍රජ-රසදිය
රැද්‍රජටා- ඊශ්වරයාගේ ජටාව බඳු පිහුවන් පාට ඇති වැල්ජාතියක්, (ජටාමකුට)
රැද්‍රපත්නී-එළ ඊතණ, ඇඟැස්ස
රැද්‍රපුෂ්ප-බදුවද, වද
රැද්‍රප්‍රියා-අරලු, ගුගුල්
රැද්‍රමල්ලි-කෝවක්කා
රැද්‍රා-හෙළ තම්පලා
රැඩිර-ලේ, තඹ, කොකුම්
රැඩිරනාමක-කොකුම්
රැඩිරපාඝි-කුඩැල්ලා
රැප්‍රතෙල්-එරඹු තෙල්
රැබු
රැබුක
රැඹුක } එරඹු
රැලන්-රළු තිරිඟු පිටි
රැවත්-රත්‍රන්
රැවු-එරඹු, රත් එරඹු
රැෂකා-කුෂ්ඨ රෝගය
රැෂ්‍යජිහ්ව-මහා කුෂ්ඨ රෝගය
රැෂ්කරා-මකුල්ගස
රැහ-ඇඹුල
රැහර-සමූහය

රෑ-ශුක්‍ර ධාතුව
රෑක්ෂ-දැත්ත ගස, කොට්ටම්, වියලි දේ
රෑක්ෂගන්ධ-ගුගුල්, පෙරුම්කායම්
රෑක්ෂපත්‍ර-ගැටනිවුල්
රෑක්ෂප්‍රිය-ඍෂභක
රෑක්ෂා-දූදු
රෑකාංවා-ලප්නාරම්
රෑකණ්ටා-ලප්නාරම්
රෑප-කුප්පමේනිය

රෙ රො

රූපලාභිනී–දූදු
රූපවාන්–හෝපලු ගස
රූපාරී–කොසඹ
රූපිකා–එළවරා
රූපිමාක්ෂිකා–දියරිදී
රූපිය–රිදී
රූප්‍ය(ක)–රිදී
රූප්‍යතාර–රිදී
රූෂක– වංඅපල, කුෂ්ඨ රෝග විශෙෂයක්
රූස්කරා–මකුල්, මඤුල් ගස
රූහා–මහපෝටා වැල

රෙවක–පික්මල්,යවකර, ජයපාල, මාරා ගස, ඇසළ
රෙවන–හොඳ මිරිස්, ඇසළ,මහරි= මදටිය, ජයපාල, යවකාර ලුණු
රෙවනක–වෙලඟ ගස
රෙවනී– ත්‍රස්තවාළු, මිරිස්, කටු වෙළඟ
රෙවී–අහුණ, වෙළඟ, රඹුටන්
රෙණු–පැපිලිය, මල්රේණු, දූලි, පස්
රෙණුකා–රාහාණිය (වටරාහැණ)
රෙණුනාමක–පැපිලිය
රෙණුසාර–කපුරු, මල්රේණු
රෙණුකෝ–හරේණුක
රෙවක–කරල්සැබෝ
රෙවත–මීගස
රෙවෙර–මානෙල් අල, නෙළඹල
රෙහෙර–නෙළුම් අල, සුළු ඕලු අල
රෙහෙනිසුරු–කපුරු
රෙළි–නිල් උණ ගස

රේණු–රොන්, පැපිලිය
රේණුක–රාහාණිය (වල්ගා මිරිස්)
රේණුනාමක–පැපිලිය
රේතස්–ශුක්‍රධාතුව
රේමස්–රේරු
රේරු–රේරු ගස් (කෙෂමුෂ්ටි)
රේවති–ගුගුල්

රොකම්–රෝගී
රොග–කොච්චම්,ධාතු විෂමවස්ථට ගන්නා ලෙඩ
රොගරාජ–ක්ෂය රෝගය
රොගශිලා–මනෝසිල
රොගහාරින්–වෛද්‍යවරයා
රොගාර්ථී–ලෙඩඇත්තා
රොගිතරු–හෝපළු ගස
රොචක–රෝමලුණු, උද්නිදලුණු, ගොරඳ
රොචන–ගෝරෝචන, කටු ඉඹුල්, එලමුරුංගා, සුදුලුනු, කරඳ, රඹුටන්, ඇසළ, දෙළුම්, රතු හෙල්මැලි
රොචනක–දෙඩම්
රොචනකඵල– දෙළුම්, දෙඩම් ප්‍රභෙද, ඩෙඩර ගස
රොචනා–මනෝසිල, ගෝරෝචන, නෙල්ලි, එලත්‍රස්නාවාළු
රොචනී–ත්‍රස්නාවාළු, මිරිස්, කුඩු වෙළඟ
රොචනෝ–කොළ හිඹුල්
රොඩී–නීතිවැල
රොදන(නී)–ඇල්කසඹිලියා
රොදනිකා–යවාස
රොදනී–දුරාලභා
රොන්–රේණු
රොම–ලොම්, කොල්ලන් කොළ, රෝමලුණු, කැකිරිවැල, මසිල් මූල

රෝ

රොමඤ්ච–පාංශුලුණු, සම්භාරි නම් ලුණු, රෝම ලුණු
රොමන්‍ථිත–මුලබටු
රොමලවණ–රොමලුණු
රොමලුණු–යවනලුණු
රොම වල්ලි සමන්විත–රසතාල්ල
රොමශ–කොල්ලන්කොල
රොමශක–රෝමලුණු
රොමශා–ගෙන්දගම්
රොමසි–ගස්කැලිය
රොමස්‍යා–කැකිර
රොමහර්ෂ–සාදිලිංගම්, හිඟුල්
රොමහර්ෂණ–බුළුගස
රොමාලවිටපිත්–ඇත්දෙමට
රොල–පිය යුතු නෙල්ලි
රොළු–කටරොළු, (හෙල(සුදු) කට රොළු, නිල් කටරොළු ය යි වඟී දෙකකි.)
රොසන–කටුකරෝහිනී
රොහනද්‍රැම–සුදුහඳුන්
රොහි–වල්එරබදු
රොහිණි–කටුකරඹු
රොහිත්–තික්තලබු
රොහිත–වල්එරබදු, ත්‍රාසනාවාළු
රොහිතක–වල්එරබදු
රොහිතෙය–වල්එරබදු
රොහිනී–දිඹුල්, මුවකිරිය, එරබදු, අරළු, කටුකරෝහිණි, ඉදටගස, ඇත්දෙමට
රොහිෂ–සුවඳ තණ, වල්එරබදු, අසුගස

රෝහිතක

රෝහිතක

කැල වෙනුවට ඉන්දියාවේ ගන්නේ මේ ගසේ සාරය යි. මෙහි කොළ දිග පළලින් අඟල් 7 × 2 ක් පමණ ඇත. මෙහි කොළ හා කඳත් අපේ රටේ තිබෙන ගල් මොරගසක කොළවලට හා කඳට සමාන ය. මේ වඟීයට ලඬකාවේ ඇතැම් පළාත්වල වල් එරබදු යන නම ද ව්‍යවහාර කරති. (ඉදිරියෙහි හිඟුල් ගැණ ලියා ඇති විස්තරය බලන්න)

රෝචනී–මිරිස්, මිංජි(මිසදුවි)
රෝම–කැකිරිවැල, මයිලමල
රෝස–මල්ගස් ජාතියක්
රෝසන–කටුකරොහිණි

රෞ ල

රෝහිණ-එරබදු
රෝහිණී-මදවිය, මුවකිරිය, කටු කරෝහිණී
රෝහිණීද්‍රැම-සපුගස
රෝහිස-අසුගස්

රෞද්‍ර-ජටාමාංශ
රෞප්‍ය-රිදී
රෞම-ශාම්බරී (ගම්හාරි) ලුණු, (රෝමලුණු)
රෞමක-රෝමලුණු
රෞහණ-සඳුන් රැක
රෞහිණ-සඳුන්
රෞහිණී-සුදු සඳුන්
රෞහිෂ-ඊතණ

රෘ-රත් හිරියල්

ල-හදවත
ලක්තක-ලතුදිය (ලාක්ෂාරස)
ලක්තකමීන්-රත්ලොත්
ලක්තා-ලාකඩ
ලක්ෂක-උණකපුරා
ලක්ෂණ-ඇපල ගස
ලක්ෂමණා-රසතාල්ල, කටුවැල්බටු
ලක්ෂ්මී-සෑම, සුළුදඬකලත්, මැණික්වැන්න, ඍද්ධි නම් ඖෂධය, එක් පෙති පියුම්
ලක්ෂ්මීඵල-බෙලිගස
ලක්ෂ්මීවත්-කොස්ගස
ලකව-දෙහිගස
ලකවැලිය-බුත්සරණ
ලකුව-දෙල්ගස, කොස්ගොන්න ගස
ලග්නී-උණකපුරා
ලගතඃ-සින්මිදි
ලගුඩ-රත්කණේරු
ලඹ්බී-ඩෙබරගස
ලඹු-බෙරා,බී, පික්මල්,උණකපුරා, මිලඳ, රත්එරඹු
ලඹුකාශ්මර්‍යී- ඇත්දෙමට හෙදයක්
ලඹුකාශීෂ-මල්කසිස්
ලඹුවන්දන-වැල්මදට
ලඹුවිභීටා-ඩෙබර ප්‍රභේද, කැකිරි,
ලඹුදනාී-හින්දත්ත
ලඹුනාමන්-අගිල්, සඳුන්
ලඹුපර්ණී-මුරුවා
ලඹුපුට-ගොමවැරවි අටකින් දෙන පුටය. එහෙත් රිදී ආදී ලෝහ ධාතුවල දී ගොම වැරවි 30 කින් දෙන පුටය ලඹුපුට නම්.
ලඹුපුෂ්ප-රත්ලොත්, මුඩමහණ, පුවක්ගස්, බින්කොලොම්
ලඹුපුෂ්පා-රන්වන් වැටකේ
ලඹුබදර-හින්ඩෙබර
ලඹුබ්‍රාහ්මී-හින් ලුණුවිල
ලඹුමන්ථ-සින්මිදි
ලඹුලය-සැවැන්න
ලඹුවල්කල-මුරුවා වැල
ලඹුවිරේචනී-දැත්ත
ලඹුසදෘඵලා-හින් දිඹුල්
ලඹුහෙමදුග්ධා-හින්දිඹුල්
ලඹකාසි(පි)කා-පික්මැලි
ලඹකාස්නාසි-නවහන්දි
ලඹකරි-කටුකරෝහිණී
ලඹෙකපිකා-පික්මැලි
ලජ්ජය-රහස්පියස
ලජ්ජාලු-නිදිකුම්බා
ලජ්ජිරි-නිදිකුම්බා
ලජකා-නිදිකුම්බා
ලජකාරිකා-නිදිකුම්බා
ලජකාරිකාරිකා-නිදිකුම්බා

ලට්ට ලව

ලට්ට-මීගස
ලට්ටා-වනුක්
ලටු-වැල්මී, වැල්මදට
ලතීවන-වැල්මී වන
ලතඹ-ලා දළුව
ලතා-වැල, පුවහු, ඊතණ, දූදු, යොහොඹු
ලතාකස්තූරිකා-කපුකිනිස්ස
ලතාග්‍ර-පඹළු
ලතාතරු-නාරම්, තල්,සල්
ලතානත-මල්
ලතාඵල-පතෝල, දුම්මැල්ල
ලතාමණි-පබලු, ලාකඩ
ලතාමරුත්-පික්මල්
ලතායෂ්ටි-වැල්මදට
ලතායාවක-පඹළු
ලතායාසු-කිරිබදු
ලතාකී-රන්වන් ලූනු, නිල්ලූනු, පබලු
ලතාවගී-රසකිඳ
ලතාවෘක්ෂ-සල්ගස
ලතාශ්වා-ඉරමුසු
ලතු-ලාකඩ
ලද-කුකුරුමුවන් ගස
ලදපස්මල්- ඊතණ, සමන්පිච්ච, සුන්සහල්, සුදු අබ, විලඳ
ලන්තු-රසකිඳ
ලන්තුකාද්වික-තල්ගස
ලප්-විලඳ
ලප්තැල්ල-තැල්වැල් වගීයක්
ලප්නාරං-නස්නාරන්
ලප්නාරඟ- නත්නාරන් (නස්නාරන්)
ලප්වටු-වටු (වට්ටක) (පක්ෂි වගීයක්)
ලපක්-මැලැස්ස (ලා ගෙඩි)
ලපත-මුඛය
ලපළු-ලා දළුව
ලපුස්-දෙල්
ලබදු-දෙල්
ලබු-දෙල්ගස
ලබුසා-ලබු
ලබොර-කප්පරවල්ලිය
ලඹු-ගැටපිච්ච
ලම්පත-තුරුක්තෙල්
ලම්බකර්ණ-රුක්අතුණ ගස
ලම්බදනතා-ලඹකා නිප්පිලි
ලම්බන්විජා-වනා නිප්පිලි
ලම්බඵල-කිරිපළු
ලම්බඵලා-ගඩනහිරියා
ලම්බවීජා-ලංකා නිප්පිලි
ලම්බොෂ්මා-නික්ත ලබු
ලම්වා-නික්තලබු
ලමඟ-කුරුඳු, කරාබු
ලමඟගස්-කුරුඳු හෝ කරාබු ගස්
ලමඟමෙලදල- කුරුඳු, එන්සාල්, කොල්ලන් කොළ
ලමඟසුඹුළු-කුරුඳු පොතු
ලමට-මීගස
ලමසි-කොල්ලු,(බිළිදුන්)
ලමා-කොල්ලම්කොළ ගස
ලමැඬ-හදවත
ලමෝර-කප්පරවල්ලිය
ලයිනෝරු- සායම් දිය කිරීමට ගන්නා තෙල් ජාතියක්
ලකී-වරා
ලර්කි-කැකිරිවැල
ලලන-සල්ගස,තල්ගස, පියල්ගස, දුම්මල
ලලනාප්‍රිය-කොළොම්, ඉරිවේරිය, අරුද
ලලිත-කස්තූරි
ලව-ලැහැබ, කරාබුනැට්

ලා

ලවඹග- කරාබුනැටි, කුරුඳුගස, කරාබු ගස
ලවඹගකලිකා-කුරුඳු
ලවඹගපුෂ්ප-වසාවාසි
ලවඹගසුඛුලු-කුරුඳුපොතු
ලවණ-ලුණු, බළල්ලුණු, මහදුඩු
ලවණකිංශුකා-මහදුඩු
ලවණචජ්ජ-ලේනියපලා
ලවණපෘථුවීභව-උද්භිද ලුණු
ලවණමූල-ලුණුමඩ
ලවණා-දූඩු
ලවණාඛ්ධිජ-මුහුදුලුණු
ලවණාෂ්ටක-සවිඳවලුණු, සුවස ලුණු, කළුලුණු,මුහුදුලුණු,පාංශු ලුණු, බළල්ලුණු, උද්භිදලුණු, රෝමලුණු
ලවණිකා-ලේනියපලා
ලවණොත්තම-සවිඳව ලුණු
ලවණොබ්ධිසම්භව-මුහුදුලුණු
ලවන්-ලපල= (ලවන = අළුතෙන් වැවෙන කැල ය)
ලවන-ලපල
ලවලිකා-සාදික්කා
ලවලී-අනෝනා, කටු අනෝනා
ලශ්‍ය-සළල
ලසවල්ලිය-දියෙහි වැවෙන වැල්
ලසා-කහ අල
ලසිකා-උක්පැණි, සඳමිදුළු
ලසුන
ලසුනු } සුදුලූනු
ලහවු-දුම්මල, ලාවු

ලාක්ෂා-ලාකඩ, හෙළ ලොත්
ලාක්ෂාප්‍රසාදන-ලොත්
ලාක්ෂාඵල-ලා ගෙඩි (මැලයි)
ලාක්ෂාරස-ලතුදිය, සිනිදුව ඇඹරූ ලාකඩ එක් ගුණයකට පිරිසිදු වතුර හය ගුණයක් සිටින සේ ගෙණ ලාකඩ සුණු ජලයේ ගැවෙන පමණට භාජනයක තබා රත්කිරීමෙන් වණීවත් වන ජලය නැවත නැවත පෑදෙන්නට තබා පෙරා ගැණීමෙන් පසු ලතු දිය සැදේ.
ලාක්ෂි-ලාකඩ
ලාක්ෂිකා-හරංකසා
ලාක-රත්ලොත් ගස
ලාඛා-ලාකඩ
ලාඛාපසාදන-රත්ලොත්
ලාඝව-නීරෝගී
ලාඞගලි-නියඟලා
ලාඞගලිකා-පුස්වැන්න,ලියනඟලා
ලාඞගලින්-පොල් ගස
ලාඞගලී-ලියනඟලා, නියඟලා=දත් කැක්කුම සැදුන විට මේ අල අඹරා නොරිදෙන (දත් රැදුව නැති)අංශයේ පස මාපට ඇඟිල්ලේ බැඳීමෙන් සමහර දත් කැක්කුම් සුව වන බව පෙනේ. (275 පිටේ නියඟලා ගැන ලියා ඇති විස්තරය බලන්න.)
ලාඞගුල-තල් ගස
ලාඞගුලිකා-අස්වැන්න, පුස් වැන්න
ලාඞගුලී-අස්වැන්න, වඳුරු මෑ
ලාජ-සාවැන්න, බැදිනාල්, විලද
ලාජ පුෂ්පී-මහල් කරද ගස

ලි ලු

ලාජා-විලඳ
ලාජාදි-විලඳ ආදි කොට ඇති
ලාජාපානිත-මල්තැලි දිය, මල්සර (මල් පැණි)
ලාජා පුෂ්පි-මහුල් කරඳ ගස
ලාටපර්ණ්‍ය-කුරුඳු පොතු
ලාදුරු-දරුණු පාප රෝගයක්
ලාපිනී-යොන්තුඹ
ලාබු (ජ)-ලබු
ලාබූලතා-ලබු වැල
ලාබුසතුම්බි-ලබු
ලාමජ්ජ (ක)-සැවැන්න
ලාමිච්ච-සැවැන්දරා
ලාලන-දුම්මල
ලාලා-කෙළ
ලාලු-පොල් කිරි සමග මිශ්‍ර කර උකු කළ පිටි කැන්ද කොළ වල ගා අච්චෙන් වියලා ගලවා ගත් පප්පඩම් වැනි සිනිදු රොටී පොල් තෙලෙන් බැද පැණි ඉස පිළියෙළ කරගන්නේ ලාලු නම්.
ලාස් හතර-ද්‍රෝණය, (පලම් 256)
ලාස-නැලි හතර=(කුරුණිය, පත 16, සිව් නැඩුමක්)
ලෑම-හිරියල්

ලිංගම්-හිඟුල් (සාදිලිඩගම්) රසදිය පෙරාගන්නේ මේ සාදිලිඩගම් වලින් ය. එයිනුත් රසදිය වැඩි පුර නිබෙන්නේ උලාදිලිඩගම් වල ය.
ලිකුව-දෙහි ගස, දෙල් ගෙඩි
ලිකුවියුස-දෙහි ඇඹුල්
ලිකුවෝ-දෙහි
ලිකොවක-රෑක් අහුන ගස
ලිඩග-සාදිලිංගම්
ලිඩගක-ජූල් ගස (දිවුල් ගස)
ලිඩග වඩිනී-සැබෝ
ලිප කදලි-අළු කෙසෙල්
ලියකස්තුරු-තකුල්(කපු කීනිස්ස =ලතා කසතුරිකා)
ලියන් තන රස-තන කිරි
ලියනඟලා-ලාඩගලී, නියඟලා
ලිහිල කොළ-ඉල්ල කොළ

ලිනියන්-නද ඇඹුලකින් යුත් ගෙඩි හටගන්නා අම්බිල ගණ යට අයත් ගසක්

ලුංග-ලප්නාරම්, ඇඹුල්දෙඩම් ගස
ලුසඤ්ර-එන්සාල්
ලුණඹු-ලුණුදිය

ලුණුකැමියා වැල්



ලුණුකැමියා වැල් — පූරා
(පාකාල ගරාඬි)
Cocculus Villosus

ලුණුකැටියා වැල්

මෙය යාපනය තිරිකුණාමලය ආදි වැලි සහිත මුහුදුබඩ ප්‍රදේශවල වැවෙන දියමිත්ත පවුලට අයත් වැලකි. මේ වගීයේ කොළ කුඩා රසකිඳ කොළ වැනි අළු පාටින් යුක්ත ය. දියමිත්ත වලට වඩා මස සහිත ය.

දියමිත්ත – ලුණුකැටියා වැල් දෙවගයම එක තැන තියා බැලුව නොත් පෙනෙන්නේ සිංහල පුවක් සහ රට පුවක් දෙවගය අතර ඇති වෙනස වැන්නකි. ලුණුකැටියා – දිය මිත්ත පවුලේ ප්‍රමාණයෙන් විශාල වගීය වන බව කිව හැකි යි. "පාඨා වෙනුවට දිය මිත්ත ගැණීම වැරදි ය. ඒ වෙනුවට ගත යුත්තේ ලුණුකැටියා වැල් ය" යන කියම නෙහි ඇති සත්‍යයක් නැත මේ දෙවගයම ගුණයෙන් සමාන බැව් විශෙෂඥ මතය හෙයිනි. එම නිසා පාඨා වෙනුවට මේ දෙවගයෙන් ලැබුන දෙයක් ගැණීම සුදුසු බැව් කියම්.

පාඨා අපේ දේශීය වෙදකමේ නොයෙක් ඖෂධ යොග සමග යෙදී ඇත. විශෙෂයෙන් පිළ්‍රිස්සීම, සර්ප විෂ, උපදංශ, (පරංගි) සම්බන්ධ රොග හා ලිඛිතික රෝග පිළිබඳ ඇතිවන වේදනා සන්සිඳුවීම සඳහා ආලෙප කිරීමට ද පාඨා කොළ ප්‍රයෝජනවත් ය.

ලුණු පස- සවිඳ, සුවස, බළල්, කාච, මුදු යනු ලුණු පස යි.
ලුණු මාළු-ලුණු මස්

ලුණුවරණ ගස



ලුණුවරණ—වරුණ
(අශ්මරිඝ්න)
Cratoeva Religiosa

මෙහි කොළ කොබ්බැ කොළ වලට සමාන ය. එක නැව්වේ කොළ තුන බැගින් පිහිටා තිබේ. ගසේ කොළ සියල්ලම අවුරුදු පතා වැටී ගස ඉපලක් මෙන් වෙයි. ඉන් පසු අතු අග සුදු පාට මල් පොකුරු හට ගණියි. මේ ගසේ අතු ලුණු පුපුරු මෙන් වහා බිඳෙයි.

මෙහි සාරය දේශීය වෙදකමේ නොයෙක් ඖෂධ යෝග වලට ඇතුළත් ව තිබේ. එයින් අශ්මරී හා මූත්‍රාශය පිළිබඳ රෝග ප්‍රධාන ය. මෙය ශක්තීරාශ්මරී භෙදනයෙහි ලා මහත් ක්‍රියා කාරී බලයක් ඇති ඖෂධයකි.

ලූ ලේ

ලූන'ඹ-මුදු වතුර, (කරදිය)
ලූප් ඉදුරු-උදුගොව්වා
ලූපුල්-පොල්
ලූලඟ-හන් අවුරුදු ලුණු
ලූහුනු-ලූනු (රතු ලූනු, සුදු ලූනු, රට (ලොකු) ලූනු යයි ලූනු වර්ග කීපයකි)
ලූහුල්-ලූල්ලූ =(ලූහුල් මත්ස්‍යයෝ, වයස් ගත වූ ලූලාට කළු මඟ යයි කියති)

ලූතා-මකුළුවා, යොන්තුඹ
ලූතා විෂ-දිවි මකුළු විෂ
ලූනිකා-මකුළුවා
ලූනල-කරවැල් විෂට ගන්නා කුඩා ලූනු අල වැනි අල ඇති පැලෑටියක්
ලූනල අල-වල් ලූනු
ලූල-ජවනාරන්

ලෙඛ්‍යවර්ධ-තල් ගස
ලෙඛ්‍යදල-තල් ගස
ලෙඛ්‍ය පත්‍රක-කරඟ ගස (තල් ගස)
ලෙඛ-ගෙන්දගම්
ලෙඛණ-ගම්මිරිස්
ලෙඛන-භූජපත්‍ර, මිරිස්
ලෙඛන පත්‍ර-තල්ගස, භූජපත්‍ර
ලෙබු-දෙහි ගස
ලෙනිකා-ලේනිය පලා
ලෙඹි-ලෙල්ල
ලෙල-ගෙන්දගම්
ලෙවන්-රත්හඳුන්
ලෙහ-ලප්නාරම්
ලෙහා-තලප, (ලේහ)
ලෙහ්‍යා-තලප (ලේහ)

ලේ-ලෙය (රුධිර)
ලේඅතීසාර-රක්තාතීසාර රෝගය
ලේගියම්-මත් බව ඇති කරණ ලේහ ද්‍රව්‍යයක්
ලේ පාවන-ලේ අතීසාරය
ලේමාලේ-සත්‍රී න් ට වැළඳෙන මාලේ(ප්‍රදර=කිළිමාලේ)රෝගය
ලේවැන්න-කැප්‍රන් කිරිය

ලේවැරැල්ල—අසියා පාන
(බෙංගාලි)



ලේවැරැල්ල — මාංශරෝහිණී
Eupatorium Ayapana

රට බිලිං හෝ වැරණියා කොළ වලට මදක් සමාන මුහුණුවැන්න මෙන් බිම දිගේ මුල් අල්ලා වුවන පඳුරු වර්ගයකි. මෙහි රත් පාට කොළ - නැවි සහ දඹු ඇති වර්ගය ලේවැරැල්ල නමින් හැඳින් වේ. මේ වර්ගයට ම අයත්

ලෝ

එල පාට දඹු - කොළ හා තැවි ඇති තවත් වගීයක් ද තිබේ.

මෙය ප්‍රංශය ජන්ම භූමිය කොට ඇති පැලෑටියකි. **අඟා පාන-අඹියාපාන** යනු විදෙශික නාමයෝ යි. මේ පැලෑටියේ ලක්ෂණ හා වැවෙන සවභාවයත් සලකා මෙය ට **ලේවැරැල්ල** යන සිංහල නාමය තබා තිබේ මෙය දහඩිය උපදවන රකතාතී සාර නාශක ඖෂධය කි. අපර දිගින් පෙර දිගට මේ පැලෑටිය බෝවී වැඩි කලක් ගත වී නැත. එහෙත් දැනට ලඞ්කාව ඇතුළු ඉන්දියා - ජාවා යන රටවල මෙය විශාල ලෙස පැතිර ගොස් තිබේ.

ලොකප්‍රිය-මහ දඩ කලන්
ලොකෙශ-රසදිය
ලොචක-කෙසෙල් ගස, මූරු වා වැල
ලොචන-ඇස
ලොච මස්තක-මොණර කුඩුම්බිය
ලොප්සුඹුලු } ලොන්සුඹුලු
ලොපුසුඹුලු }
ලොඞ්-ගොරක ගෙඩියේ මදය
ලොඛ්‍යා-තෙල ගස
ලොණ-ලුණු
ලොණසෝවීර රසය-ලුණු කාඩි= (මෙය උදර වාතාබාධයට බුදු රජානන් වහන්සේ විසින් නියම කරණ ලද ඖෂධයොග යකි. ශුද්ධ කළ යව සහල් සවිඳ ලුණු සමග ඇල් දියෙහි බහා මැටි බදුනක ලා ඇබය ගසා දෙසතියක් පොළ වෙහි වළලා තබා පෙරා ගත්තා (කාඩි) ජලය.
ලොණා-හීන් ඇඹුලැඹිලිය
ලොණී-ගෙදෑ, ගෙදපලා

ලොන් සුඹුලු



ලොන් සුඹුලු

Melaleuca Lucabendron

ලොන් සුඹුළු - ලොධ්‍ර යයි වගී දෙකකි. මේ ජායා රූපයෙන් දක්වෙන්නේ ලොන් සුඹුළු ගස කි. මෙය ගම්මි කොළ වැනි සිනින් දිග කුඩා කොළ ඇති සුඹුළු වැනි පොතු ගැලවී යන ගුරු පාට කඳ කින් යුත් විශාල ගසකි. ලොන් සුඹුළු නම් ලඞ්කාවේ විකිණීමට තිබෙන්නේ මේ ගසේ සුඹුළු යි. ඉන්දියාවේ

ලොන් සුඹුළු

ඇතැම් ප්‍රදේශ වල මෙය ලොධ්‍ර වෙනුවට ගන්නා අතර වෙනත් ප්‍රදේශ වල වීදුරු බඩු - පිඟන් - කෝප්ප ආදිය පටවා (පැක් කර) යැවීමේ දී ආරක්ෂාව පිණිස දමන පිදුරු වෙනුවට පාවිච්චි කරති.

ලොධ්‍ර වෙනුවට මේ සුඹුළු ගැණීම හරි නැත. ලොධ්‍ර සුඹුළු සහිත ගසක් නොව කජු පොතු වැනි ඝණ පොතු වලින් යුත් (Symplocos Racemosa) යන ලැටින් නාමයෙන් හැඳින්වෙන ගස් වර්ගයකි. දැනට මේ වර්ගයේ පොතු ලඞ්කාවේ බෙහෙත් බඩු කඩ වල තිබේ. **ලොන් සුඹුළු** කියා ඉල්ලූ විට ඉහත සඳහන් සුඹුළු ත්, **ලොධ්‍ර** කියා ඉල්ලූ විට මේ පොතු වර්ගය ත් ලබාගත හැක.

ලඞ්කාවේ තිබෙන බෝඹු ගස ද ලොධ්‍ර ගණය ට අයත් ගසකි. ලොධ්‍ර පොතු ලබා ගන්ට බැරි වූ විට ඒ වෙනුවට ප්‍රතිනිධි වශයෙන් බෝඹු පොතු ගැණීම සුදුසු බැව් කියමි. අපේ රටේ පැරණි දේශීය වෛද්‍ය වරු ලොධ්‍ර වෙනුවට බෝඹු පොතු මෙන් ම ලුණුවරණ පොතු ද රැගෙන තිබෙන බව පැරණි වට්ටෝරු වලින් පෙනේ.

ලොධ්‍ර පොතු, අතීසාර, ජ්වර, ලාදුරු යන රෝග වලට ත් යෙම් නැසීමට හා දත් මුල් ශක්තිමත් කිරීමට ත් ගන්නා ඖෂධ යෝග වලට ඇතුළත් කර තිබේ.

ඉන්දියානුවෝ මේ ගසෙන් ලබාගන්නා ආයමක් නළලෙහි

ලොම කකීට

තිලක තැබීම සඳහා පාවිච්චි කරති. ඒ නිසා ලොධ්‍ර වලට **තිලක** යන අපර නාමයක් ද ලැබී තිබේ.

ලොද්දආදි ගණය-ලොධ්‍රාදි ගණය
ලොද්දෙ-ලොත්
ලොද-ලොත් ගස
ලොදරද-ලොත්මල් රේණු, ලොත් සුඹුළු සුණු
ලොද-තල්ආදියෙහි බුරුල්වූ මදය, කෝමාරිකා කොළයෙහි මදය
ලොදම්-රත් ලොත්
ලොධ්‍ර-ලොත් ගස
ලොධ්‍රඛය-සුදු හා රතු මල් ඇති ලොත් ගස් දෙවර්ගය
ලොධ්‍රාදි ගණය- ලොධ්‍රඛ (හෙළ, රත් ලොත් දෙවර්ග) ය, කලා දුරු, හෝපලු, කෙසෙල්, සල්, එලවාලුක (එල්වළු = අළු ඇට) කොළොම්, වැල්මදට, ඇද්දෙමට, ඉන්සලු (බෝ) යන මේ ගණය, සෙම් හා මේදස් වියලීම, යෝනි දෙෂ දුරු කිරීම, වණ හා සියලු විෂ ත් පහ කරන්නේය.
ලොධ්‍රපිලුක-එතෙහි වූ මෝර
ලොධ්‍ර වෘක්ෂ- ලුණුවරණ = ලොධ්‍ර වෙනුවට මෙරට වෙද වරු ලුණු වරණ පොතු ද පාවිච්චි කළ බව පැරණි වට්ටෝරු වලින් පෙනේ.
ලොධ්‍ර ශාලව-හෙළ ලොත්
ලොන පත්‍රිකා-ලේනිය පලා
ලොන පිණ්ඩ-ලුණුමඩ
ලොප් සුඹුළු--ලොධ්‍ර
ලොප්පය-දීකිරි, (මිදුණු කිරි)
ලොහනීයා-මිහ මුඛ මිහණ
ලොම කකීට-අසමොදගම්

ලෝ ව

ලොමශ-කොට දිඹුළා, ජටාමාංශ, වඳුරු මැ, වදකෑ, මහමේවන්, කොල්ලම් කොළ, බැවිල
ලොමශකාණ්ඩා-ඉඹුල්
ලොමශපර්ණියා-මස්වැන්න
ලොමශපුෂ්පක-මාරා ගස
ලොමශා-ජටාමාංශ, එළු වදකසා, වඳුරු මැ
ලොමශෘණික-මස්වැන්න
ලොමහෘත්-හිරියල්
ලොමිකා-ඊතණ
ලොමුදහ රැස්- සන්‍ධින්ගේ යෝනි මාගීය
ලොලාන්‍යක-ගෙඳගම්
ලොලිකා-ඇඹුලැඹිලිය
ලොලී-ගෙඳගම්
ලොහ-අගිල්, ලෝකඩ
ලොහක-අගිල්
ලොහ කණ්ඨක-කුකුරුමාන්
ලොහකන්‍යා-යකඩ කාන්දම්
ලොහකම්බික-කාන්දම්
ලොහකිට්ට-යබොර
ලොහජ-යකඩ මල
ලොහජ රජ-යබොර
ලොහද්‍රාවින්-පුස්කර
ලොහවර-රත්රන්
ලොහ විශුද්ධිදෘ-පුස්කර
ලොහ ශ්ලේෂණ-පුස්කර
ලොහිත-රත් හඳුන්, කටු වෙළඟ, ලේ, රත් මුරාංගා, රම්මානිස්ස
ලොහිතංකෝ-පියුම්රාමිණී
ලොහිත චන්‍දන- රන්වන් සඳුන්, කොකුම්
ලොහිත පුෂ්පක-දෙළුම්
ලොහිත බිඳු-නුග හෝ මදට
ලොහිත මෘත්තිකා-සිවංගුරු
ලොහිත යෂ්ටිකා-වැල් මදට
ලොහිත වල්ලි-වැල්මදට
ලොහිතා-නිදිකුම්බා, රතු සාරණ
ලොහිතාඞ්ගක- රත්නිටුල්, කටු වෙළඟ
ලොහිතායස්-තඹ
ලොහෝ-යකඩ
ලොහෝට්-රසදිය
ලොහොත්තම-රත්රන්

ලෝ-බළල් ලුණු
ලෝමිකා-ඊතණ
ලෝලු-ලෝලු ගස්
ලෝලේ-බොරළු දමුණු
ලෝහිත-ලේ

වංඇපල-අගල් ආඩාර,-(වැටහිර= ආඩතෝඩා = වෛද්‍යමාතා=සිංහ මුඛි) සංස්කෘත නම් නිස් හත රකින් ගැඳින්වෙන වංඇපල ත් තියෂීක් ඵල නමින් හැඳින්වෙ න පාවට්ටා ත් දෙවගීයකි. වං ඇපල හෘදය රෝග, හා බහු මූත්‍ර (දියවැඩියා) රෝගය ගැණ ප්‍රත්‍යක්ෂ ඖෂධයකි. (300 පිටේ පාවට්ටා ගැණ ලියූ තන්හි මේ දෙවගීය ගැණ ම පැ හැ දි ලි විස්තරයක් ඇත)
වංජුලමාලී-හෝපළු
වංජුලා-හෝපලු, හොමුවගු
වංමුතු-කලාදුරු
වංශ-උණකපුරා, උක් ගස, සල් ගස, හුණමකුළු
වංශ කර්පූර රොචනා-උණකපුරා, හුණ මකුළු
වංශකී- උණකපුරා, හුණ මකුළු

වංශ තණඬුල

වංශ තණඬුල-උණ ගසෙන් සෑදෙන හාල්,
වංශනෙත්‍ර-උක් මූල
වංශපත්‍ර- උණ කොළ, තල නම් තණකොළ
වංශ පත්‍රක-හිරියල්
වංශපීත-රත් ගුගුල්
වංශ පුෂ්පා- මහුල් කුඹුරුවැන්න
වංශපූරක-උක් මූල
වංශ භවා-උණකපුරා
වංශ රොවනා-උණ කපුරු
වංශ වණී-වෙරලු මිණී
වංශ ශකීරා-උණකපුරා
වංශාහ්‍ර-උණ ගොඩේ
වංශික්ෂ-අගිල්, සඳුන්
වංශික (කා)- අගිල්
වංශිඛ්‍යා-උණ කපුරා, හුණ මකුළු
වංශී-උණ කපුරා, හුණ මකුළු,
වක්ත්‍ර-තුවරලා ගස
වක්ත්‍රහුෂණ-වැල්මදට
වක්ත්‍ර වාස-නාරම් ගස
වක්ත්‍ර සොඩින්-නාරම් ගස
වක්ත්‍රාහ්ව-තුවරලා
වක්නීය- දිවි පහුරා, ව්‍යාඝ්‍රනඛ, පසුරුතලා, නීයඳ
වක්ෂ-වංඇපල
වක්ෂි-හිඟුරුපියලි
වක්‍ර-තුවරලා
වක්‍රකණ්ට- ඛෙඛර ගස, මසන්, කිහිරි ගස
වක්‍ර පුෂ්ප-කැල ගස
වක්‍රා-කකීටකශ්‍රිංගී
වක-කතුරුමුරුංගා
වක කණ්ට-ඛෙඛර ගස
වකධ්‍රප-සිරිවටු
වකුංපු-ඉඟුරා
වකුඩි-ඉඟුරා
වකුණඩි-ඉඟුරා

වච්චනාවි

වකුල-මූණමල් ගස, කවෙළු, කුළුරුණ
වග-ව්‍යාඝ්‍රයා, වනය
වගතුන්- නිකුළු, (ද්‍රව්‍ය) කරාබු, වසාවාසි, සාදික්කා යන තුන් ජාතිය
වග තුන-කරාබු, වසාවාසි, සාදික්කා
වගපුල්-නිප්පිලි
වග වැල්-වක් නිය, (දිවිපහුරු)
වර්ග-ත්‍රිවගී
වඟු-සිඟිත් ධාන්‍ය වගීයක්
වඩග-යකඩ, ඊයම්, මුරුංගා, සුදු ඊයම්
වඩගසෙන-මූණමල් ගස
වඩගාරි-හිරියල්
වඩනාරෝ- පොණ්ඩරු හෙවත් වච්චනාවි
වචාති-ගුළුය

වච්චනාවි (සිංහ - කාල කූට)



වච්චනාඩි - වණ්ඩනාභ (විෂ)
Aconitum Ferox

වච්චනාවි **වච්චානත්‍රී**

හිමාලය කඳු වැටිය ඇතුළු උතුරු ඉන්දියාවෙහි වැවෙන මෙය ප්‍රධාන විෂ වගී අටෙන් එකකි. වච්චනාවි නමින් හැඳින්වෙන්නේ මේ පැලෑටි වගීයේ වියලන ලද අල (මුල්) සමූහය ය. මේ අල දින තුනක් එළ ගෝ මූත්‍ර වල දමා විෂ මැරීමෙන් පසු වේලා ගෙණ ඖෂධ සඳහා යොදා ගත හැක.

දේශීය වෙද කමෙහි සථාවර -ජඞ්ගම විෂ නාසක ඖෂධ වගී හා සින්දූරම් (රස බෙහෙත්) වගී පිළියෙළ කිරීමේදී වච්චනාවි ද බොහෝ වට්ටෝරු වල ඇතුළත් කර තිබේ.

නහර ගත ආඛාධ, සර්ප විෂ, කැස්ස හා නවත් බොහෝ ආඛාධ වලට වච්චනාවි මිශ්‍ර ඖෂධ යොග යොදති.

වචවාවි-වසාවාසි
වචා-වදකසා
වචාදි ගණය- වදකහ, කලාඳුරු, අරළු, දේවදූර, වියලි ඉඟුරු, අතිවුඩයම් (ඉවද) ය ත මේ වචාදි ගණය, දෙස් පැසවීම, ආම අතීසාර සිංසිදුවීම හා තත කිරි දෙස් ශුඩ කිරිම ද කෙරේ.
වව්‍ය-දඞ්ගන්තරු
වජ්‍රු-වල් කිඩාරම්
වජ්‍රූ පියෘ-මුවකිරිය වැල්
වජ-වජදූරු
වජපිරිබුලු-හෙළ වදකහ
වජරල-කිඩාරම්
වජී-වංඇළල
වජිර-ජීවක, ඉඳුරු = (දියමන්ති)
වජිරෝ-දියමන්ති
වජ්‍ර-කිඩාරම්, දළුක්, ඉරිවේරිය, නෙල්ලි, තල මල්, ත්‍රිවේර, ඉකිරිය, විදුරු
වජ්‍රකණ්ටක-දළුක් ගස
වජ්‍රඛඞ්ඛ-කිඩාරම් අල
වජ්‍රතුණ්ඩ-දළුක් ගස
වජ්‍රද්‍රු-සීනුක්
වජ්‍රධූම-දුම්මල
වජ්‍රපුට- බෙහෙත් පිසින (උයන) පාත්‍රා ප්‍රභේදයක්
වජ්‍රපුෂ්ප-තල මල, වාගස
වජ්‍රපුෂ්පා-සතපුෂ්ප
වජ්‍රභාණ්ඩී-දුම්කොළ
වජ්‍රමණි-දියමන්ති (වජ්‍ර)
වජ්‍රමන්ථාහ්ව-ඉරිවේරිය
වජ්‍රමාණික්‍ය-දියමන්ති මැණික
වජ්‍රමූලි-මස්වැන්න
වජ්‍රවල්ලරී-හීරුස්ස
වජ්‍රවල්ලී-හීරුස්ස
වජ්‍රවිජක-වැල් කරද
වජ්‍රවෘක්ෂ- උගුරුස්ස, පියා ගස, දළුක්
වජ්‍රවෘජී-දළුක්
වජ්‍රා-රසකිඳ, දළුක්, ඉකිරිය, විදුර
වජ්‍රාඛ්‍යා-ගස්කැලිය, පතොක්
වජ්‍රාඞ්ගී-හීරුස්ස
වජ්‍රාසථිශෘඞ්ඛලා-ඉකිරිය
වඤ්ජල- කෝන් ගස, හෝපළු, ගොඩමානෙල්, ඇඹුල්වේ
වඤ්ජලද්‍රුම-හෝපළු ගස
වඤ්ජුලප්‍රිය-වේවැල
වඤ්ජුලා-හෝපලු, හොමුවහු
වට්ටක්කා-රට (දේස) පුහුල්
වට්ටකිලිකිලිප්පෙසි - යක්බේරිය
වට්ටතක්කී-අනෝදා, මහ බැවිල
වට්ටයික්කිරිප්පු-දියමිත්ත
වට්ටා-අනවජ ගස, මහ බැවිල
වට්ටාහත්‍රී-අනවජ (අනෝදා) ගස

වට්ටාමරෙසි- වට රුහැණ (වල් ගම්මිරිස්)
වට්ටි වේරු-ඉරිවේරිය
වට්ටිය්‍යා-මඟුල්කුඹුරුවැන්න
වට-නුග ගස, කබ
වටංසක-වදමල
වටක-කලං එකහමාර ගුලිය
වටන්-මූත්‍ර
වටන්දිය-මූත්‍රජලය
වටපත්‍ර-ඵලවරා, පොල්පලා, අඳු තලා
වටරුහැණ-වාල්මොලඟු
වටවන්වේලා-වේලා වගීයක්
වටවෘක්ෂ-නුග ගස
වටසිංහ-නුග ගස
වටැස්ස-පැන්මූසු පොළවේ හට ගන්නා පෙති සේ කොළ හා පිණි සමාන මුදුනේ මල් ඇති පැලෑටියක්
වට්ට-තොටිල
වට්ටක-ඉරිවේරිය
වටෝර-කලවය
වඩිරන්-වදකහ
වඩ්‍ර-බටුහස
වණ්‍ය-සඹරල, රත්ඹිලු
වත්ති-වස්තිය
වත්තුල-මහකුරු
වත්තුල්‍යකෝ-මහකුරු
වත්සක-කෙලින්ද ගස, මල් කසිස්
වත්සකා-කෙළිඳ
වත්සකබීජ-කෙලින්ද ඇට
වත්සනා-වච්චනාවි
වත්සනාභ-වච්චනාවි
වත්සාක්ෂි-මහගොන්සුතු කැකිරි
වත්සාදන-කිරිපළු
වත්සාදනී-කිරිපළු, රසකිඳ, සින් දුම්ඩ
වනිතා-කැඳ
වනී-කහ
වතුරු-වස්ත්‍ර
වද-වදකහ, වදමල් ගස
වදකර-වදකහ අල
වදකභ-මඩගල්‍යා
වදනොත්තමා-කකීටකශ්‍රිංගි
වදයඝාන-ලබුනැටි
වදර-කපු, බින්තල්
වදසන්-සත්‍රින්ගේ යෝනි මාංශය
වදසෝ-වසාවාසි
වදගැණිගෙ කැවුතු- වදකහ අල
වදු-වදකහ

වඳුරුමෑ—
වාජීකරණ ඖෂධයක්



වඳුරු මෑ—කපිකච්ඡු
(ප්‍රාඩ්වයඝාණ්)
Mucuna Pruriens

වඳුරුමා

මෙය ලඹකාවේ හා ඉන් දියාවේ වැවෙන බෙහෙත් වැලකි. මෙහි කොළ - වැල හා කරල් බොහෝ දුරට දම්න කොළ- වැල හා කරල් වලට ත් සමාණ සි. පොකුරු වශයෙන් සැදෙන මේ වගීයේ කරල් ලපටි අවධියෙහි නිල් පැහැයෙනු ත්, වියලුන විට කළු පැහැයෙනු ත් සුලු ත සි. පැසුන කරල් මතුපිට ඉිල්ලුද වැනි පැහැයකින් දිළිසෙ සි. ඇට කළු පාට සි, මේ ඇටවල සුදුපාටින් යුත් මදය මත් වන සුළු ගනිය කින් යුත් වාජීකරණ ඖෂධයකි.

බුද්ධදාස රජ තුමා ලියූ සාරාර්ථ සංග්‍රහයෙහි තුදුස් වගීය කින් යුත් සන්ත ධාතු වර්ධන යෙහි ලා ඉතාම ප්‍රත්‍යක්ෂ වාජී කරණ රසායනයක් නිබේ. වඳුරු මැ ඇට ද එසින් එකකි.

වඳුරා-මසුරිකා බිබිලි, දියමන්ති, සිරිස්ස වැල
වඳුරුවැල්-සිරිස්ස
වඳුරුමේ-වඳුරු ආමාසය
වඳුරු වසුරා-වඳුරු බෙටි
වඩු-කඩල
වන්ඇපල-ආඩතෝඩා= (වෙදමව)
වන්ඉලප්ප-වරා ගස
වන්තක-ඇත්තෝර ගස, පිළිල
වන්තකෘ-ඇත්තෝර
වන්නිකා-රසකිද
වන්ටය-නැවි
වන්ටා-බැවිල
වන්ද-මහකරඹ
වන්දචිඟ-අමුකපුරා

වනපුෂ්පා

වන්දනීය-ගෝරෝචන, රත්වන් කිකිරිඳිය
වන්දවිඟ-අමුකපුරා
වන්දා-පිළිල, මහපෝටාවැල
වන්දකා-පිළිල
වන්දුම්-මීපැණි
වන්ද්‍ය-ගෝරෝචන
වන්ධ්‍යා-මැණික්වැන්න, බැමිතිරිය
වන්ධ්‍යාකර්කෝට වන්ධ්‍යාකපෝට } වැල්තුඹ
වන්ධ්‍රකපුෂ්ප-පියාගස
වන්නක-විලේපන
වන්‍ය-වල්කිඩාරම්, කිත්තල්, සබරල, කලාදුරා, රත් මහනෙල්, වතුර
වන-වතුර, ආරණ්‍යය
වනක-නිකගස
වනකදලී-වල්කෙසෙල්
වනකන්දු-වල්කිඩාරම්
වනකර්ණිකා-කෙසෙල්
වනකර්පාසි-වල්කපු
වනකර-බදුල්ල, රත්නිවුල්
වනකාකෝලි-කටුවැල්බටු
වනකෝමාරිකා-කළුනික
වනවන්දන-අහිල්, සඳුන්
වනවන්ද්‍රිකා-සීනිදිද
වනජ- අමුක්කරා, වල්කිඩාරම්, සීන්මිදි, වල්කපු
වනජා-බුලු, මුංවැන්න
වනජාත-තල
වනනික්ත-අරළු, දියමිත්ත
වනනිකතිකා-දියමිත්ත
වනදන-සඳුන්
වනදභී-දුරාලභා
වනදූහන-වනුවැල්
වනදීප-වල්සපු
වනසල්ලව-මුරුංගා
වනපුෂ්පා-සතපුෂ්ප

වනපූරක **වනරාජ**

වනපූරක-වල් දෙළුම්
වනප්‍රසථ-කැල
වනප්‍රිය-කුරුඳු පොතු
වනමල්ලි-සිහිඳ්ද
වනමල්ලිකා-යොන්තුඹ,ගිරිහිල්ල
වනමලී-වලිඳ්ද
වනමාලිකා- යොන්තුඹ, ඌරල, මරිතොන්ඩි

වනමාලී- වැටකේ, යොන්තුඹ, බෝලිඳ්ද
වනමුද්ග-මුංවැන්න
වනමූර්ධජා-කකීටකශ්‍රිඹහි
වනමෙථිකා-වල්උළුවා
වනමොචා-ඇටකෙසෙල්
වනය-සංකකුප්පි (සඹකපුෂ්පි)

වනරාජ—රාජ පහට අයත් එක් ඖෂධ ශිශියක්

ලඹකා වනරාජ **ඉන්දියා වනරාජ**

Anoecto Chilus

මේ වර්ගයේ කොළ දිග—පළල අඟල් 4 × 1½ ක් පමණ ඇත. කොළ වල උඩ පැත්ත ලා රත් පැහැයෙන් යුත් විල්ලූ ද රෙදි කඩක් මෙන් දිළිසෙ යි. ඒ මතුයෙහි වැටී තිබෙන රත්වන් රේඛා වලින් කොළ ශොභාමත් ව තිබේ. පැලෑටියේ කඳ වදකන පැලයක කඳ හෝ හාල්දණ්ඩකුගේ කර මෙන් වයිරන් සහිත යි.

ලඹකා වනරාජ කොළ හැඩහුරුකමින් ඉරරාජ කොළ වලට සමාන වත අතර ඉන්දියා වනරාජ එයට වඩා උල් දිගටි හැඩයෙන් යුක්ත වෙයි.

වනරාජ දේශීය වෙදකමේ ඇතැම් ගුප්ත තෙල්--බෙහෙත් සඳහා නියම කර තිබේ.

වනලක්ෂ්මී

වනලක්ෂ්මී-කෙසෙල්
වනවීර-කළුතලා
වනවාසින්-තෙලඹු, දේවදාලි, බින්තල්, සෘෂභක
වනවිලාසිනී-අඩනහිරිය
වනවීජ-වල්දෙළුම්=වනවීජපූර
වනවීජපූර-ලප්නාරත් වගීයක්
වනවෘන්තාකී-බටු, වල්බටු
වනව්‍රීහි-බොඩහමු
වනවෙස්මක-කළුනික
වනශුකරී-වදුරු මෑ
වනශෘඛාට- ගොකටු, ඉකිරිය, වල්කොහිල
වනශොධන-කරබෙඩිය
වනශොභන-නෙළුම්
වනස්තකී-මහනුග
වනස්පතී-නුග (ඇසතු වගී)
වනසඛකට-මසුර, වනකපු
වනසරොජිනී-වල්කපු
වනසූ-යකවනස්ස,මාරාගස, මදට ගස
වනහරිද්‍රා-වල්කහා
වනහාස-තුසතණ
වනකාක-මූං
වනාම්ල-කරඹ
වනාම්‍ර-කොහු අඹ
වනාරිෂ්ට-වල්කහ (හරන්කහඅල)
වනාලිකා- ඇත්සැටිය (ඇස්සොඬ)
වනිතා-පුවහු, මෝරු
වනිතාප්‍රිය-පුස්කර, අඹගනාප්‍රිය
වනෙක්ෂුද්‍රා-කරද
වනෙසර්ජ-පියාගස
වනෝද්භවා-වල්කපු
වනුප්-සෙන්දිරික්කා ගස, (කුසුම්භ) වත්නිශිඛ
වනුරු-කිරිපලු ගස
වනුරුපිය-කිරිපළු ගස
වනුලරුක්-පියාගස

ව

වනුවැල්- වෙනිවැල්=(බාන්වැල්, කහවැල්) යන මේ නම් වලින් හැඳින්වෙන වැල් වගීය අපේ රටේ දැරැහරිද්‍රා වෙනුවට ගණී කී. මෙය පිටගැස්මට හා ග්‍රන්ථි රෝගයට ප්‍රත්‍යක්ෂ ඖෂධයකි. (242 පිටේ දැරැහරිද්‍රා ගැණ ලියූ විස්තරය බලන්න.)
වපු-ශරීරය, දඬකලත්
වපුල-හෝපලු
වප්‍ර-ඊයම්, වැල්මදට
වප්‍රතී-තැල්වැල
වම්මුතු-කලාදුරු
වමථු-වමනය කිරීම
වමනතක-තොවිල
වමන- දියපූඩාවා, කුකුරුමාන්, කුරුඳු, මහකපු
වමනඵල-කුකුරුමාන්
වමනීමූල-නුවරලා, බින්නුග
වයඃස්ථා-මුකුණුවැන්න, අරළු, රස කිඳ, නෙල්ලි, කිරිකවෙළ
වයස්ත-මුගුණවැන්න
වයස්‍යතා-නෙල්ලි, රසකිඳ
වයස්‍යා-මගුල්කරද
වයසෙක්ෂූ-වැළඟ්
වගී-කරාබුනැටි, වසාවාසි, සාදික්කා
වර්වර-ගඹක, සාදිලිංගම්, වේලා, රත්හදුන්, තලා
වර්වල-සූරියකාන්ත ගස
වර්වස්-ශුක්ල, මල
වර්වස්ක-මල
වර්ජක-අඳුතලා
වණී-කොකුම්, වතුර, කහ, මහ හිඟුරුපියලි, හිරියල්
වණීක-හිරියල්, සඳුන්, ආදී ද්‍රව්‍ය, සාදිලිංගම්

වර්ණතුල්ල්‍ය-කොළුවැල
වර්ණද-කළු අහිල්
වර්ණදාත්‍රි-කහ
වර්ණපත්‍ර-ඇඹුල්වේ
වර්ණපිණ්ඩිතක-කටුකරඹු
වර්ණප්‍රසාදන-වැල්මදට
වර්ණලෝහ-පිත්තල
වර්ණවති-කහ
වර්ණස්-මොරගස
වර්ණස්‍ය-රත්වන් කටුකරඹු
වර්ණා-තලා
වර්ණාර්හ-මුං
වර්ණාත්‍රි-කහ
වර්තුල- ගජකිප්පිලි, වතුසුද්ද, ලූනු, මුරුංගා
වර්ධක-මදටිය
වර්ධමාන-එරඹු, එළ එරඹු
වර්ධමානක-එරඹු
වර්මකණ්ටක-තලා
වර්මකෂා-දැසමන්
වර්වර- රත්වන් සඳුන්, ගෙන්දගම්, රම්මානිස්ස, කළු තලා, අඳුතලා, සාදිලිංගම්
වර්වරා-වේලාගස
වර්ෂක-බැමිතිරිය (ලුණුවිල)
වර්ෂකේතු-මහසාරණ,රතුසාරණ
වර්ෂපාකින්-ඇම්බරැල්ල
වර්ෂපුෂ්ප-කුඹුරුවැල්, මහ බැවිල
වර්ෂපුෂ්පා- මඟුල්කුඹුරුවැන්න, මිහබැවිල
වර්ෂපුෂ්පී-අස්බැවිල, වැල්කුඹුරු වැන්න
වර්ෂා-කළුදුරු
වර්ෂාඛ්‍හි-සාරණ
වර්ෂාඃතු-නිකිනි, බිතර දෙමස
වර්ෂාභූ-සුළුසාරණ, මහසාරණ
වර්ෂායුසය්‍ය-දියමිත්ත

වර්ෂාල-කඩල
වර්ෂොළල-දෙළුම්
වර්ෂ-විෂ්ණුක්‍රාන්ති, මොණරපිල්, මලිත ගස, රත්නිටුල්
වර්හිකුසුම- විෂ්ණුක්‍රාන්ති
වර්හින-තුවරලා
වර්හිපුෂ්ප-විෂ්ණුක්‍රාන්ති
වර්හිශුෂ්මන්-ඉරිවේරිය
වර්හිෂට-ඉරිවේරිය
වර්හිස්-රත්නිටුල්, විෂ්ණුක්‍රාන්ති
වර-කොකුම්, ගුගුල්, ලාකඩ, කටු කරඹු, කෙළින්ද, කුරුඳු,තිපල්, අමුඉඟුරු
වරක- වරක නම් වූ මෙනේරි
පඳුරු වැනි ගොයම් වගීයක්,(වරු) වල්මුං, පැපිලිය, දෙළුම්, කසිස්
වරකාණ්‍යා-සින් මැඩහඟු
වරකාණ්‍යක-පැපිලිය
වරකා- ඉදුනවිට බෙරි නොවන ගෙඩි සැදෙන කොස් වගීය
වරකු-අමු
වරගාත්‍රී-අමුක්කරා
වරවර්ණිනි- දේවදුර, වනුක්ඇට, කලුඅහිල්
වරවිටාමරෙ-වාල්මොලඟු
වරණඩ-මුඛ රෝග ප්‍රභෙදයක්
වරණඩාලු-එරඹු ගස
වරණ-ලුණුවරණ
වරණාදිගණය- ලුණුවරණ, කටු වෙළඟ, සාකාවාරිය, බෙලි,සින් -මහ මැඩහඟු දෙවර්ගය, වැල් මුරුංගා, ඉළුක්, සිරිල, පිත-රකත කටුකරඹු දෙවගීය, එල ඛටු, කටුවැල්බටු, බොරළුදමුණු, (උගුරැස්ස) නිවිහ (කෙම්=කෝවක්කා), සිහින්මිදි, සිවිය, රත් නිටුල්, කරඳ යන මේ වරණාදි

ගණය අන්තර්ගත වූ හා සෙම් මේදස්, ගුල්ම රෝග පහ කරන්නේ ය.
වරණව-කොසඹ
වරණිකත- පැපිලිය, දුම්මැල්ල, කෙළින්ද
වරතිකතක-අලරිය
වරද- කෝමාරිකා, අමුක්කරා, කෝවක්කා, ඊතණ
වරදූ-අමුක්කරා, කෝවක්කා, නිකා
වරදූම-අගිල්
වරපිතක-මිණිරන්
වරප්‍රිය-කුරුඳු
වරප්‍රියඛග-ශ්‍රීබේර
වරඵල-එලජම්බු, පොල්ගස, දෙඛි ගස
වරඹරා-චක්‍රපර්ණී (සක්වැන්න)
වරමූඛි-රේණුක නම් සුවඳ
වරලබ්ධ-සපුගස
වරලිපත්‍ර-ඇඹුල්වේ
වරවාග්ලිකා-කොකුම්
වරා-අරළු, බුළු, නෙල්ලි, රේණුක නම් සුවඳ ද්‍රව්‍යය, රසකිද, මේවන්, වළඟසාල්, දියමිත්ත, කඟ, බෝදි ඇට, සුදු පාසානම්, යක් බේරිය
වරාගස-කුරුඳු
වරාඛග-කඟ, වෙනිවැල්
වරාඛගක-කුරුඳු
වරාඛගින්-ඇඹුල්වේ
වරාජ-රත්නිටුල්
වරාට-කවඩි
වරාටක-නෙළුම් බට්ටා, (නෙළුම් කෙඹිය)
වරාටකරජස්-නාමල්රේණු
වරාටිකා-කවඩි
වරාදන-කිරපළු
වරාඛ්‍යාක-කුරුඳු
වරාපක්කඩ-වරා කොළ
වරාභීෂක්-අහුගස
වරාම්‍ර-කරඹ
වරාර්ධක-වීදුරු
වරාරොහ-රත් නෙළුම්
වරාල-කරාබුනැටි
වරාලක-කුරුඳුපොතු, කරාබු
වරාලඹ-තිත්තලබු
වරාලි-වැරැල්ල, ලේවැරැල්ල
වරා වගී හතර-රතුවරා, එළවරා, අළුවරා, පැණිවරා
වරාසන-වදමල (බඳුවද)
වරාසාල්- වරක නැමති මහදුරු ඇට පමණ වී ඇට සැදෙන මෙනේරි පඳුරු වැනි වී වගී යක් ඇත. මේ වගී යේ සහල් දුර්භික්ෂ කාලවල රජවරුන්ට පවා අග්‍ර භෝජන වන බැව් පැරණි සිංහල සාහිත්‍ය පොත්වල කියා තිබේ.
වරාහ-බින්තල්, කලාඳුරු, අමුක්කරා
වරාහකර්ණී-අමුක්කරා
වරාහකාන්තා-බින්තල්
වරාහක්‍රාන්තා-නිදිකුම්බා
වරාහිකා-වඳුරාමැ
වරාහිගන්ධා-බින්තල්
වරාහි-කලාඳුරු, ඇත්දෙමට
වරාහිප්‍රිය-භූරල, ඇද්දෙමට
වරි-වදකහ, සාතාවාරිය, කෝවක්කා
වරික } රණවරා ගස
වරිකා }
වරිත-රණවරා
වරිෂට- මිරිස්, තඹ, ඉරිවේරිය, කෝවක්කා

වරිෂ්ටා-කටුරෝහිණී
වරී- සාතාවාරිය, කෝවක්කා, තල, වැලුක්
වරියස්-සුරා
වරුක්කු-කුකුරුමුවන්
වරුණ-ලුණුවරණ, සුරා
වරුණා-වදකහ
වරුණු-කිරිපලු
වරොට-කුකුරුමාන් මල
වරොත්පල-ඇඹුල
වරෙණඛ- අරළු, මකුණුවැන්න, ගොටුකොළ
වරෙණඛී- මකුණුවැන්න, ගොටු කොළ, අරළු
වල්-කෙසෙල් ගස, අඹ ගස
වල් ඉහුරු-කළුවා අල-වමී රෝග සඳහා ආලේපයට ගන්නා තද සුවඳකින් යුත් පැලෑටියක්.(92 පිටේ ඡායාරූපය සහිත විස් තරය බලන්න)
වල්කතරු- පුවක් ගස, පට්ටිකා වැල
වල්කපුකිනිස්ස-වනකර්පාස (වල් බන්ඩක්කා)
වල්කල-පොතු, හෙළ ලොත්, දිය මිදෙල්ල, සබරලොත්
වල්කලත්-වල්කොල්ලු
වල්කලොඝ්න-පට්ටිකා, ලොත්
වල්කහ-වනහරිද්‍රා
වල්කොහොඹ-ලුණුම්දෙල්ල
වල්ගු-සඳුන්
වල්ගුජ-බෝදි ඇට
වල්ගුපත්‍ර-වල්මුං
වල්නීය-කැලනිය
වල්නීයදල-කුප්පමේනිය
වල්නීති-වල් නිවිනිය වැල්
වල්මධුකර-වැල්මී
වල්මලඉත්ත-කැලැමලිත
වල්මිකවජ්ජ-ශිරාරෝගයක් (හුඹස් විදුරාව)
වල්ල-ඔලිඳ ඇට තුණක ප්‍රමාණ ඛර, ඇඹුල්වේ.
වල්ලක-කෙසෙල්
වල්ලකී-ඇල්ගස
වල්ලභා-හෙළ පලොල්
වල්ලර-කලු අහිල්, මකුළුවැන්න, ගොටුකොළ
වල්ලරී-මහුල්කරද, වල්ඵළුවා,මල් පොකුර, එළනිතුල්
වල්ලරෙ-මකුළුවැන්න
වල්ලාහ-අමුක්කරා
වල්ලා ගස්-බර අඩු සුදු පාට ලී ඇති මේ ගස් වල කොළ දත් ගලවන (ප්‍රත්‍යක්ෂ) බේතකි. (පුරාණ ලඬකාවේ)මේ කලමෙන් දත් රෝග බහුල නැත. එ කල වයස් ගත වූ ඇතැම් අයගේ විදුරුමස් දියවී දත් සෙල වෙන්ට පටන් ගණී සි. එසේ වූ විට මේ වල්ලා ගසේ කොළ අඹරා ඒ සෙලවෙන දත් තිබෙ න විදුරුමසට තබා මිනිත්තු පහළොහක් පමණ සිටිය විට දින කිපයකින් කිසියම් වේද නාවක් නැති ව ඒ දත් ගැලවී වැටෙ සි.
වල්ලි-අසමොද, කසිවර්තමුස්තා, කෙකටිය, සිවිය, හෙළ නිවුල්, මිරිස්
වල්ලික්කිලංගු-වැල්ලල අල
වල්ලිකා-කොමඩු පුසුල්, හීරුස්ස, පුසුල්
වල්ලිජ-මිරිස්
වල්ලිප්-ගම්මිරිස්
වල්ලිබ-කොමඩු, පත්තක්කා
වල්ලී-වැල්, මිරිස්වැල, ගිරිතිල්ල

වල්ලිදුර්වා

වල්ලිදුර්වා-වල්ඊතණ
වල්ලීබදරී-බිම්බෙබර
වල්ලීමධුක(ර)-වැල්මී
වල්ලීමුද්ග-වල්මුං
වල්ලී වෘක්ෂ-සල්ගස
වල්වූර-වියලි මස්, (වැලිරාණඹු=වැල්ලිරා)
වල්ලූ්‍ය-නෙල්ලි ගස
වල්වදුරා කොළ-වල්වත්රදු (වල් මත්රදු) කොළ
වලකිදු-පිටිකර, ගලවලුව
වලඟ-මිණිරන්, වළඟසාල්, ඉඟටිය
වලඟුලුවා-වළඟළුළුවා (වල්ළුවා)
වලපත්‍රී-කොසඹ
වලපුරක්-ලප්නාරන්
වලඹ-වල් අඹ
වලයන්කඛුප්පු-පුරාණ වස්ත්‍ර විශෙෂයක්
වලයල්ලුප්පු-බළල්ලුණු
වලහක-නිල්ගස්
වලා-කළු ත්‍රස්තවාලු, වම්මුතු (කලාදුරා)
වලාක-මුං
වලාන-ආරණ්‍යය
වලාවැන්න-හංසපාදී=කිතුල් පැළයේ හැඩහුරුකම ඇති මියන වගීයට අයත් පැලැටියක්. මේ වර්ගයට අයත් පැලැටි 100 ක් පමණ තිබේ එයින් ඖෂධ සඳහා ගන්නේ ලොකු කොළ නිබෙන වර්ගය පමණයි. හංස පාද වැනි හැඩහුරුකමින් යුත් කොළ ඇති මේ වර්ගය වෙනුවට ඇතැම් වෛද්‍ය පරම්පරා වල උඳුපියලි ද ගණිති. මුඛ මහණ මෙන් ම මෙය ද දිවි ඔකුළු විෂට ප්‍රත්‍යක්ෂ ඖෂධ යකි.

වවුලැවිය

වලි-ගෙන්දගම්, කසට ගස
වලිද්ද-වල්ඉද්ද ගස
වලිදුලෙඹි-ඇත්බටු (වම්බටු)
වලිප්පාලඹි-රුක්අත්තන
වලුතිතෙ-වම්බටු
වලුපස-පොල්, තල්, කෙසෙල්, පුවක්, ඉඳි
වවුල්පියෑ-වවුලන්ගේ පිහාටු

වවුලැවිය—කටු සහිත වැලක්.



වවුලැවිය—මුර්මූසි

Caesalpinia Digyna

වවුලැවිය ද කුඹුරු පවුලට අයත් කටු සහිත වැලකි. මෙහි කොළ කුඹුරු කොළ වලට වඩා කුඩා ය. නින්තඹල කොළ මෙන් ඕවාල හැඩයෙන් යුක්ත ය. දළුවරත් පාට ය. කුඹුරු වැලේ කටු වලට වඩා කටු නියුණු ය. ඇට

වවුලැවිය

ද කුඹුරු ඇට වලට වඩා කුඩා ය. කුඹුරු වැලේ කොළ මීට වඩා ලොකු ය. දිග් ය. අග උල් වී ඇත. දළුව ද රත් පාට නැත. ඇට ද ලොකු ය. කටු ද මේ පමණ ගණසැරයට නැත. මේ දෙවගීය වෙන් වශයෙන් අදුනා ගත හැක්කේ මේ ලක්‍ෂණ අනුව ය.

දේශීය වෙදකමේ වෙනසක් නැති ව මේ දෙවර්ගය ම එකම ඖෂධයක් වශයෙන් ගණිති.

පියාඹා යන වවුලෝ මේ වැල් වල ගැටෙනි එසින් ඔවුන්ගේ පියා පත් (සිව්) සිදුරුවී ඉගිලී යා නොහැකි ව මේ පදුරු වල ම රැඳෙන නිසා මෙයට වවුලැවි (වවුල් + ගැවි)ය යන නම සිංහලයෙන් ව්‍යවහාර වන බව පෙණේ.

"වවුලන් එල්වී සිටින විලාශ යක් දක්වන කොළ ඇති ඔවුන් ලැවි ගැමට (ඵලා කැමට) කැමති එක්තරා පැළ වගීයකට වවුලැවි ය යි කියති" යන අළුත් මතය පිළිගත නොහැක. වවුලැවිය කුඹුරු වගීයට ම අයත් වැලක් බැව් පෙර-අපර දෙදිග ම උද්භිද විඤ්ඤයන් පිළිගෙණ තිබෙන හෙයිනි.

වංශි-උණකපුරා
වඝිකා-කිරිඳි
වඝි-ගජනිප්පිලි, සිව්විය
වඝීක-අගිල්, සඳුන්

වඝීර-මුදුලුණු, ගජනිප්පිලි, රත් සැබෑ, සිව්විය, රත්ගොකටු,
වඝීරි-ගජනිප්පිලි
වස්-උණගස, නිල් උණ
වස්කරි-හෙළ කිඹුරු
වස්තක-පාංශුලුණු
වස්තකණී-සල් ගස
වස්තගන්ධා-වේලා
වස්තමොදූ-අසමොදගම්
වස්තිකමීඝ්‍ය-දියමිත්ත
වස්තීකා-වල්ඵළුවා
වස්තී-මූත්‍ර තිබෙන විත
වස්තුක-සුදුවැල්පලා, නිල්තම්පලා
වස්තුච්ඡිද්‍රා-මහමේවන්
වස්ත්‍ර-කොල්ලන් කොළ
වස්ත්‍ර තමාලක-කොල්ලන් කොළ
වස්ත්‍රභූෂණ-වැල්මදට
වස්ත්‍රරඤ්ජන-වනුක්
වස්ත්‍රරාගධෘත්-මිල්කසිස්
වස්මර-අපස්මාරය (මීමස්මෝර)
වස්සිකා-දැසමන්
වස්සිකී-දැසමන්
වස්‍යා-විෂ්ණුක්‍රාන්ති
වස-වව්වනාවි, රිහි
වසක-පාංශුලුණු
වසත-අරළු
වසතැල් } නික්ත තැල්, රස
වසතැල්ල } තැල්, වසතැල්, ලප් තැල්, යසි තැල් වගී හත රකි. හඟුලු යනු ද මෙය ට ම නමකි. මෙය දියමිත්ත කොළ වලට සමාන කොළ ඇති වැල් වගීයකි.
වසනත-බුළු ගස, බක් - වෙසක් දෙමස, තොටිල
වසනතක-තොටිල ගස
වසනතෘ-යොහොඹුවැල

වා

වසනනදූත-යොහොඹුවැල, අඹ, පළොල්, කිණිහිරි
වසනනදූතී-පළොල්, රත්පළොල්
වසනනද්‍රු-අඹ ගස, බුළු ගස
වසනෙනාද්භව-සින්දූරම්
වසන්දල-රැක්අත්තන
වසනා-වච්චනාවි
වසනාතමාල-කොල්ලම් කොළ
වසම්පු-වදකහ
වසෘ-වැල් කසඹිලියා වැල, වච්චනාවි
වසලලු-නයා
වස වෙද-විෂ වෛද්‍ය වරයා
වසා-මේද තෙල, මස්වැන්න, ලුණු විල
වසාදනී-ඇට්ටර
වසාලි-හෙළ පෝටා
වසිකා-සුළු පෝටා වැල
වසිර-ගජ නිප්පිලි, සිවිය
වසී-රත් ගොකටු, ඇඹුල්වේ
වසු-වකපුෂ්ප, පාංශු ලුණු, කෝවක්කා, ගෙන්දගම්, වැඩි නම් ඖෂධය, දිඹුල්
වසුක-වරා, මූනමල්, සාම්භාරි නම් ලුණු, වලාවැන්න, වකපුෂ්ප, සිරිල, යාපුර, නුග ගස
වසුවජ්‍රා-මහමේවන්, උණ ගස,
වසුතනාම-රිදී
වසුභට්ට-කෝවක්කා, මූනමල්ගස
වසුරැක්-දිඹුල් ගස
වසුසසව-ඉන්සළු ගස
වහ්නි-ගිනි, රත් නිවුල්, බදුල්ල, කොසඹ
වහනිකරී-නෙල්ලි ගස
වහනිගන්ධ-දුම්මල
වහනිගණී-උණ ගස, සැම ගස
වහනිජ්වාලා-ලියනහලා,මිලිතගස
වහනිදීපක- අසමෝදගම්, වනුක්
වහනිනාමා-එළ නිවුල්
වහනිනී-ජටාමාංශ
වහනිපුෂ්ප-මිලින මල්, ලියනහලා මල්
වහනිභොග්‍ය-ගිතෙල්
වහනිමන්ථ-මිදි ගස, කිණිහිරි ගස
වහනිමුඛි-ලියනහලා
වහනිමූල-මහ මිදි
වහනිරැවි-දූදු
වහනිලොහක-ලෝකඩ
වහනිවණී-රත් මහතෙල්
වහනිවල්ලභ-දුම්මල
වහනිවීජ-දුරා, මලින ගස
වහනිශිඛ-වනුක්, පුවහු, මලින ගස
වහනිශිඛා-ඛැලිල, ලියනහලා
වහ්නිසඛ-වාතය, දුරා
වහ්නී-පැපිලිය, ගිනි, කේශර ඛැවිල
වහලගඤ්ඣ-සම්බර සඳුන්
වහල චක්‍ෂුස්-මැඩහඳු
වහලතිව-නෙළ ලොත්
වහලා-මහ එන්සාල්, ශතපුෂ්ප
වහිස්වූඩා-හරංකසා
වෛඩූක-බුළු ගස

වාක-සුඹුළු, (පට්ටා)
වාකපුෂ්ප-කරාබුනැටි, කුරුඳු
වාකු-අමුනාල්
වාකුවිකා-බෝදි ඇට
වාකුවී-බෝදි ඇට
වාකොළ-වා ගසේ කොළ

වාකෝ-මහරි
වාගස්-මාරා වගීයට අයත් තද අරටුවකින් යුත් ගසක්
වාගුජී-බෝදි ඇට
වාවං-වරකා ගෙඩිය
වාවක-පිච්ච මල
වාජා-අමුක්කරා අල
වාජි-අමුක්කරා
වාජිකණි-රත් මුරුත
වාජිකරී-අමුක්කරා
වාජිගන්ධ-අමුක්කරා
වාජිදන්ත-වංඇපල
වාජිදන්තී-වංඇපල
වාජින්-අමුක්කරා
වාජින-උනුකරපු කිරි
වාජිපෘෂ්ට-උඳුපියලි
වාජීහඤ්ඤ-හණ
වාජීහොජන-මුං
වාජීකරණ-ධාතු වර්ධනය කරණ බෙහෙත්
වාටිකා-පත්‍රාභිංගු
වාට්‍යපුෂ්පිකා-කොටිකන් බැවිල
වාට්‍යවාට-සුළු බූ බැවිල
වාට්‍යා-සුළු බැවිල
වාට්‍යාපුෂ්පී-අස්බැවිල, මඟ බැවිල, අතෝජා
වාට්‍යාල-මල්සුදු බැවිල, අස්බැවිල,
වාට්‍යාලක-සුළු බැවිල
වාට්‍යාලි, වාට්‍යාලිකා } සුළු බූ බැවිල
වාණවව-නිල් කටුකරඹු
වාණීර-වේවැල, තුන් පුළිල, ඇඹුල්වේ
වාතනි-වේලිප්පරිත්නි, කාරං ගස
වාත අතීසාර- වාතය කිපීමෙන් උපදනා අතීසාර රෝගය
වාත උදර-වාතොදරය
වාතක-අසණපර්ණ
වාතකී-හෙළබටු
වාත කුණ්ඩලිකා - මූත්‍ර කෘච්ඡ්‍රා රෝගය
වාතකුෂ්මාණ්ඩ-පැපොල්
වාතඝ්න-ලීමෑ, මෑ
වාතඝ්නී-උඳු, වැල් බැවිල, ආපසු මඳු, අරත්ත, අස්වැන්න, අමුක්කරා
වාතඝාතකෝ-ඇසළ
වාතචඡ-වම්මුතු (කලාඳුරු)
වාතඩිං-වෘඳුී රෝගය
වාතඛ්වජ-කලාඳුරු අල
වාතපෝත-කැල ගස
වාත මැඩක්කිය-වාතහංග =(වාසි පාසි)
වාත රක්තඝ්න-පොණ්ඩරු
වාතරක්තාරි-රසකිඳ
වාතරඹග-ඇසටු ගස
වාතරායණ-හොර ගස
වාතවෛරි-රත් එරඹු
වාතඝ්පී-වැල් මුරුංගා
වාතහර-තොවිල
වාතහා-ඇත් දෙමට
වාතාද-කොස් ගස, කොට්ටම්බා ගස
වාතාමොදූ-කස්තුරි
වාතාරි-එරඹු, සාතාවාරිය, සේපාලිකා, අසමෝදගම්, සිරිතේක්කු, දළුක්, ආපසු මඳු, කිඩාරම්, වලඟඝාල්, කොටදිඹුලා, බදුල්ල
වානිකන්-වැල් නිබ්බටු
වානිග-වම්බටු
වාකිඩගත-හෙළ බටු, බටු
වානිනී-සූරියකාන්ති
වාතීය-කාඩි
වාතෝනා-ගැට නිවුල්
වාදන-ගෙන්දගම්

වාදම් වාරිකර්ණී

වාදම්-වාතරක්ත රෝගය
වාදරඹ-ඇසතු බෝ ගස
වාදුල-වැල්මී
වාදළු-වා ගස් වල දළු
වාදී-සුළු බැවිල
වාදුඛ්කී-කැකිරි
වාන්තාක-කරාබු නැටි
වාන්තෘක-කරාබු නැටි
වාන්‍ද්‍රක-වල් ඉතුරු, පිළිල
වාන-වියලි ගෙඩි
වාන ප්‍රසථ-මීගස, කැල ගස
වානමෙපිකා-වල් එළහාල්
වානර ප්‍රසථ-මීගස
වානරප්‍රිය-කිරිපළු ගස
වානරාඝාත-ලොත් ගස
වානරී-වඳුරු මෑ
වානීර- වේවැල්
වානෙය-කලාඳුරු
වානෙය්‍යං-දසපුර
වාප්‍ය-කොට්ටම්
වාමක---රිදී තුත්තම්
වාමඝති-කටුකරෝෂණ
වාමන-අඟුන, කොට්ටම්, සුදුහඳුන්
වාමසෝච-කයිල වැල
වාමසෝධ-කයිල වැල
වාමහිරි-කටුකරෝෂණ
වාමාකෘ-රිදී තුත්තම්
වාමාඞ්ඝ්‍රියාන-අසෝකා
වාමාඞ්ඝ්‍රිඝාත-අසෝකා
වායස-අගිල්, හොර අරටු, කළු කැම්මේරිය
වායසක-ඟඟුළු
වායස ජඞ්ඝා-ගුරැල්ල
වායසා-ඟඟුළු
වායසාදනී-අගිල්
වායසාරාති-මඟ දූදු
වායසී-කොටදිඹුලා, කිරිකවෙලු, කළුකැම්මේරිය, තැල් වැල්
වායසෙක්ෂු-කුසතණ
වායසොලි-කවෙලු, කළු කැම්මේරිය
වායින-මිරිස්
වායි විලන්ගන්-වලහසාල්
වායුදෙව ප්‍රියඞ්කරී-සාතාවාරිය
වායු මුලන්ගු-වාල්මුකු (වාල් මෙලහු)
වායුවාහිනී-ශරීරයේ නහර
වාර්-වතුර
වාණීකු-ඇත්බටු (වම්බටු)
වාතීකත්-වැල් නිබ්බටු ගෙඩි
වාතීක
වාතීකී } එළබටු
වාතීකී ඵල-කටුවැල්බටු, වම්බටු, කෝවක්කා
වාද්ද-ඔනිඳ (ඔනිඳ ඇට),අඹ
වාර්දර-ඔලිඳ, ලාකඩ, අඹ
වාර්ධිභව-මුදු ලූණු
වාර්ෂික-යොන්තුඹ, බැමිතිරිය, (ලූණුවිල) ගැටපිච්ච
වාර්හත-බටු ගෙඩිය
වාර-සුවඳ හොට
වාරගා-සුළු බූ බැවිල
වාරණකර්ණිකා-සබරල
වාරණබීජා-කෙසෙල්
වාරණ වල්ලහා-කෙහෙල්
වාරණා-කෙහෙල්
වාරාහ-මහ කුකුරුමාන්
වාරාහකර්ණී-අමුක්කරා
වාරාහ පත්‍රී-අමුක්කරා
වාරාහාඞ්ගී-දූන්න
වාරාණී- යොන්තුඹ, බින් ත ල්, ඌරල
වාරි-වතුර, ඉරිවේරිය, තකුල්, සාතාවාරිය, සක්තැබ
වාරිකණ්ටක-දිය ඉකිරි
වාරිකර්ණී-පළොල්

වාරිකාකි-ඇත්බටු, වම්බටු, බටු
වාරිකුසුම්-කිරිබදු
වාරිවත්තර-රත් පළොල්
වාරිවාමර-පෙඳ
වාරිජ-සක් බෙල්ලා, නෙළුම් මල, කුරුඳු, ලුණු ප්‍රභෙද, කරාබු, දිය රත්රන්
වාරිජලදෙ-සක්නැඹ
වාරිතස්කර-කලාදුරු
වාරිද-කලාදුරා, ගිබේර
වාරිධර-කලාදුරු
වාරිනාම-කිරිඳි
වාරිනාමක-ගිවේර
වාරිපර්ණි-පළොල්, දිය පරඬලා
වාරි පසන-ඉඟිනි ඇට
වාරිපාලිකා-පළොල්
වාරිපාෂාණ-පොල්පලා
වාරිපුෂ්ප-කරාබු නැට්
වාරිප්‍රසාදන-පළොල්
වාරිප්‍රසාදන ඵල-ඉඟිනි ඇට
වාරිපෘෂ්ණි-පළොල්, කුමහිකා
වාරිඵල-කලාදුරු
වාරි බදරා - ප්‍රාචීනාම්ලක (උගුරැස්ස)
වාරිබාලක-ඉරිවේරිය
වාරිභව-හොයඳුන්, සක්
වාරිමසි-කලාදුරු අල
වාරිමුල්-සාතාවාරිය
වාරිමූලි-පළොල්
වාරිරුහ-නෙලුම්
වාරිවදන-උගුරැස්ස
වාරිවර-මහ කරඹ
වාරිවල්ලභා-ඩෙබර (මසන්)
වාරිවාහ-කලාදුරු
වාරිසම්භව-ශ්‍රොතොඤ්ජන= (හොයඳුන්)
වාරිසම්භූත-මුහුදු ලුණු

වාරිසාලිකා- දිය පරඬලා හෝ පාසි
වාරුණ-වතුර
වාරුණා-මනෝසිල
වාරුණී- මහ ගොන්සුතුකැකිරි, සුරා, ඊතණ
වාරුණිගහී-නෙල්ලි
වාරුනි-පූපාදියෙන් කළ සුරා
වාල්මොලගු-වල්ගාම්රිස්
වාල-ඉරිවේරිය, වතුර,මීනුග, ඒල වාලුක (අළු ඇට)
වාලක-ඉරිවේරිය
වාලහෙෂජ්‍ය- බාන්වැල්, (වෙනි වැල්) කෂායෙහි ලූ තුතු
වාලයජ-වෛරෝඩි මැණික්
වාලවායජ-වෛරෝඩි
වාලික-ඇඹුලැඹිලිය
වාලිකා-මුගුණවැන්න, වැලි
වාලෙසිමරම්-කෙසෙල් ගස
වාලුක-කපුරා, වැලි, සාතාවාරිය, ඒලවාළුක
වාලුකා යන්ත්‍රය-භාජනයක වැලි පුරවා මැද ඖෂධ දැමූ වෙනත් භාජනයක් තබා පුටදීමට සාදා ගන්නා උපකරණ ය
වාලු(ඞ්)කී-කැකිරි
වාලුලුවාසි-දුඩු
වාශ-රෙදි
වාශක-කළුතලා, වංඇපල
වාශා-වංඇපල
වාෂ්ප- කුරතම්පලා, පත්‍රාභිංගු, කඳුළු
වාස්තුක-විලපලා, නිල් තම්පලා
වාස්පිකා-කළුදුරු, පත්‍රාභිංගු
වාස්පෙය-නාමල්රේණු
වාසක-වංඇපල

වැ

වාසදේව ප්‍රියඞ්කරී-සාතාවාරිය
වාසන්ත-මුං, කළුමුං, කුකුරුමාන්
වාසන්ති-යොගොඹු
වාසනාභිඥ-බුළුගස
වාසවිලතා-පිච්ච
වාසා-වංඅපල, හාල්කසඹිලියා
වාසි-වංඅපල
වාසිනා-වංඅපල
වාසිනී-වියලි කටුකරඹු
වාසිමිරිස්-වසාවාසි
වාසුක-කොවක්කා
වාසුදෙවප්‍රියඞ්කර- භාතාවාරිය වැල
වාසොච-වසාවාසි
වාසොවා-වසාවාසි
වාහ්ලි-බාහල දේශයෙහි කොකුම්, පෙරුම්කායම්
වාහ්ලික- පිණ්ඩාභිංගු, කොකුම් මල්, තුරුක්තෙල්
වාහ්වික-පිණ්ඩාභිංගු
වාහන-බදුල්ල
වාහස-ලාස් දහස(16)ය
වාහස-කිඹුල්වැන්න, මල්තුඹ
වාහිරන්- ඉහුරු, ගම්මිරිස්, තිප්පිලි, (තිකුළු)
වාහුවාර-ලෝලුගස

වැක්කි-නාරං
වැග්ගි-කටුවැල්බටු
වැග්‍ර-අරක්කු
වැටකෝරළු- වැටකේ අරළු(වැටකේ ගස්වල පාතට ඇදෙන ඇටුවන් (මුල්)
වැටහිර-ආඞ්තෝඩා
වැටහිරියා-වංඅපල (ආඞ්තෝඩා)
වැටෙන-තණරද
වැත්ත- අස්වැන්න=සල්වැන්න (ශාලපර්ණි) මස්වැන්න (මාෂපර්ණි) මුංවැන්න (මුද්ගපර්ණි) පුස්වැන්න (පෘෂ්ණිපර්ණි) වලා වැන්න= වැලිවැන්න (හංසපාදි) මකුළුවැන්න (මණ්ඩූකපර්ණි) කිඹුල්වැන්න (සවඤ්ඡිකා විලඳ) වැන්න (සඞ්ඛ පුෂ්පි) සක් වැන්න (චක්‍රපර්ණි)
වැරනියා--නික කොළ වලට මදක් සමාන තික්ත රසයෙන් යුත් කොළ ඇති පඳුරු වර්ගයකි. මී වස්සන්ගේ පණු ගාය මේ කොළ වලට ලුණු වතුර ඉස දීමෙන් සුව වේ.
වැරල්-කරාබු
වැරුල්ල-වැරුල්ලාස(කුෂ්ඨරෝගයට ගන්නා බෙහෙතක්)
වැල්අඟුන-අඟුන වැල්(කිරිඅඟුන= තික්ත අඟුණ යයි අඟුණ වැල් දෙවර්ගයකි. මෙයින් කිරි අඟුණ කිරි පණු ගායට ත්, තික්ත අඟුණ ශ්ලීපද= (බරපා=බරවා) රෝගයට ත් ප්‍රත්‍යක්ෂ යි.
වැල්අල-අල වැල් (අල බඳින වැල් වර්ග)
වැල් ඇඟිනිය-වැල් අඟුණ, මූලී
වැල්ගුරිල-ගුරාල්ලවැල් (ගෝසාල වැල්=ගෝයාලියා ලතා=ගොඩා පලී=වැල් බුරාල්ල)
වැල්නික-නිකවැල්
වැල්නීති-නිච්චිනිවැල්
වැල්පස් මුල් ගණය-කිරිබදු, හිර මුසු, මැඩහඳු, රසකිඳ, වැල්කසඹිලියා හෝ පුවටා යන මේ වැල් පස් මූල මූත්‍රකෘච්ඡ්‍රා හා වාත රෝග නසන්නේ ය.

වැල් කැප්පෙට්ටියා
වැල් කැප්පෙට්ටියා



වැල්කැප්පෙට්ටියා

ගස් කැප්පෙට්ටියා,වැල් කැප්පෙට්ටියා ය යි විශී දෙකකි. මේයින් ගස් කැප්පෙට්ටියා මුල් සහ පොතු තුවාල තෙල් සහ ගව බෙහෙත් සැදීමට ත්, කොළ වම්බටු, අමු මිරිස් සහ බුලත් පාත්නි පොහොර කිරීමට ත්, ගණිති. මේ ගසේ කිරි කැපුන් තුවාල වලට ලේ පිට ම දැමීමෙන් ඒවා නොපැසවා සම්පූර්ණයෙන් ම වියලී යයි. (සුව වෙයි)

වැල් කැප්පෙට්ටියා, ගස් කැප්පෙට්ටියා කොළ වලට වඩා මිදක් දිගටි හැඩයෙන් යුත් රුණ මැඳියා කොළ වැනි, ඒ පමණ

වැල්පෙනෙල

ලොකු නො වූ කොළ ඇති වැල් මෙන් දිගට යන පඳුරු වශීයකි. මේ ගසේ පඤ්චාඞ්ගය ම සර්ප විෂට හා කැපුන් තුවාල වලට ත් ප්‍රත්‍යක්ෂ යි.

ඇතැම් අය මේ පැළෑටිය Croton Officinalis (පොඩි අරිසි) නමින් හඳුන්වති. (320 පිට බලන්න.)

වැල්පෙනෙල—අඩයද
(පෙනෙල වැල්)



වැල්පෙනෙල — කාලමේඝිකා
Cardiospermum Halicacabum

අඩි චන්ද්‍රා යන අපර නාමය කින් ද හැඳින්වෙන පෙනෙල වැලේ කොළ-රෑන් සහ ඇට කොපු ත් ඉතා ශොභාමත් ය තුඹ කරිවිල වැලකට මිදක් සමාන වූ මේ වැලේ කෝෂ තුළ ගෝන

වැල්පෙනෙල **වෑහ**

මූනිස්සන් හෝ බුත්සරණ ඇට පමණ විශාල කාල වර්ණයෙන් යුත් ඇට තුන බැගින් ඇත.

මේ වගීය දේශීය වෙදකමේ ඉතා උසස් ඖෂධයකි. අණ්ඩ වාත-අන්ත්‍රවෘද්ධි ඇතුළු වාතා බාධ සඳහා මේ වගීයේ පංචාඞ්ග ය ම අරිෂ්ට-කෂාය-මැල්ලුම්-සහ කැඳ පිණිස ත් අවශ්‍ය වේ. පෙනෙල දළු රතු ලූනු-උම්බලකඩ සමග එක පමණට ගෙණ එලගි තෙලින් මලවා කෑමෙන් සෞම්‍ය ධාතු වර්ධනය වෙයි.

පෙනෙල වැල් සපී විෂට හා ආමශූල-උදරශූල ආදි වෙනත් ආබාධ සඳහා ද ගණිති.

හින්දු ජාතිකයෝ මේ වගීය මළ පවිත්‍ර කරණ ද්‍රව්‍යයක් වශ යෙන් පාවිච්චි කරති. කහ-සුදු දෙ පාටින් යුත් පෙනෙල වැල් වගී දෙකක් තිබේ. මේ දෙවර්ගය ම වෙනසක් නැතිව ඖෂධ සඳහා යොදති. ගස් පෙනෙල වෙන වගීයකි. ඒ ගැණ මේ පොතේ 163 පිටේ ඡායාරූප සහිත විස්තරයක් ඇත.

වැල්මදට- සෙළකන්, දඬුඉදින් නරා, සෙව්වෙල්ලි

වැල්මල්-බුලත් වැල්වල හෝ රට වැල්වල කරල්

වැල්මී-පැණිවැල (මධුයෂ්ටිකා)

වැල්ලරිමාළු-වැලිරාණ්ඩු, (වේලුන දඬමස්)

වැල්වරකා-මියලි කලාපයේ වැවෙන මදනකාමපූ වලට සමාන කුඩා ඇඹුල් කෙසෙල් ගෙඩි පමණ ගෙඩි පොකුරු සැදෙන අශීස්රෝග නාශක වැල්වගීයක්

වැල්සමන්-පිච්ච වැල

වැල-විලිකුම් ඵල, ඉදුනවිට බෙරි වන ගෙඩි සැදෙන කොස් ගස් වගීය.(වැලගස)

වැලගෙඩිය-ඉදුන විට මිදුළු තද නැති කොස් ගෙඩිය.

වැලිකසා-වැලිකහ

වැලිගර ලුණු-වැලිකර ලුණු

වැලිවැන්න- වලාවැන්න, (හංස පාදී) (පිලා, බරවා රෝග වලට ගන්නා බෙහෙතක්)

වැලිහකුරු-උකුකළ පැණි කොළ පත (පුවක් කොළය) කට වත් කර සාදා ගන්නා පැණි පට්ටය

මාස කීපයක් දුම යට එල්ලා තැබීමෙන් පසු සුකිරි (ගල් කණ්ඩු) මෙන් මිදෙන වැලි හකුරු සැදෙයි.

වැලුක්-උක් (ඉක්ෂු) විශෙෂයක්

වැලුක්මල්-වැලුක් ගසෙහි මල්

වැලගු-වැලුක්

වැකොද-වල්පිච්ච(පිච්ච මල් වලට සමාන සුදු පාහැයෙන් යුක්ත ස ව ස ට පි පෙ න සු ග ඬ වත් මල් ඇති ගැටපිච්ච වලට සමාන වැල් වගීයකි. මේ වැල් ලපල්වල හා දිරූ තල්, කොස් ආදී ගස්වල ද පාළු වී වැඩෙ යි.)

වෑහ-අරක්කු

වි

විංගම්-නිප්පිලි
වික්‍රාන්තා-වලාවැන්න
වික්තීන-වරා
වික්ෂීර-වරා ගස
විකඩකට-ගොකටු
විකඩකත-උගුරාස්ස, මහබැවිල
විකඩකතා-ඇස් බැවිල, මහබැවිල, කටුකිරිය
විකට-සුදු හඳුන්, කටුකරඹු වෙසෙසක්
විකණ්ටක-හීන්ඩෙබර, යවාස
විකන්-කිහිරි
විකතීන-වරා ගස
විකරණේ-වරා
විකලම්බක-ගොකටු
විකශ්වර-රතු සාරණ
විකෂා-වැල්මදට
විකසිත-පුබුදුවීම
විකා-ගජතිප්පිලි, සිවිය
විකාර-ලෙඩ
විකාශී-දෙෂයන් වියලා ශරීර බල බිඳ සන්දිපත් අප්‍රාණික කරණ පුවක් වැනි විෂ ඵල වර්ගයක්
විකිරණ-වරාගස
විකිරණඵලා-වැල්නිබ්බටු, එළවරා
විකුන්තක-මයුරතුතු, (පල්මාණික්කම්) කොත්ත මල්ලි
විඥෙය-අමු ඉහුරු
විඥෙයා-සේරු
විගන්ධක-නියඹරා
විගන්ධිකා-අතිවුඩයන්, මුඩමහණ
විගන්ධිනී-අතිවුඩයන්
විඝ්න-කරඹ
විඝ්නෙශානකාන්තා- සුදු ඊතණ
විඩගම්-නිප්පිලි,(වගපුල්)
විචඡිව-සුළුසාරණ
විචක්ෂණ-දැන්ත, කවෙළු
විචකිල-කුකුරුමාන්
විචචර්ත්‍යා-උණගස
විචර්චිකා-කුෂ්ඨ රෝගය
විචිත්‍ර-අසෝකා
විචිත්‍රා-මදට ගස
විචිත්‍රාඩිගී-දුම්මැල්ල
විජ්ජුල-පොත්ත, කුරුඳුපොතු
විජ්‍රනී-මාරාගස
විජ්‍රා-මුඩමහණ
විජෘම්භනී-බදුල්ල ගස
විජය-ඉද්දගස, මදට ගස, කුඹුක්, අරලු
විජයා-ඉද්ද, සිනිද්ද,අරලු,ඊතණ, කන්සා, සේපාලිකා, වැල්මදට, භිඟුරුපියලි, මහමිදි, වදකහ තලා ,
විජයාර්ධා- මහ එන්සාල්,වදුරුමැ
විජ්‍රුල-ඉඹුල් කඳ
විටි-මල (අසුවි)
විටිඛදිර-ඇපල, භිඹුරු
විටිනිද-කැකිරි
විට්ලවණ, විඩ } බළල් ලුණු
විට-නාරම්ගස, කිහිරි ප්‍රභෙදයක්-ලවණ
විටප-අත්ත, කොළ, ගස
විටපත්‍රී-සීත් ඩෙබර
විටපිත්-නුග ගස
විටපී-ගස
විටපෝ, විටනි } වෙලෙප්
විටි-රන්වන් සඳුන්
විඩ්ගන්ධ-බළල් ලුණු
විඩ්නිද-කැකිරි

විඩිලවණ-බළල් ලුණු
විඛඩග-වලහසාල්
විඛත්තල්-අත්දර
විඛාල-ඇස්පිඩ, හිරියල්, කිරිබදු
විඛාල ලවණ-බළල් ලුණු
විඛාලා-තුන්පත් කුරැඳු
විඩුල-වේවැල්
විතණ්ඩා-නීතිවැල, කොම්ඩු
විතන්නක- වැළක්, සාතාවාරිය
විතශොක-අසෝකා
විතාන මූලක-සැවැන්න
විතැන-කොත්තමල්ලි
විතුත්ථක-නවතැඹිලිය
විතුන්න- කොත්තමල්ලි, කිඹුල් වැන්න
විතුන්නක- පල් මානික්කම්, නව නැඹිලිය, කොත්තමල්ලි
විතුන්නය- කිඹුල්වැන්න (පතම් පෙති)
විතුන්‍ය-කළාදුරු
විතුන-කොත්තමල්ලි
විතෙ-ඇට
විද්දුමෝ-පබළු
විද්දෝදර-උදර රෝග විශෙෂයක්
විධඛණී-දියමිත්ත
විද්‍යද්‍රෝ-වී
විද්‍යමානක-සුදුදුරු
විඤ්ඣ-ගුගුල්, හීන් මිදි
විඤ්ඣදල-කරඟස
විද්‍යුල්ලතා-නියඟලා
විද්‍රක-ගුරැකැට
විද්‍රධි-එනම් රෝගය
විද්‍රධිනාශක-ඇසල
විද්‍රධිනාසන-මුරැංගා
විද්‍රාවන-රිදී තුත්තන්
විද්‍රැම-පබළු
විද්‍රැම ලතා-පබළු වැල, ලියනඟලා වැල

විදග්ධ-විශෙෂයෙන් දැගිය
විදපා-ගුගුල්, සීන් මිදි
විදල-රත්රන්, ත්‍රඝනවාළු, කළු ත්‍රඝනවාළු
විදුක-ගුරැකැට
විදුරණ-කිණිහිරි ගස
විදුරි-බිම් පුසුල්, අස්වැන්න
විදුරිගන්ධා-අස්වැන්න
විදුරිණී-ඇත්දෙමට
විදුලිකා-කිරිබදු
විදි-බුලත්
විදිඵලත්තුව-බුලත් වැල
විදුම්
විදුමල් } පබළු
විදුර-වජ්‍ර=(දියමන්ති), විදුරු
විදුරඹ-නරමූත්‍ර
විදුරු-දෙළුම්, කිඩාරම්, දියමන්ති,
විදුරුතෙල වැල-සීරැස්ස වැල
විදුරු මුව-පූඩැල්ලා
විදුල ඇඹුල්වේ, සුවඳ තණ
විදුලා-මුඛමහණ
විධාතෘ-සුරා, තිප්පිලි
විධූ-කපුරු
විඬ්ගපත්‍ර-කරගස
විඬ්ග-ඈන්සාල්, ලාවලු, (ලාවුළු) ගස
විඬ්ගාග්ව-අමුක්කරා
විනම්‍රක-තුවරලා මල
විනීතාකුල පුත්‍රක-කුකුරුමාන්
විපණීක කැල ගස
විපාතිකා-පතුල් පැලියාව, (පතුල් පැලෙන (පාත) රෝගය)
විපින-ආරණ්‍යය
විපුල-මුඛමහණ
විපුලා
විපුෂා } මුඛමහණ
විඵල-වැටකේ
විබන්ධ-මලබද්ධය, කොසඹ

විභාකර-වරාගස, හෙළ නිටුල්
විභාවරි-කහ
විභාවසු-වරා ගස, රත් නිටුල්
විභීතක} බුළු ගස
විභීතකී}
විභීස-බුළු
විභීසතඃ-මිදි
විම්බ-කෙම් ගෙඩිය, (කෝවක්කා ගෙඩිය)
විම්බට-අඹ
විම්බිකා-කෝවක්කා
විමල-දැසමන්, සවිඳුව ලුණු
විමලා-නෙල්ලි, බැමිතිරිය
විමශ්‍රඬගිකා-වැල් පෙතෙල
වියදුන්-කැවිලි
වියරු-උන්මාදය, (පිස්සුව) මීමස් මොරය (වස්මර)
වියලි ගැට වෙළුන්-වේලිච්ච ගැඹ වෙලුන්
විරඬග-පීක් මල්
විරණ-සැවැන්න
විරණාමූල-සැවැන්දරා
විරඝ-සැවැන්න
විරහ-රති කෙළිය
විරාල-නිඹිරි,
විරාලිකා-කිරිකවෙලු
විරිකතා-වලාවැන්න
විරූඪ-උඩැත්ත
විරූප-කිප්පිලි මුල්, අනිවුඩයන්, ඇල් කසඹිලියා, කළුදුරු
විරූපා-නිල්මානෙල්, උඩැත්ත
විරෙක-මලාදිය පහතට යාම (මල පහවීම)
විරෙකී-රුකතුණ, යක්බේරිය
විරෙචන-මොර ගස, මල පහවීම
විරේචනී-පීක්මැලි
විරොචන- එරබදු, තොවිල, වරා ගස
විල්කොත්-කොන්ත
විල්තලා-තලා වගීයක්, විලකොළ
විල්දුම්මල-විල්වලින් හාරාගන්නා දුම්මල
විල්ලම්-බෙලි ගස
විල්ලමූලා-බින්තල්
විල්ව-බෙලි
විල්විකා-පත්‍රාභිංගු
විලංගන්-මිනිරන්
විලංබාදන-වලහසාල්
විලඟ-වලහසාල්
විලඳ-ඒ පොරි (ධාන්‍ය බැඳි ලද මල් = ලාජා)
විලඳ පැන්-මල් රස, මල් වතුර
විලඳවැන්න-විලඳ වැනි මල් හට ගන්නා මූගුණු වැන්න වලට මදක් සමාණ වමන කාරක පැලැටියක්, (ඇතැම් අය සඹඹ පුෂ්පි =(සඹ මල්) වලට ද විලඳ වැන්න යයි කියති)
විලපලා-තනකිරි වැඩිවන කැමක් (පලා වගීයක්)
විලලා-සුදු බැවිල
විලාප්-දෙඩම්
විලාප පැගිරි-දෙඩම් පැගිරි
විලාමරම්-ගිවුලු ගස
විලාවරිසි-විලා අරිසි =(වලහසාල්)
විලාසිනී-කසා, සංකකුප්පි
විලි-ගෙඹිය, ඵල
විලිකුම්-පැසුණු
විලිකුම්කදලි-ඉදුන කෙසෙල්ගෙඩි
විලිකුම් පත්-පැසුන කොළ
විලිකුම්මිරිදිය-උනුවතුර
විලිමුවන්-රිලවුන්
විලෙපනය-සඳුන්, කසා, ගොරද, කොකුම්, මෙකී දේ
විලෙපී-තලප
විලොචක-සඹ ගස, පැපිලිය
විලොඩී-මෝරු

විඛඤ්ඤන්

විවඤ්ඤන්-වරා, රන්නිටුල්
විවිටප-හැමගස්
විවෘඩි-කිණදෙඹ
විශ්‍රගන්‍ධක-හිරියල්
විශ්‍රගන්‍ධා-මුඛමහණ
විශ්‍රා-මුඛමහණ
විශ්තෘණ-වැළුක්
විශව-සිදුසිහුරා, අතිවුඩයන්, තිප්පිලි
විශවක-වැලහුණ
විශවඝෙෂණා-විශ්ණුක්‍රාන්තී, බින්තල්, පුවහු
විශවකෙෂණා-රැකහුණ
විශවගන්‍ධ-ගෙන්දගම්, ලුණු, අඳුතලා
විශවගන්‍ධා-තලා, අඳුතලා
විශවග්‍රන්ථි-වලාවැන්න
විශවදෙවා-ගස්කැලිය, මහබැවිල, ගොඩමාතෙල්
විශවදෙවී-සිරිවැඩි බැවිල
විශවභෙෂජ-සිදුසිහුරා
විශවරූපක-කළු අගිල්
විශවරූපී-කලුවැල්, අගිල්
විශවසථා-සාතාවාරිය
විශවා-අතිවුඩයන්, වියලි ඉඟුරා .
විශවාමිත්‍ර ප්‍රිය-පොල්
විශ්වෞෂධ-ඉඟුරා
විෂමචර්ද-රුක්අත්තන
විෂල්‍යකා-කුඹුරු වැල
විෂල්‍යා-හෙළු නෙවුල්, මහ ගොන් සුතු කැකිරි, අසමොදගම්, නියඟළා, නිටුල් ගස, රසකිද, නියඔරා, කටුවැල් බටු
විෂා-අතිවුඩයන්, කේශර බැවිල, වව්වනාවි, වෙල් මුඛ (මුඛමහණ)
විෂාඛජ-නාරන් ගස
විෂාඛා-කරිවිල, සාරණ මුල්
විෂාණී-මැඩඟහු
විෂාල-රත් මහනෙල්, නියඔරා, ඇන්බටු, (වම්බටු)

විෂාලත්වච්-රුක් අත්තන
විෂාල නලගන්ධී-පියා ගස
විෂාල පත්‍ර-තල් ගස
විෂාලා-මහ ගොන් සුතු කැකිරි, නියඔරා
විෂාලී-අසමොද
විෂිණීපණී-කොසඹ
විෂුඩලවණ-සවිඳව ලුණු
විෂුදධි-කසා
විශොදරී-කටුවෙලඟ
විශොධනී-දැන්න
විශොධින්-දැන්න
විශ්‍රගන්‍ධා-වෙල්මුඛ (මුඛමහණ)
විෂ්ටර-ගස
විෂ්ටරුහා-රන්වන් වැටකේ
විෂ්ටා-මල, (අසූචි)
විශ්ණුක්‍රාන්තා-කටරොලු
විශ්ණුකාන්තා-විශ්ණුක්‍රාන්ති
විශ්ණුගන්ධි-විශ්ණුක්‍රාන්ති
විශ්ණුප්‍රියා-තලා, කලුතලා
විශ්ණුරූපවත්-කරඳ ගස
විශ්ණුවල්ලභ-මලිත, තලා
විශ්ණුවල්ලභා-විශ්ණුක්‍රාන්ති,ගිනිසිළු, (මලිත) ගස
විශ්ණුසයන-නුග ගස
විශ්ණුනිතා-කළුතලා
විෂ්ඵජිනී-තිඹිරි ගස
විෂ්ඵුරනී-තිඹිරි ගස
විෂ්ඵොට-පිලිකාව, පැපොල් හෝ මසූරිකා (වසූරි) රෝග
විෂ්වක්ෂෙණ-පුවහු, රැකහුණ
විෂ්වරිත්මස්ණප්‍රියා-බිම්තල්
විෂ-නෙළුම් රේණු, නෙළුම් අල, ගෙඳගම්, වව්වනාවි, ඇරැ
විෂකණ්ටකිනී-මල්තුඹ

විෂ කුම්බ

විෂ කුම්බ

මසෙසුදුාක්කා කොළ වැනි කොළ හා රත් පාට මල් පොකුරු ත් රට එඩරා ගෙඩි වැනි ගෙඩි ත් ඇති මේ ගසට විෂ කුම්බ ය යි කියති. මෙය සපී විෂ නාසක **විෂකුම්භ** නමැති ඖෂධය ලෙස බොහෝ දෙනා කියත ත් හැඩ හුරා කම්ත් මෙය ලංකාවට මැතක දී බෝ වූ න ගසක් බැව් පෙනේ.

අපේ පැරණි සිංහල වෙද පොත් වල විෂකුම්බා නමින් හැ දි න් වෙ න් නේ ක දෙ ත් මුල් වල ත් අත්තික්කා වැනි ගෙඩි හා බුව සහිත දිග කොළ ඇති ගසේ පට්ටාව දිගට ම ගැල වෙන කොටදිඹුලා = (කවුඩු අත් තික්කා = වායසෝදුම්බර) යන අපර නාමයන්ගෙන් හැඳින්වෙන (Ficus Hispida) නමැති **කොට දිඹුලා** ගස යි. ජයපාල වලට ද **විෂකුම්බා** ය යි කියති. විෂ සහිත වගීයක් නිසා එයට විෂ කුම්බ ය යි කියනවා විය හැක.

විෂ ගන්ධකා-අතිවිඩයම්
විෂගන්ධි-රම්මානිස්ස
විෂගන්ධිනී-අතිවිඩයම්
විෂඝ්න-සියඹලා, පෙරුම්කායම්, බුලු
විෂඝ්නබීජ-මූනමල්
විෂඝ්නී-සියඹලා, මහ උක්, සස් සඳ, පෙරුම්කායම්, ගොඩ මේ රිය, මුඩමහණ්, ඊතණ, දේව දාලි, සුදු (හෙළ) කටරොළු
විෂජිත්-මහරි
විෂජිහ්ව-දේවදාලි
විෂණ්ඩ-නෙළුම් අල
විෂතින්දුක-කුපීළු, (ගොඩකදුරු)
විෂද-මල් කසිස්
විෂදූ-වම්බොටු
විෂදූර-සියඹලා
විෂදූෂණී-මුඩමහණ (වෘදුසි රෝග යට හා ග්‍රහණියට ගුණ දායි ඖෂධයකි. 373 පිට බලන්න)
විෂදෘම-වැල් මුරුංගා
විෂධවංසි-කලාදුරු
විෂධ-මහ කසිස්
විෂධා-රසකිඳ
විෂධාතින්-මාරා, කාඹිලියා, බුලු, සපු, කැකිරි, අඳුතලා, පිටවක් කා, රතු සාරණ, කහ, ඇන්සැ ටිය, මහ කරඳ, වදකසා, පිංඛා හිඟු, සියඹලා, ලෝලු

විසනාසන-මාරා ගස (මේය විෂ නාසක ඖෂධයකි)
විෂනාසනී-රසකිද,නියඳ·
විෂනුද්-තොටිල
විෂපහ- කටරොලු වැල්, නිත්ත ලබු
විෂපු-විසප්පු
විෂපුෂ්ප-නිල් නෙළුම්, කුකුරු මාත්
විෂපුෂ්පක-කුකුරුමාත්
විෂමච්ඡද-රුක් අත්තන
විෂමණ්ඩල-තොලබෝ(තොලබෝ ග්‍රන්ථි ශොථයට ප්‍රත්‍යක්ෂ බෙහෙතකි. 231 පිට බලන්න)
විෂමදල-රුක් අත්තන
විෂමදෘෂක-ලෙඩ ඇත්තෙක්
විෂමර්දනී-අරත්ත, ඒකාවේරිය
විෂමුෂ්ටික-ගොඩකදුරු
විෂමුෂ්ටි-රේරු, ගොඩකදුරු
විෂරු-නිඹිරි
විෂරූප-අතිවුඩයන්
විෂරූපක-කළු අගිල්
විෂරූපා-අතිවුඩයන්
විෂලතා-කැකිරි වැල
විෂල්‍යා-ලියනහලා
විෂවහා-රේරු ගස්
විෂවාලකා-නෙළුම් අල
විෂවිනාසනී-නියඳ
විෂඝ්න-මාරා, සපු, බුලු, වේලා, ගොන් කැකිරි, යවාස, මහ කරඳ
විෂඝනනී-කටරොලු
විෂඝා-දේවදුලිය වැල
විෂා-අතිවුඩයන්, කෙසර බැවිල, ලියනහලා, රේරු
විෂාඛ-සුළු සාරණ
විෂාඛුල-මැඩහඳු

විෂාණ- මුවන් ආදීන් ගේ අඟ, ඇත් දත, ඌරුදත, කොට්ටන්, කිරිකවෙළු
විෂාණික-තෝර ගස
විෂාණිකා-කකීටකශ්‍රිංගි, තෙල්ලි, පික්මැලි, අඟ, මැඩහඳු
විෂාණිකා කුසුම - කෙහෙල් ගස
විෂාණී-යෂ්ඨිමධුක, මැඩහඳු, ඇත් සැවිය
විෂාද-මහ සාරණ
විෂාපහ-නිත්ත ලබු
විෂාපහා-කටුවෙළඟ, ඇපල, කළු නික, දේවදුලිය, සටරොළු, නිත්ත ලබු
විෂායනා-රසකිද
විෂාරදා-අමුක්කරා
විෂාරාති-කළු අත්තන, මහ එරඬු
විෂාරි-දිය බෙරලිය, පුත්කරඤ්ජ
විෂාවහ-සස්සඳ, වරාමුල, ගොන් කැකිරි, නාගදමනී
විෂාස්‍ය-බදුල්ල
විෂෞෂධි-දැත්ත, (මහාදන්ති)
විස්ව-නිප්පිලි, ඉහුරු
විස්වරූපක-කළු වැල්
විසවලක-වැලහුණ
විසවලා-වෙනිවැල්කෂායෙන් යුත් තුත්තන්
විසවල්ලී-තලිස් පතුරු
විස්‍රගන්ධා-තියඹරා
විස්‍රගන්ධී-හිරියල්
විස-නෙළඹුදැලි, තෙරිවිස, සර්පවිස, වච්චනාවි
විසකුසුම-නෙළුම් මල
විසගද-ඉවද, අතිවිඩයම්
විසගන්ධි-රත්වන් වේලා
විසඛකට-වැලහුණ
විසද-සාරණ

වී

විස දූවිලි-වදුරු මෑ හෝ උඩවැඩියා වගීයට අයත් පැල වගීයක් මේ වගීයේ ගෙඩි වේලී පිපුරුන විට නික්මෙන ධූලි (දූවිලි) වැනි ඇට ඇගේ ගැවුනහොත් කැසී ම,දූවිල්ල, හා වේදනාව ගණ්සි.
විසනිරි-නෙරිවිස
විසබිජු-ජයපාල ඇට
විසමදල-රුක් අත්තන
විසල්-රුක්කත්තන ගස
විසල්‍ය-රසකිඳ,හියඹරා, අසමොදා, මලින,දූන්න
විසලදල-රුක්අත්තන
විසවිහ-රේරු
විසවා-ඉවද
විසස්සන-ගම්සූරිය
විසා-ඉවද
විසාරින්-මිස්වැන්න
විසාල-කුඹුරු වැල
විසාලා- පෙනෙල ගස, ගොන් කැකිරි
විසාලාක්ෂි-ලියනඟලා
විසාහ්වය-රේරු
විසි-මාරා ගස, මදට ගස
විසිනී-නෙළුම්, කෙරව
විසිවන-මාරා
විසිවනසු-මදට
විසූචිකා-ආනිසාරය
විහිදු-තණරද
විහිදි
විහිදුම් } පුබුදුවීම
විළඟං-වලඟ සාල්

වීජ-අංකුරය, ඇට, ගෙඩි ආදිය
වීජක-නස්නාරන්
වීජකෝෂ-නෙළුම් බව්ටා
වීජගණ්-පතෝල
වීජගුප්ති-මුංවැන්න
වීජපාදප-බදුල්ල ගස
වීජ පුෂ්ප-කුකුරුමාන්
වීජපූර-දෙඩම් ප්‍රභේදයක්, ලප් නාරන්
වීජඵලක- දෙළුම්, කුකුරුමාන්, දෙඩම්
වීජමාතෘක-නෙළුම් ඇට
වීජරජ්ජ-මෑ, එදු
වීජරෙචන-ජයපාල ඇට
වීජවෘක්ෂ-පියා ගස
වීජාඵල-සියඹලා
වීටිකා-බුලත් වැල
වීඩාල-තුන්පත් කුරුඳු
වීත්තු-අත්දර
වීථ්‍යා-තුරු පෙළ
වීර්‍ය්‍ය-ශුක්‍රධාතුව
වීර- කුඹුක්, තිඹිරි, ශෘෂභක, උණකපුරා,මිරිස්, කාඩ්, බදුල්ල ගස, නෙළුම් අල, සැවැන්න,
වීරක-කණේරු
වීරකක්ෂා-නරිඅල
වීරණ-සැවැන්න
වීරණ කටායක-සැවැන්න
වීරණ මූලිකා-සැවැන්න
වීරණී-සාවැන්න
වීරතර-සාවැන්න,අත්දර,කුඹුක්, බදුල්ල
වීරතරු-අත්දර, කුඹුක්, ඉකිරි, බදුල්ල
වීරතුරු-කුඹුක්
වීරදා-අත්දර
වීරපත්‍ර-කංසා
වීරපත්‍රා-ඉද්ද, බළුදම්
වීරභද්‍ර-සාවැන්න
වීර වෘක්ෂ-අත්දර, බදුල්ල

වු වෘ

වීරතරාදි ගණය-අන්දර, සිහින් මිදි, වැළුක්, පෝටා, නිතණ, බොරළු දමුණු, සාතාවාරිය, කොබෝවක්කා, තොට්ලි, ගොකටු, යාපුර, (නිරිල) රත් මල් ගස්, ඉළුප්, කටුකරඹු දෙවගය, පහණබෙය (පොල් පලා) යන මේ වීරතරාදි ගණය අශ්මරී - මූත්‍ර සක්‍රීරා - මූත්‍ර කෘච්ඡ්‍රා හා වාතරෝග නසන්නේ ය.

වීර හනස්-බදුල්ල ගස
වීරා- කිරි කවෙලු, නෙල්ලි, එන් සාල්, කෙසෙල්, වරා, කිරිබදු, මහ හාතාවාරිය, කෝමාරිකා, අනිවුඩයන්, මුද්දරප්පලම්, ඉන් සළු, කිරිඳි, කිරිකවෙළු
වීරාම්ල-ඇඹුල්වේ
වීරාසිරා-කිරි අහුණ ගස
වීරික්තා-වලාවැන්න
වීරු-කළුදුරු, පත්‍ර බොහෝ ඇති වැල
වීරුඩ-ඉහුරු, උඩැන්න, වරා
වීරූප-කසා, අනිවුඩයන්, හුණ්ඩ, වගපුල්
වීරූපා-උඩැන්නා, දුරාලභා
වීලී-ගෙන්දගම්
වීස-ඉඳු සල් ගස
වීසන-මැඩහහු

වුදඩිරොගො-වෘදධි රෝගය
වුන්ටෙ-නිබ්බටු
වුළුව-උළුවා
වූෂණා-කලාදුරු
වූසඹල-සියඹලා ගස

වෘක්ක-වකුගඩුව
වෘක්ත පුෂ්පකා-මහරි
වෘක්ෂ-කෙළින්ද ගස
වෘක්ෂක-පියා ගස, ගස, කෙළින්ද
වෘක්ෂකන්ද-බින්තල්
වෘක්ෂකන්ද-කිරිබදු
වෘක්ෂගන්ධා-සීන් දුමැඩ
වෘක්ෂගන්ධිනී-ගැටතුඹ
වෘක්ෂධූප-හොර ගස
වෘක්ෂනාථ-නුග ගස
වෘක්ෂපණී-රුක් කොළ
වෘක්ෂපාක-නුග ගස
වෘක්ෂභක්ෂා-පිළිල
වෘක්ෂභායත්‍රී-යක්ඛේරිය
වෘක්ෂමාද්නි-දිය හොමුවහු
වෘක්ෂයාසී-යක්ඛේරිය
වෘක්ෂරුහා-පිළිල, සීන්දුමැඩ
වෘක්ෂසාරක-ගැටතුඹ
වෘක්ෂාදන-ඇසටු, පියාගස, පිළිල
වෘක්ෂාදනී-පුවටා,සීන්දුමැඩ,පිළිල
වෘක්ෂාම්ල-සියඹලා, රටගොරක
වෘක්ෂෝත්පල- මිදිගස, කිණිහිරි ගස
වෘක-කෝවක්කා, දියමිත්ත
වෘකධූප-සිරිවටු, දශාඞ්ගාදි ධූප
වෘකධූම-තුරුක් තෙල්, ඇපල, ගුගුල්
වෘක ධූම-තුරුක් තෙල්, ඇපල, ගුගුල්
වෘකධූමක-ඇපල
වෘකවෘන්තා-දියමිත්ත
වෘණ-වණය, තුවාලය
වෘණකා-කලුතලා
වෘණකාරක-බදුල්ල ගස
වෘණඝ්න-මසේනිය
වෘණඝ්නී-ලියනහලා
වෘණරිපු-මසේනිය
වෘණසෞධන-කටුවෙළඟ

වෘණහා වාතී

වෘණහා-එරඹු
වෘණාලිකා-කිරිබදු
වෘණෝත්තා-අමුක්කරා
වෘණෝත්තා-අමුක්කරා
වෘත්ත-පිත්තල, ඇඹුල, වතුසුද්ද මූල
වෘත්තකොෂා-දේවදාලි
වෘත්තපත්‍රා-දියමිත්ත,දියබෙරලිය
වෘත්තපර්ණී-මහ හණමිල්, දිය මිත්ත
වෘත්තපුෂ්ප-කොළොං, මාරා
වෘත්තපුෂ්පක-මාරා ගස
වෘත්තපුෂ්පා-කෙසෙල් ගස, බක්මී
වෘත්තඵල-දෙහි, මිරිස්, දෙළුම්, ඩෙබර, ජූල්, (දිවුල්) බටු, නෙල්ලි
වෘත්තමල්ලිකා-හෙළවරා
වෘත්තලෝහ-පිත්තල
වෘත්තවීජ-නාපිරිත්ත, ආසකි
වෘත්තා-මස්වැන්න, පුවඟු
වෘත්තාඞ්ගී-පතුක්
වෘත්තාඤ්ජන-මස්වැන්න
වෘත්තික-හෙළදම්
වෘත්තිකා-හෙළදම්, සේපාලිකා
වෘන්තනාදීවර-ඇඹුල
වෘනතා-අරළු
වෘනිඛකර-උගුරැස්ස
වෘඛ-ගල්මද, ගල්සෙවෙල්, කප්පරවල්ලිය, නවනැඹිලිය, බදුල්ලගස
වෘඛජාත-බුළු ගස
වෘඛදූරිකා-මුතුණුවැන්න
වෘඛඵල-දේවදාලිය, අන්දර ගස, විලිකුම් ගෙඩි
වෘඛරාජ-ඇඹුල්වේ
වෘඛවිභීතක-ඇම්බරැල්ල
වෘදඩි- ගල්වල හටගන්නා ද්‍රව්‍ය යක්. අනෝජ්ය. ඇස්බැබිල
වෘදඩිකා- අෂ්ටක වර්ගයෙ ඔසුවක්

වෘඛදූරු වැල්



වෘඛදූරු වැල්

Argyreia Speciosa

ලඬකාවේ **ගිරිකිල්ල** වෙනුවට ඉන්දියාවේ ගන්නේ මේ වැල්ය. මෙහි කොළ රසකිඳ කොළ වලට මදක් සමාන ය. කොළ වල විල්ලූද වැනි දිළිසෙන සුදු බූවක් තිබේ. වැල් ද මූරුවා වැල් මෙන් සුදු පාට ය.

වෘත්ත-නටු
වෘන්තඵල-රත්සැබෝ
වෘන්තා-රත් පළොල්
වෘන්තාකී-චම්බටු
වෘන්තිකා-කටුකරෝහිණී
වෘන්ද-තලා, අබ
වෘතී-රුක්මල්

වෘශ්චාක–කෝවක්කා, මදනගස
වෘශ්චික–කුකුරුමාන්
වෘශ්චික කර්ණී–මීකන්පලා
වෘශ්චිකාදංෂ්ට්‍රා–ඇන්සැටිය
වෘශ්චිකාලී– වැල්කහඹිලියා (එළු අං මෙන් උඩට නැඟි කරල් ඇති මදක් බුවසහිත දියමින්න වැනි පත්‍ර වලින් යුත් කටු සහිත දකුණට කරකැවෙන වැල් වර්ගයක් ය සි සුශ්‍රැත ටීකා වේ කියා නිබේ). වේලිපරත්නි මේ ලකුණු වලින් යුක්ත සි.
වෘශ්චිපත්‍රී– ඇන්සැටිය, වැල්කස ඹිලියා
වෘශ්චිපර්ණී– ඇන්සැටිය, වෘශ්චි කාලී
වෘශ්චී–ඇන්සැටිය
වෘශ්චීර–සුදු සාරණ
වෘෂ්ටිඝ්නී–හීන් එන්සාල්
වෘෂ්‍ය–ශුක්ල වැඩි කරණ,නෙල්ලි, සාතාවාරිය. ඔසබිය, මුද්‍රික ඵල
වෘෂ්‍යකන්ධා–කිරිබදු අල
වෘෂ්‍යගන්ධා– කිරිබදු, කොටිකන් බැවිල
වෘෂ්‍යගන්ධිකා–මිහබැවිල
වෘෂ්‍යවල්ලී–කිරිබදු
වෘෂ්‍යා–සාතාවාරිය
වෘෂ–පාංශු ලුණු, ඔසබිය, ආඩා තෝඩා. මොණරපිල්
වෘෂක–පාංශු ලුණු, ආඩාතෝඩා
වෘෂකණ්‍යා–මුගුණුවැන්න
වෘෂකපායී–බුලත්
වෘෂගද–රම්මානිස්ස
වෘෂගන්ධිකා–ගිරිතිල්ල
වෘෂද–ඵඳු
වෘෂදංශක–බළලා
වෘෂදංශවිටී–බළල් වසුරු
වෘෂධ්වාඞ්ක්ෂී– ඉඟුරු, කලාඳුරු
වෘෂනාශක–වළහසාල්
වෘෂපර්ණී–කොතුරුඹැදීද= (මීකන්පලා)
වෘෂපුෂ්පිකා–ගොඩමානෙල්
වෘෂභ–ඔසබිය, ගොන්කැකිරි
වෘෂභාක්ෂී– තියඹරා, කටරොළු, කැකිරි
වෘෂභී–මිහ එන්සාල්
වෘෂවර්ජ–එඩරු
වෘෂා–වංඇපල, අමුක්කරා, හාතාවාරිය, දූදු, මකුණුවැන්න
වෘෂාඛ්‍යා–බදුල්ල
වෘෂාඩ්‍රී–වඳුරු මැ
වෘෂාදනී–කැකිරි
වෘෂාලී–හිරිතිල්ල
වෘහච්චඤ්චු–මිහ එරබු
වෘහච්ඡාත–නස්නාරම්
වෘහත්ගලා–මිහබැවිල
වෘහත්තාල–කිතුල්
වෘහකනිකන්‍යා–දියමින්න
වෘහත්තෘණ–උණ ගස
වෘහන්පාටලී–අත්තන ගස
වෘහන්පාදප–නුග ගස
වෘහන්පාලින්–වල්දුරු
වෘහන්පිලු–මිහමෝර
වෘහන්පුෂ්පි–යක්බෙරිය
වෘහන්ඵලා–මාදම්, නිත්ත ලබු
වෘහන්බලා–මිහබැවිල
වෘහබ්ධානු–රත්නිටුල්
වෘහනිකා–බටු
වෘහතී–කටුවැල්බටු, වම්බටු, කුඩා බටු
වෘහද්දල–කිතුල්, පට්ටිකා ලොත්
වෘහද්ඛල–මහලියනහලා වැල
වෘහද්වල්ක–පට්ටිකා ලොත්
වෘහද්වාරණී–මිහනියඹරා
වෘහද්වීජ–ඇම්බරැල්ල

ව

වෘහදම්ලා–කාමරංගා
වෘහදෙලා–මහ එන්සාල්
වෘහන්තල–මහ උක්
වෘහන්තලා–කුඹුක්

වෙගා–කටුවෙළඟ
වෙජයන්තිකා–තිටිඟ
වෙජාන්‍ය–බෝදි ඇට
වෙඩිප්පු–වෙඩිලුණු
වෙඩිසන්නි–සන්නි රෝගයක්
වෙණි–දේවදාර
වෙනිවැල්–වනුවැල්=මුරුවා කොළ වලට මදක් සමාන කහ පාටින් යුත් වැල් වගීයක්. තද තික්ත ගතියක් ඇති මේ වැල් ජ්වර –වාතාබාධ හා ග්‍රන්පි රෝගයට ගන්නා– බෙහෙත් වගී වලට එකතු කරති. ඖෂධ සඳහා ගන්නේ මේ වැල් වගීයේ මහත් වී තිබෙන පුරුක්(ගැට)ය. තැල්මට හා පිටගැස්මට ද වෙනි වැල් ගැට ප්‍රත්‍යක්ෂ ඖෂධයකි. මීහරක් දිගිරි කිරීමට හා ඇදීමට ගන්නා නිසා බාන් වැල් නමින් ද, කහ පාට නිසා කහ වැල් නමින් ද, ගම්වාසීන් අතර ප්‍රසිද්ධ මේ වැල් වගීය ඖෂධ වශයෙන් ගන්නේ **දෘඃහරිද්‍රා** නමැති ඉන්දියානු ගස් වගීය වෙනුවට ය.
වෙණීර–කොහොඹ
වෙණු–උණගස
වෙණුකකීර–කණේරු
වෙණුන–මිරිස්
වෙණුපත්‍රී– පිණඩාණිංගු, දියබෙරලිය
වෙණුයව–උණහාල්
වෙත්තිලෙ–බුලත්
වෙත්‍ර–වේවැල
වෙතස–ඇලවේවැල
වෙතසාම්ල–ඇඹුල්වේ
වෙතුම්පෙ–අනෝද ගස
වෙද–පෙරුම්කායම්, රසදිය, දිය පුඩාවා
වෙදමවු–වංඇපල
වෙදමුකඛ–කස්තුරි, හිඟුරුපියලි
වෙදමුකඛක–හිඟුරුපියලි
වෙදමුල්–වංඇපල මුල්
වෙදරාලගෙ මෝ– (වෛද්‍ය මාතා) වංඇපල(සපි වෙදකමේ රහස් වචනයක්)
වෙදවේ–වංඇපල
වෙදි–දියමිත්ත,ඇඹුලැඹිලිය, බැම්තිරිය
වෙධක–ඇඹුල්වේ,කොත්තමල්ලි, යකඩ, රසදිය
වෙධනී–කස්තුරි, උළුවා
වෙධස්–එළවරා
වෙධිනී–පුඩාවා
වෙන්කඩුහු–හෙළ අබ
වෙන්කනලි–එළ ඔලිඳ වැල
වෙන්කරුන්කාලි–හෙළ කිහිරි
වෙන්කල්–ලෝකඩ
වෙන්කාඋල්ලි–සුදුලූනු අල
වෙන්කොලිවි–පිලඟස, හෙළ පිල
වෙන්තාමරයි–හෙළ නෙළුම්
වෙන්තුලෙ–අදුතලා
වෙන්තොඩි–නියඟලා
වෙන්නාවල්–හැලිදඬු
වෙන්නීර–උණුවතුර
වෙන්නේ–එළ එඩරු
වෙනී–දේවදාලී

වෙනු වෙල්ලන්ගිරිය

වෙනු-උණගස, නිල්උණ
වෙනුරුස්-විෂ්ණුක්‍රාන්ති
වෙප්පමරම්-කොසඹ ගස
වෙප්පාල් අරිසි-කෙළිදසාල්
වෙප්පාලෙසි-කෙළිද ගස
වෙපටි-ඉරිවේරිය
වෙපථු-කම්පාවීම,වෙවිලීම
වෙම්පු-කොසඹ
වෙම්පුමරම්-කොසඹ ගස
වෙම්බාඩම්-රත්නිවුල්
වෙයග බඩ-වේවැලෙහි අග බඩය හෙවත් මොලොක් කොටස
වෙයඟ-ක්ෂුද්‍ර රෝගයක්
වෙයඟනීලික-ක්ෂුද්‍ර රෝගයක්
වෙර්කොඹු-සිඳහුරු

වෙර- ශරීරය, බටු, කටුවැල්බටු, කොකුම්, කපුරු
වෙරළු-වෙරළු ගස
වෙරළුමිණි-වෛරෝඩි මැණික
වෙරා-යක්බේරිය
වෙල්එරක්කු-හෙළවරා
වෙල්නාවල්-හෙළදම්
වෙල්බිජු-කුඹුරුඇට
වෙල්මුඩ-මුඩමහණ
වෙල්ල-මිරිස්, මිණිරන්, වළහසාල්
වෙල්ලකානදි-මුස්සැන්ද
වෙල්ලකුණඩුමණි-හෙල ඔලිද
වෙල්ලජ-මිරිස්, වළහසාල්

වෙල්ලන්ගිරිය

වෙල්ලන්ගිරිය කඩකරු කඨ (වල්) වෙල්ලන්ගිරිය

Paramignya Monophylla

වේ

වෙල්ලන්ගිරිය **මැඩිය කොළ** වලට මදක් සමාන කටු සහිත පඳුරු වර්ගයකි. මෙහි සුදු පාට කොළ ඇති වර්ගයක් සහ තද නිල් (කළු) පාට කොළ ඇති වර්ගයක් දැකි දෙවර්ගයක් තිබේ. මෙයින් ඖෂධ වශයෙන් ගන්නේ මූලින් කී වර්ගය යි. ඒ වර්ගය සොයා ගන්ට බැරි වූ විට දෙවැනි ව කී කළු වෙල්ලන්ගිරිය ද ඖෂධ වශයෙන් ගණිති.

වෙල්ලන්ගිරිය කොළ-පොතු හා මුල් තෙල් වර්ග සෑදීමට කැඩුම්-බිඳුම් වෙදකමේ බෙහෙත් වලට හා සජී විෂට ත්, අවශ්‍ය වේ. අල්ප මූත්‍ර වහනය සිදු වූ විට එය වැඩි කොට මූත්‍ර පිරිසිදු කිරීම සඳහා ත්, ගවයින්ගේ ලේ සහිත මූත්‍ර යාම සඳහා ත් මේ වර්ගයේ සාරය යොදති.

මේ පඳුරුවල සෑදෙන වැල්දෙහි පමණ ලොකු ගෙඩි ඉදුන විට තද දුගඳක් නික්මෙ යි. මේ ගෙඩි ඉදී කුණු වූ විට ඒ ගෙඩි තුළින් ඇහැ ටුල්ලන් උපදින බව වෘද්ධයෝ කියති.

වෙල්ලනාර-අන්දර
වෙල්ලහ-මල්ර්තණ
වෙල්ලප්පරිත්ති-මස්බැද්ද
වෙල්ලප්පාතිරි-හෙළ පළොල්
වෙල්ලප්පාසානම්-සුදු පාසානම්
වෙල්ලප්පුවත්පල-කෙළ්දසාල්
වෙල්ලරි-කැකිරි
වෙල්ලරැක්කු-හෙළ වරා
වෙල්ලාපාමාගී- සුදු කරල්සැබෝ
වෙල්ලි-රිදී
වෙල්ලිකා-දියමිත්ත
වෙල්ලිප්පරිත්ති-මැඩහඳු
වෙල්ලියම්-සුදු තුඹ
වෙල්ලෙසිවසවිපු-එළ වදකසාඅල
වෙල්ලොත්තිරං- හෙළ ලොත්, ලුණුවරණ, පළිහු
වෙල්නැල්පිටි-වෙල්හැල්සාලේ පිටි
වෙලං-වෙලඟ ගස
වෙල-ලප්නාරං
වෙලඟ-වෙලන් ගස, (ලේවැරිල්ල කොළ වැනි කොළ ඇති ඍජුව වැවෙන විශාල ගසකි. මේ කොළවල යටි පැත්ත සහ ගෙඩි ත් කුඩු පාටින් (ලා රත් පැහැයෙන්) යුක්ත ය. කුඩු වෙළඟ ගැණ 119 පිටේ ලියා ඇති ඕස්තර ය බලන්න
වෙලවෘත-හෙළහිඹුරු
වෙලුප්පු-සුදු ලුණු (සුවස ලුණු)
වෙලුරියම්-වෙරළුමිණ්
වෙලෙප්-හැමගස්
වෙෂ්ටක-සිරිවටු, ඉඹුල්ලාටු
වෙෂ්ටසාර-සිරිවටු
වෙෂණ-කොත්තමල්ලි

වේගා-කුරවිය
වේණු-උණගස
වේජය-තිවිහ
වේතුංපේ-අනෝදා ගඟ
වේද-රසදිය
වේදනී-වමී රෝගයක්
වේපටි--ඉරිවේරිය
වේපතු-වාත රෝගයක්(වෙව්ලීම)
වේබිජු-වේවැල් ඇටය
වේර්කොබු-සිඳඹිහුරු

වෛ වෝ ව්‍ය

වේරි-ජල
වේරු-මුල්
වේලාවගීතුණ-සුදුමල් වේලා, ලා රත්මල් වේලා, රත්වන් පාට මල් (රත්මානිස්ස) වේලා ය යි වගී තුනකි. මෙයින් මල් සුදු සහ රත්වන් මල් ඇති දෙව ගය පමණක් ඖෂධ සඳහා ගනිති.
වේලිප්පරිත්ති-මැඩහඳු, සුදුඊයම්
වේළු-උණගස
වේවැල්-චේත්‍ර ලතා= (මාවේවැල්, තම්බවුවැල්, (තුඩරුණ) ඇල වේවැල්, කුකුළු (කුඩා) වේ වැල් ය යි වේවැල් සතර වගී යකි)

වෛකඞ්කත-උගුරැස්ස
වෛකුණ්ට-අඳුතලා, ගැටතුඹ
වෛගන්ධ-ගෙන්දගම්
වෛජයන්ත-මිදි ගස
වෛජයන්ති-ඇටිකොසෙල්
වෛජයන්තිකා- සීත් මිදි ගස, තිවිඟ
වෛඩූර්‍යයී-වෙරළුම්ණි
වෛතස-ඇඹුල්වේ
වෛද්‍ය-වංඇපල, කවෙළු
වෛද්‍යබන්ධු-ඇසළ ගස
වෛද්‍යමාතා-වංඇපල
වෛද්‍යසිංහි-වංඇපල
වෛද්‍ය-කවෙළු
වෛදර්ධකෙශිකා-දූදු
වෛදල-මුං ආදී පියලි
වෛඩූර්‍යයී-වෛරෝඩි
වෛදෙහිකා-බළුදම්
වෛදෙහී-නිප්පිලි,ඇල්කඳඹිලියා, කඳ
වෛනතී-උණකපුරු
වෛරම්-ඊදුරු
වෛරවෘක්ෂ-කුඹුක්
වෛරාජී-මහ ජම්බු
වෛරාන්තක-කුඹුක්
වෛල්ව-බෙලි ගෙඩිය
වෛශ්වානර-හින්දර, බදුල්ල, රත් නිවුල්, කටුකරෝහිණී,
වෛශ්‍රවනවාස-නුගගස
වෛශාඛ-සුළු සාරණ

වොන්කාරං-පුස්කර
වොන්තෙ-වෙඩරු
වොට-ඔටුවන්
වොර-ගෙන්දගම්
වොල-ගෙන්දගම්
වොෂ-ගෙන්දගම්, හොඳ මිරිස්
වොස-ආඩානෝඩා

ව්‍යක්ත ගන්ධා-නිල් කටු කරඹු, හෝපළු
ව්‍යඝ-වඳුරුමැ
ව්‍යඩම්බක-එරඹු ගස
ව්‍යඩම්බර-එල එරඹු ගස
ව්‍යතිවාර-මැණික්වැන්න
ව්‍යථා-බැමිතිරිය, අරළු
ව්‍යථාන්තක-ඇසළ
ව්‍යදිඤාත-වරණගස
ව්‍යවහාරිකඅත්තා-වැලහුණ
ව්‍යවාසි-සකල ශරීරයේ වහා පැතිර යන අබ්, කාසා වැනි විෂ වගී

වෛ්‍යා වු

වෛ්‍යාකොද-වෑකොද
වෛ්‍යාඝ්‍ර-එරඹු, රත්එරඹු, කරඳ
වෛ්‍යාඝ්‍රකර } රත්එරඹු
වෛ්‍යාඝ්‍රතර }
වෛ්‍යාඝ්‍රතල-දිවිපහුරා, පඝුරාතලා, දළුක්
වෛ්‍යාඝ්‍රදනී-බින්තල්
වෛ්‍යාඝ්‍රදල-එරඹු, රත්නිවුල්
වෛ්‍යාඝ්‍රනඛ-දිවිපහුරා, වක්නිය
වෛ්‍යාඝ්‍රපද-කිහිරි
වෛ්‍යාඝ්‍රපර්ණිකා-හෙළ එරඹු
වෛ්‍යාඝ්‍රපාද-උගුරැස්ස
වෛ්‍යාඝ්‍රපාද සමාවෘක්ෂ-උගුරැස්ස
වෛ්‍යාඝ්‍රපුච්ඡි-එරඹු
වෛ්‍යාඝ්‍රබල-රත්එරඹු
වෛ්‍යාඝ්‍රාදනී-ත්‍රාසනාවාළු වැල
වෛ්‍යාඝ්‍රී-බටු, කටුවැල්බටු, වක්නිය
වෛ්‍යාඩවික්-එරඹු
වෛ්‍යාඩම්බක-එරඹු
වෛ්‍යාඩායුධ-දිවිපහුරා, වක්නිය
වෛ්‍යාධායුධ-වක්නිය
වෛ්‍යාධි-කොට්ටන්
වෛ්‍යාධිකොෂ්ටක-කොට්ටන්
වෛ්‍යාධිඝාත-ඇසල
වෛ්‍යාධිනාස-ඇසල
වෛ්‍යාධිහන්තු-බින්තල්
වෛ්‍යාධී-කොට්ටම්, ලෙඩ, උපුල් කොළ
වෛ්‍යාඝ්‍ය-කොට්ටම්
වෛ්‍යාල-රත්නිවුල්, එළ නිවුල්
වෛ්‍යාලගන්ධා-කබෙළු
වෛ්‍යාලජිහ්වා-මඟ වැල්මදට
වෛ්‍යාලදංෂ්ට්‍රා-ගොකටු
වෛ්‍යාලපත්‍රා-කැකිරි
වෛ්‍යාලප්‍රහරණ-වක්නිය
වෛ්‍යාලම්බ-රත් එරඹු
වෛ්‍යාලායුධ-වක්නිය
වෛ්‍යාවායෝ-මෛථුනය

වෛ්‍යාපකුල්‍යා-නිප්පිලි
වෛ්‍යාශ-ඉඟුරා, මිරිස්, නිප්පිලි, සිඳඹුරා, (නිකුළු)

වුක-දියමිත්ත
වුණකා-කළුතලා
වුණකාරක-බදුල්ල
වුණකෘත්-බදුල්ල
වුණස්නී--ලියනඟලා
වුණදවිෂ්-සිරිතේක්කු
වුණහ-එරඹු, රසකිඳ
වුණාශ-ගෙන්දගම්, නුග ගය
වුණෙජිතා-අමුක්කරා
වුධන-මූල
වුනී-රුක් මල
වුෂණ්‍යා-මීනුග
වුෂගද-රන්වන් වේලා, (රම්මා නිස්ස)
වුෂබ-ඔසබිය, ගොන් කැකිරි
වුෂඹ-ගොන් කැකිරි
වුෂඹල-විලිකුන් සියඹලා
වුසාවජිෂ-එඩරා

ව්‍රීඩා-හොර ගස
ව්‍රීහිකාඤ්චන-ත්‍රාසනාවාළු
ව්‍රීහි-වී

ශ

ශංවර-චතුර, කඟ
ශංවරී-මීනුග, ම කු ණු වැ න් න, සෘතාචාරිය
ශකෘත්-අසූචි, මල
ශකෘදාවාර-මල ද්වාරය, අපානසථානය
ශක්තව-අන්සුණු
ශක්තාය-කටුකරඹු
ශක්තිඛණ්ඩ-නිදිකුම්බා
ශක්තිපත්‍ර-නිදිකුම්බා
ශක්තිපණී-රුක් අත්තන
ශක්තී පණීව-නිදිකුම්බා
ශක්තු-බැදි හාල් ආදී සුණු, අත් සුණු
ශක්තු ඵල-ලෝලු, සැම ගස
ශක්තු ඵල (ලී)-සැම ගස
ශක්‍ර-සොලින්ද ගස
ශක්‍රදාරු-දේවදාර
ශක්‍රද්‍රැම-දේවදාර
ශක්‍රපයීාය-කෙළිඳ
ශක්‍රපාදක-කෙළිඳ
ශක්‍රපාදප-කෙළින්ද ගස, දේවදාර
ශක්‍රපුෂ්ප-මලිත ගස
ශක්‍ර පුෂ්පී-නීවුල් ගස, ලියනගලා
ශක්‍රභූ භවා-කැකිරි
ශක්‍රභූ රුහ-කෙළින්ද
ශක්‍ර ලොධ්‍ර-සඹර ලොත්
ශක්‍රවර්ණී-කළුතලා
ශක්‍රවල්ලී-කැකිරි වැල
ශක්‍ර වීජ-කෙළින්ද ඇට
ශක්‍ර වෘක්ෂ-කෙළින්ද ගස
ශක්‍ර ශාඛින්-කෙළින්ද ගස
ශක්‍රසුධා-පාලංගා
ශක්‍රසෘෂ්ටා-අරළු
ශක්‍රාශන-කන්සා, කෙළින්ද ගස,
ශක්‍රාහ්වය-කෙළින්ද
ශක්‍රාහ්වා-කෙළින්ද
ශකල-පොතු, කුරුඳු පොතු
ශකලින්-මත්ස්‍යයා
ශකාදන-කෙළිඳ
ශකුලාක්ෂී-එල ඊතණ, ගඩඊතණ
ශකුලාදනී-ජටාමාංශ, දියතිප්පිලි, කව්ඵල
ශඞ්කත-හිඟුරුපියලි
ශඞ්කරාවාස-කපුරු
ශඞ්කරාහ්වය-සැමගස
ශඞ්කිණීකා-හරංකසා
ශඞ්කු-ලිඟුව, වක්නිය, අඞ්ගව
ශඞ්කුතරු-සල් ගස
ශඞ්කුඵල-සැමගස
ශඞ්කුලා-පුවක් කපන ගිරේ, මහ නෙල් කොළ
ශඞ්ඛ-සඤ, වැල්දෙහි, ඇන්සැටිය, සුදු පාෂාණම්
ශඞ්ඛ කුසුම-අඬනහිරියා
ශඞ්ඛද්‍රාවින්-ඇඹුල් වේ
ශඞ්ඛනඛ-කුඩා සඤ, සක්නැඹ
ශඞ්ඛනාභී-සක් නැඹ = සක් බෙලි කටුවෙහි නැඹ (මෑද පෙදෙස= මැද පුරැක) මේ වෙනුවට සම් පූණී සක් බෙලි කටුව ම ගන්නා නමුත් එය හරි නැත)
ශඞ්ඛනාම්නී-හඬන හිරියා
ශඞ්ඛපුෂ්පී-සක් මල් (ස ක් ම ල් ගැණ ඉදිරියෙහි ලියා ඇති ඡායාරූප සහිත විස්තරය බලන්න)
ශඞ්ඛවාත-ශීඝ්‍ර රෝගයක්.
ශඞ්ඛාහ්වා-අඬනහිරියා, වැල්දෙහි, ඇන්සැටිය
ශඞ්ඛිනී- කටුකරෝහිණී, යක්බේරිය, අඬනහිරියා, සක්මල්, වැල් දෙහි, සුදු ඇඹුලැඹිලිය

ශඛිනී ඵල-ඉරා ගස
ශඛිනී වාස-ගැට තෙටුල්
ශඛ්බී-වක්නිය
ශට-කාඩි, මූතමල් ගස, අත්තන
ශටී-ඇඹුලැඹිලිය, නිහුරු පියලි
ශඨ-අත්තන
ශඨ්ද්‍රැම-කුඹුක්
ශඩ-සමූහය, ලෙඩ
ශණකණටකා-යක්බේරිය
ශණපත්‍ර-සුදු නෙළුම්
ශණපුෂ්පි-යක්බේරිය
ශණවණ්ටිකා-යක් බේරිය
ශණා-හණ
ශණාලූකා-ඇසල ගස
ශණිකා-හණ මල්
ශතග්‍රන්ථි-ඊතණ
ශතඤ්නී ඇන්සැටිය, කරඳ
ශතදන්තිකා- මහගොන් කැකිරි
ශතපත්‍ර-සුදු නෙළුම්
ශතපත්‍රිකා- ශතපුෂ්ප, සාතාවරිය, මාදුරු, (මහ දුරු)
ශතපත්‍රී-සතපුෂ්ප, සාතාවාරිය
ශතපද්ම-හෙළ නෙළුම්
ශතපදී-සාතාවාරිය
ශතපර්ණී-උන ගස
ශතපර්ණී-වදකහ, ඊතණ, කටු කරෝහිණී, උණගස
ශතපර්ණී-හෙළ වද
ශතපර්විකා-ඊතණ, වදකසා
ශතපුෂ්-සාතාවාරිය
ශතපාදිකා-කවෙලු
ශතපුෂ්පක-රත් කණේරු
ශතපුෂ්පා-සතකුප්ප
ශතප්‍රසූතා-ශතපුෂ්ප
ශතප්‍රාස-අලරිය (කණේරු)
ශතඝීරු-සීනිද්ද
ශතමූල-සාතාවාරිය
ශතමූලි-ඊතණ, සාතාවාරිය

ශත පුෂ්ප — සත කුප්ප



ශත පුෂ්ප — ශත ප්‍රසූතා

Peucedanum Graveolens

ගස පුරා ම සිය ගණන් පුබුදු වූ මල් වලින් පිරී වැසී යන මහ දුරු ගස වැනී මේ පැලෑටියට දෙමළෙන් කියන **සතකුප්ප** යන නාමය ම සිංහල යන් අතර ද වැඩි වසයෙන් ව්‍යවහාර වේ. මෙය ව්‍යඤ්ජන රසවත් කිරීමට කුළු බඩු වශයෙන් හා ඖෂධ වශයෙනුත් ඉන්දියාවේ යොදන නමුත් ලඬකාවේ වැඩි වශයෙන් යොදන්නේ ඖෂධයක් වශයෙන් පමණකි.

මේ වගීය සූතිකා රුධිරය හා සූතිකා වේදනාව පහ කිරීමට ත්, දරුවන් ලැබීමෙන් පසු මහත් වන ගර්භ කොෂය පිඬු කිරීම (හැකිලීම) ට ත් ඖෂධයක් වශයෙන් පාවිච්චි කරති,

ශතවීර්‍යා

ශතවීර්‍යා-එළ ඊතණ
ශතවෙධින්-ඇඹුල්වේ
ශතවෙධි-ඇඹුල්වේ
ශතවේ‍යෂ-සතපුෂ්ප
ශතසහශ්‍රාංසී-මොර ගස
ශතසුතා-සාතාවාරිය
ශතා-සතපුෂ්ප
ශතාක්ෂී-ඊතණ, සතපුෂ්ප
ශතාඞග-කෝන් ගස
ශතාවරී-සාතාවාරිය
ශතාහ්වා-සතපුෂ්ප, සාතාවාරිය
ශතෙකා-ඇම්බරැල්ල
ශතකාවලී- ගජ නිප්පිලි, සිවිය කරල්
ශතපර්ණී-බෙරැ
ශපර්විකා-හෙළ ඊතණ
ශපූ-ගවාදීන්ගේ කුරය, සක්නැඹ, ගස මුල
ශබ්දබොධන-යක්බේරිය
ශබ්දිකා-යක්බේරිය
ශම්පාක-ඇසල
ශම්බර-රත් නිවුල්, ලොන්, කුඹුක්
ශම්බරකන්‍ද-බින්තල් අල
ශම්බරී- මකුණුවැන්න, මී හූ ග, භාතාවාරිය
ශම්බා-දියමින්ත
ශම්බුකා-බෙල්ලෝ
ශම්භු-කොඛලීල
ශම්භුප්‍රියා-නෙල්ලි, ඊතණ
ශම්භුවල්ලභ-නෙළුම් මල
ශම්වර-වතුර
ශම්වරී-මීනුග
ශම්‍යා-ඊතණ
ශම්‍යාක-ඇසළ
ශමී-සැමගස, ලෝලු
ශමීගර්භ-ගින්න

ශශාඞක ලෙඛා

ශමීධාන්‍ය- තෝර, මෑ, මුං ආදී ධාන්‍ය
ශමීපත්‍රී-නිදිකුම්බා
ශමීර-වාතය, කටුවැල්බටු
ශමීසිකා-සියඹලා
ශර්කරක-මිහිරි පැණිදෙඩම්
ශර්කර ජා-ගල් කණ්ඩු
ශර්කරා-සීනි
ශර්වරී-රාත්‍රිය, කහ
ශර්ජ-සල් ගස, හල් දුම්මල
ශර්පාක්ෂී-දන්කැටියා ගස
ශර-බට ගස, යකඩ
ශරට-වතුක්
ශරණී-ආපසුමදු
ශරත්පද්මී-හෙළ නෙළුම්
ශරත්පුෂ්පී-බඳුවද
ශරදූ-මහ ඉරමුසු
ශරපුඛා-පිල ගස
ශරල-හොර ගස
ශරාව-නැඹිලිය, පැස, බඳුන
ශල්ක-ගස, පොතු
ශල්මලී-ඉඹුල්, කටුඉඹුල් ගස
ශල්ලක-තොටිල
ශල්ලකද්‍රව-තුරුක් තෙල්
ශල්ලකී-ඉන්සළු ගස
ශල්‍ය-කිහිරි, කුකුරුමාන්, බෙලි
ශල්‍යක-කුකුරුමාන්
ශල්‍යපර්ණී-මේවන්
ශල්‍යාක-කුකුරුමාන්
ශලාකා-කුකුරුමාන්
ශලාටු-බෙලි ගස, අමු ගෙඩි
ශලිල-වතුර
ශශධර-කපුරු
ශශභෘද්-කපුරු
ශශල්‍ය-කුකුරුමාන්
ශශශිම්බිකා-බුලත්
ශශාඞක-කපුරු
ශශාඞක ලෙඛා-බෝදි ඇට

ශා

ශශි-කපුරු
ශශිකාන්ත-චන්ද්‍රකාන්ත
ශශින්-කපුරු
ශශිපර්ණි-පුවඟු
ශශිප්‍රභා-රත්මහනෙල්, සුදුනෙළුම්
ශශිප්‍රිය- රත් මහනෙල්, නිල් මහ නෙල්, ඇඹුල
ශශිලෙඛා-රසකිඳ, බෝදි ඇට
ශශිවාටිකා-සාරණ
ශශිවාලක-කපුරු
ශශ්‍ය සංවරණ-මුරුඟ ගස
ශශ්‍ය සම්බර-ලෝලු, සල් ගස
ශශ්‍යාරු-සුළු සැමගස
ශෂ්ටික-වී,(ධාන්‍ය)
ශස්ත්‍ර-වානේ
ශස්ත්‍රක-යකඩ
ශස්ත්‍රකොෂතරු-මහකුකුරුමුවන්
ශස්ත්‍රවෘක්ෂ-වැලඟුණ
ශස්ත්‍රහස්ත-සල්ගස
ශස්ථ-ලාතණකොළ
ශඟශ්‍රවෙල්ලි-පෙරැම්කායම්
ශඟශ්‍රවේධින්-පෙරැම්කායම්

ශාක්‍ය-කටුකරඹු
ශාක-කොළ මල් ආදි වෘක්ෂප්‍රභෙද, අතු, අරළගස, මාරාගස
ශාකචුක්‍රිකා-සියඹලා
ශාකජ-මහරි
ශාකජඵල-සාදික්කා
ශාකට-ලෝලුගස, දූවගස
ශාකපත්‍ර-මුරුංගා
ශාකබාලෙය-රසකිඳවැල
ශාකයොග්‍ය-කොත්තමල්ලි
ශාකරාජ-කුරතම්පලා
ශාකවාස්තුක-නිල්තම්පලා
ශාකවිල්ව-බටුගය
ශාකවීර-කුරතම්පලා
ශාකශ්‍රේෂ්ඨ- කුරතම්පලා, කිරිපලා, බටු
ශාකා-අරළු
ශාකාඩග-මිරිස්
ශාකාම්ල-සියඹලා
ශාකාම්ලභෙදන-සියඹලා
ශාකාවලාවු-ලබු ප්‍රභෙද
ශාකිණී-කුරතම්පලා
ශාඛ-වැල, අතු
ශාඛමාරා-කිරිපලා
ශාඛවරා-කිරිපලා
ශාඛවෘක්ෂ-ලුණුවරණ
ශාඛවෘක්ෂක-සල්ගස
ශාඛශ්‍රේෂ්ඨ-කිරිපලා
ශාඛාකර්ණ්ඨ-දළුක්, සීනුක්
ශාඛාඩඹපුෂ්ප-මාරාගස
ශාඛාම්ලා-සියඹලා
ශාඛාල-වේවැල
ශාඛාශිඵා-අතුවල මුල්
ශාඛිණී-කුරතම්පලා, අලකිරිය
ශාඛින්-ගස
ශාඛී-ගස, කුඩාගස
ශාඛොට-ගැටිනිවුල්
ශාඩහුෂ්ටා-ඵනිඳ,(ඔලිඳ)
ශාටක-වස්ත්‍රය
ශාණඩවලපර්ණී-පොණඩරු
ශාණඩිල්‍ය-බෙලිගස, අත්තන
ශාතකුම්භ-රත්රන්, අත්තන
ශාතකෞම්භ-කණේරු, රත්රන්, අත්තන
ශාතන-තුනීකිරීම, විනාශය
ශාතඝීරු-ඉද්ද විශෙෂයක්
ශාතලා-බැම්මිරිය
ශාද්වලා-ඊතණ, එළ ඊතණ
ශාද-මඩ, බැලතණ

ශි

ශානී-කැකිරි
ශාම්බූක-සක්
ශාම්වලීපත්‍රක-රැක්අත්තන
ශාමර-ලොත්, වඳුරු මෑ
ශාමල-බෝගස, බෙලි
ශාමවාස්තුක-නිල්තම්පලා
ශාර්කර-සීනි,කිරෙන් නැගි පෙණ
ශාර්ඛ-අමුඉහුරු
ශාර්ඛශ්ටා-හඟුළු, තැල්වැල්
ශාර-කපුරු පැහැය
ශාරඛ-කැඳැත්තා මුවා, ඇතා, මීමැස්සා, මොණරා
ශාරද-සුදු පියුම්, උක්ගස, මූනමල් ගස, රන්වන් මුං
ශාරදූ-ඉරමුසු, ලුණුවිල
ශාරදික-සරත් කාලයෙහි හටගන්නා රෝගය
ශාරදින්- රැක්අත්තන, ලුණුවිල
ශාරදී- ලියනහලා, රැක්අත්තන
ශාරිබා-හිරමුසු
ශාරිබාදිගණය- හිරමුසු, පද්මක, සුවඳහොට, මීපුප්, හෙළ-රත් හඳුන් දෙවර්ගය, ඇද්දෙමට, වැල්මී යන මේ ශාරිබාදි ගණය රත් පිත්, පිපාසා, නියුණු පිත් උණ, වමනය හා මහත් දැවිල්ල දැ නසන්නේ ය.
ශාරිවා-ඉරමුසු
ශාල්මලි-ඉඹුල් ගස
ශාල්මලික-ඉඹුල්
ශාල්මලීරස-ඉඹුල්ලාටු
ශාල්මලීවෙෂ්ට-ඉඹුල්ලාටු
ශාල-සල්ගස, ගස, මීඅඹ ගස
ශාලජ-දුම්මල, (හල්දුම්මල)
ශාලඤ්ච-මුගුණුවැන්න
ශාලද්‍රුම-සල්ගස
ශාලනියාඃස-දුම්මල (හල්දුම්මල)
ශාලපර්ණී- සල්වැන්න, (සල් වැන්න ගැණ ඉදිරියෙහි ලියා ඇති ඡායාරූප සහිත විස්තරය බලන්න)
ශාලවෙෂ්ට-දුම්මල
ශාලසාර-පෙරැත්කායම්
ශාලාටු-බෙලි
ශාලානී-කිරිබදු
ශාලාව-ලොත්
ශාලාවෘක-බල්ලා, සිවලා, බළලා මුවා, වඳුරා
ශාලි-සැට දැ, හැල් ආදී ධාන්‍ය
ශාලිකඃ-කිරිබදු, ශාලිපර්ණී
ශාලිනී-ශාලිපර්ණී
ශාලී-ඇල්වී, උළුවා, කළුදුරු
ශාලීන-නෙළඔල, උළුවා
ශාලූ-නෙළඔල, කසට ද්‍රව්‍යය, හිඟුරුපියලි
ශාලූක- නෙළඔල, රතැඹුල මුල්, සාදික්කා
ශාලෙය-ශතපුෂ්ප, පැපිලිය
ශාවර-ලොත්, හෙළ ලොත්
ශාවරී-වඳුරු මෑ, ලොත් සුඹුළු

ශිංශපා-ඇට්ටේරිය ගස
ශික්තක-මී ඉටි
ශික්ථ-මී ඉටි, මී වද
ශිඛ(ඛා)ණ්ඩ-මොණර පිල්, මිණිරන්
ශිඛණ්ඩිකා-ඔලිඳ, බෝලිඳ
ශිඛණ්ඩින්-හුනිඳ, බෝලිඳ
ශිඛර-මුදුන, කරාබුනැව්, කුන්දුරුක්කාන්
ශිබිරිකා-පිළිල

ශිඛරින්-පිළිල,සැබෝ, කුන්දුරුක් කත්, යව, තල, ගෙන්දගම්, සීනිද්ද
ශිඛරී-මීතුග, දේවදාලි, සැබෝ
ශිඛාග්‍ර-හිස් මුදුන
ශිඛානන්ද-රතුලූනු
ශිඛාමූල-රතුලූනු
ශිඛාලූ- මොණරකුඩුම්බිය, (දුටු සතුටු)
ශිඛාවත්-රත්නිටුල් ගස
ශිඛාවර-කොස් ගස
ශිඛාවල-මොණරකුඩුම්බිය
ශිඛාවාන්-හෙළ නිටුල්
ශිඛී-හෙළ නිටුල්
ශිඛීන්-උළුවා, රත්නිටුල්, මොණර කුඩුම්බිය, එලුලොම්
ශිඛිකණ්ඨ-මයුරතුතු, පල්මානික්කම්
ශිඛිග්‍රීව-මයුරතුතු
ශිඛිප්‍රිය-සීන්ඩෙබර
ශිඛිමණ්ඩල-ලුණුවරණ
ශිඛිමන්ථ-කිණිහිරි
ශිඛිමොදා-අසමොදගම්
ශිඛිවර්ධක-කොමඩු පුසුල්
ශිග්‍රු-මුරුංගා
ශිග්‍රුක-රත්මුරුංගා
ශිග්‍රුක-රතු මුරුංගා
ශිඞ්ඝාණ-ලෝකඩ පාත්‍රය, ශ්ලේෂ්මාව, යකඩමල, හොටු
ශිත්කා-සීනි
ශිත-රත්මහනෙල්,ගල්මද, තකුල්
ශිතල-කැකිරි
ශිතශූක-යව
ශිතා- කටුවැල්බටු, අතිවුඩයන්, උණකපුරු
ශිතාක-සීනි
ශිතානත-බෙලි
ශිතාභ්‍ර-කපුරු
ශිතාර්ජක-අඳුහලා
ශිතිසාරක-තිඹිරි
ශිතොපල-සීනි
ශිනි-කරගස, බුජපත්
ශිඵ-ගස්වල ජටා වැනි මුල්
ශිඵාක-නෙළුම් මුල්
ශිඵාකන්ද-නෙළුම් මුල්
ශිඵාරුහ-නුග ගස
ශිම්‍යා-මුංවැන්න
ශිම්බිපර්ණී-මුංවැන්න
ශිම්බීජ-කොල්ලු
ශිර-තිප්පිලි මුල්, ඉස්මුදුන, හෙළ බටු
ශිරඃකපාල-ඉස්කබල
ශිරඃකම්ප-ඉස වෙව්ලීම
ශිරඃඵල-පොල්ගස
ශිරඃශූල-ඉස රදය
ශිරා-නහර
ශිරාපත්‍ර-කිතුල් ගස
ශිරාල-කාමරංගා
ශිරාවෘත්ත-රීයම්
ශිරීෂ-මාරාගස, මහරිගස
ශිරීෂකා-සියඹලා
ශිරොධරා-ග්‍රීවය, බෙල්ල
ශිරෝර්ථි-ඉසේ වේදනාව
ශිරොවෘත්ත-මිරිස්
ශිරොවෘත්තාඵල-රතුසැබෝ
ශිරොසන්ධි-ඉසේ ඇටය
ශිලා- ගල්සෙවෙල්, රත්හිරියල්, ගල්මද, මිනෝශිල
ශිලාකර්ණී-වැලඟුණ, ගලලකී, එන්සලු
ශිලාජ-ගල්මද
ශිලාජතු- ගල්සෙවෙල්, උපධාතු වෙසෙසක්වූ මේවා ගල්වල ඇට ගණී)
ශිලාත්මජ-යකඩ

ශී

ශිලාදද්‍රු-ගල්සෙවෙල්
ශිලාධාතු-සුදුගල් (තිරිවානා), කසාවත් සිවංගුරු
ශිලාපනා-කොල්ලු
ශිලාපුෂ්ප-ගල්සෙවෙල්
ශිලාභිද්-පොල්පලා
ශිලාභිස්‍යන්ද-ගල්මද, ගල්සෙවෙල්
ශිලාභෙද-පොල්පලා, අක්කාපාන
ශිලාව්‍යාධි-ගල්සෙවෙල්
ශිලාසන-ගල්සෙවෙල්
ශිලාසාර-යකඩ, (ලොහ)
ශිලාහ්වය- ගල්මද, ගල්සෙවෙල් හෝ ගල්නහර
ශිලින්ධ්‍ර-කෙසෙල් මල
ශිලීපද-බරපා (බරවා) රෝගය (ශ්ලීපද)
ශිලෝද්භව-ගල්මද, ගල්සෙවෙල්
ශිව-නෙල්ලි, බෙලි, ගුගුල්, රසදිය, මිණිරත්, අගිල්, වතුර, සවින්දව, මුහුදු ලුණු, සුදුපුස්කර, කළුඅත්තන, පිටවක්කා
ශිවද්විෂ්ටා-වැටකේ
ශිවදාරු-දේවදාර, රසකිද
ශිවද්‍රුම-බෙලිගස
ශිවධාතු-රසදිය
ශිවපුෂ්ප-ඉඳුවද, වද
ශිවප්‍රිය-ගුගුල්, අත්තන
ශිවමල්ලක-කුඹුක්
ශිවමල්ලිකා-මූනමල් : 379 පිටේ ජායාරූප සහිත විස්තරය බලන්න)
ශිවමල්ලී-වකපුෂ්ප, කෝවක්කා
ශිව වල්ලභ-නෙළුම්
ශිවවීජ-රසදිය
ශිවවෙෂ්ට-බෙලි
ශිවශෙඛර-අත්තන, කෝවක්කා
ශිවා-අරළු, නෙල්ලි, සෑමගස, ඊතණ, ගෝරෝචන, පිටවක්කා, ඇත්දෙමට, මකුණුවැන්න, උළුවා, දියමිත්ත, මිණිරත්
ශිවාටිකා-පිණ්ඩාභිඛ්‍ය
ශිවානාලි-පිටවක්කා
ශිවානී-මිදිගස
ශිවාඵලා-සෑමගස
ශිවාලස-රතු තලා
ශිවාස්මෘති-මිදිගස
ශිවී-කරගස
ශිශිර-සඳුන්, සෑවැන්දරා, තවන්-මැදින් දෙමස
ශිශිරා-ඉරමුසු, රුහැණිය

ශීඝ්‍ර, ශීඝ්‍රා } මුරුංගා
ශීඝ්‍රජන්මන්-කරඳ ගස
ශීඝ්‍රාණුකුලක-දැන්න
ශීත-පියාගස, උළුවා, ලෝලු, කපුරු, ඔොමුවහු
ශීතක්ෂාර-සුදුපුෂ්කර
ශීතකර-කපුරු
ශීතකරී-ඊතණ
ශීතකා-සීනි
ශීතකුම්භ-කණේරු
ශීතගන්ධ-සුදු හඳුන්
ශීතගු-කපුරු
ශීතපර්ණී-වරාමල්
ශීතපාකිණී-කවෙලු
ශීතපාකී-සුළුබැවිල, කවෙලු
ශීතපුෂ්ප-මාරා, වරා, ගල්සෙවෙල්
ශීතපුෂ්පී-කරඹ
ශීතපුෂ්පා-කොටිකන්බැවිල
ශීතප්‍රභ-කපුරු

ශ

ශීතප්‍රිය-පැපිලිය
ශීතඵල-දිඹුල්
ශීතබලා- මහවැල්මදට
ශීතභානු-කපුරු
ශීතභීරු-නික, ඉද්ද, සීනිද්ද,වැල් ඉද්ද
ශීතමඤ්ජරී-සේපාලිකා
ශීතමල්ලික-අගිල්
ශීතමූලික-සැවැන්න
ශීතරජ-කපුරු
ශීතරශ්මි-කපුරු
ශීතල-මලයරට සඳුන්, පැපිලිය, කොසඹ
ශීතලක-සුදු උපුල්, නියඳ
ශීතලච්ඡද- සපුගස
ශීතල ජල-මහතෙල්
ශීතලා-සුදුබැවිල, කැකිරි, සඳුන්, සැවැන්න, අස්වැන්න, අන්දර, සපු, කපුරු, ගල්සෙවෙල්
ශීතලාරජ-කපුරු
ශීතලාලය-එළ ජම්බු
ශීතවල්කල-දිඹුල්
ශීත වල්ලභා-දිඹුල්, බලුදම්, පැපිලිය
ශීතවීර්‍යී-පද්මිකාෂ්ඨ
ශීතවීර්‍යීක-පුළිල
ශීතශිව-සමින්දව, උළුවා, කප්පර වල්ලිය, ලෝලු ගස, ශතපුෂ්ප
ශීතසභා- කෝමාරිකා පියා ගස, නිල් නික, යොහොඹු
ශීතා-ඊතණ, මුරුවා, මහ බැවිල
ශීතාංශු-කපුරු
ශීතාඞ්ගී-වලාවැන්න
ශීතානන-බෙලි
ශීතාහ්‍ව-කපුරු
ශීතාර්ජ, ශීතාර්ජක } අඳුනලා
ශීතාවලා-මහ වැල්මදට
ශීතිසාරක-නිඹිරි
ශිණීපත්‍ර- කොසඹ, පච්චිකා ලොත්, කිණිහිරි ගස්
ශිණීපණී-කොසඹ
ශිණීපර්ණී-ඇත්දෙමට, කොසඹ, යොන් තුඹ
ශිණීපුෂ්පී-ශතපුෂ්ප, තුඹ මල්
ශිණීමාලා-පුස්වැන්න
ශිව-ගල්මද
ශිවශිව-සමින්දව ලුණු
ශිෂ, ශිෂක } ඊයම්

ශුක්ක්‍ර-රත්නිවුල්, ගිනි
ශුක්ත-බෙල්ලා, කාඩි
ශුක්ති-සක්නාඹ, මුතු බෙලි කටු, අශීස් රෝගය, වක්නිය, තුරුක් තෙල්, අඩ පලම (කලං හය)
ශුක්තිකා-මුතු බෙල්ලා, ඇඹුලැඹිලිය
ශුක්තිජ-ලුහුනු, මාරා, මුතු
ශුක්තිස්සීල-තුරුක් තෙල්
ශුක්ති හනු-වක්නිය
ශුක්තී-සක්නාඹ, තුරුක් තෙල්, වක්නිය, මුතු, මුතුබෙලි කටු
ශුක්‍ර-ශුක්ල ධාතුව, රත් නිවුල්, ගින්න
ශුක්‍රප්‍රමාතා-සිරිතේක්කු
ශුක්‍රමේහ- ප්‍රමේහ රෝග විශෙෂ යක්
ශුක්‍රලා-ලුනු ගස, මාරා ගස, ඔලිද
ශුක්‍රශුද්ධා-අරළු ගස
ශුක්ල-වරා, එරඬු,කොඳ,වසාවාසි, රිදී, වෙඩරු, ශුක්ල ධාතුව
ශුක්ලක-තුඹතාවාළු, හෙළ ලුහුනු

ශුක්ලකන්ද- අතිවුඩයන්, හෙළ ලුහුනු
ශුක්ලකන්ඩා- අතිවුඩයන්, හෙළ ලුහුනු
ශුක්ලගන්ඩා- අතිවුඩයන්, හෙළ ලුහුනු
ශුක්ලගන්ධිකා-තුඩනවාළු
ශුක්ලදූග්ධා-ඉකිරි
ශුක්ලධාතු-ශුක්ල (ධාතු), එළබටු
ශුක්ලපුෂ්ප- කුකුරුමාන්, ම හ ගොන් සුතු කැකිරි, කොදහස, අරත්ත
ශුක්ලපුෂ්පා-අඩන හිරියා
ශුක්ලපුෂ්පිකා-ලියනහලා
ශුක්ලපෘෂ්ටක-නික ගස
ශුක්ලඵලා-වරා ගස
ශුක්ලමජ්ජී-සුදුදුරු
ශුක්ලලා-ඔලිද
ශුක්ලවචා-හෙළ වද, සුවඳ කසා
ශුක්ලවෘක්ෂ-දූව ගස
ශුක්ලශාල-කොසඹ ගස, තල් ගස
ශුක්ලා- සීනි, කවෙළු, කිරිබදු, දළුක්, වැල් පෙනෙල
ශුක්ලාඩ්‍ගී-සේපාලිකා
ශුක්ලාජා, ශුක්ලාජාජී } සුදුදුරු
ශුක්ලෝපලා-සීනි
ශුක-තොටිල
ශුකවක්ත්‍ර-විශ්ණුක්‍රානති
ශුකතරු-මාරා ගස
ශුකතුණ්ඩ- ඉහුල්, (හිහුල් = සාදිලිඛගම්)
ශුකනාස-දද, තොටිල
ශුකපිණ්ඩී-වදුරු මෑ, (ප්‍රධාන වාජීකරණ ඖෂධයකි)
ශුකපුෂ්ප-මාරා ගස
ශුකප්‍රිය-මාරා ගස,ජම්බු, කොසඹ
ශුකඵල-වරා ගස
ශුකරකාන්තා-බිම්තල්, උඟරල
ශුකරෙෂ්ට-කෙකටිය අල
ශුකල-වරා ගස
ශුකවල්ලභ-දෙළුම් ගස
ශුකශිම්බා-වදුරු මෑ
ශුකසිම්බි-වදුරු මෑ
ශුකාක්‍රීඩා-මහරි, මදටිය
ශුකාදන-දෙළුම්
ශුකාශ-වැල්තුඹ
ශුක්තොදර-තලිස් පතුරු
ශුචි-රත් නිවුල්, ඝකීටක ශ්‍රිංගී
ශුචිද්‍රුම-ඇසටු ගස
ශුචිපර්ණී-හෙළ නෙළුම්
ශුචිපර්ණීක-සුදු නෙළුම්
ශුචි මල්ලිකා-සීනිද්ද
ශුණ්ඨී-සිඹිඟුරු
ශුණ්ඨ්‍යා-සිඹිඟුරු
ශුණ්ඩා-සුරා
ශුද්ධරඡ්ජන-කොබෝලීල ගස
ශුඩ-සවිඳව ලුණු, මිරිස්
ශුද්ධවල්ලී-රසකිඳ
ශුධා-අමෘතය, සුණු
ශුනී-කොමඩු පුසුල්
ශුභ-පද්මකාෂ්ඨ
ශුභද-ඇසටු ගස
ශුභපත්‍රිකා-ශාලිපර්ණී
ශුභ්‍රා- ගෝරෝචන, පුවඟු, උණ කපුරු, සුදු ඊතණ
ශුභ්‍රාඤ්ජන-මුරුංගා
ශුභ්‍ර-රීයම්, ඕනිරන්, රිදී, කසිස්, සඳුන්
ශුභ්‍රකර-කපුරු
ශුම්බා-කටරොලු
ශුරණ-කිඳාරම්
ශුල්බ, ශුල්ල, ශුල්ව } තඹ
ශුල්වාරි-ගෙන්දගම්

ශූ ශෘ

ශූලහෘත්-පෙරැම්කායම්
ශූලිනී-රසතැල්
ශූෂ්කගොමය-ගොම වැරටි
ශූෂ්කඋයොබ්ධිජ-මූදුපෙණ
ශූෂ්ක ඵල-වියලි ගෙඩි
ශූෂ්කල-මස්
ශූෂ්ක ශෘඤ්ඡ-යවගස
ශූෂ්කා-මූදු පෙණ
ශූෂ්කාඞ්ග-යව ගස, ගුරු
ශූෂ්කාද්‍ර-ඉඟුරු
ශූෂ්කාදී-වියලි ඉඟුරු
ශූෂ්මන්-රත්තිවුල්
ශූෂිරා-පබළු

ශූක ක්‍රීඩා-මාරා ගස
ශූකවර්ජද-හරංකහ, විෂ්ණුක්‍රාන්ති
ශූකතරු-මාරා ගස
ශූකතුණ්ඩ-සාදිලිංගම්
ශූකධාන්‍ය-යවාදී ධාන්‍ය
ශූකනාර්ක්ෂ-තොවිල
ශූකපිණ්ඩී-වඳුරු මැ
ශූකපුච්ඡ-ගෙන්දගම්
ශූකපුෂ්ප-විෂ්ණුක්‍රාන්ති, මාරාගස
ශූකප්‍රිය-ජම්බු
ශූකප්‍රියා-දෙළුම්
ශූකර කන්ද-බිම්තල්
ශූකර මර්දව-සූකර මද්දව (උණරු හතු)
ශූකරක්‍රාන්තා, ශූකරී } බිම්තල්
ශූකරෙෂ්ට-කොකටිය අල
ශූකවතී-වඳුරු මැ
ශූකවර්ණී-හරන්කසා
ශූකවල්ලභා-දෙළුම්
ශූකවෘක්ෂ-මාරා ගස
ශූකශිම්බා, ශූකශිම්බී } වඳුරු මැ

ශූකඝ්නාන-වරා ගස
ශූකා-වඳුරු මැ
ශූකාදන-දෙළුම්
ශූකාස-වැල්තුඹ
ශූකාහ්වය-වැල් තුඹ
ශූකොදර-තලිස්පතුරු
ශූද්‍රප්‍රිය-ලුහුනු
ශූද්‍රාතී-පුවහු
ශූන්‍යා-මහ කටුවැල් බටු
ශූර- රත්තෙටුල්, සල්, සල්ගස, මිදෙල්ල ගස
ශූරණ-තොවිල, කිඩාරම්
ශූලගන්ධි-මල් ඊතණ
ශූලඛ්න-කොත්තමල්ලි
ශූලඝාතන-යකඩ බොර
ශූලදර්ප-පෙරැම්කායම්
ශූලනාශන-සුවස ලුණු
ශූලශත්‍රු-එරඹු
ශූලහනනීය-අසමොදා
ශූලහෘත්-පෙරැම්කායම්
ශූලින-මාරා ගස
ශූලිනී-රසතැල්
ශූලොන්ඛා-බෝදි ඇට

ශෘගාලඤ්ජි-ඉකිරි
ශෘගාල ජම්බු-මහ ගොන් කැකිරි
ශෘගාලවින්‍යා, ශෘගාලවෘන්‍යා } පුස්වැන්න
ශෘගාලිකා-කිරිබදු
ශෘඞ්ග-අඟ, ජීවක, කඳුරු ගස
ශෘඞ්ගක-දුරු ගස
ශෘඞ්ගකන්ද-ඉකිරි
ශෘඞ්ගජ-හොර ගස, අගිල්, සඳුන්
ශෘඞ්ගනාම්නී-ඝකීටකශ්‍රිඞ්ගි
ශෘඞ්ගබෙර-අම්බ ඉඟුරු
ශෘඞ්ගමූල-ඉකිරි

ශෙ ශෛ ශො

ශෘඞ්ගමෝහින්-සපු ගස
ශෘඞ්ගලා-මැඩහඳු
ශෘඞ්ගලී-ඉකිරි
ශෘඞ්ගවේර-අම්බු ඉඟුරු
ශෘඞ්ගාට-කිරිබදු
ශෘඞ්ගාටක-ඉකිරි
ශෘඞ්ගාර-කුරුඳු, කළුවැල්, සින්දූරම්
ශෘඞ්ගාරභූෂණ-සින්දූරම්
ශෘඞ්ගාරිත්-පුවක්
ශෘඞ්ගාලවින්නා-පුස්වැන්න
ශෘඞ්ගික-ජීවක
ශෘඞ්ගී- වෘෂභක, කර්කටකශෘංගී, අතිවුඩයන්, ගජතිප්පිලි
ශෘඞ්ගෝවෘෂ්ණ-උගුරැස්ස

ශෙඛර-කරාබුනැටි
ශෙඛරික-ගෝරෝචන, කර්පූර
ශෙපාලිකා-සේපාලිකා
ශෙඵාලිකා-නික ගස, සේපාලිකා ගස
ශෙඵාලී-සේපාලිකා
ශෙලු-ලෝලු ගස
ශෙවල, ශෙවාල } පෙද (දියසෙවෙල්)
ශෙෂඝ්න-නොවිල
ශෙෂසම්භව-නිප්පිලි මුල්

ශෛඛරික, ශෛඛරය } සැබෝ
ශෛහාඞ්ඝ්න-රතුමුරුංගා
ශෛයඤ්ඤික-කටුකරඹු
ශෛයඤ්ඤී-සාදික්කා
ශෛරීයක-කටුකරඹු
ශෛරී-ලියනහලා
ශෛල-ගල්සෙවෙල්
ශෛලක-පෙද
ශෛලගර්භ-සබර, සඳුන්
ශෛලජ- ගල්සෙවෙල්, රසඳුන්, ගජතිප්පිලි
ශෛලනියර්‍යාස-ගල්සෙවෙල්
ශෛලපත්‍ර-බෙලිගස, කප්පරවල්ලිය
ශෛලපර්ණිකා-සින්අරත්ත
ශෛලබීජ-බදුල්ල
ශෛලසාර, ශෛලාජ } ගල්සෙවෙල්
ශෛලාට- බිම්කොසඹ, සුදුපාට ලෝකඩ
ශෛලික, ශෛලූ, ශෛලූක } ලෝලු ගස
ශෛලූෂ-බෙලිගස
ශෛලෙඤ්ජ-කරගස
ශෛලෙය- කප්පරවල්ලිය, ගල්සෙවෙල්, ගල්නහර
ශෛවලත්භවා-නීත්පොල්පලා
ශෛව-පෙද, අත්තන
ශෛවල-පෙද, පොඬරු
ශෛවාල-පෙද, (දියසෙවෙල්)

ශොකනාශ-නෝපළු, අශෝක
ශොකහර්තා-හෝපළු, අශෝක
ශොකහාරි-වල් අදුනලා
ශොකා-කටුකරඹු
ශොකාරී-බක්මී, කොළොම්
ශොචිෂ්කෙශ- හින්න, රත්නිවුල්
ශොණ-වරා, සින්දූරම්, ලේ, රත් උක්. රත්නිවුල්, නොවිල
ශොණක-නොවිල
ශොණක්ඛිණ්ටිකා- රත් කටුකරඹු
ශොණක්ඛිණ්ටී-කටුවැල්බටු

ශෞ ශ්‍යා

ශොණනාධිෂ-ජයපාල ගස
ශොණපත්‍ර-රතුසාරණ
ශොණ පුෂ්පක-කොබෝලීල
ශොණ පුෂ්පී-එරබදු ගස
ශොණඵලිනී-තැල්වැල්
ශොණාක-තොටිල
ශොණාලු-ඇසළ
ශොණිත-ලේ, හුරිර
ශොණිත චන්දන-රත්හඳුන්
ශොණීඵල-මැණික
ශොඵක්නී-ශාලිපර්ණී
ශොධන-බුලත්, බෙරැ, කොසඹ, කුරුඳු
ශොධනාධිප-ජයපාල
ශොඵ-ඉදිමුම
ශොඵකාරක-බදුල්ල ගස
ශොඵඝ්න-යක්බේරිය
ශොඵක්නී-සාරණ, මේවන්, අස්වැන්න
ශොඵජිත්-සාරණ
ශොඵජීත්ව-සාරණ
ශොඵනාශන- බෙරැ, යක්බේරිය
ශොඵහෘත්-බදුල්ල ගස
ශොභන-නෙළුම්
ශොභනක-මුරැංගා
ශොභනා-කභ, ගෝරෝචන
ශොභාඤ්ජන-මුරැංගා, රත්මුරැංගා
ශොමරාජ- බෝදිඇට, කපුරැවිල
ශොමරාජී-බෝදිඇට, (සන්නිනායන්)
ශොමලතා-බෝදි ඇට, මුවකීරිය
ශොමවල්කල-එළකිහිරි,බෝදිඇට
ශොමවල්ලි-මුවකීරිය
ශොමවෘක්ෂ-මාරාගස, මදටගස
ශොෂණ-රස අනුභව කිරීම
ශොෂසම්භව-නිප්පිලි මුල්

ශෞක්තිකෙය-මුතු
ශෞකරී-බින්තල්
ශෞඛ්‍යා-රසකිඳ
ශෞගන්ධික-ගෙන්දගම්
ශෞණ්ඩ-රත්හඳුන්
ශෞණ්ඩී-ගජනිප්පිලි

ශ්මශාන-සොහොන
ශ්මශෘ-රැවුල

ශ්‍යන්දන-කෝන්ගස
ශ්‍යන්දනී-කෙල

ශ්‍යාම-අත්තන, නුග, මිරිස්, හිරිතිල්ල, කුඹුක්, ඉහිනිඇට,බොඩ අමු, තණ, සවිඳුව ලූණු
ශ්‍යාමකන්දු-අනිවුඩයන්
ශ්‍යාමකණ්ඩා-ගඩර්තණ
ශ්‍යාමකාරක-කිහිරි
ශ්‍යාමඛණ්ඩා-අනිවිඩයන්
ශ්‍යාමග්‍රන්ථි-ගඩර්තණ
ශ්‍යාමදර්භ-ඉළුක්
ශ්‍යාමපත්‍ර-කොල්ලම් කොළ
ශ්‍යාමභව-දේවදාර
ශ්‍යාමභූෂණ-මිරිස්
ශ්‍යාමල-කලුතිප්පිලි, පුළිල, මඟ කපු, ජම්බු, කස්තුරි, අමුක්කරා
ශ්‍යාමලවූඩා-ඔලිඳ
ශ්‍යාමලතු-කළු හිරමුසු
ශ්‍යාමලිකා-බෙරැ (තෘණ විශෙෂයකි)
ශ්‍යාමවර්ණ-මාරාගස

ශ ශ්‍රා ශ්‍රි ශ්‍රී

ශ්‍යාමා–මේවන්, රසකිඳ, කස්තුරි, බෙරු, ඉන්සලු, ඉරමුසු, ගුගුල්, බෝදිඇට, පිළිල, කළුත්‍රස්ත වාලු, වැල්පෙනෙල, නිල්සාරණ, නිප්පිලි, කඟ, නිල්තලා, නෙළුම් ඇට, ඇවිටර, කිරිදි, ත්‍රස්ත වාලු, පුවඟු, නිල්ඊතණ, නුග කොළ, මකුලුවැන්න

ශ්‍යාමාදිගණය–පෝටා, දැත්ත, මී නුග, සීනුක්, තිරස්තවාළු, රස කිඳ, දැසමන් හෝ දැමිතිරිය, වැල්දෙණ, එළකටරොළු, ඇසළු, නෙලකිරිය, කුඩුවෙළඟ, කරඳ, රත්කිරිගොකටු යන මේ ශ්‍යාමා දි ගණය තෙම උදුවහී–උදර–බඛපිපිම්–විෂ–ගුල්ම යන මේ රෝග නසන්නේ ය.

ශ්‍යාමාක–බොඩහමු

ශ්‍යාව–ඇසළ

ශ්‍යෙතඝණ්ටා–දැත්ත

ශ්‍යෙතාණක–නොවිල ගස

ශ්‍රංඝන–පියාගස

ශ්‍රංඝන–පියාගස

ශ්‍රද්ධ–රත්කණේරු

ශ්‍රඛසා–ගිරිතිල්ල

ශ්‍රමනාහ්වය, ශ්‍රමනී } මුඛමහණ, ජටාමාංශ

ශ්‍රව–කණ

ශ්‍රවණ–කණ, දැත්ත ගස

ශ්‍රවනී–නියඳ, ගෙඳ

ශ්‍රවන්දු–සුලුදඬකලන්

ශ්‍රවනා–සියඹලා ගස, දැත්ත ගස

ශ්‍රවනී–මුකුණුවැන්න, ගෙඳ

ශ්‍රවා–මුරුවා

ශ්‍රාණා–යවකැඳ

ශ්‍රාර්ධව නියර්‍යාස–ගුගුල්

ශ්‍රාර්ධවශාක–කරපිංචා ගස

ශ්‍රාවිහෝ–තුන්පත්කුරුඳු

ශ්‍රාවනශීර්ෂක–මුඛමහණ

ශ්‍රාවනී–මිදි ගස, මීනුග, සුලුදඬ කලන්

ශ්‍රිංසී–පියාගස

ශ්‍රිකර–ඉරිවේරිය

ශ්‍රිගාලඝණ්ට–ඉකිරි

ශ්‍රිඝාදචව–අඹ

ශ්‍රිඛඟක–ජීවක

ශ්‍රිඛනිකා–අගිල්, අතිවුඩයන්, කඤ්ච කශ්‍රිංගි

ශ්‍රිඛනිනී–පෙරැම්කායම්

ශ්‍රිඛගිබෙර–අමුණුහුරු, යක්බේරිය

ශ්‍රිඛගිබෙරකමූල–හණගස

ශ්‍රිඛිනී–ජීවක, වෘෂභක, අතිවුඩයන්, කඤ්චකශ්‍රිඛනි, ඇසවු, (නුග)

ශ්‍රිඛිරිකා–කිරිපලා

ශ්‍රී–හඳුන්, බෙලි ගස, කරාබු නැට, කොකුම්

ශ්‍රීකණ්ඨ–සඳුන්

ශ්‍රීකණ්ඨඃ–සඳුන්

ශ්‍රීකඳු–ඊල් ඩෙබර

ශ්‍රීකර– රත් මහතෙල්, නෙලුම් මූරුත, නිල් මහතෙල්, බුලත්, රතුපුල්

ශ්‍රීකරී–හෙළ සැබෝ, බුලත්, ඉරිවේරිය

ශ්‍රීකාත්–සල් ගස

ශ්‍රීඛණ්ඩ–සුදු හඳුන්

ශ්‍රීගෙහ

ශ්‍රීගෙහ-සුදු නෙළුම්
ශ්‍රීතලා-දුම්මැල්ල
ශ්‍රීද්‍රුවය, ශ්‍රීද්‍රැම } බෙලි ගස
ශ්‍රීධර-තලා ගස
ශ්‍රීනිකෙත-රත් මහනෙල්
ශ්‍රීනිර්ගුණ්ඩි-කළුතලා
ශ්‍රීනිවාස-සිරිවටු
ශ්‍රීපණී-නෙළුම්, මිදි, තොවිල
ශ්‍රීපණීණ-නවසාරන්
ශ්‍රීපර්ණිකා-කරබෙඹිය ගස, පුස් වැන්න, ඇත්දෙමට
ශ්‍රීපර්ණී- ඇද්දෙමට, අස්වැන්න, ඉඟුල්, සීන් මිදි, තොවිල
ශ්‍රීපන්ව-කරාබු
ශ්‍රීපුෂ්ප-කරාබුනැට්, නෙළුම්බට්ටා
ශ්‍රී ප්‍රසූතක-කරාබු නැට්
ශ්‍රී ප්‍රිය-සුදු හඳුන්
ශ්‍රී ඵල-නෙල්ලි, ඇද්දෙමට, බෙලි, කිරිපළු, ඉඳි, බේරා
ශ්‍රී ඵලිකක්ඛිණ්ටි, ශ්‍රී ඵලී } බෙරා, අවරිය
ශ්‍රී භද්‍රා-කලාදුරා
ශ්‍රීමත්-කහට්පලු, සිඳුරම්, මදට ගස
ශ්‍රීමති-මුඛමහණ, යොන්තුඹ
ශ්‍රීම්ලා පහා-දුම්කොළ
ශ්‍රී මහා ඵල-බෙලි ගස
ශ්‍රීමාන්- ගුගුල්, මාරා, වෘෂහක, තෙල ගස, සින්දූරම්, කහ
ශ්‍රී ලතා-මහ දූදු වැල
ශ්‍රී වාස-දේවදාර, සිරිවටු, සල් දුම් මල
ශ්‍රී වාසක-ගුගුල්
ශ්‍රී විභූෂණ-සක්
ශ්‍රී විරෝ-වෘෂහක
ශ්‍රී වෘක්ෂ-ඇසටු

ශ්‍රීහස්තිනී

ශ්‍රී වේෂ්ට- සි රි ව ටු = (සරලද්‍රව= වෘක්ෂාධ්‍යක්ෂ)
ශ්‍රී වේෂ්ටක-ගුගුල්
ශ්‍රී සංඥ-බෙලි ගස
ශ්‍රී සාදව්ව-අඹ

ශ්‍රීහස්තිනී—දික්නිඩිය

ශ්‍රී හස්තිනී—ඇන්සොඩ
Heliotropium Indicum

රටල කොළ වලට සමාන කොළ හා ඇන් සොඩක් වැනි දිග කටුවක සුදු පැහැති මල් හට ගන්නා වැඩි වශයෙන් වෙල් වල වැවෙන අඩි එකහමාරක් පමණ උස ඇති පැලෑටියකි. මෙය **ඇන්ඇවිය** නමින් ද ඇතැම් අය හඳුන්වති.

———

ශ්‍රෙ ශ්‍රෝ ශ්ල ශ්ලේ ශ්වේ

ශ්‍රෙණී-ඉදි ගස, දැත්ත
ශ්‍රෙය-රත්කැලැ
ශ්‍රෙෂ්ඨි-අරත්ත, දියමිත්ත, අරළු, ගජනිප්පිලි
ශ්‍රෙෂ්ඨ-ජීවක, අමුකා
ශ්‍රෙෂ්ඨා- තිපල් (අරළු, බුළු, නෙල්ලි)
ශ්‍රෙෂ්ඨාම්ල-සියඹලා
ශ්‍රෙෂ්ඨ-සව්වැඳව ලුණු
ශ්‍රෙෂ්ඨගන්ධ-සඳුන්
ශ්‍රෙෂ්ඨමූලිකා-මැණික් වැන්න
ශ්‍රෙෂ්ඨා-අරළු, තිප්පිලි, මැණික් වැන්න, බැමිතිරිය, සීත්දුමැඩ
ශ්‍රෙෂ්ඨෝදක-හාල් දෙවුන් දිය

ශ්‍රෝණ-පියුම් මිණි
ශ්‍රෝණරකතක-පියුම්රාමිණි

ශ්ලක්ෂ්ණත්වච්-පොල්පලා
ශ්ලීපද-බර පා (බරවා) රොගය
ශ්ලීපදප්‍රභව-අඹ ගස
ශ්ලීපදඋපහා-බුත්සරණ

ශ්ලේෂ්ම-සෙම
ශ්ලේෂ්මක-කිරිපළු ගස
ශ්ලේෂ්මඝ්නා-බෝලිද්ද, වැටකේ, දීදු
ශ්ලේෂ්ම ඵල-ලෝලු ගස
ශ්ලේෂ්මඝ-ඇදේදෙමට
ශ්ලේෂ්මාත
ශ්ලේෂ්මාතක } ලෝලු ගස

ශ්වදංෂ්ට්‍රක
ශ්වදංෂ්ට්‍රා } ගොකටු
ශ්වඵල-දෙළුම් ගස

ශ්වඃපුෂ්ප-ඉදිමුම
ශ්වයෝනි-රැක්අත්තන
ශ්වර්භූ-කොබලීලී
ශ්වසන-කුකුරුමාන්
ශ්වසනෙශ්වර-ඉදි ගස, කුඹුක්
ශ්වාධ්‍රබන්ධා-කිරිපලු
ශ්වාස-කාශ රෝගයක්
ශ්වාසාරි-තෙළම් අල
ශ්වේත්‍ර-සෙවතකුෂ්ට (සුදු කබර)

ශ්වේත-ලුණුවරණ, කවඩි, සඤ්, සුදු මිණිරත්, සුදුදුරු, රිදී
ශ්වේතකණ්ඨකාරි-සුදුකටුවැල්බටු
ශ්වේතකන්දු-අනිවිඩයන්
ශ්වේතකුබේරාක්ෂි-හෙළ පළොල්
ශ්වේතකුම්භී-හෙළ පළොල්
ශ්වේතකුෂ්ඨ-සුදු කබර
ශ්වේත කුසුම-නික ගස
ශ්වේතකෙශ-රත් මුරුංගා
ශ්වේත ගුඤ්ජා-සුදු ඔලිඳ
ශ්වේත ජීරක-සුදුදුරු
ශ්වේතතෛල-සිනිත් එන්සාල්
ශ්වේත දණ්ඩා-එළ ඊතණ
ශ්වේත දුර්වා-සුදු ඊතණ
ශ්වේතධාමන්-කපුරු, මුදුපෙණ
ශ්වේත පණ්ණාස-සුදු තලා
ශ්වේත පාටල-හෙළ පළොල්
ශ්වේත පිණ්ඩිතක - මහ කුකුරුමාන්
ශ්වේත පුෂ්ප- හෙළ නික, සුදු කණේරු, දැත්ත, වැටකොළු, හියඹරා
ශ්වේත පුෂ්පා-සුදු කටරොළු, මහ ගොන් සුතු කැකිරි, කණේරු,
ශ්වේතඵලෙරුහා-හෙළ පළොල්
ශ්වේතභණ්ඩා-සුදු ඊතණ

ශ ස

ශ්වෙතමථ-කිරිමෝරු
ශ්වෙතමන්දූර-යක් එරබදු
ශ්වෙතමරිච- සුදු මිරිස්, වැල් මිරිසුංගා
ශ්වෙත මූලා-මහ සාරණ
ශ්වෙත වචා-අනිවිඩයන්
ශ්වෙත වල්කල-දිඹුල් ගස
ශ්වෙත වාසර-උක් ගස
ශ්වෙත විසා-අනිවිඩයන්
ශ්වෙත වෘක්ෂ-ලුණුවරණ
ශ්වෙතවෘන්තී-හීන් සුදු කටුවැල් බටු
ශ්වෙතවෘන්තිකා-හෙළ බටු
ශ්වෙතශ්‍යාමු-සුදු කටරොලු
ශ්වෙත ශූරණ-වල් කිඳාරම්
ශ්වෙතස්ථාමු-එළ ඊතණ
ශ්වෙතසජී-ලුණුවරණ
ශ්වෙතසර්ජ-හෙළ අබ
ශ්වෙතසාර-එළ කිහිරි
ශ්වෙතසීස-සුදු ඊයම්
ශ්වෙතසුරසා-එළ සේපාලිකා
ශ්වෙතසූරණ-වල් කිඳාරම්
ශ්වෙතා-කවඩි, අඩනහිරියා, අනිවිඩයන්, මුවකිරිය, එළ ඊතණ, එළ කටුවැල් බටු, පොල්පලා, උණකපුරා, සීනි
ශ්වෙතාකී-එළ වරා
ශ්වෙතෙක්ෂූ-එළ උක්
ශ්වෙතෙලා-හීන් එන්සාල්, කර්ද මුංගු

ෂට්කටුක-සිව්ය, රත් නිටුල්, තිප්පිලි මුල්, ඉඟුරු, මිරිස්, තිප්පිලි යන කුළු සය වග
ෂට්කොණ-දියමන්ති
ෂට්ග්‍රන්ථ-මිගුල්කරද, වද
ෂට්ග්‍රන්ථි-තිප්පිලි මුල්, වදකහ
ෂට්ග්‍රන්ධ-කුණු කරද
ෂට්පදී-මීමැස්සෝ, බඹරු
ෂට්පදප්‍රිය-යොන්තුඹ, නාකෙසරු
ෂට්පදු නිපී-අඹ ගස
ෂට්පදුනන්දවර්ධන-හෝපළු ගස
ෂට්පදුලය-දෙඹ ගස
ෂට්පදෙෂට-බක්මී, කොළොම්
ෂට් රස- මිහිරි, ලුණු, තික්ත, කසට, කටුක, ඇඹුල් යන රස සය වගීය
ෂඨක-තුවරලා
ෂඩ්ග්‍රන්ථා- වද කසා, හරංකසා, හිඟුරුපියලි, මහ කරද
ෂඩ්ග්‍රන්ථි-හිඟුරු පියලි, වදකහ, තිප්පිලි මුල්
ෂඩඟ-හීන් ගොකටු පැල
ෂඩාශ්මය-තුන්බෝ අත්තන
ෂඩ්ධර්ණ- ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි, තිප්පිලි මුල්, සිව්ය, රත් නිටුල්
ෂණ්ඩාකී-හිරිතිල්ල
ෂල්ලික්කොඩි-පණම්පෙනි,නිඹුල් වැන්න
ෂෂ්ඨක-තුවරලා
ෂිල්ලික්කාසි-පුස් ඇට
ෂුරතාවරෙසි-සෙනෙහ කොළ
ෂුරෙසි-එරමිණියා
ෂෝන අවරෙසි-වඳුරු මෑ

සංවර්ජිකා-නවසාරම්
සංවර්තක-බුලු ගස
සංවරිණී-වලාවැන්න
සංවිධාය-කසා
සංවිසා-අනිවුඩයන්
සංශිකන්ත දුර්ගන්ධ-මහ උක්

සංස්ථිා-වටැස්ස

සංහතපුෂ්පිකා-උළුවා

සක්-සඞ්ඛ (සක්බෙලි කටු)

සක් ඇට-සක් කටු

සක්කැබලි-සක්බෙලි කටු

සකඛරා-සකුරු

සකඛරා උදක-හකුරු මුසු ජලය

සක්තූරඟ-චරා ගස

සක්නැඹ-සඞ්ඛනාභි, (සක් බෙලි කටුවේ මැද පෙදෙස = මැද පුරුක. මේ වෙනුවට සම්පූර්ණ සක්බෙලි කටුව ම ඖෂධසඳහා ගන්නා නමුත් එය හරි නැත)

සක්පුපල-ඉඟිනි ඇට

සක්මල්



සක්මල්—ශඞ්ඛපුෂ්පි

Canscora Decussata

සක් ගෙඩියක ට සමාන කහ පාට කුඩා මල් හා අඟල් $1 \times \frac{1}{2}$ ක් පමණ දිග - පළල කොළ ඇති දිය සීරාව සහිත තෙත් බිම් වල වැවෙන ගිරා පලා වලට මදක් සමාන පැලෑටිය කි.

සක්මල් අපස්මාර (මීමස් මොර=වස් මර), මානසික රෝග, කුෂ්ට රෝග, සප්ත විධ අණඹ වෘද්ධි හා දිවිමකුළු විෂ ඇතුළු විෂ ශරීර ගත වීමෙන් හට ගන්නා ආබාධ නසන, ධාරණ ශක්තිය දියුණු කරණ ප්‍රධාන පඬිකාතියේ විරේක ඖෂධය කි.

මේ පැලෑටි යේ සම්පූර්ණ හැඩහුරු කම හා ඖෂධ ශක්තිය ත් සසඳ බලන විට මෙය **විලදවැන්න** පවුල ට අයත් පැලෑටි යක් බැව් පෙනේ. එසේ ම **සඞ්ඛපුෂ්පි** (සක්මල්) **විලදවැන්න** ම යයි සිංහල නිඝණ්ටුවේ සඳහන් කර තිබේ. එබැවින් ඉහත සඳහන් කළ ඖෂධ ගුණ ඇත්තේ විලදවැන්න ට ම බැව් පෙනේ. එසේ ම **සඞ්ඛපුෂ්පි** (සක්මල්) **විලදවැන්න** ම යයි සිංහල නිඝණ්ටුවේ සඳහන් කර තිබේ. එබැවින් ඉහත සඳහන් කළ ඖෂධ ගුණ ඇත්තේ විලදවැන්න ට ම බැව් පෙනේ. සිංහල නිඝණ්ටුවේ සඳහන් කර තිබේ. එබැවින් ඉහත සඳහන් කළ ඖෂධ ගුණ ඇත්තේ විලදවැන්න ට ම බැව් පෙනේ. එසේ ම **සඞ්ඛපුෂ්පි** (සක්මල්) **විලදවැන්න** ම යයි

සකට-දුමැඩ
සකටලොචන-ගුගුල්
සකණ්ටක-පෙඳ
සකද්-කීකිරිඳිය
සකදුරු-ඉදිගස
සකන-මුතුබෙල්ලා
සකර-සීනි
සකල-කුරුදුපොතු
සකලාක්ෂ-දැවගස
සකුණ-එළ නිකා
සකුරු-නිතුල්හකුරු
සකුරුපූ-හකුරුආප්ප
සකුල-කුළුරිණ
සකුලාක්ෂක-කලාදුරු
සකුලාදනී-කටුකරෝහිණී
සකුලාදිනී-ලියනහලා
සකොදන-තලිස්පතුරු
සඛි-අරළු. කටුකරඹ, මුගුණුවැන්න
සගන්ධික-කරවිතලා
සඝකටාක්ෂ-දැවගස
සඝකාරු-පින්තල
සඝකි-මස්
සඝෙකාව-කොකුම්මල්
සඝෙකාවනී-නිදිකුම්බා
සඝ්‍රාපුස්පි-සක්මල්
සඞ්ඛමුකුතා-සක්මුතු, (මුතු බෙල්ලන්ගේ මුතු)
සඞ්ඛිණී- වැල්දෙනි, යක්ඛේරිය, සක්මල්
සඤ්ඣාණඩි-හෙළ නිකා
සඩගමුලි-මුඩමිහණ
සඩහර-සැමගස
සඩහශෙයිත්‍රී-ගෙඳගම්
සඩ්ග්‍රාහින්-කෙළිද ගස
සඩ්ඝාපුෂ්පි-සක්මල්
සඩ්ඝාතපත්‍රිකා-ශතපුෂ්ප

සචිමන-ලුණුවරණ
සචිව-කළු අත්තන
සවෙෂට-අඹ
සජ්ජය-සල්
සජ්ජිය-දුම්මැල්ල
සජ්ජු-දුම්මල
සජ්ඣු-රිදී
සජරය-දුම්මල, සල්මැලියම්
සජාඛ්‍ය-දුම්මල
සජුරස-සල්දුම්මල
සජෝවනන්තක-ඇන්තෝර
සඤ්ඣාරා-කහ
සඤ්ඣාලි-ඔලිඳ
සඤ්ඣිකා-කෑඳ, කාඩි
සඤ්ඣීව-කිරි
සටාළු-බෙලිපත, (බෙලිකොළ)
සඩ්ලෝ-යක්වනසු (යකුවනස්ස)
සණ්ඨකී-ගිරිනිල්ල, කිරිඟහුළු
සණ්ඩාකී-ගිරිනිල්ල
සණස්-ඇසතු
සත්ආකාර විෂ- දෂ්ට, ස්පෘෂ්ට, දෘෂ්ටි, අසිත, පිත, ඛායිත, සායිත යන සප්තවිධ විෂ.
සත්කට-උගුරැස්ස
සත්ත්‍ය-ඇසතු, බෝගස
සත්තපර්ණි-රුක්අත්තන
සත්තලා-සත් පෙනි දැ සමන්
සත්තුරහ-වරාගස
සත්පි-කලව
සත්පූවණෙණා-රත්රන්
සත්දල-රුක්අත්තන
සත්පත්-රුක්අත්තන
සත්ඵල-දෙළුම්
සත්මැලි-ඉඹුල් මැලියම්
සත්මූලි-සාතාවාරිය
සත්සාර-කයිප්පු
සත්‍යනාමා-මකුණුවැන්න
සත්‍යඵල-බෙලි
සත්‍යාග්ව-බැමිනිරිය

සත-ශතපුෂ්ප
සතකුප්ප-යහවපු(ශතපුෂ්ප)
සතග්නි-මුඛරෝගයක්
සතච්ඡද-කළුනික
සතත්‍ය-තනකිරි
සතපත්‍ර-නෙළුම්, කළුතලා
සතපදී-මහකපු
සතපර්කා-ඊතණ, වදකහ
සතපුෂ්පික-රත්හඳුන්
සතප්‍රාස්‍ය-අලරිය
සතභෙද-පෙරුම්කායම්
සතම්ල-ඇඹුල
සතමූලා-බිත්තල්, සාතාවාරිය
සතමූලිකා-සාතාවාරිය
සතමූලී-සාතාවාරිය
සතරහුල්-ඇසළ
සතරත-සප්තපර්ණි වෘක්ෂය
සතරඞ්ගී-මී, දඹුවැල් (ඛැ), බඹර, කණවෙසියා පැණි
සතරමහාවිකට- මළ, මූත්‍ර, අළු, මැටි, (සර්පයන් දෂ්ට කළ විෂට මේ සතර වර්ගය ගෙන ඇල් දියෙන් දියකර පානය කිරීමෙන් විෂ බැස යනවා ඇත මෙය නාගයකු විසින් දෂ්ට කරණ ලද භික්ෂූන් වහන්සේ නමකට බුදුරජාණන් වහන්සේ විසින් නියම් කරණ ලද බෙහෙතකි. (විනය පිටක-මහා වගග පාලි -202. පිට)
සතාය්‍ව-සාතාවාරිය
සතාවරී-සාතාවාරිය, කටුකරෝහිණී
සතිකාතක-කොසඹ
සතිකාක-කොසඹ
සතිතස්වච්කා-විෂ්ණුක්‍රාන්ති
සතිසක්කෝ-කෙළිද
සතුරුතෙල්-එරඬුතෙල්
සතුරුසම්මැට්ට-කරඬියනාතෙයි= සිහින් දිග කොළ සහිත සර්ප විෂට ගන්නා පැලෑටියක් (සමැට්ට= හංමැට්ට=සම්මැට්ට)
සද්දලෝ-ඊතණ
සද්‍යඃශොථා-වඳුරු මැ
සද්‍යොහයෝනි-ගල්සෙවෙල්
සද-සාවැන්දරා
සදකා-හාල්
සදකාම්මිනී- දියතරිප්පු (චණ්ඩ කාන්ත පාෂාණ)
සදන-රසකිඳ
සදරාජ- හැඩහුරුකමින් ඉරරාජ වලද සමාන සුදු පාට රේඛා වලින් යුත් පැලෑටියක්. (47 පිටේ ඉරරාජ ගැණ ලියා ඇති විස්තරය බලන්න)
සදවිභග-කොකුම්
සදෂ්ඨා-ගොකටු
සදතොයා-එන්සාල් කොළ
සදපුෂ්ප-රතු වරා ගස, කොඳ, පොල්ගස
සදපුෂ්පඵල-බෙලිගස
සදපුෂ්පා-පුස්සමන්
සදපුෂ්පී-රතු වරා ගස, පොල්ගස
සදප්‍රසූත- එරබදු ගස, වරාගස, කොඳවැල
සදඵල-පොල්ගස, බෙලිගස, දිඹුල් ගස, පිටවක්කා
සදභද්‍රා-පුස්සමන්,ඇද්දෙමට
සදවශ්‍ය-නිබ්බටු ගෙඩි
සදසන්-ඉරිවේරිය
සදිවර්‍ෂිත-බෙලි
සදුන්-හඳුන්
සදුන්කල්ක-චන්දන කල්කය
සඳුල්-නීතණ, දිවියා

සදෙල

සදෙල-සල්. හල්
සදෙලමල-හල්දුම්මල
සන්තක- පියල්ගස, කිරිපළු
සන්තකද්දු-පියල්ගස
සන්තතොද්භව-ලොත්ගස
සන්දනිකා-නිඹුරු
සන්දීප්‍ය-මොණරකුඩුම්බිය
සන්බන්ධ- බිම්කොසඹ, බින්සපු= (භූම්‍යවම්පක= සව්කෙන්ද= යව කෙන්ද)
සන්ධ්‍යාපුෂ්පී-දැසමන්
සන්ධ්‍යාහ්‍ර-සිවංගුරු
සන්ධ්‍යාරාග-කෘෂ්ණකෝලි (සෙන්දිරික්කා)

සන්නිනායන්—
බෝදින (බෝදි ඇට)

සන්නිනායන්—ශ්විත්‍රාරි
Vernonia Anthelmintica

සනස්

වාකුවී - වවුවී- අවල්ගුජා- ශ්විත්‍රාරි-සොමරාජී-කෘෂ්ණඵලා - බෝදින - බෝදි ඇට යන නම් වලින් හැඳින්වෙන සන්නිනායන් නමැති පැළැටියේ ඇට සුදු කබර, උපදංශ (පරංගි), සුදු ලාදුරු හා සමේ ඇතිවන නොයෙක් වගීවල කුෂ්ඨ රෝග වලට ත් ප්‍රත්‍යක්ෂ කෘමි නාශක ඖෂධයකි.

දිය සිරාව සහිත තෙත් බිම් වල හොඳින් වැවෙන අඩි තුනකට වඩා උස් නොවූ මේ පැළැටිය බොහෝ සෙයින් ම මළ බටු ගස කට සමාන ය. ඖෂධ සඳහ ගන්නේ දුඹුරු පාටින් යුත් මේ ගසේ හටගන්නා ඇට ය.

බෝදි ඇට

බෝදි ඇට ය යි කියා ඉන්දියාවෙන් ගෙනෙන කොල්ලු ඇට මෙන් පැතළි ඊට මදක් කුඩා වූ කළු පාට ඇට වගීයක් ද මේ රටේ ඖෂධ සඳහා සන්නිනායන් වෙනුවට ගණිති.

බෝදි ඇට සොයා ගත නොහැකි වූ විට ප්‍රතිනිධි වශයෙන් **පරංගි තෝර ඇට** ඖෂධ සඳහා රැගෙන නිබෙන බව පැරණි වෛද්‍යවරු වලින් පෙණේ.

සන්නි-රෝග විශෙෂයක්
සන්නිරුද්ද-ගුදු රෝගයක්
සන්නිපාතහුන්- නේපාල බිම් කොසඹ
සනක-මහළුක්. පතුක්
සනන්තක-මහදෙඹ
සනස්-ඇසටු ගස

සනානිකා-ඉන්සලු
සනෝඝව්‍ය-යක්බේරිය
සප්ත-රුක්අත්තන
සප්තක-හිඟුරු ,සිවිය
සප්තචඡද-රුක්අත්තන
සප්තධාතු-රස, ලේ, මස්, මේද තෙල්, ඇට, ඇටමිදුලු, ශුක්‍ර යන ධාතු හත
සප්තධාන්‍ය-ඇල්වී, අමු, තිරිඟු, කුරහන්, යව, තණ, ඉරිඟු යන ධාන්‍ය වගී හත
සප්තපත්‍ර-රුක්අත්තන
සපතපණී-නිදිකුම්බ, රුක්අත්තන
සප්තපර්ණී-රුක්අත්තන
සප්තහද්‍ර-මාරා
සප්තලා- දූසමන්, සීතිද්ද, මස් වැන්න, වී, බැමිතිරිය, ඔලිඳ, පලොල්,
සප්තවිධ ධාන්‍ය-ශාලි, ව්‍රීහි, යව, ගොදුම, තණ, වරක, කංගු
සප්තශිරා-බුලත්
සප්තසප්ති-වරාගස
සප්තසාර- ගිතෙල්, තලතෙල්, දී පෙරලි දිය, සුරා, සුදුලූණු, රත්නිවුල්, සීනි
සපතාච්-නිවුල්
සුප්තාශ්ව--රුක්අත්තන
සප්තාශ්ව වාහන-වරාගස
සප්දිවි-විෂවෙද්දු (සපිජිවි)
සප්පි-ගිතෙල්
සප්බැස්ස-ඔසුවැල්ල
සප්හැල-සජී හැවය
සපදංස-මුරුංගා
සපා-මීවදය
සපිණ්ඩා-යොන්ඉදි
සපිමාරි-කලුකැම්මේරිය

සප්සද—යස්සද වැල්

සප්සද—අහිඡ්
Aristolochia Indica

සිප්නේක්කු කොළ වලට සමාන කොළ—**රුරුජීණ** මල් පොකුරු වලට සමාන මල් පොකුරු හා වඩු කුරුළුකුඩු වැනි සිහින් කෙඳි වැනි නටුවල එල්වී තිබෙන ගෙඩි වළු ඇති මොළය කිතිකවන තද සුවඳකින් යුත් වැලකි සප්සද වැල.

කරණ ලද පරීක්ෂණ අනුව ප්‍රධාන පඩිකාතියේ විෂ බීජ නාශක ද්‍රව්‍යයක් වශයෙන් පෙර-අපර දෙදිග ම පිළිගෙණ ඇති මේ වැල සත්ව ජීවිතයේ පැවැත්මට ඉතා හිතකර ඖෂධයකි.

සප්සඳ

ජ්වර-විෂමජ්වර - අතීසාර - ආමිශූල- යන රෝග වලට ත්, පිස්සු බළු-පිස්සු මී විෂ හා හැම වශීයක ම සර්පයින් දෂට කිරී මෙන් ඇතිවන විෂවලට ත්, මේ වශීයේ කොළ-වැල් හා මුල් ඖෂධ වශයෙන් ගණිති.

මේ වැලේ මුල් කැල්ලක් ළඟ තබා ගත් විට වසංගත (විෂ බීජ ශරීරගත වීමෙන් බෝවෙන) රෝග බෝ නොවේ. එබඳු රෝ ගීන් ස්පශී වුව ද ඒ රෝග නො වැළඳෙ සි. මේ මුල් වල පවත් නා තද සුවඳ නිසා සර්පයෝ කිට්ටුවට පවා නො එති.

බෝවෙන රෝග (රෝගබීජ) වලින් හා සර්පයන්ගෙන් ආරක් ෂා වීම සඳහා සප්සඳ මුල් කැල් ලක් ළඟ තබා ගැණීම පැරණි සිංහළ වාරිත්‍රයකි.

ලක්දිව මිනිසුන් තබා කටුසු- ගිරළු ආදි කුඩා සතුන් පවා මේ වැලේ ඇති බලය ගැණ දන්නා බව පෙණේ. සර්පයන් ගෙන් ආරක්ෂා වීම සඳහා ඒ කුඩා සතුන් මේ වැල් ගොමු තුළ සැඟවී සිටින බැවි පරීක්ෂාවෙන් බැළුව හොත් දකින්නට පුලුවන.

සප්සඳ වස-විෂ නිසා ඇති වන හදිසි විපත්ති වල දී රෑ දුවල් හෙදයක් නැති ව හදිසියෙන් ඵව මනා කරණ රාත්‍රි ඖෂධයක් නිසා හැම ගෙ මිදුලක ම අලඞ්කාරය- ආරක්ෂාව හා ඖෂධ පිණිස ලවා ගත යුතු වැලකි.

සමනස්

සපිතක } මහවැටකොලු
සපිතිකා }
සපිති-ආපසුම්දු
සපු- කිකිරිදිය, මීවදය, චම්පක වෘක්ෂය
සඵල-ඇසටු ගස
සබර-දියමිදෙල්ල, පියාගස් (මොර ගස්)
සබරල-සබර + අල=සබරල
සබරලොඳ-මොරලොඳ
සබරි-මීනුග, (බිංනුග)
සබල- දියඹෙරලිය, සැබෝකරල
සම්-සජ් හැවය
සම්පාක-ඇසළ
සම්පුල්ලිතොා- මල් පිපී තිබෙන ගස
සම්පෙලිතත-සම්පිල්ල
සම්බරකන්දක-බිම්තල්
සම්බාරි-දූත්ත, මීකන්පලා, සාතා වාරිය
සම්භව-ශුක්‍රධාතුව
සම්හිකා-මයිල ගස
සම්වතී-බුලු ගස
සම්‍යක්ගවෙරණ-මුරුත
සම්‍යා-බුලත්
සම්‍යාක-ඇසළ
සමං-සමන්පිච්ච
සමංගා-වැල්මදට, සුලු බූ බැවිල
සමංමුතු-කලාදුරු අල
සමංසාලෙ-රුක්අත්තන
සමංසුමං-සමන්පිච්ච වැල
සමඅත්-කරඳ, බුලු
සමගඞ්ක-සැවැන්න
සමගර්භ-මරකත මාණික්‍යය
සමඞ්ගා-වැල්මදට, කලුතලා, සුළු බැවිල, කිරිදි, නිදිකුම්බා
සමණ-බුරුත ගස
සමනස්-ලුණුවිල

සමදරා — තික්ත සමදරා ගස්

සමදරා
Samadera Indica

තිඹිරි කොළ වලටඋ මදක් සමාන ප්‍රමාණයෙන් එසට මදක් කුඩා වූ කාල වණ්ණයෙන් යුත් ගසකි. මෙහි ගෙඩි නන්නන් ගෙඩි හෝ කවිටකුමඤ්ඤල් (දෙවධූප) ගෙඩි වැනි ය.

තද තික්ත ගතියකින් යුත් මේ ගසේ කොළ-පොතු හා ඇට හොරි-දද-කුෂ්ඨ-කඩුවේගන්ආදි හමේ රෝග වලට ප්‍රත්‍යක්ෂ ඖෂධ වෙති.

තද තික්ත ගතියකින් යුත් නීසා ගම්වාසීහු මේ වගීය **තික්ත සමදරා** නමින් හඳුන්වති.

සම්දෙෂ-නීරෝගී
සමන්-දැසමන්
සමන්ගා- වැල්මදට, සුලුබුබැවිල
සමන්තක-මහදෙඔ, ඉලුක්
සමන්තදුග්ධා-මහඑක්, දළුක්ගස
සමන්තපුෂ්ප-සුවඳ ඇති අගිල්
සමන්පලා-සමන්පිච්ච කොළ
සමන-මුරැන, මුඛමහණ
සමපාකය-කල්කය ඉටිසේවී ලනු ඇඹරෙනු වැනි පදම
සමපාටලී-හෙළ පළොල්
සමතී-ඇටකෙසෙල්
සමරා-මුරැවා
සමල්ලිකා-කෝවක්කා
සමවාත-කිණිහිරි
සමස්ථිලා-පතුක්,වල්ලි අල
සමසත්-දදගස
සමාසෝ-සුළුබැවිල
සමාධි-වෘෂභක
සමාරොහා-ඉඳි, රටඉඳි
සමාහ්වා-ගැටනිවුල්
සම්ද්-කැල
සම්-හිඟුරුපියලි, සැමගස්
සම්පත්‍රා-නිදිකුම්බා
සම්රණ-කුකුරුමාන්, වරා, හීන් තලා, කරවි තලා, මුරැවා
සම්රසා--බෙලි
සම්රොපසම්-සැමගස
සමුද්භව-මැසිදූ
සමුද්‍ර-මුදුලුණු, සක්නැබ
සමුද්‍රකට-දිවිපහුරු
සමුද්‍රකථා-මුදුපෙණ
සමුද්‍රපර්ණී-මීපැණි
සමුද්‍රඵේන-මුදුපෙණ
සමුද්‍රලවණ-මුදුලුණු
සමුද්‍රාන්ත-කහඹිලියා, සාදික්කා, කපු

සමුද්‍රානනා

සමුද්‍රාන්තා-කඩල, පික්මල්, ඇල් කහඹිලියා, මහකපු, මහ ඉර මුසු, ඊතණ
සමෝදක-කිරිමෝරු
සයං-රසදිය
සයථු-ඉදිමීම
සයාකාර අජීර්ණ-ආම, විදග්ධ, විෂටබ්ධ, විලම්බික, රසශෙෂ, උත්සුක යන අජීර්ණ සය
සයාකාර අතීසාරය-වාත, පිත්ත, ශ්ලේෂ්ම, සන්නිපාත, භය, ශොක යන අතීසාර සය
සයාකාර රසය- (වෘක්ෂලතාවල) මුල්, කඳ, පොතු, කොළ, ගෙඩි, මිල් යන මේවායේ රස
සයාකාර වායු- ඌර්ධ්වඛගමන, අධොගමන, කුච්ඡිසය, කොෂ්ට සය, අඛගමඛාානුසාරී, ආශ්වාස, ප්‍රශ්වාස යන සයාකාර වාතය
සයින්කෙ-බදුල්ල
සසිරයඃ-කට්ටකරඹු
සසිල-රසඳුන්
සකීර-හකුරා, (සක්කර) සීනි
සකීරා අර්බුද-රෝග විශෙෂයක්
සර්වරී-කහඅල
සර්ජ-දුම්මල, සල්ගස
සර්ජක-සල්ගස
සර්ජගන්ධා-අරත්ත, සස්සඳ
සර්ජය-දුම්මැල්ල
සර්ජරස-දුම්මල, සල්ගස
සර්ජා-සළල
සර්ජාහ්ව-දුම්මල, සල්ගස
සර්ජාහ්වය නිර්යාස-දුම්මල
සජ්ජික-, සජ්ජිකා } සුවසඳුණු
සර්ජිකාක්ෂාර-සුවසඳුණු

සඞ්ග්‍රහමූලාක්ෂ

සර්ප-සඳුකරඹ, වැවරණ
සර්පගන්ධා-ඒකාවේරිය
සර්පගන්ධික-අරත්ත-සප්සඳ
සර්පචිත්‍ර-නයිහතු (භූමිපුෂ්ප)
සර්පදෂ්ටි-කොළොම් ගස
සර්පදංෂ්ට්‍ර- දැත්ත, ඇත්සැවිය, දැත්කැටියා
සර්පදංෂ්ට්‍රා-මැඩහඟු, සුළුසාරණ
සර්පදංෂ්ට්‍රිකා-මැඩහඟු,සුළුසාරණ
සර්පදන්ති-දැත්ත
සර්පදමනා-මල්වැටකොළු
සර්පනාලි-කිඳාරම්
සර්පප්‍රිය-සඳුන්
සර්පපුෂ්පි-දැත්ත
සර්පමාරි-කළුකැමේරිය
සර්පමෙදා-හිඹුරු ගස
සර්පලතා-බුලත්වැල
සර්පසංඥ-කොල්ලම් කොළ
සර්පසුගන්ධා-සප්සඳ
සර්පාක්ෂ-රත්ගොකටු, ඒකාවේරිය
සර්පාක්ෂි- අඛනභිරිය, අරත්ත, රත්ගොකටු, ගඛනාකුලී
සර්පාදනී-අරත්ත, ඒකාවේරිය
සර්පාරී-හෙළ හිඹුරු
සර්පාවාස-සුදුහඳුන්
සර්පිස්-ගිතෙල්
සර්පී-ගිතෙල්
සර්පීන්ද්‍ර-ගුගුල්
සර්පීෂ්ට, සර්පෙෂ්ට } සඳුන්
සර්වග-පුවහුරුක
සර්වගන්ධ-එන්සාල්, කුරුඳුපොතු, කොල්ලම් කොළ, තාම්ල්රේණු, කපුරු, අගිල්, කරාබුනැවි, තකුල්, කොකුම් මල්
සර්වගුන්ඩි, සර්වගුන්ඩික, සර්වගුන්ඩි මූලක } නිප්පිලි මුල්

සර්වජනප්‍රිය-සුළුදඬකළුත්
සර්වජයා-බුත්සරණ
සර්වනිඝ්නා-කළුකැමේමිරිය
සර්වතොභද්‍ර-ඇද්දෙමට, කොසඹ
සර්වද්‍රපුෂ්ප-රත්ගොකටු
සර්වපුෂ්පිකා-දැත්ත
සර්වභද්‍රා-ඇද්දෙමට
සර්වරස-ලුණු
සර්වරසඃ-දුම්මල
සර්වරසොත්තම-ලුණු
සර්වරොමතා-දැත්ත
සර්වරොස-රත්ගොකටු
සර්ව වර්ණිකා-ඇත්දෙමට
සර්වසාර-කෝන් ගස, මුරුත
සර්ව සිද්ධි-බෙලිගස
සර්වානුකාරිණී-අස්වැන්න, ශාලි පර්ණි
සර්වානුභූතී-සුදු තුස්තවාළු
සර්වානුභූතිකා-තුස්තවාළු
සර්වෞෂධි-කොච්චම්, ජටාමාංශ, කහ, වදකහ, මුරාමාංශ, කලාඳුරු, කපුරු, ගල්සෙවෙල්, සඳුන්
සර්වෞෂධිගණ- ජටාමාංශ, වද කහ, කොච්චම්, මුරාමාංශ, ගල් සෙවෙල්, කහ, ඛාන්වැල්ගැට, (වෙනිවැල්ගැට) නිහුරාපියලි, සපුමල්, කලාඳුරු
සර්සප-අබ
සර-තලගස, ලුණුවතුර, යකඩ, නෙළුම් මල, වෙඩරු, පියුම්,
සරඝා-මීහකුරු, මීමැස්සා
සරජ-වෙඩරු
සරණ-යකඩමල, වැල්බැවිල, පිච්ච, සාරණ
සරණා-කටුපිල, ආපසුමිදු
සරණි-ආපසුමිදු=(ප්‍රශාරිණී)
සරත්පර්ණී-මුංවැන්න
සරත්ඵලා-මහඉරමුසු
සරත-මුරුවා
සරදී-රැක්අත්තන
සරපත්‍රිකා-නෙළුම් මල
සරපුඛ-කටු පිල
සරබිං-ඉරමුසු
සරල-දුම්මල, දේවදාරු,තුස්තවාළු, නොරගස
සරලද්‍රව-සිරිවටු, තුස්තවාළු, සල් මාලියම්
සරලද්‍රුම-ගුගුල්, නොරගස
සරලම්-සිරිවටු
සරලා-තුස්තවාළු
සරලාඛග-දුම්මල
සරලී-නොරගස
සරලෝ-සරල
සරස්වතී-බැම්මිරිය
සරස-එළ තුස්තවාලු, ඊයම්, කිරිමෝරු, මියුරුඇඹුල්, සොරස, (අමු බෙහෙත් කපා කොටා මිරිකාගත් ඉස්ම)කසට, තික්ත, මධුර, ලුණු
සරස-කසට, තික්ත, මධුර, ලුණු, ඇඹුල්, කටුක යන රස සය
සරසම්පත-ගොකටු
සරසාරි-ගුගුල්
සරසිජ
සරසීරුහ } නෙළුම්
සරා-බෙරු, ආපසුමිදු
සරික-තල
සරිකා-පත්‍රාඞ්ගු
සරිල-වතුර
සරිසපය-අබ
සරෝජ
සරෝජන්මන් } නෙළුම් මල
සරොරුහ-නෙළුම්

සල්—හල් ගස්



සල්—සාල (අශ්වකර්ණ)

Shorea Robusta

දැනට **සල්** නමින් තුන් වගී යක් ලඬකාවේ තිබේ. එයින් (Shorea Oblongifolia) න මැ නි හල් ගස ලඬකාව ම ජන්ම භූමි කොට ඇති ගසක් ලෙස සැළ කිය හැක. වෙන කිසිම රටක මේ වගීය මේතාක් සොයා ගෙන නැති හෙයිනි. මෙහී කඳ සුදු පාට යි. කොළ ගලිස් කොළ වලට ත් වඩා විශාල යි. තේක්ක කොළ මෙන් බොකුටු හැඩයෙන් යුක්ත යි. අතු මුදුන්වල සැදෙන මුරුන මල් වැනි මල් පොකුරු මනා සුවඳකින් යුක්ත යි. මෙහි සැදෙන ගෙඩි ලෙලි හැරි කුන්දිරු පොල් ගෙඩි පමණ විශාල යි. අඟල් බාගයක් පමණ ඝණ වූ ලෙල්ල අස්කළ විට ඉතිරි වන මදය තද නික්ත ගතියකින් යුක්ත යි.

වේරැන් වලින් හෝ බෙලෙක් කැල්ලකින් සාදා ගත් ඇණ පෝරුවකින් මේ මදය සිහින් වෙන්ට සූරා ගෙණ මල්ලක දමා කට වසා බැඳ දියපාරක එක රැයක් බැඳ තබා නික්ත හැර මිරිකා ගත් හල්කිරි වලට හාල් පිටි හා කිතුල් පැණි මිශ්‍රකර හල් කැඳ ත්, මිරිකා ඉතිරිවන රොඩ්ඩට හාල් පිටි හා පොල් මිශ්‍ර කර හල් පිට්ටු ත්, සාදා ගත හැක.

මෙ සේ සාදා ගන්නා හල් කිරි කැඳ සහ පිට්ටු රක්තවැත, මූල වාත හා අර්ශස් රෝග වලට ත්, වස විෂ ශරීරගත වූවන්ට ත් නො වරදින ඔසුවකි. හල් ගෙඩි ස්ථිර සතෙකු නොකන නිසා "**සතුන් නොකන නික්ත ගෙඩිය**" යන තේරවිලි පදයක් ද හල් ගෙඩිය ගැණ ගම්වාසීන් අතර ව්‍යවහාරයෙහි පවති.

හල්පොතු

නික්ත මිශ්‍ර කසට රසයකින් යුත් හල්පොතු අතීසාර රොග යට ප්‍රත්‍යක්ෂ ඖෂධයකි. තෙල් දිය රාවීම (පැසවීම) නැවැත්වීමට ත්, එයින් උණු කරණ පැණි වණීවත් කිරීමට හා සුගන්ධවත් කිරීමට ත්, හල්පොතු යොදති.

හල්දුම්මල

තුවාල වල ඔඩු කැපීම සඳහා පැලැස්තර සෑදීමට ත්, විෂ බීජ නාශක ඖෂධයක් වශයෙන් දුම් ඇල්ලීමට ත් සල් ගසෙන් පිටවී වේලෙන දිළිසෙන ගතියකින් යුත් කිරි (හල්දුම්මල) ගණිති. මේ වගී යේ පිරිසිදු කැලි ගෙන කුඩුකර දෙරණ තෙලට මිශ්‍රකර හොඳින් උනුකර සකස් කර පෙරා ගන්නා වලිවිවි (වාර්නිස්) **හල්ගුහා-හික්ති-සිව් ලින්- ඛනු** ආදියෙහි අඳින ලද සිතියම් දීප්තිමත් වීම හා ආරක්ෂා වීමත් සඳහා ඒ සිතියම් වලට උඩින් ගානි. අපේ රටේ අවුරුදු දහස් ගණන් පැරණි චිත්‍ර ආරක්ෂා වී තිබෙන්නේ මේ ගුප්ත වාර්නිස් වගීයේ පවතින පුදුම බලය නිසා ය.

මෙය ලංකාවේ පමණක් තිබෙන හල්ගස මිස ඉන්දියාවේ තිබෙන සල් ගස් වගීය නොවේ.

මේ රටේ සල් නමින් ව්‍යවහාර වන දෙවැනි වගීය දකුණු ඇමෙරිකාවෙන් ගෙනැවිත් 1881 දී බෝකරණ ලද (Cannon Ball Tree නමැති-කාලතුවක්කු උණ්ඩ ගස) ගසකි. හොඳුපර ගසට මඳක් සමාන කොළ හා මල් ඇති විශාල ලෙස වැවෙන මේ ගසේ මිනිස් හිස් පමණ මහත ඇති ගෙඩි සෑදෙයි. ඉර උදුවත් සමග මිහිරි සුවඳකින් යුක්තව පිපෙන මේ ගසේ මල් ඉර අවරවීමෙන් සමග අමිහිරි දුගඳක් පතුරවමින් පරවී ය යි. තද ඝණ කටුවකින් යුත් මේ ගසේ ගෙඩි ජූරියන් ඇට පමණ විශාල වූ ඇට හා ලා දුඹුරු පැහැයෙන් යුත් දුගඳ හමන මද වලින් පිරී තිබේ.

මෙය සල් ගසක් නම්‍ ආසියාතික වෙන ගසක් නෝ නොවේ. සල් ගසකට සමාන කිසිම ලක්ෂණයක් ද මෙහි නැත මීට අවුරුදු 78 කට පෙර දකුණු අමෙරිකාවෙන් ගෙනැවිත් ලඬකාවේ බෝකරණ ලද මේ ගස මීට පෙර ඉන්දියාවෙහි හෝ ලංකාවෙහි තිබුන බවට කිසිම ශාස්ත්‍රීයක් ද නැත.

සිද්ධාර්ථ කුමාරොත්පත්තිය සිදුවුන වේලෙහි අග සිට මුලට පිපී ගිය සල් ගසක අත්තක් ඇල්වූබව සඳහන්වන කථා ප්‍රවෘත්තිය නිසා කද දිහට මල් පිපෙන පමණින් මෙය එහි විස්තරවන සල් වගීය යි වරදවා තේරුම් ගැණීමෙන් මේ ගසට සල් යන වැරදි ව්‍යවහාරය භාවිත වී තිබෙන බව පෙණේ.

තුන්වැන්න (Shorea Robusta) නමින් උද්භිද විද්‍යඥයන් විසින් හඳුන්වනු ලබන නියම සල් වගීය යි මෙය ඉන්දියාවේ හා ජාවා දූපත්වල ත් වැවී තිබේ. මෙහි කද සුදු පාට ය. කොළ අසුන්ගේ කන්වලට සමාන ය. පේරාදෙණියේ උද්‍යානයේ වවා තිබෙන පැළ කිපය හැර මේ වගීය මීට කලින් ලඬකාවේ වැවී නැත

සල් ගසේ කොළ හැඩහුරුකමින් **අශ්වකර්ණ** (අසුන්ගේ කන්) වලට සමාන නිසා සල් ගසට සංස්කෘත භාෂාවෙන් **අශ්වකර්ණ** යන නම ව්‍යවහාර වේ. ඉන්දියාව ජන්මභූමිකොට ඇති ගසක් වීම, හැඩහුරුකමින් මෙ කි ලක්ෂණයන්ට සමාන වීම හා උද්නිද විද්‍යාඥයන් සල් වශයෙන් පිළිගැණීම යන මේ කරුණු අනුව සළකන විට සිද්ධාර්ථ කුමාරොත්පත්තිය සිදු වූ අවස්ථාවෙහි මහාමායා බිසවට ආධාර වූයේ මේ වගීයේ සල් ගසක් විය හැකි යි. ලඞ්කාවේ තිබෙන සල් (හල්) ගස ද මේ පවුලට ම අයත් ගසක් බැව් දෙවර්ගයට ම උද්නිද විද්‍යාඥයන් තබා තිබෙන ලැටින් නාමයේ සමානකම හා ගසේ හැඩහුරුකමත් අනුව සැලකීමට ඉඩ තිබේ. දකුණු ඇමෙරිකාවෙන් ගෙනැවිත් මෑත කදී බෝකරණ ලද කාලතුවක්කු උණ්ඩ ගස-ශාල (සල්) වගීයට පවා අයත් ගසක් නොවේ.

මෙනි ඡායාරූපයෙන් දැක්වෙන්නේ ඉන්දියාවෙහි තිබෙන නියම සල් ගසේ අත්තක සිතියමකි. ලඞ්කාවේ තිබෙන හල් ගස හා කාලතුවක්කු උණ්ඩ ගස කවුරුත් පාගේ දැක පුරුදු නිසා ඒවායේ ඡායාරූප අවශ්‍ය ය සි නො සිතමි.

එ හෙත් මේ තුන්වගීයෙන් ඖෂධයක් වශයෙන් හා රසායන ද්‍රව්‍ය යක් වශයෙන් ප්‍රයෝජන ලැබෙන්නේ ලඞ්කාවේ තිබෙන හල් ගසෙන් පමණකි.

සල්මලී-ඉඹුල්
සල්මණිල-හල්මිල්ල ගස
සල්මැලි-ඉඹුල් මැලියම්
සල්ලකා-කලුකිඹිරි, කුකුරුමුවන්
සල්ලකි-තොටිල, කෙනෙල්
සල්ලකී-ඉන්සලු, කුන්දුරුක්කන්
සල-ඉත්තැවා, සරල වෘක්ෂය
සලඟ-ඉත්තැකුරු
සලදල-බෝගස
සලපත්-බෝගස
සලල-ඉත්තැවා, සරල වෘක්ෂය
සලලා-ඉත්තැකුරු
සලස්ත-ලුණුවරණ
සලස්ම-ලුණුවරණ
සලිල-වතුර
සලිල කුන්තල- පෙද (දිය සෙවෙල්)
සවිවවිව ලුණු-සුවස ලුණු
සවිසිරි-සෞසීර
සවරා-වල්කෝමාරිකා
සවහා-ත්‍රාසනවාලු
සවිකා-සිවිය
සවිතු-වරා ගස
සවිඛ-සහිද ලුණු
සවිඳව, සවිදව } සෛන්ධව ලුණු
සවිස-රත් කණේරු, වව්වනාවි

සල්වැන්න සල්වැන්න

සල්වැන්න



සල්වැන්න—ශාලිපර්ණී

Desmodicum Gangeticum

සුළු පස් මුල් ගණයට අයත් සල්වැන්න දිග-පලල අඟල් 2 × 1 පමණ කොළ – කුඩා මල් හා-දික් වූ කුඩා කරල් ඇති අඹිය කට වඩා උස් ව නො වැඩෙන පැළයකි. (ගසකි.). ඉන්දියානු වෛද්‍ය කොෂ ග්‍රන්ථවල සඳහන් ලක්ෂණ අනුව මේ පැළෑටිය නියම සල්වැන්න (ශාලිපර්ණී) බැව් සිහිරව ම කිව හැක.

එහෙත් මේ වෙනුවට අති දීර්ඝ කාලයක සිට ඖෂධ සඳහා **අස්වැන්න** නමැති දිග-පළලින් අඟල් 1 × ½ ක් පමණ ඇති කුඩා වැල් වර්ගයක් ගැණීමට අපේ රටේ පුරුදු වී තිබෙන බව පෙණේ.

මෙ දෙවර්ගය ම මේ රටේ සුලබව තිබිය දී ශාලිපර්ණී වෙනුවට අස්වැන්න නමැති කුඩා වැල් වර්ගය ම ගන්නේ මක්නිසා දැ යි සලකා බැලිය යුතුව තිබේ.

මේ රටේ සුළුපස් මුල් කෂාය හෝ පේයාව පෙර සිට ම පිළියෙළ කර තිබෙන්නේ ශාලිපර්ණී(සල් වැන්න) වෙනුවට අස්වැන්න හා පෘෂ්ණි පර්ණී (පුස්වැන්න) වෙනුවට පොල්පලා ත් ඇතුළත් කිරීමෙනි.

ලක්දිව පෙර විසූ වෛද්‍ය වරයන්ගේ මේ නිගමනය එක වරම ඉවත දැමීම සුදුසු නැත. ඒ විධියට පිළියෙළ කර දෙන ඖෂධ යෝග වලින් එහි සඳහන් නියම ගුණය ලැබී රොග සුව වන හෙයිනි.

නුදුරු අනාගතයෙහි ඇති විය හැකි ආයුර්වේද රසායනා-ගාර මගින් මෙ බඳු මතභෙද සහිත දේ පරීක්ෂණ වලට භාජන වී සාවද්‍ය-නිරවද්‍ය භාවය එලිදරව් වනතෙක් ඉවසිය යුතු ය.

සවිසා–අනිවුඩයන්, වව්වනාවි
සවුක්කාරන් උප්පු–යවකාර ලුණු
සවුකෙන්ද } යවකෙන්ද
සවුගෙඳි } (භූමි වම්පක
සලුක–හෙළ උපුල් අල

සව්කෙන්ද—යව්කෙන්ද

සව්කෙන්ද—භූමි චම්පක

Kaempferia Rotunda -

ගස වැවෙන විට කොළ පමණකුත්, ගස මැරෙන විට මල් පමණකුත් ඇති මේ පුදුම පැලෑටිය පැල වෙන්නේ එහි තිබෙන රටල පමණ මහත ඇති කුඩා අල පොකුරක් නිසා ය. මෙහි කොළ අඹ කහ හෝ හුලන්කිරිය කොළ වලට ත් මල් වෙසක් මල් වලට ත් සමාන ය. වැවී තිබෙන සම්පූර්ණ පදුර පෙනුමෙන් අඹ කහ පදුරක් බදු ය. ගස මැරී මල් හටගන්නා කාලයෙහි දිනපතා එක බැගින් මසක් පමණ නොකඩවා පිපෙන මේ මල් මිහිරි සුවඳකින් හා මිනා පෙනුමකින් යුකත් වෙයි.

සපු මල් සුවඳට මදක් සමාන නිසා **භූමිචම්පක** යන සංස්කෘත නාමයෙන් හැඳින්වෙන මේ වගීය යවන (අරාබි) දේශය හෝ රොටන්ඩා දේශය ජන්ම භූමි කොට ඇති බැව් මෙයට ව්‍යවහාර වන යව කෙන්ද (යවන කෙන්ද) Kaempferia Rotunda යන නාම අනුව සැලකීම ට ඉඩ තිබේ. මේ වගීයේ අල උනු අළු පල්ලේ තම්බා එළ ගිතෙලෙන් අඹරා ලේ ගෙඩි පිට ගැමෙන් ඒ ගෙඩි මොළොක් වී හොඳින් පැසවා ලේ සාරය ඇදී යයි.

සවෝ-මල් ආදියෙන් කළ සුරා
සසත්‍ර-සසත්‍රවේදි
සස්‍යසංවර-සල් ගස
සස්‍ය සංවරණ-මුරැත
සස-මීගස
සසන්තිකා-ඉලුක්
සසල්‍ය-රසකිඳ
සසි-නිල් මානෙල්
සසුගන්ධිකා-කිරිකවෙලු
සහකාර- ඉතා දුරට සුවඳ ඇති අඹ, මී අඹ
සහකාරක-අඹ
සහචර-නිල් කටුකරඹු, රන්වන් කටුකරඹු
සහදෙව- බැවිල, දඹු ඵපුල්, ඉර මුසු, අඬතහිරියා, රන්වන් දඹු ඵපුල්
සහදෙවි-මහ බැවිල, මහුල් කුඹුරු වැන්න, ගොඩමානෙල්
සහයුරු-අඹ ගස
සහරසා-මුංවැන්න

සා

සහල් දෙවුන් දිය – හාල්පාණු =(සිංහල කැකුළු හාල්. පාඤු (හාල් සේදූ වතුර) මේ රටේ පෙර සිට ගණිති, සහල් පලම් එකකට වතුර එක පතක් දමා සිංහල පැය 15 ක් තබා පෙරා ගත් ජලය සහල් දෙවුන් දිය (තණ්ඩුලාම්බු) වේ.

සහලෝකා-රසකිඳ
සහස්-පෙරුම්කායම්
සහස් දත්-මත්ස්‍යයා, (බලයා)
සහස් නෙත්-කෙළිඳ ගස්
සහස් පත්-නෙළුම්
සහස් රැස්-වරා ගස
සහස් වෙද-පෙරුම්කායම්
සහඤ්ජකණ්ඩී-සුදු ඊතණ
සහස්‍ර පත්‍ර-රත් නෙළුම්
සහස්‍ර පාදු-වරා ගස
සහස්‍ර වීර්‍යා-ඊතණ
සහස්‍ර වෙධී-ඇඹුල්වේ, පෙරුම්කායම්, කස්තුරි
සහස්‍රා-දියමිත්ත
සහස්රී-ඇම්බරැල්ල
සහසා-අරත්ත
සහා-මුංවැන්න, කෝමාරිකා, දඹු උපුල්,සුදු කටුකරඹු, අරත්ත, පික්මැලි, කටුකරඹු, සුලු ගෙලඩිය, මහ ගෙලඩිය
සහාචර-තෙල ගස, රන්වන් කටුකරඹු
සහාර-අඹ
සහිඤ්ඤු-දෙහි
සහිරි-පුස්කර

සා-සෑම ගස්, අත්තන
සාක-මහරි, අතු
සාකය-වරණ ගස
සාකාපස-නීක, වරා, කුඹුරා, තොටිල, එරඹු යන මේ පස් වගීයේ ශාඛා
සාකුරණ්ඩ-කටුකරඹු
සාකොට-ගැට නිවුල්
සාඛා-අතු
සාඛිණ-සෑමගස
සාගර-මුනුදු ලුණු
සාගරක-මූදු ලුණු
සාගරගාමිණී-හින් එන්සාල්
සාගර'ජම්ල-මූදු පෙණ
සාගරොත්ථ-මූදුලුණු
සාගරොත්ථමල-මූදු පෙණ
සාචිවාටිකා-සුදු සාරණ
සාටක } රෙදි
සාටිකා }
සාඩහ චිටපී-කිහිරි ගස
සාතකුම්භ-අලරිය, රත්රන්
සාතලා-බෑමිතිරිය
සාතලාවර්තිනී-වී
සාතාවාරි- ෂාතාවාරිය (සාතාවාරිය
සාතාවාරිය-ජලමඤ්ඡී
සාද-කොකුම්
සාදනී-බෙරැ
සාදුරණය- සම වූ දිය හා ගල් ඇති ප්‍රදෙශය
සාදික්කායි-ලමඟ පුවක් (සාදික්කා ගෙඩි)
සාදිලිංගම්-හිඟුල් (හිඹුල)
සාදුකණ්ටෝ-කටු කිහිරි
සාධු පුෂ්ප-ගොඩ නෙළුම්
සාධුපුෂ්පී-මයිල ගස
සාධුවෘක්ෂ-ලුණුවරණ, කොලොම් ගස

සාන්ද්‍ර සාරඝ

සාන්ද්‍ර-ඝන වූ දෙය, සිනිදු දෙය
සාන්ද්‍රපුෂ්ප-බුළු ගස
සාන-මදුටිය 15 ක බර
සානය-සය අකක්
සානි-කොරාසානි
සානු-මහ සාරණ
සානුජ-කොත්තමල්ලි, පොණ්ඩරු
සාඛරී-යක්ඛේරිය

සාම්බ්‍රාණි—කුන්දුරු
(කුන්දුරුක්කන්)



සාම්බ්‍රාණි—කුන්දුරුක්කන්

දවට කොළ වලට සමාන කොළ ඇති සුදු පාට කඳකින් යුත් අඩි පණහක් පමණ උසට වැවෙන ගසකි. මේ ගසේ ඇට හොර ගසේ ඇට වලට මිදක් සමාන ය. පියාපත් බද්ද ය.

ගසේ මුලින් සහ සක්සිස්ථාන වලින් නික්මෙන දුම්මල වැනි මැලියම් සාම්බ්‍රාණි නමින් ගෙවල් සුගන්ධවත් කරණ, විෂබීජ නාසක ද්‍රව්‍යයක් වශයෙන් දුම් ඇල්ලීමට පාවිච්චි කරති.

සාම්භවා-රත් ලොත්
සාම්භාර-සාම්බර දෙශයෙහි ලුණු
සාම-රුක් ගස, ඉරමුසු
සාමං-පුවහු, ඉරමුසු
සාමඳුන-කොළය කඩා නැවත එකතු කළ විට පැස්සෙන සිංහ මුඛ කොළ වැනි කොළ ඇති කුඩා පැලැටියක්
සාමවල්ක, සාමවෘක්ෂ } වාරා ගස
සාමා-පෝටා වැල, පුවහු, කළු නුඹනාවාළු, ඉරමුසු
සාමි වෘක්ෂ-කාල ගස
සාමුද්‍ර, සාමුද්‍රක, සාමුද්‍රජ, සාමුද්‍රලවන } මුදු ලුණු
සාමුද්‍රික-මුහුදු ලුණු
සායපුඩ්ඛා-පිල ගස
සාර්ත්‍රා-කෝවක්කා
සාර-අරටු, වෙඩරු, යකඩ, සජීක්ෂාර, වතුර, රෝම ලුණු, මී ගස
සාරක-ජයපාල, ඇට්ටර
සාරඛදිර-හිඹුරු ගස
සාරගන්ධ-සඳුන්
සාරඝ-මීපැණි, මී ඉටි
සාරඩග-නෙළුම් මූල, සක, සඳුන්, කපුරු, කලාදුරු
සාරජ-වෙඩරු

සාරණ-අතීසාරය, වැල් බැවිල, ඇම්බරැල්ල
සාරණී-සාරණ, යොහොඹු, ආපසු මදු
සාරණෙ-සාරණ
සාරතරැ-කොහෙල් ගස
සාරතෙල-ගෝසාල වැල
සාරදී-ලියනහලා, රැක් අත්තන, රණවරා, කටුකරෝහිණී
සාරදුම-කිහිරි
සාරපුෂ්ප-පියා ගස, සල් ගස
සාරමහා-බැවිල
සාරමූෂිකා-දේවදාලිය
සාරය-බට
සාරලජී-අඹ
සාරවතී-සැමගස
සාරවීරතරැ-අන්දර ගස
සාරස-සුදු නෙළුම්, සවිඳුව ලුණු, නෙළුම්, මීපැණි, ලුණු රස
සාරශ්‍රෙෂ්ඨා-මාරා ගස
සාරා-කලු තුඹතාවාළු, ඊතණ, ලී මැ, දෙළුම්, ඛෝදි ගස, ලුණු වරණ
සාරාල-තල ගස (තිල)
සාරිණී-සපු ගස, මහුල් කුඹුරු වැන්න, ඇල් කහඹිලියා, රන් වන් ඇට්ටර, ආපසු මදු, රතු සාරණ
සාරිබා-ඉරමුසු
සාරිබී-ඉරමුසු
සාරී-බැමිනිරිය
සාරී(තෘ)ණ-ගොඩමානෙල්, කහඹිලියා, ආපසු මදු, රතු සාරණ, කපු ගස
සාල්මලී-ඉඹුල් ගස
සාල්මලී නිර්‍යාස-හිඹුල් ලාටු
සාල්මාර-ඉඹුල් ලාටු
සාල-සල් ගස, දුම්මල
සාලන
සාලනීර්‍යාස } දුම්මල
සාලපර්ණී-මේවන්, අස්වැන්න
සාලපුෂ්ප-ගොඩපියුම්
සාලය-අඹගස
සාලරස
සාලවෙෂ්ට } දුම්මල
සාලස්මා-තල් ගස
සාලසසර්ජ-මුරැත ගස
සාලස-සල් ගස
සාලසාරක-මුරැත ගස
සාලාදි ගණය - සල්, කොබු (කෝන්), රන්වන් කැල, (වෙනි වැල්), දැව ගස්, සඳෙළ (රන් වන් සල්), කුඹුක්, පියා, මහරි, ඇට්ටර, රැක් බුරැඳ (සාරණ), කිහිරි හර, හෙළ - රත් හඳුන් දෙවගය, හිඹුරැ, රත් මුරැත, කරඳ (සිරිල), නිඹිරි, කලු වැල් (අහිල්) යන මේ ශාලාදි ගණය සෙම්රෝග, කැසීම, ඡවි රෝග, කුෂ්ඨ, ප්‍රමෙහ යන මේ රෝග නසන්නේ ය.
සාලි-හැල් = (වී වගීයක්)
සාලුක-ඕළු, සාදික්කා, මානෙල් අල
සාලෙය-ශතපුෂ්ප, පද්මකාෂ්ඨ
සාලෝ-සල්ගස
සාවිහ-ලුණුවිල
සාවර-ලොත්
සාවරක-ලොත් ගස
සා වසුරැ-හාබෙටි
සාවාසද-අසමොදගම්
සාවිත්‍ර-වරා
සාසප-අබ
සාඝින්-වම්මුතු, (කලාඳුරැ)

සැ සි

සැඹරුස්-වරා
සැඩොල්-සාල්
සැනි-මල්කැන
සැපිටි-(උරුලෑ) සව්ටම්
සැබෝ-කරල් සැබෝ
සැබෝ සාල්-කරල් සැබෝ ඇට
සැම-වෙලඟ
සැර-මලාව =(පැස=පෙට්ටිය)
සැලඹ-හැලඹ, (හැලි අඹ – ලොකු අඹ) බක්මී ගස් වලට බොහෝ සෙයින් සමාන හැලඹ නමැති වෙන ගස් වර්ගයක් ද තිබේ.
සැලලීහුනු-සුදු ලීනු අල
සැවැන්දට-සුවඳ හොට (සැවැන් දරා)
සැවැන්දන-සැවැන්න =(සැවැන් දරා)
සැවැන්දරා-සැවැන්න
සැවැන්දෙට-සුවඳහොට
සැවැන්න මුල්-බබුස් තණ
සැවුලු-කුකුලා
සැහැයුරා-අඹ
සැළඹ-සැලි අඹ, (ලොකු අඹ)

සිංගාවෝ-ගොකටු
සිංවිත-ආඩානෝඩා
සිංශපා-ඉන්සළු ගස, ඇට්ටර ගස
සිංහ-රත් මුරුංගා ගස, මූනමල් ගස, වංඇපල
සිංහඝා-වංඇපල
සිංහකොශර-මූනමල් ගස
සිංහතුණ්ඩ-දළුක්
සිංහනාදිකා-ඇල් කහඹිලියා
සිංහපර්ණී-වංඇපල ගස
සිංහපුච්ඡි-මස්වැන්න, පුස්වැන්න, අස්වැන්න
සිංහපුච්ඡිකා-පුස්වැන්න
සිංහපුෂ්පා-පුස්වැන්න
සිංහමුඛ-ආඩානෝඩා, (මෙහි සිංහ මුඛාකාර මල් පිපෙන හෙයින් සිංහමුඛ යයි කියති)
සිංහමුඛී-පුස්වැන්න, මස්වැන්න, වංඇපල
සිංහමූත්‍ර-වැලි
සිංහල-කුරුඳු ගස
සිංහලක-පිත්තල, නිකා ගස
සිංහලාඞ්ගුලි-පුස්වැන්න
සිංහවින්නා-මස්වැන්න
සිංහා-යකඩ මල
සිංහාඛ්‍යඞ්නා-වංඇපල
සිංහාන-යකඩ මල
සිංහාස්‍ය-වංඇපල
සිංහිකා-වංඇපල
සිංගී-එළ බටු, කටුවැල් බටු, වම් බටු, මුංවැන්න, වංඇපල
සිංහුණ්ඩී-මහ උක්. වැල් මුරුංගා
සික්ථ-මී ඉටි, බෙරු
සික්ථක-මී ඉටි
සිකතා මේහ - ප්‍ර මේ හ රෝ ග යක්
සිකතා-වැලි
සිකන්ඩි-කටුපිල
සිකා-කිරිබදු වැල
සිකාපත්‍ර-රත්එරඹු
සිකි-පල්මානික්කන්
සිකිගීව-පල්මානික්කන්
සිකුරාපියලි-හිහුරුපියලි
සිඛණ්ඩි-කටුපිල
සිඛණ්ඩිකා-කටුපිල
සිඛණ්ඩී-ඔලිද, පිච්ච වැල
සිඛර-යබොර, වසාවාසි
සිඛරා-බුලත්

සිඛරී- කුන්දුරුක්කන්, ඇපල, තෙලගස
සිඛා-රත් එරබු
සිඛී-රත් නිවුල්
සිගහු-මුරුංගා
සිගි-වංඇපල
සිගිවෙර-ඉඟුරු
සිඞ්ගි-දේවදුර
සිඩගිලිකොඩි-හිඟුරු වැල්
සිඩඝාටෝ-ගොකටු
සිඩඝාණ-යඛොර
සිඤ්චිතා-නිප්පිලි
සිට්ටමල්ලි-අස්වැන්න
සිත්තමට්ටි-බැවිල
සිත්තලෙලෙ-හීන් එන්සාල්
සිත්තලෙලෙප්පාවු-පුස්වැන්න
සිත්ථක-මී ඉටි, මිපැණි
සිත-රිදී, අලජාති, සඳුන්, හොඳු වහු, කපුරු, මුඛ රෝගයක්, මැණික්වැන්න, සීනි, සුදු පාසා නම්, වී
සිතකර-කපුරු
සිතකර්ණී-වංඇපල
සිතකුලක-බැවිල
සිතඟ-එළ ඉඹුල් ගස
සිතගුජා-සීනි, සුදුහකුරු
සිතගුඤ්ජා-එළ ඔලිඳ
සිතවජ්‍රා-ශතපුෂ්ප
සිතවඡද-එළ ඊතණ
සිතදර්භ-එළ කුසතණ
සිතදීප්‍ය-සුදු දුරු
සිතදුර්වා-එළ ඊතණ
සිතද්‍රොන-ගැටතුඹ, සොන්තුඹ
සිතධාතු-සාටුවැල්බටු
සිතපණී-වරාහස
සිතපුඛ්ඛා-හෙල පිලඟස
සිතපුෂ්ප- හෙළකටරොලු, හෙළ බටු, තුවරලා
සිතපුෂ්පා- කොටවියාමුරු, තුවරලා, කුසතණ, එළ එර බදු, එළ ඊතණ, බෝලිඳ,
සිතප්‍රසූ-පුස්සමන්
සිතර්භට-සුදු හඳුන්
සිතමරිච-එළ මිරිස්
සිතමාස-මහ මැ
සිතඹු-කපුරු
සිතලා-තලා
සිතලෙඛා-කඩසකුරු
සිතවර්ෂාභූ-එළ සාරණ
සිතසායක-එළ පිලඟස
සිතසිම්බිකා-තිරිඟු
සිතඟුරණ-වල් කිඩාරම්
සිතසර්ෂප-හෙළ අබ
සිතහිම-සුදු හඳුන්
සිතා-සුදු හඳුන්, සීනි, වදකසා
සිතාඛණ්ඩ-මීහකුරු
සිතාණඩිකා- සුළුසාරණ, මහ සාරණ
සිතාබ්ජ-සුදු පියුම
සිතාහ-කපුරු, මෝරු
සිතාහු, සිතාහ්‍ර, සිතාහ්‍රක } කපුරු
සිතාම්බුජ-හෙළ නෙළුම්
සිතාර්ජක-සුදුතලා
සිතාර්ජුන-මුරුත
සිතාරත්න-හීන්අරත්ත
සිතාරුණ-කුෂ්ඨ රෝගයක්
සිතාලක-සුදු මදුරා
සිතාලතා-සුදු ඊතණ
සිතිවාර-කිඹුල්වැන්න
සිතු-පළොල් රුක
සිතුබන්-සුන්සාල් බත්
සිතුලා-තලා
සිතෙඤ්චර-කොල්ලු, එළ ඊතණ
සිතොග්‍රා-හෙළ වදකසා

සිතෝපල-පබළු, එළබටු, සීනි
සිද්ධ-සවිත්දව, කළුඅත්තහා, සීනි
සිද්ධක-නිකගස, සල්ගස
සිද්ධජල-කාඩි
සිද්ධතෙලා-අබ
සිද්ධධාතු-රසදිය
සිද්ධපුෂ්ප-කණේරු
සිද්ධප්‍රයෝජන-සුදු අබ
සිද්ධම-කුෂ්ඨ රෝගයක්, (ලාදුරු)
සිද්ධමූලිකොළ-වරා කොළ
සිද්ධරස-රසදිය
සිද්ධසාධන-සුදු අබ
සිද්ධාජී-නුග ගස, අබ
සිදඩි-සුළුදඬකලත්, පළඟස, වැට කොළු, කිතුල් ගස
සිදඩිහුරු-වියලි ඉහුරු
සිදු-සෛන්ධව ලුණු
සිදුජල-ලුණු දිය හෝ මුදු ජලය
සිදුපෙන-මුහුදු පෙණ
සිදුබිජු-අබ
සිදුලුණු-සවිදලුණු
සිදුවර-නීක, ලුණුවරණ
සිදුවරපත්-නීකකොළ
සිදුවරණ-නීක
සිදුහත්-අබ
සිදුහත්සුණු-අබකුඩු
සිදුහතු-අබ
සිදුහතු තෙල්-අබ තෙල්
සිධිම-කුෂ්ඨ රෝගයක්, (ලාදුරු)
සිධු-මීපැණි
සිධුපුෂ්පි-මුරුංගා
සින්ඝාටක-කොකටිය
සින්තල්-කිතුල්, (හින්තාල) රස කිඳ
සින්නිල්-රසකිඳ
සින්දු-සවිදලුණු, තොවිල ගස
සින්දු(ඛ්‍රු)ක-නීකගස
සින්ධුකොඩි-ගිරිනිල්ල
සින්ධුර-සින්දූරම්, රතු ඊයම්
සින්ධුරකාරණ-ඊයම්
සින්ධුවාර-නීකගස, නීකමූල
සින්ධුවාරිකා-නීක ගස
සින්ධූරම්-රසබෙහෙත, (රසහම්ම) චූර්ණය
සින්ධූරී-එරබදු ගස, මිලිතගස
සින්ධ්‍ර-සවිත්දව, ඇත්මද, පළිහු, සුදු පුස්කර
සින්ධ්‍රකථ-මුහුදුපෙණ
සින්ධ්‍රකර-සුදු පුෂ්කර
සින්ධ්‍රජ-සවිත්දව
සින්ධ්‍රත්ථ-සවිත්දව ලුණු
සින්ධ්‍රනි-සවිත්දව ලුණු
සින්ධ්‍රත්භව-සවිත්දව ලුණු
සින්ධ්‍රපල-සවිත්දව ලුණු
සින්ධ්‍රපුෂ්ප-කුසුමාඤ්ජන, සක්, මලිත
සින්ධ්‍රමන්ථජ-අම්බව,සවිත්දවලුණු
සින්ධ්‍රලවන-සවිත්දව ලුණු
සින්ධ්‍රවරිත-නීකගස
සින්ධ්‍රවාර-නීක, හෙළ නීක
සින්ධ්‍රවාරක-නීක ගස
සින්ධ්‍රවාරච්ඡද-නීක, කළුනීක
සින්ධ්‍රවාරිකා-නීකගස
සින්ධ්‍රවෙසන-ඇත්දෙමට
සින්ධ්‍ර-සින්දූරම්
සින්නේලම්-සිහින් එන්සාල්
සින්ඛ-වම්මුතු
සින්ඛි- කටුවැල්බටු, එළබටු, වං ඇපල
සිනක්කර-සීනක්කාරම්
සිනික්කර-සීනක්කාරම්
සිනිද-අඹ
සිනිඹලා-සියඹලා
සිප්-භික්ගස, මුල
සිඵා-නුග ඇටුවන්, මුල
සිම්බකණ්ටිකා-කිරිඳි
සිම්බල-කොළු ඉඹුල්
සිම්බලී-ඉඹුල්
සිම්බා(ම්බී)-වඳුරු මෑ

සිම්බිජා

සිම්බිජා-කොල්ලු
සිම්බිල-හිඹුල්, අවර
සිම්බී- මුංවැන්න,
සිම්බිධ්‍යාන්‍ය-උඳු; මුං ආදිය
සියන්දුඹුලු-වියන්දුඹුලු
සියපත්-නෙළුම්
සියම්දි-මුද්දරප්පලම්
සියම්දිපැන්-මුද්දරප්පලම් මිරිකා පෙරා ගත් ජලය
සියම්ර-ඉහුරුපියලි
සිර-ඉස, තිප්පිලි මුල්, පළොල්ගස
සිරසනග්න-සුළුකරඹ
සිරසලොදු-කරපිංචා
සිරා-කිරිඅතුණ
සිරි-බෙලි, ඉළුක්
සිරිකට-සඳුන්

සිරිතේක්කු---දම්දෙවිසුදු



සිරිතේක්කු-බ්‍රාහ්මණ යෂ්ටිකා
Premna Tomentosa

සිරිවාසො

මුල් පැළවීමෙන් විශාල ලෙස බෝවී යන හාර්ඩ්‍ය ආදි නම් රාශියකින් හැඳින්වෙන සිරිතේක්කු ගස ඉන්දියාවෙහි මෙන්ම ලඞ්කාවෙහි ද මැනවින් වැවෙයි. ගස මේරුනවිට මුදුනෙහි රතු-සුදු පැහැයෙන් යුත් මල් පොකුරු පිපෙන මේ ගසේ ඖෂධ සඳහා ගන්නේ ගැට සහිත මුල් ය.

මේ මුල් ඌණ-කැස්ස-ශ්වාස-ජලෝදර හා වාතාබාධ සඳහා ගන්නා ඖෂධ යොග වලට එකතු කරති.

සිරිකඩ-ගඳුන්ගස
සිරිකමල-සඳුන්
සිරිකුම්ල්--කරබෙඹිය
සිරිඟානි--මදට්ටිය
සිරිවි-අඹනහිරිය
සිරිජන්-ගල්මද
සිරිදල-ඇද්දෙමට
සිරිපර්ණී-ඇද්දෙමට
සිරිපල-බෙලි
සිරිමල්-වසාවාසි
සිරියල-හිරියල=හිරිතල (අල වර්ගයක්)
සිරියෙල්-හිරියල්
සිරිල-පණුකරඹු, කුණුකරද
සිරිවටු- ශ්‍රීවෙෂ්ට=වෘකධූප= සරල ද්‍රව=(සිරිවටු වශයෙන් හොර ඉටි(හොරදුම්මල) ගත යුතු බැව් පෙණෙන නමුත් වැඩි දෙනා ගන්නේ හොර අරටු ය.)
සිරිවාසො-සරලද්‍රව

සිරි වැඩි බැවිල- හිරිවැඩිබැවිල



සිරිවැඩිබැවිල—නාගබලා

Sida Alba

දම්පාට මිශ්‍ර සුදු පාටින් යුත් මල් ගසපුරා ම පිපෙන අඩි හතරක් පහක් පමණ උසට වැවෙන බැවිල වර්ගයට අයත් ඉතාම ලක්ෂණ ගස **නාගබලා** නම් වූ සිරිවැඩි බැවිල ගස යි. නාගබලා වෙනුවට ගන යුත්තේ ගස්කැලිය නොව මේ සිරිවැඩි බැවිල ය. මෙය වාපිත්-සෙම් සමණය හා සෞම්‍ය ධාතු වර්ධන ය කරණ වාජීකරණ ඖෂධයකි. බැවිල වර්ග ගැණ විස්තරයක් 332 පිටේ ඇත.

සිරිසලෝද්‍ර-සබරල
සිරීෂ-මාරාගස, මහරිගස
සිරුකිරෙ-සුළුකූර
සිරුත්ති-අගිල්
සිරුපයරු-හීන්මුංඇට
සිරුපිලෙ-පොල්පළා
සිරුපුන්නෙ-කිණදෙඹ
සිරුපුල්ලඩි-මූංවැන්න
සිරුමරම්-කුඩා ගස්
සිරුමුගස්ටෙ-සීන්දුමැඩ
සිරුවලුතිලෙ-හෙළ අබ
සිරෝමූර්තු-ශීර්ෂ රෝගයක්
සිරෝසූල-ඉසරැජාව
සිල්පි-සක්නැබ
සිල්ලකි-කෙහෙල් ගස
සිල-ඉහුරු
සිලන්දු-ක්ෂුද්‍ර රෝගයක්
සිලා-ගල, වැටකොළු
සිලාජතු-ගල්මද
සිලාපහා-කොල්ලු
සිලාහෙද-පොල්පළා
සිලායනී-යක්ඛේරිය
සිලායු-"සිලායු" නම් මුඛරෝගය
සිලායෂී-පොල්පළා
සිලිල්-ඉරිවේරිය, වතුර
සිලිල්දු-වම්මුතු
සිලිල්දත්-පියුම්
සිලිල-සීතල ජලය, දියපාර, (සිලිලාර) ඵල්පත,ඵල්පැන්
සිලිස්සන්-ඉරිවේරිය
සිලු-මොණරපිල්, මොණරකුඩුම්බිය
සිලුපැන්-ඇල්වතුර
සිළුම්ණි-ඔලිඳ
සිලෙන්දි-මල්කූර
සිවිකරිස-දෙලොස් කලද, දෙලොස් කිරිය
සිවිකුඹුක්-කුඹුක් වනී හතර (දිය කුඹුක්,ගොඩකුඹුක්,රත්කුඹුක්, (අශ්වකර්ණ) කුඹුක්

සිව්ගුල් — සිහුණඩ

සිව්ගුල්-ඇසළ ගස
සිව්තුඹ-ගැටතුඹ, යොන්තුඹ, මල් තුඹ, ගෙඩි තුඹ,(තුඹකරිවිල)
සිව්දල-ඇසළ ගස
සිව්දෑ- චතුර්ජාතක- (එන්සාල්, කරාබු, වසාවාසි, සාදික්කා)
සිව්රැස්-හිරැස්ස
සිව්රැස්පොතු-හිරැස්සපළු
සිව්සානය-තුන්කලඳ
සිව-අරළු, මිණිරන්
සිවග්‍රංජන-අරළු, රතුලූනු
සිවන්ගුරු-සුවන්ගුරු
සිවන්තෙ-ත්‍රස්තවාළු
සිවන්දුප්පු-සිවසලුණු(සුවසලුණු)
සිවි--සම, සිවියවැල්

සිවිය—සිවියවැල්



සිවියවැල්—වව්‍ය (ශඞ්ඛනාකුලි)
Piper Chaba

සිවිය බුලත් කොළ වලට සමාන ඊට වඩා මදක් සණ කොළ හා අඟල් අටක් පමණ දිග කරල් ඇති පිපළුලි ගණයට අයත් වැල් වර්ගයකි. මෙය ලඞ්කා වෙහි මෙන් ම ඉන්දියා-ජාවා-සුමාත්‍රා ඝන රට වල ද මැනවින් වැවේ සි.

සිවිය- කාශ, ශ්වාස, ශ්ලෙෂ්ම, ජ්වර, වාත නාශක හා අග්නිදීපනය ඇති කරණ උෂ්ණ කාරක ඖෂධයකි. දේශීය වෙදකමේ බොහෝ ඖෂධ යොග වලට සිවිය මුල් ඇතුළත් කර තිබේ.

සිවෙල්-කුඹුරු ඇට
සිෂ්ටඤ්ඤ-මැණික්වැන්න
සිසක-ඊයම්
සිසපත්‍ර-ඊයම්
සිසි-කපුරු
සිසිපිය-නිල්මානෙල්
සිසිමෙලෙ-සියඹලා ගස
සිසිර-සැවැන්න, ඉරිවේරිය
සිසිරා-ඊතණ
සිසිල-සඳුන්
සිසුර-තලා
සිහ්නකි--කොහෙල් ගස
සිහ්ල-තුරුක්තෙල්
සිහපුච්ඡි-පුස්වැන්න
සිහිකා-කාමරංගා
සිහින්අක්මැල්ල- හීන් අක්මැල්ල
සිහින්කස්-කුඩා දද ඛෝ කුෂ්ටය
සිහින්කසා-හීන් කසා ගස
සිහින්මැඩහදු-සිහින්මස්බැද්ද
සිහින්මිදි-හීන් මිදි ගස
සිහිනැටි-හිනට් වී
සිහිනිඳි-හීන්ඉඳි, සීනිද්ද
සිහිල්-ඉරිවේරිය, සඳුන්
සිහුණඩ-දළුක්

සී

සී- සිංහයා- වෘක්ෂමසතක (ගස් මුදුන්)

සි අන්කා



සි අන්කා

සිනිද්ද හෝ **සියඹලා** කොළ වැනි කොළ හා අහල් $6 \times \frac{1}{2}$ ක් පමණ දිග-පළල ඇති කරල් පොකුරු සැදෙන අඩි පහළොහක් පමණ උසට වැවෙන දකුණු ඉන්දියාවෙන් ගෙනැවිත් මෙහි බෝකරණ ලද ගසකි.

මෙය වමී රෝග නාශක ඖෂධයකි සමේ පිට සැදෙන අළුත්-නොරි- දද- කුෂ්ඨ වලට මේ කරල්වල ඇට ඇල් දියෙන් අඹරා ඇඟේ ගා පැය බාගය කින් පමණ ඇල්වතුර නැම කර න්න. මෙසේ සතියකට තුන් වරක් පමණ සති කීපයක් නොකඩවා නැමෙන් සම්පූර්ණ සුවය ලබා ගත හැක. ඒ කාලය තුළ සබන් ගැම සුදුසු නැත.

එක වරක් පමණක් මේ ඇට අඹරා ගැමෙන් පිට සමේ තිබෙන තෙල් ගතිය මගහැරී සම හොඳින් පිරිසිදු වෙයි.

සිකස-සිහින් කසා ගස
සිගෘ-මුරුංගා ගස
සිගෘකා-වැල් මුරුංගා

සිත-අඟිල්, කිහිරි, සඳුන්, කටු පිල, ලෝලු, තුන් ප්‍රජිල, හොමු වඟු, පෝටා, (පුවටා)

සිත උද්දාල-ලෝලු

සිතක-අඟිල්, කර ගස, සීනි, කළු ඊයන්

සිතකණ්‍යා-කහඹිලිසා
සිත කුමහිකා-හෙළ පළොල්
සිතකූලක-සුළු බිව්ල
සිතගන්ධි-සුදු හඳුන් ගස
සිතගාත්‍රා-සන්නිපාත ජ්වර රෝ ගයක්
සිතජාති-කටුපිල
සිතද්‍රොණ-යොන්තුඹ
සිතපඤ්ඣ-කටුපිල
සිතපලලව-බළුදම්
සිතපාණී-කළිල වැල, කටුපිල
සිතපුෂ්ප-හෙළ නික, මහ කරඹ
සිතපුෂ්පී-ඇස් බැලිල
සිතප්‍රිය-පැපිලිය- ඇල්කහඹිලියා

සිත ඵල-තෙල්ලි
සිතඛ්හෝ-කපුරු
සිත බහුඵල-කිඹිරි
සිතභීරු-ඉද්ද ගස
සිතමාලා-අත්මැල්ල
සිතල-කැකිරි, මහ කසිස්, ඇඹුල, ඕලු මල්, සුලු බැවිල, බැවිල
සිතලා-සුලු බැවිල, කැකිරි
සිතලාරඤ්ඤ-කපුරු
සිතලාලඝ-එළ ජම්බු
සිත වල්ලභා-බළුදම්
සිතවර-ලෝලු
සිතවාරක-කිරිඳි
සිතවාරා-පුස්සමන්
සිතවීයඹී-නිල් මහනෙල්, ඇඹුල
සිතසඟා-කෝමාරිකා
සිත සිව-සවින්දව
සිත සෙඟඟඹී-රන් මානෙල්
සිතා-කෝමාරිකා
සිතාර්ජක-අඳුතලා
සිතාලොලිං-හි වැලෙනි ඇලෙන පස් (නගුලෙන් සී සාන විට පස කැපි යාම සඳහා සවිකර තිබෙන වානේ පතුරෙනි එක තුවන පස්, මේ පස් එකතු වන්නේ ඒ වානේ පතුර හා සම්බන්ධ වූ නගුලි'සේ මුල්ලෙහි ය. ඒ පස් රැගෙණ ඇල් දියෙන් දිය කර පෙරා වශී කරණ (ඉනා) බෙහෙත් කැවීමෙන් විෂ ශරීර ගතවූ රෝගීන් ට පෙවීමෙන් සම්පූර්ණ සුවය ලැබේ. මෙය බුදුරජාණන් වහන්සේ විසින් (විනය පිටක -මහාවගග පාලි - හෙසජ්ජක්ඛන්ධක) සරදින්නා බාධය (ඉනා බෙහෙත් කැවීමෙන් ඇති වන රෝගය) ට නියම කර වදාරණ ලද බෙහෙතකි.
සිතිදුරකා-තිඹිරි
සිතිද්‍රොණ-යොන්තුඹ
සිතිසාරක-තිඹිරි
සිඩු-මී පැණි, උක් පැණියෙන් කළ සුරා
සිඩුගඤ්ඤ-මූනමල් ගස
සිඩුපුෂ්ප- මූනමල් ගස, මලිත, කොළොම්
සිඩුපුෂ්පි-මුරුංගා
සිඩුඵල-තෙල්ලි
සිඩුරස-අඹගස
සින්-වංඇපල
සින් ගොඩ මෙනේරිය - සිහින් මෙනේරි (ධාන්‍ය වර්ගයක්)
සිනක්කාරම්- එනම් උප ධාතු (ලවණ) විශෙෂය
සින් තඹල- කුඩා කොළ ඇති තඹල වර්ගය (ඕයාරූප සහිත විස්තාරයක් ඉදිරියෙහි ඇත)
සිනව්වුඩම්-අමු කපුරු
සිනමුල්-චීන දේශයෙන් ගෙනෙන ලද බෙහෙත් අල වර්ගයක්=(වොබචිනි=ඕයාරූප සහිත විස්තාරයක් 192 පිටේ ඇත)
සිනි-උක් ආදියෙහි පැණි උකු කර සාදා ගන්නා සිහින් කැට වර්ගයක්
සිනිදි-සිනිද්ද
සිනුක්- පතොක් වර්ගයට අයත් පැලැටියක්. මෙහි දඬු සිරුස්ස පළු වලට වඩා මදක් විශාල ය. හතරැස් ය. නාරටිය දිගේ සිහින් කොළ තිබේ. කිරි ඇති - නැති සිනුක් දෙවගය කි. මෙයින් ඖෂධ සඳහා ගන්නේ කිරි සහිත වර්ගය පමණකි.

සු

සිපද-ශ්ලීපද (බරපා = බරවා) රෝගය
සිමන්තිනී-ඇසතු බෝ ගස
සිමී-ඉස, මහරි රැක
සිර-වරා ගස
සිරිස්-හිරිස්ස වැල (පළු)
සිරිස්ස-විදුරු වැල් (සිරිස්ස පළු)
සිරි-ලියනහලා
සිල-මනෝසිල
සිවැල-නගුලේ වානේ පතුර හෝ නගුලෙන් සාන සී විට
සිස-කළු ඊයම්
සිසං-බළල් ලුණු, කළු තුඹ
සිසක-කළු ඊයම්
සිසපත්‍ර-කළු ඊයම්
සිසුර-තලා
සිහනාගා-සිහින් කැනැස්ස
සිහපුච්ඡි-පුස්වැන්න
සිහල-සිඳසිඟුරු, කුරුඳු
